නාට්‍ය හා රංග කලාව

ගුරු මාර්ගෝපදේශය

12 ශ්‍රේණිය

(2017 සිට ක්‍රියාත්මක වේ.)

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk
info@ni.lk

නාට්‍ය හා රංග කලාව

12 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2017

© ජාතික අධ්‍යාපන ආයතනය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය : ජාතික අධ්‍යාපන ආයතනය

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

ආචාර්ය ජයන්ති ගුණසේකර

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද, සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව, ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

පටුන

	පිටුව
අධ්‍යක්ෂ ජනරාල් පණිවුඩය	iii
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පණිවිඩය	iv
විෂයමාලා කමිටුව	vi
ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්	vii
විෂය නිර්දේශයේ අන්තර්ගතය	viii-xiv
ක්‍රියාකාරකම් වාරවලට බෙදා දැක්වීම	xxi
ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්	01-227
ඡායාරූප එකතුව	228 සිට

විෂයමාලා කමිටුව

උපදේශකත්වය හා අනුමැතිය	:	ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ජාතික අධ්‍යාපන ආයතනය
විෂය සම්බන්ධීකරණය	:	කේ. ජී. අජිත් රූපසේන, ව්‍යාපෘති කණ්ඩායම් නායක - නාට්‍ය හා රංග කලාව සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය
විෂය විශේෂඥ උපදෙස්	:	
මහාචාර්ය වෝල්ටර් මාරසිංහ	-	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (විශ්‍රාමික)
මහාචාර්ය රෝලන්ඩ් අබේපාල	-	කොළඹ විශ්ව විද්‍යාලය
මහාචාර්ය එස්. මෞනගුරු	-	මඩකළපුව විශ්ව විද්‍යාලය
මහාචාර්ය මංගලිකා ජයතුංග	-	කැලණිය විශ්ව විද්‍යාලය (විශ්‍රාමික)
ලේඛක මණ්ඩලය		
අභ්‍යන්තර	:	
කේ. ජී. අජිත් රූපසේන	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය
බාහිර	:	
එම්.ජේ. ක්ලයිව් ශාන්ත	-	ගුරු සේවය, ශාන්ත ආනා විද්‍යාලය, කුරුණෑගල
රණසිංහ අධිකාරි	-	ගුරු සේවය - මහින්ද විද්‍යාලය, ගාල්ල
සෙනෙවිරත්න රැදිගෝ	-	ගුරු උපදේශක - කොළඹ කලාපය
ලලිතා ජයරත්න	-	ගුරු උපදේශක - ඇඹිලිපිටිය කලාපය
ඩී.පී. ස්වර්ණලතා	-	ගුරු උපදේශක - ඇල්පිටිය කලාපය
සමන් කස්තුරිරත්න	-	ගුරු සේවය (විශ්‍රාමික)
ජී. කරුණාවතී	-	අධ්‍යාපන පරිපාලන සේවය ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලය, කොළඹ
ටෙනිසන් දසනායක	-	ගුරු සේවය - ඇල්පිටිය ආනන්ද විද්‍යාලය
රසික ප්‍රසංග බණ්ඩාර	-	විදුහල්පති සේවය වලගම්බා විද්‍යාලය, කැගල්ල
නයෝමි සමුද්‍රිකා ගුණසිරි	-	ගුරු සේවය - කරුණාරත්න බෞද්ධ ම. විද්‍යාලය, රාගම
භාෂා සංස්කරණය	-	ශ්‍රීනාත් ගණේවත්ත
පිටකවර නිර්මාණය	-	රවීන්ද්‍ර තේනුවර, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සෞන්දර්ය විෂයයන් අතර නාට්‍ය හා රංග කලාව විෂයයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. නිපුණතා ගොඩනැංවීම අරමුණු කරගත් අධ්‍යාපන ක්‍රමයේ දී වඩාත් ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ ක්‍රියාකාරකම්වලින් මෙම විෂය ක්ෂේත්‍රය සකස් වී තිබීම එයට හේතුව යි. 12 ශ්‍රේණියේ නාට්‍ය හා රංග කලාව විෂය නිර්දේශය යටතේ උක්ත අරමුණ කෙරෙහි වඩාත් අවධානය යොමු කරමින් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට තිබේ.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතුළත් කොට ඇති ක්‍රියාකාරකම්වලින් දැනුම, කුශලතා හා ආවේදන ක්ෂේත්‍රයන්හි පුළුල් සංවර්ධනයක් සිදු කිරීම අපේක්ෂා කෙරේ. නාට්‍ය සිද්ධාන්ත, න්‍යායාත්මක පදනම, ප්‍රායෝගික ක්‍රියාකාරකම් සංස්කෘතික හා සාමාජික පසුබිම, රසාස්වාදය හා විචාරය, නිර්මාණාත්මක චින්තනය යන ක්‍රියාකාරකම්වලින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සංගෘහිත වේ. මීට අමතර වෘත්තීය කුශලතා සංවර්ධනය අරමුණු කරගත් නව නිපුණතාවක් ඇතුළත් කිරීම මඟින් නාට්‍ය හා රංග කලාව විෂයය සමාජගත කිරීමේ මූලික පදනම සැලසුම් කොට ඇති බව ද මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

මෙහි ඇති ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් සාර්ථක කරගැනීම සඳහා මානව සම්පත් මෙන් ම භෞතික සම්පත් සම්පාදනය කරදීම අත්‍යවශ්‍ය වේ. නාට්‍ය හා රංග කලාව විෂයය පිළිබඳ ව අතිරේක දැනුම උපයා ගැනීම සඳහා විෂයානුබද්ධ ග්‍රන්ථ පරිශීලනයට සිසුන් යොමුකිරීම ඉතා වැදගත් වන අතර ඒ සඳහා අවශ්‍ය පුස්තකාල පහසුකම් සලසා දීම කෙරෙහි ගුරු භවතාගේ විශේෂ අවධානය යොමු විය යුතු ය.

එමෙන් ම ක්ෂේත්‍ර චාරිකා මඟින් සම්පත් පුද්ගලයන් හමුවීම හා පර්යේෂණාත්මක අධ්‍යයනයකට සිසුන් යොමු කිරීම ද වැදගත් වේ.''නාට්‍යය'' යනු කුමක්දැයි සැබෑ අවබෝධයක් ලබා ගැනීම සඳහා ජාතික තලයේ නාට්‍ය නැරඹීම සඳහා අවස්ථාව සලසා දීම ද ඉතා වැදගත් වේ. එමෙන් නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා රංගපීඨ භාවිත කිරීම, ක්‍රියාකාරී පන්ති කාමරයක් සැලසුම් කිරීම හා පවත්වා ගෙනයාම, නාට්‍ය තරග සංවිධානය කිරීම, රංග කලාව හා සම්බන්ධ ප්‍රදර්ශන, විවාද ආදි විවිධාංග සංවිධානය කිරීම ආදිය මඟින් නාට්‍ය විෂයය ශිෂ්‍යයාට වඩාත් සමීප කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිහරණය කිරීමේ දී අවධානයට ගත යුතු විශේෂ කරුණක් ඇත. එනම්, මෙහි අතුළත් කොට ඇති ක්‍රියාකාරකම්ඃ විශේෂයෙන් ම ප්‍රායෝගික ක්‍රියාකාරකම් කිසිදු වෙනසක් නොකර, මෙහි සඳහන් ආකාරයෙන් ම ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. සමස්ත වශයෙන් මුළු රට පුරා සෑම පාලසක ම එක ම රාමුවක් තුළ, එකම ආකාරයෙන් ක්‍රියාකාරකම් පල ගැන්වීමේ ඒකමිතික අවශ්‍යතාව මෙහිලා විශේෂයෙන් අවධාරණය කෙරේ. ඉගැනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව මෙයින් පැහැදිලි වනු ඇත.

උක්ත සියලු ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී ශිෂ්‍යයාට වඩාත් ප්‍රියජනක වන අයුරින් මෙන් ම නාට්‍ය හා රංග කලාව විෂයයට ශිෂ්‍යයා ආකර්ෂණය වන අයුරින් ද සංවිධානය කිරීම විෂය භාර ගුරු භවතාගේ වගකීම බව ද මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුත්තේ ය.

විෂය නිර්දේශයේ අන්තර්ගතය

1.0 හැඳින්වීම

නාට්‍ය හා රංග කලාව යනු අතිශයින් නිර්මාණශීලී වූත්, ප්‍රායෝගික වූත්, වින්දනීය වූත්, විෂය ක්ෂේත්‍රයකි. පාසල් පද්ධතියේ වර්තමානයේ ක්‍රියාත්මක වන නිපුණතා පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමය හා අනුගත විෂය නිර්දේශයක් ලෙස නාට්‍ය හා රංගකලාව විෂය නිර්දේශය හැඳින්විය හැකි ය.

මුල් කාලයේ දී අ.පො.ස. උසස් පෙළ ශ්‍රේණි සඳහා පමණක් සීමා වී තිබුණු මෙම විෂයය, 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව පසුව 10,11 ශ්‍රේණි දක්වා ද ව්‍යාප්ත විය. එය වඩාත් පුළුල් පරාසයක විකාශය වෙමින් 2007 වසරේ දී 6 වැනි ශ්‍රේණියෙන් ඇරඹෙන විෂය නිර්දේශය, නිපුණතාපාදක අධ්‍යාපන ක්‍රමය හා මැනවින් බද්ධ වී ඇත. මෙම විෂයය ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ, නිශ්චිත නිපුණතා ළඟා කරගත හැකි ක්‍රියාකාරකම් පාදක කොටගත් විෂයයක් වන බැවින්. සමාජ ගැටලු නාට්‍යමය දෘෂ්ටි කෝණයකින් හඳුනා ගෙන වින්දනාත්මක ව ග්‍රහණය කරගැනීමේ හැකියාව වර්ධනය කිරීම මෙමගින් අපේක්ෂිත ය.

නිර්මාණාත්මක හැකියාවන් හා ප්‍රායෝගික කුශලතාවන් වර්ධනය කිරීමත්, විචාරශීලී රසාස්වාදයට හුරු කිරීමත් අරමුණු කොට ගෙන ඇති මෙම විෂයය මගින් නාට්‍ය සිද්ධාන්ත, නිර්මාණාත්මක හැකියාව, ප්‍රායෝගික ක්‍රියාකාරකම්, දේශීය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම, හා වින්දනීය මානව හිතවාදියකු බිහිකිරීම යන පංචවිධ නිපුණතා සාධනය කරගැනීම අපේක්ෂා කෙරේ.

ළමා මනසට ගෝචර වන විචිත්‍ර ලෝකය හා වීරක්‍රියා වැනි සංකල්ප ගොඩ නැගීමට නාට්‍ය හා රංගකලාව විෂයය යොදාගැනීම බෙහෙවින් සාර්ථක ය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දී ප්‍රියජනක ඉගැනුම් අත්දැකීම් සමීප කරමින්, නිර්මාණශීලී පරපුරක් ගොඩ නැගීම හා එමගින් සමස්ත පුද්ගල පෞරුෂය ගොඩ නැගීමේ කාර්යය සඳහා ද මෙම විෂයය ඉවහල් වේ. නව ලෝකයේ සංකීර්ණ වූත්, වේගවත් වූත්, වැඩ පරිසරයට අවශ්‍ය වන ශ්‍රමදායකයා ද, විචාරශීලී නිර්මාණකරුවා ද, වින්දනය හා ස්වාභිමානය/ආත්මාභිමානය පුරුදු පුහුණු කළ මානව හිතවාදියා ද ගොඩ නැගීමට අවශ්‍ය දේශීය අනන්‍යතාව හා සංස්කෘතික උරුමය, ප්‍රායෝගිකත්වය හා නිර්මාණශීලීත්වය ගැබ් වූ ක්‍රමවේදයක් නාට්‍ය හා රංගකලාව විෂයය තුළ අන්තර්ගත වේ.

සමාජ ජීවිතයේ මුහුණ දෙන ගැටලුවලට යථාර්ථවාදී හා ශුභවාදී විසඳුම් ලබාගැනීමට අවශ්‍ය පෙර සූදානම මෙමගින් ලබාදෙන අතර, වින්දනීය මානව හිතවාදියකු මෙන් ම ශ්‍රී ලාංකේය අනන්‍යතාවකින් හෙබි අභිමානවත් පුරවැසියකු ගොඩනැගීමේ අභියෝගය නාට්‍ය හා රංගකලාව විෂය භාර ගුරුභවතුන් හමුවේ පවතින භාරදූර වගකීමක් බව අවසන් වශයෙන් සඳහන් කළ යුතු ය.

2.0 ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුශලතා පෝෂණය කිරීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003)

3.0 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කරගනී.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කරගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුශලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදිතාව හා කුශලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුශලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුශලතාව ඉගැනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුශලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනාගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරාගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුශලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහාගැනීම හා ස්වීකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගැනීමට ඉගැනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබාදීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003)

4.0 නාට්‍ය හා රංග කලා විෂය අරමුණු

පරිසරයේ ඇති සියලුම වස්තූන් ඇසුරෙන් වින්දනයක් ලබා ගැනීමේ ශක්තිය ඇති එකම සත්ත්වයා, මිනිසා ය. මිනිසා හා මිනිසා අතර ඇති වන විවිධ ගැටීම් නාට්‍යමය දෘෂ්ටි කෝණයකින් හඳුනාගෙන, ඒවා වින්දනාත්මක ව ග්‍රහණය කර ගැනීමේ හැකියාව ශිෂ්‍යයා තුළ වර්ධනය කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

නිර්මාණාත්මක ශක්ති වර්ධනය

නාට්‍යමය සංසිද්ධි වින්දනයේ දී මෙන් ම නිර්මාණයේ දී ද ප්‍රබල අනුභූතියක් ලබාදෙයි. එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම් හා මිනිස් ඇසුර මගින් ලබන අත්දැකීම් නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමට හැකි අනුභූතීන් ගොඩ නගා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම මෙහි එක් අරමුණෙකි.

ප්‍රායෝගික කුශලතා වර්ධනය

නාට්‍යානුසාරී අභ්‍යාස මගින් නිර්මාණය වූත්, එසේ ම එදිනෙදා ජීවිතයේ කාර්යයන් සඵල කර ගැනීමට සරිලන්නා වූත්, ස්වකීය චාලක හැකියාවන් පෝෂණය කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රායෝගික අවස්ථා මෙහි දී සැලසුම් කෙරේ.

විචාර ශක්ති වර්ධනය

සාහිත්‍යමය හා නාට්‍යමය වශයෙන් ද ජනසන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ ශ්‍රව්‍යමය හා දෘශ්‍යමය වශයෙන් ද ඉදිරිපත් කෙරෙන සංසිද්ධි විමර්ශනාත්මක ව තර්කානුකූල ව විචාරයට ලක් කිරීමේ හැකියාව වර්ධනය කිරීම ද මෙහි මූලික අපේක්ෂාවකි.

විෂයානුබද්ධ දේශීය හා විදේශීය අනන්‍යතාවන් හඳුනාගැනීම

ඉගැනුම් කාර්යයේ දී මෙන් ම, ඵලදායී දෛනික ජීවිතයට වැදගත් වන ඒ ඒ විෂයානුබද්ධ දේශීය අනන්‍යතාව පිළිබිඹු කෙරෙන සංස්කෘතික උරුමයන් පිළිබඳ වත්, එම දැනුම පෝෂණය කෙරෙන වෙනත් විදේශීය උරුමයන් පිළිබඳ වත් නිවැරදි චින්තනයකින් යුත් චරිතායනයක් සිසුන් තුළ ජනිත කිරීම අවශ්‍ය කරුණකි. නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක විඳගැනීම මගින් සමාජයට අවශ්‍ය කරන මානව හිතවාදියකු ගොඩනැගීම ද මෙම විෂයයේ මුඛ්‍ය අරමුණක් වේ. නාට්‍ය හා රංග කලා විෂයානුබද්ධ දැනුම හා එමගින් මනා ආකල්ප ඇති කිරීම ද මෙම විෂය නිර්දේශයේ අපේක්ෂාව වන්නේ ය.

නාට්‍ය හා රංග කලාව

5.0 ජාතික පොදු අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව

	ජාතික අරමුණු							
නාට්‍ය හා රංග කලාව විෂයයේ අරමුණු	I	II	III	IV	V	VI	VII	VIII
1. පරිසරය ඇසුරින් වින්දන ශක්තිය වර්ධනය.	√	√	√	√	√			√
2. නිර්මාණාත්මක චින්තනය හා නිර්මාණාත්මක කුශලතා වර්ධනය.		√			√	√	√	√
3. ඵලදායී දිවි පැවැත්මකට අවශ්‍ය කුශලතා හා ආකල්ප වර්ධනය.	√	√	√	√				√
4. දේශීය හා විදේශීය සංස්කෘතික අංගයන්ගේ අනන්‍යතා හඳුනා ගැනීම හා අගය කිරීම.	√		√		√			√
5. විචාර ශක්තිය වර්ධනය.	√		√		√	√	√	√
6. අනාගත වැඩ ලෝකයේ අභියෝගවලට මුහුණ දිය හැකි ශක්‍යතාවෙන් සමන්විත සමබර පෞරුෂ වර්ධනය.	√	√			√	√	√	√

6.0 නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය, ඉගැනුම් පල සහ කාලච්ඡේද

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගැනුම් පල	කාලච්ඡේද
0.1 කලාව යන්න විමසමින් නාට්‍ය හා රංග කලාව අනෙකුත් කලා සමඟ සංසන්දනය කරයි.	1.1 කලාව යන්න නිර්වචනය කර වර්ගීකරණයට ලක් කරයි. 1.2 ප්‍රාසංගික කලා හඳුන්වයි. 1.3 ප්‍රාසංගික කලා හා වෙනත් කලාවන් අතර වෙනස පැහැදිලි කරයි. 1.4 සෙසු ප්‍රාසංගික කලා සහ නාට්‍ය කලාව අතර ඇති වෙනස පැහැදිලි කරයි.	1.1.1 කලාව යන්න නිර්වචනය කරමින්, කලාව පිළිබඳ මූලික වර්ගීකරණය දැක්වීම 1.2.1 ප්‍රාසංගික කලා යන්න පැහැදිලි කරමින් ප්‍රාසංගික කලා වර්ග නම් කිරීම 1.2.2 ප්‍රාසංගික කලාවේ මූලික ලක්ෂණ පැහැදිලි කිරීම 1.3.1 ප්‍රාසංගික කලා සහ වෙනත් කලා පිළිබඳ ව විස්තර කිරීම 1.4.1 නාට්‍ය කලාව සහ සෙසු ප්‍රාසංගික කලා අතර සමාන අසමානතා සැසඳීම	• කලාව පිළිබඳ ව ඇති නිර්වචන විමසයි • නිර්වචන ඇසුරින් කලාව විග්‍රහ කරයි. • කලාවෙහි ප්‍රභේද දක්වයි. • ප්‍රාසංගික කලාවන්හි සුවිශේෂ ලක්ෂණ වෙන් කරදක්වයි. • සෙසු ප්‍රාසංගික කලා අතර නාට්‍ය කලාවෙහි ස්වභාවය වටහාගනියි.	20
2.0 නාට්‍ය හා රංගකලාව විෂයය පිළිබඳ න්‍යායාත්මක පදනම ප්‍රගුණ කරයි.	2.1 නාට්‍ය හා රංග කලාව යන්න විමසයි. 2.2 නාට්‍ය කලාව හා සම්බන්ධ පාරිභාෂික වචන අර්ථ නිරූපණය කරයි. 2.3 ප්‍රධාන රංග ශෛලීන්හි වෙනස්කම් හඳුනා ගනියි. 2.4 ග්‍රීක නාට්‍ය කලාව හා සම්බන්ධ න්‍යායාත්මක පදනම අධ්‍යයනය කරයි.	2.1.1 නාට්‍යය යනු කුමක් ද යි හඳුන්වා දීම 2.1.2 නෘත්ත, නෘත්‍ය, නාට්‍ය 2.1.3 සතර අභිනය 2.1.4 නාට්‍ය හා රංග කලාව යන දෙපදය විමසීම 2.2.1 නාට්‍ය හා රංග කලාවේ මූලිකාංග විමසීම 2.2.2 රංග භූමිය, ප්‍රේක්ෂාව සහ ප්‍රේක්ෂකයා 2.3.1 ලෝකධර්මී 2.3.2 නාට්‍යධර්මී 2.4.1 ග්‍රීක ශෝකාත්ම ට්‍රැජඩි) පිළිබඳ ව ඇරිස්ටෝටල් ගේ විග්‍රහය • වස්තුව (Plot)	• නාට්‍ය, නාට්‍ය හා රංගකලාව යන පදවල අර්ථය විමසයි. • සතර අභිනය හඳුන්වයි. • නාට්‍ය කලාවෙහි මූලිකාංග හඳුන්වයි. • රංග භූමිය, ප්‍රේක්ෂාව හා ප්‍රේක්ෂකයා පිළිබඳ ව විස්තර කරයි. • ප්‍රධාන රංග ශෛලින් නිදසුන් සහිත ව දක්වයි. • ග්‍රීක නාට්‍ය වර්ගීකරණය කරමින් විග්‍රහ කරයි. • ශෝකාත්ම නාට්‍යයක මුඛ්‍යාංග සාකච්ඡා කරයි.	30

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගැනුම් පල	කාලච්ඡේද
		• ආකුලීකරණය • අනාවරණය • ප්‍රත්‍යාවර්තනය • ප්‍රත්‍යභිඥානය l : d¾ Sa(Catharisis) 2.4.2 ඒකත්ව සංකල්පය 2.4.3 ශෝකාත්ම නාට්‍යයක මුඛ්‍යාංග • කථාවස්තුව • චරිත • චින්තනය • වාග්විලාසය • ප්‍රේක්ෂාව • සංගීතය		
3.0 ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යායන් ප්‍රකට කරයි.	3.1 රංග අභ්‍යාස ප්‍රගුණ කරයි. 3.2 රංග ක්‍රීඩා ප්‍රගුණ කරයි. 3.3 චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.	3.1.1 රංග අභ්‍යාස • ශිථිලකරණ අභ්‍යාස • ශ්වසන අභ්‍යාස • කටහඬ අභ්‍යාස • සංවේදන අභ්‍යාස • පරිකල්පන අභ්‍යාස 3.1.2 ක්ෂණික නිරූපණ (සාමූහික) 3.1.3 රිද්ම චලන (සංගීතය සමඟ) 3.2.1 රංගක්‍රීඩා • මකර වලිගය • පූසෝ සහ මීයෝ 3.3.1 ක්ෂණික නිරූපණ (ඒකල)	• රංග අභ්‍යාසයන්හි නිරත වෙයි. • රංග අභ්‍යාස භාවිත කරමින් ප්‍රායෝගික කුශලතා ප්‍රගුණ කරයි. • රංග ක්‍රීඩාවලින් ලැබෙන ප්‍රයෝජන විස්තර කරයි. • පරිකල්පන කුශලතා උපයෝගී කරගනිමින් ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි. • සංගීතය හා ගායනය උපයෝගී කරගනිමින් චරිත හා අවස්ථා නිර්මාණය කරයි. • රංග රූප ප්‍රතිනිර්මාණය කරයි.	80

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගැනුම් පල	කාලච්ඡේද
	3.4 අභිරූපණ කුශලතා වර්ධනය කරයි. 3.5 නිර්දිෂ්ට පෙළට අදාළ ව රූපණයේ යෙදෙයි.	3.3.2 සංගීතය උපයෝගී කරගෙන චරිත සහ අවස්ථා නිර්මාණය කිරීම. 3.3.3 නාට්‍ය ගීත ගායනා කරමින් රංගනයේ යෙදීම 3.3.4 නරඹා ඇති නාට්‍යවල සිද්ධි හෝ අවස්ථා හෝ ප්‍රතිනිර්මාණය කිරීම 3.3.5 ගුරුවරයා විසින් නම් කරනු ලබන චරිත හා අවස්ථා නිර්මාණය කිරීම 3.3.6 රංග රූප ප්‍රතිනිර්මාණය කිරීම 3.3.7 අත්දැකීම් පාදක කොටගත් අවස්ථා නිරූපණය කිරීම 3.4.1 අභිරූපණ අභ්‍යාස 3.4.2 ඒකල නිරූපණ 3.5.1 ඊඩිපස් හා කුවේණි පෙළට අදාළ ව තෝරාගත් අවස්ථා නිරූපණය කිරීම	• නිර්දිෂ්ට පෙළෙහි තෝරාගත් කොටස් නිරූපණය කරයි. • ආනුෂංගික අංග සැලසුම් කර නිර්මාණය කරයි.	
4.0 නාට්‍ය හා රංගකලාව විෂය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.	4.1 නාට්‍ය කලාවේ ප්‍රභවය විමසයි (ග්‍රීක නාට්‍ය) 4.2 ග්‍රීක නාට්‍යයේ රංග ශෛලිය පිළිබඳ ව විමසයි.	4.1.1 ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රභවය පිළිබඳව විමසීම 4.1.2 ග්‍රීක නාට්‍ය ප්‍රභේද • ශෝකාත්ම (Tragedy) • සුඛාත්ම (Comedy) • සටූර (Satur) 4.1.3 ග්‍රීක නාට්‍යකරුවෝ - ඊස්කිලස් - සොෆොක්ලීස් - යුරිපිඩීස් - ඇරිස්ටොෆානිස් 4.2.1 ග්‍රීක නාට්‍යයේ රංග ශෛලිය	• ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රභවය හා විකාශය පිළිබඳ කරුණු අධ්‍යයනය කරයි. • දේශීය නාට්‍ය කලාවේ ප්‍රභවය විස්තර කරයි. • ග්‍රීක නාට්‍යකරුවන් හඳුන්වයි. • මධ්‍යකාලීන යුරෝපයේ ජනවන්දනා නාට්‍යගැන සාකච්ඡා කරයි.	52

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගැනුම් පල	කාලච්ඡේද
	4.3 මධ්‍යකාලීන යුරෝපයේ ජනවන්දනා නාට්‍ය පිළිබඳ විමසයි.	4.3.1 මධ්‍යකාලීන යුරෝපයේ ජනවන්දනා නාට්‍ය	• දේශීය ගැමි නාටකවල නාට්‍යමය ලක්ෂණ විමසයි.	
	4.4 දේශීය නාට්‍ය කලාවේ ප්‍රභවය විමසයි.	4.4.1 අභිචාර විධි හා පූජාකර්ම • දේශීය ශාන්තිකර්මවල නාට්‍යමය ලක්ෂණ විමසීම • උඩරට ශාන්ති කර්ම කොහොඹා කංකාරිය • පහතරට ශාන්ති කර්ම, දහඅට සන්නිය, රටයකුම, සූනියම් යාගය • සබරගමු ශාන්තිකර්ම කිරිමඩු, පහන්මඩු. ගම්මඩු. පූනාමඩු	• නූර්ති, ටවර් හෝල්, ටීටර් හා මිනර්වා නාට්‍ය පිළිබඳ ව විස්තර කරයි. • සිංහල නාට්‍ය කලාවේ ප්‍රගමනය උදෙසා විශ්වවිද්‍යාලයීය දායකත්වය විමසයි.	
	4.5 දේශීය ගැමි නාටකවල නාට්‍යමය ලක්ෂණ විමසයි.	4.5.1සොකරි 4.5.2 කෝලම් 4.5.3 නාඩගම් 4.5.4 පාස්කු		
	4.6 නූර්ති, මිනර්වා ආදි නාට්‍ය ප්‍රභේදයන් ගෙන් දේශීය නාට්‍ය කලාවේ පෝෂණයට ලැබුණු පිටිවහල වටහාගනියි.	4.6.1 නූර්ති හා ටවර් හෝල් නාට්‍ය 4.6.2 ටීටර් හා මිනර්වා නාට්‍ය		
	4.7 ආදි විශ්වවිද්‍යාලයීය නාට්‍ය අතර වඩාත් කැපී පෙනෙන නාට්‍ය විමසයි.	4.7.1 සිංහල නාට්‍ය කලාවේ ප්‍රගමනය උදෙසා විශ්වවිද්‍යාලයීය දායකත්වය (මනමේ නාට්‍යය තෙක්)		

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
5.0 නාට්‍ය හා රංග කලාව සම්බන්ධ විවිධ නිර්මාණ රසාස්වාදයට හා විචාරයට ලක් කරමින් ජීවිත අත්දැකීම් පෝෂණය කරයි.	5.1 නාට්‍ය පෙළ රසවිඳියි. 5.2 නාට්‍ය පෙළ රංගයක් බවට පත් කර ඇති ආකාරය විමසයි. 5.3 නාට්‍ය කෘති පරිශීලනයෙන් නවජීවන දෘෂ්ටියක් ඇති කරගනියි. 5.4 නාට්‍ය විචාරයේ දී සැලකිය යුතු කරුණු අධ්‍යයනය කරයි. 5.5 නිර්මාණාත්මක විචාර කලාවක් ගොඩ නඟයි. 5.6 වේදිකා නාට්‍ය කලාවේ පැවැත්ම හා වර්ධනය සඳහා ප්‍රේක්ෂක ප්‍රතිචාරවල වැදගත්කම වටහාගනියි.	5.1.1 ඊඩිපස් පෙළ රස විඳීම 5.1.2 කුවේණි පෙළ රස විඳීම 5.1.3 රූකඩ ගෙදර පෙළ රස විඳීම 5.2.1 ඊඩිපස් පෙළ රංගයක් බවට පත් කර ඇති ආකාරය විමැසීම 5.2.2 කුවේණි පෙළ රංගයක් බවට පත් කර ඇති අකාරය විමැසීම 5.2.3 රූකඩ ගෙදර පෙළ රංගයක් බවට පත් කර ඇති අකාරය විමැසීම 5.3.1 ඊඩිපස් නාට්‍යයෙන් මතු වන ජීවන දෘෂ්ටිය විමැසීම 5.3.2 කුවේණි නාට්‍යයෙන් මතු වන ජීවන දෘෂ්ටිය විමැසීම 5.3.3 රූකඩ ගෙදර නාට්‍යයෙන් මතු වන ජීවන දෘෂ්ටිය විමැසීම 5.4.1 නරඹන ලද නාට්‍යයක් විචාරයට ලක් කිරීම 5.5.1 නිර්මාණාත්මක ව නාට්‍ය විචාරයට ලක් කිරීම 5.6.1 ප්‍රේක්ෂක ප්‍රතිචාර පිළිබඳ ව සාකච්ඡා කිරීම	• කාව්‍ය ශාස්ත්‍රය ආශ්‍රය කොට ගෙන ඊඩිපස් නාට්‍ය පෙළ විමසයි. රස විඳියි. • දේශීය නාට්‍ය කලාවේ උසස් නිර්මාණයක් ලෙස කුවේණි නාට්‍යය විමසයි. • රූකඩ ගෙදර නාට්‍යය ඇසුරින් යථාදර්ශී නාට්‍ය පිළිබඳ ව සාකච්ඡා කරයි. • දේශීය හා විදේශීය නාට්‍ය කෘති පරිශීලනය කරයි. • නිර්මාණාත්මක නාට්‍ය විචාරය ප්‍රගුණ කරයි. • නාට්‍ය දෘෂ්ටිය යනු කුමක් දැ යි පැහැදිලි කරයි. • ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයෙහි පෝෂණයට ඉවහල් වන අයුරු විස්තර කරයි.	52

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගැනුම් පල	කාලච්ඡේද
6.0 නාට්‍ය හා රංග කලාව විෂයයට අදාළ සිද්ධාන්ත ප්‍රායෝගික ව අත්හදා බලමින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය කරගනියි.	6.1 විවිධ අත්දැකීම් පාදක කොටගෙන නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරයි.	6.1.1. චින්තනය හා නිර්මාණාත්මක කුශලතා වර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් - මනස සැහැල්ලු කිරීම - සිත එකඟ කරගැනීම - පරිකල්පන හැකියාව වර්ධනය කිරීම 6.1.2 විවිධ භූමිකා අපූර්වත්වයෙන් යුතු ව නිර්මාණය කිරීම	• මානසික ඒකාග්‍රතාව ඇති කර ගැනීම සඳහා අදාළ අභ්‍යාස ප්‍රගුණ කරයි. • පරිකල්පන හැකියාව භූමිකා නිරූපණය සඳහා යොදාගනියි. • රූපණ කුශලතා ප්‍රදර්ශනය කරයි. විවිධ භූමිකා අපූර්වත්වයෙන් යුතු ව නිරූපණය කරයි.	32
7.0 නාට්‍ය හා රංග කලාව විෂයයට අනුබද්ධ ආනුෂංගික කලා අධ්‍යයනය කර වෘත්තීය කුශලතා සංවර්ධනය කරගනියි.	7.1 ආනුෂංගික කලා පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.	7.1.1 ආනුෂංගික කලා - රංගභූමි ආලෝකකරණය - පසුතල නිර්මාණය - සංගීතය - වේෂභූෂණ හා අංග රචනය පිළිබඳ සිද්ධාන්ත අධ්‍යයනය කොට ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදීම	• නාට්‍යයක සාර්ථකත්වය සඳහා ආනුෂංගික කලා යොදාගැනීමේ වැදගත්කම සාකච්ඡා කරයි. • අදාළ සිද්ධාන්ත උපයෝගී කරගනිමින් පසුතල නිර්මාණය කරයි. • වේෂභූෂණ සැලසුම් කරගනිමින් නිර්මාණ කරයි. • නාට්‍යෝචිත සංගීතය භාවිත කරයි. • සෛද්ධාන්තික අංග රචනයෙහි යෙදෙයි.	34

12 ශ්‍රේණිය - නාට්‍ය හා රංග කලාව

පාඩම	කා.	පාඩම	කා.	පාඩම	කා.
1.1	4	3.1.1.4	3	3.3.5.1	3
1.2	4	3.1.1.5.1	3	3.3.5.2	5
1.3	4	3.1.1.5.2	3	3.3.6.1	3
1.4	8	3.1.1.5.3	3	3.3.6.2	3
2.1	6	3.2.1	5	3.3.6.3	3
2.1.2	3	3.3.1	3	3.4.1	3
2.1.3	4	3.3.2	4	3.5.1	3
2.1.4	4	3.3.2.1	3	4.5.1	2
2.2.1	5	3.3.3	3	4.5.2	2
2.3	4	3.3.4	3	4.5.3	2
2.4	4	4.4.1	3	4.5.4	2
3.1	7	4.4.2	3	4.6.1	5
3.1.1.1	4	4.4.3	2	4.6.2	3
3.1.1.2	3	4.4.4	2	4.7	3
3.1.1.3. i	4	4.4.5	2	6.1.1.2	4
3.1.1.3. ii	3	4.4.6	2	6.1.1.3	4
3.1.2	3	4.4.7	2	6.1.1.4	4
4.1.1	3	5.1.2	4	6.1.2.2	4
4.1.2	2	5.1.3	4	6.1.2.3	4
4.1.3	4	5.2.2	4	6.1.2.4	4
4.2.1	3	5.2.3	4	6.1.2.5	4
4.3..1	5	5.3.2	4	7.1.1	8
5.1.1	6	5.3.3	4	7.1.2	8
5.2.1	4	5.4.1	6	7.1.3	2
5.3.1	4	5.5	4	7.1.4	4
		5.6	4	7.1.5	4
		6.1.1.1	4	7.1.6	8
එකතුව	105		91		104

නිපුණතාව 1.0 : කලාව යන්න විමසමින් නාට්‍ය හා රංග කලාව අනෙකුත් කලා සමග සංසන්දනය කරයි.

නිපුණතා මට්ටම 1.1 : කලාව යන්න නිර්වචනය කර වර්ගීකරණයට ලක් කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- කලාව යන්න හඳුන්වයි.
- කලාව නිර්වචනය කරයි.
- කලාවේ ප්‍රභේද දක්වයි.

ක්‍රියාකාරකම : ''කලාව'' යන්න හඳුනාගනිමු.

ගුණාත්මක යෙදැවුම් :
- කලාව පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපි
- කලාවේ විවිධ ප්‍රභේද නිරූපණය කෙරෙන සංයුක්ත තැටි
- විවිධ කලා නිර්මාණවල පින්තූර/පත්‍රිකා

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය
ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

කලාව හැඳින්වීම

''කලාව' යන්න ඉංගිරිසි බසින් "art" යනුවෙන් ද ලතින් බසින් "ars" යනුවෙන් ද, ජර්මන් බසින් "kunst" යනුවෙන් ද හඳුන්වා ඇත. මෙහි පොදු අර්ථය වන්නේ ''කුශලතාව'' යන්න යි. කලාව පිළිබඳ විවිධ නිර්වචන දක්වා ඇතත් එහි ලා පොදු පිළිගැනීමක් නොමැත. සාහිත්‍යයේ ''කලාව'' යන්න නිර්වචනය කොට ඇත්තේ ''අක්ෂර, ලිඛිත ආදි ශිල්ප හැටහතර'' ලෙසිනි.

'කලාව යනු රසිකයා පිනවන අපූර්වත්වයෙන් යුත් සෞන්දර්යාත්මක නිර්මාණයකි' යනු තවත් නිර්වචනයකි.

යම් කාර්යයක කුශලතාවක් ලබන්නා ශිල්පියකු නැතහොත් කලාකරුවකු ලෙස හඳුන්වනු ලැබේ.

කලාකරුවා නාද, වර්ණ, වචන, රේඛා, රිද්ම, ශාරීරික චලන ආදිය මගින් ගද්‍ය පද්‍ය කාව්‍ය, ගීත, චිත්‍ර, නර්තන, සංගීත, කැටයම්, මූර්ති ආදිය නිර්මාණය කරයි. මේවා නිර්මිත කලා වේ.

කලාවේ විවිධ ප්‍රභේද හා වර්ගීකරණ.

* කලාව හා ශිල්ප වශයෙන් කෙරෙන වර්ගීකරණය

කලාව නිර්මාණාත්මක ය. ශිල්ප පුරුදු පුහුණු කළ යුත්තකි. මිනිස් චෛතන්‍යය සමග සම්බන්ධ වන චිත්‍ර, මූර්ති, කාව්‍ය, සංගීත, නාටක ආදි භාව ප්‍රකාශන ශක්තියකින් යුත් නිර්මාණ "කලාව" ලෙසත් එසේ භාව ප්‍රකාශනයෙන් තොර මිනිස් ක්‍රියාකාරකම් "ශිල්ප" ලෙසත් හැඳින්වේ. ප්‍රතිමා ශිල්පය, ගෘහ නිර්මාණ ශිල්පය, කඩු ශිල්පය, දුනු ශිල්පය, මෝස්තර, ලියවැල් මල්වැල් මෙන් ම කැටයම් කලා කෘති ආදිය උදාහරණ ලෙස දැක්විය හැකි ය.

* බාහිර ලක්ෂණ සලකා කෙරෙන වර්ගීකරණය.

- ප්‍රාකෘතික කලා
- ගැමි කලා
- ලලිත කලා

ප්‍රාකෘතික කලාව ප්‍රාග් ඓතිහාසික කලාව යන නමින් ද හඳුන්වනු ලැබේ. මානව ශිෂ්ටාචාරයේ ඉතා ම ඈත යුගවල දී එනම් ප්‍රාකෘතික ජන සමාජවල දක්නට ලැබුණු චිත්‍ර, මූර්ති, අභිචාරමය අරුතින් කරන ලද නැටුම්, ගැයුම් වැයුම් මේ කලාවට අයත් වේ. මේවා මටසිලුටු හා සුඛනම්‍ය බවින් ඌන වීමත් සාර්වභෞමික ව හා සර්වකාලීන ව මිනිසා සමග ආත්මීය වශයෙන් සම්බන්ධ වීමට තරම් ශක්තිමත් නොවීමත් ලලිත කලා ලෙස නොසැලකීමට හේතු වී ඇත.

ජන කලා - ජන සමාජවල බිහි වී වර්ධනය වී තිබෙන සාහිත්‍යය, සංගීතය, චිත්‍ර, මූර්ති, නාට්‍ය ආදි කලා මේ යටතට වැටේ. මේවා ප්‍රාකෘතික කලාවට වඩා යම් ප්‍රමාණයකට මිනිස් චෛතන්‍යය සමඟ ආත්මීය බැඳීමක් ඇති කරවීමට දක්ෂ වුව ද මට සිලුටු බව අඩු වීමත්, මිනිස් සිතේ භාවමය පක්ෂය හා පමණක් සම්බන්ධ වීමත් හේතුවෙන් ලලිත කලා යටතට නොගැනේ. මිනිසා ගේ විඥානය පුළුල් කිරීමෙහි ඇති ශක්තිය මෙම කලාවල දක්නට නොලැබේ. ජන කවි, ජන සංගීතය, සොකරි, කෝලම් ජන නැටුම් වැනි කලාංග (ලී කෙළිය ආදි) ජන කලා ගණයට අයත් යැයි කිව හැකි ය.

ලලිත කලා - මටසිලුටු වූ ද, තමන්ට අයත් මාධ්‍යයන් වඩා නිදහස් ලෙස භාවිත කරන්නා වූ ද මනස හා පරිකල්පනය සමඟ සම්බන්ධ වීම ප්‍රධාන ලක්ෂණය කර ගත්තා වූ ද සංගීත, නර්තන නිර්මාණ සාහිත්‍ය, චිත්‍ර, මූර්ති ආදි කලා ලලිත කලා ලෙස හැඳින්වේ. කාලයෙන් කාලයට යුගයෙන් යුගයට විවිධ කලා බිහි විය හැකි බැවින් ලලිත කලා වශයෙන් කලා මාධ්‍ය කීපයක් නම් කරනවාට වඩා ලලිත කලාව හඳුනා ගැනීමට හැකි වන නිර්ණායක පමණක් සලකා බැලීම වැදගත් වේ.

ගුණාත්මක අංශය සලකා කෙරෙන වර්ගීකරණය

- ජනප්‍රිය කලාව
- ව්‍යාවහාරික කලාව
- ලලිත කලාව

ජනප්‍රිය කලාව - ස්වාභාවික ලෝකයේ මතුපිට ලක්ෂණ කලා මාධ්‍යවල නොගැඹුරු ස්වරූප ඇසුරින් අනුකරණය කෙරෙන කලාව යි. මිනිසුන් තුළ පවත්නා සරල හා නොගැඹුරු සිතිවිලි වස්තු කොට ගන්නා මෙම කලාව ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත්පත වැනි බහුජන මාධ්‍ය ඔස්සේ ලබන ප්‍රචාරය නිසා ඉක්මනින් ජනතාව අතරට යයි.

ව්‍යවහාරික කලාව -- යන්ත්‍ර සූත්‍රවලින් භාණ්ඩ නිපදවීමේ භාණ්ඩ දී ඒවායේ හැඩ හා වර්ණ ආදියට කලාත්මක ලක්ෂණ ඇතුළු කිරීමෙන් ඒ සඳහා වෙළෙඳපොළ ඉල්ලුම වැඩි කර ගැනීම සඳහා මෙන් ම භාණ්ඩ ජනප්‍රිය කරවීම සඳහා යොදා ගනු ලබන පෝස්ටර් හා දැන්වීම් පුවරු ආදිය සඳහා ද කලා මාධ්‍යය යොදා ගැනීම ව්‍යවහාරික කලාව වේ. මෙම කලාව කාර්මික විප්ලවයෙන් පසු ව භාවිතයට පැමිණි බව සඳහන් වුව ද ශිෂ්ටාචාරයේ මුල් යුගවල සිට ම මිනිසා විසින් භාණ්ඩ නිෂ්පාදනයේ දී ඒවාට කලාත්මක ලක්ෂණ ඇතුළු කොට ඇති බව පෙන්වා දිය හැකි ය.

ලලිත කලාව - ඉහත දක්වුණු අන්දමට බාහිර ලක්ෂණ සලකා බලා කෙරෙන වර්ගීකරණයට ද මෙය ඇතුළත් කොට ඇති නමුදු මෙහි දී වඩා පුළුල් අර්ථයකින් මෙම කලාව හඳුන්වා දෙනු ලැබ ඇත. පාඨකයාගේ හෝ ප්‍රේක්ෂකයාගේ හෝ ශ්‍රාවකයාගේ හෝ විඥානය පුළුල් කරමින්, වඩා ගැඹුරු ලෙස ආධ්‍යාත්මික ශික්ෂණය ඇති කිරීමට අපේක්ෂා කෙරෙන මෙම කලාවට සංගීතය, සාහිත්‍යය, චිත්‍ර කලාව, මූර්ති කලාව, නාට්‍ය කලාව, චිත්‍රපට කලාව මෙන් ම ගෘහ නිර්මාණ කලාව අයත් වන බව ද දක්වා ඇත. එනමුදු ගෘහ නිර්මාණ කලාව කොතෙක් දුරට ලලිත කලා ගණයට වැටේ ද යන්න ගැටලු සහගත බව විද්වත්හු පවසති.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- කලාව යන්න හඳුන්වන්න.
- කලාවේ විවිධ ප්‍රභේද උදාහරණ සහිත ව විස්තර කරන්න.

අතිරේක උදවු : විශ්ව කෝෂය - කලාව

නිපුණතාව 1.0 : කලාව යන්න විමසමින් නාට්‍ය හා රංග කලාව අනෙකුත් කලා සමඟ සංසන්දනය කරයි.

නිපුණතා මට්ටම 1.2 : 'ප්‍රාසංගික කලාව'' හඳුන්වයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- ප්‍රාසංගික කලාව යන්න හඳුන්වයි.
- ප්‍රාසංගික කලා නම් කරයි.
- ප්‍රාසංගික කලාවේ මූලික ලක්ෂණ දක්වයි.
- ප්‍රාසංගික කලා අනෙක් කලා හා සසඳයි.

ක්‍රියාකාරකම 1.1.3 : ප්‍රාසංගික කලාව හඳුනා ගනිමු.

ගුණාත්මක යෙදවුම් : ප්‍රාසංගික කලාවන් දක්වෙන සංයුක්ත තැටි, ප්‍රාසංගික කලාව පිළිබඳ පොත්, පත්‍රිකා ආදිය.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම් සැලැසුම් කිරීම සඳහා උපදෙස්:

ප්‍රාසංගික කලාව හැඳින්වීම.

- ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ සජීව ව ඉදිරිපත් කරනු ලබන නිරූපණ කලා ප්‍රාසංගික කලා යනුවෙන් හඳුන්වනු ලබයි.
- ගායනය, රංගනය, චලනය පදනම් කොටගෙන ශිල්පියා ගේ පෞරුෂය මැනවින් හසුරුවා ගනිමින්, රංග භූමියක කෙරෙන නිරූපණ කලාවකි ප්‍රාසංගික කලාව.

ප්‍රාසංගික කලාවේ ප්‍රභේද

- සංගීතය, නර්තනය, නාට්‍ය ප්‍රධාන වේ.
- බැලේ, මුද්‍රා නාට්‍ය, ඔපෙරා, ගීත නාට්‍යය, වීදි නාට්‍යය ආදිය ප්‍රාසංගික කලා ගණයෙහි ලා සලකනු ලැබේ.
- විවිධ අන්තර්ජාල වෙබ් අඩවිවල ජවසරඹ (ජිම්නාස්ටික්), සරඹ සන්දර්ශන, පිහිනුම්, ජල ක්‍රීඩා, මැජික් සන්දර්ශන මෙන් ම වෙනත් ක්‍රීඩා වර්ග ද ප්‍රාසංගික කලා ලෙස නම් කර ඇති නමුදු ඒවා ප්‍රාසංගික කලා ලෙස හැඳින්වීම අපහසු ය. ප්‍රාසංගික කලාවේ මූලික ලක්ෂණ විමසා බැලීමේ දී එයට හේතු සාධක පැහැදිලි වේ.
- ප්‍රාසංගික කලාවේ මූලික නිර්ණායක
  - අභිනය භාවිතය
  - සජීව රංගනයක් වීම.
  - සජීව ප්‍රේක්ෂක පිරිසක් අභිමුඛයෙහි ඉදිරිපත් කිරීම.
  - රංග භූමියක් (නිශ්චිත ව හෝ තාවකාලික ව හෝ) භාවිත කිරීම
  - තම මාධ්‍යයට අදාළ ශිල්ප ධර්ම ශික්ෂණයකින් හා අපූර්වත්වයකින් යුතු ව ඉදිරිපත් කිරීම.
  - විනෝදාස්වාදයක් මෙන් ම ගැඹුරු ජීවන අත්දැකීමක් ගැඹුරු වින්දනයක්, රසයක්, ආනන්දයක් ලබාදීම.
  - මනා ප්‍රාසංගිකත්වයකින් යුක්ත වීම.

- මෙම මූලික ලක්ෂණ අඩුවැඩි වශයෙන් ඉහත දක්වන ලද කලාවන්හි අඩංගු වී ඇති අයුරු සිසුන් සමඟ සාකච්ඡා කරන්න. ඒ අනුව ප්‍රාසංගික කලා ලෙස හඳුනා ගත හැක්කේ කුමන කලාවන් ද යන්න, ඔවුන්ට ම නිදසුන් සහිත ව පැහැදිලි කර ගැනීමට අවස්ථාව සලසන්න.

- සංගීත ප්‍රසංගයක් (**1 රූපය බලන්න**), නර්තන ප්‍රසංගයක්, වේදිකා නාට්‍යයක් වුව ද රූප ගත කර පෙන්වනු ලබන්නේ නම් ප්‍රාසංගික කලා ලෙස නම් කළ නොහැකි ය. සජීවී ප්‍රේක්ෂක සබඳතාවක් නොමැති වීම හේතුවෙන් ප්‍රේක්ෂකයාට වේදිකාව මත සිදුවන සෑම සියුම් සිදුවීමක් ම පියෙවි ඇසින් දැකීමට හැකියාව නොමැති වේ. කැමරා ඇසින් එම සිදුවීම් නැරඹීමට වඩා සජීවී ව නරඹමින් සෘජු සබඳතාවක් පවත්වා ගැනීමට ඔහු වඩාත් කැමති වෙති. පටිගත කරනු ලබන අවස්ථාවේ සජීවී වුව ද ප්‍රේක්ෂකයා වෙතට යොමු වන්නේ තිරයක් මඟින් නම් එය ප්‍රාසංගික කලා යන අර්ථයෙන් බැහැර වේ.

- සංගීතය ප්‍රාසංගික කලාවක් ලෙස

  ඒකල, යුගල හෝ සමූහ හෝ වශයෙන් සංගීත ප්‍රසංග සජීව ප්‍රේක්ෂක ප්‍රතිචාර මැද සුදුසු වේදිකාවක ඉදිරිපත් කරනු ලැබේ. ගායකයා හෝ ගායක පිරිස හෝ විවිධ චලන සමඟ ගායනය ඉදිරිපත් කරති. ගායකයා ගයන විට වෙනත් පිරිසක් නර්තනය ඉදිරිපත් කරන අවස්ථා ද බහුල වේ. පසුබිම් සංගීතය, විවිධ ආලෝක වර්ණ යොදා ගැනීම, සිත් ගන්නා සුලු ඇඳුම් පැළැඳුම් යනාදි ආනුෂංගික අංග භාවිත කරමින් ප්‍රේක්ෂකයාට අපූර්ව වින්දනයක් ලබා දෙමින් මේ ප්‍රසංග ඉදිරිපත් කරනු ලැබේ.

- ''නර්තනය'' ප්‍රාසංගික කලාවක් ලෙස

  සජීවී ව, ප්‍රේක්ෂක පිරිසක් අබියස නර්තන ශිල්පීන් විසින් ඉදිරිපත් කරනු ලබයි. ආංගික, ආහාර්ය, සාත්ත්වික අභිනය ප්‍රධාන කොට ගන්නා අතර පසුබිම් ගායන යොදා ගැනේ. තාල වාද්‍ය භාණ්ඩ ප්‍රධාන කොටගත් පසුබිම් සංගීතය ද යොදා ගැනේ. වේදිකා සැරසිලි, අංගරචනය, වේෂභූෂණ, පසුතල නිර්මාණ සහ රංගාලෝකය ද යොදා ගනිමින් අපූර්වත්වයෙන් යුක්ත ව ප්‍රේක්ෂකයා පිනවීම පිණිස ඉදිරිපත් කරනු ලැබේ.

- නාට්‍යය ප්‍රාසංගික කලාවක් ලෙස

  ශ්‍රව්‍ය - දෘශ්‍ය සජීව කලා මාධ්‍යයක් වන නාට්‍ය කලාවේ දී සතර අභිනය යොදා ගනු ලබන අතර ප්‍රේක්ෂක සහභාගිත්වය අනිවාර්ය වේ. ඉහත ප්‍රාසංගික කලා වන සංගීතය හා නර්තනය ද නාට්‍ය කලාවෙහි අඩු වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර ශෛලිය අනුව එය වෙනස් වේ. වේෂභූෂණ, අංග රචනය, ආලෝකකරණය, රංගභූමි අලංකරණය ආදි ආනුෂංගික අංග යොදා ගනිමින් වේදිකාවක් මත හෝ වෙනත් තෝරාගත් ස්ථානයක හෝ ඉදිරිපත් කරනු ලබන මෙම කලාව මිනිසා ආනන්දයෙන් ප්‍රඥාවට යොමු කරමින් මනා වින්දනයක් ලබාදීමට සමත් වේ.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ප්‍රාසංගික කලා යන්න හඳුන්වන්න.
- ප්‍රාසංගික කලා නම් කරන්න.
- ප්‍රාසංගික කලාවේ මූලික නිර්ණායක දක්වන්න.

නිපුණතාව 1.0 : කලාව යන්න විමසමින් නාට්‍ය හා රංග කලාව අනෙකුත් කලා සමග සංසන්දනය කරයි.

නිපුණතා මට්ටම 1.3 : ප්‍රාසංගික කලා හා වෙනත් කලා අතර වෙනස පැහැදිලි කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- ප්‍රාසංගික කලා යන්න පැහැදිලි කරයි.
- ප්‍රාසංගික කලා වෙනත් කලා අතරින් වෙන් කොට හඳුනා ගනී.
- ඒ ඒ කලාවල වෙනස්කම් පැහැදිලි කරයි.

ක්‍රියාකාරකම : ප්‍රාසංගික හා වෙනත් කලා අතර වෙනස හඳුනා ගනිමු.

ගුණාත්මක යෙදැවුම් :
- ප්‍රාසංගික කලාව හා වෙනත් කලා පිළිබඳ විස්තර ඇතුළත් ලිපි, පොත්
- ඒ ඒ කලාවලට අදාළ සංයුක්ත තැටි

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස්:

- යම් කලාවක් ප්‍රාසංගික කලාවක් ලෙස හැඳින්වීමට මූලික නිර්ණායක පද්ධතියක් ඇති බව පසුගිය පාඩමේ දී උගත් බැවින්, වෙනත් කලා හඳුනාගැනීමට හා ඒවායේ මූලික ලක්ෂණ ප්‍රාසංගික කලාවල ලක්ෂණවලින් වෙනස් වන අයුරු හඳුනාගැනීමට සිසුන් යොමු කරවන්න.

- ගද්‍ය, පද්‍ය, කාව්‍ය, ගීත, චිත්‍ර, කැටයම්, මූර්ති මෙන් ම වේදිකා නාට්‍ය, ටෙලි නාට්‍යය චිත්‍රපට, ගීත නාට්‍යය, ඔපෙරා, බැලේ, මුද්‍රා නාට්‍යය, වීදි නාට්‍යය, රූකඩ ආදි වශයෙන් විවිධ කලා ඇති අතර එම කලා විවිධ ප්‍රභේද යටතේ ඉහත දක්වා ඇත. ඒවා අතුරින් ඇතැම් කලා ප්‍රාසංගික කලා ලෙස නම් නොකිරීමට හේතු සාධක හඳුනාගැනීමට සිසුන්ට පැහැදිලි අවබෝධයක් ලබාදිය යුතු වේ. එබැවින් ඒ ඒ කලාවල ඇති මූලික ලක්ෂණ හා ප්‍රාසංගික කලාවේ මූලික නිර්ණායක හොඳින් හඳුනාගෙන විවිධ කලා අතුරින් ප්‍රාසංගික කලා වෙන් කොට දැක්වීමට සිසුන් යොමු කරවන්න.

- චිත්‍ර, මූර්ති, කැටයම් දෘශ්‍ය කලා වන අතර ඒවා සජීව ව ඉදිරිපත් නොකිරීම, ඍජු ප්‍රේක්ෂක සම්බන්ධයක් නොමැති වීම, ප්‍රාසංගිකත්වයෙන් ඈත් වීම ආදි කරුණු ප්‍රාසංගික කලා නොවීමට හේතු වන බව පැහැදිලි කරන්න.

  නවකතා, කෙටිකතා ඇතුළු වෙනත් සාහිත්‍ය කෘති (ගද්‍ය කෘති) රසිකයන්ට කියවා හෝ අසා රස විඳීමට නිර්මාණය කොට ඇත. පන්සිය පනස් ජාතක පොත උදාහරණයක් ලෙස ගතහොත් මෙය අසා රස විඳීමට නූගත් ජනයාට පවා හැකි වී ඇත. කාව්‍ය, පද්‍ය නිර්මාණ ද එසේ ම වේ. මෙම කලා ප්‍රාසංගික කලාවලින් වෙන් කොට හඳුනාගැනීමට එම කරුණු ඉවහල් වේ.

  චිත්‍රපට, ටෙලිනාට්‍ය, කාටූන් යන කලා ද කැමරා ඇසින් දකින දේ, අජීව ව ප්‍රේක්ෂකයා වෙතට ප්‍රක්ෂේපණය කරයි. මෙහි දී ප්‍රේක්ෂකයා නරඹන්නේ සැබෑ රූපය නොවේ. කැමරා කරු ගේ ඇසට වඩාත් ප්‍රිය වන දේ නැරඹීමට ප්‍රේක්ෂකයන්ට සිදු වේ. එය පටිගත කරන අවස්ථාවේ සජීව රංගනයක් හෝ රූපණයක් හෝ විය හැකි ය. එහෙත් ප්‍රේක්ෂකයා වෙතට දෘශ්‍යමාන වන්නේ තිරයක් මත ය. අභිවාහකයකු මගින් සජීව ව ඍජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලබමින් ඉදිරිපත් නොකරන කලා වුව ද, නරඹන්නන්ට අපූර්වතම වින්දනයක් ලබා දෙන මෙම කලාව අතරේ ප්‍රාසංගික කලාවට මූලාශ්‍රය සපයන මෙන් ම අත්දැකීම් ලබා දෙන කලාංග ද දක්නට ලැබේ. එම කලාවන් පදක කොට ගෙන ප්‍රාසංගික කලා නිර්මාණ බිහි වී ඇත. උදාහරණ ලෙස නවකතා, කෙටිකථා, ඓතිහාසික කථා, ජාතක කථා තේමා කොටගෙන නාට්‍ය සකස් වී ඇත.

එමෙන් ම විවිධ කාව්‍ය, පද්‍ය නිර්මාණ ගීත ගායනා ලෙසින් සංගීත ප්‍රසංගවල දී සජීවී ව ප්‍රසංගාත්මක ලෙස ඉදිරිපත් කරනු ලැබේ. මෙහි දී ගායකයා, චලනය, නර්තනය සමඟ ගායනය යොදා ගනිමින්, සජීවී ව ප්‍රේක්ෂක ප්‍රතිචාර මැද එම ගීත ගායනා කරමින් මනා වූ රසවින්දනයක් ප්‍රේක්ෂකයාට අත්කර දෙයි.

මේ අනුව ප්‍රේක්ෂක සහභාගිත්වය, සාමූහික ක්‍රියාවක ඵලයක් වීම, සජීවීව ඉදිරිපත් කිරීම, ආවේණික ශෛලියක් යොදා ගනිමින් රූපණය සඳහා ම නිර්මාණය වීම, නිශ්චිත ස්ථානයක ඉදිරිපත් කිරීම, මුල, මැද, අග මනා ලෙස ගැළපෙන කතා වස්තුවක් තිබීම, සතර අභිනය අඩු වැඩි වශයෙන් භාවිත කිරීම, මාධ්‍යයට අදාළ ශිල්ප ධර්ම ශික්ෂණයකින් හා අපූර්වත්වයෙන් යුතු ව ඉදිරිපත් කිරීම, මනා ප්‍රාසංගිකත්වයකින් යුක්ත වීම සහ ප්‍රේක්ෂකයාට මනා වින්දනයක් ලබාදීම යන කරුණු කවර හෝ කලාවක ගැබ් වී ඇත්නම් එය ප්‍රාසංගික කලාවක් වන බව උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. එසේ නොමැති විවිධ කලා ප්‍රාසංගික කලා ලෙස නම් නොකරන බව ද උදාහරණ සහිත ව හඳුන්වා දෙන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ප්‍රාසංගික කලා හා වෙනත් කලා අතර වෙනස පැහැදිලි කරන්න.
- උදාහරණ සපයමින් ප්‍රාසංගික කලා හා වෙනත් කලා පිළිබඳ ව විස්තර කරන්න.

නිපුණතාව 1.0 : කලාව යන්න විමසමින් නාට්‍ය හා රංග කලාව අනෙකුත් කලා සමඟ සංසන්දනය කරයි.

නිපුණතා මට්ටම 1.4 : සෙසු ප්‍රාසංගික කලා සහ නාට්‍ය කලාව අතර ඇති වෙනස පැහැදිලි කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- ප්‍රාසංගික කලා අතර නාට්‍ය කලාවට හිමි ව ඇති ස්ථානය පැහැදිලි කරයි.
- වේදිකා නාට්‍යයේ ප්‍රාසංගික ලක්ෂණ පැහැදිලි කරයි.
- නාට්‍ය කලාවේ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.

ක්‍රියාකාරකම : සෙසු ප්‍රාසංගික කලා හා නාට්‍ය කලාව සසඳයි.

ගුණාත්මක යෙදවුම් :
- වේදිකා නාට්‍යවල පිටපත් හා සංයුක්ත තැටි
- සංගීත, නර්තන, බැලේ, මුද්‍රා නාට්‍ය, ගීත නාට්‍යවල ද සංයුක්ත තැටි කීපයක්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

ප්‍රාසංගික කලා අතර වඩා පුළුල් වූ නිරූපණ කලාව වේදිකා නාට්‍ය කලාව වේ. නාට්‍ය කලාවේ දී නළු-නිළියන් විසින් සතර අභිනය ම උපයෝගී කරගෙන, ප්‍රේක්ෂකයාට ළඟා කර දීමට බලාපොරොත්තු වන රසය, වින්දනය හෝ අනුභූතිය හෝ සජීවී ව ඉදිරිපත් කරනු ලැබේ. බොහෝ අවස්ථාවල අනෙක් ප්‍රධාන ප්‍රාසංගික කලාංග දෙක වන සංගීතය හා නර්තනය යොදා ගනිමින් ප්‍රේක්ෂකයා වෙතට අසීමිත ආස්වාදයක් ළඟා කර දීමට නාට්‍යය සමත් වේ. ප්‍රාසංගික කලා අතරේ නාට්‍යය සුවිශේෂ වීමට, සජීව රංගනයක් වීම හා සජීව ප්‍රේක්ෂක පිරිසක් අබියස ඉදිරිපත් කිරීම හේතු වේ. නළුවා හෝ නිළිය හෝ තම ශරීරය ප්‍රධාන මෙවලම කොටගෙන, කටහඬ මනස සවිඥානක ව පාලනය කරගනිමින්, ප්‍රේක්ෂකයා සමඟ සහසම්බන්ධයක් ගොඩනඟා ගනිමින්, ප්‍රේක්ෂක ප්‍රතිචාර මධ්‍යයේ තම රංගන සිදු කරයි. සංගීතය, නර්තන වැනි කලාවල දී කාලය සීමිත බැවින් ප්‍රේක්ෂකයා සමඟ භාවාත්මක ව බැඳීමේ අවකාශ හීන වුව ද නාට්‍ය කලාවේ දී ඉතා සියුම් ආකාරයෙන් මිනිස් මනස හා බැඳීමට මෙන් ම ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වීමට ප්‍රේක්ෂකයාට මනා ඉඩක් ලැබේ. එමෙන් ම ප්‍රේක්ෂකයාට වැඩි තෘප්තියක් ළඟා කර දීම ද ප්‍රාසංගික කලාවේ වැදගත් සාධකයකි. නාට්‍ය කලාවේ දී වේදිකාවක් භාවිත කරමින් ප්‍රේක්ෂාගාරයක් අබියස රංගනය කිරීම හේතුවෙන් සෙසු අභිනයන් සමඟ ආහාර්ය අභිනය මැනවින් භාවිත කිරීමට ද, ප්‍රේක්ෂකයාට මනා ප්‍රේක්ෂාවක් ලබාදීමට ද, ආලෝකය හා හඬ පාලනය සම්බන්ධ තාක්ෂණික උපක්‍රම මැනවින් භාවිත කිරීමට ද, බාහිර ක්‍රියාකාරකම් හේතුවෙන් සිදු වන අවධානය බිඳීයාම වැළැකීමට ද, ප්‍රේක්ෂකයා හා පාත්‍රවර්ගයා එක අරමුණක පිහිටුවා ගැනීමට ද හැකියාව ලැබේ. මිනිසා ගේ හැසිරීම් රටාව, මනුෂ්‍ය ස්වභාවය හා එහි සංකීර්ණ බව, ගුප්ත බව, විවිධ ආවේග හා මනෝභාව නළු-නිළියන් විසින් සජීව ව වේදිකාව මත එම මොහොතේ ම මවා පෙන්වන බැවින් චරිත අතර මානව සබඳතා ඔවුනොවුන් ගේ සිතිවිලි, හැඟීම්, ආකල්ප ආදිය ප්‍රේක්ෂකයා ගේ හෘදය ස්පර්ශය කරයි. සෘජු ප්‍රේක්ෂක සහභාගිත්වය නාට්‍යයක දී මෙන් ම අනෙක් ප්‍රාසංගික කලාවන්හි දී ද අත්‍යවශ්‍ය වුව ද නාට්‍ය කලාවේ දී එය දැඩි බලපෑමක් නිර්මාණය කෙරෙහි එල්ල කරයි. නාට්‍යයේ ඉදිරි පැවැත්ම ද රඳා පවතින්නේ ප්‍රේක්ෂක ප්‍රතිචාර මත වන අතර ම නාට්‍යයේ වෙනස්වීම් පවා සිදු කිරීමට හේතු වන අවස්ථා ඇත. ප්‍රේක්ෂකයා රසිකයකු, විචාරකයකු මෙන් ම නාට්‍යයේ විනිසුරුවකු ද වීම නාට්‍ය කලාවේ විශේෂත්වයකි.

එමෙන් ම සංගීත, නර්තන වැනි කලාවන් ඒකල වශයෙන් ඉදිරිපත් කළ හැකි වුව ද නාට්‍යය සාමූහික කලාවකි, සාමූහික ක්‍රියාකාරිත්වයක ඵලයකි. මුද්‍රා නාට්‍යවල, බැලේ **(අංක 2 රූප සටහන් බලන්න)** නාට්‍යවල වාචිකාභිනය නොමැත. එහෙත් වේදිකා නාට්‍යය සතර අභිනය ම උපයෝගී කර ගනිමින්, අනෙකුත් ආනුෂංගික කලාවන් රැසක් ම භාවිත කරමින් මනා සුසංයෝගයකින් ඉදිරිපත් කරනු ලැබේ. තම මාධ්‍යයට අදාළ ශිල්පධර්ම ශික්ෂණයකින් හා අපූර්වත්වයෙන් යුතු ව ඉදිරිපත් කිරීමට ද නාට්‍ය කලාවේ දී වගබලා ගනු ලැබේ.

නාට්‍යය මනා ප්‍රාසංගිකත්වයකින් යුක්ත වීම ද අත්‍යවශ්‍ය කරුණකි. නාට්‍ය කලාවේ දී නළුවා හෝ නිළිය හෝ මෙහි දී මුඛ්‍ය සාධකය වේ. තම ශරීරයේ රිද්මය, හඬ, ශක්තිය හා නම්‍යශීලිත්වය උපයෝගී කර ගනිමින් විදහා දක්වන ප්‍රාසංගිකත්වය අන් සියල්ලක් ම අබිබවා යයි. රංගභූමිය භාවිත කිරීම පිළිබඳ දැනුම, ශිල්ප ක්‍රම ප්‍රගුණ කිරීම මනා පෞරුෂයකින් යුක්ත වීම, කාලය හා අවකාශය පිළිබඳ අවබෝධය, අනුබද්ධ කලා පිළිබඳ දැනුම යන කරුණු වේදිකාව මත සිය රංගනයේ ප්‍රාසංගිකත්වය ප්‍රකට කිරීමෙහි ලා උපකාරී වේ. සෑම ප්‍රාසංගික කලාවක ම ප්‍රාසංගික බව අත්‍යවශ්‍ය අංගයක් වන අතර ම නාට්‍ය කලාවේ දී එය වඩාත් කැපී පෙනේ.

එසේ ම නාට්‍යයට පෙළක් තිබිය යුතු වීම ද විශේෂ ලක්ෂණයකි. සංගීතය හා නර්තනය සඳහා එවැනි පෙළක් භාවිත නොකළ ද සංගීතය හා නර්තනය මූලික කොට ගෙන කරනු ලබන බැලේ, ඔපෙරා, ගීත නාට්‍ය, මුද්‍රා නාට්‍ය සඳහා යම් කිසි පෙළක් උපයෝගී කරගැනේ. කිසියම් අවස්ථාවක්, සිද්ධියක්, අත්දැකීමක් පදනම් කොටගෙන නාට්‍ය පෙළක් නිර්මාණය කෙරෙන අතර ම එම පෙළ නාට්‍ය නිර්මාණයට හා රස වින්දනයට මෙන් ම විචාරයට ද මූලික පදනම වේ. පෙළෙහි ප්‍රබලත්වය සාර්ථක නිර්මාණයකට වඩාත් බලපායි.

ප්‍රාසංගික කලාවක් විනෝදය ලබා දෙන්නක් විය යුතු ය යන සංකල්පය බොහෝ ප්‍රාසංගික කලාවලින් ප්‍රකට වේ. වේදිකා නාට්‍යයක දී විනෝදය මෙන් ම ඉන් ඔබ්බට යන පුළුල් ජීවිත අත්දැකීමක්, පරිඥානයක් ප්‍රේක්ෂකයාට අත්කර දෙනු ලැබේ.

ප්‍රාසංගික කලාවක් සතු ව තිබිය යුතු සෑම ගුණාංගයක් ම නාට්‍ය කලාවේ අඩංගු ව ඇති අතර ම අනෙකුත් ප්‍රාසංගික කලාවලට වඩා සුවිශේෂ අංග කීපයක් ද ඇති බව ඉහත කරුණු අනුව පැහැදිලි වේ.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ප්‍රාසංගික කලාවන් අතර නාට්‍යයට හිමි තැන උදාහරණ සහිත ව දක්වන්න.
- නාට්‍ය කලාවේ සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.

නිපුණතාව 2.0 : නාට්‍ය හා රංග කලාව විෂයය පිළිබඳ න්‍යායාත්මක පදනම ප්‍රගුණ කරයි.

නිපුණතා මට්ටම 2.1 : නාට්‍ය හා රංග කලාව යන්න විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- නාට්‍ය කලාවේ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- නාට්‍ය කලාව, පෙළ, සජීව බව, ඍජු ප්‍රේක්ෂක සහභාගිත්වය යනාදි කරුණු ඔස්සේ අනෙක් කලා අබිබවා යන ආකාරය මතු කොට දක්වයි.
- නාට්‍ය පෙළ රචනා කරයි.
- කලාවන් අතර නාට්‍යයට හිමි ස්ථානය පිළිබඳ අවබෝධ කරගනී.
- නාට්‍ය රඟ දැක්වීමට කැමැත්ත දක්වයි.

ක්‍රියාකාරකම : නාට්‍යය යනු කුමක් ද?

ගුණාත්මක යෙදවුම් :
- විවිධ නාට්‍ය පිටපත්
- වේදිකා නාට්‍ය ඇතුළත් සංයුක්ත තැටි
- නවකතා

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය - විවෘත ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- නවකතා හා නාට්‍ය පිටපත් කියවීමට ලබා දීමෙන් ද, නාට්‍ය සංයුක්ත තැටි නැරඹීමට අවස්ථාව සැලසීමෙන් ද පාඩම වෙත සිසු අවධානය යොමු කරගන්න. අනතුරු ව සිසුන් සමඟ සාකච්ඡා කිරීමේ දී පහත දැක්වෙන විෂය කරුණු ද සහාය කරගන්න.
- නාට්‍ය කලාවේ දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයක් වනුයේ නාට්‍ය පෙළක් හෙවත් පිටපතක් භාවිත කිරීම ය.

  කිසියම් අවස්ථාවක්, සිද්ධියක් හෝ අත්දැකීමක් හෝ පාදක කොටගෙන නාට්‍ය පෙළක් රචනා කරයි.

  නාට්‍ය නිර්මාණයට, රස වින්දනයට මෙන් ම විචාරයට ද මූලික පදනම වන්නේ නාට්‍ය පෙළ ය. රංගනය මතු කරගැනීමටත්, අවස්ථා මවා ගැනීමටත්, චරිතවල අභ්‍යන්තර හා බාහිර ස්වභාවය මෙන් ම රංග රටාව වටහා ගැනීමටත් නාට්‍ය පෙළෙහි එම රංග විධාන වඩාත් වැදගත් වෙයි.

  පෙළෙහි ඇතුළත් රංග විධාන, වේෂභූෂණ ශිල්පියාට ද, පසුතල නිර්මාණ ශිල්පීන්ට ද, නාට්‍යෝපකරණ නිර්මාණකරුවන්ට ද, සංගීතඥයන්ට මෙන් ම රංගාලෝක ශිල්පීන්ට ද උපදෙස් සපයයි.

  නාට්‍ය පිටපතක ප්‍රබලත්වය සාර්ථක නාට්‍ය නිෂ්පාදනයකට වඩාත් බලපායි.
- අනෙකුත් ප්‍රාසංගික කලා අතුරෙන් නාට්‍ය කලාවෙහි සුවිශේෂ ලක්ෂණයක් ලෙස ''සජීව බව'' කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

  මිනිසා ගේ හැසිරීම් රටාව, මනුෂ්‍ය ස්වභාවය හා එහි සංකීර්ණ ස්වභාවය, ගුප්ත බව, දුක, ශෝකය ආදි විවිධ ආවේග හා මනෝභාව නළු-නිළියන් විසින් සජීව ලෙස වේදිකාව මත ඒ මොහොතේ ම මවා පෙන්වනු ලැබේ. ඒ අනුව නාට්‍යය දර්ශන වාරයක් පාසා ම නවතාවකින් යුතු වෙයි. පාත්‍ර වර්ගයා ගේ රූපණ විධි නවතාවකින්, වෙනසකින් යුතු වෙයි.

නාට්‍යය හා සුසංයෝගී වන ආනුෂංගික කලා භාවිතය ද ඒ ඒ දර්ශන සඳහා දායක කරගත යුතු ය. ඒ සඳහා ශිල්පීන් ගේ සහභාගිත්වය නිරතුරු ව ම ලබාගත යුතු ය. සංගීතඥයෝ, ශබ්ද මෙහෙයවන්නෝ පසුතල සවි කිරීම්, පසුතල ඉවත් කිරීම්, තිර භාරකරුවෝ, රංගාලෝක ශිල්පීහු අංග රචනා ශිල්පීහු සෑම නාට්‍ය දර්ශනයක් සඳහා ම සහභාගි විය යුත්තාහ.

නිශ්චිත වූ ස්ථානයක දී, නිශ්චිත වූ කාල සීමාවක් තුළ නාට්‍යය නැරඹිය යුතු ය. නාට්‍යය නැරඹීම සඳහා ප්‍රේක්ෂකයන් විශේෂ සූදානමකින් යුතු ව ප්‍රේක්ෂාගාරයට පිවිසිය යුතු වේ.

චරිත අතර මානව සබඳතා ඔවුනොවුන් ගේ සිතිවිලි, හැඟීම්, ආකල්ප ආදිය ප්‍රේක්ෂකයා ගේ හදවතට දනේ. ප්‍රේක්ෂාගාරය වනාහි කිසියම් තේමාවක් / දෘෂ්ටියක් ප්‍රේක්ෂක හදවත්වලට සම්ප්‍රේෂණය කළ හැකි භූමියකි.

- වේදිකා නාට්‍යයක දැකිය හැකි තවත් ප්‍රබල සාධකයක් වනුයේ සෘජු ප්‍රේක්ෂක සහභාගිත්වය යි. ප්‍රේක්ෂක සහභාගිත්වය නාට්‍යයක් සඳහා අත්‍යවශ්‍ය ම සාධකයකි. නාට්‍යයේ පැවැත්ම රඳා පවත්නේ ප්‍රේක්ෂක ප්‍රතිචාර මත ය.

  ප්‍රේක්ෂක ප්‍රතිචාර මත නාට්‍යයේ වෙනස් වීම් පවා සිදු වූ අවස්ථා බොහෝ ය. මුල් යුගයේ රූකඩ ගෙදර (Doll's house) නාට්‍ය අවසන් වූයේ නෝරාට තම නිවසින් බැහැර යාමට ඉඩ නොදීමෙනි. ඒ පිළිබඳ ව අප්‍රසාදය පළ කළ ප්‍රේක්ෂකයෝ නාට්‍යාවසානයේ දී නෝරා නිවස හැර යාම අනුමත කළ හ. සෝමලතා සුබසිංහයන් ගේ ''තොප්පි වෙළෙන්දා'' නාට්‍යය පෙර පාසල් දරුවනට ප්‍රදර්ශනය කළ අවස්ථාවක දී, වඳුරන්ට තොප්පි අහිමිවීම ඔවුන් ගේ දැඩි කනස්සල්ලට හේතු වූයෙන් වඳුරන්ට එක් එක් තොප්පිය බැගින් ලබාදීමෙන් ප්‍රේක්ෂක සන්තුෂ්ටිය ඇති කරදීමට නිෂ්පාදිකාවට සිදු වූයේ ය.

  ප්‍රේක්ෂාගාරය තුළ සිනහාව දුක, භීතිය ප්‍රතික්ෂේප කිරීම ('හූ' හඬ) වහා පැතිර යයි.

  ප්‍රේක්ෂකයා රසිකයකු, විචාරකයකු මෙන් ම නාට්‍යයේ විනිශ්චයකරුවෙක් ද වන්නේ ය.

- නාට්‍යය වනාහි අනෙකුත් කලාංගවලින් පෝෂණය වන පරායත්ත කලාවකි. එහි පැවැත්ම උදෙසා සාහිත්‍යය, සංගීතය, නර්තනය වැනි ආනුෂංගික කලාංග බද්ධ විය යුතු ය.
- නාට්‍යය කිසි දු විටෙක ගබඩා කර තැබිය හැකි ද නොවේ. එසේ ගබඩා කර තැබිය හැක්කේ නාට්‍ය පිටපත පමණකි. එහෙත් එය සජීව නාට්‍ය දර්ශනයක් නොවේ.
- වේදිකා නාට්‍යය එක වරක දී ප්‍රදර්ශනය කළ හැකි වනුයේ එක් ස්ථානයක දී පමණකි.
- නාට්‍ය කලාව වනාහි ප්‍රදර්ශනය කරනු ලබන වාරයක් පාසා ම (සහභාගි වන සියලු දෙනාට ම) නැවත නැවත ප්‍රතිලාභ ලැබිය හැකි කලාවකි.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- වේදිකා නාට්‍යයක දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ නිදසුන් සහිත ව විස්තර කරන්න.
- නවකතාවක හා නාට්‍ය පෙළක ඇති සමාන-අසමානතා පිළිබඳව සාකච්ඡා කරන්න.

නිපුණතාව 2.0 : නාට්‍ය හා රංග කලාව විෂයය පිළිබඳ න්‍යායාත්මක පදනම ප්‍රගුණ කරයි.

නිපුණතා මට්ටම 2.1 : නාට්‍ය හා රංග කලාව යන්න විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව :

ඉගෙනුම් පල :
- නෘත්ත, නෘත්‍ය හා නාට්‍යය යනු කුමක් ද යි වාච්‍යාර්ථය අනුව ප්‍රකාශ කරයි.
- නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය අතර පවත්නා අසමානතා පිළිබඳ ව කරුණු දක්වයි.
- නෘත්ත, නෘත්‍ය හා නාට්‍යය පිළිබඳ ව ලියැවී ඇති ග්‍රන්ථ පරිශීලනය කරයි.
- සාමාන්‍ය අංග චලනයක හා අර්ථාන්විත මෙන් ම නිර්මාණාත්මක වූත් ප්‍රකාශනයක වෙනස හඳුනාගනියි.

ක්‍රියාකාරකම 2.1.2 : නෘත්ත, නෘත්‍ය, නාට්‍ය හඳුනා ගනිමු.

ගුණාත්මක යෙදැවුම් :
- භරත නාට්‍යම්, මනිපුරි, උඩරට, පහතරට නැටුම් සහිත පින්තූර, සාත්ත්වික අභිනය ප්‍රකට කරන නාට්‍යයක නළු-නිළියන් දැක්වෙන පින්තූර.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය - ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

ගුණාත්මක යෙදැවුම් සඳහා සකසා ගත් පින්තූර ප්‍රදර්ශනය කරමින් පාඩමට සිසු අවධානය යොමු කර ගන්න.

- නෘත් හා නට් ධාතුවලින් නෘත්ත, නෘත්‍ය, නාට්‍ය යන වචන උත්පාදනය ව ඇත.
- නෘත්ත යනු, ශුද්ධ නැටුම හෙවත් රිද්මානුකූල ව කෙරෙන අංග චලනය යි. එහි අභිනයෙන් කියැවෙන කිසි දු අර්ථයක් නැත. නෘත්තයෙහි ඇත්තේ අර්ථයක් ප්‍රකාශ නොවන රිද්මයක් පමණකි. මෙය ඉංග්‍රීසියෙන් Pure Dance නම් වේ.
- උඩරට නැටුම්හි බොහෝ විට දක්නට ලැබෙන්නේ නෘත්ත ලක්ෂණයකි. තාලාන්විත බව හා දෘශ්‍ය රූපයෙහි සුන්දරත්වය ඒවාහි දක්නට ඇත. කිසි දු භාවයක් මුහුණෙන් ප්‍රකට කරන්නේ නැත. නර්තනයක දැකිය හැකි සුන්දරත්වය එම නර්තනයන්ගෙන් ප්‍රකට වෙයි.
- නෘත්‍යය යනු ආංගික හා සාත්ත්වික අභිනය මාර්ගයෙන් කිසියම් භාවයක් ප්‍රකාශ වන නර්තනයකි. එය මෙලෙස ''අභිනය දර්පණයෙහි'' සඳහන් වේ.

  ''(නර්තකිය) මුවින් ගීතය ගයන්නී ය, හස්තයෙන් අර්ථය ප්‍රකට කරන්නී ය, දෑසින් භාවය දක්වන්නී ය, දෙපයින් තාලය තබන්නී ය.''

  මේ අනුව රිද්මානුකූල චලන සමග අත්, පා, ඇස්, මුහුණ මගින් භාවයන් ප්‍රකාශ වන නර්තන විශේෂය නෘත්‍ය නම් වේ.

  භරත නාට්‍යම්, මනිපුරි, පහතරට නැටුම් ආදිය ආංගික හා සාත්ත්වික අභිනයට අනුරූපී ව මනෝභාව ප්‍රකාශ කරයි. මේ අනුව නෘත්‍යයෙහි රිද්මයක් ද, අර්ථයක් ද, මනෝභාවයක් ද ඇත. මෙය ඉංග්‍රීසි භාෂාවෙන් Dance නමින් හැඳින්වේ.

  (ආඞ්ගිකාභිනයෙරෙව භාවානෙවව්‍යක්ති යත්

  තන්නෘත්‍යං මාර්ගශ්වේදෙන ප්‍රසිද්ධං නෘත්‍යවේදිනාම්

ආසෙයනාලම්බයෙද් ගීතං හස්තේනාර්ථං ප්‍රදර්ශයෙන්

චක්ෂුර්භ්‍යාං දර්ශයෙද් භාවං පාදාභ්‍යාං තාලාමාචරෙන්)

(අභිනය දර්පණ - 36)

- චලනවලට පමණක් සීමා නොවී චතුර්විධ අභිනය භාවිතයෙන් කිසියම් අවස්ථාවක් හෝ සිද්ධියක් හෝ නිරූපණය කිරීම නාට්‍යය නම් වේ. එහි දී අත්දැකීම් සමූහයක්. පාත්‍ර වර්ගයා මාර්ගයෙන් ප්‍රේක්ෂකයන් ඉදිරියේ අපූර්වත්වයෙන් යුතු ව රූපණය කෙරෙන්නේ නාට්‍යයෙහි ය. වේදිකාවක් මත, ප්‍රේක්ෂකයන්ගේ රස ජනනය උදෙසා ක්‍රියා සහ සංවාද ස්වරූපයෙන් ඉදිරිපත් කරනු ලබන, ලෝක ස්වභාවය හුවා දැක්වීම නාට්‍යය වශයෙන් හැඳින්වේ.

  ඉංග්‍රීසි භාෂාවෙන් නාට්‍යය යන්න හැඳින්වෙන්නේ Drama යනුවෙනි.

  (චතුර්ධාභිනයොපෙතං ලක්ෂණාවෘත්තිනො බුධෛඃ

  නර්තනං නාට්‍යමිත්‍යුක්තං සර්වත්‍රාභිනයෝ භවෙත්)

  විවිධ විද්වතුන් විසින් නාට්‍යය පිළිබඳ ව දක්වනු ලැබූ නිර්වචන කීපයක් පහත දැක්වේ.

  1. ''නාට්‍යය යනු ක්‍රියාවක් අනුකරණය කිරීමයි.'' - ඇරිස්ටෝටල් / භරතමුනි
  2. ''නාට්‍යය ජීවිතයේ පිටපතෙකි. සිරිත් විරිත්වල කැටපතෙකි.'' - ඇලඩයිස් නිකොල්
  3. ''නාට්‍යය යනු ලෝකයා ගේ පැවැත්ම අනුකරණය කිරීමකි.'' - භරතමුනි
  4. ''නාට්‍යය යනු ලෝකයේ සුඛ දුක්ඛ යන දෙකෙන් ම යුක්ත වූ යම් ස්වභාවයක් පවතී ද, එය අංග ආදි අභිනයෙන් ප්‍රකාශ කිරීම යි.'' - භරතමුනි
  5. ''නාට්‍ය යනු අවස්ථා අනුකරණය කිරීමකි.'' - ධනංජය
  6. ''නාට්‍ය යනු ජීවිතයේ පැතිකඩකි.'' - බර්නාඩ් ෂෝ
  7. ''නාට්‍යය වූ කලී සංගීතය, නර්තනය, දෙබස්, රඟපෑම්, වේෂභූෂණ, අංගරචනා ආදි කලාත්මක මාධ්‍යයන් මඟින් ප්‍රේක්ෂකයා තුළ කිසියම් සෞන්දර්යාත්මක අත්දැකීමක් දනවීමට යත්න දරන්නා වූ, සම්පූර්ණයෙන් වෙනස් වූ කලාත්මක නිර්මාණයකි.'' - අභිනව ගුප්ත -

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නෘත්ත, නෘත්‍ය හා නාට්‍යය යනු නිදසුන් සපයමින් පැහැදිලි කරන්න.
- ''නාට්‍යය'' පිළිබඳ ව පෙර'පර දෙදිග විද්වතුන් ගේ මත විචාරශීලී ව ගවේෂණය කරන්න.

නිපුණතාව 20 : නාට්‍ය හා රංග කලාව විෂයය පිළිබඳ න්‍යායාත්මක පදනම ප්‍රගුණ කරයි.

නිපුණතා මට්ටම 2.1 : නාට්‍ය හා රංග කලාව යන්න විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- අභිනය යන්නෙහි අර්ථය ප්‍රකාශ කරයි.
- චතුර් අභිනය පිළිබඳ ව කරුණු විමසයි.
- නාට්‍යයක අභිනය භාවිත කර ඇති ආකාරය විමර්ශනය කරයි.
- ඒ ඒ අභිනය ප්‍රකට කිරීමට අදාළ රංග අභ්‍යාසවල නිරත වෙයි.
- සතර අභිනය නිරූපණය කෙරෙන පින්තූර රැස් කරයි.

ක්‍රියාකාරකම 2.1.3 : සතර අභිනය හඳුනා ගනිමු.

ගුණාත්මක යෙදවුම් : වාචික, ආංගික, සාත්ත්වික හා ආහාර්ය අභිනය නිරූපණය කෙරෙන පින්තූර සංයුක්ත තැටි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය - ග්‍රන්ථ පරිශීලනය හා සාකච්ඡාව

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ගුණාත්මක යෙදවුම් වශයෙන් රැස් කරගත් පින්තූර හා සංයුක්ත තැටි ප්‍රදර්ශනය කරමින්, පහත සඳහන් කරුණු ද ප්‍රයෝජනයට ගනිමින් සිසුන්ට අවබෝධයක් ලබා දෙන්න.

- නාට්‍ය පෙළක්, රංගනයක් ලෙස ප්‍රේක්ෂකයා හමුවට ගෙන යාමේ දී, නළුවන් විසින් අනුගමනය කරනු ලබන ශිල්ප ක්‍රම ''අභිනය'' නමින් හඳුන්වනු ලැබේ.

  අභි - ඉදිරියට

  නය - පැමිණවීම

  යන අදහසින් අභිනය යන වචනය අර්ථවත් වේ. අභිනය සතර විධියකි. එනම් ආංගික, වාචික, සාත්ත්වික හා ආහාර්ය වශයෙනි. මෙහි දී මුල් අභිනය විධි තුන ම පාත්‍ර වර්ගයා විසින් ම ස්වකීය ශරීරය උපයෝගී කර ගනිමින් ප්‍රදර්ශනය කළ යුතු වේ. ආහාර්ය අභිනයේ දී නළුවා ගේ රූපණ කාර්යය වඩාත් ඔපවත් කර ගැනීම පිණිස නළුවා වෙත බැහැරින් ලබා දෙන අංග ඇතුළත් වෙයි.

- ආංගික අභිනය

  නළුවා වේදිකාවට පැමිණ සිය අංග ප්‍රත්‍යංග හා උපාංග භාවිත කරමින් අදහසක් ප්‍රකාශ කිරීම ආංගික අභිනය යනුවෙන් හැඳින්වේ.

  සංස්කෘත නාට්‍යයෙහි ආංගික අභිනය, ප්‍රධාන ප්‍රභේද හතරක් වශයෙන් දක්වා ඇත. එනම් චාරී, ස්ථානක, හස්ත හා කරණ වශයෙනි. නළුවන් ගේ පාද චලන ''චාරී'' නම් වේ. පාද, ජංඝා, කලව හා තුනටියේ චලන සහිත පාද චලන හෙවත් පියවර තැබීම මෙලෙස විග්‍රහ කළ හැකි ය. පාද චලන සහිත ව සිරුරේ අඟ පසඟවල ද සංයෝගයෙන් නිරූපණය කරනු ලබන ගමන් විලාස ද ආංගික අභිනය ලෙස හැඳින්විය හැකි ය.

  වේදිකාවේ සිට ගන්නා ක්‍රම හෙවත් ඉරියවු ස්ථානක යනුවෙන් හැඳින්වේ. ආශිර්වාද කිරීම, දුනුදිය ඇදීම, අහසින් යාම, අසුන් ගැනීම, ඇතු පිට යාම, මල්ලව පොර, අවි මුදා හැරීම වැනි ඉරියවු නිදසුන් වශයෙන් සැලකිය හැකි ය. හස්ත යනු අත් සහ ඇඟිලි භාවිතයෙන් කරනු ලබන සංකේතාත්මක හා නාට්‍යධර්මීගත චලන වේ. මෘග ශීර්ෂ, සර්ප ශීර්ෂ, නෙළුම් පොහොට්ටුව, අඩ සඳ, හංසයාගේ හැඩ ආදිය පෙන්වීම සඳහා විශේෂ හස්ත (මුද්‍රා) ක්‍රම ද, අහස, වැස්ස, රහස් කීම, යන්න, එන්න වැනි විධාන කිරීම් ද නිදසුන් ලෙස දැක්විය හැකි ය.

  හිසේ හා කඳේ චලන ද සහිත ව චාරී හා හස්තවල සංයෝගයෙන් කෙරෙන ඉදිරිපත් කිරීම් ''කරණ'' නම් වෙයි. සර්පයකුට බිය වී පලා යාම, වේදිකාව මත මල් විසුරුවීම, ආයාචනා කිරීම වැනි අවස්ථාවල දී කරණ ඉදිරිපත් කිරීම් සිදු වේ.

- වාචික අභිනය

  නාට්‍යයේ අන්තර්ගතය ප්‍රේක්ෂකයන් වෙත ගෙන යාම සඳහා භාවිත වන සංවාද, ගීත, ස්වගත ආදිය වාචික අභිනය ලෙස සැලකිය හැකි ය. නාට්‍යධර්මී සම්ප්‍රදායයේ දී පසුතල ආදිය මවාපානු ලබන්නේ වාචික අභිනය මාර්ගයෙනි. වාචික අභිනය උච්චාරණය කරන විධි පිළිබඳ ඉඟි නාට්‍ය පිටපතෙහි සඳහන් ය. රහසින්, ශබ්ද නගා, උස් හඬින්, ගොත ගසමින් යන රංග විධාන මෙන් ම විරාම ලක්ෂණ ද අනුව වාචික ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ විලාසය වටහා ගත හැකි ය.

  සාමාන්‍ය කතාබහ චිත්ත අභ්‍යන්තරය හෙළිදරවු කිරීම රහස් හුවමාරුව, පිරිසක් එකට දොඩමලු වීම, වේදිකාවෙන් බැහැර මනඃකල්පිත පුද්ගලයන් සමඟ කෙරෙන කතා බහ. රහස්‍ය කථන ආදි ක්‍රම මඟින් වාචික අභිනය භාවිත කරනු ලබයි.

- සාත්ත්වික අභිනය

  චිත්ත ඒකාග්‍රතාවෙන් යුතු ව සියුම් භාවයන් නිරූපණය කිරීම මෙනමින් හඳුන්වනු ලැබේ. ''සත්ත්ව'' යනු මිනිසා ගේ මනෝභාවයන් ගේ ප්‍රකාශනය පාලනය කරන්නා වූ ධර්මතාවකි. එය ප්‍රදර්ශනය කරනු ලබන්නේ සාත්ත්වික අභිනය මඟිනි.

  ''නාට්‍යශාස්ත්‍ර'' නම් වූ සංස්කෘත විචාර ග්‍රන්ථයෙහි පහත සඳහන් ආකාරයෙන් සාත්ත්වික භාව අටක් දක්වා ඇත.

  1. ස්තම්භ - ශරීරය දරදඬු වීම
  2. රෝමාංච - රෝම සෘජු වීම
  3. වේපථු - සර්වාංගය වෙවුලීම
  4. ස්වරභංග - කටහඬ බිඳීම
  5. ස්වේද - දහඩිය දැමීම
  6. අශ්‍රු - කඳුළු වැටීම
  7. වෛවර්ණ්‍යය - සිරුරේ පැහැය වෙනස් වීම
  8. ප්‍රලය - සිහිමූර්ච්ඡාව

  අපට ජීවිතයේ දී මුහුණ පාන්නට සිදුවන යම් යම් හදිසි, අසීරු අවස්ථාවල දී ඉහත සඳහන් කළ ලෙස ප්‍රතික්‍රියා එකක් හෝ වැඩි ගණනක් හෝ නිරුත්සාහයෙන් ම අප තුළ ඇති විය හැකි ය.

  සාත්ත්වික භාවය නිරූපණය කරන නළුවා දැඩි චිත්ත ඒකාග්‍රතාවකින් යුතු ව එය ඉදිරිපත් කළ යුතු වෙයි. හොඳ සිහි කල්පනාවකින් යුතු ව මෙම භාවයන් ඉදිරිපත් කිරීම නළුවා ගේ වගකීමකි. කඳුළු සැලීම, දහදිය දැමීම, රෝම සෘජු වීම, සිරුර දරදඬු වීම, සිහිමූර්ච්ඡා වීම, සිරුරේ පැහැය වෙනස් වීම ආදි රූපණ තාත්ත්වික අයුරින් නිරූපණය කිරීම දුෂ්කර කාර්යයකි. එවන් අවස්ථාවන්, වෙනත් චරිත මඟින් ප්‍රේක්ෂකයන් ගේ දැනගැනීම උදෙසා ප්‍රකාශ කිරීම අවශ්‍ය වේ.

- ආහාර්ය අභිනය

  නළුවාට උපකාරී වන ඇඳුම්- පැළැඳුම් නාට්‍යෝපකරණ, අංග රචනය, සංගීතය, පසුබිම් සැරසිලි, තිර, රංගාලෝකය වැනි ආනුෂංගික අංග ආහාර්ය අභිනය ලෙස සැලකේ. සැබෑ වස්තූන් අනුකරණයෙන් සාදා ගනු ලබන උපකරණ ආදිය නාට්‍යෝපකරණ යනුවෙන් හඳුන්වනු ලැබේ. මේ සඳහා සැහැල්ලු ද්‍රව්‍ය යොදා ගැනීම සුදුසු ය. ලෝහ, තද අරටු සහිත ලී ආදියෙන් නිර්මාණය කරනු ලබන උපකරණ භාවිතය නළුවාට වෙහෙසකර වීමට ඉඩ ඇත.

  නිදසුන් වශයෙන් පලතුරු, මල් ආදිය සකසා ගැනීම උදෙසා ලබු කටු, රෙදි, මී ඉටි හෝ ලාක්ෂා යොදා ගැනීමෙන් සැහැල්ලු බව ලබා ගත යුතු ව ඇත.

කඩු, තුවක්කු, පලිස්, දුනු, හී මෙන් ම පුස්තක ද, දුම්වැටි, පයිප්ප, වේවැල ආදි අතේ ගෙන යන භාණ්ඩ ද, පසුබිම් දර්ශන මෙන් ම ගෘහ භාණ්ඩ ද ආහාර්ය අභිනය ප්‍රදර්ශනය කරන්නකි. 'කැලණි පාලම' නම් වූ නාට්‍යයෙහි පසුතලයෙහි පාලම් ඇන්ද, පදික වේදිකාව, ජල කරාමය ද, පාර දෙසට නැමුණු විදුලි පහන් කණුව ද පැල්පත් දෙක ද අයත් වන්නේ ආහාර්ය අභිනය යන කොටසට ය.

සංස්කෘත නාට්‍යයේ එන විදූෂක අතේ ගෙන යන දණ්ඩකාෂ්ඨය හෙවත් වකුටු සැරයටිය දිවුල්, බෙලි නැතහොත් උණ ලීයෙන් සකස් කර ගනු ලබන්නකි.

මූලික වශයෙන් නළුනිළියන් හඳුනාගත හැක්කේ වේෂභූෂණ මඟිනි. නාට්‍යයේ ශෛලිය ද චරිත ස්වභාවය මෙන් ම ජාතිකත්වය, සමාජ තරාතිරම, නිල මට්ටම යනාදි තොරතුරු වේෂ භූෂණ මඟින් ගම්‍යමාන වේ. ඇඳුම් මෙන් ම පැලඳුම් වන හිස් පලඳනා, රවුළු, හිසේ තලප්පා, මල් දම් මඟින් ද චරිත ස්වභාවය හඳුනාගත හැකි වේ. ආහාර්ය අභිනයේ දී අංග රචනා ශිල්පය ද වැදගත් ස්ථානයක් උසුලයි. ප්‍රධාන අංග රචනා මාධ්‍ය වනුයේ වර්ණාලේප ය. ඒ ඒ චරිත සඳහා වර්ණ භාවිතය සංකේතාත්මක වේ. වර්ණයෙන් චරිතයක වයස, දේශය, තරාතිරම හා සමාජ තත්ත්වය නිරූපණය වේ. අංගරචනය මඟින් චරිතයකට තමා ගේ පුද්ගල භාවය සඟවා ගෙන අන්‍ය භූමිකාවක් ආරෝපණය කරගත හැකි ය.

පසුතලය, අවස්ථා හෝ චරිත වඩාත් අර්ථවත් කිරීම පිණිස රංගාලෝකය යොදා ගනු ලැබේ. රංගාලෝකයේ සහායෙන් පාත්‍රයන් ගේ රංග කාර්යය වඩාත් පහසු වී ඇත.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ඔබ මෑතක දී නැරඹූ නාට්‍යයක සතර අභිනය භාවිත කර ඇති ආකාරය සාකච්ඡා කරන්න.
- ඔබ නාට්‍යයක් නිෂ්පාදනය කරන්නේ නම් ''ආහාර්ය අභිනය'' දායක කර ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු මොනවා දැයි අනුපිළිවෙළින් පහදන්න.

පැවරුම : වෝල්ටර් මාරසිංහ - සංස්කෘත නාට්‍ය සම්ප්‍රදාය හා රත්නාවලී
නාට්‍යශාස්ත්‍ර, xxi වැනි අධ්‍යාය

නිපුණතාව 20 : නාට්‍ය හා රංග කලාව විෂයය පිළිබඳ න්‍යායාත්මක පදනම ප්‍රගුණ කරයි.

නිපුණතා මට්ටම 2.1 : නාට්‍ය හා රංග කලාව යන්න විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :

- සාමාන්‍ය ව්‍යවහාරයේ දී ''නාට්‍ය'' යන පොදු පදයෙහි නාට්‍ය රචනය මෙන් ම වේදිකාව මත සිදු වන ක්‍රියාවලිය ද ඇතුළත් වන බව ප්‍රකාශ කරයි.
- නාට්‍ය හා රංග කලාව යන විෂයය හැදෑරීමේ දී එහි අධ්‍යයනයට පදනමක් ලෙස මෙම දෙපදය ශාස්ත්‍රීය වශයෙන් වෙන වෙන ම අර්ථ දැක්වුව ද එම පද දෙක මඟින් ඉදිරිපත් වනුයේ එකිනෙකට බද්ධ වී බිහි වූ නාට්‍ය නිර්මාණය යන සංකල්පය බව පැහැදිලි කරයි.
- විෂය අධ්‍යයනයේ දී ''නාට්‍ය'' යන්නට පෙළ නිර්මාණ ක්‍රියාවලිය සහ ඊට පදනම් වන මූලධර්ම, සිද්ධාන්ත ඇතුළු ලෝක නාට්‍ය කලාවේ විවිධ සම්ප්‍රදාය හා ප්‍රභේද වැනි අංග ඇතුළත් බව ප්‍රකාශ කරයි.
- විෂය අධ්‍යයනයේ දී රංග කලාව යන්නට වේදිකාව මත රංගනය අරමුණු කොටගත් නාට්‍ය පෙළ සහ එය රඟදැක්වීම සඳහා යොදාගනු ලබන නළු-නිළි රංගනය, සෙසු ආනුෂංගික අංග සහ ප්‍රේක්ෂක සහභාගිත්වය ද ඇතුළත් බව ප්‍රකාශ කරයි.
- තව දුරටත් ''නාට්‍ය' යන්නෙන් පොදුවේ නාට්‍ය මූලධර්ම පදනම් කොටගත් නාට්‍ය පෙළක් වේදිකාවට මෙන් ම රූපවාහිනිය, ගුවන් විදුලිය වැනි විවිධ මාධ්‍යවලට ගැළපෙන ආකාරයට ද ඉදිරිපත් කළ හැකි බව ප්‍රකාශ කරයි.
- රංග කලාව යන්නට රඟපෑම සහ ආනුෂංගික කලා ඇතුළත් ඔපෙරා, බැලේ, මුද්‍රා නාට්‍ය, ඉඟි නළුව වැනි සෙසු ප්‍රාසංගික කලා ද අයත් බව පැහැදිලි කරයි.
- රංග ශෛලිය, විචාරය වැනි සංකල්ප නාට්‍ය මූලධර්ම කොටසට මෙන් ම රංග කලාව යන ප්‍රායෝගික කොටස සමඟ ද එකිනෙකට සම්බන්ධ වන බව ද පැහැදිලි කරයි.

ක්‍රියාකාරකම 2.1.4 : නාට්‍ය හා රංගකලාව යන්න විමසීම.

ගුණාත්මක යෙදවුම් : ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ Drama යන පදයට අරුත් දක්වන කොටස (විවිධ නිර්වචන) අන්තර්ජාලයේ Drama, Theatre යන පද අරුත් දැක්වෙන කොටස (විවිධ නිර්වචන).

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය - ග්‍රන්ථ පරිශීලනය හා නිරීක්ෂණ

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්:

- සාමාන්‍ය පොදු ව්‍යවහාරයේ දී ''නාට්‍ය'' යන වදනින් නාට්‍ය පෙළ මෙන් ම වේදිකා නිෂ්පාදනය ද අදහස් කෙරේ.

  නිදසුන් : අපි මනමේ නාට්‍යය කියවල රස වින්දා
  අපි මනමේ නාට්‍යය බලන්න යනවා
  මෙහි දී ''නාට්‍ය'' යන්නෙන් නාට්‍ය පෙළත්, වේදිකා නිෂ්පාදනයත් දෙක ම අර්ථ ගැන්වේ.

- නාට්‍ය හා රංග කලාව විෂය හැදෑරීමේ දී, විශේෂයෙන් විෂය නිර්දේශ සකස් කිරීමේ දී මෙම ''නාට්‍ය'' යන පදයත් රංග කලාව යන පදයත් ශාස්ත්‍රීය වශයෙන් වෙන වෙන ම අර්ථ දැක්වීමත් කෙරේ. එහෙත් නාට්‍ය රචනයේ සිට නිෂ්පාදන ක්‍රියාවලිය තෙක් ප්‍රායෝගික තලයේ දී මෙය වෙන වෙන ම ක්‍රියාත්මක නො වේ. නාට්‍ය හා රංග කලාව යන සංකල්ප එකිනෙකට සහසම්බන්ධ එක ම ක්‍රියාවලියක් ලෙස ක්‍රියාත්මක වේ. නිදසුනක් ලෙස මනමේ නාට්‍ය

පෙළෙහි කුමාරයා කුමරිය ගෙන් කඩුව ඉල්ලන අවස්ථාව ගැටුම මුල් කරගත් දෙගිඩියාව හා අවිනිශ්චිත බව මඟින් නිර්මාණය කර ඇත. ඒ අනුව මෙම අවස්ථාව නාට්‍ය මූලධර්ම අනුව නිර්මාණය කළ ද එය පෙළෙහි ඇත්තේ රඟ දැක්වීම අරමුණු කොටගෙන ය. ඒ සඳහා නළු-නිළි රංගන දායකත්වය මෙන් ම ඇඳුම්, පැලඳුම්, අංග රචනය, නාට්‍යෝපකරණ, සංගීතය වැනි ආනුෂංගික කලාවල දායකත්වය ද ලබා ගැනේ. මෙලෙස නාට්‍ය යන සංකල්පයත් රංග කලාව යන සංකල්පයත් මනා ව සුසංයෝජනය වීම මඟින් සමස්ත නාට්‍ය නිර්මාණය බිහි වන බව අවබෝධ කරගත යුතු ය.

- විෂය අධ්‍යයනය කිරීමේ දී නාට්‍ය යන කොටසට නාට්‍ය පෙළ රචනය සඳහා පදනම් වන නාට්‍ය වස්තුව, තේමාව, චරිත නිරූපණය, ගැටුම, සංවාද, රංග විධාන, නාට්‍ය උත්ප්‍රාසය වැනි අංග හා මූලධර්ම ඇතුළත් වේ. නාට්‍යය (Drama) යන්න නිර්වචනය කිරීමේ දී භූමිකා හෝ චරිතාන්තර ගැටුම්කාරී අවස්ථා හෝ මඟින් කතාවක් නිරූපණය කර දක්වීම යි යන්නෙන් එය තවදුරටත් පැහැදිලි වේ. ඒ හැරෙන්නට ලොව බිහි වී ඇති විවිධ නාට්‍ය සම්ප්‍රදාය ද 'නාට්‍ය' යන්නෙන් අරුත් ගැන්වේ.

  උදා: ග්‍රීක නාට්‍ය කලාව, ඇමරිකානු නාට්‍ය කලාව ආදිය.

  නාට්‍ය යන කොටසට විශේෂයෙන්, පැරණි හා නූතන නාට්‍ය ප්‍රභේද හැදෑරීම ද අයත් වේ. පැරණි නාට්‍ය ආකෘති ලෙස ට්‍රැජඩි, කොමඩි, සැටර්, ප්‍රහසන දැක්විය හැකි ය. නූතන නාට්‍ය ආකෘති ලෙස ස්වාභාවික, යථාර්ථවාදී, අසම්මත දැක්විය හැකි අතර එම නාට්‍ය ආකෘති කෙරෙහි බලපෑම් කළ රීති ලෙස ප්‍රකාශනවාදී, සංකේතවාදී, අධිතාත්ත්වික යන රීති ගත හැකි ය. එසේ ම නූතන නාට්‍ය ප්‍රවණතා ලෙස ආඛ්‍යාන (Eipc), දිළිඳු රංගය, කුරිරු රංගය සහ විකාරරූපී රංගය දැක්වේ. එසේ ම වර්තමාන අවශ්‍යතා සැලකිල්ලට ගෙන සංවාද මණ්ඩප නාට්‍ය, බ්ලැක් බොක්ස් රංගනය වැනි විවිධ මාදිලි ද නාට්‍ය ආකෘති අතර තිබේ. නාට්‍ය යන කොටසට ගැටුම, ලෝකධර්මී හා නාට්‍යධර්මී ශෛලි ආදි නාට්‍ය මූලධර්ම හැරෙන්නට අනුකරණය, සමාරෝපය වැනි සිද්ධාන්ත හැදෑරීම ද අයත් වේ.

  විෂය අධ්‍යයනයේ දී රංග කලාව යන්නට රචනය, රඟපෑම සහ නිෂ්පාදනය යන ත්‍රිවිධ කාර්ය අයත් වේ. මෙහි දී නාට්‍ය රචනය නාට්‍ය මූලධර්ම අනුව ගොඩනැඟීම සිදු වූවත් එහි අරමුණු වනුයේ එය වේදිකාව මත ප්‍රේක්ෂකයන්ට රඟ දැක්වීම සඳහා නිර්මාණය කිරීම යි. ඒ නිසා රචකයා ගෙන් ඇරඹෙන ඒ කාර්යය සම්පූර්ණ කරනු ලබන්නේ රංග කලාවෙහි ප්‍රධාන අංගය වූ නිෂ්පාදන ක්‍රියාවලියේ මූලික වගකීම දරන අධ්‍යක්ෂවරයා යි.

  රංග කලාව යන්නට අයත් වන නළුනිළි රංගනය මඟින් පෙළ අර්ථය වේදිකාව මත රංගයක් බවට පත් කෙරේ. එය භාවපූර්ණ හා අර්ථපූර්ණ ලෙසත් මනා ප්‍රේක්ෂාවකින් යුතුව ත් නිර්මාණය කිරීම සඳහා ඇඳුම් පැලැඳුම්, අංග රචනය, වේදිකා පසුතල, සංගීතය, රංගාලෝකය නාට්‍යෝපකරණ වැනි ආනුෂංගික කලාවල දායකත්වය ලබා ගැනේ. ඒ හැරෙන්නට රංග වින්‍යාසය, හඬ, විවිධ ආලෝක හා තාක්ෂණික උපක්‍රම ද රංග කලාවට අයත් ය.

  නාට්‍ය හා රංග කලාව විෂය පුළුල් ව හැදෑරීම සඳහා මේ අංග ද්වය වෙන වෙන ම අරුත් දැක්වීමකට භාජනය කර ඇති බව අවබෝධ කරගත යුතු ය. එසේ ම 'නාට්‍ය' යන්නට මෙහි දී රේඩියෝ, රූපවාහිනී නාට්‍ය ද එම අදාළ මාධ්‍ය අනුව ඇතුළත් බව ද සැලකිල්ලට ගත යුතු ය. එසේ ම රංග කලාව යන්නට රඟපෑම සහ ආනුෂංගික කලා ඇතුළත් ඔපෙරා, බැලේ, මුද්‍රා නාට්‍ය හා ඉඟිනළුව ද ඇතුළත් වේ. මේවා මාධ්‍ය වශයෙන් වෙනස් වුව ද 'නාට්‍ය' මූලධර්ම අනුව සකස් වී ඇත.

  රංග ශෛලිය හා විචාරය වැනි සංකල්ප නාට්‍ය මූලධර්ම කොටසට මෙන් ම රංග කලාව යන ප්‍රායෝගික කොටස සමග ද එකිනෙකට සම්බන්ධ වේ.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නාට්‍ය හා රංග කලාව විෂය හැදෑරීමේ දී 'නාට්‍ය' යන සංකල්පයට අයත් විෂය කොටස් නම් කරන්න.
- 'රංග කලාව' යන සංකල්පයට අයත් විෂය කොටස් නම් කරන්න.
- මෙම සංකල්ප දෙක මනා ව සුසංයෝජනය කිරීම මඟින් නාට්‍ය නිර්මාණයක් බිහි වන අයුරු ඔබ දුටු නාට්‍යයක් ඇසුරු කොට ගෙන පැහැදිලි කරන්න.

නිපුණතාව 2.0 : නාට්‍ය හා රංග කලාව විෂයය පිළිබඳ න්‍යායාත්මක පදනම ප්‍රගුණ කරයි.

නිපුණතා මට්ටම 2.2 : නාට්‍ය කලාව හා සම්බන්ධ පාරිභාෂික වචන අර්ථ නිරූපණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගැනුම් පල :
- රංග කලාවේ මූලිකාංග හා ලක්ෂණ පැහැදිලි කරයි.
- එම මූලික ලක්ෂණ නාට්‍යයට බලපාන ආකාරය විස්තර කරයි.
- නරඹන ලද නාට්‍යයක් ආශ්‍රිත ව ඉහත හඳුනා ගත් ලක්ෂණ සාකච්ඡා කරයි.
- රූපණ කාර්යය සාර්ථක ව ඉදිරිපත් කිරීම සඳහා තාක්ෂණික උපක්‍රම යොදා ගත හැකි ආකාරය නිරීක්ෂණය කරයි.
- ප්‍රේක්ෂකයකු වශයෙන් ස්වකීය වටිනාකම පිළිබඳ ව තෘප්තිමත් වෙයි.

ක්‍රියාකාරකම 2.2.1 : නාට්‍ය හා රංග කලාවේ මූලිකාංග විමැසීම.

ගුණාත්මක යෙදැවුම් :
- විවිධ ආකාරයේ රංගභූමිවල පින්තූර
- පසුතල අලංකරණ සහිත රංගභූමිවල ඡායාරූප
- රංගාලෝක උපකරණවල පින්තූර හෝ ඡායාරූප
- වේෂ භූෂණ, අංග රචනා ආදියට නිදසුන් වන රූප සටහන් හෝ ඡායාරූප
- ඉහත දැක්වුණු අංග සහිත දෘශ්‍ය පට
- නාට්‍ය පිටපත් කිහිපයක්

ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය - නිරීක්ෂණය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ඉහත කී ආකාරයට රැස් කරගත් ගුණාත්මක යෙදැවුම් වරින් වර ප්‍රදර්ශනය කරමින්, රංග කලාවේ මූලිකාංග හඳුන්වා දීමට පහත දැක්වෙන කරුණු ද ප්‍රයෝජනයට ගන්න.
- නාට්‍ය පෙළ

  නාට්‍යෝචිත කතාවක්, අවස්ථාවක්, සිද්ධියක් හෝ එවැනි අවස්ථා, සිද්ධි කීපයක් හෝ රංගෝචිත ලෙස ලියා සකස් කරගත් විට එය නාට්‍ය පෙළ යනුවෙන් හැඳින්වේ.
- බොහෝ අවස්ථාවල නාට්‍ය පෙළක කතා වස්තුවක් තිබේ. එසේ නොවන අවස්ථා ද දක්නට ලැබේ.
- නාට්‍යය, රඟ දක්වා පෙන්වීම සඳහා නිර්මාණය කරන්නක් බැවින් නාට්‍ය පෙළ හුදෙක් ප්‍රේක්ෂකයා අරමුණු කරගෙන නිර්මාණය විය යුතු ය. නාට්‍ය පිටපත රූපණය සඳහා ම නිර්මාණය වූවකි.
- එහෙත් නාට්‍ය පෙළ කියවීමෙන් වුව ද කෙනෙකුට එක්තරා ආකාරයක රසාස්වාදයක් අත්දැකිය හැකි අතර, එම රසය නාට්‍යය නැරඹීමෙන් ලැබෙන රසයට වඩා හාත්පසින් ම වෙනස් ය.
- ලිඛිත පිටපතක් වන මෙය සංවාද වලින් හා රංග විධානවලින් සමන්විත ය.
- අවස්ථා ප්‍රතිනිර්මාණය කිරීම සඳහා නළුනිළියනට මෙකී සංවාද හා රංග විධාන සහිත නාට්‍ය පෙළ අවශ්‍ය වේ.
- නාට්‍යයක් නිර්මාණය කළ හැකි විභව ශක්තියක් නාට්‍ය පෙළ තුළ ඇත.
- නාට්‍ය පෙළ පදනම් කරගෙන නාට්‍ය නිර්මාණය එළි දකී.
- නාට්‍ය පෙළක් ලිවීමේ දී ඒ සඳහා වාච්‍යාර්ථය අබිබවා ව්‍යංග්‍යාර්ථ දනවන ප්‍රාණවත් බස් වහරක් යොදා ගත යුතු ය.
- වාචිකාභිනය සඳහා පාදක වන්නේ නාට්‍ය පෙළ බැවින්, නාට්‍ය නිර්මාණයක් සඳහා පෙළ ඉතා වැදගත් වේ.

නාට්‍ය අධ්‍යක්ෂ / නිෂ්පාදක

- නාට්‍ය නිෂ්පාදනය සම්බන්ධ ව මූලික වගකීම දරනු ලබන්නේ නාට්‍ය අධ්‍යක්ෂවරයා ය.
- නාට්‍ය රචකයා විසින් ලියා තබන ලද නාට්‍ය පිටපත සජීව කලාවක් හැටියට වේදිකාවේ ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා මූලික වන්නේ අධ්‍යක්ෂවරයා ය.
- එක ම නාට්‍ය පිටපතක් විවිධ අර්ථකථන මතු කරමින් නිර්මාණය කිරීමට අධ්‍යක්ෂවරයාට නිදහස තිබේ.
- නිෂ්පාදන ක්‍රියාවලියේ දි අධ්‍යක්ෂවරයා ශිල්පීන් රාශියක ගේ සහයෝගය ලබාගත යුතු බව ය.
- නාට්‍ය පෙළ ආශ්‍රිත ව නිෂ්පාදන පිටපත සකස් කරගැනීමත්, එය නාට්‍යයට සම්බන්ධ සියලු දෙනා සමඟ සාකච්ඡා කර අරුත් සියල්ල මතු කර, පැහැදිලි කරගැනීමත් නාට්‍ය අධ්‍යක්ෂ ගේ කාර්යභාරයකි.
- නාට්‍ය අධ්‍යක්ෂවරයා බොහෝ අය සමග සුහද ව කටයුතු කරන, එහෙත් තම අදහස් යට කිරීමට ඉඩ නොතබන සොඳුරු ආඥාදායකයකු ලෙස හැඳින්විය හැකි ය.
- නිෂ්පාදන පහසුව තකා අධ්‍යක්ෂවරයා සහාය අධ්‍යක්ෂවරයකු ගේ සේවය ලබාගනී.
- නාට්‍යයේ මුදල් හා සම්බන්ධ කටයුතු වෙනුවෙන් අධ්‍යක්ෂවරයා ගේ කැමැත්ත මත මුදල් වියදම් කරන්නකු (අර්ථපතියකු) යොදාගත හැකි ය.
- අප රටේ බොහෝ විට අධ්‍යක්ෂවරයා හා නිෂ්පාදකවරයා එක් තැනැත්තෙක් වෙයි. ඇතැම් විට පෙළ රචනය ද ඔහු ගේ ම කාර්යයක් වී ඇත.
- නළුනිළියන් දිරි ගැන්වීම, ඔවුන් ගේ උපරිම ඵලදායිතාව ලබාගැනීම, ඉවැසීම, නව යෝජනා හා අදහස් මැදහත් සිතින් ඉවැසීම, නළු-නිළියන්ට රංගනයේ දී නිදහස් ව ක්‍රියා කිරීමට ඉඩදීම ආදි ගුණාංග අධ්‍යක්ෂවරයා සතු ව පැවතිය යුතු ය.

රංග භූමිය

- රංග පීඨය, රඟමඬල, කරළිය, වේදිකාව ආදි නම්වලින් හැඳින්වෙන මෙය ආගමික ඇදහිලි හා පුද පූජා සමඟ බිහි වූවකි.
- මුලින් වෘත්තාකාර භූමියක් රංග භූමිය වශයෙන් යොදා ගැනුණු අතර, ක්‍රමයෙන් එය පින්තූර රාමු වේදිකාව තෙක් විකාශය විය.
- ග්‍රීසියේ දියෝනීසස් රඟහල, එළිමහන් රංග පීඨයක් වූ අතර, එහි ප්‍රධාන ලක්ෂණ වශයෙන් ප්‍රේක්ෂාලය (Theatron) ඕර්කෙස්ට්‍රාව (Orchestra) වේදිකා ගෘහය (Skene) හැඳින්විය හැකි ය.
- රෝම රඟමඬලෙහි ප්‍රේක්ෂක මණ්ඩපය (කේවියා -Cavea) අර්ධ කවාකාර මණ්ඩපයක් ද, වේදිකා ගෘහය අතිශයින් විසිතුරු කේවල මණ්ඩපයක් ද (ස්කීනියා ෆ්‍රොන්ස් -Scaenae Frons) වේ. මෙම රඟහල තැනිතලා බිමක ඉදි කරන ලද්දකි.
- මධ්‍යකාලීන රංග ශාලා අතර මණ්ඩප වේදිකාව (Platform Stage) සන්දර්ශන රථ (Pgeant vagon), ප්ලැටියා හෙවත් පොදු රංග භූමිය (Platea) ආදිය දැක්විය හැකි ය.
- එලිසබෙතීන යුගයේ ග්ලෝබ් වේදිකාව ආකෘතිකමය වටනාකමකින් යුක්ත වූ අතර පසුකාලීන ව වෙනත් විවිධ ලක්ෂණ එයට ඇතුළත් විය.
- පුනරුදය යුගයේ පසුතල, චිත්‍ර වස්ත්‍ර භාවිතය සමඟ Proscenium (ඉදිරියේ -දර්ශනය) ආරුක්කු (Arch) අර්ථය ඇති ව ප්‍රොසීනියම් ආරුක්කු වේදිකාව බිහි වූයේ ය.

- නූතන ප්‍රොසීනියම් වේදිකාව භූගෝලීය වශයෙන් මනඃකල්පිත කොටස් නවයකට බෙදිය හැකි ය.

Up stage	උඩ/ඉහළ දකුණ	උඩ/ඉහළ මැද	උඩ/ඉහළ වම
	මැද දකුණ	මැද මැද	මැද වම
Down- stage	යටි/පහළ දකුණ	යටි/පහළ මැද	යටි/පහළ වම

රංග භූමි අලංකරණය

- නාට්‍ය පෙළෙන් කියැවෙන පසුබිම අර්ථවත් කිරීම සඳහා වේදිකාව සකස් කිරීම රංගභූමි අලංකරණය හෙවත් වේදිකා පසුතල නිර්මාණ යන නමින් හැඳින්වේ.
- පසුතල සකස් කිරීම හා විචිත්‍රත්වය සඳහා විවිධ උපකරණ, තිර, දර්ශන ආදිය යොදා ගන්නා අතර හා ඇතැම් විට එයින් තේමාව, අන්තර්ගතය ආදිය සංකේතාත්මක ව ප්‍රකාශ වේ.
- ඇතැම් විට නාට්‍ය පෙළෙහි පසුතල පිළිබඳ ව දක්වා ඇති විස්තරය රංගභූමිය නාට්‍යයට උචිත පරිදි සකස් කර ගැනීම සඳහා උපකාරි වෙයි.
- නාට්‍යයේ ශෛලිය අනුව වේදිකා පසුතල පිළිබඳ සංකල්පය වෙනස් වන අතර, බොහෝ විට වර්තමාන යථාර්ථවාදී රංගනයේ දී නාට්‍යයේ අවස්ථා, සිදු වන වකවානුව, ඊට අදාළ පරිසරය, සමාජ ආර්ථික තත්ත්වය හා පුද්ගල මනෝභාවයන් ඉස්මතු කරන අයුරින් වේදිකා පසුතල නිර්මාණය විය යුතු ය. එහි දී වර්ණ සංයෝජනයත්, රංගාලෝකය සමඟ මනා ව සම්මිශ්‍රණය වීමත් දෘශ්‍ය රූප ප්‍රබල කිරීමට හේතු වෙයි.
- නූතන තාක්ෂණික භාවිතය සමඟ ගණනිකාව ඇසුරින් විවිධ පසුතල නිර්මාණ ප්‍රතිනිර්මාණය කරගත හැකි ය.
- ඉක්මනින් සවි කිරීමේ හා ගැලවීමේ පහසුව, ප්‍රවාහණ පහසුව, නාට්‍යෝපකරණ බහුකාර්ය සඳහා යොදා ගත හැකි වීම, ඇසිරීමේ පහසුව, ශක්තිමත් බව ආදි කරුණු පසුතල නිර්මාණයේ දී වැදගත් වෙයි.

වේෂ භූෂණ හා අංග රචනය

- නාට්‍යයේ චරිතයට ගැළපෙන ආකාරයට නළුවා ගේ බාහිර ස්වරූපය, වේෂ භූෂණ හා අංගරචනය මඟින් අලංකාර කිරීම වෙස් මෝස්තර නිර්මාණය නමින් ද හැඳින්වේ.
- බාහිර සමාරෝපය ඇති කිරීම සඳහා වේෂ භූෂණ ප්‍රධාන තැනක් ගනී.
- වේෂ භූෂණ නිර්මාණය කිරීමේ දී නාට්‍යයේ තේමාව, ශෛලිය, සංස්කෘතික පසුබිම, චරිත ස්වභාවය මෙන් ම යුගය, කාලය ආදි කරුණු ගැන ද සැලකිලිමත් විය යුතු ය.
- සරල වීම, පහසුවෙන් භාවිතයට ගත හැකි වීම සහ රඟපෑමට පහසු වීම යන කරුණු වේෂ භූෂණ නිර්මාණයේ දී අවධානයට ලක් විය යුතු ය.
- වේෂ භූෂණයේ හා අංග රචනයේ දී වර්ණ සංයෝජනය හා රංගාලෝකය පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.
- වේෂ නිරූපණ ශිල්පියා ගේ කාර්යය රූප ලාවණ්‍ය ශිල්පියකු ගේ කාර්යයට වඩා බෙහෙවින් වෙනස් වේ. චරිතයේ ලක්ෂණ ඉස්මතු කරමින් නාට්‍යයේ භූමිකාවට අදාළ වන අයුරින් වෙස් ගැන්වීම වේෂ නිරූපණ ශිල්පියා ගේ කාර්යයකි.

රංග භූමි ආලෝකකරණය

- පෙරදිග නාට්‍ය කලාවේ මුල් අවදියේ අඳුර පලවා හැරීම අරමුණු කොටගෙන පන්දම් හා පහන් වර්ග යොදා ගත්හ.
- නාට්‍යයේ ප්‍රාසංගික ලක්ෂණ ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟ අර්ථය පුළුල් හා තීව්‍ර කිරීමේ කාර්යය සඳහා භාවිත කෙරෙන භාෂාවක් පරිද්දෙන් රංග ආලෝකය යොදා ගැනේ.
- වේදිකා නාට්‍යයක දී වේදිකාවේ රඟපාන නළුනිළියන් ද පසුතල, වේෂ භූෂණ හා වේදිකා මෙවලම් ආදිය සූක්ෂම ලෙස හා අර්ථාන්විත ආකාරයෙන් කලාත්මක ව ඉදිරිපත් කිරීම සඳහා රංගාලෝක සැලැසුමක් මෙන් ම රංගාලෝක ශිල්පියෙක් ද අවශ්‍ය වේ.
- ගලා යන එළිය යන අර්ථය දෙන ධාරා පහන් හෙවත් ෆ්ලඩ් ලාම්පු (Flood Light) ඉලක්කය වෙත විහිදී යන අර්ථය දෙන යොමු පහන් හෙවත් ස්පොට් ලාම්පු (Spot Light). තීරු ලාම්පු යන අර්ථය දෙන ස්ට්‍රිප් ලාම්පු (Strip Light / Batten Light) වර්ණ චක්‍ර (Colour Wheels) ආදි උපකරණ රංගාලෝකය සඳහා භාවිත කෙරේ.

  (11 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ රංගාලෝකය පිළිබඳ වැඩි විස්තර දක්වා ඇත.)

ප්‍රේක්ෂාව - **Spectacle**

- නාට්‍ය කලාවට සම්බන්ධ ප්‍රේක්ෂාව (Spectacle) පිළිබඳ ව පැරණි හා නවීන අර්ථ කීපයක් ඇත.
- නාට්‍ය කලාවට සම්බන්ධ ව මෙම සංකල්පය ඇරිස්ටෝටල් විසින් පෙන්වා දෙනු ලැබ ඇත්තේ වේදිකාවේ ''දෘෂ්ටි ගෝචර භාවය'' යනුවෙනි.
- නාට්‍යයක් නරඹන විට ප්‍රේක්ෂකයා ඉදිරියේ රංග භූමිය මත මොහොතින් මොහොත මැවෙන දර්ශනය ''ප්‍රේක්ෂාව'' වේ.
- රංග භූමියක් මත දිග හැරෙන නාට්‍යයක් ප්‍රේක්ෂකයා ඇදබැඳ ගැනීමට මුල් වන එක් සාධකයකි ''ප්‍රේක්ෂාව''.
- නාට්‍යයේ ප්‍රේක්ෂාවක් මැවීම සඳහා නිෂ්පාදනයේ දෘෂ්ටිමය පැත්ත වන පසුතල නිර්මාණ (Scenery) වස්ත්‍රාභරණ (Costumes), ආලෝකය (Lighting), අංගරචනය (Makeup), නාට්‍යෝපකරණ (Stage properties) සහ රූපණ ශිල්පීන් ගේ කුශලතා පිරි රංගනය ආදිය වැදගත් ය.
- ප්‍රේක්ෂකයා ඉදිරියේ ප්‍රේක්ෂාව සිදු වන බැවින් එහි කිසියම් චමත්කාරයක් හා රසඥතාවක් තිබිය යුතු ය.

ප්‍රේක්ෂකයා

- ප්‍රේක්ෂකයා නාට්‍යයේ කොටසක් ලෙස සැලකේ. නාට්‍යයක් වර්ධනය වන්නේ ප්‍රේක්ෂක ප්‍රතිචාර මත ය.
- නාට්‍යයක අත්‍යවශ්‍ය ම අංගත්‍රයෙන් (පෙළ, නළුවා, ප්‍රේක්ෂකයා) එක් සාධකයක් ලෙස ප්‍රේක්ෂකයා සැලකේ.
- ප්‍රේක්ෂකයා යනු විචාරකයකු, රසිකයකු පමණක් නො ව, විනිශ්චයකරුවෙක් ද වෙයි. බුද්ධිමය ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයේ ගුණාත්මක බව තක්සේරු කිරීමට හේතු වන නිර්ණායකයකි.

රංග වින්‍යාසය - **Choreography**

- නාට්‍යයක කිසියම් අවස්ථාවකට හෝ සිදුවීමකට හෝ අවශ්‍ය පරිදි චලන හා රිද්ම මනා ව පෙළ ගැස්වීම රංග වින්‍යාසය හෙවත් රංග රචනය යනුවෙන් හැඳින්විය හැකි ය.
- රංග වින්‍යාසය මුලින් ම පෙළ ගැස්වෙන්නේ නාට්‍ය පෙළට හා එහි ශෛලියට අනුව නාට්‍ය රචකයා ගේ නිර්මාණාත්මක චින්තනයේ ය.

- පෙළ ජීවමාන කිරීමේ දී සිද්ධි හා අවස්ථා මාලාවට ගැළපෙන පරිද්දෙන් රංග වින්‍යාසය සකස් කෙරේ.
- නාට්‍යයේ ගැඹුර, චමත්කාරය, නිරූපණය තීව්‍ර කිරීම සඳහා මනා කුශලතාවක් රංග වින්‍යාස ශිල්පියා සතු ව පැවතිය යුතු වේ.

රංග භූමි පාලනය (Stage Management)

- නාට්‍ය අධ්‍යක්ෂවරයාට අමතර ව රංග භූමියේ සියලු ම කටයුතුවල වගකීම දරන්නේ රංග භූමි පාලකයා ය.
- රංග භූමි පාලකයා ඇතැම් විට වේදිකා පාලක ලෙස ද, රංග කළමනාකරු ලෙස ද හැඳින්වෙන අතර, ඔහු අධ්‍යක්ෂවරයා ගේ ප්‍රධාන සහායකයකු ලෙස සැලැකිය හැකි ය.
- නාට්‍යයක් වේදිකාගත කිරීමේ දී රංග භූමිය හා නිෂ්පාදනය සම්බන්ධ සෑම කටයුත්තක ම වගකීම ඔහුට පැවරේ.
- නාට්‍ය නිෂ්පාදනයේ දී දර්ශන සංවිධානය කිරීම, රංග භූමිය හා නළු-නිළියන් සම්බන්ධ සියලු ම කටයුතු කිරීම ආදි කටයුතුවල වගකීම රංග භූමි පාලකයා සතු ය.
- රූපණ ශිල්පීන් ගේ හැසිරීම් පාලනය කිරීම, අනිකුත් ආනුෂංගික කලාකරුවන් ගේ සහාය ලබාගැනීම ආදිය ඉටු කරමින් නාට්‍යයක් වේදිකාවට නැංවීමේ වගකීම දරනු ලබන්නේ රංගභූමි පාලකයා විසිනි.
- නාට්‍යයට සම්බන්ධ වන සියලු ම දෙනා මෙහෙයවමින් නාට්‍ය දර්ශනය ආරම්භ කිරීමත්, පවත්වාගෙන යාමත් රූපණ ශිල්පීන් ගේ අදෘශ්‍යමාන සහායකයා ලෙස කටයුතු කරන වේදිකා පාලකවරයා ගේ උපදෙස් අනුව සිදුවේ.
- වේදිකා පාලකයා හා ඔහු ගේ සහායකයන් ප්‍රේක්ෂකයාට දෘශ්‍යමාන නොවුණ ද ඔවුහු නාට්‍ය නිෂ්පාදනය සාර්ථක කිරීමට අනුබල දෙති.
- ඉතා හොඳ නාට්‍යයක් වුවත්, වේදිකා පාලක ගේ දුර්වලත්වය හේතුවෙන් අසාර්ථක විය හැකි ය.

රංග භූමි තාක්ෂණය

- නූතන වේදිකාව මත නාට්‍යයක නිරූපිත අවස්ථා වඩා චමත්කාර කරගැනීම සඳහා තාක්ෂණ උපක්‍රම බෙහෙවින් භාවිත කැරේ.
- නාට්‍යයක් රඟ දැක්වීමේ දී වේදිකාවක් සැකසීමේ පටන් නිෂ්පාදන කාර්යය පරිසමාප්තියට පත් වන අවස්ථාව තෙක් රංග උපක්‍රම භාවිත කැරේ.
- නාට්‍යයට අදාළ ආලෝකය සැපයීම, සංගීතය සැපයීම, රංග භූමි අලංකරණය යන සෑම රංග උපකරණ භාවිතයට ගැනීමක් ම රංග භූමි තාක්ෂණයට අයත් වෙයි. අවස්ථා නිරූපණය ගැඹුරින් ප්‍රකාශ කිරීමට ඒවා උපයෝගී වෙයි.
- භීතිය, ත්‍රාසය, විස්මය, ගැටුම් අවස්ථා මෙන් ම ඉතා සියුම් භාව ප්‍රකාශන දනවීම සඳහා ද ශබ්ද තාක්ෂණය බහුල ව යොදාගැනේ.
- විදුලිය කෙටීම, හෙණ හඬ, සුළං ආදිය වේදිකාවේ මවා පෙන්වීම සඳහා ද මෙම ශබ්ද හා දෘශ්‍ය භාණ්ඩ භාවිත කෙරේ.
- නූතන නාට්‍යවල රංග භූමි තාක්ෂණය සඳහා නූතන ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්, සිනමාව ආදිය විවිධාකාරයෙන් භාවිත කෙරෙයි.

නාට්‍යෝපකරණ (වේදිකා මෙවලම්) - Stage Properties

- චරිතය හා සම්බන්ධ ව නළු-නිළියන් විසින් භාවිත කෙරෙන භාණ්ඩ නාට්‍යෝපකරණ නමින් හැඳින්වේ.
- නාට්‍යෝපකරණ බොහෝ විට වේදිකා පසුතලය සමඟ ද සම්බන්ධ වේ.
- නාට්‍යයක දී මෙම වේදිකා මෙවලම් ඉතා වැදගත් ය.
- වේදිකා මෙවලම් නිර්මාණය කිරීමේ දී සරල බව, පහසුවෙන් පරිහරණය කළ හැකි වීම මෙන් ම මිල අඩු අමුද්‍රව්‍ය පරිහරණය කිරීම ද අවශ්‍ය වේ.
- නළුවා ගේ රංගනයට මෙන් ම චරිතය ඉස්මතු කිරීමට ද වේදිකා මෙවලම් බලපායි.
- භාණ්ඩ නිර්මාණයේ දී එහි හැඩය, වර්ණය හා බර පිළිබඳ ව ද සැලකිලිමත් විය යුතු ය.
- සැබෑ භාණ්ඩ හා නාට්‍යෝපකරණ අතර පැහැදිලි වෙනසක් දැකිය හැකි ය.
- වේදිකා මෙවලම් භාවිතයේ දී පුහුණුවීම් අවස්ථාවල භාවිතා කැරෙන මෙවලම් නාට්‍ය දර්ශනයේ දී ද භාවිත කිරීම ඉතා වැදගත් ය.

සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා නාට්‍ය කලාවේ මූලිකාංග පාඩම ආශ්‍රිත ව ප්‍රශ්නාවලියක් සකස් කිරීමට උපදෙස් දෙන්න. එම ප්‍රශ්නාවලිය ආශ්‍රය කරගනිමින් ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් මෙහෙයවන්න.

මූලාශ්‍රය :

1. නාට්‍ය ප්‍රවේශය - රංජිත් ධර්මකීර්ති
2. කලාව හා යථාර්ථය - මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු
3. නාට්‍ය හා රංග කලා ශබ්දාකරය - සුනන්ද මහේන්ද්‍ර

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

1. නාට්‍ය කලාවේ දක්නට ලැබෙන මූලිකාංග හඳුන්වා දෙමින්, නාට්‍ය නිෂ්පාදනයක් සඳහා එකී අංගවල දායකත්වය කෙසේ ලබාගත යුත්තේ දැයි විස්තර කරන්න.
2. ඔබ නැරඹූ නාට්‍යයක තාක්ෂණික මෙවලම්, නාට්‍යයේ ගුණාත්මක වර්ධනයට දායක වූ ආකාරය විමර්ශනය කරන්න.

නිපුණතාව 2.0 : නාට්‍ය හා රංග කලාව විෂයය පිළිබඳ න්‍යායාත්මක පදනම ප්‍රගුණ කරයි.

නිපුණතා මට්ටම 2.3 : ප්‍රධාන රංග ශෛලිවල වෙනස්කම් හඳුනා ගනියි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- ලෝකධර්මී නාට්‍යයක ලක්ෂණ අධ්‍යයනය කරයි.
- දේශීය හා විදේශීය වශයෙන් ලෝකධර්මී ශෛලියට අයත් නාට්‍ය පිටපත් රැස් කරයි.
- නාට්‍යධර්මී නාට්‍යයක ලක්ෂණ සාකච්ඡා කරයි.
- නාට්‍යධර්මී නාට්‍යයක් නිෂ්පාදනය කරයි.

ක්‍රියාකාරකම : ප්‍රධාන රංග ශෛලි හඳුනාගනිමු.

ගුණාත්මක යෙදවුම් : මනමේ සිංහබාහු, කැලණි පාලම, තලමල පිපිලා නාට්‍යවල පින්තූර

භරතමුනි ප්‍රණීත නාට්‍යශාස්ත්‍ර ද්විතීය භාගය 13 වන අධ්‍යයනය පිටු අංක 121-132 තෙක් උද්ධෘත

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය - නිරීක්ෂණ

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සපයාගත් නාට්‍යවල පින්තූර ප්‍රදර්ශනය කරමින් ඒ ඒ ශෛලි හඳුනා ගැනීමට පොලඹවන්න. ඊට අදාළ ව ලෝකධර්මී හා නාට්‍යධර්මී නාට්‍ය ප්‍රභේදයන්හි විශේෂ ලක්ෂණ විස්තර කිරීම සඳහා පහත දැක්වෙන තොරතුරු සහාය කරගන්න.
- ''නාට්‍යශාස්ත්‍රයේ'' 13 වන අධ්‍යායයේ 70-86 යන ශ්ලෝකවලින් දැක්වෙන පරිදි නාට්‍ය සම්ප්‍රදාය දෙකකි.

  ලෝකධර්මී

  නාට්‍යධර්මී වශයෙනි.

ලෝකධර්මී

- පාත්‍රයන් ස්වාභාවික ලෙස හැසිරෙන්නා වූ, අව්‍යාජවූ, විකෘත නොවූ, ලෝකයා ගේ පැවැත් මෙන් ම හා ක්‍රියාවන් යුක්ත වූ. ලාලිත්‍යයෙන් යුතු අංග චලනයෙන් තොර වූ, ස්වාභාවික අභිනයෙන් යුක්ත වූ, නොයෙක් ස්ත්‍රීන් හා පුරුෂයන් පාත්‍රයන් සේ හැසිරෙන්නා වූ යම් නාට්‍යයක් වේ ද එය ලෝකධර්මී නාට්‍යයක් ලෙස හැඳින්වේ.
- සංස්කෘත නාට්‍යයක ප්‍රකාශ භාෂණය හෙවත් සාමාන්‍ය කථාව හා රහස් දෙඩීම වැනි මූලික දෙබස් බොහෝ විට ඉදිරිපත් කරන ලද්දේ තාත්ත්වික ව ය. එනම් ලෝකධර්මී සම්ප්‍රදායයට අනුව ය. කිසියම් රඟපෑමක් මඟින් ලෝකයේ සිදුවන යමක් ඒ අයුරින් ම සිදු කිරීම ලෝකධර්මී සම්ප්‍රදායයට අනුරූපී ය.
- ලෝකධර්මී සම්ප්‍රදායයට අනුව වස්තු විෂයය කර ගනුයේ කාලීන පුවතකි. යොදා ගන්නා භාෂාව ව්‍යවහාරෝචිත ය. යාම්, ඊම් ආදී චලන විධි ද, හැසිරීම් ස්වභාවය ද ස්වාභාවික ආකාරයට සිදුවේ. තත්ත්වානුරූපී මායාව ඇති කරලීම සඳහා පසුතල හා නාට්‍යෝපකරණ බහුල ලෙස යොදා ගැනේ. වේෂභූෂණ ද එදිනෙදා අප දකින ඇඳුම් පැළැඳුම්වලට සමීප ය. අංග රචනය හා රංගලෝකය මඟින් ද ස්වාභාවිකත්වය ඉස්මතු කරනු ලැබේ. ලෝකධර්මී සම්ප්‍රදායයේ දී වෙස්මුහුණු භාවිත නො කෙරෙයි. මෙම ශෛලියට අයත් නාට්‍යයක පසුතල වෙනස් කරන්නේ රංග භූමියේ අඳුර භාවිත කරමිනි.
- රුසියානු ජාතික ඇන්ටන් චෙකෝෆ් ගේ The proposal (මඟුල් ප්‍රස්තාව) හා Cherry Orcherd (චෙරි වත්ත) නෝර්වීජියානු ජාතික හෙන්රික් ඉබ්සන් ගේ Doll's house (සෙල්ලම් ගෙය) ආර්. ආර්. සමරකෝන් ගේ 'කැලණි පාලම', ජයලත් මනෝරත්න ගේ ''තලමල පිපිලා'' නාට්‍ය නිදසුන් වේ.

නාට්‍යධර්මී

- ස්වාභාවිකත්වයෙන් ඈත් වූ සංවාදවලින් හා රඟපෑම්වලින් යුක්ත වූ ද, ස්වභාවිකත්වයෙන් ඈත් වූ චිත්ත වෘත්ති හා භාව නිරූපණය කරන්නා වූ ද, ලාලිත්‍යයෙන් යුතු අංගහාරයෙන් හා අභිනයෙන් යුක්ත වූ ද, නාට්‍යමය ලක්ෂණයන් ගෙන් උපලක්ෂිත වූ ද, ස්වර හා අලංකාර සහිත වූ ද, අස්වාභාවික ලෙස හැසිරෙන පාත්‍රයන් ඇසුරු කරන්නා වූ ද යම් නාට්‍යයක් වේ ද, එය නාට්‍යධර්මී ලෙස හැඳින්විය හැකි ය.
- ලොව සිදු වන යම් දෙයක් පාත්‍රයන් විසින් මූර්තිමත් ලෙස හා චිත්තාකර්ෂණීය ලෙස නාට්‍යයේ ඉදිරිපත් කරනු ලැබීම නාට්‍යධර්මී ලක්ෂණයකි.
- පර්වත, යාන, විමන්, පලිස්, සන්නාහ, ආයුධ, ධ්වජ මූර්තිමත් ලෙස ඉදිරිපත් කරනු ලබන්නේ නාට්‍යධර්මී නාට්‍යවල ය.
- එක් භූමිකාවක් රඟපෑමෙන් පසු නළුවා ගේ කෞශල්‍යය නිසා හෝ අන් නළුවකු නොමැතිවීම නිසා හෝ වෙනත් භූමිකාවක් රඟපායි නම් එය ද නාට්‍යධර්මී ලක්ෂණයකි.
- ලාලිත්‍යයෙන් යුතු අංග වින්‍යාසයෙන්, වඩා එසැවුණු පියවර තබමින් නැටීම හා ගමන් කිරීමත් නාට්‍යධර්මී ලක්ෂණයකි.
- සැප හා දුක දනවන ක්‍රියා ආත්මකොට ඇත්තා වූ ලෝක ස්වභාවය ආංගික අභිනයෙන් ඉදිරිපත් කරනු ලැබීම නාට්‍යධර්මී ලක්ෂණයකි.
- මහබඹු විසින් නිර්මිත ඉතිහාසය හා වේදය ගැබ් කොට දෙවියන් ගේ හා මනුෂ්‍යයන් ගේ රස වින්දනය උදෙසා කළ කිසියම් නාට්‍යවේදයක් වේ ද එය නාට්‍යධර්මී වේ.
- විවිධ නියම අනුව රංග පීඨය මත ඉදිරිපත් කරනු ලබන කක්ෂ්‍යා විභාගය ද නාට්‍යධර්මී ලක්ෂණයකි.
- සියලු අභිනය අලංකාර අංග විලාසයෙන් යුතු ව ඉදිරිපත් කිරීම ද නාට්‍යධර්මී වේ.
- ශ්‍රී ලංකාවේ ශෛලිගත වශයෙන් හැඳින්වෙන නාට්‍යය ද නාට්‍යධර්මී වේ. මෙහි දී ද දෙබස් ගීතවත් ව ගැයෙන අතර, නළුවෝ තාලානුකූල ව චලනවල යෙදෙත්.
- වේදිකාව සැරසිලිවලින් තොර ය. විශේෂයෙන් සකස් කරගන්නා නාට්‍යෝපකරණ, විශේෂිත අංග රචනා හා වේෂ භූෂණ ද ඇත. වටයක් යාමෙන් ස්ථාන මාරුවක් සිදුවීම ද, ආත්ම භාෂණ ද නාට්‍යධර්මී ලක්ෂණයෝ ය.
- නාට්‍ය නිෂ්පාදනයේ දී නාට්‍යධර්මී මෙන් ම ලෝකධර්මී ලක්ෂණ ද සහිත මිශ්‍ර වූ ශෛලියක් ද බොහෝ විට භාවිත කෙරේ.
- ලාංකේය නාට්‍යධර්මී නාට්‍ය සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.
  - මහාචාර්ය සරච්චන්ද්‍රයන් ගේ මනමේ, සිංහබාහු
  - දයානන්ද ගුණවර්ධනයන් ගේ නරිබෑණා
  - බන්ධුල ජයවර්ධනයන් ගේ බෙරහඬ

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

1. ලෝකධර්මී හා නාට්‍යධර්මී නාට්‍ය පිළිබඳ ව භරතමුනිගේ විග්‍රහය විභාග කරන්න.
2. ලෝකධර්මී හා නාට්‍යධර්මී නාට්‍යයන්හි දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ නිදසුන් සපයමින් විස්තර කරන්න.

ආශ්‍රිත ග්‍රන්ථ :

භරතමුනි ප්‍රණීත නාට්‍යශාස්ත්‍ර (ද්විතීය භාගය)
පරිවර්තනය වෝල්ටර් මාරසිංහ

නිපුණතාව 2.0 : නාට්‍ය හා රංග කලාව විෂයය පිළිබඳ න්‍යායාත්මක පදනම ප්‍රගුණ කරයි.

නිපුණතා මට්ටම 2.4 : ග්‍රීක නාට්‍ය කලාව හා සම්බන්ධ න්‍යායාත්මක පදනම අධ්‍යයනය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගැනුම් පල :
- ශෝකාත්ම පිළිබඳ ඇරිස්ටෝටල් ගේ විග්‍රහය විමර්ශනය කරයි.
- කථා වින්‍යාසයේ ස්වභාවය ගවේෂණය කරයි.
- ග්‍රීක නාට්‍යයන්හි ත්‍රිවිධ ඒකත්වය භාවිත වී ඇති ආකාරය විමසා බලයි.
- ඛේදනීය වීරයා ගේ චරිත ස්වභාවය විග්‍රහ කරයි.
- ශෝකාත්ම නාට්‍යයක ඇතුළත් ෂඩාංග පිළිබඳ කරුණු රැස් කරයි.

ක්‍රියාකාරකම 2.4.1 :
- ග්‍රීක ශෝකාත්ම නාට්‍යය පිළිබඳ ඇරිස්ටෝටල් ගේ විග්‍රහය.

ගුණාත්මක යෙදවුම් :
- ඇරිස්ටෝටල් ගේ "කාව්‍ය ශාස්ත්‍රය" කෘතිය
- ඇරිස්ටෝටල් හා භරත කෘතිය
- ඇරිස්ටෝටල් ගේ ඡායාරූපයක්
- ග්‍රීක රංග භූමියක පින්තූරයක්

ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය - ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ඉහත කී ගුණාත්මක යෙදැවුම් ග්‍රන්ථ සහ ඇරිස්ටෝටල් ගේ ඡායාරූපය පෙන්වමින් පසෙක ප්‍රදර්ශනය කරන ලද ග්‍රීක රංග භූමියේ රූපය කෙරෙහි ද අවධානය යොමු කරමින් පාඩමට ප්‍රවේශ විය හැකි ය.

  අනතුර ව පහත සඳහන් කරුණු අඩංගු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ඇරිස්ටෝටල් ක්‍රි. පූ. 384 දී උතුරු ග්‍රීසියේ මැසිඩෝනියාවට නුදුරින් පිහිටි ස්තගිර නම් කුඩා නගරයේ උපත ලැබුවේ ය. දා හත් වන වියේ දී, එනම් ක්‍රි. පූ. 367 දී ඔහු ඇතැන්ස් නගරයේ පිහිටි ප්ලේටෝ ගේ අධ්‍යාපනායතනයට බැඳී ඊළඟ විසි අවුරුදු කාලයක් ශිෂ්‍යයකු වශයෙන් ද, ගුරුවරයකු වශයෙන් ද එහි ගත කළේ ය. ඇරිස්ටෝටල් ඔහු ගේ හතලිස් නව වන වියේ සිට හැට දෙවන විය දක්වා වූ කාලයේ දී ලයිසියම්හි පෙරිපතෙටික් (Peripatetic) ආයතනය ආරම්භ කළේ ය. ''කාව්‍ය ශාස්ත්‍රය'' (Poetics) ඇතුළු ඔහු ගේ ප්‍රධාන කෘති සම්පාදනය කෙරුණේ මෙම කාල පරිච්ඡේදයේ දී ය. ක්‍රි. පූ. 322 දී ඊජියන් මුහුදේ යුබෝයේ නම් දූපතේ දී ඔහු අභාවප්‍රාප්ත වූයේ ය.

  කාව්‍ය ශාස්ත්‍රය යනු ඇරිස්ටෝටල් තම ශිෂ්‍යයන් සඳහා පැවැත්වූ දේශන එක් කොට කෘතියක් වශයෙන් සම්පාදනය කරන ලද්දකැයි සැලකේ.

  ''කාව්‍යශාස්ත්‍රයේ'' පරිච්ඡේද ගණන 26කි. එහි 1, 3, 4 පරිච්ඡේදවලින් අනුකරණය විෂයයෙහි විවිධ කලා මාධ්‍ය එක් එක් මාධ්‍යයෙන් වෙනස් වන ආකාරය සාකච්ඡා කෙරේ.

  කවියකු සතු ව අනුකරණ මාධ්‍ය විධි 3කි.

  එනම්,
  1. මාධ්‍යය
  2. වස්තු
  3. විධි

  යනුවෙනි.

  දෙවන පරිච්ඡේදයෙන් අනුකරණය කෙරෙන පුද්ගලයන් ගේ ස්වභාවය හෙළි කෙරෙයි. ශෝකෝත්පාදකයේ දී ප්‍රකෘති තත්ත්වයට වඩා හොඳ මිනිස්සු ද, හාස්‍යෝත්පාදකයේ දී ප්‍රකෘති තත්ත්වයට වඩා නරක මිනිස්සු ද අනුකරණය කැරෙති.

සතර වන පරිච්ඡේදයෙන් කාව්‍යයේ මනෝවිද්‍යාත්මක සහ ඓතිහාසික ප්‍රභවයන් ඉදිරිපත් කෙරේ. ඒ අනුව නාට්‍ය ශෝකෝත්පාදකය සහ හාස්‍යෝත්පාදකය වශයෙන් ප්‍රභේද කෙරේ.

පස් වන පරිච්ඡේදයෙන් හාස්‍යොත්පාදකයේ නිර්වචනය මෙන් ම එහි අන්තර්ගතය මුල් කරගෙන කතා වස්තුව, චරිත, වාග් විලාසය, චින්තනය, ප්‍රේක්ෂාව, සංගීතය යන අංග හය විස්තර කෙරේ.

හත - දහය පරිච්ඡේදවලින් කථා වින්‍යාසය සහ චරිත යන අංග සාකච්ඡා කෙරේ. ශෝකෝත්පාදකය මුලක්, මැදක් හා අවසානයක් සහිත පූර්ණ ක්‍රියාවක අනුකරණයක් විය යුතු බව පැවසේ. අනුකරණය කරන ක්‍රියාවට නියමිත පරිමාණයක් තිබිය යුතු ය. එය පමණට වඩා කෙටි නොවිය යුතුවාක් මෙන් ම වඩා දීර්ඝ ද නොවිය යුතු ය.

වස්තුව සරල හා සංකීර්ණ වශයෙන් දෙආකාර ය. සරල කථා වස්තුව කේවල හා අඛණ්ඩ ක්‍රියාවලියකින් යුතු ය. මෙහි ස්වභාව නම් සිද්ධිවල සංකීර්ණත්වයක් නොමැති ව ඉරණම් පෙරළිය සිද්ධ වීම ය.

සංකීර්ණ වස්තුව ප්‍රත්‍යාවර්තනය, ප්‍රත්‍යභිඥානය යන අවස්ථා දෙකින් යුක්ත ය. මෙහි දී ඉරණම් පෙරළිය සිද්ධ වනුයේ සිද්ධි පිළිබඳ සංකීර්ණත්වයක් ඇති වීමෙන් පසු ය. ප්‍රත්‍යාවර්තනය යනු ඛේදනීය වීරයා ගේ භාග්‍ය පරිවර්තනය සිදු වන අවස්ථාව යි. මෙහි දී අනුක්‍රමයෙන් අනාවරණය වෙමින් ආ සිද්ධි මාලාවක් ආපසු පෙරළීමෙන් කතාව සංකීර්ණ වේ.

අනතුරු ව එම සිද්ධි එකින් එක නිරාකරණයෙන් අනාවරණය වීම නිසා ප්‍රත්‍යභිඥානය ලබයි. එනම් නිවැරදි අවබෝධය යි. එතෙක් නොදැන සිටි යම් යම් දේ අනාවරණය වීමෙන් ප්‍රත්‍යභිඥානය ලැබේ. හොඳ ට්‍රැජඩි නාට්‍යයක ප්‍රත්‍යාවර්තනය සමග ප්‍රත්‍යභිඥානය ලැබීම සිදු වේ.

එකොළහ - දහඅට පරිච්ඡේදවලින් ශෝකෝත්පාදක කවීන් සඳහා නීති සංග්‍රහ කෙරේ. විසි එක, විසි දෙක පරිච්ඡේදවලින් චින්තනය, වාග් විලාසය යන කරුණු සාකච්ඡා කෙරේ. චින්තනය යටතේ කාරුණ්‍යය සහ භය යන භාව පිළිබඳ ව ද, වාග් විලාසය යටතේ ප්‍රකාශන කලාව, භාෂාව හා රූපකාලංකාරය පිළිබඳ ව ද සාකච්ඡා කෙරේ. වාග් විලාසය පැහැදිලි විය යුතු සේ ම අධම නොවිය යුතු බව පැවසේ.

ප්‍රකට වෛද්‍යවරයකු ගේ පුත්‍රයෙකු වූ ඇරිස්ටෝටල් ග්‍රීක ශෝකෝත්පාදකයන් මඟින් කැතාසිස් (Katharsis) යන භාව විශෝධනය සිදුවන බව පවසයි. මෙහි සෞන්දර්ය පක්ෂයෙන් පොදු වූ ද, අතිශය සියුම් වූ ද රෝග නිවාරණ අර්ථයක් ගැබ් ව ඇති බව පැවසේ.

''ශෝකෝත්පාදකය මඟින් සියලු මිනිසුන් ගේ හදවත් තුළ අන්තර්ගත කාරුණ්‍ය සහ භය යන භාව සහ ඒවාට ඥාතිත්වය දක්වන අනෙක් භාව ද ප්‍රබෝධවත් කෙරේ''. ''භාව වූ කලි යම් ආකාරයක හෝමියෝපති රෝග නිවාරණ මාර්ගයක් වෙයි'' යනුවෙන් බුචර් නම් විචාරකයා පවසයි. ශෝකෝත්පාදකය මඟින් කාරුණ්‍යය සහ භය යන භාව අප තුළ ඇති කෙරෙනුයේ ඒවා සංසිඳුවමින් ඉන් සිදුවන්නා වූ අහිතකර බලපෑම් අපගෙන් විරේචනය කරවීම සඳහා පමණ ය. එයින් ඇති වන්නේ ආධ්‍යාත්මික සුබදායක ඵලයකි.

ඇරිස්ටෝටල් පවසන පරිදි ශෝකෝත්පාදකයේ කාර්ය සිද්ධිය භාව විශෝධනය යි. එනම් ප්‍රේක්ෂක ජනයා ගේ භාව පවිත්‍රීකරණය යි.

- මේ සඳහා ප්‍රේක්ෂකයන් සතු විය යුතු සුදුසුකම් ද වේ. යමකු සතුටට පත් වනු දැකීමෙන් තමාට ද සතුට පහළවන්නේ නම් ද, යමකු දුක්ඛ වේදනාවෙන් පෙළෙන කල්හි තමාට ද එවැනි හැඟීම් ඇති වන්නේ නම් ද ප්‍රේක්ෂක තත්ත්වයට සුදුසු වේ.
- ග්‍රීක ශෝකාත්ම නාට්‍යයක ත්‍රිවිධ ඒකත්වය ද බල පැවැත්වේ.

 එනම්, ක්‍රියා ඒකත්වය
 කාල ඒකත්වය
 ස්ථාන ඒකත්වය

වශයෙන් ත්‍රිවිධ ඒකත්වයක් පිළිබඳ ව සඳහන් වෙනත් ඇරිස්ටෝටල් විසින් අවධාරණය කරනු ලැබුයේ ක්‍රියා ඒකත්වය සහ කාල ඒකත්වය යන දෙක පමණකි.

ක්‍රියා ඒකත්වය යනු සම්මත රීතී අනුකූල ව වේදිකාව මත කළ හැකි දෑ පමණක් අනුකරණය කිරීම ය.

කාල ඒකත්වයට අදාළ ව කථා වස්තු සපයා ගත යුත්තේ සූර්යයා ගේ එක් භ්‍රමණ වාරයක දී එනම් පැ 24ක කාලයක දී රඟ දැක්විය හැකි පරිදි ය.

ස්ථාන ඒකත්වය යනු එක් ස්ථානයක් පසුබිම් කොට නාට්‍ය රඟ දැක්වීම ය. නිදසුන් වශයෙන් සොෆොක්ලීස් ගේ ''ඊඩිපස් රජ'' නාට්‍යයට ද, ''ඇන්ටිගනී'' නාට්‍යයට ද පසුබිම් වන්නේ තීබ්ස්හි රජ මාළිගාව ය.

කෙසේ වුව ද මෙය සැම ග්‍රීක නාට්‍යයකට ම අදාළ නො වේ.

- ශෝකාත්මයක දෙවන වැදගත් අංගය ලෙස සැලකෙන්නේ චරිත යන්න ය. චරිතයක ස්වභාවය මෙලෙස විය යුතු වේ.

1. භාග්‍ය සම්පන්න සහ නිර්දෝෂ විය යුතු නොවේ. ඔහු යහපත් සහ උත්තම ගති ඇත්තකු වුවත් ඔහු තුළ ඇතැම් මානව දුර්වලකම් සහ අඩුපාඩු තිබිය යුතු ය.
2. ඔහු අභාග්‍යයට මුහුණ දෙන්නේ ඔහු ගේ දුශ්චරිත සහ දුෂ්ටකම් නිසා නොව චරිතයේ දක්නට ලැබෙන ප්‍රමාද දෝෂයක් හේතු කොට ගෙන ය. එය hamartia නම් වේ.
3. ඛේදනීය වීරයා රජකු හෝ ප්‍රභුවරයකු හෝ විය යුතු ය. ඔහු සෞභාග්‍යත්, සමෘද්ධිමත්, උසස් පෙළපතකට අයත් වූවකු විය යුතු ය.

තව දුරටත් චරිත පිළිබඳ ව විස්තර කරනුයේ අංග 4ක් ඔස්සේ ය.

1. චරිත යහපත් විය යුතු ය.
2. චරිත (කථාවට) යෝග්‍ය විය යුතු ය.
3. චරිත යථාර්ථවත් ස්වරූපයක් ගත යුතු ය.
4. චරිත සංගත විය යුතු ය.

චරිත නිරූපණයේ දී පුද්ගලයා ගේ ජීව විද්‍යාත්මක සහ මනෝවිද්‍යාත්මක හැඩ ගැස්මට ද අදාළ විය යුතු වේ.

චරිත සංගත වීම කෙරෙහි ද ඇරිස්ටෝටල් ගේ අවධානය යොමු වේ. චරිත විශ්වසනීයත්වයට හානි පමුණුවන සේ ක්ෂණික ව වෙනස් වන අසංගත භාවය ඔහු ප්‍රතික්ෂේප කරයි.

- වාග් විලාසය යන්නෙන් අදහස් වනුයේ අර්ථ ප්‍රකාශනය සඳහා වචන භාවිත කිරීම ය. රිද්මය, ස්වර මාධුර්යය සහ ගීතයෙන් සමන්විත වූ රමණීය භාෂා ප්‍රයෝග උපයෝගී කර ගැනීම මෙයින් අදහස් වේ.

විධානය, යාඥාව, තර්ජන, ආයාචනා, ප්‍රශ්න, පිළිතුරු ඇසීම ආදි විවිධ උච්චාරණ විලාස වැනි අංග ද වැදගත් කොට සලකයි.

උත්තම වාග් විලාසය ගැන සඳහන් කරන ඇරිස්ටෝටල් එය පැහැදිලි විය යුතුවා මෙන් ම අධම නොවිය යුතු බව ද පවසයි. නාට්‍යකරුවා විසින් භාවිත කළ යුතු වචන වර්ග 7කට බෙදා දක්වනු ලැබේ.

1. සාමාන්‍ය වචන - ව්‍යාවහාරික වචන වේ.
2. අසාමාන්‍ය වචන - වෙනත් උපභාෂා භාවිතය යි.
3. රූපකාර්ථවත් වචන - ''මහලු වයස'' - සන්ධ්‍යාව හෙවත් ජීවිතයේ හිරු බැස යාම ලෙස ඉදිරිපත් කළ හැකි ය.

3. ප්‍රබන්ධ කළ වචන - නව අරුතක් දෙන වචන ය.
4. ප්‍රසාදනීය වචන - අමතර වර්ණයක් එකතු කරන ලද වචන ය.
5. කෙටි කළ වචන - වචනයේ කොටසක් ඉවත් කරනු ලැබීම ය.
6. විකෘත වචන - කොටසක් ඉවත් කොට නව වචනයක් නිර්මාණය කිරීම ය.

- චින්තනය පිළිබඳ ව ''කාව්‍ය ශාස්ත්‍රයේ'' පැහැදිලි අදහසක් ඉදිරිපත් කර නැති නමුදු ප්‍රකාශිත අදහස් අනුව අවධාරණය වන්නේ යමකු මුහුණ දෙන ඕනෑ ම අවස්ථාවක දී ඊට අදාළ වූ ද, යෝග්‍ය වූ දේ ද පැවසීමේ ශක්තිය චින්තනය බව ය.

  ''චින්තනය වනාහි වාගාලංකරණ සම්බන්ධ විෂයයක් වන නිසා භාෂණය මඟින් ඉටු කෙරෙන සියලු කාර්ය චින්තනය විසින් පාලනය කෙරේ'' යනුවෙන් ඇරිස්ටෝටල් වැඩි දුරටත් පවසයි.

- ප්‍රේක්ෂාව ගැන ''කාව්‍ය ශාස්ත්‍රයෙහි'' සඳහන් වන්නේ අල්පමාත්‍ර වශයෙනි.

  ''ප්‍රේක්ෂාව මඟින් භය සහ කාරුණ්‍යය මතු කරගත හැකි ය. එහෙත් ඒ භාව නාට්‍යයේ ව්‍යුහය සහ සිද්ධි මඟින් ද මතු කරගත හැකි ය. වඩා යෝග්‍ය දෙවැනි මාර්ගය යි. වඩා හොඳ නාට්‍යකරුවා ද මොහු ය'' යනුවෙන් පවසන ඇරිස්ටෝටල් ප්‍රේක්ෂාව වැදගත් කොට සැලකූ බවක් නොපෙනේ. එහෙත් ඊස්කිලස් ගේ නාට්‍ය සඳහා සාම්ප්‍රදායික දීප්තිමත් ඇඳුම් ද අඩි උස පාවහන් ද, හිස් පලඳනා ද සොෆොක්ලීස් භාවිත කළේ ය.

  ග්‍රීක නාට්‍යාගාරයේ සැකැස්ම ද මනා ප්‍රේක්ෂාවක් මවන බව අමතක කළ නොහැකි ය.

  ශෝකෝත්පාදක නාට්‍යයෙහි සංගීතය ආස්වාදනයේ දී මුල් තැනක් ගන්නා බව ද, එහි භාව ප්‍රබෝධන ශක්තියක් පවතින බව ද ඇරිස්ටෝටල් අවධාරණය කරයි. ග්‍රීක ගායන වෘන්දයේ කාර්යභාරය වඩා වැදගත් කොට සලකමින් සංගීතයෙහි වැදගත්කම හුවා දැක්වීමට ද ඇරිස්ටෝටල් අමතක කළේ නැත.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

ග්‍රීක නාට්‍යයේ ''ප්‍රේක්ෂාව'' සකස් වීම කෙරෙහි ග්‍රීක රංග භූමියෙහි පිහිටීම බලපෑ ආකාරය සාකච්ඡා කරන්න.

වැඩිදුර අධ්‍යයනය සඳහා:
- ඒ. වී. සුරවීර - ඇරිස්ටෝටල් හා භරත
- ඒ. වී. සුරවීර - කාව්‍ය ශාස්ත්‍රය

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.1 : රංග අභ්‍යාසය ප්‍රගුණ කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 06

ඉගැනුම් පල :
- ශරීරාංග චලනය නිර්මාණාත්මක ව සිදු කරයි.
- රිද්මානුකූල ව ශරීරාංග චලනය කරයි.
- යම් යම් චරිත ලක්ෂණ මතු වන ආකාරයට අනුකරණයේ යෙදෙයි.
- විවිධ ද්‍රව්‍ය ඇසුරු කරගෙන නිර්මාණාත්මක චලන ගොඩනංවයි.
- විවිධ චරිත නිරූපණයට පෙලැඹෙයි.

ශරීරාංග ස්වාභාවික ව ද විවිධ රිද්ම රටාවන්ට අනුව ද චලනය කරමින් නිර්මාණාත්මක චලන රටා ගොඩනැංවීම සහ ඒ ඔස්සේ චරිත නිරූපණය සඳහා යොමු වීමට වුවමනා කරන චලන ක්‍රියාවලියකට යොමු වීම.

ක්‍රියාකාරකම 3.1.1 : නිර්මාණාත්මක චලන අභ්‍යාස

ගුණාත්මක යෙදවුම් : සංගීත භාණ්ඩ ඇතුළත් සංයුක්ත තැටි, වතුර බෝතලයක්, කොස්සක් වැනි ද්‍රව්‍ය

ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය - ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. මෙම අභ්‍යාස සඳහා සැහැල්ලු ඇඳුමක් යෝග්‍ය බව ප්‍රකාශ කරන්න.

- මුලින් ම සිසුන්ට නිදහස් අවකාශයේ සාමාන්‍ය ආකාරයට ඇවිදීමට ඉඩ සලසන්න. එසේ ඇවිදින අතර ගුරු විධානයට අනුව ක්‍රියා කරන්න. වේගය අඩු කරමින් වැඩි කරමින් ඇවිදීමට විධානය දෙන්න. ශාරීරික ඉරියවු හැඩ වෙනස් කරමින් එකිනෙකා අතරින් අවකාශයේ සෑම ස්ථානයක් ම ආවරණය වන සේ ඇවිදීමට යොමු කරන්න.

- අවකාශය පුරා ඇවිදින්න. ඇඟිලි තුඩුවලින්, විළුඹෙන්, දෙපා පැත්තට පෙරළමින් (පතුල පෙරළමින්) කොර ගසමින්, කොන්ද නමාගෙන, උරහිස් හකුළුවමින් ඇවිදීමට විධානය දෙන්න. මේ ආකාරයට ශරීරාංග වෙනස් කරමින් ඇවිදීම සිදු කර ඒ ඇවිදීම්වල ආභාසය ලබා ගෙන යම් චරිතයක් අනුකරණය කරමින් ඇවිදීමට යොමු කරන්න.

  උදාඃ කොර තැනැත්තෙක්, ශරීරයේ විකෘති සහිත පුද්ගලයෙක්, මහලු අයෙක්, රෝගියෙක් වශයෙන්

- සිසුන් රවුමකට සිටුවා තබන්න. එක් සිසුවකු රවුම මැදට පැමිණ විවිධ අංග චලන දැක්වීම හා ඒවා රවුමේ සිටින සිසුන් අනුකරණය කිරීම සිදු කළ යුතු ය. මැද සිටින සිසුවා තමා ගේ චලනය යම් වේලාවක් කර ඉන් පසු එය වෙන අයකු වෙත පැවරීම කළ යුතු ය. ඔහු ද එම චලනය ම කරමින් පටන් ගෙන ස්වල්ප වේලාවකින් එය වෙනස් කර වෙනත් චලනයක් කිරීම. සෑම සිසුවකුට ම රවුම මැදට ඒමට සිදු වන ආකාරයට ගුරුවරයා මැදිහත් වී සිසුන් වෙනස් කරන්න.

- ඉහත අභ්‍යාසයකින් පසු ව විවිධ රිද්ම සහිත ව සංගීත භාණ්ඩ කිහිපයක් වාදනය කරන්න. ඒවාට ගැළපෙන අයුරින් සිරුර චලනය කිරීමට යොමු කරන්න. එක් එක් අයට දැනෙන ආකාරයට රිද්මානුකූල චලනයන් ගොඩ නගා ගෙන එය කේවල වශයෙන් හෝ සාමූහික වශයෙන් හෝ කළ හැකි ය.

- මෙම චලන අභ්‍යාසය අවසන් කිරීම සඳහා නිර්මාණාත්මක චලන අභ්‍යාසයකට යොමු වීම සඳහා පහත ක්‍රියාකාරකම්වල යොදවන්න.

- සිසුන් රවුමට වාඩි කරවා සැම අයකු ම ඉදිරියේ පත්තර පිටුවක් තැබීම.
- දෙනෙත් පියාගෙන සංගීත ඛණ්ඩයක් රස විඳීමට සැලැස්වීම.
- දෙනෙත් විවර කොට සංගීත රිද්මයට අනුව පත්තර පිටුව භාවිත කොට ගෙන යම් නිර්මාණයක් කිරීම.
- එම නිර්මාණය සමග මනසින් හා කයින් සම්බන්ධ වෙමින් රංගනයක යෙදීම.
- ක්‍රමයෙන් සියල්ලන් ම එකතු වී සාමූහික රංගනයක් නිර්මාණය කිරීම.

- ඉහත සඳහන් අභ්‍යාසයන් සියල්ල හෝ කිහිපයක් හෝ කාලච්ඡේදවල ස්වභාවය අනුව ගළපා, සිසුන් සමඟ එක් ව නිරූපණය කරන්න. මෙම අභ්‍යාස අවසානයේ කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ ව ඔවුන් ගෙන් කරුණු විමසා කෙටි සාකච්ඡාවක යෙදෙන්න. මෙම අභ්‍යාසවලින් ලබා ගත හැකි ප්‍රයෝජන රංගන ක්‍රියාවලියට ඉවහල් වන අයුරු අවධානයට යොමු කරවන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- චලන අභ්‍යාස හඳුනා ගැනීම.
- විවිධ චලන අභ්‍යාසවල යෙදීම.
- විවිධ චලන අභ්‍යාස අනුසාරයෙන් චරිත නිර්මාණය කිරීමට හැකි බව වටහා ගැනීම.
- විවිධ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ගොඩ නැගීමට පෙලඹීම.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යායයන් ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.1 : රංග අභ්‍යාසය ප්‍රගුණ කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගැනුම් පල :
- ශිථිලකරණය යන්නෙහි අර්ථය හඳුනාගනියි.
- ශිථිලකරණය, රංග අභ්‍යාසයක් බව අවබෝධ කරගනියි.
- ශිථිලකරණයෙහි යෙදෙමින් ප්‍රායෝගික කුශලතා ප්‍රගුණ කරයි.

ක්‍රියාකාරකම 3.1.1.1 : ශිථිලකරණ අභ්‍යාස (Relaxation Exercises)

ගුණාත්මක යෙදවුම් : සංගීත ඛණ්ඩ සහිත සංයුක්ත තැටි
තැටි වාදන යන්ත්‍රයක් (CD Recorder)

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 01
- ප්‍රමාණවත් ඉඩක් සහිත ස්ථානයකට සිසුන් රැගෙන යන්න. අභ්‍යාස කිරීමට සුදුසු ඇඳුමකින් සැරසීමට සිසුන්ට උපදෙස් දෙන්න.

පියවර 02
- සිසුන් වෘත්තාකාර ව බිම වාඩි කරවා, ගුරු භවතා ද එහි මැද වාඩි වී 'ශිථිලකරණය' යන්න පැහැදිලි කරන්න.
  - ශිථිලකරණය යනු ශරීරය හා මනස සමග බැඳුණු ශරීරය සැහැල්ලු කිරීමේ ක්‍රියාවලියකි.
  - මෙම අභ්‍යාස මඟින් ශරීරයේ ඉතා සියුම් කොටස් පවා හසුරුවන ආකාරය පැහැදිලි වෙයි.
  - ශාරීරික හැසිරවීම් ක්‍රියාවලිය සඳහා මනස දායක වන අයුරු වටහාගත හැකි ය.
  - මනුෂ්‍ය ශරීරය නිර්මාණය වී තිබෙන පුදුමාකාර ආකාරය, විචිත්‍රවත් බව, ආශ්චර්යවත් බව කෙරෙහි අවධානය යොමු කිරීම ද ප්‍රයෝජනවත් ය.

පියවර 03
සිසුන් සිට ගැනීමට සලස්වා, ගුරු විධානයට අනුව හිස, බෙල්ල, උරහිස්, දෑත්, ඉණ, කලව, දණ හිස, පා ඇඟිලි යනාදි වශයෙන් ශරීරයේ එක් එක් ස්ථාන සැහැල්ලු කරවන්න. දෑස් පියා ගෙන ක්‍රියාකාරකමෙහි යෙදවීම සුදුසු වේ.

පියවර 04
සියලු සිසුන්ට ශරීරය උඩු අතට සිටින සේ බිම දිගා වීමට උපදෙස් සපයන්න. දෑස් පියා ක්‍රියාකාරී වීමට සලස්වන්න. ගුරු විධානයට අනුව පා ඇඟිලි තුඩුවල සිට හිස් මුදුන තෙක් ශරීරාංග සැහැල්ලු කරවන්න. ගුරු විධාන මන්දගාමී ව සිදු කරන්න.

ගුරු භවතා එක් එක් ශිෂ්‍යයා වෙත ගොස් අතක්, පාදයක් ඔසොවා, බිමට අතහැර බැලීමෙන් සැබෑ ලෙස ම ශරීරය සැහැල්ලු වී දැ යි පරීක්ෂා කළ හැකි ය.

පියවර 05
සිසුන් අට දෙනකු පමණ වන සේ කණ්ඩායම් කරවන්න. ඔවුන් රවුමට සිටුවා එක් සිසුවකු මැදට යොමු කරවන්න. මැද සිටින සිසුවා හා වටයට සිටින පිරිසේ දුර අඩි 2ක පමණ පරතරයකි. ගුරු විධානයට අනුව මැද සිටින සිසුවා තම සිරුර ලිහිල් කර වටේ සිටින සිසුන් වෙතට වැටීමට සලස්වන්න. වටේ සිටින අය මැද සිට වැටෙන සිසුවා හොඳින් අල්ලා ගැනීම කෙරෙහි දැඩි අවධානය යොමු කරවන්න.

වරින් වර සිසුන් මාරු කරමින් ක්‍රියාකාරකමෙහි නිරත වීමට අවස්ථාව ලබාදෙන්න. අනෙක් සිසුන් ගේ ශරීරය නම්‍යශීලීව ඇති ආශ්චර්යවත් ආකාරය නිරීක්ෂණය කිරීමට මෙම අභ්‍යාසය මඟින් අවස්ථාව ලැබෙන බව ද අවධාරණය කරන්න.

පියවර 06 අවසන් ක්‍රියාකාරකම සඳහා සංගීත ඛණ්ඩ වාදනය සහාය කරගත හැකි ය.

සියලු සිසුන්ට හිස් අවකාශයෙහි ඇවිදීමට උපදෙස් දෙන්න. සංගීත ඛණ්ඩය ශ්‍රවණය කරමින් තම මනස, ශරීරය සැහැල්ලු කරවීමට උපදෙස් දෙන්න. ගුරු භවතා විවිධ චලන ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය උපදෙස් දෙමින් සියලු ම සිසුන් ක්‍රියාකාරකම වෙත යොමු කරවන්න.

(සෙමෙන් ගලන ගඟක්, මඳ සුළඟක්, අයිස් කැටයක්, දැල්වූ ඉටි පන්දමක් වැනි මාතෘකා ලබාදිය හැකි ය.)

ක්‍රමයෙන් සංගීත රාවය අඩු කරමින් සිසුන් නිශ්චල ඉරියව්වක පිහිටුවන්න. එලෙස දෑස් පියා භාවනානුයෝගී ව සිටීමට කෙටි කාලයක් වෙන් කරන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- 'ශිථිලකරණය' යන්න පැහැදිලි කිරීම.
- අභ්‍යාස සඳහා සුදුසු මාතෘකා ප්‍රකාශ කිරීම.
- ශිථිලකරණ අභ්‍යාසවල නියැළීම.
- තම ශරීරයෙහි අවයව නම්‍යශීලී වන ආකාරය විමර්ශනය කිරීම.
- අන් අය ගේ ශරීරාංග ශිථිලකරණය වන ආකාරය නිරීක්ෂණය කිරීම.

පැවරුම : මනස සැහැල්ලු කරගැනීම සඳහා දිනකට මිනිත්තු 10 බැගින් ආනාපානසති භාවනාවෙහි නිරත වීම.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.1 : රංග අභ්‍යාස ප්‍රගුණ කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- ශ්වසන ක්‍රියාවලිය නිවැරදි ව වටහාගනියි.
- ශ්වසන අභ්‍යාසවල නිවැරදි ව යෙදෙයි.
- රඟපෑම සඳහා දායක කර ගනියි.

ක්‍රියාකාරකම 3.1.1.2 : ශ්වසන අභ්‍යාස කරමු.

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. අවකාශයෙහි විසිරී සිටීමට හෝ රවුමකට සිටීමට හෝ යොමු කරවා අභ්‍යාස ඇරඹිය හැකි ය.
- සංවාද භාවිතයේ දී විවිධ රිද්මවල විවිධ හඬ පරාසවල ඒවා ඉදිරිපත් කිරීමට සිදු වේ. එහි දී ශ්වසන ක්‍රියාවලිය මැනවින් සිදු කිරීම සංවාද ඉදිරිපත් කිරීමට සුවිශාල පහසුවකි. ශ්වසන අභ්‍යාස භාවිතය වැදගත් වන්නේ එබැවින් බව සිසුන්ට ප්‍රකාශ කරන්න.
- හුස්ම හොඳින් ඉහළට ඇද වැඩි වේලාවක් රඳවා ගෙන සිට ඉතා සෙමෙන් පිට කිරීම. (සැහැල්ලුවෙන්, පහසුවෙන් සිට ගෙන හුස්ම ගැනීම පමණක් කරන්න.)
- හුස්ම ගැනීමත් සමඟ ම මෙයට සාපේක්ෂ ව අත් දෙක ද ඉහළට ඔසවන්න. හුස්ම රඳවාගෙන සිටින්න. ක්‍රමයෙන් හුස්ම පහළට හෙළීමත් සමඟ ම අත් ද සෙමෙන් පහළට රැගෙන එන්න.
- පෙර සේ ම ගැඹුරින් හුස්ම ගන්න. හැකි තරම් දීර්ඝ කාලයක් රඳවා තබා ගන්න. යම්කිසි ශබ්දයක් නැඟෙන ලෙස සෙමෙන් හුස්ම පිට කරන්න.
- හුස්ම හොඳින් ගෙන රඳවා නොගෙන පිට කරන විට අ, ල, ක, ර වැනි අක්ෂරයක ශබ්දයක් නැඟෙන සේ පිට කරන්න.
- තමන් ඉදිරියේ සුළං පිරවූ බැලූනයක් ඇතැයි මනසින් මවා ගැනීමට උපදෙස් දෙන්න. ඉන් පසු ගුරුවරයා සංඥාවක් නිකුත් කළ විට එම උඩ ඇති බැලූනයට මුවින් පිඹිමින් උඩ රඳවා ගැනීමට උත්සාහ කරන්න. (පුළුන් රොදක් හෝ ඊට සමාන වෙනත් දෙයක් හෝ ලෙස ප්‍රකාශ කළ හැකි යි. ස්වාභාවික ද්‍රව්‍ය ම භාවිත කර අභ්‍යාස කිරීමට ද හැකි ය.)
- ඉහත මූලික ශ්වසන අභ්‍යාසවලින් පසුව තවත් ඉදිරි පියවරකට යා හැකි ය. ඒ අනුව එක් ප්‍රශ්වාස වාරයක දී සිසුන් ගැඹුරින් හුස්ම ගෙන එය රඳවා තබාගෙන ක්‍රමානුකූල ව පිට කිරීම සිදු කළ යුත්තේ පහළ තාරතාවේ සිට ඉහළ තාරතාව තෙක් යම් ස්වරයක හඬ නැංවෙන පරිදි ය.

  උදා: මෙහි දී හැකි තරම් දීර්ඝ කාලයක් හුස්ම රඳවා ගනිමින් පිට කරන්න.
- ඉහත ආශ්වාස ප්‍රශ්වාස ක්‍රියාවලිය ම සිදු කිරීම. මෙහි දී ප්‍රශ්වාස වාතය පිට කිරීම ආරම්භ කරන්නේ ඉහළ තාරතාවේ සිට පහළ තාරතාව තෙක් මෙම ස්වරය හඬ නැඟෙන පරිදි ය.
- ඉහත ක්‍රියාකාරකම් දෙක එකින් එක මාරුවෙන් මාරුවට එක ළඟ ඉදිරිපත් කිරීම කළ හැකි ය. මෙම ශ්වසන අභ්‍යාස අවසන් කරන්න ආසන්න වූ විට හඬ ස්වරය නැංවීම ද කළ හැකි යි. (එනම් හඬ අඩු කිරීම, වැඩි කිරිම, වෙනස් කිරීම, වෙවුලවීම වැනි ආකාරයෙන් ස්වර හඬ නැඟීම කළ හැකි යි.)

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

මෙම ස්වර හඬ නැඟීමේ දී යම් යම් භාවාත්මක බවකින් යුක්ත ව, යම් චරිත ස්වභාවයක් ඉස්මතු වන සේ හඬ පිට කිරීමට උත්සාහ කරන ලෙස සිසුන්ට ප්‍රකාශ කරන්න. සිසුන් 3-4 වැනි කණ්ඩායම්වලට බෙදා ඔවුන් ප්‍රශ්වාස කරන විට එය නිර්මාණාත්මක ව සිදු කිරීමට ඒ අනුව අවස්ථාව සලසන්න.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.1 : රංග අභ්‍යාස ප්‍රගුණ කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 04

ඉගැනුම් පල :
- වාචික අභිනයෙහි වැදගත්කම වටහා ගනී.
- වාචික අභිනය නිවැරදි ව භාවිත කිරීමට කටහඬ අභ්‍යාස කිරීම අවශ්‍ය බව ප්‍රකාශ කරයි.
- කටහඬ අභ්‍යාසවල යෙදෙමින් හඬ පිළිබඳ කුශලතා ප්‍රගුණ කරයි.

ක්‍රියාකාරකම 3.1.1.3 : කටහඬ අභ්‍යාස I

ගුණාත්මක යෙදැවුම් : විවිධ වාහන පණ ගන්වන ශබ්ද ඇතුළත් සංයුක්ත තැටියක් (ත්‍රීවීලරය, යතුරු පැදිය, ලොරිය, බසය වැනි වාහන)

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 01 වෙනත් ශබ්ද නොඇසෙන හිස් අවකාශයකට ළමයි රැගෙන යන්න. සියලු ළමයි ඒ මේ අත නිදහසේ ඇවිදවන්න. ඇවිදීම නවතා පෙරදින කරන ලද ශ්වසන අභ්‍යාස පිළිබඳ ව ළමයින් සමග සාකච්ඡා කරන්න.

පියවර 02 හඬ පටයේ ආධාරයෙන් විවිධ වාහනවල ශබ්ද හොඳින් ශ්‍රවණය කිරීමට සලස්වන්න.

පියවර 03 සිසුන් කණ්ඩායම්වලට බෙදා එක් එක් වාහන ශබ්දය නිකුත් කිරීම කණ්ඩායම්වලට පවරන්න. තමන්ට හිමි ශබ්දය හඬ නගා අනුකරණය කිරීමට උපදෙස් දෙන්න. ගුරුවරයා ගේ සංඥාවට අනුව කණ්ඩායම විවිධ ශබ්ද නිකුත් කරනු ඇත. එක් කණ්ඩායමක් ශබ්ද කරන විට අනෙක් කණ්ඩායම් නිශ්ශබ්ද ව අසා සිටිය යුතු ය. වාහනය එක වර ම නැවතීම යළි දුෂ්කර ලෙස පණ ගැන්වීම, කන්දක ගමන් කිරීම, වෙනත් ගියරයකට මාරු කිරීම වැනි විවිධ විධාන ලබා දීමට ගුරුවරයාට හැකි ය.

පියවර 04 ළමයින් පේළි පහකට පමණ සිටින සේ පෙළ ගස්වන්න. මුව හොඳින් විවර කොට ''අ'' ශබ්දය නැඟීම ආ... ඇ ඊ ඌ ඒ... යනාදි ලෙස විවිධ අක්ෂර අනුව ශබ්ද නඟන්නට අවස්ථාව ලබා දෙන්න. මෙම අකුරු ම යොදා ගෙන එම අභ්‍යාසය නැවත යම්කිසි හැඟීමක් ප්‍රකාශ වන අයුරින් කිරීමට යොමු කරවන්න. එහි දී එම හැඟීමට අනුව ආංගික චලනයන් ප්‍රකාශ වන්නේ නම් ඒ සඳහා ද අවස්ථාව ලබාදෙන්න. මෙහි දී වාචික අභිනය ද අදාළ අභ්‍යාසයන්හි යෙදෙන අනෙක් අභිනය ද ඒ හා එකතු විය හැකි බව සහ එසේ එකතු කළ හැකි බව පෙන්වාදෙන්න.

උදා: ''ආ... '' ශබ්දය යම්කිසි හැඟීමක් ද සහිත ව ඉදිරිපත් කරන විට එයට අදාළ ව ශාරීරික චලනය ද සිදුවීමට ඉඩ හරින්න.

පියවර 05 විවිධ සතුන් ගේ හඬ අනුකරණය කරවන්න. සිංහයකු ලෙස ද, මීයකු ලෙස ද ශබ්ද නඟන්න. එහි දී හඬට ගැළපෙන අයුරින් මුහුණේ ස්වරූපය වෙනස් කරමින් හඬ නඟන්න. සිංහයාගේ හඬ, මුහුණ ද වෙනස් කරමින් ඉදිරිපත් කර ක්ෂණයකින් මීයා ගේ හඬ සහ ස්වරූපයට වෙනස් වන්න. විවිධ වර්ගයේ සතුන් මේ ආකාරයට අනුකරණය කරන්න. විවිධ වයසේ විවිධ වර්ගයේ බල්ලන් දෙදෙනකු පොරකන ශබ්දයක් අනුකරණය කිරීම ද කළ හැකි ය.

පියවර 06 අභ්‍යාස අවසන් කළ පසු සියලු දෙනා ම කළ දේ පිළිබඳ ව සාකච්ඡා කිරීමත් සාධනීය ලක්ෂණ අගය කිරීමත් තව දුරටත් හඬ සංවර්ධනය කරගත යුතු තත්ත්ව පෙන්වාදීමත් කළ හැකි ය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- භාවාත්මක අයුරින් හඬ ප්‍රකාශන හැකියාව විමසීම.
- හඬ පාලනයෙහි හැකියාව විමසීම.
- නළු කාර්යය සඳහා කටහඬෙහි ඇති ප්‍රයෝජන ප්‍රකාශ කිරීම.
- විවිධ හඬ අභ්‍යාසවල ප්‍රායෝගික ව නිරත වීම.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.1 : රංග අභ්‍යාස ප්‍රගුණ කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- ''හඬ භාවිතය නළු කාර්යයේ දී අවශ්‍ය බව ප්‍රකාශ කරයි.
- කටහඬ සඳහා රංග අභ්‍යාස කළ යුතු බව වටහා ගනී.
- නාට්‍යවල සංවාදයේ යෙදීමේ දී හඬ පාලනය පිළිබඳ සැලකිලිමත් වෙයි.

ක්‍රියාකාරකම 3.1.1.3 : කටහඬ අභ්‍යාස II

ගුණාත්මක යෙදැවුම් : නම්පොත, පුවත් සිරස්තල සහිත පිටු කිහිපයක්, සංගීත ගුරුවරයා හෝ සංගීතය දන්නා සිසුවෙක් හෝ (සම්පත්දායකයකු ලෙස)

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 01 සියලු සිසුන්ට සරල ව ශ්වසන අභ්‍යාසයන් 3ක් පමණ කරවන්න. හිස් අවකාශයක් සොයා ගැනීමට අපහසු නම් පන්ති කාමරයේ දී වුව මෙය කළ හැකි ය.

පියවර 02 නොනවත්වා කතා කිරීම (Non-stop talk) සියලු සිසුන්ට හිස් අවකාශයේ සැම ස්ථානයක් ම ආවරණය වන සේ ඇවිදීමට විධාන කරන්න. එසේ ඇවිදින අතරේ තමන්ට සිතෙන ඕනෑ ම දෙයක් වේගවත් ව, නොනවත්වා කතා කිරීමට උපදෙස් දෙන්න.

පළමු ව මිනිත්තුවකින් සංඥාවක් දී ක්‍රියාකාරකම නවත්වන්න. නැවත වරක් ආරම්භ කරන්න. නොනවත්වා ඉතා ඉක්මනින් වේගවත් ව කතා කරවන්න. තමන් ගේ සිතට එන ඕනෑ ම හැඟීමක් ප්‍රකාශ කළ හැකි ය. වචන අතර තර්කානුකූල සම්බන්ධතාවක් අවශ්‍ය නැත. අවශ්‍ය නම් තමා කැමති පුද්ගල චරිතයකට අනුව කතා කිරීමට ද පුළුවන. අදාළ හැඟීම් ද සහිත ව.

උදා: දේශපාලකයක්, බීමත් පුද්ගලයෙක්, මානසික රෝගියෙක්, රොබෝවක්, නූගත් ගැමියෙක්, ඕපදූප සොයන ගැමි කතක්

පියවර 03 ළමයින් රවුමට සිටුවන්න. එක් අයකුට මිනිත්තුවක් කතා කිරීමට සලසන්න. ඔහු ගෙන් පසු ව ඊළඟට සිටින අය කතාව පටන් ගත යුතු ය. මේ ආකාරයට සියලු දෙනා ක්ෂණික ව ඉතා වේගවත් ව හොඳින් මුව විවර කොට වචන කියවා ගෙන යා යුතු ය.

ළමයින් රවුමක හැඩයට වාඩි කරවන්න. එක් ළමයෙක් කතාවකට මුල පුරයි. ඊළඟ තැනැත්තා එයට සම්බන්ධ අනෙක් කොටස නිර්මාණය කර ක්ෂණික ව ඉතා ඉක්මනින් කියාගෙන යයි. ඔහු නැවැත්වූ තැන සිට අනෙකා වේගයෙන් පටන් ගනී. මේ ආකාරයට ඉතා වේගයෙන් කතාවක් ගොඩ නැගිය හැකිය. හැඟීම් නිරූපණය වන අයුරින් ද අදහස් ප්‍රකාශ කළ හැකි බව පෙන්වා දෙන්න.

සිසුන් කැමති ගීතයක් හෝ ගීත කොටසක් හෝ ගායනා කිරීම. දෙවනු ව එම ගීත ඛණ්ඩය ම ඈත සිටින අයකුට ඇසෙන සේ ශබ්ද නගා ගායනා කිරීම. ළඟ සිටින සහ ඈත සිටින ආදි වශයෙන් විවිධ දුර ප්‍රමාණවලට ඇසෙන සේ ගායනා කිරීම.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- කට හඬ භාවිතය පිළිබඳ ව විමසීම
- හඬ විහිදුවමින් නොනවත්වා එක දිගට අදහස් ප්‍රකාශ කිරීම.
- විවිධ අදහස් ප්‍රකාශ වන පරිදි ක්ෂණික ව කථා කිරීම.
- හඬ යම් කිසි හැඟීමක් ද ප්‍රකාශ වන ආකාරයට භාවිත කිරීම.

පැවරුම : සැම සිසුවකුට ම නැවත අභ්‍යාස සඳහා සහභාගි වන දිනට ඉදිරිපත් කළ හැකි වන සේ කථාවක් පුහුණු වී පැමිණෙන ලෙස දන්වන්න. එය යම්කිසි කතන්දරයක් වීම වැදගත් බව පෙන්වාදෙන්න.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.1 : රංග අභ්‍යාස හා රංග ක්‍රීඩා ප්‍රගුණ කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- මිනිස් සිරුරට සංවේදන ලැබෙන ආකාර නම් කරයි.
- විඳීම් දැනීම් වශයෙන් සංවේදන හඳුනාගනියි.
- අන්‍යයන් ගේ සංවේදනවලට ප්‍රතිචාර දක්වයි / හඳුනාගනියි.
- සංවේදන හා පරිසරය අතර ඇති සම්බන්ධතා දක්වයි.
- සංවේදන හා සම්බන්ධ ජීවිත පරිඥානයන් අන්‍යයන් හා සමඟ බෙදාහදා ගනියි.
- අන්‍යයන් ගේ සංවේදන හඳුනාගෙන සාමූහික කටයුතුවල දී ගැටුම් අවම කර ක්‍රියා කිරීමේ කුශලතා ඇති කරගනියි.
- රංග අභ්‍යාසවලින් ලැබෙන වටිනාකම් ජීවිතයට එක් කරගනියි.
- එම ප්‍රතිලාභ නම් කරයි.

ක්‍රියාකාරකම 3.1.1.4 : සංවේදන අභ්‍යාස ප්‍රගුණ කරමු.

ගුණාත්මක යෙදවුම් :
- මෛත්‍රී භාවනාව අඩංගු හඬ පටයක් (සංයුක්ත තැටි)
- සත්ත්වයන් ගේ හඬ කිපයක් පටිගත කරන ලද හඬපට
- ලේනා ගේ හඬ, අලියා ගේ කුංචනාදය, කොටියා ගේ ගෙරවීම, කැරලා ගේ හඬ, බල්ලා ගේ බිරුම, නරියා ගේ හූව - අන්තර් ජාලයෙන් මෙම හඬවල් බාගත (download) කිරීම ද කළ හැකි ය.
- එසේ නැතහොත් විවිධ ශබ්ද (කටින්) නැඟිය හැකි සිසුන් තෝරාගන්න.
- සබන් කැට කීපයක් (සන්ලයිට්, ලක්ස්, බේබි, බාර් සබන්, ඩෙටොල් සබන්)
- රෙදි පටියක් (ඇස් බැඳීම සඳහා)
- අයිස් වතුර බඳුනක්, උණුවතුර බඳුනක්
- බිමට වැටුණු විට ශබ්දයක් නැගෙන භාණ්ඩයක් (ලොකු ලැල්ලක්, භාජනයක් වසන පියනක්, ඇලුමිනියම් ජෝගුවක් වැනි දෙයක්)

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 01 රූපණය සඳහා ශිෂ්‍යයන්ට මඟපෙන්වීමේ දී විවිධ රංග අභ්‍යාස පුහුණුවීම ඔවුන් ගේ සිරුරේ නම්‍යශීලී බව මෙන් ම මානසික සමබරතාව කෙරේ ද ප්‍රබල ලෙස බලපාන බව සාකච්ඡා කරන්න. මේ සඳහා ශිථිලකරණ අභ්‍යාස, ශ්වසන අභ්‍යාසය, කටහඬ අභ්‍යාස, පරිකල්පන අභ්‍යාස හා සංවේදන අභ්‍යාස ආදිය ප්‍රගුණ කළ යුතු අභ්‍යාස ලෙස පෙන්වාදෙන්න.

මෙම පාඩමෙන් දැක්වෙන්නේ සංවේදන අභ්‍යාස කෙරේ සිසුන් යොමු කරන අන්දම යි. මිනිස් සිරුරට සංවේදන ලැබෙන ඉන්ද්‍රිය 6 ක් ඇත. එනම්, ඇස, කන, දිව, නාසය, ශරීරය හා මනස යි. මිනිසා නිරන්තරයෙන් ම මෙම ෂඩින්ද්‍රිය ඔස්සේ සංවේදන ග්‍රහණය කරගනී. වඩාත් ශුභවාදී සංවේදන තදින් ග්‍රහණය කරගැනීමත් අශුභවාදී සංවේදන හැකි තාක් ග්‍රහණයෙන් ඉවත් කිරීමත් සාමාන්‍ය මිනිසා ගේ ස්වභාවය යි. ජීවිත පැවැත්ම උදෙසා ඉඳුරන් දමනය කරගැනීමේ දී සංවේදන පිළිබඳ ව උපේක්ෂා සහගත වීම ඉතා වැදගත් ය.

පියවර 02 සිසුන් කණ්ඩායම් 6 කට වෙන් කරන්න.

1 වන කණ්ඩායම සඳහා ඇසට අවශ්‍ය සංවේදන ලබාගන්න. අභ්‍යාසය පහත දැක්වෙන පරිදි ප්‍රගුණ කරගැනීමට අවස්ථාව ලබාදෙන්න.

- හිස් පන්ති කාමරයක් මේ සඳහා තෝරාගන්න.
- පන්තියේ තැනින් තැන පුටු කීපයක් තබන්න. (පිට්ටනියක් වැනි තැනක නම් ළමයින් පිරිසක් සිටුවා තබා ගමන් මඟ සකස් කර ගත හැකි ය.)



- මෙය සිසුන්ට අභිමත පරිදි හෝ භෞතික පරිසරයේ ඇති ඉඩකඩ අනුව හෝ වෙනස් කර ගත හැකි ය.
- සියලු දෙනාට ම එක වරක් දැස් හැර ඊතලයෙන් දැක්වෙන ගමන් මඟේ යන්නට ඉඩ දෙන්න. එක් එක් සිසුවාට එම ගමන යාමට කාලයක් ලබාදෙන්න.
- එම ගමන් මඟ හොඳට මතක තබා ගන්නා ලෙසත් ඊට උපක්‍රමයක් තමන් ම සිතා ගන්නා ලෙසත් පවසන්න.
- ඉන් පසු සිසුන් තමන් අන්ධ යැයි සිතා දැස් පටියකින් බැඳ පළමු ගමන් මාර්ගයේ මතකයෙන් යාමට ඉඩ දෙන්න.
- එක් සිසුවකුට නිරීක්ෂණයටත් මඟ පෙන්වීමට හා නායකත්වයටත් ඉඩ ලබාදෙන්න.
- කණ්ඩායම සම්පූර්ණයෙන් අභ්‍යාසයේ යෙදුණු පසු නායක සිසුවාට ද එම අවස්ථාව ලබාදෙන්න.
- සිසුන් සියලු දෙනා ම කාමරයෙන් ඉවත් කොට නායකයා විසින් එක් සිසුවකු ගේ ඇස් බැඳ දොරෙන් ඇතුළු කර පුටු මඟහරවමින් පෙරගිය ගමන් මඟේ බාධාවකින් තොර ව ගොස් දොරෙන් ඉවත් වීමට උපදෙස් දෙන්න.
- යම් ශිෂ්‍යයකු බාධා ලෙස පැවති පුටුවේ හැපුණොත් හෝ පුටුව ස්පර්ශ කළහොත් අභ්‍යාසයෙන් තාවකාලික ව ඉවත් කරන්න. එහෙත් පසු ව එම අවස්ථාව ලබා දෙන්න.
- යහපත් සංවේදන සහිත සිසුන් පෙර කී ගමන් මඟ ආරම්භයේ සිට අවසානය තෙක් ගමන් කරනු ඇත. දැස් පෙනෙන අවස්ථාවේ පෙනෙන දෙය නිසි පරිදි සංවේදනයට හසු කරගත් සිසුන්ට එම ගමන් මඟ නිම කිරීම අපහසු නොවේ.

II කණ්ඩායම (සිසුහු 5 දෙනෙක් හෝ 6 දෙනෙක් හෝ)

- සිසුන්ට යමක් නැති වූවා ය යි සිතා පන්ති කාමරයේ යමක් සොයන ආකාරයේ අභ්‍යාසයක යෙදෙන්නට ඉඩ ලබාදෙන්න.
- ඉන් පසු සිසුන් පන්ති කාමරයෙන් එළියට යවන්න.
- සෑම සිසුවකුට ම තමන් පරිහරණය කරන කුඩා වස්තුවක් (පෑනක්, මකනයක්, යතුරු රඳවනයක් (Key tag) පැන්සල් මුවහත් කරණයක් (Pencil cutter) තමන් ගේ අතේ තබා ගන්නා ලෙස පවසන්න.

- නායකයාට එක් එක් සිසුවා ගේ අතේ ඇති කුඩා භාණ්ඩය පන්ති කාමරයේ පහසුවෙන් සොයා ගත නොහැකි තැනක සඟවා තැබීමට උපදෙස් දෙන්න.
- එක් අයකු ගේ අතේ ඇති වස්තුව වෙන කෙනෙකුට හමු වුව හොත් කිසිදු ප්‍රතිචාරයක් නොදක්වන ලෙස ද උපදෙස් දෙන්න. තමාගේ භාණ්ඩය සොයා ගත් විට නිහඬ ව පන්ති කාමරයෙන් එළියට එන ලෙස උපදෙස් දෙන්න.

  උදා: පැන්සල → ගුරු මේසයේ මල් බඳුන තුළ

  එය අයිති නිමල්ට → දුටුවේ කමල්

  එහෙත් කමල් එය දුටු බව පැවසීම හෝ එය අතට ගැනීම හෝ නොකළ යුතු ය. තමා ගේ භාණ්ඩය පෑනක් නම් එය සඟවා ඇති තැන සොයා ගොස් ලබාගත යුතු ය.
- මේ ආකාරයට ඇස හා සම්බන්ධ දෘශ්‍ය සංවේදන ප්‍රගුණ කරගැනීමට අවස්ථාව ලබාදෙන්න.

III කණ්ඩායමම ආඝ්‍රාණය සම්බන්ධ අභ්‍යාස (කණ්ඩායමම සිසුහු 5 දෙනෙක් හෝ 6 දෙනෙක් හෝ)

- කණ්ඩායමට නායකයකු පත් කරගන්න.
- ඉතිරි සිසුන් රවුමට පුටුවල වාඩි කරවන්න.



- නායකයා තමන් අතේ සබන් කැට වර්ග 5ක් ඇති බව පවසන්න. ඒවායේ නම් පමණක් කියන්න.ලක්ස්, බේබි, සන්ලයිට්, බාර් සබන්, ඩෙටොල් සබන් ඒ ආකාරයට පලතුරු වර්ගයක් ද ඇති බව පවසන්න. (අඹ / අන්නාසි / පේර)
- සිසුන්ට පෑනක් හා පොතක් රැගෙන වාඩි වන ලෙස මුලින් ම උපදෙස් දෙන්න. පුටුවල වාඩි වූ සිසුන් ගේ දෑස් රෙදි පටියකින් බඳින්න.
- ඉන් පසු නායකයා එක් සබන් කැටය බැගින් ගෙන නාසයට ළං කර ආඝ්‍රාණය කර සබන් වර්ගයේ නම අංක යොදමින් ලියන ලෙස උපදෙස් දෙන්න.

  (උදා : අංක 1 - ලක්ස්)
- සබන් වර්ගය අතරතුර පලතුරු කැබලි ද වරකට එක බැගින් රවුමේ යමින් ආඝ්‍රාණය කිරීමට සලස්වා එහි නම ලියන ලෙස උපදෙස් දෙන්න.
- මෙහි දී එකිනෙකාට ඇසෙන ලෙස පිළිතුරු හඬ නගා කීමට හෝ අනෙකා ගෙන් ඇසීමට හෝ ඉඩ නොදෙන්න.
- භාවිත කරන ද්‍රව්‍ය ප්‍රමාණ අනුව රවුම් ගණන ද වැඩිවේ. නායකයා ද තමා යන රවුම් ගණනට අදාළ ද්‍රව්‍ය නිවැරදි ව පොතක සටහන් තබා ගත යුතු ය.
- අවසානයේ තමාගේ දෑස් බැඳි පටිය ගලවා ගන්නා ලෙසට උපදෙස් දෙන්න.
- නායකයාට අනුව තමන් හඳුනාගත් සුවඳ හා ද්‍රව්‍ය නිවැරදි ද යන්න තහවුරු කරගැනීමට සිසුන්ට ම අවස්ථාව ලබාදෙන්න.

IV කණ්ඩායම - ස්පර්ශ සංවේදන අභ්‍යාස

- එක් සිසුවකු ඇස් බැඳ පුටුවක වාඩි වී සිටීමට සලස්වන්න.
- අනෙක් සිසුන්ට ඔහුට අතට අත දීමට සලස්වන්න.
- අතට අත දීමේ දී විවිධ ආකාර ඇති බව ප්‍රකාශ කිරීමට ඉඩ දෙන්න.
  1. සම්පූර්ණයෙන් ම අතට අත දීම- සුහද බව
  2. අතේ ඇඟිලි පමණක් ස්පර්ශ කිරීම - දැඩි කැමැත්තක් නැති බව
  3. අත තදින් මිරිකීම - අකමැත්ත / තරහව
  4. ඉතා ඉක්මනින් අත ඉවතට ගැනීම - දැඩි අප්‍රසාදය
- ඉන් පසු අයිස් වතුර බඳුනට අත දමා තිබී අතට අත දීමට සලස්වන්න.
- ඒ අවස්ථාවේ දී ඇස් වැසූ ශිෂ්‍යයා ගේ ප්‍රතිචාර නිරීක්ෂණය කරන්න.
- උණුසුම් ජල බඳුනට අත දමා අතට අත දීමේ දී ප්‍රතිචාර නිරීක්ෂණය කරන්න. (උණුසුම් ජල බඳුන - අත නොපිලිස්සෙන පරිදි සකස් කර ගත යුතු ය.)
- මෙම සැම අභ්‍යාසයක දී ම සිසුන් ගේ ප්‍රතිචාර හා භාව ප්‍රකාශනය නිරීක්ෂණය කිරීමට සිසුන්ට ඉඩ ලබාදෙන්න.

V කණ්ඩායම - ශබ්ද පිළිබඳ සංවේදන අභ්‍යාස

- සිසුන්ට ඇස් වසා ගන්නට උපදෙස් දෙන්න.
- 1-5 තෙක් විරාමයක් සහිත ව ගණන් කරන්න.
- අංක 5ට ගණන් කරන විට විශාල ශබ්දයක් ඇසෙන බව උපකල්පනය කරන්නට උපදෙස් දෙන්න.
- හඬක් ඇසුණා ය යි සිතා ප්‍රතිචාර දක්වන්නට ඉඩ ලබාදෙන්න.
- ඉන් පසු 25ට ගණන් කිරීමට ඉඩ ලබාදෙන්න.
- අංක 15ට පමණ ගණන් කිරීමේ දී ගුණාත්මක යෙදැවුම් පිණිස සපයාගත් බඳුනක්, උපකරණයක් බිම දමා ශබ්දයක් ඇති කරන්න. එහි දී ශිෂ්‍යයන් ගේ ප්‍රතිචාර නිරීක්ෂණය කරන්න. අනපේක්ෂිත ශබ්ද නිසා ඇති වන සංවේදනවලට දක්වන ප්‍රතිචාර සෙසු සිසුන්ට නිරීක්ෂණය කිරීමට ඉඩ ලබාදෙන්න.

VI කණ්ඩායම - ශබ්ද හඳුනා ගැනීමේ අභ්‍යාස

ඉහත කණ්ඩායම් සියල්ලේ ම ක්‍රියාකාරකම් හැකි තාක් දුරට අනෙක් කණ්ඩායම්වලට නිරීක්ෂණය කිරීමට ඉඩ ලබාදෙන්න. ක්‍රියාකාරකම් අවසානයේ දී පහත දැක්වෙන කරුණු පිළිබඳ ව සිසුන් හා සාකච්ඡා කරන්න.

- සංවේදන අභ්‍යාස මගින් තම චර්යා හා සිරුර කැමති පරිදි පාලනය කරගත හැකි වීම.
- ෂඩ් ඉන්ද්‍රියයන්ට ගෝචර වන සංවේදන පිළිබඳ අභ්‍යාස ප්‍රගුණ කිරීමෙන් හෝ විඳ ගැනීමට පුරුදු වීමෙන් හෝ විවිධ භූමිකා රංගනවල දී ඉමහත් ප්‍රයෝජන ලැබිය හැකි බව.
- ඉන්ද්‍රියයන් පාලනය කරගැනීම භූමිකා රංගනයට පමණක් නො ව පෞද්ගලික ජීවිතයට ද අතිශය වැදගත් බව.
- සංවේදන අභ්‍යාසය මගින් අභියෝග විඳ දරා ගැනීමේ හැකියාව ඇති වන බව.

  උදාඃ චිත්ත ඒකාග්‍රතාව මගින් අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය ශක්තිය ගොඩ නඟා ගැනීම.

  සිරුර - ස්පර්ශ - සුඛදායී වුව ද / දුක්ඛදායී වුවද ඉවසා සිටීමට හුරු වීම. ඉන්ද්‍රිය දමනය, රංගනයේ දී නම්‍යශීලී බව ඇති කිරීමට බලපාන බව.

කන ඇසීම - හඬ හඳුනාගැනීම / විධාන පිළිපැදීම / අදහස් හා මත ඉවසා සිටීම.

- නාසය → ආඝ්‍රාණය → ගඳ සුවඳ හඳුනාගැනීම හා විඳ දරා ගැනීම.
- දිව → රස/නීරස හඳුනාගැනීම
- සියලු කණ්ඩායම්හි අභ්‍යාස / ක්‍රියාකාරකම් අවසාන වූ පසු සියලු ම සිසුන් බිම වාඩි කරවා මෛත්‍රී භාවනාව හඬ පටයට සවන් දී සිත එක් අරමුණක රඳවාගැනීමට උපදෙස් දෙන්න.
- අවසානයේ සිත භාවනාවට අරමුණු වූවා ද නැද්ද යන්න සිසුන් ගෙන් විමසන්න.
- අවංක ව පිළිතුරු ලබාදෙන ලෙස උපදෙස් ගුරුවරයා විසින් ලබා දිය යුතු ය.
- එහි දී ළමයින් ගේ පිළිතුරු නිරීක්ෂණය කිරීමෙන් පසු එක් ධාරණාවක් කෙරේ සිත යොමු කිරීමේ වටිනාකම රංගනයේ දී වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.
- විවිධ සතුන් ගේ හඬ ඇතුළත් පටය හෝ විවිධ ශබ්ද නැඟීමේ කුශලතා ඇති ශිෂ්‍යයා හෝ උපයෝගී කර ගන්න.
- පන්තියේ සිසුන්ට වාඩි වී ඇස් තදින් වසාගැනීමට උපදෙස් දෙන්න.
- ඉන් පසු හඬ පටය ක්‍රියාත්මක කර හෝ සිසුවා මඟින් හෝ විවිධ සතුන් ගේ ශබ්ද ඇසීමට සලස්වන්න.
- එක් සතකුගේ ශබ්දයක් ඇසුණු පසු ඇස් හැර ශබ්දය කුමන සතා ගෙන් නිකුත් වන්නක් දැයි ප්‍රකාශ කරන ලෙස දක්වන්න. එකිනෙකා ගෙන් විමසන්න. ශබ්දය හඳුනාගත් සිසුන්ට අත ඔසවන ලෙස උපදෙස් දෙන්න.
- සියලු ම හඬ ප්‍රකාශ වුවාට පසු සිසුන්ට එම හඬ නැඟීමට තමන්ට හැකියාව තිබේ දැයි අභ්‍යාස මඟින් ප්‍රගුණ කර ගැනීමට උපදෙස් දෙන්න.
- බාහිර පරිසරයේ ඇති වන එබඳු ශබ්ද කෙරේ යොමු වන ලෙස උපදෙස් දෙන්න.
- පසු විපරමක් ලෙස ඊළඟ පාඩමේදී සිසුන් පරිසර නිරීක්ෂණයෙන්/ශ්‍රවණයෙන් හඳුනාගත් හඬ පිළිබඳ විමසන්න.
- නාට්‍යයක් නිර්මාණය කිරීමේ දී මෙම හඬ වර්ග භාවිත කළ හැකි අයුරු සාකච්ඡා කරන්න.
- පරිසරයට සංවේදී වීමෙන් බොහෝ ප්‍රයෝජන ඇති බව සාකච්ඡා කරන්න.

  උදාඃ කැලයක් මැදින් යාමේ දී සතුන්ගෙන් ආරක්ෂා වීම සඳහා හඬට සංවේදී වීම අතිශය ප්‍රයෝජනවත් බව දක්වන්න.
- නාට්‍යයක් රංගගත කිරීමේ දී අන්‍යයන්ගේප්‍රතිචාර / අදහස් / මතවාද / හඳුනාගැනීමට හා දරා ගැනීමට ඉන් ලැබෙන ප්‍රයෝජන දක්වන්න.

  උදාඃ නව නළු රසය හා සම්බන්ධ භාවයන්ට අදාළ ඉරියව් හා අභිනය

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ

- පංචේන්ද්‍රියන් කෙරේ යොමු වන සංවේදන හඳුනාගෙන ඒවා ශුභවාදී ලෙස ප්‍රගුණ කළ හැකි වෙනත් අභ්‍යාස නිර්මාණය කරන්න.
- රූපණය සඳහා එම අවස්ථා යොදාගත හැකි ආකාරයේ රංගන අවස්ථා නිර්මාණය කරන්න.
- සංවේදන අභ්‍යාස ප්‍රගුණ කිරීමෙන් ජීවිතයට ලැබෙන ප්‍රතිලාභ නිදසුන් මඟින් පැහැදිලි කරන්න.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.1 : රංග අභ්‍යාස ප්‍රගුණ කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- පරිකල්පන අභ්‍යාසයට අයත් වන විවිධ ප්‍රභේද අධ්‍යයනය කරයි.
- පරිසරයේ දී දකින විවිධ හැඩතල ප්‍රතිනිර්මාණය කළ හැකි බව ප්‍රකාශ කරයි.
- කණ්ඩායම් ක්‍රියාකාරීත්වය තුළ පවතින විවිධ පෞරුෂ හා අන්‍යෝන්‍ය කුශලතා හඳුනාගනී.
- එම කුශලතා සාමූහික නිර්මාණයට යොදා ගන්නා ආකාරය විස්තර කරයි.
- සාමූහිකත්වය, සහයෝගිතාව, සතුට භුක්ති විඳියි.
- ක්ෂණික ව, නිවැරදි ව තීරණ ගැනීමට පුහුණුව ලබයි.

ක්‍රියාකාරකම 3.1.1.5.1 : පරිකල්පන අභ්‍යාස (සාමූහික)

ගුණාත්මක යෙදැවුම් : වී කොටන යන්ත්‍රය, අත් ට්‍රැක්ටරය, කේතලය, විදුලිය පංකාව, බෝතලය නෙළුම් මල, ත්‍රිරෝද රථ, බොලොක්කයක් භාවිතයෙන් වතුර අදින ළිඳ, බෝලය සහ පිත්ත සහිත පින්තූර හෝ භාණ්ඩ

ඉගැනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 01 ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා සුදුසු නිදහස් අවකාශයක් සහිත භූමියකට සිසුන් කැටුව යන්න. පරිසරයේ දී එදිනෙදා දැකිය හැකි හැඩතල හා වස්තු පිළිබඳ නිදසුන් සැපයීමට සිසුන් පොලඹවන්න. ගුණාත්මක යෙදැවුම් වශයෙන් සපයා ගත් පින්තූරවල හෝ භාණ්ඩවල හෝ හැඩතල නිරීක්ෂණය කිරීමට අවස්ථාව සලසන්න.

එබඳු නා නා විධ හැඩතල හා වස්තු ශිල්පියා ගේ ශාරීරික ප්‍රකාශනයන් ලෙස ප්‍රතිනිර්මාණය කළ හැකි බව පැහැදිලි කරන්න.

පියවර 02 අහඹු ලෙස සිසුන් කණ්ඩායම් කර ස්ථානගත කරන්න. නිශ්චිත කාලයක් තුළ දී දෙනු ලබන වස්තුව හෝ හැඩතලය හෝ නිර්මාණය කළ යුතු බවට උපදෙස් සපයන්න.

- මෙහි දී භාවිත කළ හැක්කේ තම තමන් ගේ ශරීරය හා වචන පමණක් බව පැහැදිලි කරන්න.
- මුලින් ම සරල හැඩතල වන වෘත්තය, චතුරස්‍රය, කතිරය වැනි දෑ නිරූපණයටත්, අනතුරු ව එම හැඩතල භාවිත කරමින් විවිධ වස්තු නිර්මාණය කිරීමටත් උපදෙස් සපයන්න.
  නිදසුන් : හැඩතල
  රවුම, සනකය, කොටුව, ත්‍රිකෝණය

පියවර 03 හැඩතල ආශ්‍රිත වස්තු

නුග ගස, පුවක් ගස, කුඹියා, ඉබ්බා, තරුව, පොකුණ, අලියා, කකුළුවා, ගඟ

පියවර 04 නිර්මාණාත්මක වස්තු

කේතලය, අත්ට්රැක්ටරය, විදුලි පංකාව, පොත, නෙළුම් මල, ත්‍රිරෝද රථය වතුර අදින ළිඳ, බෝලය සහ පිත්ත ස්වාභාවික හෝ අස්වාභාවික හෝ වස්තු ලෙස අප දන්නා හඳුනන වස්තු ගුරු භවතාට අභිමත පරිදි භාවිත කළ හැකි වේ.

පියවර 05 සියලු නිර්මාණ අගය කරන්න. හැඩතල නිවැරදි කරන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලිඛිත ව හෝ වාචික ව හෝ ලබා ගනිමින් සිසු දැනුම තහවුරු කරන්න.

- පරිකල්පන අභ්‍යාස මගින් නළු කාර්යයට අත්වන වාසි පැහැදිලි කරන්න.
- පරිසරයේ දැකිය හැකි ස්වාභාවික වස්තු සහ ස්වාභාවික නොවන වස්තු අතර වෙනස පහදන්න.
- නිවැරදි ලෙස හැඩතල නිර්මාණය කරන්න.
- ශරීරය භාවිතයෙන් කරන ලද නිර්මාණයන්හි විශිෂ්ටත්වය අගයන්න.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.1 : රංග අභ්‍යාස ප්‍රගුණ කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- පරිකල්පන අභ්‍යාස යනු කුමක් ද යි ප්‍රකාශ කරයි.
- පරිකල්පන අභ්‍යාසවලට අදාළ විවිධ ප්‍රභේද වර්ග කරයි.
- පරිකල්පන කුශලතා උපයෝගි කරගනිමින් පරිකල්පන අභ්‍යාසවල නිරත වෙයි.
- විවිධ පරිකල්පනවලට අනුව නව නිර්මාණයවල යෙදෙයි.

ක්‍රියාකාරකම 3.1.1.5.3 : පරිකල්පන අභ්‍යාස (අවස්ථාවක්/සිදුවීමක්)

ගුණාත්මක යෙදැවුම් : පියවර 02ට අදාළ ගීත ඇතුළත් සංයුක්ත තැටියක්, තැටි ධාවක යන්ත්‍රයක්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 01 මෙම ක්‍රියාකාරකම සඳහා පන්ති කාමරය හෝ වෙනත් ප්‍රමාණවත් අවකාශයක් හෝ වෙත සිසුන් යොමු කරන්න. සියලු සිසුන් වෘත්තාකාර ව රඳවා ගුරු භවතා ද එහි ම රැඳී, සරල ශ්වසන අභ්‍යාසයක යෙදෙමින් පාඩම කෙරෙහි සිසු අවධානය යොමු කරගන්න.

පියවර 02 සියලු ම දෙනා බිම වාඩි වී, 'පරිකල්පනය' යනු කුමක් ද යි පහදා ගැනීමට සිසුන්ට සහාය වන්න. එහි දී අලුතින් යමක් සිතීම, නිර්මාණශීලි සංකල්ප, එවන් ගීත නිර්මාණ ලෙස,

• ''සුරංගීට දුක හිතුණා...''	රචක -	ප්‍රේමකීර්ති ද අල්විස්
	ගායනය -	නන්දා මාලනී
• ''යමුනා ගං තෙර...''	රචක -	සුනිල් ආරියරත්න
	ගායනය -	නන්දා මාලනී
''සන්නාලියනේ...''	රචක -	මහගමසේකර
	ගායනය -	ඩබ්.ඩී. අමරදේව

වැනි ගීත නිර්මාණ පිළිබඳ ව ද සඳහන් කරමින් පාඩම කෙරෙහි පූර්ව සූදානමක් ඇති කරවන්න.

- නාට්‍ය නිර්මාණයක ''පරිකල්පනය'' (Imagination) හා ''සංකල්ප'' (Concepts) බෙහෙවින් ක්‍රියාත්මක වනු දක්නට හැකි ය.
- නාට්‍යයක් නිර්මාණය කිරීමට කතා වස්තුව සිතට එන විට ද,
- පිටපත නාට්‍යයක් බවට පත් කිරීමේ දී නාට්‍යයේ ආකෘතිය හා ශෛලිය තීරණය කිරීමේ දී ද,
- විවිධ චරිත නිරූපණය කිරීමේ ස්වභාවය නිර්ණය කිරීම, එනම් චරිතයන් ගේ අනන්‍යතා හඳුනාගැනීමේ දී ද,
- වේෂභූෂණ, නාට්‍යෝපකරණ, අංගරචනය, පසුතල, රංගාලෝකය, සංගීතය යනාදි ආනුෂංගික කලා සුසංයෝග කිරීමේ දී ද,
- රංග වින්‍යාසය නිර්මාණය කිරීමේ දී ද, (ප්‍රවේශන, නිෂ්ක්‍රමණ අවස්ථා ද ඇතුළත් ව)
- අවසානයේ දී නාට්‍යය, විචාරාත්මක ප්‍රවේශයේ දී ද විවිධ පරිකල්පන හා සංකල්ප ජනනය වෙමින් නිරතුරු ව ම නාට්‍ය කලාව පෝෂණය වන ආකාරය ද සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

පියවර 03 සරල ක්‍රමවේදයකට අනුව සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. මාතෘකා දෙකක් ලබා දෙන්න.

- මළ ගෙදරක සිදුවන අපූර්ව සිදුවීමක්
- මංගල උත්සවයක සිදුවන අපූර්ව සිදුවීමක්
- නාට්‍ය කලා විෂයයට අදාළ වන්නේ හුදෙක් මළ ගෙදරක හෝ මංගල උත්සවයක හෝ චරිත හා ක්‍රියාකාරකම් නිරූපණය නොව එවැනි තැනක ඇතිවන සිදුවීමක් නාට්‍යමය අවස්ථාවක් ලෙස නිරූපණය කිරීම බව පැහැදිලි කරන්න.
- මාතෘකාවට අදාළ වුව, පරිකල්පනාත්මක නිර්මාණයක දී නාට්‍යෝචිත, අපූර්ව දැක්මක් ඒ තුළ තිබිය යුතු බව පැහැදිලි කරන්න.
- මළ ගෙය - පවුල් පරිසරය, මරණයට හේතුව, සාමාජික සම්බන්ධතා, යැපීම සම්බන්ධ ගැටලු, අවසන් කටයුතු සංවිධානය, ඥාති, හිතවතුන් සහ සහභාගි වන පිරිස් සඳහා සංග්‍රහ කටයුතු, ඒ සැම අතරින් මානව චර්යා රටාව ආදි පැතිකඩ ඔස්සේ නාට්‍යමය සිදුවීම නිර්මාණය විය යුතු සැටි විස්තර කරන්න.
- මංගල උත්සවය - මනාල පාර්ශ්වයේ පැමිණීම, පිළිගැනීම්, චාරිත්‍ර, සංග්‍රහ, තිළිණ ප්‍රදාන, කතා බහ, හමුවීම්, සමුගැනීම් ආදි කටයුතු අතර අපූර්ව නාට්‍යමය ආකාරයෙන් නිර්මාණය කෙරෙහි අවධානය යොමු කිරීම කළ හැකි බවත් පැහැදිලි කරන්න.
- එලෙස මාතෘකාව පිළිබඳ ව පරිකල්පනය කිරීමට මිනිත්තු 10ක පමණ කාලයක් ලබා දී, තම නිර්මාණය නිර්මාණශීලී ලෙස ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.

පියවර 04 ඒ ඒ කණ්ඩායම් තම නිර්මාණ ඉදිරිපත් කිරීමේ දී අනෙක් කණ්ඩායමට නිරීක්ෂණය සඳහා අවස්ථාව ලබාදෙන්න.

පියවර 05 ඉදිරිපත් කරනු ලබන නිර්මාණයෙහි සාධනීය ලක්ෂණ, දුර්වල ස්ථාන මෙන් ම තව දුරටත් පරිකල්පනය කිරීමට තිබූ අවස්ථා පිළිබඳ ව ද සිසු අවධානය යොමු කරමින් සාකච්ඡාවක් ගොඩ නගන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පහත දැක්වෙන පරිදි ප්‍රශ්න අසමින් සිසුන් ඇගැයීමට ලක් කරන්න.

- පරිකල්පනය යනු කුමක් ද?
- පරිකල්පන කුශලතා ප්‍රගුණ කරගැනීමෙන් අත්වන ප්‍රයෝජන මොනවා ද?
- නළු කාර්යයේ දී ''පරිකල්පනය'' අවශ්‍ය වන්නේ ඇයි?
- පරිකල්පන ශක්තිය ප්‍රගුණ කරගන්නේ කෙසේ ද?
- පරිකල්පන අභ්‍යාස දෙකක් නම් කරන්න.

පැවරුම : ඔබ දුටු නාට්‍යයක පරිකල්පනය හා සංකල්ප මතු කෙරෙන ආකාරය පැහැදිලි කරන්න.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යායයන් ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.1 : රංග අභ්‍යාස ප්‍රගුණ කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- 'පරිකල්පනය' යන්නෙහි අර්ථ නිරූපණය කරයි.
- අභ්‍යාස මඟින් පරිකල්පන කුශලතා වර්ධනය කර ගනියි.
- විවිධ වර්ගයේ පරිකල්පන අභ්‍යාස ප්‍රගුණ කරයි.

ක්‍රියාකාරකම 3.1.1.5.3 : පරිකල්පන අභ්‍යාස -කේවල නිර්මාණ

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 01 ප්‍රමාණවත් හිස් අවකාශයක, සියලු ම සිසුන් වෘත්තාකාර ව සිටගැනීමට සලස්වා ගුරු භවතා ගේ මෙහෙයවීමෙන් සරල ශ්වසන අභ්‍යාසයක නිරත කරවීමෙන් පාඩම කෙරෙහි සිසු අවධානය යොමු කරවා ගත හැකි ය.

පියවර 02 ගුරු භවතා සමඟ සියලු ම සිසුන් බිම වාඩි වී 'පරිකල්පනය' යනු කුමක් දැ යි හඳුනාගැනීම සඳහා සාකච්ඡාවක් ගොඩ නගන්න.
පරිකල්පනය යනු යථාර්ථයෙන් ඔබ්බට නිර්මාණාත්මක ව සිතීමකි. තිබෙන දේ උපයෝගී කරගෙන අලුත් දේ නිර්මාණය කිරීම යි. කරුණු පැහැදිලි කිරීම සඳහා යම රජු, දෙවියන්, සුරාංගනාවන් වැනි චරිත මෙන් ම ගීත රචනා ද, නාට්‍යමය අවස්ථා ද නිදසුන් වශයෙන් දැක්විය හැකි ය.
පරිකල්පන කුශලතා වර්ධනය කිරීම සඳහා විවිධ අභ්‍යාස ක්‍රම ඇති බව පවසමින් එවැනි එක් අභ්‍යාසයක නිරත වීමට සූදානම් කරන්න.

පියවර 03 කණ්ඩායමේ එක් සිසුවකු අත මැටි ගුලියක් ඇතැ යි සිතා ගැනීමට උපදෙස් දී, එමගින් කිසියම් භාණ්ඩයක් නිර්මාණය කර එය ඊළඟ සිසුවාට යොමු කරවන්න. මෙහි දී එම භාණ්ඩය කිසියම් ආකාරයකට පරිහරණය කරමින් නිරූපණය කර වෙනත් භාණ්ඩයක් නිර්මාණය කර ඊළඟ සිසුන්ට ලබා දීම සඳහා උපදෙස් දෙන්න.
මෙලෙස එකිනෙකා අතට භාණ්ඩ හුවමාරු වෙමින්, භාණ්ඩ හඳුනා ගනිමින් පරිහරණය කරමින්, වෙනත් භාණ්ඩයක් ලෙස නිර්මාණය කරමින් නව නිර්මාණ රැසක් පරිකල්පනයෙන් පරිහරණය කර නිරූපණය කිරීමට ඉඩ ප්‍රස්ථාවය සලසන්න.

පියවර 04 සිසුන් විසින් පරිකල්පනය කර නිර්මාණය කරන ලද විශේෂ භාණ්ඩ අගය කරමින්, තවදුරටත් පරිකල්පන අභ්‍යාස ප්‍රගුණ කිරීම සඳහා යොමු කරවන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පරිකල්පන කුශලතා වර්ධනය කරගැනීම ද නළු කාර්යය සඳහා අත්‍යවශ්‍ය බව නිදසුන් සහිත ව පහදා දෙන්න.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.1 : චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.
කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- ක්ෂණික නිරූපණ ක්‍රියාවලිය හඳුනාගනියි.
- ක්ෂණික නිරූපණ අවස්ථා නිර්මාණය කරයි.
- මුල, මැද අග සහිත කතාවක සැකිල්ලක් නිර්මාණය කරයි.
- සාමූහික ව එකතු වී අවස්ථාව රඟ දක්වා පෙන්වයි.

ක්‍රියාකාරකම 3.1.2 : ක්ෂණික නිරූපණ (සාමූහික)

ගුණාත්මක යෙදැවුම් : පන්ති කාමරයේ දී ලබාගත හැකි බෑග්, වතුර බෝතල්, ඇඳුම් වැනි දේ
ඉගැනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ගුරුවරයා සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. මූලික රංග අභ්‍යාස කිහිපයක යොදවන්න. සහභාගි වන සිසුන් ප්‍රමාණය අනුව එක් කණ්ඩායමක් හෝ කණ්ඩායම් කිහිපයක් හෝ වශයෙන් බෙදන්න.
- ගුරුවරයා ලබා දෙන මිනිත්තු 5-10 කාලය අතරතුර කණ්ඩායමට සූදානම් වී කැමති නාට්‍යමය අවස්ථාවක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබාදෙන්න. එහි දී එක් කණ්ඩායමක් හෝ කණ්ඩායම් කිහිපයක් හෝ සිටිය ද ඒ සෑම කණ්ඩායමක් ම වෙතට ගොස් ඔවුන් ගේ නිර්මාණාත්මක කාර්යයට අවශ්‍ය මඟපෙන්වීම කරන්න.
- සිසුන් ලවා ක්ෂණික නිරූපණය කරවන්න. අවසානයේ එම ඉදිරිපත් කිරීම පිළිබඳ ව ඇගයීමක් කරන්න. සාධනීය ලක්ෂණ හා නිශේධනීය ලක්ෂණ පෙන්වා දෙන්න. සිසුන්ගේ අදහස් විමසමින් සාකච්ඡා ස්වරූපයෙන් මෙම කාර්ය කළ යුතු ය.
- එම ක්ෂණික නිරූපණ අවස්ථාවෙන් පසු ව ගුරුවරයා මාතෘකාවක් ලබා දී එම මාතෘකාව අනුව ක්ෂණික නිරූපණයකට අවස්ථාව සලසන්න.
    - මෙන්න හොරෙක්
    - පන්ති කාමරයට විසකුරු සර්පයකු පැමිණීම.
    - මංගල උත්සවය අවස්ථාවේ මනමාලයා අතුරුදහන් වීම

  වැනි මාතෘකා සිසුන්ට ලබා දෙන්න.

  මෙවැනි මාතෘකාවක් ලද විට සිසුන් එම මාතෘකාවට අදාළ වන ආකාරයට නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කරගත යුතු බව පෙන්වා දෙන්න. මුල, මැද, අග සහිත කුඩා කථා ප්‍රවෘත්තියක් ද, සිටින සිසුන් ගණනට අදාළ වන සේ චරිත ද නිර්මාණය කරගෙන මෙම ක්ෂණික නිරූපණය ඉදිරිපත් කිරීමට මඟ පෙන්වන්න. මිනිත්තු 10- 15 ත් අතර කාලයක් සූදානම් වීමට ලබා දෙන්න. ඒ අවස්ථාව තුළ සපයා ගත හැකි ඇඳුම්, පැළඳුම්, පුටු මේස, බෝතල්, බෑග් වැනි දේ ද යොදා ගැනීමට හැකි බව පවසන්න.
- ක්ෂණික නිරූපණ රංගය ඉදිරිපත් කිරීම. කණ්ඩායම් කිහිපයක් ඇත් නම් ඒ ඒ කණ්ඩායමට අයත් නාට්‍ය විචාරයට ලක් කිරීමට අවස්ථාව සලසා දෙන්න. සිසුන් ගේ අදහස් විමසීමෙන් පසු ව ගුරුවරයා තමා දුටු අඩුපාඩු ද එය වඩාත් නාට්‍යෝචිත ව නිර්මාණය කරගත හැකි ආකාරය ද සිසුන්ට පෙන්වා දෙමින් පාඩම අවසන් කරන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ක්ෂණික නිරූපණ ක්‍රියාවලිය හඳුනාගැනීම.
- විවිධ මාතෘකා යටතේ ක්ෂණික නිරූපණ නිර්මාණය කළ හැකි බව වටහා ගැනීම.
- කුඩා කථා ප්‍රවෘත්තියක් නිර්මාණය කිරීම.
- සාමූහික ව ක්‍රියාත්මක වීම.
- අවට ඇති විවිධ ද්‍රව්‍ය සහ අවකාශය රංගය සමග බද්ධ කර ගැනීම ....

පැවරුම : සිසුන් ඉදිරිපත් කළ ක්ෂණික නිරූපණය පිටපතක් වශයෙන් රචනා කරන්නට අවස්ථාව ලබාදෙන්න.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.2 : රංග ක්‍රීඩා ප්‍රගුණ කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 04

ඉගැනුම් පල :
- සිරුර උණුසුම් කරගැනීමේ යෙදෙයි.
- සංගීත රිද්මයක් අනුව ශරීරාංග චලනය කරයි.
- නිර්මාණශීලී ව ක්‍රියා කරයි.
- රංගන කුශලතාවන් ද වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම 3.2.1 : රංග ක්‍රීඩාවල යෙදෙමු.

ගුණාත්මක යෙදවුම් : බෙරයක්, සංයුක්ත සංගීත තැටි

ඉගැනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පන්තියේ සිසුන් ඉඩකඩ ඇති අවකාශයකට රැගෙන යන්න. අවකාශය තුළ හොඳින් විසිරී සිටීමට ඉඩ සලසන්න. වේග රිද්මයේ සංගීත ඛණ්ඩයක් ඇසීමට සලස්වා එයට ගැළපෙන ලෙස සිරුර චලනය කරන්නට (නර්තනයේ යෙදීමට) ඉඩ සලසන්න. යම් කිසි කාල වේලාවක් මේ කාර්යය සඳහා යොදන්න. එහි දී විවිධාකාරයට ශරීරාංග චලනය කරමින් නර්තනයේ යෙදීමට සිසුන් යොමු කරන්න.

- වේග රිද්මයේ සංගීත ඛණ්ඩයට චලනය වීම අවසන් කළ පසු අවකාශයෙහි ස්වල්ප වේලාවක් සැහැල්ලුවෙන් ඇවිදීමට යොමු කරවන්න. මෙසේ අවකාශයේ (බිමේ) ඇවිදින විට සිසුන් හැම විට ම අවකාශය තුළ ඇති වන හිස්තැන් පිරෙන ලෙස ඇවිදීමට යොමු කරවන්න. ඇවිදින සැම සිසුවකු ම හිස්තැන් සොය සොයා ඇවිදීම සැම විට ම කළ යුතු වේ. මෙසේ ඇවිදින අතර ම සිසුන්ට විවිධ ක්‍රියාවල යෙදෙමින් ඇවිදින ලෙස ප්‍රකාශ කරන්න. අතක් ඔසවා ගෙන ඇවිදින්න. අතක් ඔසවාගෙන, පාද ඉදිරියට ගසා දමමින් ඇවිදින්න යන ආදි වශයෙන් ක්‍රියාකාරීව ඇවිදීම සඳහා ක්‍රමානුකූල ව යොමු කරවන්න. මේ මඟින් රංග භූමියේ රඟපෑමේ දී තිබිය යුතු අවධානය වර්ධනය වේ. මෙසේ විවිධ ක්‍රියාකාරකම් සහිත ව ඇවිදීම රංග ක්‍රීඩාවක් ලෙසින් ද කළ හැකි ය. ඒ අනුව අවකාශයෙහි නිදහස් ව ඇවිදින විට ගුරුවරයා එක වර ම අංකයක් ප්‍රකාශ කළ විට ඒ අංක සංඛ්‍යාව අනුව ගොනු වීමට යොමු කරවන්න. මෙහි දී සංඛ්‍යාව පමණක් නොව පන්සල, අනුරාධපුරය වැනි වචන ප්‍රකාශ කර එහි එන අකුරු සංඛ්‍යාවට අනුව ගොනු වීම තෙක් අභ්‍යාසය ඉදිරියට රැගෙන යන්න.

- සිරුර උණුසුම් කර ගැනීම සඳහා රංග ක්‍රීඩාවන් ද යොදා ගත හැකි ය. ලේන්සුව ගැලවීමේ අභ්‍යාසය හෙවත් මකර වලිගය නම් රංග ක්‍රීඩාව හෝ මීයෝ පූසෝ යන රංග ක්‍රීඩාව හෝ මෙහි දී යොදා ගත හැකි ය. එමෙන් ම මී... යෝ !
  මී... මෝ යන රංග ක්‍රීඩාව ද සිදු කළ හැකි ය.

- සිරුර උණුසුම් කිරීම සඳහා තව දුරටත් රංග අභ්‍යාස යොදා ගත හැකි ය. අත්තල ක්‍රීඩාව (Clap game) නම් රංග ක්‍රීඩාව ද මේ සඳහා සුදුසු ය. එනම් අත්පොළසන් නාදය අනුව සිදු කරන චලන මඟින් සිරුර උණුසුම් කරලීම සිදු කළ හැකි ය. ලැබී ඇති කාලච්ඡේද සංඛ්‍යාව අනුව ඉහතින් සඳහන් කළ රංග අභ්‍යාස සැලසුම් කරගත හැකි ය. අභ්‍යාස අවසානයේ සිසුන්ට කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ ව යම් අවබෝධයක් ලබාදීම සඳහා ඔවුන් සමඟ කෙටි සාකච්ඡාවක් ද පවත්වන්න. සිසුන්ට දැනුණු දේ මෙයින් අපේක්ෂා කළ අරමුණු යනාදිය පිළිබඳ ව කරන සාකච්ඡාවකින් මෙම අභ්‍යාස මාලාව අවසන් කළ හැකි ය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සිරුර උණුසුම් කිරීමේ අභ්‍යාස යනු කුමක් දැයි හඳුනාගැනීම.
- චලන, තාල, රිද්ම, අවධාන ශක්ති වර්ධන හැකියාව ලබා ගැනීම.
- අවධානයෙන් කටයුතු කිරීමට සහ ක්ෂණික ව ක්‍රියාත්මක වීමට අවශ්‍ය කායික හා මානසික හැකියාව ලබා ගැනීම.
- ජය පරාජය විඳ දරා ගැනීමට හැකි වීම.
- රූපණ කාර්ය දියුණු කරගැනීමට මෙවැනි අභ්‍යාස අවශ්‍ය බව පිළිගැනීම.

පැවරුම : **මකර වලිගය හෙවත් ලේන්සුව ගැලවීමේ අභ්‍යාසය**

ළමයින් සමාන කණ්ඩායම් 2ක් වන සේ බෙදන්න. එකිනෙකා ගේ උදරය හරහා අත් දෙක දමා තදින් අල්ලා ගෙන කණ්ඩායම් දෙක පේළි දෙකක් සාදා ගන්න. ඒ ඒ පේළි දෙකෙහි පිටුපස ම සිටින කෙනා ගේ පිටුපසෙහි ලේන්සුවක් රඳවන්න. එය මකර වලිගය යි. මේ පේළිය මකරකු ලෙස අර්ථ ගන්වා ගැනේ. ඉදිරියෙන් ම ඇත්තේ මකර හිස යි. ඒ අනුව පේළියේ ඉදිරියෙන් ම සිටින කෙනා අනික් පේළියේ පිටුපස ඇති වලිගය කැඩිය යුතු යි. පේළිය තම වලිගය ආරක්ෂා කර ගනිමින් අනික් පේළියේ වලිගය (ලේන්සුව) ගලවා ගැනීමට උත්සාහ කළ යුතු යි. වලිගය (ලේන්සුව) ගලවා ගත් කණ්ඩායමට ලකුණු 5ක් හිමිවේ. වලිගය කඩා ගැනීමේ දී තම පේළිය කඩා නොගත යුතු ය. පේළිය කැඩුණු පසු තරගය නවත්වා නැවත සකස් කරගත යුතු යි. මෙය වාර කිහිපයක් කිරීමෙන් හොඳින් සිරුර උණුසුම් කර ගැනීමට හැකි වේ. මෙම ක්‍රීඩාව කරන විට සාමූහික ව ක්‍රියා කිරීමටත් විවිධ උපක්‍රමශීලී විධි භාවිත කර ජයග්‍රහණය ලබා ගැනීමටත් මඟ පෙන්වන්න.

මීයෝ සහ පූසෝ (Cats and Rats) ක්‍රීඩාව

සිසුන් කණ්ඩායම අවකාශය තුළ යුගල වන සේ තැනින් තැන සිටිය යුතු ය. එක ළඟ සිටින දෙදෙනා සිය වම් අතින් සහ දකුණු අතින් අල්ලා ගෙන උරපතු අත් එකට ගැවී සිටින සේ ළං වී සිටිය යුතු ය. එක් අයකු තම වම් අත ඉණට තබාගෙන සිටිය යුතු ය. ඉණට අත තබාගත් විට සෑදෙන හිඩැස මී ගුල වේ. කණ්ඩායමේ එක් අයකු මීයකු ලෙස ද අනෙකා පූසකු ලෙස ද දක්වා මීයා පසු පස පූසා පැන්නීම කළ යුතු යැයි පවසන්න. මීයා මේ සිටින සිසුන් අතරින් දුව ගොස් පූසාගෙන් ගැලවිය හැකි අතර ඉණට අත තබාගෙන සිටින අය ළඟට දුවගෙන එන මීයා ඔහුගේ ඉණට තබා ඇති අත අල්ලා ගෙන ඔහුගේ උරපතුව සහ තමාගේ උරපතුව එකට ගැවෙන සේ ළංවීමෙන් මීයා ගුලට රිංගුවා වේ. එවිට පූසාට මීයා ඇල්ලිය නොහැකි ය. මේ අවස්ථාවේ දී ඉණට අත තබාගෙන සිටි අය සමඟ සිටින අනිත් කෙනා වහා ම මීයා වී පූසාගෙන් බේරීමට දිවීමට සිදුවේ. ඔහුට ද පූසාගෙන් ගැලවීම සඳහා ඉණට අත තබා ගෙන සිටින අයකු ගේ එම අතින් අල්ලා ඔහුට සමීප විය හැක. එවිට එතන සිටින අනික් ළමයා මීයා වේ. මේ ආකාරයට මෙය දිගින් දිගට ම කරගෙන යා හැකි අතර යම් හෙයකින් පූසා ලෙස සිටින ළමයා මීයාට ගැසුවහොත් ඔහු පූසා වී මීයා වන ළමයා ව පැන්නිය යුතු ය. හැම විට ම ගුලට රිංගිය යුත්තේ සිට ගෙන සිටින යුවළ ගේ පිටුපසින් පැමිණ ය. වැරදි ලෙස ක්‍රීඩා කරන අය ඉවත් කරන්න.

අත්තල ක්‍රීඩාව (Clap game)

සිසුන්ට අවකාශය පුරා විසිරී සිටීමට ඉඩ ලබාදෙන්න. සිසු අවධානය රැගෙන මුලින් ම ඔවුන්ට ක්‍රීඩා කරන අයුරු පැහැදිලි කොට දෙන්න. ගුරුවරයා එක් අත්පොළසන් නාදයක් නිකුත් කරන විට අත් දෙපසට විහිදුවන්න යැයි පවසන්න. අත්පොළසන් නාද දෙකක් නිකුත් කරන විට අත් දෙක ඉහළ ඔසවා උඩ පනින්න යැයි ප්‍රකාශ කරන්න. අත්පොළසන් නාද තුනක් නිකුත් කළ විට එක වර ම බිම වාඩි වන්න යැයි පවසන්න.

මෙම විධාන ගැන ඉතා හොඳින් නැවත නැවත අවබෝධ කරවා ක්‍රීඩාව අරඹන්න. මේ අනුව ගුරුවරයා පිළිවෙළකින් තොර ව අත්පොළසන් නාද 1, 2, 3 නිකුත් කරන්න. එක ම නාදය දෙවරක් කරන්න. ඒ නාදයට අදාළ ව ම ක්‍රියාව සිදු කළ යුතු අතර එය නිවැරදි ව නොකරන අය ඉවත් කරන්න. අංක පිළිවෙළට අත්පොළසන් නාදය නොකර අනුපිළිවෙළට අත්පොළසන් නාදය නිකුත් කරන විට වැරදි ලෙස සිදු කරන අය සොයා ගත හැකි අතර ඔවුන් ඉවත් කර අවසානයට ඉතිරි වන අය ජයග්‍රාහකයා බව ප්‍රකාශ කරමින් අභ්‍යාසය අවසන් කළ හැකි ය.

මෙම අභ්‍යාසය භාවිත කරන විට මෙම චලන විවිධ රිද්ම සහ තාල පිළිබඳ ව අවබෝධය ලැබෙන ආකාරයට ද සකස් කර ගත හැකි ය. තාල හෝ රිද්ම හෝ රහිත චලනවල පළමු පියවරයෙහි යෙදී දෙවන පියවරේ දී තාල හෝ රිද්ම හෝ රටාවකට චලන ඉදිරිපත් කරන්න. එසේ ම රිද්ම, තාල සහ රිද්ම, තාල රහිත චලන එකිනෙකට මිශ්‍ර කර ගනිමින් ද මෙම අභ්‍යාසය භාවිතා කිරීමට ද යොමුවන්න.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.3 : චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- ක්ෂණික නිරූපණ ක්‍රියාවලිය අවබෝධ කරගනියි.
- ක්ෂණික නිරූපණය යනු කුමක් දැයි ප්‍රකාශ කරයි.
- ඒකල ක්ෂණික නිරූපණයේ යෙදෙයි.
- ක්ෂණික නිරූපණයට අවශ්‍ය ආකාරයට ක්ෂණික ව ක්‍රියාත්මක වෙයි.
- මාතෘකාවට අනුව නිරූපණය කළ හැකි ආකාරයට අවස්ථාව නිර්මාණය කරගනියි.

ක්‍රියාකාරකම 3.3.1 : ක්ෂණික නිරූපණ (ඒකල)

ගුණාත්මක යෙදවුම් : ක්ෂණික නිරූපණ තේමා

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- මෙම පාඩම සඳහා පන්ති කාමරය හෝ වෙනත් නිදහස් අවකාශයක් හෝ යොදා ගත හැකි ය. ප්‍රථමයෙන් පෙර දින කරන ලද සමූහ ක්ෂණික නිරූපණ අභ්‍යාසයට අදාළ ව ලබාදුන් පැවරුම පරීක්ෂා කිරීමෙන් පාඩමට ප්‍රවිෂ්ට විය හැකි ය. සමූහ ක්ෂණික නිරූපණ පිළිබඳ ව මතකය අවදි කිරීමෙන් පසු ව ඒකල ක්ෂණික නිරූපණය සඳහා සිසුන් යොමු කරන්න.

- තනි තනි ශිෂ්‍යයාට ද චරිතයක් ක්ෂණික ව නිරූපණය කළ හැකි බව ප්‍රකාශ කර ඒ සඳහා අවශ්‍ය දැනුම මුලින් ම ලබා දිය යුතු වේ. ගුරුවරයා සිසුන්ට වෙන වෙන ම මාතෘකා ලබා දී ඒ මාතෘකාවට අනුව ඒකල ව නිරූපණය කළ හැකි රංගන අවස්ථාවක් නිරූපණය කර ගැනීම සඳහා මිනිත්තු 5-10 ත් අතර කාලයක් එක් සිසුවකුට ලබාදෙන්න. ඉන් පසු ව එම චරිතය නිරූපණය කිරීමට අවස්ථාව ලබාදෙන්න.

  1. නිවසට තමා අකැමැති ම මිතුරකු පැමිණීම.
  2. ඡන්දය ලබා ගැනීම සඳහා විවිධ විරෝධතා මධ්‍යයේ ඡන්ද දායකයන් අමතන දේශපාලකයෙකි.
  3. නෝරා ගෙදරින් ගිය පසු හෙල්ම'ර්' වැනි මාතෘකා නිර්මාණය කර දෙන්න. විශේෂයෙන් නිර්දිෂ්ට ග්‍රන්ථවල චරිත ආශ්‍රයෙන් ක්ෂණික නිරූපණ මාතෘකා සකස් කිරීම සිදු කරන්න. (උදා - නරියා ගෙන් බේරී ගෙදර ආ ගම දුව / ගම දුව රැගෙන ගිය පසු නරියා)

- සිසුන්ට තනි තනි ව ම පුහුණු වීමට කෙටි කාලයක් ලබා දී ගුරුවරයා ඔවුන් අතරට ගොස් අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම සිදු කළ යුතු ය. මෙහි දී නිරූපණය කරන චරිතයේ අනන්‍යතාව සොයා ගැනීමට මඟ පෙන්වන්න. චරිතයට සමාරෝපය විය යුත්තේ එම චරිත ලක්ෂණ හොඳින් ඉස්මතු වන පරිදි ය. චරිතවල මනුෂ්‍ය ගති ස්වභාවයන් ගවේෂණය කිරීමට අවශ්‍ය මඟපෙන්වීම සිදු කරන්න. ගුරුවරයා සිසුන්ගෙන් තමන් තෝරා ගත් චරිතයෙහි මනුෂ්‍යගති ස්වභාවයන් පිළිබඳ ව ප්‍රශ්න කරමින් චරිත ලක්ෂණ අවබෝධ කර ගැනීමට අවශ්‍ය සාකච්ඡාවක් ද සිදු කරන්න.

  සිසුන් ක්ෂණික නිරූපණය ඉදිරිපත් කළ පසු ගුරුවරයා සහ සිසුන් එකතු වී රංගනය පිළිබඳ ව සාකච්ඡාවක් සමඟ ඇගයීමක් කරන්න.

- සියලු ක්ෂණික නිරූපණ රංගනයන් අවසන් වූ පසු ව මෙවැනි තවත් ඒකල ක්ෂණික නිරූපණ අවස්ථාවන් සඳහා අවකාශයන් සලසන්න. පාසල් පාදක ඇගයීම් කටයුතුවල දී ඇතැම් ඇගයීම් සඳහා ද ඒකල ක්ෂණික නිරූපණ අවස්ථා යොදාගන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ඒකල ක්ෂණික නිරූපණයෙහි යෙදීම සිදු කිරීම.
- නාට්‍යෝචිත ලෙස අවස්ථාව ගොඩනගා ගැනීම.
- සංවාද සහ එයට ගැළපෙන චලන ක්‍රියාවලියක් භාවිත කිරීම.
- රූපණ හැකියාව ප්‍රදර්ශනය කිරීම.
- චරිත නිරූපණය හා අවස්ථා නිරූපණය පිළිබඳ ව අවබෝධයක් ඇති කරගැනීම.

පැවරුම : ඒකල ක්ෂණික නිරූපණයේ යෙදුණු මාතෘකාවට අදාළ පිටපතක් රචනා කිරීම.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.3 : චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගැනුම් පල :
- සංගීත නාදයක ඇති භාවය සහ අර්ථය ප්‍රකාශ කරයි.
- සංගීත කාණ්ඩයට අදාළ චරිතයක් සහ අවස්ථාවක් පරිකල්පනය කරගත හැකි ආකාරය ප්‍රකාශ කරයි.
- සංගීත කණ්ඩායමට අදාළ විවිධ අවස්ථා පරිකල්පනය කළ හැකි බව වටහා ගනියි.
- ක්ෂණික ව සාමූහික රංගනයක් ගොඩනගා ගත යුතු බව දක්වයි.
- ආදේශ භාණ්ඩ මගින් නාට්‍යෝචිත නාද රටා නිර්මාණය කර ගනියි.

ක්‍රියාකාරකම 3.3.2.2 : චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

ගුණාත්මක යෙදවුම් : විවිධ සංගීත ඛණ්ඩ සහිත සංයුක්ත තැටි, විවිධ ආදේශක භාණ්ඩ

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික හා සාකච්ඡා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. ඔවුන් අවකාශයේ කෙළවරක වාඩි කරවන්න. කැසට් පටයක් මගින් සංගීත ඛණ්ඩයක් වාදනය කර දෙඇස් වසා ගෙන එය රස විඳීමට ඉඩ හරින්න. දෙවනුව නැවතත් එය වාදනය කරන්න. එම සංගීත ඛණ්ඩය විඳිමින් වාඩි වී සිටින ස්ථානයෙන් නැගිට විත් ශාලාවේ අනෙක් කෙළවරෙහි අවකාශය තුළ යම්කිසි අර්ථයක් ප්‍රකාශ වන ආකාරයට වාඩි වී, සිටගෙන, දණ ගසා ගෙන හෝ කැමති ආකාරයකට හෝ ගල් ගැසී සිටිය යුතු ය. එක් අයකු ගොස් ගල් ගැසුණු විට ඊළඟ සිසුවා සංගීත ඛණ්ඩයට අනුගත ව වාඩි වී සිටින තැනින් නැගිට ගල් ගැසී සිටින තැනැත්තා ළඟට ගොස් ඔහු හා සම්බන්ධ වන ආකාරයට සිටිය යුතු ය. ඔහු ද ගල් ගැසී සිටිය යුතු ය. මේ ආකාරයට සියලු ම සිසුන් එකිනෙක බැගින් සංගීත ඛණ්ඩයට අනුගත ව යම්කිසි මනෝභාවයකින් යුතු ව තමා සිටින තැනින් නැගිට ගොස් ගල් ගැසී සිටින සමූහය සමඟ සම්බන්ධ වී යම්කිසි ආකාරයක හැඩ තලයක් සෑදිය යුතු ය. අවසාන සිසුවා ගෙන් පසු ගොඩ නැගුණු හැඩ තලයේ ස්වභාවය පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන්න. සබකෝලයෙන් තොර ව යම්කිසි හැඟීමක් ඇති කරගෙන යම්කිසි ශාරීරික ක්‍රියාවක් නිරූපණය කිරීමට යොමු වූ ආකාරයක් වේදිකාවේ සකස් වූ නාට්‍යමය හැඩතලයන් පිළිබඳ ව අවබෝධයක් ලබා දෙමින් මෙම රංග අභ්‍යාස ක්‍රියාවලියේ පළමු පියවර අවසන් කරන්න.

- නැවත ද ඔවුන්ට අවකාශය පුරා විසිරී යන ලෙස ඇවිදීමට ඉඩ සලසන්න. පසුබිමින් සංගීත ඛණ්ඩයක් වාදනය කරන්න. සිසුන් එයට සවන් දෙමින් එම සංගීත නාදය අත් විඳිමින් ඇවිදීමට ඉඩ හරින්න. ස්වල්ප වේලාවකට පසු ව සංගීත නාදයට අනුරූප වන සේ එය අත් විඳිමින් යම්කිසි චරිතයක ස්වභාවය ප්‍රකාශ වන සේ ඇවිදින ලෙස ප්‍රකාශ කරන්න. එවැනි චරිත ස්වභාවයකට ප්‍රවේශ වී ඇවිදින විට එක වර ම සංගීත ඛණ්ඩය නවත්වන්න. සිසුන් සංගීත ඛණ්ඩය නවත්වන විට එක් වර ම නිසල විය යුතු ය. (ගල් ගැසු නාක් මෙන් - Freezing) නිවැරදි ව චරිතයක් බවට පත් වී ඇති සිසුන් හඳුනාගන්න. ආදර්ශ කිහිපයක් අනිකුත් සිසුන්ට පෙන්වන්න. වාර කිහිපයක් මෙමෙ අභ්‍යාසය කළ හැකි ය.

- සිසුන් සමාන ලෙස කණ්ඩායම් කරන්න. ඒ ඒ කණ්ඩායම්වලට වෙනස් වෙනස් සංගීත ඛාණ්ඩ ශ්‍රවණය කරන්නට අවස්ථාව ලබාදෙන්න. සාකච්ඡා කිරීමට සුළු වේලාවක් ලබාදෙන්න. ඉන් පසු ව සංගීත ඛණ්ඩය වාදනය කරන්න. එය ආරම්භ වී අවසන් වීමට පෙර එම සංගීත ඛණ්ඩයට ගැළපෙන අවස්ථාවක් නිර්මාණය කර එය එම ඉරියව්වේ සිටින පරිදි ම නිසල කරවන්න. අනික් සිසුන් කණ්ඩායම් සමඟ එම කාර්ය ඇගයීමට ලක් කරන්න. සෑම ශිෂ්‍ය කණ්ඩායමකට ම එම අවස්ථාව ලබාදෙන්න.

- ශිෂ්‍ය කණ්ඩායම් සඳහා නැවතත් වෙනස් වෙනස් සංගීත ඛණ්ඩ සවන් දීමට ඉඩ සලසන්න. එම සංගීත ඛණ්ඩයට ගැළපෙන නිර්වාචික අවස්ථාවක් නිරූපණය කරලීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන්න. සංගීත ඛණ්ඩය ආරම්භ වන විට නිරූපණ ක්‍රියාව ආරම්භ විය යුතු අතර සංගීත ඛණ්ඩය අවසන් වන විට නිරූපණ ක්‍රියාවලිය අවසන් වන සේ අවස්ථාව නිර්මාණය කර ගැනීමටත් ඒ තුළ විවිධ චරිත නිරූපණය වන සේ අවස්ථාව ගොඩනගා ගැනීමටත් අවශ්‍ය උපදෙස් සැම කණ්ඩායමකට ම ලබාදෙන්න. යම් කාල වේලාවක් සූදානම් වීම සඳහා ලබා දෙන්න. ශිෂ්‍ය කණ්ඩායම් නිරූපණ ඉදිරිපත් කළ පසු අනෙක් ශිෂ්‍ය කණ්ඩායම මඟින් ඉදිරිපත් කළ කණ්ඩායම ඇගයීමට ලක් කරවන්න. ගුරුවරයා ද ශිෂ්‍ය නිර්මාණ ඇගයීමට ලක් කරන සංවාදයක් පවත්වාගෙන යන්න.
- මෙසේ විවිධ භාවාත්මක අවස්ථා නිරූපණය සඳහා සංගීත ඛණ්ඩ යොදාගත් ආකාරයට විවිධ ආදේශක භාණ්ඩ භාවිත කර එවැනි සංගීත නාද රටා නිර්මාණය කිරීම සඳහා සිසුන් යොමු කරවිය හැකි ය. විවිධ අවස්ථා නිරූපණයන් සඳහා නාට්‍යෝචිත නාද රටාවන් ආදේශ භාණ්ඩවලින් නිර්මාණය කිරීම සඳහා සිසුන් කණ්ඩායම් කර යොමු කරවිය හැකි අතර එය සමූහය එකතු වී දින කිහිපයක කාලයක් ලබාගෙන නිර්මාණය කිරීම කළ හැකි ය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සංගීතානුකූල ව නාට්‍යමය අවස්ථා ප්‍රකට කරන හැඩතල නිර්මාණය කිරීම.
- සංගීත ඛණ්ඩයක් උපයෝගි කරගෙන චරිත හා අවස්ථා නිර්මාණය කිරීම.
- නාට්‍යෝචිත අවස්ථා ඉදිරිපත් කිරීම.
- විවිධ චරිත නිර්මාණය කිරීම.
- සාමූහික ව රංග ක්‍රියාකාරකම්වල යෙදීම.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.3 : චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- සංගීතයේ භාව ප්‍රකාශන ගුණය වටහාගනී.
- සංගීතයේ පවත්නා තාලය, රිද්මය, නාදයේ වර්ණය (Tone Colour) රටාව හා බැඳුණු භාවමය ගුණය හඳුනා ගනී.
- සංගීත ඛණ්ඩවලට අනුව ශාරීරික හා භාව ප්‍රකාශන ප්‍රතිනිර්මාණය කරයි.
- චරිත හා අවස්ථා මඟින් ශාරීරික හා භාව ප්‍රකාශන ඉදිරිපත් කරයි.
- පරිකල්පනය, නිර්මාණය, ප්‍රකාශන ගුණය වැනි සහජ කුශලතා ප්‍රදර්ශනය කරයි.
- සාමූහිකත්වය, අන්‍යෝන්‍ය කුශලතාව සහජීවනය වැනි මානුෂ ධර්මතා ප්‍රකට වෙයි.

ක්‍රියාකාරකම 3.3.2.1 : සංගීතය උපයෝගි කරගෙන චරිත සහ අවස්ථා නිර්මාණය

ගුණාත්මක යෙදවුම් :
- නිදහස් අවකාශය සහිත කාමරයක්
- රංග අභ්‍යාස සඳහා සුදුසු සැහැල්ලු වස්ත්‍ර
- නාට්‍යෝචිත, භාව ප්‍රකාශනයට සුදුසු, භාව උද්දීපනය කළ හැකි වන සේ නිර්මාණය වූ සංගීත ඛණ්ඩ කීපයක්

ඉගැනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 1 සිසුන් ශරීරය උණුසුම් වන අභ්‍යාසයක යොදවන්න.

උදා: සිසුන් අවකාශය පුරා ඔබ මොබ සමාන දුරක පිහිටන පරිදි ඇවිදීමට සලස්වන්න. බෙරයක් හෝ එබඳු ශබ්දයක් හෝ නැඟිය හැකි උපකරණයකින් අඩු ලයක සිට වැඩි ලයක් දක්වා නාද පවත්වන්න. එම නාදය ක්‍රමයෙන් වේගවත් වන ආකාරය අනුව ඇවිදීමේ වේගය ද වැඩි කරන්න. (මෙම අභ්‍යාසය 3 වරක් කිරීම සෑහේ)

පියවර 2 අභ්‍යාසයෙන් පසු ශිෂ්‍යයන් රවුමක් ආකාරයට එකිනෙකා මනා ව දැකිය හැකි වන පරිදි සිට ගැනීමට සලස්වන්න. සංගීත ඛණ්ඩයක් වාදනය කරන්න. එම සංගීත ඛණ්ඩයේ නාදය, තාලය, රිද්මය, නාදයේ වර්ණය, ගුණය පිළිබඳ විස්තර කරන්න. ඉන් පසු එකී සංගීත ඛණ්ඩයට උචිත ආකාරයට කිසියම් චරිතයක් හා අවස්ථාවක් ප්‍රකාශ වන ආකාරයට ප්‍රතිනිර්මාණයක් ඉදිරිපත් කරන්න.

එම ඉදිරිපත් කිරීම සඳහා ආංගික හා සාත්ත්වික අභිනයට ප්‍රමුඛත්වය ලබාදීම පිළිබඳ ව සැලැකිලිමත් වන්න. මෙහි දී වඩාත් වැදගත් වන්නේ, ගැඹුරු චරිත නිරූපණයකට වඩා සංගීත ඛණ්ඩයේ ආත්මීය ප්‍රකාශනයට උචිත චරිත හා අවස්ථා නිරූපණයක් බව ශිෂ්‍යයන්ට පහදන්න.

පියවර 3 සංගීත ඛණ්ඩයක් වාදනය කරන්න. ගුරු භවතා ගේ නිර්මාණය සිහිපත් කරමින්, ශිෂ්‍යයන්ට ද, ඔවුන් ගේ අත්දැකීම ප්‍රකාශනයට පත් කරවන පරිදි චරිතයක් හා අවස්ථාවක් ක්ෂණික ව ප්‍රතිනිර්මාණය කිරීමට අවස්ථාව සලසන්න. එක් ශිෂ්‍යයකු විසින් තම චරිතය ඉදිරිපත් කිරීමෙන් පසු ඊළඟට ඉදිරිපත් කරන ශිෂ්‍යයාට අවස්ථාව ලබා දෙන්න. සෑම ශිෂ්‍යයකු විසින් ම නිර්මාණය කරනු ලබන අවස්ථාව රවුමේ සිටින අනෙක් ශිෂ්‍යයන් විසින් ද අනුකරණය කළ යුතු වන බවට උපදෙස් ලබා දෙන්න.

පියවර 4 සියලු ශිෂ්‍යයන් ගේ ඉදිරිපත් කිරීම් අවසානයේ ශිෂ්‍යයන් ලද අත්දැකීම් පිළිබඳ ව විමසන්න. නිර්මාණශීලි සංගීත ඛණ්ඩයකට අනුව චරිතයකට අනුගත ව අවස්ථා නිරූපණයක් කළ හැකි බව විස්තර කරන්න. තේවල ව මෙන් ම සාමූහික වශයෙන් සංගීතය උපයෝගී කරගෙන නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කළ හැකි බව පහදා ඊළඟ පාඩමේ දී එබඳු සාමූහික අවස්ථා නිරූපණයක් සඳහා ශිෂ්‍යයා තුළ පෙලඹවීමක් ඇති කරන්න.

සැ.යු. සංගීත ඛණ්ඩයක් තෝරා ගැනීමේ දී නාට්‍යෝචිත බව හා ප්‍රකාශනමය ගුණය සහිත සංගීත ඛණ්ඩ සපයා ගැනීම පිළිබඳ ව අවධානය යොමු කරන්න.

යෝජනා කළ හැකි සුවිශේෂ චරිතවලට හා අවස්ථාවලට උදාහරණ :

- කම්කරුවන් ගේ වැඩබිමක පැවතිය හැකි ක්‍රියාකාරකම් ආශ්‍රිත අවස්ථා
- ගොඩබිමක ක්‍රියාකාරකම් සහිත අවස්ථා
- ගෝත්‍රික සමාජවල පැවතිය හැකි ක්‍රියාකාරී අවස්ථා
- සත්ත්ව ක්‍රියාකාරකම් ආශ්‍රිත අවස්ථා
- සොබාදහමේ වස්තු ක්‍රියාකාරී වන අවස්ථා (ජලය, ගස්, දිය ඇලි, මුහුද, සුළඟ...)

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සංගීතය යනු කුමක් අරබයා ගොඩනැගුණු කලාවක් දැයි පහදන්න.
- සංගීතයේ භාව ප්‍රකාශනමය ගුණය ඇති කරන්නේ කුමන අංගවලින් දැ යි විස්තර කරන්න.
- සුදුසු සංගීත ඛණ්ඩයකට අනුරූප ව නාට්‍යමය අවස්ථාවක් නිරූපණය කරන්න.
- අවස්ථා උද්දීපනය වන ආකාරයට උචිත සංගීත ඛණ්ඩ තෝරා ගන්න.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.3 : චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- නාට්‍ය ගීත හඳුනාගනියි.
- ගායනා කරමින් රංගනය කරන අවස්ථා ගවේෂණය කරයි.
- ගවේෂණාත්මක අත්දැකීම්වලට ග්‍රහණය වූ චරිත පිළිබඳ ව විමසා බලයි.
- නාට්‍ය ගීත භාවිත කොටගත් රංගන අවස්ථාවන්හි උචිතානුචිත බව (නාට්‍යෝචිත බව) පිළිබඳ විචාරයට ලක් කරයි.
- නාට්‍ය ගීත ගයමින් චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

ක්‍රියාකාරකම 3.3.3 : නාට්‍ය ගීත ගයමින් රංගනයේ යෙදෙමු.

ගුණාත්මක යෙදැවුම් :
- නාට්‍ය ගීත අඩංගු ශ්‍රව්‍ය/දෘශ්‍ය පට
- නාට්‍ය ගීත ඇතුළත් පත්‍රිකා/පොත්
- නාට්‍ය කෘති
- සම්පත් දායකයන් ලෙස ගත හැකි නාට්‍ය ගීත ගායනයේ දක්ෂයන් / සිසුන් ද යොදා ගත හැකි ය.

ඉගැනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පහත සඳහන් කරුණු පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.
- චරිතයක හෝ අවස්ථාවක හෝ සංකීර්ණත්වය හා ගැඹුර අවබෝධ කොටගෙන ඒවා ප්‍රතිනිර්මාණය කර ප්‍රේක්ෂකයා ඉදිරියට ගෙන ඒම නළුවකුට හෝ නිළියකට හෝ තිබිය යුතු සුවිශේෂ කුශලතාවකි. එය සාමාන්‍ය පුද්ගලයකුට නොමැති හැකියාවකි. වේදිකාව මත මවන ප්‍රේක්ෂාවට ඔහු හෝ ඇය හෝ අපරිමිත දායකත්වයක් ලබාදෙයි.
- නාට්‍යයේ අවස්ථා අනුව මතු කරගත් භාවයන් නළුවා විසින් වාචික ව දෙබස් හෝ ගායනා හෝ විලාසයෙන් නිරූපණය කරන විට එමඟින් ප්‍රකට වන භාවයන්ට අනුකූල ව සාත්ත්වික, ආංගික හා ආහාර්ය අභිනය භාවිත කරන ආකාරය ගුණාත්මක යෙදවුම් ඇසුරෙන් පැහැදිලි කරන්න.
- සිසුන් කණ්ඩායම් කීපයකට වෙන් කොට පහත දැක්වෙන නාට්‍ය ගීත ගායනයට යොමු කරන්න.
  1. දේශීය ගැමිනාටකවල දී භාවිත කළ කවි ගායනා
  2. 1956න් පසු බිහි වූ නාට්‍ය සඳහා භාවිත කළ නාට්‍ය ගීත ගායනය
     උදා: මනමේ, සිංහබාහු ආදි නාට්‍යවල එන ගීත
  3. නව නාට්‍ය ගීත කීපයක්
     උදා: තාරාවෝ ඉගිලෙති - ශෝභාව දේ මෙපුර, මඩේ ලගින තාරාවුන්
     මූදු පුත්තු - මුහුදු පතුල යට
     රතු හැට්ටකාරි - දී කිරි දී කිරි
- එම ගීත ගයමින් රංගන අවස්ථා ගොඩනැඟීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. ගීතයේ හා චරිතයේ ගුණාත්මක බව ආරක්ෂා වන පරිදි එම රංගනයන් ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.

  උදා: සිංහබාහු නාට්‍යයේ - ගල්ලෙන බිඳලා ලෙන් දොර හැරලා

  ගීතයට අනුව රංගනයේ යෙදෙන විට එහි එන මද්දල පද තාලවලට අනුව පා තබමින් නාට්‍යධර්මී සම්ප්‍රදායයට අනුව රංගනයේ යෙදිය යුතු ආකාරය ගුණාත්මක යෙදවුම් භාවිත කරමින් පැහැදිලි කරන්න.
- නව නාට්‍ය ගීත ඇසුරෙන් රංගන අවස්ථා නිර්මාණය කරගැනීමේ දී ගුරුවරයා ගේ අභිමතය හා සිසු අභිමතය අනුව ඉහත සඳහන් ගීතවලට අමතර ව වෙනත් ගීත ද යොදා ගත හැකි ය.

  ගීතයේ අරුත එහි නාදමාලාව හා රිද්මය මඟින් ප්‍රකාශනය කොතරම් හොඳින් ප්‍රකට වනවා ද යන්න පහත උදාහරණ මඟින් සිසුන්ට පෙන්වා දිය හැකි ය.

උදාඃ මනමේ නාට්‍යයේ මනමේ කුමරු වැද්දා විසින් මරා දමනු ලැබූ පසු මනමේ කුමරි හා වැද්දා අතර තර්ගය.

ප්‍රේමණීය විලාසයකින් ආරම්භ වන දෙදෙනා අතර තර්ගය අනුක්‍රමයෙන් ශෝචනීය අන්තයක් කරා නාට්‍යකරුවා විසින් මෙහෙයවනු ලබන ආකාරය එම අවස්ථා නිරූපණය මඟින් මැනැවින් ප්‍රකට වේ. මෙහි දී නළුවාගේ සහ නිළිය ගේ ඉරියවු වෙනස් වන ආකාරය ගායනයත් සමඟ ම මැනැවින් ඒකාබද්ධ වන අයුරු නාට්‍ය නැරඹීමෙන් හෝ නාට්‍ය දෘශ්‍යපටය නැරඹීමෙන් හෝ සිසුන්ට අවබෝධ කරගැනීමට අවස්ථාව ලබාදෙන්න.

කුමරි	- මා ප්‍රිය සැමියා මරුමුව වැටුණා - කිම ද කළේ ඔබ මේ අපරාදේ
වැදි රජ බිසව - තර්ගය	- අන්ද මන්ද වූයේ මසිතා - මෙ පුවතින --- - - -
	කිම් ද වූයේ නොදනේ අරුමා
කුමරි - සින්දුව	- නැද්ද සිතේ අනුකම්පා මෙමා හට නෑ මට අන්සරණා
	වෙනු කරුණා මා - පෙම් වඩනා - රජිඳු මනා

''හුනුවටයේ කතාව'' - නාට්‍යයේ කැරැල්ල සිදු වූ රජ මාලිගාවේ රාත්‍රිය ගත කරමින් ග්‍රූෂා බිලිඳු මයිකල් කුමරුට රැකවරණය දෙන ආකාරයත්, කුමරා පිළිබඳ ව ඇය තුළ ජනනය වන මවුගුණය ආදරය මුහුකුරා යන ආකාරයත් අවසානයේ දරුවා කරපින්නාගෙන සෙරක සේ එතැනින් ගොසින් පිටමං වන ආකාරයත් කියැවෙන පොතේ ගුරු ගේ ගීතය.

බොහෝ වේලාවක්
දරුවා අසල හුන්නිය ඈ
සවසත් ගෙවී
ගෙවී මහ රෑ
උදා වන තුරු හිරු ....
ගැඹුරු ව මුදු මොළොක් ලෙස
හෙළා සුසුමක් අහසට
වඩා බිලිඳා දෝතින්
රැගෙන පා නැඟුවා ය මෙලෙසින්
(ඇය එසේ ම කරයි)
සෙරක් සේ යන්නිය
බියෙන් ළඳ පියවර මනින්නිය ....''

රැයක් පුරා සිදුවන ග්‍රූෂා ගේ මානුෂීය හැසිරීම් රටාව මෙම ගීතයෙන් මැනැවින් විස්තර වෙයි. මෙම අවස්ථාවේ ඇති භාවමය ගුණයේ අපූර්වත්වය සිසුන්ට අත් දකින්නට අවස්ථාව ලබා දෙන්න. (සජීව ව නාට්‍යය නරඹා / නාට්‍ය දෘශ්‍ය පටය නරඹා)

උක්ත නාට්‍යයේ ම ග්‍රූෂා ගඟ ළඟ රෙදි සෝදන විට සයිමන් සෂාවා පැමිණෙන අවස්ථාවේ දෙදෙනා අතර සිදු වන හැඟීම් ප්‍රකාශනය පොතේ ගුරු ගේ ගීතය මඟින් අපූරුවට ගම්‍යමාන වන බව සිසුන්ට පැහැදිලි කරදෙන්න.

පොතේ ගුරු : කියවුණු වදන් ඇත.
නොකියවුණු වදනුත් බොහෝ වෙත
ඇවිදින්ය
සොල්දාදුවා යුදගිය
ඉඳ නිරාහාර ව

උගුර තෙමමින්
බොර දියෙන් මඩ
ගෙවා ගිරි කඳුහෙල්
දිවා රෑ මඟ ගෙවා ආයෙමි''

- උක්ත රංගන අවස්ථා සියල්ල අවසානයේ සිසුන් හා එක් ව ඒ පිළිබඳ ඇගැයීමක් කරන්න. එහි දී පහත සඳහන් කරුණු අවධාරණය කරන්න.
- රංගනයට පෙර ගීතයට හොඳින් සවන් දී එහි අරුත මෙන් ම සංගීතය පිළිබඳ ව ද සරල අවබෝධයක් ලබාගැනීම.
- ගීතය හා සම්බන්ධ රංගන අවස්ථාව කුමක් ද යන්න පැහැදිලි ව අවබෝධ කරගැනීම.
- ගීතයේ අරුත මැනැවින් ධ්වනිත වන පරිදි නළුවා හෝ නිළිය හෝ සිය භාවයන් ආංගික, වාචික හා සාත්ත්වික ආදි අභිනය මඟින් ප්‍රකට කළ යුතු ආකාරය පිළිබඳ පෙර පුහුණුවීම්වල යෙදීම.
- ගීතය ගයමින් රංගනයේ යෙදෙන අවස්ථාව හා සම්බන්ධ වන අනෙකුත් රංගන ශිල්පීන් ගේ රංගන කාර්යය පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීම.

  උදා: ප්‍රේමයෙන් මන රංජිත වේ ... නන්දිත වේ.
  ගීතයට මනමේ කුමරු සමඟ මනමේ කුමරිය ද සම්බන්ධ වන බැවින් දෙදෙනා ගේ ම රංගන කාර්යය අන්‍යෝන්‍ය සම්බන්ධතාවෙන් යුක්ත ව පවත්වා ගෙන යා යුතු බව අත්දකින්නට අවස්ථාව ලබාදීම.
- නාට්‍යයක ගීතයක් ගායනා කරමින් යෙදෙන රංගනයක දී රංගන ශිල්පියා ප්‍රේක්ෂකයා වෙත සම්ප්‍රේෂණය කරන අදහස / පණිවිඩය සාක්ෂාත් කරගැනීම සඳහා සෙසු නළු-නිළියන් ගේ සහභාගිත්වය ඔවුන්ගේ භාෂණය එම අවස්ථාවේ දී භාවිත කරනු ලබන සෙසු ආනුෂංගික අංග ආදිය බෙහෙවින් බලපාන බව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
  - චරිතයට අවශ්‍ය ඇඳුම් පැලැඳුම්
  - -භාවිත කරන උපකරණ
  - යොදා ගන්නා ආලෝකය
  - -පසුතල නිර්මාණ
  - -අංග රචනා
  - -නාට්‍ය සංගීතය

- නාට්‍යෝචිත අවස්ථා මඟින් මේ පිළිබඳ අවබෝධ කරගැනීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- සිසුන් ලබා ඇති අත්දැකීම් ද ප්‍රයෝජනයට ගෙන විවිධ නාට්‍ය ගී තෝරා අංග රචනා හා වේෂ භූෂණ ද උපයෝගී කොටගෙන භූමිකා රංගන අවස්ථා නිර්මාණය කරගැනීමට අවස්ථාව ලබාදෙන්න.

  1 කණ්ඩායම - කෝලම්
  2 කණ්ඩායම - සොකරි
  3 කණ්ඩායම - නාඩගම්
  4 කණ්ඩායම - නූර්ති
  5 කණ්ඩායම - සරච්චන්ද්‍ර නාට්‍ය
  6 කණ්ඩායම - නව නාට්‍ය ගීත

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- විවිධ නාට්‍ය ගීත එකතුවක් සකස් කර කුඩා පොතක් නිර්මාණය කිරීම / ගීත එක්රැස් කර හඬ පටයකට ගොනු කිරීම (සංයුක්ත තැටි)
- එම නාට්‍ය ගීතවලට අදාළ නාට්‍ය නිර්මාණ පිළිබඳ තොරතුරු සොයා ඊට ඇතුළත් කිරීම.
- එම ගීතවලට අදාළ භූමිකා රංගන සඳහා අවශ්‍ය වේෂ භූෂණ සකසා පාසල් වේදිකාවේ නාට්‍ය ගීත ගායනා ප්‍රසංගයක් පවත්වන්න. (වර්ෂ අවසාන දින විවිධ ප්‍රසංගය සඳහා යොදා ගන්නා සැකැස්ම)

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.3 : චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :

- සිසුන් දුටු නාට්‍යවල විවිධ අවස්ථා හුදෙක් ඒ අයුරින් ම අනුකරණය නොකරමින් එම නාට්‍යවල සමස්ත අරුත අවබෝධ කරගෙන ඒවා නිර්මාණශීලී ව හා නිදහසේ ප්‍රතිනිර්මාණය කරයි.
- එම අවස්ථා සහිත නාට්‍ය සඳහා පදනම් වූ නාට්‍ය හා රංග කලා මූලධර්ම අවබෝධ කරගෙන ඒවාට ගැළපෙන අයුරින් එම අවස්ථා හෝ සිද්ධි හෝ නිර්මාණශීලී ව රංගනය කරයි.
- හුනුවටයේ කතාව නාට්‍යයේ ග්‍රූෂා ගං ඉවුරේ රෙදි සෝදන මොහොතේ සයිමන් සෂාවා නැවත මුණගැසෙන අවස්ථාව ප්‍රතිනිර්මාණය කරයි.
- හුණුවටයේ කතාව නාට්‍යයේ අසඩක් නඩුව විසඳන මොහොත ප්‍රතිනිර්මාණය කරයි.
- සුභ සහ යස නාට්‍යයේ සුභ සහ යස මුලින් ම හමු වන අවස්ථාව ප්‍රතිනිර්මාණය කරයි.
- මනමේ නාට්‍යයේ මනමේ කුමරා, කුමරිය ගෙන් කඩුව ඉල්ලන අවස්ථාව හා සබැඳි සිද්ධිය ප්‍රතිනිර්මාණය කරයි.

ක්‍රියාකාරකම 3.3.4 : නරඹා ඇති නාට්‍යවල සිද්ධි හෝ අවස්ථා හෝ ප්‍රතිනිර්මාණය කිරීම.

ගුණාත්මක යෙදවුම් : නාට්‍ය පිටපත්

හුනුවටයේ කතාව - හෙන්රි ජයසේන

සුභ සහ යස - සයිමන් නවගත්තේගම

මනමේ - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික හා සාකච්ඡා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සිසුන් නරඹා ඇති නාට්‍යවල අවස්ථාවක් හෝ සිද්ධියක් හෝ ප්‍රතිනිර්මාණය කිරීම යනු හුදෙක් එය ඒ ආකාරයෙන් ම අනුකරණය කිරීම නො වේ. ශිෂ්‍ය මට්ටමින් පන්ති කාමර තුළ කරනු ලබන නිර්මාණයක් වුවත් නිර්මාණශීලී ව නිදහසේ ඒවා රංගනයට යොමු කළ හැකි ය.
- අදාළ නාට්‍යවල කතා වින්‍යාසය, තේමාව, ජීවන දෘෂ්ටිය, චරිත නිරූපණය, ගැටුම, නාට්‍යෝචිත අවස්ථා, සංවාද, නාට්‍ය උත්ප්‍රාසය, රංග විධාන, වැනි පෙළට අදාළ වූ මූලධර්ම මෙන් ම එය වේදිකාව මත රඟ දැක්වීම සඳහා පදනම් කරගත් රංග කලා මූලධර්ම ද අවබෝධ කරගත යුතු ය. එනම් ඒවාහි රූපණය හා ආනුෂංගික කලාවන් යොදා ඇති ආකාරය යි.
- හුනුවටයේ ශ්‍රී ලාංකේය නිෂ්පාදන දැක ඇති සිසුන්ට එහි එන ග්‍රූෂා හා ගිලන් මිනිසා අතර විවාහය සිදු කරන අවස්ථාව නිදහසේ ප්‍රතිනිර්මාණය කළ හැකි ය. නිදසුනක් ලෙස මෙහි දී බ්‍රෙෂ්ට් රංග මූලධර්ම අවබෝධ කර ගැනීම වැදගත් ය. එනම් භාවාතිශය ලෙස ප්‍රේක්ෂකයා තුළ තත්ත්වානුරූප මායාව ඇති නොකරන ආකාරයට එය රංගනය කළ යුතු ය. කථකයා ගේ භූමිකාව මඟින් එය ඉටු කර ගත හැකි ය. ඊට ගැළැපෙන විරිඳු කපිරිඤ්ඤා නැතහොත් ජන ගී තාලයක් නිදහසේ තෝරාගත හැකි ය. ඇඳුම් පැලැඳුම් වුව ද නිර්මාණශීලී ව ගැළැපෙන අයුරින් සකස් කරගත හැකි ය. රංගනයේ දී වඩා නිර්මාණාත්මක වීම මෙහි දී අවධානයට යොමු විය යුතු ය. ගැමි නාට්‍යයේ විවිධ අවස්ථා අවධානයට යොමු කර ගැනීමෙන් මෙම අවස්ථාව සාර්ථක ව නිර්මාණය කර ගත හැකි ය.

- ''යුද්දෙට මං ගියා ගෑනි ගෙදර තියා'' යන ගීතයට අනුකූල ව කරනු ලබන රංගනය ද සිසු නිර්මාණශීලීත්වය උරගා බැලිය හැකි අවස්ථාවකි. සමහර විට මේ සඳහා කාන්තා චරිත ද යොදා ගත හැකි ය. ගීතයේ තාලය පවා අවශ්‍ය නම් ගැළපෙන අයුරින් ප්‍රතිනිර්මාණය කළ හැකි ය. රංගනයේ දී ''අතිශයෝක්තිය'' මඟින් බලාපොරොත්තු වන පණිවිඩය මතු කර ගන්නා අයුරු අවධානයට යොමු කළ හැකි ය.
- සුභ සහ යස නාට්‍යයේ අවස්ථාව ද සිසුන්ට වඩා නිදහස් ව හා නිර්මාණශීලී ව ප්‍රතිනිර්මාණය කළ හැකි එකකි. එනම් සුභ සහ යස මුල් වරට හමු වන අවස්ථාව යි. මෙහි දී විශේෂයෙන් බ්‍රෙෂ්ට් රංග ක්‍රමයට වඩා වෙනස් වූ ස්ටැනිස්ලව්ස්කි ගේ අභ්‍යන්තර රංගන ක්‍රමය හෙවත් රූපණ විධි ක්‍රමය භාවිත කරන ආකාරය ගැන සැලකිලිමත් විය යුතු ය. මෙය සිසුන්ට තරමක් අසීරු වුවත්, අභ්‍යන්තර රංගනය ප්‍රගුණ කිරීම සඳහා යොදා ගනු ලබන චිත්ත ඒකාග්‍රතාව වැනි රංග අභ්‍යාස පිළිබඳ අවධානය යොමු කිරීම මෙහි දී වැදගත් වේ. අභ්‍යන්තර සමාරෝපය ද මෙහි දී සැලකිල්ලට ගැනේ.
- සංවාද උච්චාරණය, සාත්ත්වික හා ආංගික අභිනය නිර්මාණශීලී ව යොදා ගැනීමට අවකාශ ලබා දිය යුතු ය.
- මනමේ නාට්‍යයේ එන කුමරා කුමරිය ගෙන් කඩුව ඉල්ලන අවස්ථාව ප්‍රතිනිර්මාණය කිරීමේ දී එහි උපයුක්ත නාට්‍යධර්මී ශෛලිය පිළිබඳ ව විශේෂ අවධානය යොමු වීම වැදගත් වේ.

  මෙහි දී රංගනය සඳහා සාත්ත්වික, ආංගික හා වාචික අභිනය යොදා ගැනීමේ දී නාට්‍යධර්මී ශෛලියට අනුව ඒවා හැසිරවිය යුතු ය. මෙහි දී මුද්‍රා භාවිතය හා ගායන හැකියාව ද වැදගත් වේ. එහෙත් එම අංග නිර්මාණශීලී ව සකස් විය යුතු ය. ගමන් තාල මෙන් ම නර්තන ලීලා ද මෙහි දී නිදහසේ නිර්මාණය කළ හැකි ය. අලුත් ආකාරයට ප්‍රතිනිර්මාණය කළ හැකි ය.
- ඇඳුම් පැළඳුම් හා රංග භාණ්ඩ ද නාට්‍යධර්මී ශෛලියට ගැළපෙන අයුරින් අලුත් ආකාරයට නිර්මාණය කිරීම සඳහා සිසු පරිකල්පන ශක්තිය යොමු කළ හැකි ය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- මනමේ නාට්‍යයේ මනමේ කුමරා, කුමරිය ගෙන් කඩුව ඉල්ලන අවස්ථාව හා සබැඳි සිද්ධිය තාත්ත්වික ශෛලියට අනුව සංවාද යොදමින් නිර්මාණය කරන්න.
- හුනුවටයේ කතාව නාට්‍යයේ කෝප්‍රල් සහ හේවායා ''යුද්දෙට මං ගියා ගෑනි ගෙදර තියා'' යන ගීතයට උචිත වෙනත් තනුවක් (ජන ගී, කපිරිඤ්ඤා) යොදා අවස්ථාව ප්‍රතිනිර්මාණය කරන්න.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.3 : චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- චරිතයක් හෝ අවස්ථාවක් හෝ නිර්මාණයේ දී සලකා බැලිය යුතු මූලික කරුණු පිළිබඳ අවබෝධයක් ලබාගනියි.
- කිසියම් චරිතයක් හෝ සිදුවීමක් දෙස නව මානයකින් බැලීමටත්, නව අර්ථකථන සැපයීමටත් පෙලඹෙයි.
- අත්දැකීම් හා පරිකල්පනය භාවිතයෙන් දෙනු ලබන ඕනෑ ම චරිතයක් හෝ සිදුවීමක් හෝ අපූර්වත්වයකින් යුතු ව නිරූපණයට හැකියාව ලබාගනියි.
- කේවල මෙන් ම සාමූහික වශයෙන් චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරමින් ස්වයං ඇගැයීමක යෙදෙයි.

ක්‍රියාකාරකම 3.3.5.1 : ගුරුවරයා විසින් නම් කරනු ලබන චරිත හා අවස්ථා නිර්මාණය කිරීම.

ගුණාත්මක යෙදවුම් :
- A4 කඩදාසි
- නාට්‍ය පිටපත් කිහිපයක් (ලබාදෙන මාතෘකාවලට අදාළ)

ඉගැනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික හා සාකච්ඡා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- රූපණය පිළිබඳ විවිධ අභ්‍යාස හා ක්‍රියාකාරකම් ආශ්‍රිත ව, යම් මට්ටමකට පරිකල්පන ශක්තිය වඩවාගත් සිසු පිරිසක් බවට මේ වන විට සිසුවා පරිවර්තනය වී ඇති බැවින්, මෙම අභ්‍යාසයේ දී සාම්ප්‍රදායික සීමාවන් ගෙන් ඔබ්බට සිතීමට සිසුන් පෙලැඹවීම වැදගත් වෙයි.
- කිසියම් චරිතයක අප දන්නා පැතිකඩට සිය පරිකල්පන ශක්තිය මෙහෙයවා නව්‍ය ආකාරයකින් ඒ දෙස බැලීමෙන් අපූර්ව චරිත නිරූපණයක් කළ හැකි බවත් පෙන්වා දෙන්න.
- කිසියම් සිදුවීමක් නිරූපණයේ දී එක් චරිතයක් පවසන දෙයකට තවත් චරිතයක් දක්වන්නේ යැයි එක් වරට සිතෙන අනිවාර්ය ප්‍රතිචාරයක් සපුරා වෙනස් ආකාරයකින් දැක්වීමට හැකි නම් එය අපූර්ව වූ අවස්ථා නිරූපණයක් ලෙස හැඳින්විය හැකි බව පහදා දෙන්න.

  උදා: බිය විය යුතු අවස්ථාවක බිය නොවී සිටීම.
  ශෝක විය යුතු අවස්ථාවක ශෝක නොවී සිටීම.

- කිසියම් චරිතයක් හෝ අවස්ථාවක් හෝ සාර්ථක ව නිරූපණයට නම්
  - එම සිදුවීමට හා චරිතයට අදාළ පරිසරය, යුගය හා ඉතිහාසය ආදි කරුණු හොඳින් දැනගැනීම අවශ්‍ය බව
  - නව අර්ථකථනයක් සැපයීමට හෝ යම් සිදුවීමක් දෙස වෙනත් මානයකින් බැලීමට හෝ නම් මුල් කෘතියේ අදහස මැනවින් හඳුනාගැනීම අවශ්‍ය බව.
  - කිසියම් ඉදිරිපත් කිරීමක් සාර්ථක වීමට නම් විශ්වසනීයත්වය, තර්කානුකූල බව, හේතුඵල සම්බන්ධතාව, රංගෝචිත බව ආදි කරුණු සම්පූර්ණ විය යුතු බව

  ආදි මූලික කරුණු පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.

ඉහත සඳහන් උපදෙස් සැලකිල්ලට ගනිමින් පහත ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.

පියවර 1
- මූලික ව ඉහත උපදෙස් ආශ්‍රිත ව, සිසුන්ගෙන් නව්‍ය ආකාරයක ඉදිරිපත් කිරීමක් අපේක්ෂා කරන බව පහදන්න.
- සිසුන් වෙත පහත දක්වා ඇති චරිත හා සිදුවීම් සහිත මාතෘකා කිහිපයක් අහඹු ලෙස ලබාදෙන්න.

1. බල්ලාගෙන් බේරී පැන ආ නරියා - නරිබෑණා නාට්‍යය ඇසුරෙන්
2. සිංහයා මරා දමූ සිංහබාහු - සිංහබාහු නාට්‍යය ඇසුරෙන්
3. නෝරා ගිය පසු හෙල්මා - සෙල්ලම් ගෙදර ඇසුරෙන්
4. සකුන්තලාට පුතකු ඉපදුණ දා - සකුන්තලා ඇසුරෙන්
5. මියගිය ඊඩිපස් හා ජොකස්ටා පරලොව දී හමු වීම - ඊඩිපස් ඇසුරෙන්
6. මියගිය කුවේණියට පරලොව දී මනමේ කුමරු හමුවීම - කුවේණි හා මනමේ ඇසුරෙන්

පියවර 2
- ඒ ඒ මාතෘකාවට අනුකූල ව තනි තනි ව හෝ අවශ්‍යතාව පරිදි සාමූහික ව හෝ නිරූපණය සඳහා සූදානම් වීමට අවස්ථාව ලබාදෙන්න.
- ඒ ඒ මාතෘකාවට අදාළ නාට්‍ය පිළිබඳ මූලික අවබෝධය නොමැති නම් නාට්‍ය පිටපත් පරිශීලනයට උපදෙස් ලබා දෙන්න.

පියවර 3
- සිසුන් විසින් සූදානම් කරගන්නා ලද චරිත හෝ අවස්ථා හෝ සෙසු පිරිස වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- සිසු ඉදිරිපත් කිරීම් පිළිබඳ ව සෙසු සිසුන් ගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ඒ ඒ ඉදිරිපත් කිරීම සම්බන්ධ ව නිර්මාණයන්ට දායක වූ සිසුන් ගේ අදහස් හා ඒ ඒ යෙදීම්වලට හේතු ආදි කරුණු සෙසු අය සමඟ සාකච්ඡා කිරීමට අවකාශ සලසන්න.

පියවර 4
- සිසු නිර්මාණ එකිනෙකෙහි ගුණදොස් පිළිබඳ සමාලෝචනයක යෙදෙමින් තව තවත් ඒවා සාර්ථක වීමට නම් කළ යුතු වෙනස්කම් හෝ වැඩිදියුණු විය යුතු තැන් හෝ පිළිබඳ ව ගුරුවරයා ගේ යෝජනා සිසුන් වෙත ඉදිරිපත් කරන්න.

පැවරුම : පෙර ක්‍රියාකාරකම මගින් ලද අත්දැකීම් ඇසුරු කරගනිමින් පෙර තමන් හෝ තම කණ්ඩායම හෝ වෙත ලැබුණු මාතෘකාවට අදාළ ව කෙටි නාට්‍යමය අවස්ථාවක් රචනා කරන්න.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.3 : චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 04

ඉගැනුම් පල :
- නාට්‍ය පෙළක් රංගයක් වන අයුරු ප්‍රකාශ කරයි.
- නාට්‍ය පිටපත අර්ථකථනය කරයි.
- චරිත, අවස්ථා එකිනෙකට සම්බන්ධ වෙමින් ගොඩනැඟෙන අයුරු පැහැදිලි කරයි.
- සාමූහික ව නිර්මාණ කාර්යයේ නියැළෙයි.
- අපූර්වත්වයෙන් යුතු චරිත අපූර්ව අවස්ථා නිර්මාණය වීමට හේතුවන අයුරු විස්තර කරයි.
- කේවලව සහ සාමූහික ව නිර්මාණ කාර්යයන්හි යෙදීමෙන් ස්වයං විවේචනයක යෙදේ.
- නිර්මාණකරුවකු ලෙස ප්‍රගුණ කළ යුතු ගුණාංග වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම 3.3.5.2 : ගුරුවරයා විසින් නම් කරනු ලබන චරිත හා අවස්ථා නිර්මාණය කිරීම.

ගුණාත්මක යෙදැවුම් : පුටු හා විවිධ නාට්‍යමය අවස්ථා ඇති පින්තූර

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික හා සාකච්ඡා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

මෙම ක්‍රියාකාරකම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් අවශ්‍ය වන අතර සිසුන් ප්‍රායෝගික ක්‍රියා සඳහා සුදුසු ඇඳුමකින් සැරසී සිටීම වඩා ප්‍රයෝජනවත් ය.

පියවර 01 ශරීරය උණුසුම් කිරීමේ රංග අභ්‍යාසයක් හෝ රංග ක්‍රීඩාවක් හෝ සිදු කර සිසුන් ගේ ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට යෝග්‍ය ඉඩක් වෙන් කර වාඩි කරවන්න.

පියවර 02 පහත සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න. නැරඹූ නාට්‍යයක චරිතයක් නම් කරන්න. එම චරිතයට පිවිසි පිරිස ඉදිරියට ගොස් චරිතය පිළිබඳ විස්තර කරන ලෙස එක් සිසුවකුට පවසන්න. විස්තරයෙන් පසු ව චරිතය පිළිබඳ ඉදිරියේ සිටින පිරිසට ප්‍රශ්න විමසන ලෙස පවසන්න. එම ප්‍රශ්න සඳහා ද ඉදිරියේ සිටින සිසුවා තම චරිතය තුළ රැඳෙමින් පිළිතුරු දිය යුතු ය. මෙලෙස සිසුන් කිහිප දෙනකු චරිතයක් නම් කර ඉදිරිපත් කිරීමට සලස්වන්න. අවශ්‍ය නම් වාඩි වීම සඳහා වේදිකාවේ පුටුවක් තබන්න.

මෙම ප්‍රශ්න කිරීම් මඟින් චරිතයේ පසුබිම සහ නාට්‍යයේ මුල් චරිතය මුහුණ දෙන අත්දැකීම්, ගැටුම් හා විවිධ සංකීර්ණ අවස්ථා පිළිබඳ ව එළිදරවු කරගත යුතු ය.

පිරිස කවාකාර ව සිටුවන්න. පිරිමියකු ගේ හෝ කාන්තාවක ගේ නමක් යෝජනා කරන්න. පිළිවෙළින් යමින් එම චරිතයට ඉතිහාසයක් අභ්‍යන්තර චරිත ලක්ෂණ සහ බාහිර පෙනුමක් / ස්වරූපයක් (අනන්‍යතා) තෝරා ගැනීම, නිතර ඇසිපිය ගැනීම, ඔළුව කැසීම ආදි ලෙස) කරන්න. සම්පූර්ණ වෘත්තයේ ම සිටින සිසුන් යම් යම් ලක්ෂණ එක් කළ පසු එක් සිසුවකු ඉදිරියට පැමිණ එම ස්වරූපය සහිත චරිතය බවට පත්වන ලෙස පවසන්න. තවත් සිසුවකු ඉදිරියට ගෙන පෙර චරිතයට විරුද්ධ චරිත ලක්ෂණ සහිත චරිතය වන ලෙස පවසන්න. මාර්ගයක්, කාමරයක්, උද්‍යානයක් වශයෙන් දෙදෙනාට අවස්ථාවක් ලබාදෙන්න. දෙදෙනා එක්වීමෙන් නිර්මාණය වන අවස්ථාව නාට්‍යෝචිත ව ඉදිරිපත් කරන ලෙස පවසන්න. තවත්

සිසුවකු ඉදිරියට ගෙන පෙර චරිතයට විරුද්ධ චරිත ලක්ෂණ සහිත චරිතය වන ලෙස පවසන්න. මාර්ගයක්, කාමරයක්, උද්‍යානයක් වශයෙන් දෙදෙනාට අවස්ථාවක් ලබා දෙන්න. දෙදෙනා එක් වීමෙන් නිර්මාණය වන අවස්ථාව නාට්‍යෝචිත ව ඉදිරිපත් කරන ලෙස පවසන්න.

වේදිකාවේ යම් භාණ්ඩයක් තබා අවස්ථාවක් ද යෝජනා කරන්න.

උදා: වේදිකාවේ පුටුවක් තබා බස් නැවතුමක බංකුවක් ලෙස පැවසීම.

- ඇතිරිල්ලක් පොළව මත එළා එය ගඟක් ලෙස සිතන ලෙස පවසන්න.

එක් එක් සිසුන් යෝජිත අවස්ථාවට යොමු කරමින් එය නාට්‍යමය ලෙස රඟ දක්වන ලෙස පවසන්න.

- සිසුන් පස් දෙනකු හෝ එයට අඩු සංඛ්‍යාවක් සමාන ව එන සේ කණ්ඩායම් කරන්න. පළමු වැනි කණ්ඩායමට අංක ලබා දී එසේ ම අනෙක් කණ්ඩායම්වලට අංක බෙදා ගන්නා ලෙස පවසන්න.

  පළමු වන කණ්ඩායමට යම් අවස්ථාවක් ලබා දී එය ක්ෂණික ව නිරූපණය කරන ලෙස පවසන්න. ගුරුවරයා ලබාදෙන සංඥාව සමඟ එය නවත්වන ලෙසත් ඒ සමග ම දෙවැනි කණ්ඩායම එතැන් පටන් එම අවස්ථාව රඟ දක්වන ලෙසත් පවසන්න. එහි දී පළමු කණ්ඩායමේ අංක 1 ගත් චරිතය දෙවන කණ්ඩායමේ අංක 1 සිසුවා වශයෙන් රංගනය කරවන්න. ඉන් පසු තෙවන කණ්ඩායමට හෝ නැවතත් පළමු කණ්ඩායමට හෝ වශයෙන් ගුරුවරයා ලබාදෙන සංඥාව සමඟ නළු-නිළියන් මාරු කරන්න.

- විවිධ අවස්ථාවන් සඳහන් ව ඇති කොළ කැබලි කිහිපයක් ඉහළ දමා කණ්ඩායමට එක බැගින් ගන්නා ලෙස පවසා තමන් ලත් අවස්ථාව නිරූපණය කරන ලෙස පවසන්න. නැවතත් එම කොළ කැබලි අහඹු ලෙස තෝරා ගෙන රඟ දැක්වීම සඳහා යොමු කරන්න. එක ම අවස්ථාව විවිධ කණ්ඩායම් අතින් විවිධ ලෙස නිර්මාණශීලී ව අර්ථකථනය වන අයුරු සිසුන්ට අධ්‍යයනය කිරීමට සලස්වන්න.

- සිසුන් නිදහස් ව අවකාශයේ ඇවිදීමට යොමු කර විවිධ අවස්ථා ලබා දෙන්න. එහි දී නිර්මාණාත්මක ලෙස කේවල ව සහ සාමූහික ව අවස්ථාවට අනුව රූපණයේ යෙදීමට උපදෙස් දෙන්න.

  උදා: අවස්ථා - සුළි සුළඟක්, ගං වතුරක්, කාන්තාරයක දහවලක්, කනත්තක්

- නාට්‍ය පිටපත් කිහිපයක අවස්ථා කිහිපයකට ම අදාළ දෙබස් ඛණ්ඩ සිසුන්ට ලබාදෙන්න. එම සියලු දෙබස්වල සහ රංග විධානවලටත් සමස්ත පිටපතෙහි අර්ථයටත් හොඳින් අවධානය යොමු කරමින් නාට්‍යමය අවස්ථාවක් ගොඩනඟන අයුරු සිසුන් සමග සාකච්ඡා කරන්න. සිසුන් එම අවස්ථාව නිර්මාණය කිරීම සඳහා යොමු කරන්න.

ක්‍රියාකාරකම් අවසානයෙහි සිසුන් සමඟ තම අත්දැකීම් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පැවරුම : ඔබ නැරඹූ නාට්‍යයක නාට්‍යමය අවස්ථාවක් ගෙන එය නාට්‍යයක ආරම්භය ලෙස ගන්න. එතැන් සිට ඔබේ නිර්මාණශීලීත්වය භාවිත කරමින් වෙනස් අවසානයක් සිදු වන ලෙස නාට්‍ය පිටපතක් රචනා කරන්න.

නිර්මාණකරුවකුට ජීවන අත්දැකීම් වැදගත් වන්නේ කෙසේ දැයි එවැනි නිර්මාණයන් උදාහරණ ලෙස දක්වමින් පැහැදිලි කරන්න.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.3 : චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- චරිත, අවකාශයෙහි අර්ථවත් ලෙස ගොඩනැගිය යුතු බව ප්‍රකාශ කරයි.
- නාට්‍යයක අවස්ථා නිර්මාණය, අර්ථවත් විය යුතු බව අවබෝධ කර ගනී.
- රංගයට උචිත ලෙස හිස් අවකාශය කළමනාකරණය කරයි.
- තෝරාගත් අවකාශයට අනුව අර්ථවත් ලෙස මූර්ති ස්වරූපයෙන් චරිත හා අවස්ථා ගොඩනගයි.
- අර්ථවත් ලෙස ජීවමූර්ති නිර්මාණය කිරීම සඳහා අභ්‍යාස ක්‍රම ඇති බව අවබෝධ කරගනී.

ක්‍රියාකාරකම 3.3.6.1 : ජීව මූර්ති නිර්මාණය කිරීම.

ගුණාත්මක යෙදවුම් : ජීව මූර්ති සහිත ඡායාරූප

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික හා සාකච්ඡා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 01 ඉඩ පහසුකම් සහිත ස්ථානයකට සිසුන් කැටිව යන්න. එම භූමියෙහි ඇවිදීමට සිසුන්ට උපදෙස් දෙන්න. සියලු දෙනා ම එක්වර නිශ්චල විය යුතු බවට විධානයක් දෙන්න. තමා වටා වූ අවකාශය නිරීක්ෂණය කිරීමට යොමු කරවන්න. එහි පුළුල් පරතරයකින් යුතු අවකාශයක් නිර්මාණය වී ඇති බව වැටහී යා හැකි ය. ඊළඟ ඇවිදීම් වාරයේ දී, එකිනෙකා අතර පරතරය සමබර කිරීමට උපදෙස් දෙන්න. ඒ අනුව අවකාශය කළමනාකරණය කරගැනීම පිළිබඳ ව අවධානයෙන් යුතු ව ඇවිදිය යුතු බවට උපදෙස් සපයන්න. නැවත ගුරු විධානයට අනුකූල ව (සෙමෙන් හෝ වේගයෙන් හෝ) සිසුන්ට ඇවිදීමට සලස්වා පෙර සේ ම එකවර නිශ්චල කරවන්න. අනතුරු ව තමා අවට අවකාශය නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබාදෙන්න.

පාඩම් තුනක පළමු පාඩම වශයෙන් සැලකිය හැකි මෙම පාඩමට අදාළ වන්නේ සරල අභ්‍යාසයක් බව සිසුන්ට පැහැදිලි කරන්න.

අවකාශය සහ නළුවා අතර සබඳතාව වැදගත් බවත්, අවකාශය විවිධ අයුරින්, අර්ථවත් ව භාවිත කළ හැකි බවත් සිසුන් සමග සාකච්ඡා කරන්න.

පියවර 02 සිසුහු දෙපේළියකට සිටුවන්න. අවශ්‍ය නම් උසෙහි පිළිවෙළ හෝ මහත, කෙට්ටු ආදි වශයෙන් හෝ පේළි සකස් කළ හැකි වේ.

දෙපේළි මුහුණට මුහුණ ලා සිටුවන්න. මෙවිට සෑම අයකු ඉදිරියේ සහායකයෙක් (partner) සිටිය යුතු ය.

අනතුරු ව උපදෙස් දෙන්න.

එක් පේළියක සිටින්නෝ නිර්මාණකරුවෝ ය. අනෙක් පෙළෙහි සිටින්නන් මැටි පිඩු බවට උපකල්පනය කරවන්න. ගුරු විධානයට අනුව නිර්මාණකරුවන් ඉදිරියට ගොස් අදාළ මැටිවලින් අපූර් ව මූර්තියක් සෑදිය යුතු වේ. මේ සඳහා මිනිත්තු දෙකක පමණ කාලයක් ලබාදිය හැකි ය. මෙම නිර්මාණයේ දී අත්, පා, මුහුණ ආදි හැඩ වෙනස් කරමින් අපේක්ෂිත රූපය නිර්මාණය කළ හැකි වේ.

නියමිත කාල වේලාව අවසානයේ අභ්‍යාසය නවතන්න.

වඩාත් ම නිර්මාණශීලී රූප ඉතිරි වන්නට හැර අනෙක් රූප ලිහිල් කොට විසුරුවන්න. ඉතිරි රූපවල නිර්මාණාත්මක බව අගය කරන්න.

නැවත පිල් දෙක මාරු කර පෙර සේ ම අභ්‍යාසයෙහි නිරත කරවා අගය කරන්න.

පියවර 03 සියලු ම සිසුන් වෘත්තාකාර ව සිටුවා, කළ අභ්‍යාසය පිළිබඳ ව නැවත ස්මරණය කරන්න. අවකාශය තුළ තනි ව හෝ යම් රංග රූපයක් නිර්මාණය කළ හැකි බවත්, ඒ සඳහා නිර්මාණකරුවන් ගේ පරිකල්පනය වැදගත් වන බවත් වටහා ගැනීමට සලස්වන්න.

පියවර 04 සරල ශ්වසන අභ්‍යාසයක් කරවා පාඩම අවසන් කරන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- අවකාශය අර්ථවත් වන සේ ජීවමූර්ති නිර්මාණය කිරීම.
- පරිකල්පන ශක්ති උපයෝගි කරගෙන අපූර්ව ජීව මූර්ති නිර්මාණය කිරීම.
- සමූහ ජීව මූර්ති (අවස්ථාවක් ගොඩ නැගෙන සේ) නිර්මාණය කිරීම.
- ජීව මූර්ති කිහිපය බැගින් ළං කර කිසියම් කතාවක් දක්වෙන සේ රූප (Image) ගොනු කිරීම.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.3 : චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- හිස් අවකාශය අර්ථවත් ලෙස භාවිත කළ හැකි බව ප්‍රකාශ කරයි.
- ''ජීව මූර්ති'' යන්න කුමක් ද යි අවබෝධ කර ගනියි.
- ජීව මූර්ති, ප්‍රතිනිර්මාණය කිරීම, අභ්‍යාස මඟින් ප්‍රගුණ කරයි.

ක්‍රියාකාරකම 3.3.6.2 : ජීව මූර්ති නිර්මාණය කිරීම.

ගුණාත්මක යෙදවුම් : ජීව මූර්ති සහිත ඡායාරූප

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය = ප්‍රායෝගික හා සාකච්ඡා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් : (අංක 3 රූප සටහන් බලන්න)

පියවර 01 පෙර කරන ලද පාඩමෙහි දෙවන පියවර ලෙස මෙම පියවර ක්‍රියාත්මක වන බව පවසමින් පාඩමට ප්‍රවේශ වන්න.

පියවර 02 සියලු සිසුන් අවකාශයෙහි එක් පසකට කැඳවා ඉදිරියේ දී කිරීමට නියමිත අභ්‍යාසය පිළිබඳ ව ඔවුන්ට වැටහීමක් ලබා දෙන්න.

පියවර 03
- එක් සිසුවකු ඉදිරියට ගොස් සිසුන්ට මුහුණ ලා සිටගන්න.
- ඔහුට හෝ ඇයට හෝ ඕනෑ ම ඉරියව්වක් ගත හැකි ය. සාත්ත්වික අභිනය, ආංගික අභිනය සහිත ව මුළු ශරීරය ම ඒ සඳහා සහාය කරගන්න.

පියවර 04
- තවත් සිසුවකු ඉදිරිපත් වී, කලින් සිසුවා ගත් හැඩයට අර්ථයක් ගෙන දෙන ලෙස සම්බන්ධ වන්න.
- මෙසේ සියලු ම දෙනා එක් ව ගොඩ නඟන ලද රූපයෙන් මනා ප්‍රේක්ෂාවක් (Spectacle) මැවෙන බව විස්තර කරන්න. මෙහි දී වාචික අභිනය භාවිත නොකෙරෙන අතර මෙම රූප ස්ථිර අචල (Freez) ජීව මූර්තියක් බව ද පහදන්න. තනි තනි ව නිර්මාණය කෙරෙන ජීව මූර්ති අපූර්ව වන්නේ පරිකල්පන කුශලතාව හේතුවෙන් බව ද, වේදිකා නාට්‍යයක චලනය වන රංග රූප පෙළක් ඇති බව ද පැහැදිලි කරන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- තම පරිකල්පනය මෙහෙයවා අවකාශය තුළ ජීව මූර්ති නිර්මාණය කිරීම.
- එකිනෙකා තනි තනි ව ගොඩනඟන ජීව මූර්ති එකතුවෙන් සමූහ මූර්තියක් (Group sculpture) ගොඩ නැගීම.
- නිර්මාණය කරනු ලබන ජීව මූර්ති රූප, කතාවක් පිළිබඳ හෝඩුවාවක් දනවෙන ලෙස ගොනු කිරීම.
- එම ජීව මූර්ති සජීව බවට පත් වෙමින් භාවමය අවස්ථාවක් නිරූපණය කිරීම.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.3 : චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- නාට්‍යයක අවස්ථා නිර්මාණය කිරීම සඳහා ජීව මූර්ති නිර්මාණය බෙහෙවින් ප්‍රයෝජනවත් වන බව ප්‍රකාශ කරයි.
- වේදිකා නාට්‍යයක රංග වින්‍යාසය සඳහා රංග රූප, පෙළ ගැස්වීම - අත්‍යවශ්‍ය බව වටහා ගනී.
- නාට්‍යෝචිත අවස්ථා වඩාත් ප්‍රබල වන්නේ ජීව මූර්ති නිර්මාණයෙහි අපූර්වත්වය නිසා බව අවබෝධයෙන් පිළිගනී.

ක්‍රියාකාරකම 3.3.6.3 : ජීව මූර්ති නිර්මාණය කිරීම.

ගුණාත්මක යෙදවුම් : ජීව මූර්ති සහිත ඡායාරූප

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික හා සාකච්ඡා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 01 වඩාත් ඉඩකඩ ඇති හිස් අවකාශයක් තෝරාගන්න. සියලු සිසුන් රංග අභ්‍යාස කිරීමට සුදුසු ලිහිල් ඇඳුමකින් සැරසී සිටිය යුතු වේ. කලින් පාඩම් දෙකේ දී කරන ලද අවසාන රංග අභ්‍යාසය මෙය යි. මෙය ඉතා නිරවුල් ව ගුරු භවතා විසින් සිසුන්ට පැහැදිලි කර දිය යුතු වේ. සිසුන් විශාල පිරිසක් සිටින විට එක් කණ්ඩායමකට හය දෙනකු අයත් වන සේ කණ්ඩායම් කිහිපයකට බෙදන්න. පන්තියේ සිටින්නෝ සිසුහු පස් දෙනෙක් නම්, එම පස් දෙනා එක් කණ්ඩායමක් ලෙස ගත හැකි ය. කණ්ඩායම්වලට වෙන් කිරීමට පෙර සියලු දෙනාට සරල ශ්වසන අභ්‍යාසයක් කරවන්න. ඉන් පසු ව අවශ්‍ය ආකාරයකට කණ්ඩායම්වලට බෙදන්න. සියලු කණ්ඩායම්වලට පෙනෙන සේ කළ යුතු බැව් පවසන්න.

පියවර 02 කණ්ඩායමේ සිටින එක් අයකු අනෙක් සියලු දෙනා උපයෝගි කර ගනිමින් නාට්‍යමය රංග රූපයක් (අවස්ථාවක්) නිර්මාණය කළ යුතු වේ.

උදාහරණ ලෙස කණ්ඩායමේ සිටින්නෝ A, B, C, D, E, F යනුවෙන් හය දෙනෙක් නම් A නැමැත්තා BCDEF යන අය මඟින් කිසියම් අවස්ථාවක් නිර්මාණය කළ යුතු වේ. වාචික අභිනය භාවිත කෙරෙන්නේ නැත. A නැමැත්තා නිර්මාණය කරන්නේ මංගල අවස්ථාවක් ය යි සිතන්න. එවිට මනාලයා සහ මනාලිය, අෂ්ටක කියන කපු මහතා, දෙපාර්ශ්වයේ මාපියෝ සතුටින් බලා සිටිති. අයෙක් ඡායාරූප ගනිමින් සිටිති. මෙම චරිතවල ක්‍රියාකාරී ඉරියව්ව ප්‍රදර්ශනය වන ආකාරයේ නිශ්චල වේදිකා මූර්තියක් නිර්මාණය කළ යුතු වේ. ඔවුන් සියලු දෙනා ගේ ම සාත්ත්වික අභිනය, ආංගික අභිනය හොඳින් නිරූපණය විය යුතු ය. තමා සෑදූ රූප හොඳින් මතක තබාගත යුතු ය.

පියවර 03 මී ළඟට කණ්ඩායමේ තවත් සිසුවකු අනෙක් සිසුන් පස් දෙනා ගෙන තමා අධ්‍යක්ෂකවරයා මෙන් සිතා ඔහුට අභිමත නිශ්චල රූපයක් නිර්මාණය කළ යුතු වේ. උදාහරණ ලෙස, B ගේ අවස්ථාවේ දී ACDEF යන පස් දෙනා උපයෝගී කර ගත යුතු ය. ඔහු නිර්මාණය කරන රංග අවස්ථාව ක්‍රීඩාවක අවස්ථාවකි. තිරික්කලයක යෑම, රූගත කිරීමක්, ඔරු පදිනවා, මළ ගෙයක්, දේව රූපයක් ආදි වශයෙන් ඕනෑ ම අවස්ථාවක් විය හැකි ය. ඔහු ද තමා ගේ රූපය හොඳින් මතක තබාගත යුතු ය. එයට සහභාගි වුවන් ද තමා සිටි ඉරියව්ව හොඳින් මතක තබා ගත යුතු වේ.

පියවර 04 කණ්ඩායමේ තවත් අයකුට ඊළඟ අවස්ථාව ලැබේ. ඔහු ද රූපයක් සාදයි. ඔහු එය හොඳින් මතක තබා ගනී.

මේ ආකාරයට සියලු සාමාජිකයන් රංග රූප 6ක් නිර්මාණය කළ යුතු වේ. (කණ්ඩායමේ සිටින්නේ හතර දෙනා නම් රූප හතර යි. පස් දෙනෙක් සිටිත් නම් රූප පහයි.)

පියවර 05 රූපය නිර්මාණය කරන අය ද එම අවස්ථාවේ රංග රූපයේ කොටසක් වීම අනිවාර්ය වේ. එනම්, කලින් සඳහන් කළ උදාහරණයේ "මංගල අවස්ථාව" අවස්ථාව නිර්මාණය කළ A සිසුවා එහි කොටස්කරුවකු විය යුතු ය. එනම්, ඡායාරූප ශිල්පියා හෝ වෙනත් අයකු හෝ ලෙස මේ අවස්ථාවේ හෝ සිටිය යුතු ය.

පියවර 06 කණ්ඩායම් කිහිපයක් ඇති විට මෙසේ සෑම කණ්ඩායමක් ම ක්‍රියාකාරී විය යුතු ය. මේ සඳහා කාලයක් ලබා දේ. මිනිත්තු 5ක් හෝ මිනිත්තු 8ක් සියලු ම කණ්ඩායම්වලට ලබා දේ. අවසානයේ සියලු කණ්ඩායම් වෙන වෙන ම ස්ථානවල බිම වාඩි වීමට සලස්වා, එක් එක් කණ්ඩායම ඉදිරියට විත් තමන් නිර්මාණය කළ රූප පද්ධතිය ගුරුවරයා ගේ විධානයට අනුව ක්ෂණික ව කර පෙන්වීම අපේක්ෂා කෑරේ.

උදාහරණ: 1 වන කණ්ඩායමේ සිසුහු සියලු දෙනා ඉදිරියට පැමිණෙති. A නිර්මාණය කළ රූපය ඉදිරිපත් කරයි. එය නිශ්චල රූපයකි. එම රූපය පිළිබඳ ව අනෙක් අයගේ අදහස් ගුරුවරයා විසින් විමසනු ලැබේ. අවස්ථාව කුමක් ද? එම නිර්මාණය සාර්ථක ද? ප්‍රේක්ෂකයන්ට එය හොඳින් පෙනෙනවද යන කාරණා එහි දී අවධානයට ලක් කෙරේ.

ඉන් පසු ව B ගේ රූපය නිර්මාණය කර පෙන්වයි. මේ ආකාරයට C, D, E, F යන අය ගේ අවස්ථා හා නිර්මාණය කර පෙන්වයි. රූප 6ට ම ඉදිරිපත් කළ පසු ව නැවත මුල සිට පිළිවෙළින් හය දෙනා ම ක්ෂණික ව අවස්ථා කර පෙන්විය යුතු යි. එහි දී ගුරුවරයා ගේ විධානයට අනුව ක්ෂණික ව අවස්ථා මාරු වෙමින් කළ යුතු ය. ගුරුවරයා එක, දෙක, තුන, හතර, පහ, හය ආදි වශයෙන් කණ්ඩායමේ සිටින ගණන අනුව හඬ නගා කියයි. එවිට එයට අදාළ අයගේ රූපය ක්ෂණික ව නිර්මාණය කර පෙන්විය යුතු යි. මෙසේ එක් කණ්ඩායමක් හතර වතාවක් පමණ මුල සිට අග තෙක් අවස්ථා කර පෙන්වීම අපේක්ෂා කෑරේ. මෙහි දී අවස්ථාව සහ හැඩතල තමා සිටි ඉරියව්ව ආදි සෑම දෙයක් ම වෙනස් නොවිය යුතු ය. මතක ශක්තිය හොඳින් තිබිය යුතු ය. අනුවර්තන හැකියාව හොඳින් තිබිය යුතු ය. ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව තිබිය යුතු ය. කාර්යක්ෂමතාව, කඩිසර බව ආදී සියලු ගුණාංග වර්ධනය වී ඇති කණ්ඩායම තෝරාගත හැකි ය.

සියලු ම කණ්ඩායම් මෙසේ කර පෙන්විය යුතු ය. හොඳ ම නිර්මාණශීලී රංග රූප පෙළ නිර්මාණය කළ කණ්ඩායමට අත්පොළසන් දී ඇගැයීමක් ද කළ හැකි ය.

පියවර 07 අවසානයේ සාදන සාමූහික ජීව මූර්ති රූපය කිසියම් කතාවක් දැක්වෙන සේ හැඩ ගසා ගන්න. ඉන් පසු එම කතාවට මුලක්, මැදක් සහ අගක් සෑදෙන සේ රූප පහක් සාදා ගන්න. මෙය සිසුන් හා සාකච්ඡා කරමින් කළ හැකි ය.



- කණ්ඩායම් නිරූපණය, කණ්ඩායම් නායකයා විසින් අධ්‍යක්ෂණය කිරීම.
- ක්ෂණික ව, නොවෙනස් ව කණ්ඩායම් නිරූපණ ඉදිරිපත් කිරීම.
- මතක ශක්තිය හා නිරූපණ අපූර්වත්වය ප්‍රකාශ කිරීම.
- අර්ථාන්විත ජීව රූප නිරූපණය කිරීම.
- කතාන්දරය විකාශනය වන සේ ජීව මූර්ති පෙළ ගොඩ නැංවීම.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.4 : අභිරූපණ කුශලතා වර්ධනය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- අභිරූපණය යන්න පැහැදිලි කරයි.
- ගමන් විලාස අනුගමනය කරයි.
- රූපණ රටා අභ්‍යාස කරයි.
- කේවල රංගන සඳහා වස්තු රැස් කරයි.
- සාමූහික රූපණ සඳහා යෝග්‍ය වස්තු නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම 3.4.1 : අභිරූපණය හඳුනා ගනිමු.

ගුණාත්මක යෙදැවුම් :
- අභිරූපණ ශිල්පියකු ගේ රූපණය සහිත පින්තූර
- අදාළ සංයුක්ත තැටි
- ජයන්තා රණවක - රූපණ ප්‍රවේශය ග්‍රන්ථය
- ජයන්තා රණවක - අභිනය රංග කලාව ග්‍රන්ථය

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ගුණාත්මක යෙදවුම් වශයෙන් රැස් කරගත් පින්තූර සමඟ ග්‍රන්ථ පෙන්වමින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් සම්පාදිත සංයුක්ත තැටිය නැරඹීමට සැලැස්වීමෙන් ද පාඩම සඳහා සිසුන් යොමු කරගන්න.

- අභිරූපණ නම් රූපණ විලාසය පැහැදිලි කිරීම සඳහා පහත දක්වෙන කරුණු ද සහාය කර ගන්න.

- අභිරූපණය වනාහි ලෝක භාෂාවකි. සංවාදවලින් තොර වූ සන්නිවේදන මාධ්‍යයකි. ලෝකයේ විවිධ රටවල විවිධ අභිරූපණ මාදිලි බිහි ව ඇත. අභිරූපණය වනාහි සාමාන්‍ය නිරූපණයට වඩා අතිශයෝක්තියෙන් යුතු ව අදහස් ප්‍රකාශ කිරීමකි. මෙහි චලනවල කිසියම් රිද්මානුකූල බවක් ඇත. සාත්ත්වික හා ආංගික අභිනය ඇසුරු කරගෙන නිරූපණ ඉදිරිපත් කෙරේ. කුඩා අවකාශයක් තුළ රූපණ අවස්ථා මැවීම මෙහි දී සිදු වේ. අභිරූපණයේ දී සාත්ත්වික අභිනය ප්‍රබල බැවින් මුහුණ රචනය කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු වේ.

  අභිරූපණ රංගයේ දී සාත්ත්වික අභිනය ප්‍රබල බැවින් මුහුණ අංග රචනය කිරීම විශේෂ ආකාරයකට සිදුවේ.

  අභිරූපණ ශිල්පියකු ගේ ශාරීරික නම්‍යතාව වඩා වැදගත් වන බැවින් ලිහිල් ඇඳුමක් ඇඳීම සුදුසු ය. බොහෝ විට මෙම ඇඳුම කළු හෝ සුදු හෝ පැහැය ගනී. දෑත්වලට අත් මේස් පැළඳීමෙන් දෑත් චලන කෙරෙහි දැඩි අවධානය ලබාගත හැකි ය.

  සංවාද භාවිතයෙන් තොර වන බැවින් අභිරූපණ ශිල්පියා අදහස් ගෙන හැර පෑ යුත්තේ සිය ශරීරය මෙවලමක් කරගනිමිනි. මේ සඳහා ශාරීරික නම්‍යශීලී භාවය ලබාගැනීම අතිශයින් ම වැදගත් වේ. ඒ සඳහා ශිථිලකරණ අභ්‍යාසයවල නිරත විය යුතු ය.

  අඟර දඟර අභ්‍යාසය, ලිහිල් ව බිම පෙරළීමේ (රෝල් වීමේ) අභ්‍යාසය හා සැලීමේ අභ්‍යාසයන් ප්‍රගුණ කිරීමෙන් ශාරීරික නම්‍යශීලීත්වය ලබාගත හැකි වේ.

  අභිරූපණ රංගයේ දී ප්‍රගුණ කළ යුතු විශේෂ ශිල්පීය කුශලතා ගණනාවකි.

- ඇවිදීමේ ක්‍රම
  - සැහැල්ලු ඉදිරි ගමන
  - පැති ගමන
  - දුෂ්කර ගමන

- ආපසු ගමන
- පඩි නැඟීම
- පඩි බැසීම
- ඉණිමගේ නැඟීම
- ඉණිමගෙන් බැසීම
- කඹයක් ආධාරයෙන් උඩට නැඟීම
- කඹය දිගේ පහළට ලිස්සා ඒම

වැනි චලන කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. මෙහි දී පාද චලනය මෙන් ම දෑත්වල හා ශාරීරික ඉරියව්වල නිවැරදි භාවය කෙරෙහි විමසිලිමත් වීම වැදගත් ය.

- අවකාශයෙහි භාණ්ඩ මැවීම හා භාවිත කිරීම. මෙහි දී හැඩය, ඝනත්වය, බර, ප්‍රමාණය, පෘෂ්ඨීය ස්වභාවය සමඟ භාවිතයට ගැනීම පිළිබඳ අත්දැකීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

  මේ සියල්ල සිදු කිරීම සඳහා සැබෑ ලෝකයේ දකින වස්තු පිළිබඳ බාහිර ස්වරූපය සිත්හි මවා ගැනීමේ පරිකල්පන කුශලතා වර්ධනය කරගැනීම අතිශයින් ම ප්‍රයෝජනවත් වේ.

- රූපණය පෝෂණය කිරීම සඳහා ආටෝප ක්‍රියා යොදාගැනීම ද වැදගත් ය. දත් මැදීම, ගිලීම, ගායනය, රැවුළ බෑම, ස්පර්ශය, සවන් දීම, ආඝ්‍රාණය එවන් සහාය ක්‍රියා ය.

  මේ සියලු ම ක්‍රියා සැබෑ ලෝකයේ මානව හා සත්ත්ව චර්යා ඉතා සියුම් ව නිරීක්ෂණය කිරීමෙන් අත්දැකීම් ලබාගත හැකි ය.

- රංග කාර්යයට බද්ධ වූ සංගීතය යොදා ගැනීමෙන් ද, ප්‍රකාශනය ප්‍රබල කරගන්නා අවස්ථා ඇත. එහෙත් ක්‍රියාව හා නොබැඳුණු සංගීතය සහාය කර ගැනීම අතිශයින් හානිකර ය.

  සංවාද නොමැති බැවින් රූපණය වෙත ප්‍රේක්ෂක අවධානය ලබාගැනීම අසීරු ය. එබැවින් වඩා යෝග්‍ය වූ සිද්ධියක්, අවස්ථාවක් තේමා කර ගැනීම කෙරෙහි අවධානය යොමු විය යුතු ය. එම සිදුවීම නාට්‍යෝචිත ගුණයෙන් යුක්ත විය යුතු වේ. ගැටුම් සහිත ව, අපූර්ව අත්දැකීම් ඇතුළත් අවස්ථා නිරූපණය සඳහා යොදා ගත යුතු ය.

  නිදසුන් වශයෙන් 'වීදුරු පිසින්නා' යන මාතෘකාව අනුව,

  - රැකියා විරහිත තරුණයකු ගේ ස්වභාවය
  - මුදල් සොයා ගැනීමේ උත්සාහය
  - වීදුරු බිත්තියක් සේදීමට අවස්ථාව උදා වීම.
  - ඉතා හොඳින් කාර්යය නිම කිරීම
  - කාර්යය හා ප්‍රතිලාභ පිළිබඳ ව සතුටු වීම
  - මැස්සකු ගේ පැමිණීම
  - වීදුරුව කිලිටි වීම
  - නැවත පිරිසිදු කිරීම හා නැවත මැස්සා ගේ පැමිණීම
  - කෝප වුණු තරුණයා පොල්ලක් ගෙන මැස්සාට ගැසීම
  - බිඳුණු වීදුරුව හා පශ්චාත්තාප වීම

  ආදිය ඇසුරින් තර්කානුකූල ව, විශ්වසනීයත්වය රැකෙන පරිදි සිදුවීම් පෙළ ගැසීම කෙරෙහි අවධානය යොමු විය යුතු ය.

- සියලු ක්‍රියා සහ ප්‍රතික්‍රියා ඉතා සියුම් ලෙස එකිනෙක හා බද්ධ වීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

- සමූහ අභිරූපණ ඉදිරිපත් කිරීමක දී කණ්ඩායම, එකිනෙකාගේ සියුම් රූපණ අවස්ථා කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. නිදසුනක් වශයෙන් ''පිළිම හොරු'' නම් නිර්මාණයේ සිද්ධි පෙළ ගැස්වීම පහත සඳහන් ආකාරයට සිදුවිය යුතු වේ.

  - මුදල් නොමැති ව ඉතා අසහනයෙන් සිටින තරුණයෝ දෙදෙනෙකි. අයෙක් සාමකාමී ය. අනෙකා දඟකාරී ය.

- නගර මධ්‍යයේ ඇති පිළිම දෙකකි. එහි පින් කැටයට මුදල් දමා යන පිරිස් දැකීම.
- මුදල් ලබා ගැනීමේ අභිප්‍රායයෙන් ඔවුන් දෙදෙනා පිළිම දෙක ඉවත් කර තමන් පිළිම සේ ස්ථානගත වීම.
- විභාගයට යන පාසල් සිසුන් පින් කැටයට කාසි දැමීම. වාහනවලින් පැමිණ පින් කැටයට මුදල් දැමීම.
- තරුණ යුවළක් පැමිණීම. තරුණිය ස්පර්ශ කිරීමට ද තරුණයා පෙලඹීම. ඇය ස්පර්ශ කළේ කවරෙක් දැයි නොදැන කෝපයට පත් වන තරුණිය පෙම්වතාට පහර දීම.
- චිත්‍ර ශිල්පියකු පැමිණ පිළිම ඇඳීමට සූදානම් වීම. එක් ඉරියව්වක සිටීමට අපොහොසත් තරුණයන් විවිධ ඉරියවු පෑම නිසා බියට පත් වන චිත්‍ර ශිල්පියා පලායාම.
- ඡායාරූප ශිල්පියකු පැමිණ ඡායාරූපගත කිරීම.
- නගර සභාවේ කසළ ශෝධකයන් පැමිණ පිළිම පවිත්‍ර කිරීම. තරුණයන් අපහසුවට පත්වීම.
- සැර පරුෂ පලතුරු වෙළෙන්දියක පැමිණීම. දඟයා විසින් පලතුරු වට්ටියෙන් කෙසෙල් ඇවරියක් ගෙන කමින් ලෙලි පිළිම පිටුපසට විසි කිරීම. කෙසෙල් අඩු බව දැන ගන්නා වෙළෙන්දිය කලබලයට පත් වීම. පිළිම වටා යමින් නිරීක්ෂණය කරද්දී, පිළිම පිටුපස වන කෙසෙල් ලෙලි දකී. සිද්ධිය තේරුම් ගන්නා වෙළෙන්දිය පොල්ලක් ගෙන තරුණයන්ට ගසා පලවා හරී.

• මෙලෙස කුතුහලය, ත්‍රාසය, ගැටුම්, අපූර්වත්වය සහ නාට්‍යමය ගුණාංග සහිත ව අවස්ථාව පෙළ ගැස්විය යුතු වේ.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- අභිරූපණයක් ඉදිරිපත් කිරීමේ දී නළුවා විසින් ප්‍රගුණ කළ යුතු රංග අභ්‍යාස විස්තර කිරීම.
- කේවල හා සාමූහික අභිරූපණ නිරූපණ සඳහා නාට්‍යෝචිත අවස්ථා පෙළ ගැන්වීම.
- නිවැරදි ශිල්ප ක්‍රම භාවිත කරමින් අංග රචනය කිරීම.

නිපුණතාව 3.0 : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යාය ප්‍රකට කරයි.

නිපුණතා මට්ටම 3.5 : නිර්දිෂ්ට පෙළට අදාළ ව රූපණයේ යෙදෙයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- නිර්දිෂ්ට පෙළෙහි චරිත අවබෝධයෙන් යුතු ව නිරූපණය කරයි.
- චරිතයක් නිර්මාණය වීම සඳහා බලපාන සාධක ප්‍රායෝගික ව අවබෝධ කර ගනියි.
- කණ්ඩායම් වශයෙන් එක් ව නාට්‍ය අවස්ථාවක් නිරූපණය කරයි.
- චරිත පිළිබඳ ව සොයන්නටත් අපූර්වත්වයෙන් යුතු ව ඒවා නිරූපණය කරන්නටත් පෙළඹේ.
- නාට්‍ය අවස්ථාවක් ඇසුරින් නාට්‍ය පිටපත සහ චරිත අර්ථකථනය කරන අයුරු ප්‍රකාශ කරයි.
- රංගනය සඳහා පූර්ව සූදානම වැදගත් බව ප්‍රකාශ කරයි.

ක්‍රියාකාරකම 3.5.1 : ඊඩිපස්, සෙල්ලම් ගෙදර හා කුවේණි පෙළට අදාළ ව තෝරාගත් අවස්ථා නිරූපණය කිරීම.

ගුණාත්මක යෙදවුම් : A4 කඩදාසි

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික හා තාක්ෂණ

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 01 නිර්දිෂ්ට නාට්‍යයක පෙළෙහි යම් අවස්ථාවකට අදාළ දෙබස් කොටසක් සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා ඔවුන් වෙත ලබා දෙන්න.

උදා: හුනු වටයේ කතාව - අසඩක් හා මහල්ලා ගේ හමු වීමේ අවස්ථාව
ජුලියස් සීසර් - සීසර් ඝාතනය කිරීම
සෙල්ලම් ගෙදර - නෝරා නිවසින් සමු ගැනීම
ඇන්ටිගනී - සෙබළා ගේ පැමිණීම

මෙවැනි නාට්‍යමය අවස්ථාවක් නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව ඔවුන් ගෙන් විමසන්න. නාට්‍යයක අවස්ථාවක් නිරූපණයේ දී බොහෝ කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව අවධාරණය කරන්න.

පියවර 02 පහත තොරතුරු සඳහන් කාර්ය පත්‍රිකාව සිසුන් වෙත ලබා දී තම කණ්ඩායම ලබාගත් අවස්ථාවට අනුව එම තොරතුරු සටහන් කරන ලෙස පවසන්න.

සම්පූර්ණ නාට්‍යයක් බවට පත් වන්නේ නාට්‍යමය අවස්ථා කිහිපයක හෝ රැසක හෝ එකතුවකි. ඒ නිසා නිර්දිෂ්ට පෙළෙන් ඔබ ලබාගත් නාට්‍යමය අවස්ථාවට අදාළ ව පහත දැක්වෙන තොරතුරු සම්පූර්ණ කරන්න.

- එම දෙබස අයත් නාට්‍යයේ ශෛලිය.
- ඔබට ලැබුණ නාට්‍යමය අවස්ථාව හමු වන්නේ කුමන රිද්මයක, කුමන ස්ථානයක නාට්‍යය පවතින විට ද?
- නාට්‍යමය අවස්ථාවේ පරිසරය, දේශය, සමාජ ස්වභාවය
- එම අවස්ථාවට අයත් වන චරිතවල ඉතිහාසය, වර්තමානය සහ අනාගතය
  - වයස
  - සමාජ තත්ත්වය
  - එම අවස්ථාවට චරිතය පැමිණෙන්නේ කොහි සිට කුමන ස්වභාවයකින් ද යන්න

- එම අවස්ථාවෙන් පසු ව චරිතය යන්නේ කුමන ස්ථානයක කුමන තත්ත්වයකට ද යන බව
- චරිතයේ ශාරීරික ශක්ති සහ දුබලතා
- රුචි-අරුචිකම්
- වේෂභූෂණ සහ එහි ස්වභාවය
- බාහිර ස්වභාවය හා අංග රචනය
- සමාජ සම්බන්ධතාවල ස්වරූපය
- අවස්ථාවට අදාළ දෙබස
- අභ්‍යන්තර චරිත ලක්ෂණ සහ චලන

- නාට්‍යයේ පසුතල නිර්මාණ සහ නාට්‍යෝපකරණ
- ආලෝකකරණය
- සංගීතය
- අධ්‍යක්ෂවරයා ගේ නාට්‍ය පිළිබඳ අර්ථකථනය
- පිටපත් රචකයා ගේ අර්ථකථනය
- එම අවස්ථාවේ වේදිකාවේ සිටින චරිත සහ ඒවායෙහි ස්වභාවය
- ප්‍රේක්ෂාගාරයේ ස්වභාවය

පියවර 03
- අවස්ථාවට අදාළ ව දත්ත තොරතුරු සොයා ගැනීමෙන් පසු ඒවාට අනුගත වන ලෙස අදාළ අවස්ථාව පුහුණු වන ලෙස සිසුන්ට පවසන්න. මෙහි දී වේදිකා භාවිතය රංගනය ආදි කරුණු පිළිබඳ ගැටලු ඇති තැන් නිදොස් කරන්න.
- සෑම නාට්‍ය පෙළක් සමඟ ම ඇති ගවේෂණ කාර්ය හොඳ නිෂ්පාදනයක් බිහිවීමට හේතුවන බව සිසුන් ගේ ක්‍රියාකාරකම ආශ්‍රයයෙන් පැහැදිලි කරන්න.

පියවර 04
- අවස්ථාව නිරූපණය සඳහා අවස්ථාව ලබාදෙන්න. සිසුන් ගේ ප්‍රබලතා දුබලතා සහ අත්දැකීම පිළිබඳ සාකච්ඡා කරන්න.

උක්ත ක්‍රියාකාරකම සිදු කිරීමේ දී සිසුන්ට ගවේෂණය කිරීම සඳහා පහත චරිතවලට ප්‍රමුඛත්වය ලබාදෙන ලෙස පවසන්න.

නාට්‍ය	චරිතය
කුවේණි	කුවේණි, ජීවහත්ත, දිසාලා, දඩයක්කරු, විනිසුරු
සෙල්ලම් ගෙදර	ක්‍රොග්ස්ටඩ්, නෝරා, හෙල්ම, ලින්ඩ, රන්ක් දොස්තර
ඊඩිපස්	ඊඩිපස්, යොකැස්ට්‍රා, ක්‍රෙයොන්

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පැවරුම : නිර්දිෂ්ට නාට්‍ය පෙළක චරිතයක් තෝරා ගෙන එම චරිතයේ ස්වභාවය එසේ වීමට හේතු විමර්ශනාත්මක ව සාකච්ඡා කරන්න.

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.1 : නාට්‍ය කලාවේ ප්‍රභවය විමසයි. (ග්‍රීක නාට්‍ය)

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රභවය පිළිබඳ ව කරුණු අධ්‍යයනය කරයි.
- ආරම්භක නාට්‍යකරුවන් හඳුනාගනියි.
- ඔවුන්ගේ කෘති පිළිබඳ තොරතුරු සාකච්ඡා කරයි.
- සාර්ථක නිර්මාණ අගය කරයි.
- ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රභවය හා විකාශය

ක්‍රියාකාරකම 4.1.1 : ග්‍රීක නාට්‍ය පෙළ අධ්‍යයනය කරයි.

ගුණාත්මක යෙදවුම් :
- ඇරිස්ටෝටල් ''කාව්‍ය ශාස්ත්‍රය'' ග්‍රන්ථය
- ඊස්කිලස්, සොෆොක්ලීස්, යුරිපිඩීස්, ඇරිස්ටොෆනීස්, මෙනන්ඩ්‍රොස් යන නාට්‍යකරුවන්ගේ ඡායාරූප
- ග්‍රීක රංග භූමියක රූප

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ග්‍රීක රංග භූමියක පින්තූර, ''කාව්‍ය ශාස්ත්‍රය'' ග්‍රන්ථය, නාට්‍යකරුවන් ගේ පින්තූර සිසුන්ට ප්‍රදර්ශනය කිරීමෙන් පාඩම වෙත සිසුන් ප්‍රවේශ කර ගනිමින්, පහත දැක්වෙන කරුණු ආශ්‍රිත ව සාකච්ඡාවක් ගොඩ නඟන්න.

- ක්‍රි. පූ. 5 වැනි හා 4 වැනි ශත වර්ෂවල දී බිහිවුණු සම්භාව්‍ය සාහිත්‍ය කෘති සියල්ල ම පාහේ නාට්‍ය කෘති වීම විශේෂයකි.

  මෙම යුගය ඇතැන්සයට මහත් කරදර ගෙනදුන් යුද කලබලවලින් හා අවුල්-වියවුල්වලින් පිරුණු සමයක් විය. එහෙත් නාට්‍ය රචනයට හා නිෂ්පාදනයට ඉන් කිසිදු බාධාවක් නොවිණි. ඇතැන්ස් නගරයේ වර්ෂයකට දෙවරක් දෙවියන් උදෙසා පැවැත්වුණු අත්සව මාලාවක අංගයක් ලෙස පැවැත්වුණු නාට්‍ය තරග සඳහා ග්‍රීකයෝ නාට්‍ය රචනා කිරීමට පෙළඹුණහ. තරගකාරී මට්ටමින් නාට්‍ය ග්‍රීක දෙවිවරුන් අතර වඩා ජනප්‍රිය වූයේ දියෝනීසස් දෙවියා ය. දෙවියා තමනට ආවේශ වී ඇතැයි සිතා මෝහනයට පත් වීම දියෝනිසස් භක්තිකයන්ගේ විශේෂ ලක්ෂණයකි. මිදි පල හට ගන්නා සමයෙහි ඔවුහු මිදි යුෂ පානය කර මත් වී, සීමාව ඉක්මවා ගිය අසංස්කෘත වූත්, අසභ්‍ය වූත් විහිළු-තහළුවලින් අනූන ව දෙවියන් වෙත පූජෝපහාර පැවැත්වූහ. දෙවියන්ට උපහාර පිණිස ඉදිරිපත් කළ වෘන්ද ගායනය ඩිතුරම්බොස් නම් විය. එම නම දියෝනීසස් දෙවියන් ගේ අපර නාමය යි.

- ඩිතුරම්බොස් ගායනා කලාත්මක අගයකින් යුතු ව සකස් කළේ ක්‍රි. පූ. 7 වැනි සියවස ආරම්භයේ පෙරියන්ඩර් රජු ගේ රාජ සභාවේ සේවය කළ අරියොන් නම් කවියා ය.

  ක්‍රි. පූ. 534 දී ප්‍රථම වරට ඩිතුරම්බොස් ගාන වෘන්දයට නළුවකු එක් වූ බව පැවසේ. අට්ටිකාවේ ඉකරියොස් නගරයේ උපන් තෙස්පිස් නම් ගායක නායකයා ගායනයෙහි නිරත වන අතර ම ''දියෝනීසස් මම වෙමි''යි පවසමින් මුල් ම නළුවා බවට පත් විය. ''මේ සා පිරිසක් ඉදිරියේ මේ සා බොරු ගොතා කීමට ඔබට ලජ්ජා නැද්ද''යි ඇතැන්ස් රාජ්‍ය නායකයා ව සිටි සොලෝන් නමැත්තා පිළිවිසි නමුදු එය ග්‍රීක නාට්‍ය කලාවේ ආරම්භයට මූලික පදනම දැමීමක් ලෙස සැලකිය හැකි ය.

ට්රැජඩි (ට්‍රැගොඩියා) යන ග්‍රීක වචනයෙහි තේරුම ''අජගීතය'' යනු ය. දියෝනීසස් දෙවියා ගේ පූජාසනය මත එළුවකු කපා, පූජා කිරීමෙන් පසු ගයනු ලබන ගීත ඇසුරෙන් එනම් වූ බව සඳහන් වේ.

ඩිතුරම්බොස් යනු වෘන්ද ගායනා තරගයකින් ජය ගත් කවියාට එළුවකු තෑගි වශයෙන් ලබා දීම හේතුවෙන් පට බැඳුණු නාමයක් බව ද පැවසේ. සටුරයන් ගේ වෙස්ගත් ගාන වෘන්දයක් (සත්ත්ව හා වල්ගා ද ඇති ව) නිසාවෙන් ට්‍රැගෝඩියා යන නම් ලද බවට ද මතයකි. එම ගාන වෘන්දයේ නාට්‍යකරුවන් ගේ වේශභූෂණය වූයේ ඉඟ වටා එතුණු රෙදි කැබැල්ලක් හෝ සත්ත්ව සමක් හෝ පමණකි. එයට පිටතින් කෘත්‍රිම ලිංගේන්ද්‍රියයක් හා වලිගයක් සම්බන්ධ විණි. සටුරයන් නිරුවතින් සිටින බව එමගින් හැඟවිණි. ඔවුහු සත්ත්ව කන් සහිත වෙස් මුහුණු පැළඳියහ. ඔවුහු ට්රැජඩි, කොමඩිවල පමණක් නොව සැටර් නාට්‍යවල දී ද වෙස් මුහුණු භාවිත කළ හ. ඒ අනුව මෙම නාට්‍ය ප්‍රභේද තුනේ ම ගාන වෘන්දය විශේෂ තැනක් ගත්තේ ය. එහෙත් කොමඩි සඳහා ''කෝමෝස්'' නමින් හඳුන්වනු ලැබූ වෙස් මුහුණු පැළඳි නැටුමක් මුල් වන්නට ඇතැයි සැලකේ.

නළුවාට ගායක පිරිස අමතමින්, සංවාදයෙහි නිරත වීමටත්, වෙස් මුහුණු මාරු කිරීමෙන් වරින් වර චරිත කිහිපයක් නිරූපණය කිරීමටත් අවකාශ සැලසිණි.

තෙස්පීස් ගෙන් පසු ව ඔහුගේ ශිෂ්‍ය ෆ්රූනිබොස් ක්‍රි.පූ. 511-508 අතරතුර කාලයේ දී නාට්‍ය තරගයකින් ජය ගත්තේ ය. ඔහුගේ ප්‍රසිද්ධ ම නාට්‍යය ක්‍රි.පූ. 493 හෝ 492 හෝ දී නිෂ්පාදනය කරන ලද ''මිලීටොස් ලුණ්ඨනය'' විය. ෆ්රූනිබොස් සමඟ බොයිරිලොස් හා ප්‍රටිනස් නමින් නාට්‍ය රචකයියෝ කිහිප දෙනෙක් ද විසූ හ.

මෙලෙස ප්‍රභව වූ නාට්‍ය කලාව වඩාත් ඉහළ තලයකට ගෙන යන ලදුයේ ඊස්කිලස්, සොෆොක්ලීස්, යුරිපිඩීස්, ඇරිස්ටොෆනිස් සහ මෙනන්ඩ්‍රොස් විසිනි.

ඊස්කිලස් දෙවන නළුවකු ද, සොෆොක්ලීස් තුන් වැන්නකු ද එක් කරනු ලැබීමෙන් පසු ග්‍රීක නාට්‍ය පරිණත භාවයට පත් විය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

ග්‍රීක නාට්‍යයේ ප්‍රභවය පිළිබඳ විස්තරයක් කරන්න. (එහි දී නාට්‍යමය ලක්ෂණ වර්ධනය වූ ආකාරය කෙරෙහි අවධානය යොමු වීම සුදුසු වේ).

වැඩිදුර අධ්‍යයනය සඳහා :

වෝල්ටර් මාරසිංහ	- ග්‍රීක නාට්‍ය සම්ප්‍රදාය
ඒ. වී. සුරවීර	- ඇරිස්ටෝටල් කාව්‍ය ශාස්ත්‍රය
බන්ධුල ජයවර්ධන විජේරත්න පතිරාජ	- සම්භාව්‍ය ග්‍රීක නාට්‍ය කලාව

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.1 : ග්‍රීක නාට්‍ය ප්‍රභේද
- ශෝකාත්ම (Tragedy)
- සුඛාත්ම (Comedy)
- සටුර (Satyr)

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- ග්‍රීක නාට්‍ය ප්‍රභේද නම් කරයි.
- ඒ ඒ ප්‍රභේදවල විශේෂතා සාකච්ඡා කරයි.
- ඒ ඒ ප්‍රභේදවලට අයත් නාට්‍යවල නාට්‍යමය ලක්ෂණ වෙන්කර දක්වයි.
- ග්‍රීක රංග ශෛලිය විස්තර කරයි.
- ඒ ඒ ප්‍රභේදවලට අයත් නාට්‍ය පිටපත් කියවයි.

ක්‍රියාකාරකම 4.1.2 : ග්‍රීක නාට්‍ය ප්‍රභේද

ගුණාත්මක යෙදැවුම් :
- වෙස් මුහුණු පැළඳගත් ග්‍රීක නාට්‍ය නළුවන් ගේ පින්තූර
- ග්‍රීක රංග භූමියේ පින්තූරයක්
- ''කාව්‍යශාස්ත්‍රය'' ග්‍රන්ථය

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ගුණාත්මක යෙදැවුම් වශයෙන් සපයාගත් දෑ සිසුන්ට ප්‍රදර්ශනය කිරීමෙන් පාඩමට ප්‍රවේශ කර ගන්න.
- අනතුරු ව පහත දැක්වෙන විෂය කරුණු අන්තර්ගත වන සේ සාකච්ඡාවක් ගොඩ නගන්න.
- ඇරිස්ටෝටල් ගේ ''කාව්‍යශාස්ත්‍රය'' සම්පාදනය කරනු ලැබූ දින වකවනු නිශ්චිත නො වේ. එය පරිච්ඡේද 26කින් යුක්ත කුඩා පොතක් වශයෙන් හඳුනා ගත හැකි ය. ''කාව්‍යශාස්ත්‍රය'' අරම්භයේ දී සඳහන් කරන පරිදි, රචකයා ගේ මූලික අපේක්ෂාව වී ඇත්තේ ආධුනික රචකයන්ට ශිල්ප ධර්ම පද්ධතියක් ඉදිරිපත් කිරීම බව පෙනේ.
- ක්‍රි. පූ. 384-322 කාලයේ ජීවත් වූ ග්‍රීක දාර්ශනිකයන් අතුරෙන් ඇරිස්ටෝටල්ට හිමි වන්නේ ප්‍රමුඛස්ථානයකි.
- ''කාව්‍යශාස්ත්‍රයෙන්'' කාව්‍ය වර්ග 4ක් පිළිබඳ ව සඳහන් කෙරේ. ඒ ට්‍රැජඩි, කොමඩි, සැටර් හා වීර කාව්‍ය වශයෙනි.

  ''කාව්‍යශාස්ත්‍රයෙහි'' වැඩි අවධානයක් යොමු ව ඇත්තේ ශෝකාත්ම හෙවත් ඛේදජනක යනුවෙන් හැඳින්වෙන ප්‍රභේදය වෙත ය.
- ට්‍රැජඩියෙහි නායකයා (Tragic hero) නාට්‍යාවසානයේ දී ඛේදජනක අවස්ථාවකට මුහුණ පාන්නේ දෛවෝපගත ඉරණමට අනුව හෝ, දැන හෝ නොදැන සිදු කරන ලද වැරැද්දක් හේතුවෙනි.
- ට්‍රැජඩි නාට්‍යයක කථා නායකයා රජකු හෝ ප්‍රභුවරයකු හෝ විය යුතු ය. ඔහු කිසිදු විටෙක දැනුම්වත් ව කිසිදු පාපී ක්‍රියාවක නිරත නො වේ. ඇරිස්ටෝටල් දක්වන පරිදි ට්‍රැඩියක නායකයා හැමතින් ම යහපත් වූත්, අතිශයින් දුෂ්ට වූත් පුද්ගලයකු නොවන මධ්‍යස්ථ පුද්ගලයකු විය යුතු ය.

  ඛේදාන්ත වීරයා හුදෙක් කටයුතු කරන්නේ පරාර්ථ සාධනය වෙනුවෙනි. එහෙත් ඔහු තුළ පවතින අතිමානය (හ්‍යුබ්‍රිස්) හේතු කොට ගෙන ඛේදනීය අවසානයක් කරා යොමු වෙයි. ඒ අනුව නාට්‍යය පුරා පැතිර පවත්නා බිය හා කරුණාව/අනුකම්පාව යන භාව මුල් කරගෙන ප්‍රේක්ෂකයා තුළ භාව විශෝධනයක් සිදුවේ.

- කොමඩියේ පරමාර්ථය විනෝදාස්වාදය යි. අඳුරු පරිසරයක් මධ්‍යයේ ආරම්භ වන නාටකය හාස්‍යජනක හෝ ප්‍රීතිමත් හෝ ලෙස අවසන් වේ. මෙහි දී කවියා සමාජයේ දුර්වල තැන් පමණක් නොව දේශපාලන නායකයන් වැනි සමකාලීන ප්‍රසිද්ධ පුද්ගලයන් ද නිර්දය ලෙස විවේචනයට ලක් කළේ ය. ප්‍රසිද්ධ කොමඩි රචකයකු වූ ඇරිස්ටොෆනිස් ගේ කෘති කිහිපයක ම එවක ඇතැන්සයේ රාජ්‍ය නායකයා ව සිටි ක්ලෙයෝන් නිර්දය ලෙස උපහාසයට ලක් කොට ඇත.

බොහෝ විට කොමඩියක කථානායක-නායිකාවන් වූවෝ සාමාන්‍ය පුද්ගලයෝ ය. දුර්ගුණවලින් ගහන දුෂ්ට පුද්ගලයෝ ය. කොමඩි හි වේෂභූෂණ තාත්ත්වික විය. දෙබස් රචනා වූයේ පද්‍යයෙන් වුව ද භාෂා විලාසය සම ව්‍යවහාර භාෂාවට සමීප විය. කොමඩියක ගාන වෘන්දය 24 දෙනෙකු ගෙන් සමන්විත විය. ගාන වෘන්දයට විශේෂ ස්ථානයක් හිමි වුණු අතර, නාට්‍යය හැඳින්වූයේ ගාන වෘන්දයේ නමිනි. හාස්‍යෝත්පාදක නාට්‍යයෙහි විශේෂ ලක්ෂණයක් වනුයේ අසභ්‍යත්වය හා ග්‍රාම්‍යත්වය උත්පාදක ශක්තියට පාදක වන්නේ ය යන විශ්වාසයෙන් ලිංගික ක්‍රියා අනුකරණය කර දක්වීම ය.

ඇරිස්ටොෆනානිස් ගේ නාට්‍යවලින් ගැඹුරු හාස්‍යයක් ප්‍රකට කෙරිණි. විවාදයක් පැවතීම මේවාහි විශේෂ ලක්ෂණයකි.

කොමඩි වස්ත්‍ර බොහෝ විට ඉතා වර්ණවත්, මෝස්තර පින්තාරු කරන ලද ඒවා ය. චරිතය විශාල කර පෙන්වීම සඳහා කුඩා කොට්ට වැනි උපකරණ මඟින් ඇඳුම් පුම්බා තිබිණි. කොමඩි නළුවකු අඳින්නේ ඉතා කෙටි රෙදි කඩකි. පැතලි සෙරෙප්පු ය. වස්ත්‍රය ඉදිරිපසින් මෙන් ම පිටුපසින් ද පුම්බා විසුළු ස්වරූපයක් ලබා දී ඇත. යටින් ඇඳ සිටියේ ශරීරයට ම තද වූ දිග කලිසමකි. එය ශරීරයේ පාට ම හෝ ඉරි සහිත හෝ විය. සශ්‍රීකත්වයේ සංකේතයක් වශයෙන් සැලකුණු පුරුෂ ලිංගේන්ද්‍රියයක් (Phallus) අතිශයෝක්තියෙන් යුතු ව පැලඳ සිටිය හ.

කොමඩි නාට්‍යවල වෙස් මුහුණු භාවිත කළත් හිස් වැසුම් පැලඳියේ නැත. බොහෝ විට වස්ත්‍ර නිසා ගාන වෘන්දය රංග භූමියට පිවිසි අවස්ථාවේදී ම ප්‍රේක්ෂකයන්ට නාට්‍යයේ නම පිළිබඳ ව වැටහීමක් ඇති වන්නට ඇත.

සටුර (සැටර්) නාටකය

ක්‍රි. පූ. පස් වැනි ශත වර්ෂයේ දී නාටක තරගවලට ඉදිරිපත් වූ සැම ශෝකාන්ත නාටක රචකයෙකු ම ශෝකාන්ත නාටක තුනක් සමග සටුර නාට්‍යයක් ද ඉදිරිපත් කළ යුතු විය. සැටර් නාට්‍යය ද හාස්‍යෝත්පාදක ලක්ෂණයෙන් සමන්විත විය. හාස්‍යජනක ග්‍රීක පුරාණෝක්ති ඒවාට වස්තු විය.

ශරීරයේ ඇතැම් කොටස් මනුෂ්‍යයන් ගේ මෙන් ද අන් කොටස් එළුවන් ගේ හෝ අශ්වයන් ගේ හෝ මෙන් ද විය. පුරා කථාගත අද්භූත සත්ත්ව විශේෂ මෙන් සැරසුණු ගාන වෘන්දයය සහිත ශෝකාන්ත නාටක තුනක් ම නැරඹීමෙන් කම්පනයට පත් වූ ප්‍රේක්ෂකයෝ කෙටි සැටර් නාටක නරඹා ලිහිල් මනසින් හා සතුටු සිතින් තම නිවෙස් බලා ගිය හ.

සැටර් නාටක වර්ගයෙන් දනට සම්පූර්ණයෙන් ඉතිරි වී ඇත්තේ එකක් පමණකි. එය යුරිපිඩීස් ගේ ''කුක්ලොප්ස්'' යන සැටර් නාටකය යි. නාටකයේ මැදට වෘන්ද ගීත සතරක් යොදා එය කොටස් පහකට බෙදා ඇත. එම ලක්ෂණය ශෝකාත්ම නාටකයකට සමාන වේ. ඔඩිසි කාව්‍යයෙහි එන ඔඩිසියස්ට එකැස් යෝධයකු හමු වී මුහුණ පෑ ත්‍රාසජනක අත්දැකීම් ආශ්‍රයෙන් වස්තුව ගොඩනඟනු ලැබ ඇත. සොෆොක්ලීස් ගේ ඉක්නෙව්ටායි (අඩිපාරේ යන්නෝ) යන සැටර් නාටකයෙන් ඉතිරි වී ඇත්තේ කොටසක් පමණි. එයින් කියැවෙන්නේ හර්මීස් විසින් තමා ගෙන් සොරා ගන්නා ලද ගවයන් ආපසු ගැනීමට ඇපලෝ දෙවියන් දරූ ප්‍රයත්න පිළිබඳ කතාව ය. එය ද කුක්ලොප්ස් නාට්‍යයේ කතාවට සමාන ය.

සැටර් නාටකය පස් වැනි ශත වර්ෂයේ දී ඇතැන්ස්හි රංගනයෙහි නිත්‍ය ලක්ෂණයක් වුව ද එය පසු කාලයට එතරම් බලපෑවේ නැත. ග්‍රීක නාට්‍ය කලාව පිරිහීමත් සමඟ ම සැටර් නාටක ද අභාවයට ගියේ ය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ග්‍රීක නාට්‍යයක ප්‍රභේද කෙටියෙන් හඳුන්වන්න.
- ග්‍රීක ට්‍රැජඩියක හා කොමඩියක විශේෂ ලක්ෂණ මොනවා දැයි විස්තර කරන්න.

වැඩිදුර අධ්‍යයනය සඳහා :	සුචරිත ගම්ලත්	-	බටහිර නාට්‍ය හා රංග කලාව
	ඒ. වී. සුරවීර	-	ඇරිස්ටෝටල් හා භරත
	බන්දුල ජයවර්ධන	-	සම්භාව්‍ය ග්‍රීක නාට්‍ය කලාව
	වෝල්ටර් මාරසිංහ	-	ග්‍රීක නාට්‍ය සම්ප්‍රදාය

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.1 : නාට්‍ය කලාවේ ප්‍රභවය විමසයි. (ග්‍රීක නාට්‍ය)

ක්‍රියාකාරකම 4.1.3 : ග්‍රීක නාට්‍යකරුවන් හඳුනාගනිමු.

කාලච්ඡේද සංඛ්‍යාව : 04

ඉගැනුම් පල :
- ශ්‍රේෂ්ඨ නාට්‍යකරුවන් හඳුනාගනියි.
- ඒ ඒ නාට්‍යකරුවන් ගේ සුවිශේෂතා ලේඛනගත කරයි.
- ඔවුන් ගේ නාට්‍ය කෘති නම් කරයි.
- එම නාට්‍ය නිර්මාණවලට පාදක කථා වස්තු රැස් කරයි.
- නාට්‍යකරුවන් ගේ ඡායාරූප එකතු කරයි.

ගුණාත්මක යෙදැවුම් :
- ඊස්කිලස්, සොෆොක්ලීස්, යුරිපිඩීස්, ඇරිස්ටොෆානිස් ගේ ඡායාරූප
- සිංහලයට පරිවර්තනය කර ඇති නාට්‍ය පිටපත් (තීබ ත්‍රිකය, ප්‍රොමිතියස් බන්ධය, ප්ලවුටස්, හිපොලීටස්, බැකී)

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ගුණාත්මක යෙදවුම් වශයෙන් සපයාගත් ග්‍රීක නාට්‍යකරුවන් ගේ ඡායාරූප පෙන්වමින් ද, සිංහලයට නගා ඇති ග්‍රීක නාට්‍ය පිටපත් පෙන්වමින් ද සිසුන් පාඩම වෙත යොමු කරගැනීමට පිළිවන.
- අනතුරු ව පහත සඳහන් තොරතුරු අන්තර්ගත වන සේ සාකච්ඡාවක් ගොඩනගන්න.
- ග්‍රීක නාට්‍ය කලාවේ මුල් ම නළුවා වශයෙන් හඳුන්වනු ලබන තෙස්පීස් ගෙන් පසු ව ෆ්රෑනිබොස්, බෝයිරිලොස් හා ප්‍රටිනස් ආදි නාට්‍යකරුවෝ නාට්‍ය රචනයේ ද, රංගනයේ ද යෙදුණහ. අනතුරු ව, නාට්‍ය තරගවලින් නිරතුරු ව ම ජය ලැබූ විශිෂ්ට නාට්‍යකරුවන් හතර දෙනකු පිළිබඳ තොරතුරු හෙළිදරවු වේ.
- **ඊස්කිලස්**

  ක්‍රි. පූ. 525-456 කාලයේ දී ඇතැන්සයේ එලෙව්සිස් නම් ගම්මානයේ උපත ලැබුවේ යැයි සැලැකෙන ඊස්කිලස්, එතෙක් කාව්‍යමය ලක්ෂණ ඇතුළත් ව තිබූ ග්‍රීක නාට්‍යයට නිත්‍ය ශෝකජනක ආකෘතියක් එක් කළේ ය. ග්‍රීසියේ ක්‍රි. පූ. පස් වන සියවස තුළ පැවති උසස් ම සාහිත්‍ය කෘති ලෙස ඊස්කිලස්ගේ නිර්මාණ සැලකිය හැකි වේ. ඔහු විසින් ලියන ලද යි සැලැකෙන නාට්‍ය කෘති 79ක් අතුරින් දැනට ඉතිරි ව ඇත්තේ නාට්‍ය 07ක් පමණකි. එම නාට්‍ය කෘති අතුරෙන් සටුර නාට්‍ය 13ක් ලියූ බවට සාක්ෂ්‍ය ඇතත්, ඉතිරි ව ඇති කෘති හත ම ශෝකජනක නාට්‍ය ය. ඊස්කිලස් නාට්‍ය තරගවලින් ජයග්‍රහණ 13ක් ලබාගත්තේ ය.

  ඊස්කිලස් තමා විසූ ඇතැන්ස් නගරය ආක්‍රමණය කිරීමට පැමිණි පර්සියවරුන්ට එරෙහි ව, ග්‍රීකයන් විසින් කරන ලද යුද්ධයට සහභාගි වූ සෙබළෙකි.

  ඒ අනුව ඔහු විසින් ලියනු ලැබූ ප්‍රථම නාට්‍ය කෘතිය 'පර්සියන්වරු'ය. එය ග්‍රීක නාට්‍ය සාහිත්‍යයේ සමකාලීන සිද්ධියක් අන්තර්ගත කරගත් එක ම ශෝකාන්තය යි. අන් රචකයන් සිය නාට්‍ය කෘති සඳහා පාදක කරගනු ලැබූයේ දේව කථා නොහොත් වීර කථා ය. නැතහොත් ප්‍රචලිත පුරාණෝක්තියකි. 'පර්සියන්වරු' නාට්‍යයට පාදක වූ සිදුවීම සිදු වූයේ නාට්‍ය ලිවීමට වසරකට පෙර ය. එනම් ක්‍රි. පූ. 480 දී ය. තමන් ගේ අත්දැකීම් ආශ්‍රිත ව නාට්‍යය රචනා කිරීමේ වාසිය ඊස්කිලස් විසින් මැනවින් ලබාගත් ආකාරය රණබිම සම්බන්ධ ව කරන විස්තරයෙන් පැහැදිලි වේ. යුද්ධයේ අත්දැකීම් නිසා කලකිරීමට පත් වූ ඔහු යුද්ධයේ ආදීනව 'පර්සියන්වරු' නාට්‍යයෙන් ප්‍රකට කරයි.

ඊස්කිලස් ගේ නාට්‍ය කෘති මඟින් ඔහු දක්වන මානව දයාව පැහැදිලි වෙයි. ඔහු ගේ සෑම ශෝකාත්මයක් ම මිනිසා ගේ අභිමානය තුළින් විපතට පත්වන වීර චරිතයක් කේන්ද්‍ර කොට ගනී. දේශමාමකයකු වන ඊස්කිලස් යුද්ධයේ දී ජයග්‍රාහී පක්ෂයට උදම් වීමට අවස්ථාව නොදෙන අතර, පරාජය වූ සතුරා ගේ ගෞරවය ද නිරතුරු ව ම ආරක්ෂා කරයි.

The seven against Thebes (තීබසයට එරෙහි වූ සත් දෙනා - ක්‍රි. පූ. 467)

Suppliants (යදින්නෝ - ක්‍රි. පූ. 470 පමණ)

The prometheus Bound (ප්‍රොමිතියස් බන්ධනය - ක්‍රි. පූ. 460)

Agamemnon
Choephoroe
Eumenides

Oresteia Trilogy

ඊස්කිලස් ගේ කෘති ය. ග්‍රීක සාහිත්‍යයේ දැනට ඉතිරි වී ඇත්තේ ද ඔරෙස්ට්‍රියා නාට්‍ය ත්‍රිත්වය යි. ක්‍රි. පූ. 456 දී ලියන ලද මෙම කෘතිය ඊස්කිලස් ගේ අවසාන කෘතිය පමණක් නොව ශ්‍රේෂ්ඨතම කෘතිය ද වේ. 20 වන සියවස මුල් භාගයේ දී විසූ ඉංග්‍රීසි කවියෙකු වූ ස්වින්බර්න් විසින් ඔරෙස්ටියා හඳුන්වනු ලැබ ඇත්තේ "මිනිසා විසින් නිමවන ලද උත්තරීතර ආධ්‍යාත්මික කෘතිය" වශයෙනි. මෙම ශෝකජනකය සැබවින් ම සාර්වභෞමික ව මිනිසා ගේ සනාතන ඛේදවාචකය තේමා කොට ගත්තකි. ඒ සඳහා රචකයා විසින් පාදක කර ගැනුණේ ප්‍රදේශීය පුරාණෝක්තියකි.

ආගම හා සදාචාරාත්මක ප්‍රශ්න පදනම් කරගෙන, අපූර්වත්වයෙන් ශෝකජනක නිර්මාණය කිරීමේ ක්‍රමවේදය ඊස්කිලස් සතු විය. ප්‍රථම වරට ඔහු නාට්‍යය සඳහා දෙවන නළුවකු හඳුන්වා දුන්නේ ය. ගායන වෘන්දයේ සහභාගිත්වය අඩු කර, සංවාද බහුල වශයෙන් යොදා ගත්හ. ඊස්කිලස් ක්‍රි. පූ. 456 දී මිය යන විට වයස අවුරුදු 69කි.

- **සොෆොක්ලීස්**

ක්‍රි. පූ. 497-406 දී, කොලෝනස් නම් පෙදෙසෙහි උපත ලද උසස් පරපුරකින් පැවත ආවකු ලෙස සැලකේ.

යුද්ධයකින් ලබන ලද ජය සැමරීමේ උත්සවයක දී සංගීත කණ්ඩායමක් මෙහෙයවීමට තෝරා ගන්නා විට සොෆොක්ලීස් ගේ වයස අවුරුදු 15කි. ඇතැන්සයේ උදාර පුරවැසියකු ව විසූ ඔහු මහලු වයසේ දී පවා සියරට උදෙසා වූ රාජකාරි කටයුතුවල නියුක්ත වූවෙකි. ඔහු චමත්කාරජනක කවියකු ලෙස හැඳින්වේ. ශෝකාන්ත නාට්‍ය ඉහළ තලයට නැංවූ රචකයා ය. නාට්‍ය 125ක් පමණ රචනා කරන ලද මොහු නාට්‍ය තරගවලින් 24 වතාවක් පළමු ස්ථානය දිනාගත් බව පැවසේ. ක්‍රි. පූ. 468 දී ඔහු ගේ මුල් ම නාට්‍ය නිර්මාණයට ප්‍රථම ස්ථානය හිමි විය. ඔහු ලියූ නාට්‍ය අතරින් නාට්‍ය 30ක් පමණ සටුර නාට්‍ය විය. ඊඩිපස් රෙක්ස්ට අමතර ව තවත් ශෝකාත්ම නාට්‍ය හතක් හා අසම්පූර්ණ එක් සැටර් නාට්‍යයක් ද දැනට ඉතිරි ව ඇත.

ඊඩිපස් රජ (Oedipus Tyrannus)
කොලෝනස් ඊඩිපස් (Oedipus at Colonus)
ඇන්ටිගනී (Antigone)
ඇජැක්ස් (Ajax)
විමන් ඔෆ් ට්‍රකිස් (Frachiniae)
ඉලෙක්ට්‍රා (Electra)
ෆිලොක්ටිටිස් (Phioctetes)
යන ශෝකාත්ම නාට්‍ය හතක් හා ඉක්නෙව්ටායි (Icneutai) නම් වූ සැටර් නාට්‍යයක් ද රචනා කළ සොෆොක්ලීස්, ඇතැම් විට රංගනයෙහි ද නිරත විය.

ග්‍රීක රංග පීඨයට තුන් වන නළුවකු හඳුන්වා දීම, සංවාද බහුල ව යොදා ගැනීම, ගායන වෘන්දයේ ප්‍රධානත්වය අඩු කිරීම, ප්‍රථම වරට පින්තාරු කරන ලද දර්ශන නාට්‍යයට සම්බන්ධ කිරීම, එක් තේමාවක් යටතේ තුන් ඈඳුතු (ත්‍රිකය) නාට්‍ය නිර්මාණය, නාට්‍ය උත්ප්‍රාසය තීක්ෂණ ව යොදා ගැනීම ආදිය මඟින් ඔහු ගේ නාට්‍ය විශේෂත්වයක් ගනී.

සොෆොක්ලීස් තුළ අනාවැකි පිළිබඳ දැඩි විශ්වාසයක් පැවතිණි. ඔහු ගේ නාට්‍ය කිහිපයක ම අනාවැකි, වස්තු කර ගැනීම දැකිය හැකි ය. ඊඩිපස්, ඉලෙක්ට්‍රා, කොලෝනස්හි ඊඩිපස් යන නාට්‍යයන්හි අනාවැකි පළ කිරීම හා අවසානයේ අනාවැකි ඉටු වීමත් දැකිය හැකි ය.

ඔහුගේ නාට්‍යවල කිසි විටෙක හෝ මිනිසා මනුෂ්‍යත්වය ඉක්මවූවකු ලෙස නොදැක්වෙයි.

'කාලය' වැදගත් කොට දැක්වීම ද විශේෂ ලක්ෂණයකි.

නාට්‍යයේ කලාත්මක භාවයට හානියක් නොකොට ආගමික අදහස් ගැබ් කිරීම ද විශේෂ ලක්ෂණයකි. ඔහු ගේ නාට්‍යවල දෙවිවරු හා දේව වැකි නිතර හමු වේ. සෙව්ස්, ඇතීනා, ඇපොල්ලෝ, අර්තේමිස්, හර්මිස්, දියෝනීසස් යන දෙවිවරු ඔහුගේ නාට්‍යයන් හි අන්තර්ගත ය. දෛවයට නැතහොත් ඉරණමට ප්‍රමුඛත්වයක් හිමි වේ.

සොෆොක්ලීස් ගේ කිසිම නාට්‍යයක් අතුරු කතා මාලාවකින් සමන්විත නො වේ. සෑම සිද්ධියක් ම ඊට අනුපූර්ව සිදුවීමක් හා සම්බන්ධ ය. අදාළ නොවන කිසිවක් ඔහුගේ නාට්‍යවල නොමැත.

පශ්චාද් දෘෂ්ටි කථන රීතිය ද ඔහු ගේ නාට්‍යමය උපක්‍රමයකි. අතීත සිදුවීම් ගෙන හැර පෑම පිණිස ගායන වෘන්දය හෝ නව චරිතයක් හෝ වේදිකාවට ප්‍රවිෂ්ට කිරීමෙන් අවශ්‍යතාව සපුරා ගත්තේ ය.

සොෆොක්ලීස් ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වූයේ චරිතවල ශ්‍රේෂ්ඨත්වය හුවා දැක්වීමට ය. චරිත නිවැරදි නොවුණ පුද්ගලයන් වුව ද පරමාදර්ශයන්ට වඩාත් සමීප අය ලෙස දැක්වූයේ ය.

අනූ වසරක් ආයු වැළඳූ ඔහු මිය ගියේ ක්‍රි. පූ. 468 දී ය.

- **යුරිපිඩීස්**

ග්‍රීක ශෝකාත්ම නාට්‍යකරුවන් අතරින් නූතනවාදී රටාවක් සහිත නාට්‍යකරු වන්නේ යුරිපිඩීස් ය. ක්‍රි. පූ. 484 දී උපත ලත් ඔහු නාට්‍ය 92ක් පමණ ලියූ බව සැලකෙතත් අද අපට ඉතිරි ව ඇත්තේ නාට්‍ය 18ක් පමණකි.

''නාට්‍යකරුවා සමාජයෙහි ගුරුවරයා ය'' යන ග්‍රීක සංකල්පය දැඩි ලෙස පිළිගත් ඔහු විප්ලවකාරී චින්තකයකු ලෙස සැලකේ. ග්‍රීසියේ විසූ විතණ්ඩවාදීන් (Sophists) ගේ දාර්ශනික මතවාදවලට නැඹුරු වූ ඔහු තම කෘතිවලින් එකල සමාජයේ පැවති දුර්වලතා හා ඇතැම් විශ්වාස විවේචනය කළේ ය. ඔහු මිනිසා කේන්ද්‍ර කොටගත් ආකල්පයකින් යුතු ව ශෝකාත්ම නාට්‍ය රචනා කළේ ය. යුරිපිඩීස්, දෙවිවරුන් පිළිබඳ ව කථා කළේ මිනිසා කෙරෙහි කිසි දු අනුකම්පාවක් නැති අන්ධ, අසාධාරණ බලවේගයක් ලෙසින් ය.

ඔහුගේ නාට්‍යවල ශෝකාත්ම ආකෘතිය අන් නාට්‍ය රචකයන් ගේ ආකෘතියෙන් වෙනස් වන අතර අන්තර්ගත වූ පුරාණෝක්තිය ද සිය දර්ශනය අනුව අර්ථකථනය කරමින් නව නැම්මක් ඇති කළේ ය. ඇතැම් විචාරකයන් යුරිපිඩීස් හඳුන්වන්නේ ''යථාර්ථයේ පියා'' යන විරුදාවලියෙනි.

ඔහු ඉදිරිපත් කළ නාට්‍යය මිනිසා ගේ චෛතසිකය ගැඹුරින් විග්‍රහ කරමින් මිනිසා ගේ දුක් දොම්නස් මෙන් ම වේදනාව ද සතුට ද, සොම්නස ද තේරුම් ගැනීමට දරන ලද ප්‍රයත්නයකි. ඒ නිසා එම නාට්‍ය මිනිස් වර්ගයා ගේ ශෝකාත්ම ලෙස සැලකිය හැකි ය.

ඔහුගේ දැක්ම එළිදරවු කිරීමට යොදා ගත් උපක්‍රමයක් නම් ග්‍රීක පුරාණෝක්තිවල එන කාන්තා චරිත දෙස සිය ප්‍රගතිශීලී මනස යොමු කර ඔවුන් ගේ හදවත් මෙහෙයවූ අභිප්‍රාය, ආශාවන් යථාර්ථවාදී ලෙස විශ්ලේෂණය කිරීම ය. මෙය මැනවින් පෙනී යන්නේ යුරිපිඩීස් ගේ අග්‍රගණ්‍ය කෘතියක් වශයෙන් සැලකෙන ''මීඩියා'' නාට්‍යයෙනි.

''මීඩියා හි'' කථා වස්තුව විජය කුවේණි පුවතට තරමක සමානකමක් දක්වයි. ''මීඩියා'' නාට්‍යය ආරම්භ වන්නේ ඇගේ ස්වාමියා ඇය අතරමං කළ බව දැනගත් පසු ව ඇය නින්දා අපහාස හා විවිධ මානසික පීඩනයන්ට ගොදුරු වීම නිසා අසනීප වීමෙනි. ඇය දැඩි ලෙස මානසික පීඩනයට ලක් ව පළි ගැනීම සඳහා සැලසුම් සකස් කරයි. ආගන්තුක ස්ත්‍රියක දයාවෙන් තොර සමාජයක් විසින් පෙළන ලදුව ම්ලේච්ඡ ලෙස හැසිරීම සානුකම්පිත ව අවබෝධ කර ගැනීමට යුරිපිඩීස් සිය නාට්‍යයෙන් ඉඟි සපයයි. ''හිපොලීටස්'' නාට්‍යය ද මානසික වශයෙන් පීඩාවට පත් ස්ත්‍රී චරිතයක් කේන්ද්‍ර කොට ගෙන ලියැවුණු ශෝකාන්තයකි.

ග්‍රීක සමාජයේ පැවති දේවකථා සහ පුරාණෝක්ති සිය ඛේදාන්ත නාට්‍යයක් සඳහා වස්තු විෂයය කර ගැනීමට එවක නාට්‍ය රචකයෝ උත්සුක වූහ. එමඟින් නාට්‍යයේ ආගමික නැඹුරුව රැකගන්නා අතර ම මනුෂ්‍යත්වය පිළිබඳ ගැඹුරු දර්ශනයක් කරා යොමු වීමටත් අවස්ථාව ලැබිණි.

යුරිපිඩීස් ගේ අනුකම්පාව, අවධානය බොහෝ විට යොමු වූයේ ගොවියන්, දාසයන් හා සාමාන්‍ය පුද්ගලයන් වෙත ය. ඔහු ග්‍රීක නාට්‍යයෙහි යථාර්ථවාදී කලාවේ ආරම්භකයා ලෙසත්, වස්තු විෂයයෙහි පැහැදිලි වෙනස්කම් දක්වූ නාට්‍යකරුවා ලෙසත් සැලකිය හැකි ය.

ඔහු ගේ රචනා අතර පහත සඳහන් කෘති විශේෂයෙන් සඳහන් කළ හැකි ය.

1. මීඩියා (Media)
2. ඇල්සෙස්ටික් (Alcestis)
3. හිපොලීටස් (Hippolyts)
4. ද ට්‍රෝජන් විමෙන් (The Trojan women)
5. ද බැකී (The Bacchae)

යුරිපිඩීස් ඔහු ජීවත් වූ කාලයට වඩා බොහෝ ඈත දුටුවෙකි. ක්‍රි.පූ. 431 දී ඇතැන්සය හා ස්පාර්ටාව අතර ඇති වූ පෙලොපොන්නීසිය සංග්‍රාමය විසි වර්ෂයක් පුරා (431-411) පැවතෙමින් අවසානයේ ඇතැන්සය පරාජයට පත් විය. මේ නිසා රට තුළ දේශපාලන හා සමාජීය පරිවර්තන රාශියක් ඇති විය. පැරණි දේ ඉවත දමමින්, අලුතින් සිතා බලන්නට මිනිස්සු හුරු වූහ. මෙම නව ව්‍යාපාරයේ පුරෝගාමියා වූයේ යුරිපිඩීස් ය.

එවක සමාජ චාරිත්‍ර අනුව වනිතාවන්, විදේශිකයන් හා අවජාතක දරුවෝ විවිධ ගැහැටවලට ලක් වූහ. ඒ බැව් ''මීඩියා'' හා ''හිපොලීටස්'' නාට්‍යවලින් කදිමට ගෙන හැර පෑවේ ය.

යුරිපීඩීස් ගේ නාට්‍යවල ප්‍රස්තාවනාව (Prologue) ඇතුළත් විය. ගායක පිරිස රංග භූමියට මුලින් ම පිවිසෙන අවස්ථාව දක්වා වන කොටස ප්‍රස්තාවනාව ය.

ඔහු ගායන වෘන්දය උපයෝගී කොට ගන්නේ ඔහුට ම ආවේණික ආකාරයකට ය. ''හිපොලීටස්'' නාට්‍යයේ ගායක පිරිස ට්‍රොයිසියානු කාන්තාවන් ගෙන් සැදුම් ලද්දේ ය. ''මීඩියා'' නාට්‍යයේ ගාන වෘන්දය කොරින්ත් දේශයේ කාන්තාවන්ගෙන් සමන්විත වූහ. ඔවුහු බෙහෙවින් ම සාමාන්‍ය මනුෂ්‍යත්වය පිළිබිඹු කරන්නෝ වූහ. භාෂාව ද සරල විය. සංවාද පද්‍යයෙන් ලියැවුණ ද බොහෝ විට ගද්‍ය ස්වරූපය ගත්තේ ය.

යුරිපිඩීස් තම සමාජ විවේචන සිය කෘතිවලට ඇතුළත් කළේ ප්‍රේක්ෂකයාට හුදු විනෝදාස්වාදයක් ලබාදීමට නොව, ඔහු විසින් ඉතා සැලකිල්ලෙන් සැලසුම් කරන ලද සමාජ සංශෝධන වැඩ පිළිවෙළක අංගයක් ලෙසට ය. ඔහු ග්‍රීක නාටකයට හඳුන්වා දුන් වැදගත් නවීකරණය වූයේ දේවත්වය හා වීරත්වය ඇසුරු කළ ශෝකාන්තයට මානුෂික ස්වරූපයක් දීම ය.

යුරිපිඩීස් ක්‍රි.පූ. 484 දී උපත ලැබ ක්‍රි. පූ. 406 දී මිය ගියේ වයස අවුරුදු 79ක් ආයු වළඳා ය.

- **ඇරිස්ටොෆනීස්**

ක්‍රි. පූ. 6 වැනි සියවස අග භාගයේ පටන් ම කොමඩි රචනයත්, නිෂ්පාදනයත් සිදු වූ බවට සාධක ඇත. ඇරිස්ටොෆනීස්ට පෙර විසූ ක්‍රටිනොස් හා එව්පොලිස් නම් කොමෝඩි රචකයන් දෙදෙනෙකු ගේ කෘතිවලින් ඛණ්ඩ කිහිපයක් පමණක් ලැබී ඇත. අද අපට ඉතිරි වී ඇති සම්පූර්ණ කොමෝඩි එකොළොස ම ඇරිස්ටොෆනීස් ගේ ය. එසේ ම 5 වන හා 4 වන සියවස්හි ඇතැන්සයේ විසූ කොමඩි රචකයන් අතුරින් ශ්‍රේෂ්ඨතමයා වනුයේ ද මොහු ය.

කොමොඩියෝ පරමාර්ථය විනෝදාස්වාදය ම බැවන් දුඃඛිත වාතාවරණයක් මධ්‍යයේ ආරම්භ වන නාටකය අවසන් වනුයේ හාස්‍යජනක ලෙස ප්‍රීතිමත් වූ විසඳීමකිනි. කොමොඩි මඟින් සමාජයේ දුර්වල තැන් පමණක් නො ව දේශපාලන නායකයන් වැනි සමකාලීන ප්‍රසිද්ධ පුද්ගලයෝ ද නිර්දය ලෙස විවේචනයට ලක් වූ හ. ඇරිස්ටොෆනීස් නාට්‍ය කිහිපයක ම එවකට ඇතන්සයේ රාජ්‍ය නායකයා ව සිටි ක්ලෙයෝන් දරුණු ලෙස අපහාසයට ලක් කළේ ය.

කොමෝඩියේ චරිත ද කතා වස්තුවට අනුකූල ලෙස ම සාමාන්‍ය පුද්ගලයෝ වූහ. එබැවින් මෙම නාටක සාමාන්‍ය ජීවිතයට ඉතා සමීප විය. එනිසා ඕනෑ ම දේශයක, කාලයක ජීවත් වන්නවුනට රස විඳීමේ හැකියාවක් මෙම නාට්‍යවල ඇත.

ඇරිස්ටොෆනිස් ගේ කෘතීන්ට බහුල වශයෙන් කාලීන මාතෘකා පාදක කරගෙන ඇත. එවක ඇතැන්සයේ පැවති දේශපාලන හා සමාජීය තත්ත්වයන් පිළිබඳ ව මෙන් ම ප්‍රසිද්ධ පුද්ගලයන් පිළිබඳ ව ද මෙමඟින් හෙළි දක්වේ. ඇසිටොෆනීස් ගේ ඇතැම් කෘති රස විඳීම සඳහා ඊස්කිලස් හා යුරිපිඩීස්ගේ කෘති පිළිබඳ ව ද, එකල සාහිත්‍ය විචාරය ගැන ද මනා අවබෝධයකින් සිටිය යුතු විය. එවන් අත්දැකීමක් නැති ව වුව ද, ඔහුගේ කෘති ඇසුරු කිරිමෙන් මනා රසවින්දනයක් ලබා ගන්නට හැකි වීම සුවිශේෂ ය.

එවක දේශපාලනය හා කලාව සම්බන්ධ කරුණු, යුද්ධය හා සාමය පිළිබඳ ප්‍රශ්න සුඛාන්ත නාට්‍ය රචකයන්ට අරුචි වූ පුද්ගලයන් ගේ චර්යාවන් හා භාවිතයන් වස්තු විෂයය කරගත් බව පෙනේ. ඉඳහිට ඇනුම්පද කීමට පුරාකථාගත වස්තු පාදක කරගත් නමුත් සාමාන්‍ය වශයෙන් රචකයාගේ ම නිබන්ධ ඉදිරිපත් විය.

ක්‍රි. පූ. 445-380 තෙක් ජීවත් වූ ඇරිස්ටොෆනීස් විසින් නාට්‍ය කෘති 44 ක් පමණ රචනා කළ මුත් දැනට ඉතිරි ව ඇත්තේ නාට්‍ය එකොළොසක් පමණකි.

1. අඛර්ණියයෝ (The Acharnians) ක්‍රි. පූ. 425
2. සිටුවරු (The knights) ක්‍රි. පූ. 424
3. වලාකුළු (The clouds) ක්‍රි. පූ. 423
4. දෙබරු (The wasps) ක්‍රි. පූ. 422
5. සාමය (Peace) ක්‍රි. පූ. 421
6. කුරුල්ලෝ (The birds) ක්‍රි. පූ. 414
7. ලයිසිස්ට්‍රාටා (Lysistrata) ක්‍රි. පූ. 411
8. තෙස්මොෆෝරියානු පූජිකාවෝ (Thesmophoriazusae) ක්‍රි. පූ. 411
9. මණ්ඩූකයෝ ක්‍රි. පූ. 405
10. ජන සබයට ගිය ස්ත්‍රීහු (The Ecclesiazusae) ක්‍රි. පූ. 392
11. ප්ලූටස් (Plutus) ක්‍රි. පූ. 388

ඇරිස්ටොෆනීස් නාට්‍ය තරග සඳහා ඉදිරිපත් වූයේ ක්‍රි. පූ. 427 වර්ෂයේ පටන් ය. ඔහු තමා ගේ නාට්‍ය ස්වල්පයක රඟපාන්නට ඇතැ යි සැලකේ. එහෙත් ඔහු තම නාට්‍ය නිෂ්පාදනය කිරීම සඳහා වෙනත් ප්‍රයුක්ත්‍රජකයන්ට (නිෂ්පාදකයන්ට) භාර දිනි.

ඇරිස්ටොෆනීස් නාට්‍ය තරගවල දී එතරම් සාර්ථක ප්‍රතිඵල ලබා ගත් බවක් නොපෙනේ. එහුට ලබාගත හැකි වූයේ පළමු ත්‍යාග හතරක් ද, දෙවැනි ත්‍යාග තුනක් හා තුන්වැනි ත්‍යාග එකක් පමණකි. එහුගේ ශ්‍රේෂ්ඨත ම කෘතිය සේ සැලැකෙන කුරුල්ලෝ නාටකයට හිමි වූයේ දෙවැනි ස්ථානයකි.

ඇරිස්ටොෆනීස් ගේ නාට්‍යවලින් හාස්‍යය, පුද්ගල නිග්‍රහය, මනඃකෘෂ්ටිය, සුන්දරතර උදාන කාව්‍ය, සාහිත්‍යමය හා සංගීතමය අන්‍යාලාප හා ඇනුම්පද, සමකාලීන කරුණු ගැන බැරෑරුම් නිරීක්ෂණ හා අර්ථකථන හඳුනාගත හැකි ය.

ක්‍රි. පූ. 423 දී දියෝනීසස් මහා පූජෝත්සවයේ දී රඟ දක්වන ලදුව, ප්‍රථම ස්ථානය හිමි වූයේ ''වලාකුළු'' නාටකයට ය.

ඇරිස්ටොෆනීස්ගේ නාටකයට ආවේණික අංග මෙලෙස දැක්විය හැකි ය.

ඇරිස්ටොනීස්ගේ නාට්‍යයන් හි ගායන වෘන්දය 24ක් වු අතර ඔවුහු කණ්ඩායම් දෙකකට බෙදී රංගනයට සහභාගි වූහ.

නාට්‍යවල දෙබස් හාස්‍යය හා උපහාස්‍යය ප්‍රබලව ඉස්මතු කරයි.

''වලාකුළු'' නාට්‍යයේ දී මෙකී භාවිතයෙහි අනුපිළිවෙළ මඳක් වෙනස් කර ඇත.

''වලාකුළු'' හි ගාන වෘන්දය වලාකුළු ය. වලාකුළුවලින් මෙහි දී සංකේතවත් කෙරෙන්නේ මනඃකෘෂ්ටිය යි. සිහින ලෝකය යි. වලාකුළුවලින් නව අධ්‍යාපන ක්‍රමය නිරූපණය වෙයි. මෙහි කාලය හා ස්ථානය නිරූපණය කෙරෙන්නේ නාට්‍යමය අවශ්‍යතාව විසිනි. ඇතැම් විට සංවාදයක් හෝ දෙකක් හෝ අතරතුර පැය ගණන් හා දින ගණන් ගත වී යයි. ස්ථානය රිසි සේ මාරු කෙරේ. එලෙස රංගභූමි මායාව නිතර නිතර බිඳිනු ලබයි. පාත්‍රයෝ ප්‍රේක්ෂකයන් විවේචනය කරති.

ඇරිස්ටොෆනීස් භාෂාව හැසිරවීමේ දී විශාල නිදහසකින් යුතු ව ක්‍රියා කර ඇත. දෙබස් සඳහා ව්‍යවහාර භාෂාව උපයෝගි කරගත් ඔහු දෙපැත්ත කැපෙන වචන යෙදුයේ ද වඩා හාස්‍යය මතු කරනු පිණිස ය.

ඇරිස්ටොෆනීස් ගේ ජීවිතයේ අවසාන භාගයේ දී කොමෝඩිය වෙනත් ස්වරූපයක් ගනු පෙනිණ. දැවෙන ප්‍රශ්න හා ප්‍රසිද්ධ පුද්ගලයන් විවේචනය කිරීම අත්හැර, කිසිවකුගේ සිත නොරිදෙන පරිදි නාට්‍ය රචනා කළේ ය. මේ සඳහා ඔහු දේව කථා හා මිථ්‍යා කථාවලින් වස්තු සපයා ගත්තේ ය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ග්‍රීක ශෝකාත්ම නාට්‍ය රචකයන් ගේ කෘතිවල විශේෂතා සාකච්ඡා කරන්න.
- සුඛාත්ම නාට්‍ය රචක ඇරිස්ටොෆනීස් ගේ නාට්‍ය රචනා අගයන්න.

වැඩිදුර අධ්‍යයනය සඳහා :

වෝල්ටර් මාරසිංහ	-	ග්‍රීක නාට්‍ය සම්ප්‍රදාය
සීබල් ජයකොඩි	-	හිපොලීටස්
සීබල් ජයකොඩි	-	මීඩියා
ආරියවංශ රණවීර	-	බැකී
සුචරිත ගම්ලත්	-	බටහිර නාට්‍ය හා රංග කලාව
කමණී ජයසේකර	-	ග්‍රීක නාට්‍යකරු ඇරිස්ටොෆනීස්

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.2 : ග්‍රීක නාට්‍යයේ රංග ශෛලිය පිළිබඳ ව විමසයි.

ක්‍රියාකාරකම 4.2.1 : ග්‍රීක ට්‍රැජඩි ශෛලිය හඳුනාගනිමු.

ඉගැනුම් පල :
- ග්‍රීක රංග භූමිය පිළිබඳ කරුණු අධ්‍යයනය කරයි.
- ට්‍රැජඩි නාට්‍යයෙහි රංග ශෛලිය පිළිබඳ ව ගවේෂණය කරයි.
- විවිධ ග්‍රීක නාට්‍ය ප්‍රභේද පිළිබඳ ව ගවේෂණය කරයි.
- නළුවන් ගේ හා ගායන වෘන්දයේ කාර්යය පිළිබඳ ව විමසයි.
- නළුවන් ගේ වේෂභූෂණ, නාට්‍යෝපකරණ හා වෙස් මුහුණු පිළිබඳ තොරතුරු රැස් කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ගුණාත්මක යෙදවුම් :
- ග්‍රීක රංග භූමියක රූප
- වෙස් මුහුණු (ට්‍රැජඩි, කොමඩි, සටුර) රූප
- නළු රූප
- ඊඩිපස් රජ නාට්‍ය පෙළ

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය හා අධ්‍යයනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් : (අංක 4 හා 5 රූප සටහන් බලන්න)

- ග්‍රීක රංග භූමියේ රූප සටහන් පෙන්වමින්, ඒ ඒ කොටස් නම් කරමින්, භාවිතය පිළිබඳ තොරතුරු සඳහන් කරමින් පාඩම වෙත සිසුන් යොමු කර ගන්න.
- ග්‍රීක රංග භූමියේ දළ රූප සටහන ඇඳ ගැනීමට අවකාශ ලබා දෙමින් පහත දැක්වෙන තොරතුරු ද අන්තර්ගත වන සේ සාකච්ඡාවක් ගොඩනඟන්න.
- ග්‍රීසිය වනාහි වර්ෂාපතනය අඩු, වියළි දේශගුණයකින් යුතු, පාෂාණමය කඳු හෙල්වලින් යුතු භූමි භාගයකි. එවන් භූමියක දියෝනීසස් දෙවොල පිහිටියේ ය.

  දේව පුද පූජාවක් ලෙසින් ඇරඹි නාට්‍යය දියෝනීසස් දේවාලය අබියස රඟදැක් විය. අඩි 200ක පමණ කඳු බෑවුමක පිහිටි රංග භූමිය විශාල ප්‍රේක්ෂක පිරිසකට නාට්‍යය නැරඹිය හැකි පරිදි සකස් ව පැවතිණි. වරෙකට ප්‍රේක්ෂකයන් 14000කට අධික වූ ප්‍රේක්ෂක පිරිසකට නාට්‍යය නැරඹීමේ අවස්ථාව හිමි විය. වලයාකාර වූ රංග භූමිය පුරා කුඩා ශබ්දයක් වුව ඉතා හොඳින් ශ්‍රවණය කළ හැකි විය. කඳු බෑවුමේ පඩි පෙළ ආකාරයෙන් ආසන සකස් කර ඇත. මුල් කාලයේ දී මෙම ආසන ලීයෙන් තැනුණු අතර, පසු කලෙක ශෛලමය ආසන වශයෙන් සකස් විය.

  ආසන මේකිස් (Mekis) නම් වන අතර, ආසන වෙත ප්‍රේක්ෂකයන්ට පිවිසීම සඳහා සැකසූ මාර්ග ක්ලිමේකිස් නම් විය. මේ මාවත නිසා ප්‍රේක්ෂකයන්ට කිසිදු අපහසුවකින් තොර ව ආසන කරා යාමට ද, පිට ව යාමට ද අවකාශ සැලසිණි. රංග භූමියට ආසන්න ප්‍රධාන ආසන පෙළ පමණක් රාජ්‍යයේ ප්‍රධාන අමුත්තන්ට හා විනිශ්චය මණ්ඩලයට වෙන් කැරුණු අතර, ඉදිරි පෙළ මැද ආසනය ප්‍රධාන පූජකයා උදෙසා වෙන් කෙරිණි. ප්‍රභූ ආසනවලට ඉහළින් හිස් ආවරණ තුබූ බවට ලැබී ඇති සාක්ෂ්‍ය අනුව පැහැදිලි වෙයි.

  අනෙකුත් සියලු ම ආසන කිසි දු බෙදීමකින් තොර ව ප්‍රේක්ෂකයන්ට භාවිත කළ හැකි විය.

  (රංග භූමියෙහි රූප සිසුන්ට පෙන්වීම සුදුසු ය.)

  නාට්‍ය තරග සඳහා වෙන් කැරුණු සියලු රාජ්‍ය ආයතන නිවාඩු දින වශයෙන් සැලැකුණු අතර, නගරවාසී සැම සියලු දෙනා ම රංගස්ථානය වෙත පැමිණියහ. මරණීය දණ්ඩනයට නියම ව සිටි සිරකරුවන් පවා යදම් සහිත ව ම නාට්‍යය නැරඹීම සඳහා සහභාගි වූ බව පැවසේ. ප්‍රේක්ෂකයන්

ඔබොල් දෙකක් මිල වූ ප්‍රවේශ පත්‍රයක් මිල දී ගත යුතු විය. මුදල් සපයාගත නොහැකි ප්‍රේක්ෂකයන්ට රජයේ වියදමින් නාට්‍යය නැරඹීමට අවකාශ සැලසිණි.

රංගභූමියේ පසු කෙළවරේ සිට මුල් ආසන පේළිය තෙක් දුර අඩි 60-70ක් පමණ විය. ප්‍රේක්ෂාලයයේ ඉහළ ම අසුන් පෙළ පිහිටියේ බිම සිට අඩි 300ක් උසිනි. ප්‍රේක්ෂාලයයට ප්‍රතිමුඛ ව වෘත්තාකාර ව රංගභූමිය පිහිටියේ ය. එය ඕර්කිස්ට්‍රාව නම් විය. ඕර්කිස්ට්‍රාව අඩි 90ක විෂ්කම්භයකින් යුතු විය. එහි මැද දියොනීසස් පූජාසනය ස්ථාපිත ව තිබිණි. ගාන වෘන්දය බොහෝ විට රැඳී සිටියේ ඕර්කිස්ට්‍රාවේ ය. මෙම රංගභූමියට යාබද ව පිටුපසින් පිහිටියේ වේදිකාව සහිත ස්කිනි නමින් හැඳින් වූ නේපථ්‍යගෘහය යි. නළුවන් වේෂභූෂණ පැලඳියේ ද, නාට්‍යෝපකරණ ගබඩා කර තැබුණේ ද, යන්ත්‍රෝපකරණ ක්‍රියාත්මක කරනු ලැබුයේ ද ස්කීනිය තුළ ය. විචිත්‍ර වේදිකා සැරසිලි භාවිත නොකළ බැවින් නාට්‍යයක පසුතලය වශයෙන් සැලැකුණේ ද මෙම නේපථ්‍යගෘහයේ බිත්තිය යි.

ස්කීනියේ දෙකෙළවරත්, ප්‍රේක්ෂාලයයේ දෙකෙළවරත් අතර දෙපස වූ අවකාශය පැරඩෝස් (Parodos) නම් විය. මේ මඟින් ගායක පිරිස රංග භූමියට පිවිසියහ. නගරයේ සිට හෝ විදේශයක සිට හෝ පැමිණීම සඳහා ද නළුවෝ පැරඩෝසය උපයෝගී කර ගත්හ.

ස්කීනි ගොඩනැඟිල්ලෙහි දෙපස, පැරිස්කීනියා නම් වූ කාමර දෙකක් වීය. ස්කීනියේ සිට වේදිකාවට ඇතුළු වීම සඳහා ද්වාර තුනක් විය. මෙයින් මධ්‍යයේ වූ ප්‍රධාන දොරටුව අඩි 12ක් පමණ පුළුල් වූ විවර කළ හැකි දොරපියන් සහිත විය. ට්‍රැජඩි නාට්‍යයේ රජමැඳුර සඳහා භාවිත කරන ලද්දේ මෙම මධ්‍ය දොර ය.

නේපථ්‍යගෘහයේ සමතල වහල ද රඟපෑම සඳහා යොදා ගන්නා ලද්දේ ය. (නළුවන්ගේ පින්තූර ඉදිරිපත් කිරීමෙන් කරුණු සනාථ කළ හැකි ය.)

විශාල ප්‍රේක්ෂක පිරිසකට ඉතා හොඳින් නළුවන් දර්ශනය වීම සඳහා සුදුසු වන සේ නළුවන් ජීව ප්‍රමාණයට වඩා විශාල කළ යුතු විය. මේ අනුව ඔවුහු කොතුර්නොස් නමින් හැඳින්වූ ලීයෙන් තනන ලද අඩි උස පාවහන් පැලඳියහ. අර්ධ වශයෙන් ආවරණය කරන ලද මෙම පාවහන්වලින් සමහරක් ඉදිරිපසින් වක් වී තිබිණි. සමාජ තරාතිරමේ ස්වභාවයට අනුව මෙම පාවහන්හි උස තීරණය විය. අඩියක් පමණ උසට ඔන්කොස් නමින් හැඳින්වූ මුහුළක් ද පැලඳියේ ය. නළුවන් ගේ වේෂය වූයේ අත්‍යලංකාර ලෙස සැකසූ දීප්තිමත් වර්ණයන් ගෙන් යුත් දෙපා වැසෙන ආකාරයේ ලෝගු වැනි කඩා හැලෙන සුළු වස්ත්‍රයකි. ඌර්ධ්ව කාය සැරසුණේ සාටකයකිනි. පිරිමි චරිත එය උරමත රඳවාගත් අතර, ස්ත්‍රී චරිත එයින් හිස වසා සිටියහ.

සාත්ත්වික අභිනයෙන් තොර වූ නළුවා ආංගික අභිනයට ප්‍රමුඛස්ථානයක් දුන්නේ ය. මුහුණට පැලඳි වෙස් මුහුණ, ප්‍රකෘති මුහුණට වඩා තරමක් විශාල වූ අතර, කටහඬ ඇතට ඇසෙන ආකාරයට මුඛය විශාල වත්, විශේෂිත ආකාරයකටත් සකස් ව පැවතියේ ය. (වෙස් මුහුණු සහිත රූප පෙන්වීම යෝග්‍ය ය.)

නාට්‍යය ප්‍රදර්ශනය කළේ දිවා කාලයෙහි බැවින් රංග ආලෝක භාවිතයෙහි අවශ්‍යතාවක් නොවිණි.

ග්‍රීක නාට්‍ය සඳහා ආසන කිහිපයක්, සිංහාසනයක්, කව්ච්චියක්, එක්කුක්ලීමා නම් රෝද සවි කළ මැස්ස මෙන් ම, දොඹකරයක් ද නාට්‍යෝපකරණ වශයෙන් භාවිත විය. දොඹකරයෙහි කඹ හා පුලි යොදා සැකසූ කොකුවකට නළුවා හෝ වාහනය හෝ දවටා අභිමත ස්ථානයකට එසැවීම හෝ පහත් කිරීම හෝ ඉහළින් පියාඹා යාම හෝ සිදු කළ හැකි විය. සිය දරුවන් ගේ මළ මිනී කැටි ව මීඩියා සර්ප විමානයේ නැඟී ගියේ මේ දොඹකරයේ ආධාරයෙනි.

එක්කුක්ලීමා භාවිත කරන ලද්දේ මළමිනී ප්‍රදර්ශනය සඳහා ය. ග්‍රීක වේදිකාවේ මිනී මැරුම් වැනි භීෂණ ක්‍රියාවන් සිදු නොකළ ද මිනිය ප්‍රදර්ශනය කිරීම සඳහා එක්කුක්ලීමා යොදා ගනු ලැබී ය.

ඔර්කිස්ට්‍රාවේ වූ වේදිය නමින් ද හැඳින්වූ අල්තාරය (පූජාසනය) වෙත පැමිණෙන චරිත දේව සරණ පැතූ අවස්ථා දැකිය හැකි ය. ''ඊඩිපස් රජ'' නාට්‍යයේ යොකෙස්ට්‍රා බිසව තම දාසිය සමග අල්තාරය වෙත පැමිණ සුවඳ දුම් දල්වා සරණ පැතීම නිදසුන් වේ.

ග්‍රීක වේදිකාවේ භීෂණ ක්‍රියාවක් සිදු නොකෙරෙයි. එනිසා එවන් දර්ශන පෙන්වීමෙන් ප්‍රේක්ෂකයා දැඩි ආතතියකට බඳුන් වීම වැළකිණි. නිදසුන් වශයෙන් ''ඊඩිපස් රජ'' නාට්‍යයේ ළදරු කුමරුගේ දෙපා සිදුරු කිරීම, කොරින්ත වැසියාගේ ඝාතනය, ලායියුස් රජු හා පිරිස ඝාතනය, යක්ෂණියගේ දිවි නසා ගැනීම, ජොකොස්ටා බිසව ගේ ගෙල සිරකර ගැනීම, ඊඩිපස් රජු දෙනෙත් අඳකර ගැනීම, ''ඇන්ටිගනී'' නාට්‍යයේ ඊටියොක්ලිස් හා පොලිනිසස් ගේ ද්වන්ධ සටන, හීමන් හා යුරිඩීස් බිසව සිය දිවි හානිකර ගැනීම, එවැනි අවස්ථා ය. ගාන වෘන්දය ග්‍රීක නාට්‍යයෙහි විශේෂ වැදගත්කමක් ඉසිලූහ. ආරම්භයේ දී ගායකයන් දොළොස් දෙනෙකු ගෙන් සමන්විත වූ ගාන වෘන්දය සොෆොක්ලීස් විසින් පසළොස දක්වා වැඩි කරන ලදී. වෘන්ද ගායකයෝ සංගීතයට අනුව පාද තබමින් ඉදිරියටත් පසුපසටත් යමින් ලයාන්විත නැටුමක් ඉදිරිපත් කළ හ. වාදනය සඳහා බෙර, තාලම්පට හා බට නළාව සහාය කර ගත්හ.

අතීත සිදුවීම් ගෙනහැර පෑම, චරිත හඳුන්වා දීම, චරිතවලට අවවාද දීම, භීෂණ ක්‍රියා හෙළිදරවු කිරීම, චිත්ත අභ්‍යන්තරය හෙළිදරවු කිරීම ආදි බොහෝ කාර්ය ගාන වෘන්දයෙන් ඉටු කැරිණි.

ග්‍රීක නාට්‍යයෙහි දැකිය හැකි පශ්චාද් දෘෂ්ටි කථන රීතිය විශේෂිත නාට්‍ය උපක්‍රමයකි. අතීත සිදුවීම හෝ චරිත හෝ අතර සම්බන්ධතා ඇති කිරීම ගාන වෘන්දය හෝ තම චරිතයක් හෝ ප්‍රවේශ කිරීමෙන් ඉටු විය. එපමණක් නොව ගායන වෘන්දය අදාළ නාට්‍යයට පාදක වන ප්‍රධාන නගරවාසීන් නියෝජනය කළහ. නිදසුනක් වශයෙන් ''ඊඩිපස් රජ'' නාට්‍යයේ ගායන වෘන්දය තිබ්ස් නුවර වැසියන් නියෝජනය කළහ. බොහෝ නාට්‍යවලට එකම ස්ථානයක් පසුබිම් විය. ''ඊඩිපස් රජ'' හා''ඇන්ටිගනී''නාට්‍යවල පසුබිම වූයේ තීබ්ස් නුවර රජ මාළිගය අබියස ය.

වේදිකා සහායකයෝ කිහිප දෙනෙක් නාට්‍ය සඳහා දායක වූහ. නාට්‍යෝපකරණ ස්ථානගත කිරීම හා යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම ඔවුන් ගේ කාර්යභාරය විය.

එක් දිනක කාල පරාසයක් තුළ සිදු විය හැකි සිදුවීමක් කථා වස්තුවට පාදක විය.

නාට්‍යය විකාශනය වූයේ කාව්‍යාත්මක භාෂාවකිනි. නර්තනය සහ ගායනය රංග ශෛලියෙහි ප්‍රධාන ලක්ෂණයක් ව පැවතියේ ය.

නාට්‍යය ආරම්භ වන්නේ පූර්ව රංගයෙනි. එය Prologue නම් විය. ගායන වෘන්දයේ ප්‍රවේශය Parados නම් වූ අතර නාට්‍යය අවසානයේ වේදිකාවෙන් පිට ව යා යුත්තේ ගායක පිරිස ය. එම අවස්ථාව Exodos නම් විය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ග්‍රීක නාට්‍යයට අදාළ රංග භූමිය ඇඳ නම් කරන්න.
- ග්‍රීක ට්‍රැජඩි නාට්‍යයක රංග ශෛලිය ඔබ දන්නා නාට්‍ය නිදසුන් කර ගනිමින් විස්තර කරන්න.

අතිරේක උදව් :

- වෝල්ටර් මාරසිංහ - ග්‍රීක නාට්‍ය සම්ප්‍රදාය
- බන්දුල ජයවර්ධන
  විජේරත්න පතිරාජ - සම්භාව්‍ය ග්‍රීක නාට්‍ය කලාව

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.3 : මධ්‍යකාලීන යුගයේ ජන වන්දනා නාට්‍ය පිළිබඳ විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 05

ඉගැනුම් පල :
- මධ්‍යකාලීන යුරෝපයේ ජන වන්දනා නාට්‍ය (Liturgical drama) කලාව පිළිබඳ පසුබිම විස්තර කරයි.
- ජන වන්දනා නාට්‍ය සම්ප්‍රදාය ට අයත් මිස්ටරි, මිරකල්, මොරැලිටි යන නාට්‍ය වර්ග නිර්වචනය කරයි.
- මිස්ටරි මිරකල් සහ මොරැලිටි කථා වස්තු නම් කරයි.
- ජන වන්දනා නාට්‍ය රංග ගත වූ ස්ථාන සහ එහි දී යොදා ගනු ලැබූ වේදිකා වර්ග නම් කරමින් රූ සටහන් අඳියි.
- ජන වන්දනා නාට්‍ය රංග ශෛලිය පැහැදිලි කරයි.
- ජන වන්දනා නාට්‍ය පසුකාලීන නාට්‍ය කලාවලට ඇති කළ බලපෑම විමසයි.

ක්‍රියාකාරකම 4.3.1 :ජන වන්දනා නාට්‍ය හඳුනාගනිමු.

ගුණාත්මක යෙදැවුම් :
- ජන වන්දනා නාට්‍යවල එන කථා වස්තු කීපයක අවස්ථා සහිත පින්තූර ඡායාරූප
- ජන වන්දනා නාට්‍ය රඟ දැක්වූ පල්ලිය ඇතුළත සහ පල්ලියෙන් පිටත විවිධ ස්ථානවල ස්ථාවර හා තැනින් තැන යමින් පෙන් වූ ජංගම රථ වේදිකාවල රූ සටහන්, ඡායාරූප

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : දේශන හා විමර්ශන

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ශ්‍රී ලංකාවේ බෞද්ධ විහාරස්ථානවල ධර්ම දේශනා ඇසුරෙන් බණ මඩුවේ දී රඟ දැක්වූ බෞද්ධ පූජාකර්ම පිළිබඳ ව සිසුන් ගෙන් විමසමින් එයට සමාන ව යුරෝපය තුළ එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය, ස්පාඤ්ඤය, බෙල්ජියම වැනි රටවල කතෝලික දෙව්මැඳුරුවල පවත්වනු ලැබූ ප්‍රධාන ජනවන්දනා පිළිවෙත්වල දිව්‍ය පූජා යාගය සිද්ධ කරන අවස්ථාවේ දී (පාස්කු මංගල්‍යය, නත්තල් මංගල්‍යය දිනවල දි රඟ දැක්වූ ජන වන්දනා පිළිබඳ ව හැඳින්වීම.
- එහි ආරම්භයට තුඩු දුන් පහත දැක්වෙන පසුබිම සහ හේතු සාකච්ඡාවට යොමු කිරීම.
- ක්‍රි. ව. 198 දී ටර්ටුලියන් නම් සභා පිතෘවරයා පැවති රෝම නාට්‍ය කලාව සදාචාර විරෝධී බව ප්‍රකාශ කිරීම.
- ක්‍රි. ව. 311 දී කතෝලික දහම වැලඳගත් කොන්ස්ටන්ටයින් අධිරාජයා විසින් රෝම නාට්‍ය තහනම් කිරීම.
- ක්‍රි.ව. 3 සිට 10 තෙක් යුරෝපය තුළ විධිමත් නාට්‍ය කලාවක් නොමැති අඳුරු යුගය ඇති වීම.
- යුරෝපීය ගැමි ජනයා ''අඳුරු යුගය'' තුළ පවා ගැමි ඇදහිලි, චාරිත්‍ර වාරිත්‍ර, පෙරහැර පවත්වාගෙන යාම හේතුවෙන් නාට්‍ය කලාවේ නාට්‍යාංකුර ලක්ෂණ අඛණ්ඩ ව පැවතීම.
- කතෝලික දෙව්මැඳුරුවල දිනපතා පවත්වනු ලබන දිව්‍ය පූජා පිළිවෙතෙ හි ද මූලික නාට්‍ය ලක්ෂණ දක්නට ලැබීම.
- දෙව්මැඳුරු තුළ වතාවත්වල දී ලතින් භාෂාව භාවිත වීම නිසාත් එය ජනතාවට අවබෝධ නොවීම නිසාත් නාට්‍ය මාධ්‍ය මඟින් ආගමික පණිවිඩය ඉදිරිපත් කිරීමට කතෝලික සභාව පෙලඹීම.
- නාට්‍ය පල්ලියේ පිටත රඟ දක්වන්නට වූ කල වැඩවසම් සමාජ ක්‍රමය තුළ ජන වන්දනා

නාට්‍යවල ඇතුළත් කතා පුවත් අන්තර්ගතය අනුව මිස්ටරි, මිරකල්, මොරැලිටි වශයෙන් ප්‍රභේද තුනකට වෙන් කොට ඇති බව

මිස්ටරි යනු බයිබලයේ එන පුරාණ ගිවිසුමට සහ ක්‍රිස්තු තුමා ගේ ජීවන සිදුවීම් ඇතුළත් අලුත් ගිවිසුමට අයත් ග්‍රන්ථවල සඳහන් කතා පුවත් පදනම් කරගත් ජන වන්දනා නාට්‍ය වේ.

Mystery යන වදනෙහි අරුත් කීපයකි.

- ආගමික විශ්වාසය පදනම් ව ඇදහිය යුතු අභිරහස්‍ය කාරණා යන අරුත
- ගුප්ත බල යන අරුත
- අද්භූතජනක යන අරුත
- වෙළෙඳ හෝ ශිල්ප (Craft) යන අරුත - මෙම අරුතින් ශ්‍රේණි නාටක Mystery Plays යනුවෙන් ද හැඳින්වේ.

එංගලන්තයේ දී මිස්ටරි සහ මිරකල් නාට්‍ය යන වර්ග දෙක ම එකක් ලෙස ද සලකනු ලැබේ.

මිරකල් යනු ප්‍රාතිහාර්ය විෂයක නාට්‍ය වේ. මෙහි දී විශේෂයෙන් ජේසුතුමා ගේ ජීවිතයේ දක්නට ලැබෙන ප්‍රාතිහාර්ය විෂයක සිදුවීම්වලට අමතර ව සාන්තුවරයන් ගේ ජීවිත සිදුවීම අරභයා දක්වෙන ප්‍රාතිහාර්ය ඇසුරෙන් දේව බලය හා මහිමය නිරූපණය කරන නාට්‍ය වේ. ජේසුතුමා ගේ ප්‍රාතිහාර්ය මිස්ටරි වර්ගයට ඇතුළත් කළ හැකි නිසා මිරකල් නාට්‍ය සාන්තුවරයන් සහ ජනප්‍රවාද ඇසුරෙන් නිර්මාණය කළ දේව බල මහිමය පෙන්වන නාට්‍ය ලෙස සීමා කර දක්විය හැකි ය. එහෙත් එංගලන්තයේ දී පෙන්වන ලද චක්‍ර නාටක සියල්ල (බයිබලීය පුවත් ද ඇතුළු ව) හඳුන්වා ඇත්තේ මිරකල් යනුවෙනි. (සාන්තුවරයන් ගේ ජීවන පුවත් බයිබලයේ සඳහන් කර නැති බව ද දත යුතු ය.)

මොරැලිටි යනු (සදාචාර, උපදේශාත්මක හෙවත් සදුපදේශ නාට්‍ය වේ). බයිබලීය හා වෙනත් ආගමික කතා පුවත්වලින් බැහැර වී පොදුවේ මිනිසාගේ සදාචාරය ගැන සාකච්ඡා කරන නාට්‍ය සම්ප්‍රදාය යි. කතෝලික ආගමට අනුව ජීවත් වීම යනු දේව කැමැත්තට අනුව යහපත් ලෙස දිවි ගෙවමින් තම ආත්මය මරණයෙන් පසු ව දෙවියන් වහන්සේ වෙත යළි භාරදීම යි. පව් සහ පින් පිළිබඳ තේමාව බොහෝ දුරට මොරැලිටි නාට්‍යයේ දැකිය හැකි ය.

- මිස්ටරි, මිරකල්, මොරැලිටි යන නාට්‍ය වර්ගවලට අයත් කථා වස්තු කීපයක් දක්වමු.
- පල්ලිය ඇතුළත පෙන්වන ලද මිස්ටරි නාට්‍ය
  - ක්‍රිස්තු තුමාගේ උත්ථානය නිරූපණය කරන මරියාවරුන් තිදෙනා ගේ කතාව
  - ජේසු උපත දේවදූතයා විසින් එඬේරුන්ට දැනුම් දීම
  - යුදෙවු ජාතික හෙරොද් රජු ජේසු බිළිඳු මරා දැමීමට සූදානම් වීම සහ ශුද්ධ වූ පවුල ජේසු බිළිඳා රැගෙන මිසර දේශයට පලා යාම.
  - ජේසු උපත බැහැ දැකීමට ආ රජතුන් කට්ටුවේ කතාව
- පල්ලිය ඉදිරිපිට රඟ දක්වන ලද (ප්‍රධාන දොර අසල) මිස්ටරි නාට්‍ය

  පුරාණ ගිවිසුමට අයත් ආදම් සහ ඒව සුගති උද්‍යානයේ ගත කළ කතාව. (තහනම් ගසේ ගෙඩි කෑම)
- පල්ලියෙන් පිටත චක්‍ර (ශ්‍රේණි) නාටකවල දී රඟ දැක් වූ මිස්ටරි කතා පුවත්
  - දෙවන එඬේරා ගේ කතාව
  - ආබ්‍රහම්ගේ සහ ඊසාක් ගේ කතාව (පුරාණ ගිවිසුම)
  - ජේසුතුමා සාතන් විසින් තුන් වරක් පරීක්ෂා කරනු ලැබීම
  - අන්තිම රාත්‍රී භෝජනය

---නෝආ සහ නැව ඇතුළත් කතාව
---කායින් සහ ආබේල් පුවත

- චක්‍ර (ශ්‍රේණි) නාට්‍යවල රඟ දැක්වූ ප්‍රාතිහාර්ය විෂයක (Miracle) නාට්‍ය
  - සාන්ත ඇපලෝනියා ගේ කතාව (සාන්තුවර කතා)
  - සාන්ත සිසිලියා ගේ කතාව (සාන්තුවර කතා)
  - සාන්ත නිකුලස් තුමා ගේ කතා (ජනප්‍රවාද ඇසුරින්)
  - කන්‍යාමරිය තුමිය ගේ ප්‍රාතිහාර්ය කතා (ජනප්‍රවාද ඇසුරින්)
  - සාන්ත ඇග්නස් තුමිය ගේ කතාව (සාන්තුවර කතා)

- මොරැලිටි නාට්‍ය කතා වස්තු
  - Everyman හෙවත් සකලජන නාට්‍යයේ දී සකලජන තමාගේ අවසන් ගමනට ලෞකික සගයන්ගේ සහය පතයි. එහෙත් ඔහුට සහය වන්නේ ප්‍රඥාව වැනි යහගුණ සංකේත කරන චරිත පමණි.

---Mankind නම් සදාචාර නාට්‍ය ද විවිධ යහගුණ සහ දුර්ගුණ චරිත ලෙස පණ ගැන්වෙයි. එහි අවසානයේ දී Mankind හෙවත් මිනිස් වර්ගයා නමැති චරිතය අවසන් හුස්ම හෙළද්දී ඔහුගේ යහන යටින් ඔහුගේ ම ආත්මය එළියට එයි.

ජන වන්දනා නාට්‍ය රඟ දක්වන ස්ථාන සහ ඒ අදාළ ස්ථානවල දක්නට ලැබුණු වේදිකා වර්ග කීපයකි.

- පල්ලිය ඇතුළත රඟ දක්වන විට එහි ඇතුළත විවිධ ස්ථාන වේදිකා ලෙස යොදා ගැනීම.

විශාල දෙව්මැඳුරක ඇතුළත රූප සටහනක් සිසුන් වෙත ඉදිරිපත් කරන්න. දෙව්මැඳුරේ ඇතුළත ප්‍රධාන ස්ථානය පූජාසනය සහිත අතිපූජනීය කොටසයි. එහි ඉදිරිපස ඉඩ ඇති කොටස රංග ස්ථානය ලෙස සැලකේ. එය හඳුන්වනුයේ රංග අවකාශය (Platea) නමින් ය. කතාවේ විවිධ සිදුවීම් සඳහා දෙව්මැඳුරේ ඇතුළත උචිත ස්ථාන යොදා ගැනේ. පඩි කීපයක් සහිත උස් ස්ථාන, කුඩා මැදුරක් වැනි කුඩු හැඩ ගත් ස්ථාන, දෙව්මැඳුරේ මැද සහ දෙපස කොරිඩෝරවල රඟ දැක්වීම සිදු කැරිණි. ඒවා හඳුන්වා ඇත්තේ විවිධ නම්වලින් ය.

1. Sedes (කුඩා වේදිකාවක් සහිත ස්ථානයක්)
2. Loci (සාමාන්‍ය අවකාශයක් ඇති ස්ථාන)
3. Mansion (කුඩා මන්දිරයක හැඩ ගත් ස්ථාන)

මෙහි දැකිය හැකි වනුයේ බහු වේදිකා රටාවකි. නිදසුනක් ලෙස මරියාවරුන් තිදෙනා ගේ නාට්‍යයේ සුවඳ විලවුන් මිලදී ගැනීමට එන මරියාවරුන් සහ සුවඳ විලවුන් විකුණන අය සිටින ස්ථාන දැක්විය හැකි ය. ක්‍රිස්තු තුමා ගේ සොහොන සහ දේවදූතයා සිටින උස් ස්ථානය පූජාසනයට නුදුරුව දක්වා ඇත.

පල්ලිය ඉදිරිපිට නාට්‍ය රඟදැක්වීම

'ආදම්' නාට්‍යය රඟ දැක්වීමේ දී ප්‍රධාන දොරටුවට උඩින් ඇති විශාල ජනේලයෙන් ඇතුළත සිට කරනු ලැබූ ගායනා අසන්නට ලැබිණි.

- පල්ලිය ඉදිරිපිට ඇති ඉන් පිට වන පඩි පේළිය ද රංගනය සඳහා උචිත ලෙස යොදා ගැනිණි. පල්ලිය ඉදිරිපිට ඇති රංගන අවකාශය (Platea) ප්‍රේක්ෂකයන්ට මනා දසුනක් ලබා දුන්නේ ය.

පල්ලියෙන් පිටත නාට්‍ය රඟදැක්වීම

පල්ලිය ඇතුළත නාට්‍ය පෙන්වීමේ දී එහි ශාන්ත පරිසරයට බාධා පැමිණීම නිසා නාට්‍ය පල්ලියෙන් පිටත රඟ දැක්වීම ආරම්භ විණි. (දෙව්මැඳුරු තුළ ජනතාව වැඩි වීම, විවිධ රංග උපක්‍රම ශාන්ත පරිසරයට බාධා කිරීම, පූජක පැලැන්තිය විවේචනය කිරීම, කතෝලික සභාවෙන් ලද තහංචි)

1264 iv වැනි අර්බන් පාප්තුමා කෝප්පුස්ක්‍රිස්ටි හෙවත් දිව්‍ය සත්ප්‍රසාද මංගල්ලය ආරම්භ කිරීම. එම මංගල්ලය නිමිති කොට ගෙන එංගලන්තයේ විවිධ නගරවල ශිල්ප ශ්‍රේණි (විවිධ වෘත්තීන්ට අනුව සැදුණු ශ්‍රේණි) මඟින් ශ්‍රේණි හෙවත් චක්‍ර නාටක මාලා සංවිධානය කර, නගර ශාලාව, වෙළඳපොළ සහ අවට පිට්ටනි වැනි ස්ථානවල නාට්‍ය රඟ දැක්වීම ආරම්භ කරන ලදි. මෙම නාට්‍ය මිස්ටරි නාට්‍ය මෙන් ම ප්‍රාතිහාර්ය විෂයක නාට්‍ය ලෙස විකල්ප අයුරින් හඳුන්වන ලදි. එසේ ම ඒවා චක්‍ර හා ශ්‍රේණි නමින් ද හැඳින්වීම සිදු විය. ඒවා පෙන්වූ වේදිකා රටා හා වර්ග මෙසේ ය. ඒවා ස්ථිතික හා ජංගම යන දෙවර්ගයට අයත් ය. **(අංක 6 රූප සටහන් බලන්න)**

1. බූත් (Booth stages) එළිමහනේ තැනින් තැන සවි කළ හැකි ලී වේදිකා
2. බහු වේදිකා (Multiple stages)

   පිට්ටනියක් වැනි ස්ථානයක කතා පුවතේ සිදුවීම් පෙළගැස්වීම සඳහා එක පේළියට හෝ වටේට හෝ සකස් කර ඇති වේදිකා
3. මන්දිර වේදිකා (Mansion stages)

   පල්ලිය ඇතුළේ කුඩා මැඳුරක ආකාරයෙන් තිබූ වේදිකාවට සමාන ය. එහි පැතිවලින් හා පසුබිමෙන් තිර එල්ලා මන්දිරයක් ලෙස සකස් කර ඇත
4. ජංගම රථ වේදිකා

   ලී වලින් තැනූ මන්දිර ලෙස, එනම් මන්දිර වේදිකා අශ්ව කරත්ත මත පටවා ගෙන යනු ලැබේ. එහි මන්දිර 2කි. ඉහළ මහල රඟපෑම සඳහා ය. පහළ මහල වේෂභූෂණ යනාදිය ගබඩා කිරීම සඳහා වේ. 2 වන එඬේරා නාටකයේ එන මැක් ගේ නිවස සහ ජේසු බිළිඳු උපන් ගවහල නිරූපණය කිරීම සඳහා අශ්ව කරත්ත 2ක් යොදා ගැනුණු අතර රථ වේදිකා අසල භූමියේ ද රංගනය සිදුවිය.

මොරැලිටි නාට්‍ය රඟදැක්වීම

චක්‍ර නාටක රඟ දැක්වූ අයුරින් සදාචාර නාට්‍ය ද රඟපානු ලැබුවේ මන්දිර වේදිකා පිට්ටනියක වටේට ම සකසනු ලැබීමෙනි. ප්‍රධාන සිදුවීම එහි මැද මන්දිර වේදිකාවේ රඟපෑමට යොමු විය.

- ජන වන්දනා නාට්‍ය ඊට ම සුවිශේෂ වූ රංග භූමි රටාවක රඟ දැක්වුණු අයුරු, එනම් ජන වන්දනා නාට්‍යයේ රංග ශෛලිය විමසා බැලීම.

  පල්ලිය ඇතුළත රඟ දැක්වූ ''මරියාවරුන් තිදෙනා'' නාට්‍යයේ රඟපෑවෝ පූජකයෝ ය. පල්ලියේ ගීතිකා කණ්ඩායම ද අවස්ථානුකූල ව ගයමින් නාට්‍ය රසය ලබා දීමට සහය වෙති. මෙම නාට්‍යය ද ක්‍රමික ව සංවර්ධනය වී ඇත. මරියාවරුන් තිදෙනා ක්‍රිස්තු තුමා ගේ සොහොනට යාමට පෙර සුවඳ විලවුන් මිලදී ගැනීමට වෙළෙඳපොළට යාම මෙම නාට්‍යයට පසු ව එක් කරන ලද්දකි. සුවඳ විලවුන් විකුණන තැනැත්තා හාස්‍ය රසය ඇති වන අයුරින් රංගනය කර ඇති අතර මරියාවරුන් අතර සංවාද ඊට එක් වී ඇත. මුල් කාලයේ දී සිට ම දේවදූතයා ''සොයන්නහු ද කවුරුන් මේ සොහොනෙහි කිතුනුවනි" යන්න සජ්ඣායනය කර ඇත. පිළිතුරු දෙන මරියාවරු

  ''සොයන්නෙමු අපි මෙහි
  ඇණ ගසන ලද කුරුසේ
  ජේසු සමිඳාණන්
  නාසරෙත්හි පහළ වූ
  දේව දූතයනි ගරුතර" යනුවෙන් ගයති.

  දේවදූතයන් ගේ පිළිතුර වනුයේ "ආලේලුයියා... උන් වහන්සේ නැත, නැඟුණු සේක සගපුර" යන්න යි.

මෙලෙස මරියාවරුන් හා දේවදූතයා ලෙස රඟපාන විවිධ මට්ටමේ පූජකවරු එම අවස්ථා අනුරූපණය කරති.

පල්ලිය ඇතුළත් රඟ දැක්වූ නාට්‍ය සඳහා යොදා ගත් ආනුෂංගික කලා

- පල්ලියේ ගායක කණ්ඩායමේ විවිධ වාදන සහ ගීතිකා ගායනා
- පූජක වතාවත් සඳහා භාවිත කරනු ලබන දිග ලෝගු, හිස් පලඳනා, කර පටි වැනි වේෂභූෂණ
- කථා වස්තුවලට අදාළ නාට්‍යෝපකරණ ලෙස ඔලිව් අතු, රජ කිරුළු, සුවඳ දුම් භාජන, රන් කරඬු (රජතුන් කට්ටුව) බූරුවා ද රංග භාණ්ඩයක් ලෙස යොදා ගෙන ඇත.
- පල්ලියෙන් පිටත චක්‍ර (ශ්‍රේණි) නාට්‍ය රඟ දැක්වීමේ දී එහි ලෞකික බව ඇති වීම නිසා රංගනය ඇතුළු ආනුෂංගික කලාවන්හි ද වර්ධනයක් සිදු වීම.
- පූජකයන් වෙනුවට ගිහියන් රඟපෑම සිදුවීම (වෙළෙඳ ශ්‍රේණිවල සාමාජිකයන්)
- නගරවල විවිධ වෘත්තී අනුව සංවිධානය වූ වෙළෙඳ ශ්‍රේණි විසින් චක්‍ර නාටක සංවිධානය කරනු ලැබීම.
- බයිබලයේ එන ලෝක ආරම්භයේ සිට අවසාන විනිශ්චය තෙක් නාට්‍ය මාලා නිෂ්පාදන කිරීම.

චෙස්ටර් චක්‍රය	-	නාට්‍ය මාලා 25
ටවුන්ලි හෙවත් වේක්ෆීල්ඩ් චක්‍රය	-	නාට්‍ය මාලා 32
කවන්ට්‍රි චක්‍රය	-	නාට්‍ය මාලා 42
යෝක් චක්‍රය	-	නාට්‍ය මාලා 48

- මෙම චක්‍ර නාටක රංග ගත කිරීම වෙළෙඳ ශ්‍රේණිවල විවිධ වෘත්තිකයන්ට පැවරිණි.

නිදසුන් :

නාට්‍ය	**සංවිධානය (රංග ගත කිරීම)**
ආදම් ඒව කතාව	රෙදි අපුල්ලන්නෝ
නොආ ගේ කතාව	නැව් සාදන්නෝ
ජේසුතුමා සාතන් විසින් පරීක්ෂා කිරීම	කම්මල්කරුවෝ
අන්තිම රාත්‍රි භෝජනය	පාන් පුලුස්සන්නෝ
කායින් සහ ආබෙල් කතාව	අත් මේස් මසන්නෝ
ආබ්‍රහම් සහ ඊසාක් කතාව	පොත් බඳින්නෝ
ජේසුතුමා ගේ ස්වර්ගාරෝහණය	සන්නාලියෝ

චක්‍ර නාටක මඟින් ප්‍රේක්ෂාව (Spectacle) වර්ධනය කිරීම සඳහා විවිධ රංග උපක්‍රම (Theatrical effects) භාවිත කැරිණි. රඟ දැක්වීම හිමිදිරි උදෑසන ආරම්භ විය. රථ වේදිකා ආරම්භ කිරීමට පෙර බූත් වේදිකා මත වේදිකා යන්ත්‍ර සූත්‍ර භාවිත කරන ලදි.

නිදසුනඃ සාතන් විසින් ක්‍රිස්තු තුමා දේව මාළිගාව මුඳුනට ගෙන යාම සඳහා දොඹකර යොදා ගැනීම.

සුරදූතයන් පියාපත් සහිත ව නිරූපණය කිරීම.

යක්ෂයන් උල් නියපොතු, දිග හොට, අං, වල්ගා සහිත ව නිරූපණය කිරීම.

නළුවෝ ආධුනිකයෝ වූහ. වෙළෙඳ ශ්‍රේණිවලට අයත් වූහ. ඔවුන්ට යම් ගෙවීමක් නාට්‍ය වෙනුවෙන් කරන ලදි.

ජුදාස් එල්ලී සිය දිවි නසා ගැනීමේ සිදුවීම නිරූපණය සඳහා පැන්ස 4ක් ද ''කුකුළා හැඬලීම'' සඳහා නළුවකුට පැන්ස 4ක් ද නෝවා ගේ බිරිඳ ගේ භූමිකාව වෙනුවෙන් පැන්ස 8ක් ද ගෙවා ඇති බව පැරණි වාර්තාවල සඳහන් වීම.

වේදිකාව මත උමං දොරටු (Trap doors) තිබීම. Deus Ex Machina නම් දෙවියන් වැනි චරිත දර්ශනය සඳහා යොදාගනු ලබන විශේෂ යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීම.

- අපාය, වම් පස ස්වර්ගය දකුණු පස සහ මෙලොව මැද ලෙස වේදිකාව තුළ නිරූපණය කිරීම.
- යක්ෂයන් සිටිනා නිරයේ මුඛ ද්වාරය (Hell mouth) අදාළ නාට්‍යවල පසුතල ලෙස සකස් වීම.
- යක්ෂයන් සඳහා වෙස් මුහුණු ද භාවිත කිරීම.
- සාන්ත ඇපලෝනියා මුනිවරිය ගේ දත් උගුල්ලා පෙන්වීම සඳහා උල්, ආයුධ, රැහැන් යනාදිය භාවිත කරන අයුරුත්, රංග අවකාශයේ සිට ස්වර්ගය තෙක් ඉණි මගක් දැක්වීම. ඒ අසල පොතක් සහ යෂ්ටියක් රැගෙන නාට්‍යකරුවා සිටින අයුරුද සිත්තරෙකු විසින් සිත්තම් කරනු ලැබ ඇත.

  මේ අයුරින් චක්‍ර නාටකවල රංග ශෛලිය මඟින් ප්‍රේක්ෂාව තීව්‍ර කිරීම.
- ජන වන්දනා නාට්‍යවල අන්තර්ගතය හා ආකෘතිය එක්තරා දුරකට පසුකාලීන එංගලන්ත නාට්‍ය කලාවේ ක්‍රිස්ටෝපර් මාලෝගේ සහ විශේෂයෙන් විලියම් ශේක්ෂ්පියර්ස් ගේ නාට්‍ය කලාව කෙරෙහි බලපෑමක් කර ඇත.
- මොරැලිටි නාට්‍යයේ වස්තු විෂයය බයිබල් කතාවන් ගෙන් බැහැර ව පොදුවේ මිනිසා ගේ සදාචාරය කෙරෙහි යොමු වීම. මෙය මාර්ලෝ සහ ශේක්ෂ්පියර් වැන්නන් ගේ තේමාවන් කෙරෙහි බලපෑම.

  නිදසුන් : පළිගැනීම, උන්නතිකාමය, ඊර්ෂ්‍යාව වැනි තේමාවන් කෙරෙහි නැඹුරු වීම.
- මොරැලිටි නාට්‍යයේ අන්තර්ගතය ආභාසයෙන් ශේක්ස්පියර්, මිනිසුන් එකිනෙකා සමඟ සහ ස්වකීය අභ්‍යන්තරය සමඟ ගැටෙන අයුර ප්‍රබල ව නිරූපණය කිරීම.
- මධ්‍යකාලීන වේදිකාවේ ස්වරූපය අනුව ස්ථාන ඒකත්වය දක්නට නොලැබීම සහ ශේක්ෂ්පියර්ගේ නාට්‍යවල ද ඒ ආභාසයෙන් විවිධ ස්ථාන බහු වේදිකා ක්‍රමය මඟින් ඉදිරිපත් කිරීම.

  උදා: මාලිගා ඇතුළත, පිටත, මාවත, සොහොන් පිටි යනාදිය
- අවතාර, පේන කාරියන් වැනි අද්භූත චරිත නිර්මාණය සඳහා මධ්‍යකාලීන යුගයේ යක්ෂයන් වැනි චරිත බලපා ඇති බව. ශේක්ෂ්පියර්ගේ නාට්‍ය වේදිකාවේ රහස් දොරටු වැනි උපක්‍රම ද මධ්‍යකාලීන යුගයේ බලපෑමකි.
- මිස්ටරි මිරකල් නාට්‍යවල ''ප්‍රේක්ෂාව'' අනුව ශේක්ෂ්පියර් නාට්‍යවල ද ප්‍රබල ප්‍රේක්ෂාවක් නිර්මාණය කිරීම (ඇඳුම් පැලැඳුම්, වෙස් මුහුණු, හිස් පලඳනා යනාදිය)

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- යුරෝපයේ ජන වන්දනා නාට්‍ය බිහිවීමට පාදක ආගමික පසුබිම විමසන්න.
- පල්ලිය ඇතුළත සහ පිටත රංගභූමි රූ රටා ඇඳ නම් කරන්න.
- ජන වන්දනා නාට්‍ය රඟ දැක්වූ රංග ශෛලිය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.
- පසුකාලීන නාට්‍යකරුවන් මෙම ජන වන්දනා නාට්‍ය සම්ප්‍රදායයෙන් ආභාසය ලැබූ අයුරු විස්තර කිරීම යන කරුණු ඇගැයීමට ලක් කරන්න.

අතිරේක උදව් :

- බටහිර නාට්‍ය හා රංග කලාව - මහාචාර්ය සුචරිත ගම්ලත්
- නාට්‍ය ප්‍රවේශය - රංජිත් ධර්මකීර්ති

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.4 : දේශීය නාට්‍ය කලාවේ ප්‍රභවය විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගෙනුම් පල :
- විශ්වාස හා ඇදහිලි පදනම් කරගත් අභිචාර කර්ම විස්තර කරයි.
- ස්වාභාවික වස්තුවලට දේවත්වය ආරෝපණය කොට ඇති අවස්ථා විමසයි.
- ජීවිතයේ විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීමට අභිචාර විධි භාවිත කළ අයුරු හඳුන්වයි.
- එම අභිචාර විධි ආශ්‍රිත ව නාට්‍යමය ලක්ෂණ පෙන්නුම් කරන ආකාරය නිරීක්ෂණය කරයි.
- නාට්‍ය ලක්ෂණ පිළිබිඹු කරන පූජා කර්ම හා ශාන්ති කර්ම නම් කරයි.

ක්‍රියාකාරකම 4.4.1 : අභිචාර විධි හා පූජා කර්ම

ගුණාත්මක යෙදවුම් : පූජා කර්ම හා අභිචාර කර්ම දැක්වෙන ඡායාරූප, පහතරට යක්කම්වල අවස්ථා අඩංගු සංයුක්ත තැටි, අදාළ කවි ගායනා සහිත ශ්‍රව්‍ය පට

ඉගෙනුම් - -ඉගැන්වීම් ක්‍රමවේදය : නිරීක්ෂණ

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පහත සඳහන් කරුණු ආශ්‍රය කර ගනිමින් ස්වභාවධර්මය හා මිනිසා අතර ඇති සම්බන්ධය හා සොබාදහමට දේවත්වය ආරෝපණය කරමින් මිනිසා විසින් කරන ලද පුද පූජා හා අභිචාර විධි නාට්‍ය කලාවේ ප්‍රභවය කෙරෙහි බලපා ඇති ආකාරය සාකච්ඡා කරන්න.
- ආදි මානවයා සිය රසඥතාව දියුණු වීමට පෙර ස්වභාව ධර්මය අවබෝධ නොකරගත් අවධියක නොයෙක් විශ්වාසවල හා ඇදහිලිවල එල්බගෙන කටයුතු කර ඇත. එම ඇදහිලි හා විශ්වාස පදනම් කරගත් අභිචාර විධි ආශ්‍රයයෙන් නාට්‍ය කලාවේ ප්‍රභවය සිදු විය.
- ස්වකීය පරිසරයේ දක්නට ලැබෙන ස්වාභාවික වස්තු පිළිබඳ ව ආදි කාලීන මානවයාට නිවැරදි අවබෝධයක් නොවී ය. ඒවා ගුප්ත, අදෘශ්‍යමාන බලවේග ලෙස සැලකීමට මිනිසා පුරුදු විය. එයින් තමාට අනර්ථයක් ඇති වේ යයි පැවති බිය විසින් එම ස්වාභාවික වස්තු දේවත්වයෙහි ලා පුදන්නට ඔවුහු පෙලැඹුණහ. ඒ ආශ්‍රිත ව විවිධ පූජා කර්ම සිදු කළ අතර, එහි දී බොහෝ විට සිදු කළේ අනුකරණ ක්‍රියාවලියකි. මිනිසා සූර්යයා දුටුවේ අද්භූත වස්තුවක් ලෙස ය. හිරුකිරණ ලෝකයේ පැවැත්මට නිරන්තර බලපෑමක් සිදු කළේ ය. එම බලය ආදි මානවයා සැලකුවේ අද්භූත සිදුවීමක් ලෙස ය. එහි ඵලය වූයේ හිරු-දෙවියකු බවට පත්වීම යි. හිරු දෙවියන් උදෙසා පුද පූජා පැවැත්වීමට ආදි මානවයා පෙලැඹුණේ ඒ අනුව ය. මේ අයුරින් සඳ, කඳු, පර්වත, අහස, පොළොව, ඇළ, දොළ, ගංගා, ගහ, කොළ ආදි ස්වාභාවික වූත්, අචේතනික වූත් වස්තුන්ගේ බලයට දේවත්වය ආරෝපණය කොට පුද පූජා කිරීමට ඔවුහු පෙලැඹුණහ. උදාහරණයක් ලෙස එදා මෙදා තුර මානවයා ගේ විශිෂ්ටතම සොයා ගැනීම සේ සැලකිය හැක්කේ ගින්න යි. ගින්නෙහි පවත්නා අද්භූත ස්වභාවය ආදි මානවයා විස්මයට පත් කිරීමට හේතු විය. ළං වීමට පවා අපහසු ගින්න හේතු කොට ගෙන සියලු මානව ක්‍රියා සඳහා ලබා ගත හැකි පිටිවහල මිනිසා විස්මයට පත් කළා සේ ම ඒ නිසා ගින්න අද්භූත වස්තුවක් ලෙස මිනිසා ගේ භක්තියට ද පාත්‍ර විය. ඒ අනුව ගින්න දේවත්වයෙහි ලා සැලකීමටත්, එම ගිනි දෙවියන් ගේ ආශිර්වාදය ලබා ගැනීම සඳහා විවිධ පූජාමය ක්‍රියාකාරකම් සිදු කිරීමටත් ඔවුන්ට අවශ්‍ය විය. මේ ආකාරයෙන් ම වැස්ස, සුළඟ ආදි බලවේග ආදි මානවයා ගේ පූජාවට පාත්‍ර විය.

- ස්වකීය ජීවිකා වෘත්තීන් හා සම්බන්ධ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ද අදෘශ්‍යමාන බලවේගවල පිහිට පැතීමට ආදි මානවයා පුරුදු වී සිටියේ ය. පණ්ඩුකාභය රජ දවස ව්‍යාධ දේව නම් වූ දෙවියකු තල් ගසකට අධිගෘත ව සිටි බවට මතයක් ඇත. ව්‍යාධදේව යනු දඩයමට අධිපති දෙවියෙකි. දඩයමෙහි දී ආරක්ෂාව හා සාර්ථකත්වය ලබා ගැනීම සඳහා මෙම දෙවියන්ට පුද පූජා සිදු කොට තිබේ.

- එසේ ම මළවුන් ඇදහීමේ චාරිත්‍රය ද එකල බොහෝ ජනප්‍රිය වූ බව පෙනේ. මිය ගිය ඥාතීන් ගේ ප්‍රේතාත්මවලින් හා භූතාත්මවලින් සිදුවන විපත්වලින් මිදීම සඳහා ඔවුහු එම ආත්මවලට පුද පූජා හා යාගහෝම සිදු කළ හ. මිය ගිය ඥාතිවරයා ගේ ආත්මය යාගහෝම මගින් තෘප්තියට පත් කොට ඔවුන්ගෙන් සිදු වන විපත්වලින් ආරක්ෂාව පැතූ අතර, ඇතැම් විට ස්වකීය අවශ්‍යතා ඉෂ්ට කරගැනීමට ද ඔවුන්ගේ පිහිට පැතූ බව පෙනේ.

- පුද පූජා හා යාග හෝම මෙන් ම නොයෙක් අභිචාර විධි ද ආදි මානවයා විසින් අනුගමනය කරනු ලැබී ය. ජීවිතයේ විවිධ අවශ්‍යතා ඉටු කරගැනීම සඳහා ඔවුහු මෙම අභිචාර විධි භාවිත කළහ. දරු පල ලබා ගැනීම, ගර්භය ආරක්ෂා කිරීම, දරු ප්‍රසූතිය වැනි දෑ සඳහා ඔවුහු විවිධ අභිචාර ක්‍රම භාවිත කළ හ. එක්තරා ජන කොට්ඨාසයක් දරු ප්‍රසූතිය පහසු කිරීම සඳහා කරන ලද අභිචාර ක්‍රමයක් නම් ගලක් බඩ බැඳගත් ඇදුරකු ගල සොලවමින් මන්ත්‍ර ජප කිරීමයි. අප ගේ රට යකුම ශාන්ති කර්මයේ අපේක්ෂාව වන්නේ ද ගර්භ සංරක්ෂණ යි. එසේ ම ස්වකීය ජීවන වෘත්තීවල සාර්ථකත්වය අපේක්ෂා කරමින් කරන ලද අභිචාර විධි බොහෝ ය. මසුන් ඇල්ලීමෙහි යෙදෙන අය එහි සාර්ථකත්වය උදෙසා මත්ස්‍ය රූපයක් සාදා දියට දමති. එසේ ම දඩයම් සාර්ථක කර ගැනීම අරමුණු කොට වස්ත්‍ර උනා තබා මන්දට හසු වී කැගැසීම සිදු කරති. කිඹුලන් අල්ලන අය බත් ගුලි තුනක් ගිලීමේ කෙම් ක්‍රමයක් භාවිත කරති. ගසක පල දැරීම සඳහා අලුයම් යාමයේ ගසට මූත්‍ර කොට බුවල්ලකින් තැළීම සිදු කරති. ඇසෙහි නගනයක් සැදුණු විට ඉර නගින්නට පළමු කිසිවකු හා කථා නොකොට මූත්‍ර ස්වල්පයක් ගෑම හෝ තුත්තිරි ගසක් ගලවා එහි අග රැඳි කිරි (දියර) ගෑම සිදු කරති. මෙවැනි අභිචාර විධි අප්‍රමාණ සංඛ්‍යාවක් ලෝකයේ සැම රටක ම දක්නට ලැබේ.

එසේ ම රෝග නිවාරණය කිරීම සඳහා ද, අණවිණ හා හදි හූනියම් ආදියෙන් මිදීම ද, සශ්‍රීකත්වය උදා කර ගැනීම, සෙත් ශාන්තිය උදාකර ගැනීම ආදි විවිධ ක්ෂේත්‍රවලට අදාළ ව අභිචාර විධි හා පූජා කර්ම සිදු කරනු ලැබී ය. එහි දී නාට්‍ය කලාවෙහි ඉතා වැදගත් භාවිතයක් වන අනුකරණය පැහැදිලි ලෙස ම දක්නට ලැබේ. අතීත අත්දැකීම්, සිද්ධි අවස්ථා ආදිය අනුකරණය කිරීම මෙහි දී සිදුවේ. ආදි වාසීන් අතර පැවතෙන සටනකට යාමට පෙර සිදු කරනු ලබන සටන පිළිබඳ අනුකරණාත්මක නැටුම මෙහි ලා නිදසුන් ලෙස ගත හැකි ය. එසේ ම අප ගේ පෙරහර සංස්කෘතියේ එන වර්ෂාව නිරූපණය කරන අවස්ථාව ද වැදගත් වේ. බෙර වාදනයත්, කස පිපිරවීමත්, ගිනිබෝල කරකැවීමත් වර්ෂාව අනුකරණය කිරීමක් ලෙස සැලකේ. එක්තරා ගෝත්‍රික ජන කොට්ඨාසයක් අතර පැවති චාරිත්‍රයක් වන යුද්ධයට ගිය සැමියාට ශක්තිය ලබා දීම සඳහා ශරීරයේ සුදු සායම් තවරා ගත් බිරියන් කැති, පොලු ආදිය ගෙන පැපොල් ගෙඩි පැළීම ද එබඳු අනුකරණ ක්‍රියාවක් බව කිව හැකි ය.

උක්ත අභිචාර විධිවලට අනුගත ව දෙවියන්, යකුන්, ප්‍රේතයන් ආදි අධිමානුෂීය කොටස් සඳහා මෙම පුද පූජා කරනු ලැබේ. ග්‍රීසිය, රෝමය, භාරතය වැනි රටවල නාට්‍ය කලාවේ ප්‍රභවය පිළිබඳ ව ගවේෂණය කරන විට පැහැදිලි වන කරුණක් නම් ආගමික ඇදහිලි හා විශ්වාස ඒ හා බද්ධ ව ඇති බව යි. යන්ත්‍ර මන්ත්‍ර මෙන් ම යාඥා කිරීම් ආදි වාචික අභිනය එම අනුකරණ හෝ නිරූපණවලට නාට්‍යරූපී බවක් ලබා දෙයි. ග්‍රීක නාට්‍ය කලාවේ පැහැදිලි ව දියොනීසස් දෙවියන් උදෙසා කෙරෙන පූජා නාට්‍ය කලාවක් දක්වා විකාශනය වේ. මෙම අනුකරණ ක්‍රියාවලිය සඳහා වෙස්මුහුණු භාවිත කිරීම බාහිර සමාරෝපයට ද එමගින් ඇති වන ආරූඪය

අභ්‍යන්තර සමාරෝපයට ද හේතු වන බව පැහැදිලි ය. ඒ අනුව නාට්‍ය හා රංග කලාවේ මූලික ලක්ෂණ වන අනුකරණය, අනුරූපණය, නිරූපණය, සමාරෝපය, සංවාද ආදි නාට්‍යමය ලක්ෂණ බොහෝවක් පූජාකර්මවල හා අභිචාර කර්මවල දක්නට ලැබේ.

- එබඳු අභිචාර විධි හා ආගමික සම්භවයක් සහිත නාට්‍යමය ලක්ෂණ ප්‍රකට කෙරෙන ශ්‍රී ලාංකේය සමාජයේ දක්නට ලැබෙන අවස්ථා කීපයක් පහත දැක්වේ.

බෞද්ධ පූජාකර්ම	පිරිත් පින්කම	ආලවක දමනය
	යුගාසන බණ	දොරකඩ අස්න
	මිලින්ද ප්‍රශ්නය	
වෙනත් ශාන්ති කර්ම	සන්නි යකුම	රට යකුම
	සූනියම් යාගය	කොහොඹා කංකාරිය
	ගම්මඩු	දෙවොල් මඩු
	පූනා මඩු	කිරි මඩු
	හැල්ලුම් මඩු	

උක්ත අවස්ථාවල ඉහත දක්වන ලද නාට්‍යමය ලක්ෂණ බෙහෙවින් අන්තර්ගත ව ඇත.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- විශ්වාස හා ඇදහිලි පදනම් කරගත් අභිචාර විධි හා පූජා කර්ම විස්තර කරන්න.
- ස්වභාවි ධර්මය වන්දනාවට ලක් වූ අයුරු විග්‍රහ කරන්න.
- ජීවිතයේ විවිධ අවස්ථාවල අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා අභිචාර විධි භාවිත කළ අයුරු පැහැදිලි කරන්න.
- පූජාකර්මවල හා අභිචාර විධිවල දක්නට ලැබෙන නාට්‍යරූපී ලක්ෂණ විස්තර කරන්න.
- නාට්‍ය ලක්ෂණ අන්තර්ගත දේශීය පූජාකර්ම හා අභිචාර කර්ම හඳුන්වන්න.

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.4 : දේශීය නාට්‍ය කලාවේ ප්‍රභවය විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- බෞද්ධ පූජාකර්ම හඳුන්වයි.
- බෞද්ධ පූජාකර්මවල නාට්‍යමය ලක්ෂණ විස්තර කරයි.
- බෞද්ධ පූජාකර්මවල වටිනාකම ප්‍රකාශ කරයි.
- එම පූජාකර්ම සංරක්ෂණය කරයි.
- මානසික සුවය සඳහා පූජාකර්මවලට සහභාගි වෙයි.

ක්‍රියාකාරකම 4.4.1 : ආගමික පූජාකර්ම

ගුණාත්මක යෙදවුම් : ආගමික පූජෝත්සව හා සම්බන්ධ ඡායාරූප, සංයුක්ත තැටි, ආලවක දමනය, මිලින්ද ප්‍රශ්නය, යුගාසන බණ, දොරකඩ අස්න පිළිබඳ ව ලියැවුණ ලිපි ලේඛන

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : නිරීක්ෂණ හා ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ආගමික පූජෝත්සව හා සම්බන්ධ සංයුක්ත තැටියක් නැරඹීමට සැලැස්වීම / පූජෝත්සව හා සම්බන්ධ ඡායාරූප නැරඹීමට සැලැස්වීම / දොරකඩ අස්න අසන්නට සැලැස්වීම යන කරුණුවලින් එකක් සිදු කරමින් පාඩමට අවතීර්ණ වන්න. පහත සඳහන් කරුණු අවධාරණය වන සේ පාඩම ගොඩ නඟන්න.

  ශ්‍රී ලංකාව ථෙරවාදී බුදු දහම ප්‍රචලිත ව පවත්නා රටක් ලෙස පිළිගැනේ. මුල් යුගයේ මහින්දාගමනය සමඟ මෙරට ප්‍රචලිත වූ ථෙරවාදී බුදු දහම, පසු කාලීන ව මහායාන බුදු දහම හා ප්‍රාග් බෞද්ධ යුගයේ මෙරට පැවැති විවිධ ආගමික ඇදහිලි හා විශ්වාස සමඟ සම්මිශ්‍රණය වූ ආකාරය ඉතිහාසය විමසීමේ දී පැහැදිලි වේ.

  පුරාණයේ අධ්‍යාපන කේන්ද්‍රස්ථානය වූයේ පන්සල යි. භික්ෂුව විසින් ඉගැන්වීමේ කාර්යය සිදු කරන ලදි. මෙරට සම්භාව්‍ය සාහිත්‍යයක් බිහි වන්නේ ද මෙම සමාජ සංස්කෘතික පදනම මතයි. ශීලය පදනම් වූ ථෙරවාදී බුදු දහමට අනුව ඉන්ද්‍රියයන් සංවර කිරීමේ දී "නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූස ණට්ඨානා වෙන්" විනිර්මුක්ත වීම අපේක්ෂා කරනු ලැබී ය. දඹදෙණි කතිකාවතෙහි කාව්‍ය නාටකාදී ගර්හිත විද්‍යාවන් ඉගැනීම හා ඉගැන්වීමත් ප්‍රතික්ෂේප කොට ඇත්තේ එනිසා විය යුතු ය.

  එහෙත් අනුකරණය හා නිරූපණය මඟින් යමක් තහවුරු කිරීම වඩාත් සාර්ථක වන බව යථාර්ථයයි. ලෝකෝත්තර න්‍යායයෙන් වෙන් වූ ලෞකිකත්වයට නැඹුරුවක් දක්වන මිනිසාගේ ආධ්‍යාත්මිකත්වයට පරිබාහිර අවශ්‍යතාවන් හේතු කොට ගෙන ආගම ධර්මය නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන අවස්ථා ආගමික ක්ෂේත්‍රයෙහි අපහට බොහෝ සෙයින් හමු වේ. ආගමික වතාවත් උත්සවාකාරයෙන් කිරීමත්, එහි දී විචිත්‍රවත් ආකාරයට ඉදිරිපත් කිරීමත් පොදු ජනයාට වඩාත් අභිමත විය. නාට්‍ය සංකල්පයෙන් බැහැර වුව ද, නාට්‍යානුරූපී ව බණ දහම් සමාජගත කරන අවස්ථා ගොඩ නැඟෙන්නේ ඒ අනුව ය. ඒවා නාට්‍ය අංකුර අවස්ථා ලෙස අපහට හැඳින්විය හැකි ය. මන්ද යත්, බොහෝ නාටකීය ලක්ෂණ එබඳු ආගමික ක්‍රියාවලින් පිළිබිඹු වන බැවිනි.

  ප්‍රාග් බෞද්ධ යුගයෙහි වූ බොහෝ ඇදහිලි හා විශ්වාස පසු කාලීන ව බෞද්ධාගම හා සම්බන්ධ වූ බව පෙනේ. යක්ෂ දේව ඇදහිල්ලෙහි වූ මන්ත්‍ර කීම හා ස්තෝත්‍ර කීම පිරිත් ගායනා විලාසයෙන් බෞද්ධාගමට බද්ධ විය. ප්‍රාග් යුගයෙහි වූ වෘක්ෂ වන්දනාව බෝධි වන්දනාව ලෙස වෙනස්

විය. මහායාන බුදු සමයේ සම්ප්‍රාප්තියත් සමග එළඹෙන පිරිත් පින්කම් ජනතාව වැලැඳ ගන්නේ ඉහත දක්වූ අපේක්ෂා හා එය සැසඳෙන බැවිනි. ඉහත පාඩමෙහි දක්වා ඇති ආකාරයට පැරණි සමාජයේ බෙහෙවින් ම දක්නට ලැබුණු, එහෙත් වර්තමාන සමාජයෙහි අභාවයට යමින් පවතින පිරිත් හා සති පිරිත් පින්කම්, ආලවක දමනය, දොරකඩ අස්න හා මිලින්ද ප්‍රශ්නය වැනි අවස්ථාවල දී නාට්‍ය අංකුර අවස්ථා දක්නට ලැබෙන බව පැහැදිලි ය.

පිරිත් කීම, පිරිත් මංගල්‍යය ආදි වශයෙන් හඳුන්වන, බෞද්ධයන් අතර බෙහෙවින් ම ප්‍රචලිත නාට්‍යමය ලක්ෂණ දක්නට ලැබෙන ආගමික පූජා කර්මයක් ලෙස පිරිත් පින්කම සඳහන් කළ හැකි ය. ආරක්ෂාව උදෙසා කරනු ලබන මෙම පුණ්‍ය කර්මය අමනුෂ්‍ය බිය දුරු කිරීම සඳහා ද, රෝග උපද්‍රවයන් ගෙන් අත් මිදීම සඳහා ද, සෙත් ශාන්තිය ලබා ගැනීම උදෙසා ද සිදු කරනු ලැබේ. අතීතයේ මෙය විහාරයක ඉදි කරන ලද විචිත්‍රවත් මණ්ඩපයක දී සිදු කරනු ලැබුව ද, වර්තමානයේ ගෙවලට භික්ෂූන් වැඩමකොට තුන් වරුව, වරු පිරිත වශයෙන් මෙන් ම ක්ෂණික පිරිත් දේශනා වශයෙන් ද සිදු කරනු ලැබේ. එමෙන් ම ගිහි පිරිත ද පසු කාලීන ව දක්නට ලැබේ. පරමාර්ථ වශයෙන් ගෙන බලන විට ආදි කාලීන ජන ඇදහිල්ලක් වූ යක්ෂ, ප්‍රේතාදි අමනුෂ්‍යයන් ගෙන් ආරක්ෂා වීම මෙ මඟින් අපේක්ෂා කරන අතර කරණීය මෙත්ත සූත්‍රය රතන සූත්‍රය වැනි ඇතැම් සූත්‍ර ධර්මවල එම කාරණය පැහැදිලි ලෙස ම දක්වා තිබේ.

නාට්‍යමය ලක්ෂණ හා ආදේශ කොට බලන කල්හි පිරිත් කීම පැහැදිලි ව ම අනුකරණ ක්‍රියාවකි. බුදුන් දවස තුන් බිය වන් විසාලාවට අමනුෂ්‍ය භය නැති කොට ශාන්තිය සැලසීම උදෙසා දේශනා කළ රතන සූත්‍රය ඇතුළු ව වරින් වර දේශනා කළ බවට පැවසෙන පරිත්‍රාණ ධර්මයන් ප්‍රතිනිර්මාණය කිරීම පිරිත් සජ්ඣායනයේ දී සිදු කෙරේ. අනුකරණය යනු නාට්‍ය කලාවේ දී නාට්‍යමය ලක්ෂණයක් ලෙස සලකනු ලබන්නකි. පිරිත් මණ්ඩපය නාට්‍යයේ වේදිකාව සිහි ගන්වන අතර මණ්ඩපය සරසා ඇති ආකාරය පසුතල නිර්මාණ හා සැසඳිය හැකි ය. මණ්ඩපය විසිතුරු ලෙස සැරසීමේ දී ඒ සඳහා ගොක් කොළ, පොල් මල්, පුන්කලස් ආදිය භාවිත කෙරේ. මණ්ඩපයේ ඉහළ බුලත්, නා ඇතුළු ඖෂධීය ගුණ සහිත කොළ වර්ගවලින් සරසනු ලැබේ. එහි වෘත්තාකාර ව භික්ෂූන් වහන්සේලාට වැඩ සිටීම සඳහා අසුන් පනවා ඇත. මණ්ඩපය මැද තිබෙන කණුවෙන් සංකේතවත් වන්නේ දිව්‍ය ලෝකයෙහි ඇතැයි සැලකෙන ''කප්රුක''ය. මෙය සංකේතයක් බව කිව හැකි ය. මන්ද යත්, කප්රුක සියලු සැප සම්පත් පහළ කරන්නා සේ ම, පිරිත් පින්කම ද ජනතාව ගේ සියලු අපේක්ෂා ඉටු කරන නිසා ය. තෝරා ගත් සූත්‍ර සජ්ඣායනා කිරීමේ දී ඊට ආවේණික වූ ශෛලියක් තිබේ.

නායක භික්ෂූන් වහන්සේ පිරිත ආරම්භ කරන විට අනෙකුත් භික්ෂූන් විසින් පද අල්ලනු ලබන්නේ නාට්‍යයක සමූහ ගායනයක් සිහි ගන්වමිනි. විශේෂයෙන් 'ආටානාටිය' සූත්‍රය ප්‍රබල වශයෙන් වාචිකාභිනය අන්තර්ගත අවස්ථාවක් ලෙස දැක්විය හැකි ය. වර්තමානයේ ද මැදියම් රෑ අමනුෂ්‍යයන් පලවා හැරීම සඳහා මෙම පිරිත ගායනා කරන අතර ඒ සඳහා සම්මත ශෛලියක් ද තිබේ. මනා හඬ පාලනයක් සහිත බැවින් ශබ්ද මාධුර්යය වඩාත් තීව්‍ර වෙයි.

පිරිත් නූල මෙහි තවත් වැදගත් සංකේතයකි. පිරිත ශ්‍රවණය කරන අය නාට්‍යයක ප්‍රේක්ෂකයන් සිහි ගන්වති. පිරිතකට ශ්‍රාවකයන් මෙන් නාට්‍යයකට ප්‍රේක්ෂකයා ද එක සේ වැදගත් වන්නේ ය. පිරිත් නූල ශ්‍රවණය කරන්නන් විසින් අල්ලා ගැනීමෙන් පැහැදිලි වන්නේ පිරිත් සජ්ඣායනය කිරීමේ දී ශ්‍රාවක පිරිසක් සිටීම අත්‍යවශ්‍ය බවත්, පිරිත අවසාන වන තුරු ම ශ්‍රාවකයන් රැඳී සිටීම අපේක්ෂා කරන බවත් ය. මෙය නාට්‍යයකට ද එලෙසින් ම බලපාන කරුණකි.

දොරකඩ අස්න

වර්තමානයේ ඉතා කලාතුරකින් දක්නට ලැබෙන, එහෙත් අතීතයේ වාර්ෂික පුණ්‍ය කර්මයක් වශයෙන් පැවැත්වුණු සති පිරිත් පින්කමේ අවසාන අංගය වශයෙන් සිදු කරනු ලබන්නේ දොරකඩ අස්න චාරිත්‍රය යි. මෙය ඉතා විචිත්‍රවත් ය. දොරකඩ අස්න කියවන දේවදූතයා වශයෙන් වයස අවුරුදු 12-14 පමණ ප්‍රසන්න පෙනුමෙන් යුත් දරුවකු තෝරා ගන්නා අතර ඔහු

උත්සව දිනයට සතියකට පමණ පෙර සිට පන්සලෙහි නතර වී පෙර පුහුණුවක් ලබා ගනියි. සංස්කෘත පද බහුල මිශ්‍ර සිංහල බසින් කියවනු ලබන දොරකඩ අස්නෙහි වචන උච්චාරණය, ශබ්ද මාධුර්යය මෙන් ම ගමන් විලාසය ආදි වූ චර්යා ද මෙම කාලය තුළ දී භික්ෂූන් වහන්සේ විසින් පුහුණු කරනු ලබයි. මෙම චාරිත්‍ර පිළිබඳ ව මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර සිය සිංහල ගැමි නාටකය පොතේ දක්වා ඇති විස්තරය මෙසේ සැකෙවින් දැක්විය හැකි ය.

- සති පිරිත පැවැත්වෙන අවසාන දිනයෙහි උදේ පැය භාගයකින් පමණ මහ පිරිත කියා නිම කළ පසු දේවදූතයා ලෙස සැරසුණු පිරිමි ළමයකු මණ්ඩපයෙහි වැඩ සිටි භික්ෂූන් වහන්සේලාට තල්ගොබයක් පිළිගැන්වීම.
- තෝරා ගත් භික්ෂූන් වහන්සේ නමක් ලිත බලා දේවදූතයා ගමනාරම්භ කළ යුතු හෝරාව තල්පතෙහි ලියා එය ශබ්ද නඟා කියැවීම.
- වෙනත් භික්ෂුවක විසින් විහාර අස්න කියවනු ලැබීම.

  (මෙය සියලු ම විහාරස්ථානවල නම් කියා, එම විහාරවලට හා දේවාලයවලට අධිගෘහීත දෙවි දේවතාවන්ට එදින රාත්‍රියේ මංගල සූත්‍රය හා ආටානාටිය සූත්‍රය ශ්‍රවණය කිරීම සඳහා පැමිණෙන ලෙස ආරාධනා කරමින් වෘත්තගන්ධි ශෛලියෙන් ගයනු ලබන්නකි.)
- දේවාල තල්පත ලිවීම. (මෙය අසල පිහිටි දේවාලයයෙහි දෙවිවරුනට එදින රාත්‍රි පිරිතට පැමිණෙන ලෙස කරනු ලබන සංඥාවකි.)
- තල්පත් සතරක ලියන ලද උක්ත පණිවිඩය අලංකාරවත් කත් ලීයක දෙකොනෙහි එල්ලා කඩුගත් දොරටු පාලයන් අට දෙනකු විසින් පිරිවරන ලද සර්වාභරණ විභූෂිත දේවදූතයා විසින් මහ පෙරහරින් දේවාලයයට ගෙන යාම.
- භික්ෂූන් විසින් දෙවියන් ඉදිරියේ කරණීයමෙත්ත සූත්‍රය සජ්ඣායනා කරනු ලැබීමෙන් අනතුරු ව දේවදූතයා දේවාල තල්පත කියැවීම.
- දේවාලයයෙහි සතර දිසාවෙහි තල්පත් සතර, එල්වා පිරිස ආපසු පැමිණීම.
- කඩුගත් රැකවලුන් විසින් මුර කරන ලද කුටියක රඳවන ලද දේවදූතයා පසු ව රාත්‍රි පිරිතට වඩින භික්ෂූන් ද සමඟ මහ පෙරහරින් පිරිත් මණ්ඩපය වෙත යාම.
- මණ්ඩපයේ දී දොරටු පාලයන් දෙපස ඇති ව දේවදූතයා භික්ෂුවක හා සංවාදයෙහි යෙදීම. (ඉතා විචිත්‍රවත් සංස්කෘත පද බහුල මිශ්‍ර සිංහල බසින් කෙරෙන මෙම සංවාදය ශබ්ද මාධූර්යයෙන් මෙන් ම ගම්භීරත්වයෙන් ද ඉතා ඉහළ ය.)
- භික්ෂුවක ගේ ප්‍රශ්න විචාරීමට අනුව දේවදූතයා දොරකඩ අස්නයෙහි පෙළ ශබ්ද නගා කියැවීම. (මෙයින් කියවෙන්නේ සතර වරම් දෙවිරජවරුන් ප්‍රමුඛ සියලු දෙවියන් එම ස්ථානයට පැමිණ සිටින බව යි.)
- දොරකඩ අස්න කියවා අවසන් වූ පසු භික්ෂුවක විසින් අනුශාසනය සිදු කරනු ලැබීම.

උක්ත චාරිත්‍ර පිළිබඳ ව විමසා බැලීමේ දී සමාරෝපය, සංවාද, වේශභූෂණ හා අංග රචනා භාවිතය, නාට්‍යෝපකරණ භාවිතය වැනි නාට්‍යමය ලක්ෂණ දක්නට ලැබෙන බව පැහැදිලි ය.

ආලවක දමනය

ආලවක දමනය ධර්ම දේශනය ද නාට්‍යමය ලක්ෂණ සහිත බෞද්ධ පූජාවකි. දේශකයාණන් වහන්සේ පිරිස පන්සිල්හි පිහිටුවා ආලවක දමනය සම්බන්ධ කතාව කියන්නට පටන් ගනියි. අලවි රට රජතුමා මුව දඩයමේ යද්දී ආලවක යක්ෂයා මුණ ගැසුණු අයුරුත් එහි දී යක්ෂයාට දෙන ලද ප්‍රතිඥාවකට අනුව දින පතා ඔහුට මිනිස් බිල්ලක් යැවූ අයුරුත් දොළොස් වසරක්

ඉක්මගිය තැන හත්ථාලවක කුමරු බිලි සඳහා ගෙන ගිය අයුරුත්, මෙය දැනගත් බුදු රජාණන් වහන්සේ ආලවක යක්ෂයා ගේ විමානයට වඩින ආකාරයත් එම කතාවෙන් විස්තර වේ. මෙම කතාවේ ඇතැම් කොටස් නාට්‍යානුසාරයෙන් රඟ දක්වයි.

- ආලවක යක්ෂයා ගේ විමානයට බුදුන් වහන්සේ වැඩම කළ අවස්ථාව මෙසේ රඟ දක්වන අවස්ථාවකි. යක් විමන මුරට සිටි ගදහ යක්ෂයා ලෙස වෙස් වළාගත් පුද්ගලයා ඉතා භයානක වෙසක් ගෙන ඇත. අතෙහි කඩුවෙකි. මුහුණෙහි දැලි තැවරීමෙන් යක්ෂවේශය ලබා දී ඇත. ධර්මාසනය අසල ගැවසෙන ගදහ යක්ෂයා හා ධර්මය දේශනා කරන භික්ෂූන් වහන්සේ අතර ඇති වන සංවාදය හා මෙම සිද්ධිය ආලවක යක්ෂයාට දැනුම් දීම පිණිස ගදහයා පිට ව යාම නාට්‍යානුරූපී ව දක්වයි.

- මෙතැන් සිට ගදහයා ගිය හේතුවත්, බුදුන් වහන්සේ ශ්‍රී පාදය දිගු කළ සැණින් විමනෙහි දොරටු විවර වූ බවත්, එහි දී බුදුන් වහන්සේ විමන තුළට පිවිස ආලවක ගේ මිණි මුවා පුටුවෙහි වැඩ හිඳ කාන්තාවන්ට බණ කී බවත්, සාතාගිර, හේමවත යක් සෙනෙවිවරුන් පැමිණ බුදුන් වැඳ බණ අසා පිට ව ගොස් ආලවකට තතු දැන්වූ බවත්, කුපිත වූ යක්ෂයා විමානයට ගිය බවත් දේශකයාණෝ වචනයෙන් විස්තර කරති.

- ඉන් පසු නැවත නිරූපණ ක්‍රියාවලිය සිදු වේ. යටිගිරියෙන් හූ හඬ නගමින් ආලවක යක්ෂයා පැමිණේ. ඉතා බිහිසුණු වෙසක් ඔහු ගෙන් පළ වේ. කළු රතු ඇඳුමින් ද, පයට ගෙජ්ජිවලින් ද සැරසී සිටින ඔහු අත කඩුවකි. බයාදු පෙනුමින් යුතු ගදහ ද ඔහු හා පිවිසෙයි. ආලවක බෙහෙවින් කුපිත ව ඔබ මොබ ඉව කරමින් ඇවිදින අතර දේශකයා ඔහු විසින් අඟුරු, පාෂාණ, ආයුධ, හම්, වැලි, කලල් ආදි මහ වැසි වැස් වූ ආකාරය විස්තර කරයි.

- අනතුරු ව නිරූපණ අවස්ථාවකි. ආලවක යක්ෂයා හා බුදුන් වහන්සේ අතර ඇති වන සංවාදය, යක්ෂයා ගේ අණ කිරීම්වලට තෙවරක් එකඟ වන බුදුන් වහන්සේ සිවු වැනි වර එකඟ නොවීම නිසා උපන් විමතිය, එනයින් යක්ෂයා තුළ බුදුන් කෙරෙහි ඇති වන ගෞරවය යක්ෂයා දමනය වීම ආදි කරුණු මෙහි දී නිරූපිත ය. මෙහි දී කුමරු බිල්ලට ගෙන ආ බව පවසන අතර රජ කුමරකු ලෙස සැරසූ බෝනික්කකු වඩාගත් මිනිසුන් දෙදෙනකු ධර්ම ශාලාවට පැමිණීම යක්ෂයා ලජ්ජාවෙන් බිලිඳා ප්‍රතික්ෂේප කිරීම, ආලවකයා දරුවා බුදුන්ට පිදීම. දරුවාට හත්ථාලවක නම තැබීම ආදි අවස්ථා මෙහි දී නිරූපණය කෙරේ.

  මිලින්ද ප්‍රශ්නය - මෙහි දී ධර්ම දේශකයාණන් වහන්සේ නාගසේන හිමියන් ලෙස ද, ගිහියෙක් මිළිඳු රජතුමා ලෙස ද පෙනී සිටිති. මිළිඳු රජු ලෙස පෙනී සිටින ගිහි පුද්ගලයා රාජාභරණයෙන් සැරසී සිටියි. මිලින්ද ප්‍රශ්නය නම් පෙළෙහි එන ප්‍රශ්න සහ උත්තර උපයෝගී කර ගනිමින් ඔවුහු සංවාදයෙහි යෙදෙති. එම සංවාදවල නාට්‍යමය ස්වභාවයක් දක්නට ලැබේ.

  යුගාසන බණ - එක ම ධර්ම ශාලාවක වැඩ හිඳ ධර්මයෙහි කොටස් මාරුවෙන් මාරුවට දේශනා කිරීම හෝ ප්‍රශ්නෝත්තර මඟින් දේශනා කිරීම හෝ මෙයින් අදහස් කෙරේ. ප්‍රධාන ධර්ම දේශකයා බුදුන් වහන්සේත්, ප්‍රතිඋත්තර දෙන පුද්ගලයා ධර්ම ශ්‍රාවකයාත් ලෙස පෙනී සිට දහම් ගැටලු විසඳති. අතීත කථාවක් වචන මඟින් ප්‍රතිනිර්මාණය කරන මෙම අවස්ථාව නාට්‍යයෙහි වාචික අභිනය යනුවෙන් හැඳින්වේ.

  පූර්ණ වශයෙන් නාට්‍ය නොවුව ද ඉහත කී බෞද්ධ පූජා කර්ම හොඳින් පිරික්සන විට එහි මූලික නාට්‍ය සිද්ධාන්ත වන,

  - කථා වස්තුව
  - අනුකරණය
  - සමාරෝපය
  - අනුරූපණය
  - අවස්ථා නිරූපණය
  - චරිත නිරූපණය
  - සංවාද භාවිතය
  - ප්‍රේක්ෂක සහභාගිත්වය
  - වේෂ භූෂණ
  - ආලෝකය
  - නාට්‍යෝපකරණ ආදි ලක්ෂණ ගැබ් වී ඇති බව කිව හැකි ය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

1. බෞද්ධ පූජා කර්මවලට පාදක වූ කථා වස්තු සහ එම පූජා කර්මවල නාට්‍ය ලක්ෂණ විස්තර කරන්න.
2. බෞද්ධ පූජා කර්මවලට සතර අභිනය යොදා ගත් ආකාරය පැහැදිලි කරන්න.

පැවරුම : බෞද්ධ පූජා කර්මවලින් ඉස්මතු කෙරෙන නාට්‍යමය අංකුර අවස්ථා පිළිබඳ ව විමසුමක් කරන්න.

අතිරේක උදවු :

සිංහල ගැමි නාටකය - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර
ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව - රෝලන්ඩ් අබේපාල
සිංහල බුදු සමයෙහි නාට්‍ය ලක්ෂණ - චන්ද්‍රසිරි පල්ලියගුරු

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.4. : දේශීය නාට්‍ය කලාවේ ප්‍රභවය විමසයි. (දේශීය ශාන්ති කර්මවල නාට්‍යමය ලක්ෂණ විමසීම. උඩරට ශාන්ති කර්ම, කොහොඹා කංකාරිය)

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- උඩරට ශාන්ති කර්ම පිළිබඳ ව විමසයි.
- කොහොඹා කංකාරියට පාදක වූ වස්තුව ප්‍රකාශ කරයි.
- කොහොඹා කංකාරියෙහි නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත අවස්ථා හඳුන්වයි.
- කොහොඹා කංකාරිය ශාන්ති කර්මයෙහි සතර අභිනය භාවිත කොට ඇති ආකාරය විස්තර කරයි.
- සංස්කෘතික හර පද්ධති අගය කරයි.

ක්‍රියාකාරකම 4.4.1 : කොහොඹා කංකාරිය හා එහි එන නාට්‍යමය අවස්ථා

ගුණාත්මක යෙදවුම් : කොහොඹා කංකාරියේ අවස්ථා ඇතුළත් සංයුක්ත තැටි, කොහොඹා කංකාරියේ දර්ශන සහිත ඡායාරූප නොහොත් චිත්‍ර සටහන්
කොහොඹා කංකාරිය පිළිබඳ ව ලියැවුණු ග්‍රන්ථ

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය = ග්‍රන්ථ පරිශීලනය හා ප්‍රායෝගික අධ්‍යයනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- කොහොඹා කංකාරියෙහි දර්ශන ඇතුළත් සංයුක්ත තැටියක් මඟින් හෝ ඡායාරූප / රූප සටහන් මඟින් හෝ එම ශාන්ති කර්මයෙහි අවස්ථා සිසුන්ට නැරඹීමට අවස්ථාව සලසා දෙන්න. පහත සඳහන් කරුණු ද උපයෝගි කර ගනිමින් කොහොඹා කංකාරිය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවක් සිදු කරන්න.

- දේශීය ශාන්ති කර්ම ප්‍රධාන වශයෙන් කොටස් 3කට බෙදේ. එනම් උඩරට, පහතරට හා සබරගමු වශයෙනි. කොහොඹා කංකාරිය යනු උඩරට ශාන්ති කර්මයකි.

- පෞද්ගලික හා පොදු පරමාර්ථ මුල් කරගෙන කොහොඹා කංකාරිය සිදු කරනු ලැබේ. පවුලේ අපල උපද්‍රව දුරු කර ගැනීම, අස්වනු ලබා ගැනීමෙන් පසු ව දෙවියන් හට ස්තුති කිරීම, සශ්‍රීකත්වය හා සෞභාග්‍යය උදෙසා දෙවියන් ගේ පිහිට පැතීම සහ ගමට, රටට සෙත් පැතීම ද මෙම ශාන්තිකර්මය සිදු කිරීමේ අරමුණ වේ.

- හත් කෝරලය, සතර කෝරලය, දුම්බර, හේවාහැට, උඩුනුවර, යටිනුවර ආදි උඩරට ප්‍රදේශවල මෙම ශාන්ති කර්මය සිදු කරනු ලැබේ.

- කොහොඹා යක් තුන්කට්ටුව, ඉරුගල් බණ්ඩාර, කන්දෙ බණ්ඩාර, වීරමුණ්ඩ (යක්ෂයා) මෙලෙයි යකා, වැදි යකා, කඩවර යකා, වලි යකා, කුඩාගුරු, මහගුරු, අඹරාපති හා කළුකුමාර යන යක්ෂයෝ කොහොඹා කංකාරියෙහි දී පුද ලබති.

- කොහොඹා කංකාරියෙහි උපත් කතාව විජයාගමනය හා සම්බන්ධ වූවකි. විජය විසින් කුවේණියට දෙන ලද ප්‍රතිඥාව කඩ කිරීම හේතුවෙන් දිවුරුම කඩ කිරීම හෙවත් ''දිවි දොස්'' පහ කිරීමට කොහොඹා කංකාරිය කළ බවට මතයක් තිබේ. එහෙත් මෙහි උපත් කතාව මීට වෙනස් අදහසක් දක්වයි. විජය රජු ගේ ක්‍රියා කලාපය නිසා කුපිත වූ කුවේණිය විසින් කරන ලද ශාපය හේතුවෙන් ඔහු ගෙන් පසු රජ පැමිණි පඬුවස්දෙව් රජු සිහිනයෙන් දිවියකු දක බියට පත් වෙයි. එයින් රෝගාතුර වූ රජු සුව කිරීම සඳහා (මවු කුසෙන් නූපන්) මලය රජු ගෙන්වා යාගයක් කළ යුතු බව සක් දෙවිඳු ප්‍රකාශ කරයි. ඌරු වෙස් ගත් රාහු අසුරේන්ද්‍රයා මලය රජු ගේ උයන පාළු කොට ඔහු ගේ අවධානය තමා වෙත යොමු කර ගනිමින් ලක් දිව හන්තාන නම් ස්ථානයට ඔහු රැගෙන එයි. මෙහිදි පඬුවස්දෙව් රජු ගේ දිවි දොස දුරු කරන ලෙස සක් දෙවිදු මලය රජුට

පවසයි. මලය රජු බමුණන් සිවු දෙනකු ගෙන්වා විවිධ වෙස් ගන්වා ඔවුන් ලවා උසුළු විසුළු දක්වමින් රජතුමා ගේ සිත සතුටු කොට ලෙඩ සුව කරයි. ඉන් පසු ව කොහොඹා කංකාරිය නම් ශාන්තිකර්මය සිදු කළ බව සඳහන් වේ. මෙහි දී මලය රජු සමග කිත්සිරු, සඳසිරු හා මලසිරු නමැති තුන් බෑ මලරජුන් පැමිණි බවට ද මතයක් තිබේ.

- කොහොඹා කංකාරියේ නාට්‍යමය ජවනිකා වශයෙන් වැදගත් වන්නේ යක්කම් පහ, ගුරුගේ මාලාව සහ ගබඩා කොල්ලය යි. ඌරා යක්කම, නයා යක්කම, වැදියක්කම, දර්පණ යක්කම සහ සීතා යක්කම යනුවෙන් මෙම යක්කම් හැඳින්වේ. මෙයින් වඩාත් ම නාට්‍යමය ජවනිකා ඇතුළත් වන්නේ ඌරා, නයා හා වැදි යක්කම්වල ය.

- ඌරා යක්කම හෙවත් ඌරා විදමන මුඛරි සංවාදයෙන් හා ග්‍රාමීය උපහාසය ගැබ් වූ කියුම්වලින් යුක්ත ය. මලේ රජුගේ උයන පාළු කළ ඌරා ඇල්ලීමට පැමිණෙන අවස්ථාව මෙයින් නිරූපණය කෙරෙන අතර හාස්‍ය රසයෙන් අනූන වේ. යක්දෙස්සකු හා බෙර වාදකයකු අයිලය හා තොරණ අතර ඔබ මොබ ඇවිදිමින් කෙරෙන සංවාදයක දී ඌරා යයි වටහා ගෙන ගෙම්බා, කටුස්සා, ලේනා වැනි සතුන් හමු වූ බව නාට්‍යාකාරයෙන් ඉදිරිපත් කරයි. ඉන් පසු කෙසෙල් බඩ හා ලී කෝටු උපකාර කර ගනිමින් සකස් කරන ඌරු රුව දඩමීමා උපකාර කර ගනිමින් විද මරන ආකාරය නිරූපණය කරයි. ඉන් පසු නොයෙක් විහිළු තහළු කරමින් ඌරා ගේ මස් ගමේ සියල්ලන්ට ම බෙදා දෙන අයුරු කවියෙන් ප්‍රකාශ කරයි.

- සෝලිය ගුරුට සම්මාදම් කර දානයක් දීමට යන අතරමඟදී නාගයකු විසින් දෂ්ට කරන ලද පුවතක් නයා යක්කමෙහි සඳහන් වේ. වී කෙටීම, පෙළීම, ළිප්ගල් තැබීම, හාල් සේදීම, ළිප් බැඳීම, ළිප මත තැබීම ආදි සියලු ක්‍රියාකාරකම් මෙහි දී අනුකරණය කරති. දන් කඩ (කද) ගෙන යද්දි එය බිම වැටෙන අතර ආහාර සුවඳට තුඹසෙන් එළියට එන නාගයා යද්දෙස්සාට දෂ්ට කරයි. කීප වරක් ම මෙම දෂ්ට කිරීම හා විකට මන්ත්‍ර කියා විස බැස්වීම ද සිදු කෙරේ.

- වැදි යක්කම හෙවත් වැද්දන් ගිවිස්සීම යනු කංකාරිය සඳහා වැද්දන් ගේ සහයෝගය ලබා ගැනීමට ඔවුන් කැඳවා සංග්‍රහ කරන ආකාරය නිරූපණය කරනු ලබන නාට්‍යමය අවස්ථාවකි. පැදුරක්, කුඩා දුන්නක්, ඊ තලයක්, අඹ කොළ හා නව කොළ අතු මිටියක්, පුවක් මල්, ලී කොටයක්, එළවුළු පැසක් ආදි දේ මෙහි දී භාවිත කෙරේ. යද්දෙස්සා හා බෙර වාදකයා අතර ඇති වන සංවාදය සමග ම දෙහි ගා වැද්දා නැවීමේ ක්‍රියාවලිය සිදු කොට කවා පොවා සන්තර්පණය කරනු ලැබේ. මෙහි සංවාද හාස්‍යෝත්පාදක ඒවා වන අතර භාෂා භාවිතය ඉතා වැදගත් වේ.

ගුරුගේ මාලාව

යක්දෙස්සකු හා බෙර වාදකයකු අතර ඇති වන සංවාදයක් මඟින් ඉදිරිපත් කරනු ලබන නාට්‍යමය අවස්ථාවකි. සිංහල හරි හැටි උසුරුවනු නොහැකි විදේශිකයකු ලෙස ගුරු බෙර වාදකයා හා සංවාදයෙහි යෙදෙයි. නල්ලසාමි හෙවත් ගුරු ගේ චරිතය නිරූපණය කිරීමේ දී අනුකරණ ක්‍රියාවලිය සිදුවේ.

ගබඩා කොල්ලය

කංකාරිය අවසානයේ මුව මල විදීමට පෙර ගබඩා කොල්ලය සිදු කෙරේ. කංකාරිය සඳහා ගම් වැසියන් ගෙන් එකතු කරන ලද සියලු බඩු බාහිරාදිය (ආහාර ද්‍රව්‍ය ආදි) තැන්පත් කොට ඇති ස්ථානය ගබඩාව නම් වේ. හාස්‍යය දනවන කෙටි සංවාදයන්හි යෙදෙමින් ප්‍රධාන යද්දෙස්සා සෙසු අය සමඟ ගබඩාවට වැද එම ද්‍රව්‍ය අන් අයට බෙදා දීම සිදු කරයි. ඉන් පසු ගබඩාවට ගිනි අවුළා තෙවරක් හූ කියා නික්ම යන්නේ වස් දොස් දුරු කිරිමේ චාරිත්‍රයක් ලෙස ය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- උඩරට ශාන්ති කර්ම හඳුන්වන්න.
- එම ශාන්ති කර්මවල පරමාර්ථ විස්තර කරන්න.
- ශාන්ති කර්මයට පාදක වූ වස්තුව පැහැදිලි කරන්න.
- කොහොඹා කංකාරියෙ නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත අවස්ථා විස්තර කරන්න.
- කංකාරියෙහි සතර අභිනය භාවිත කොට ඇති ආකාරය සාකච්ඡා කරන්න.

අතිරේක උදවු :

සිංහල ගැමි නාටකය	-	මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර
ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව	-	රෝලන්ඩ් අබේපාල
සිංහල බුදු සමයෙහි නාට්‍ය ලක්ෂණ	-	චන්ද්‍රසිරි පල්ලියගුරු

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.4 : දේශීය නාට්‍ය කලාවේ ප්‍රභවය විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- දහ අට සන්නිය පහත රට ශාන්ති කර්ම අතර දක්නට ලැබෙන විචිත්‍ර ශාන්තිකර්මයක් බව පවසයි.
- දහ අට සන්නියෙහි උපත් කතාව විස්තර කරයි.
- අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.
- දහ අට සන්නිය නැරඹීමට කැමැත්ත දක්වයි.
- එහි ඇති සංස්කෘතික වටිනාකම අගය කරයි.

ක්‍රියාකාරකම 4.4.3 : පහතරට ශාන්ති කර්ම - දහ අට සන්නිය

ගුණාත්මක යෙදැවුම් :
- දහ අට සන්නියෙහි දර්ශන ඇතුළත් සංයුක්ත තැටියක් හෝ ඡායාරූප / චිත්‍ර සටහන් කීපයක්
- සන්නි වෙස් මුහුණුවල රූප සටහන්
- සංවාද හා කවි පිටපත්
- දහ අට සන්නිය ගැන ලියැවුණු ලේඛන

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය හා නිරීක්ෂණ

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සන්නියකුම යනු නාට්‍යමය ලක්ෂණවලින් අනූන පහත රට ශාන්ති කර්මයකි. මහා කෝල යක්ෂයා ප්‍රමුඛ කොට ඇති යක්ෂයෝ දහ අට දෙනෙක් මෙහි දී පිදවිලි ලබති. මෙම යක්ෂයන් ගෙන් සංකේතවත් කෙරෙන්නේ මනුෂ්‍යයාට වැලඳෙන විවිධ රෝගාබාධ ය.

- මෙම ශාන්ති කර්මයෙහි පරමාර්ථය වන්නේ මිනිසා ලෙඩ කරවන සියලු ලෙඩ රෝග ද, ඇස්වහ කටවහ හෝවහ දෝෂාදි සියලු ව්‍යසන ද දුරු කොට රෝගියා මානසික ප්‍රතිකාර මගින් සුවපත් කිරීම යි.

- මෙහි උපත් කතාව සැකෙවින් මෙසේ ය.

  දඹදිව විසූ සංඛපාල නම් රජතුමා ගේ බිසව අසුපාලි නම් වූවා ය. රජතුමාට යුද්ධයක් සඳහා යාමට සිදුවන විට ඇය ගැබ් ගෙන සිටියා වුව ද රජතුමා එය දැන සිටියේ නැත. ගර්භණී බිසව මී අඹ කෑමේ දොළකින් පෙළුණු අතර අවාරයේ බොහෝ අමාරුවෙන් මී අඹ ගෙඩියක් සපයා දීමට ඇමතිවරු සමත් වූහ. බිසව මී අඹ කනු දුටු සේවිකාවකට ද අඹ කෑමට සිත් වූ නමුදු බිසව ඇයට නොදී ම මී අඹ අනුභව කළා ය. පළි ගැනීමේ චේතනාවෙන් යුත් කාන්තාව යුද්ධය දිනා එන රජු පෙරමඟට ගොස් බිසව මහ ඇමති හා අනාචාරයේ යෙදී ගර්භණී ව ඇති බව ප්‍රකාශ කළා ය. නිදහසට කරුණු නොවිමසා ම රජතුමා බිසව දෙපළු කොට මරණයට පත් කළේ ය. එහි දී උපත ලද දරුවා මව ගේ රුධිරය පානය කරමින් හැදී වැඩී ''රාජමුළු සන්නි යකා'' නමින් ප්‍රසිද්ධ විය. සිය මව නිරපරාදේ මරා දැමූ පළිය ගන්නට සිතූ ඔහු වනයට ගොස් බෙහෙත් වර්ග අඹරා ගුළි 18ක් කොට ඒවාට ජීවය ලබා දී යක්ෂයන් බවට පත් කළේ ය. විසාලා නුවරට ගොස් තුන්බිය ඇති කරනු ලැබූ මොවුන් 18 දෙනාට දොළ පිදේනි ගන්නට වරම් ලබා දුන් බුදු රජාණන් වහන්සේ රතන සූත්‍රය දේශනා කොට විශාලා නුවරට සෙත් ශාන්තිය ලබා දුන් බව මෙම උපත් කතාවේ සඳහන් වේ.

සන්නි යකුම් යාගයේ නාට්‍යමය ලක්ෂණ ඇතුළත් අවස්ථා

- සූනියම් යක්ෂණිය යාග භූමියට සම්ප්‍රාප්ත වීම.

  මෙහි දී සූනියම් යක්ෂණිය පළමු ව සුරූපී තරුණ කාන්තාවක ලෙසත්, ඉන් පසු ගර්භණී

කාන්තාවක ලෙසත් අවසානයේ දරුවකු අතැති වත් යාග භූමියට පැමිණෙයි. මෙහි චරිත නිරූපණය කරන්නෝ පිරිමි යකැදුරෝ ය.

- දහ අට සන්නිය යාග භූමියට පැමිණීම.

1. මරු සන්නිය	2. අමුක්කු සන්නිය
3. වෙඩි සන්නිය	4. කණ සන්නිය
5. බිහිරි සන්නිය	6. ගොළු සන්නිය
7. කොර සන්නිය	8. මුර්තු සන්නිය
9. ගුල්ම සන්නිය	10. ජල සන්නිය
11. ගිනි සන්නිය	12. පිස්සු සන්නිය
13. වාත සන්නිය	14. බූත සන්නිය
15. පිත් සන්නිය	16. අබූත සන්නිය
17. දේව සන්නිය	18. කෝල සන්නිය

ඒ ඒ සන්නිවලට ආවේණික වෙස් මුහුණු පැලඳ ගත් යකැදුරන් යාග භූමියට පැමිණ ගුරුන්නාන්සේ හා සංවාදයෙහි යෙදීමත්, නර්තනයෙහි යෙදීමත්, උපහාසයට ලක් වීමත්, අවසානයේ රෝගියාට සෙත් පතා පිට ව යාමත් මෙම සියලු සන්නි ඉදිරිපත් කිරීමේ පොදු කාර්ය භාරය වේ. ඔවුහු දොළ කැප ගෙන, දෝෂ මුදා, ආතුරයාට සෙත් දී නික්ම යති. උක්ත සන්නිවලට අමතර තවත් සන්නි කීපයක් ගැන ද සඳහන් වන අවස්ථා ඇත.

සීතල/වෙවුලුම් සන්නිය	නාග සන්නිය
දෙමළ සන්නිය	කාල සන්නිය
සෙලෙස්මා සන්නිය	ඉරමුදුන් සන්නිය
කපෝල සන්නිය	විකාර සන්නිය
ඔල්මාද සන්නිය	ඒකපාත සන්නිය ආදි නම්වලින් ඒවා හැඳින්වේ.

ප්‍රදේශානුබද්ධ ව මෙම වෙනස්කම් සිදු වූවා විය හැකි ය.

- මහා කෝල යක්ෂයා යාග භූමියට පැමිණීම.

- සන්නි යකුම් යාගයේ රංගරූපී අවස්ථාවල දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ
  - සංවාද හා ගායනා භාවිත කිරීම
  - සමාරෝපය
  - සතර අභිනය යොදා ගැනීම
  - රංගෝපකරණ භාවිතය
  - රංග භූමි පසුතල නිර්මාණ භාවිතය
  - වාද්‍ය භාණ්ඩ භාවිතය
  - ආලෝක භාවිතය
  - වේෂභූෂණ භාවිතය

  (වෙස් මුහුණු පැලඳීම මෙහි ලා විශේෂයෙන් වැදගත් වේ)

- මෙහි සංවාද භාවිතයේ දී යක්ෂයා නිර්දය උපහාසයට ලක් කරමින් ආතුරයා ගේ සිතේ ඇති බිය නැති කරයි. සංවාදවල බොහෝ විට ව්‍යංගාර්ථ දක්නට ලැබේ. ලිංගික හැඟීම් පවා වක්‍රෝක්තියෙන් කියා පෑමට මෙම සංවාද උපයෝගි කරගෙන තිබේ. කවි ගායනය බොහෝ සෙයින් යොදා ගනු ලබන අතර උදාහරණ වශයෙන් සන්නි යකුන් රඟ මඬලට කැඳවීම දැක්විය හැකි ය. ඒ ඒ සන්නියට අදාළ රෝග ලක්ෂණ විස්තර කරමින් රඟ මඩලට කැඳවන යක්ෂයාට

මන්ත්‍ර කියා ගොටු හා පිදවිලි කැප කොට අට විසි බුදු ගුණ අනුහසින් කළ ලෙඩ හංග කිරීම සිදු කරනු ලැබේ.

- මෙහි වාද්‍ය භාණ්ඩ ලෙස පහත රට බෙරය හෙවත් යක් බෙරය භාවිත වේ. මීට අමතර ව තාලම් පට ද භාවිත වේ. පාදවල බැඳි ගෙජ්ජිවල හඬ ද නර්තනයට සමගාමී ව ශ්‍රවණය වේ.

- පිරිමි ඇදුරෝ කාන්තා චරිත ආදී සියලු චරිත නිරූපණය කරති. විශේෂයෙන් සූනියම් යක්ෂණිය රඟ මඬලට අවතීර්ණ වන අවස්ථාවේ තරුණියක, ගැබිනියක හා මවක ලෙස භූමිකා කීපයක් නිරූපණය කරනුයේ පිරිමි ඇදුරන් බව සඳහන් කළ යුතු ය.

- රංගෝපකරණ බොහෝවක් මෙම නිරූපණවල දී යොදාගන්නා බව පෙනේ. වස්දණ්ඩ, දෙකොන විලක්කුව, කටකලියාව, දුනු පන්දම, තුවක්කුව, මුගුරු, කෙසෙල් පතුරු උපයෝගී කර ගෙන සාදා ගනු ලබන ආප්ප, කැවුම්, කෙසෙල් ගෙඩි වැනි කෑම වර්ග, සන්නස් පත්‍රය, දුම්මල කබල, කුකුළකු, ඊගස, චාමර, සළුව ආදිය මේ සඳහා යොදාගැනේ.

- මෙම යාගයේ දී යොදා ගන්නා පිල්ලු වීදිය, මල් යහන, මල්බලි, දහ අට පාළි තොරණ, සූනියම් වීදිය, කත්තිරික්ක ආදිය රංගභූමි අලංකරණ හා සමාන කොට දැක්විය හැකි ය.

- වේෂභූෂණ භාවිතයේ දී විශේෂයෙන් සන්නි මුහුණු සඳහන් කළ හැකි අතර, ඒ ඒ චරිතවලට උචිත ඇඳුම් පැලැඳුම් භාවිත කරන අයුරු දක්නට ලැබේ. එම වේෂභූෂණවලින් සමාරෝපය විය යුතු චරිතය හුවා දැක්වේ.

- සන්නි යකුම හෙවත් දහ අට සන්නිය විශේෂයෙන් භාවිත කරනු ලබන්නේ රෝග නිවාරණ ශාන්ති කර්මයක් ලෙස ය. මාතර සම්ප්‍රදායය හා බෙන්තර සම්ප්‍රදායය යනුවෙන් සම්ප්‍රදාය් දෙකක් යටතේ මෙම යාගය පැවැත්වේ. බෙන්තර ගුරුකුලයේ සන්නි යකුම් යාගය නාට්‍යමය ලක්ෂණයේ අනූන ය. උගුර වණ වීම, උගුරේ සෙම්ගෙඩි හට ගැනීම, සන්ධි ඉදිමීම, අත්පා කොරවීම, ඔල්මාදය, බඩේරුජාව, පෙනීම හා ඇසීම දුර්වල වීම යනාදී රෝග රාශියක් නිවාරණය කිරීමට සන්නි යකුම් යාගය සිදු කරනු ලබයි. ප්‍රධාන වශයෙන් ම මෙමඟින් සිදු කරනුයේ ආතුරයාට මානසික විරේකයක් ලබා දීම යි. මෙහි ලා දයානන්ද ගුණවර්ධනයන් විසින් කර ඇති පහත සඳහන් ප්‍රකාශය වැදගත් වේ.

  ''සන්නි යකුම යනු මිනිසුන් හා යක්ෂයන් (ලෙඩ රෝග) අතර ඇති ගැටුමයි. නාට්‍යමය බිජය එයයි. මිනිසාත් යක්ෂයාත් අතර ඇතිවන ගැටුමින් යක්ෂයා පරාද වේ. සමස්තයක් වශයෙන් ගත් කල යක් තොවිලය හාස්‍යෝත්පාදක නාට්‍යයක ස්වරූපය ගනියි''.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- දහඅට සන්නියේ උපත් කතාව විස්තර කරන්න.
- එහි නාට්‍යෝචිත අවස්ථා සඳහන් කරන්න.
- දහඅට සන්නියේ අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ පැහැදිලි කරන්න.
- දහ අට සන්නියේ අවස්ථා ප්‍රතිනිර්මාණය කරන්න.
- දහ අට සන්නියේ සංස්කෘතික වටිනාකම පැහැදිලි කරන්න.

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.4 : දේශීය නාට්‍ය කලාවේ ප්‍රභවය විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- රට යකුම හෙවත් රිද්දි යාගය ශාන්ති කර්මය නරඹයි.
- එහි නාට්‍යමය අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.
- රට යකුම යාගයේ ඇති මනෝ චිකිත්සක ක්‍රියාදාමය විස්තර කරයි.
- එහි ඇති දේශීය සංස්කෘතික ලක්ෂණ ගවේෂණය කරයි.
- දේශීය ශාන්තිකර්ම හා බැඳුණු ශිල්පී පරම්පරා පිළිබඳ ව විස්තර එක්රැස් කරයි.

ක්‍රියාකාරකම 4.4.4 : පහත රට ශාන්ති කර්ම - රට යකුම හෙවත් රිද්දි යාගය

ගුණාත්මක යෙදැවුම් :
- රිද්දි යාගය / යාගයෙහි අවස්ථා දැක්වෙන සංයුක්ත තැටි / ඡායාරූප / රූපසටහන්
- රිද්දි යාගය පිළිබඳ ව ලියැවුණු පොත්පත්
- රිද්දි යාගයෙහි දී භාවිත කරන සංවාද කොටස්

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය = ග්‍රන්ථ පරිශීලනය හා නිරීක්ෂණය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- රිද්දි යාගය සංයුක්ත තැටිය ක්‍රියාත්මක කර හෝ ඡායාරූප පෙන්වමින් හෝ පාඩමට පිවිසෙන්න. පහත සඳහන් කරුණු අවධාරණය වන අයුරින් සිසුන් හා සාකච්ඡා කරමින් පාඩම ගොඩ නඟන්න.

- පහත රට ශාන්ති කර්ම අතර ස්ත්‍රීන් සඳහා පමණක් කෙරෙන ශාන්ති කර්මයක් ලෙස රිද්දි යාගය හෙවත් රට යකුම සඳහන් කළ හැකි ය. මාතර සම්ප්‍රදායය හා බෙන්තර සම්ප්‍රදායය යනුවෙන් සම්ප්‍රදායයන් දෙකක් යටතේ මෙම ශාන්ති කර්මය සිදු කෙරේ. එහෙත් පොදුවේ ගත් කළ මෙම සම්ප්‍රදාය දෙක ම එක ම අරමුණක් සඳහා ක්‍රියා කරයි. පෙළපාළිවලට පෙර යකැදුරෝ දෙදෙනෙක් සංවාදයෙහි යෙදෙමින් ශාන්ති කර්මය හඳුන්වා දෙති.

- රිද්දි යාගය සිදු කිරීමෙහි අරමුණු වශයෙන් පහත සඳහන් කරුණු දැක්විය හැකි ය.
  1. ස්ත්‍රීන්ගේ වඳ භාවය නැති කොට ඔවුන්ට දරු සම්පත් ලබා දීම.
  2. ගර්භණී ස්ත්‍රීන් ගේ ගර්භයට ආරක්ෂාව ලබා දීම.
  3. දරු ප්‍රසූතිය පහසුවෙන් සිදු කිරීම සඳහා අවශ්‍ය මානසික ශක්තිය ලබා දීම.
  4. උපත ලැබූ දරුවා ගේ ආරක්ෂාව තහවුරු කිරීම.

- රිද්දි බිසවු හා ඇය ගේ දූවරු හත් දෙනා මෙම ශාන්ති කර්මයේ දී පූජා ලබති. රිද්දි බිසවුන් සම්බන්ධ මත කීපයක් ජනප්‍රවාදයෙහි පවතියි. ඉන් එක් මතයකට අනුව මහාමේරු පර්වතය පළාගෙන හටගත් ගින්නකින් කල්ප ගණනාවකට පෙර ඔවුහු උපත ලබති. ගැබ් ගත් කාන්තාවනට විණ කරන යකුන් ලෙස ඔවුහු ප්‍රකට වූහ. මොවුන් ගේ නායිකාව වන රිද්දි බිසව එසේ ගින්නෙන් උපත ලැබූ මහ බඹු ගේ බිරිය බවට පත් වී දූවරුන් සත් දෙනකු ලැබුවාය. නාමල් කුමාරි, සෝමල් කුමාරි, ඉද්දමල් කුමාරි, සපුමල් කුමාරි, පිච්චමල් කුමාරි, වදමල් කුමාරි, සිද්දිමල් කුමාරි යනුවෙන් හැඳින්වුණු ඔවුන් පසු ව මහමෙර මුදුනට ගොස් ගින්නෙන් උපන් අනික් යකුන් හා එක් ව වෙසමුණි ගේ සේවිකාවන් වූ බව ජනප්‍රවාදයෙහි දැක්වේ.

වඳ බිසවුන් වූ මොවුන් හේනක් කොටා, කපු වවා, නූල් කැට, සිවුරු සකස් කොට දීපංකර බුදු රජාණන් වහන්සේට පූජා කොට වඳ බවින් අත් මිදුණු බවත්, එම අවස්ථාවේ දී ස්ත්‍රීන් ගේ වඳ බව නැති කිරීමට හා ගැබ් ආරක්ෂා කිරීමට ඔවුන් දීපංකර බුදුන් ගෙන් වරම් ලැබූ බවත් පැවසේ.

- මාතර ප්‍රදේශයේ ප්‍රචලිත තවත් කතාවක් වන්නේ ගැබ් ගත් කාන්තාවක ''ආහරණ ඇල්ලේ'' සමයං වේලාවේ දී නැමට ගොස් රෝගාතුර වූ බවත්, බමුණු උපදෙස් මත ඇයට රට යකුම නම් ශාන්ති කර්මය කළ බවත් ය. එහි දී රිද්දි බිසෝවරුන් හත් කට්ටුව මෙසේ නම් කරනු ලැබ ඇත. මුදුන් මාල, ධර්මමාල, කොණ්ඩමාල, ගිරිමේකල, ඕංකාර, රත්න මාල, රිද්දි මාලා හෙවත් එර්දිමාලා යනුවෙනි. ඔවුන් ද පෙර කී පරිදි දීපංකර බුදුන්ට සිවුරු සකස් කොට පූජා කිරීමෙන් දරු සම්පත් ලබා ගත් බව කියැවේ.

- ශාන්ති කර්මයේ දී සිදු කැරෙනුයේ උක්ත කතා පුවත අනුකරණය කිරීම යි. රිද්දි බිසවුන් ස්නානය කොට සැරසුණු ආකාරය නානුමුරය හෙවත් දොළහ පෙළපාළියේ දී නිරූපණය කැරේ. හේන කොටා, කපු සිටුවා, සළු වියා, සිවුරු සකස් කොට පූජා කිරීම කපුයක්කාරියෙහි දී නිරූපණය කැරේ. දරුවකු ලබා ගෙන නළවන ආකාරය හා දරුවා ආතුරයා අතට ලබා දීමෙන් ශාන්ති කර්මයේ (කූට) ප්‍රාප්තියට එළැඹීම දරු නැළැවිල්ලේ දී අනුකරණය කැරේ.

- මෙම ක්‍රියාවලියේ නාට්‍යමය ලක්ෂණ දක්නට ලැබේ. අනුකරණය, අනුරූපණය, අවස්ථා නිරූපණය, සමාරෝපය, සංවාද භාවිතය, ප්‍රේක්ෂක සහභාගිත්වය ඇතුළු ව සතර අභිනය ම මෙම අනුකරණ ක්‍රියාදාමය සඳහා යොදා ගෙන තිබේ.

- මෙහි නාට්‍යමය භාවිතය ගැන සෙවීමේ දී පහත සඳහන් කරුණු ආශ්‍රිත ව වැඩිදුර අධ්‍යයනය කරන්න.

  - මේ සඳහා යොදා ගන්නා මඩුව ''රංග භූමිය'' වශයෙන් සැලකිය හැකි ය. තොරණ සතකින් සමන්විත වීදියක් වන මෙය ''මල් මඩුව'' නවමල්පාය රටයකුන් වීදිය ආදි නම්වලින් හැඳින්වේ. නාට්‍යමය ලක්ෂණ වශයෙන් ගත් කල්හි මෙය ''රංග භූමි අලංකරණ'' ලෙස සැලකිය හැකි ය.
  - නානු මුරය, කපු යක්කාරිය හා දරු නැළැවිල්ල ''අවස්ථා නිරූපණය'' සඳහා නිදසුන් ය. මෙම ක්‍රියාවලියේ දී ''අනුකරණය'', ''නිරූපණය'' හා ''අනුරූපණය'' යොදා ගැනේ.
  - ගොප් කොළ, කෙසෙල් පතුරු ආදිය උපයෝගි කර ගෙන තැනූ උපකරණ හා ලීයෙන් තැනූ බෝනික්කා ආදිය ''නාට්‍යෝපකරණ'' වේ. සංවාද, ගායනා, වාදනය, නර්තනය, වේෂභූෂණ, භාව ප්‍රකාශනය ආදි සතර අභිනයට අදාළ සියලු අංග මෙහි ක්‍රියාත්මක වේ.
  - ස්ත්‍රීන් උදෙසා සිදු කැරෙන ශාන්ති කර්මයක් වුව ද මෙහි සියලු නිරූපණ සිදු කරනු ලබන්නේ පිරිමි යකැදුරන් විසිනි. එසේ ම යාතු කර්මය හා සම්බන්ධ සියලු කටයුතු සිදු කරන්නේ ද පිරිමින් පමණක් වීම විශේෂත්වයකි.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- රට යකුම උපත් කතාව විස්තර කරන්න.
- රට යකුමේ නාට්‍යමය අවස්ථා පැහැදිලි කරන්න.
- රට යකුමෙහි ඇති මනෝචිකිත්සක ක්‍රියාදාමය විස්තර කරන්න.
- එම ශාන්ති කර්මය හා බැඳුණු ශිල්ප පරම්පරා පිළිබඳ ව කරුණු එක් රැස් කරන්න.

පැවරුම :

1. නානු මුරය හා සම්බන්ධ අනුකරණ ක්‍රියාවලිය නිදසුන් සහිත ව විස්තර කොට එය ප්‍රතිනිර්මාණය කරන්න.
2. රිද්දි යාගය හෙවත් රට යකුම හා සම්බන්ධ උපත් කතා පිළිබඳ ව මත විමසුමක් කරන්න.

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.4 : දේශීය නාට්‍ය කලාවේ ප්‍රභවය විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- සූනියම් යාගයට පසුබිම් වූ උපත් කතාව ප්‍රකාශ කරයි.
- සූනියම් යාගයේ ප්‍රධාන පෙළපාළි හඳුන්වයි.
- සූනියම් යාගයෙහි අරමුණු විස්තර කරයි.
- සූනියම් යාගය හා බැඳුණු නාට්‍යමය ලක්ෂණ විමසයි.
- දේශීය සංස්කෘතික ලක්ෂණ සූනියම් යාගය ඇසුරින් ලේඛනගත කරයි.

ක්‍රියාකාරකම 4.4.4 : පහත රට ශාන්ති කර්ම - සූනියම් යාගය

ගුණාත්මක යෙදැවුම් :
- සූනියම් යාගයෙහි අවස්ථා දක්වෙන සංයුක්ත තැටියක් හෝ ඡායාරූප හෝ
- වඩිග පටුන නර්තනයෙහි ඡායාරූප / චිත්‍ර සටහන්
- සූනියම් යාගය පිළිබඳ ව ලියැවුණු ග්‍රන්ථ

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය හා සාකච්ඡා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- වඩිග පටුනෙහි විදෙස් බමුණන් රඟ මඬලට සම්ප්‍රාප්ත වන අවස්ථාව සිසුන් ලවා ප්‍රතිනිර්මාණය කරවමින් පාඩමට පිවිසෙන්න. පහත සඳහන් කරුණු ද ආශ්‍රය කර ගනිමින් සිසුන් සමඟ සූනියම් යාගය පිළිබඳ සාකච්ඡාවක නිරත වන්න.

- පහතරට ශාන්ති කර්ම අතර නාට්‍යමය ලක්ෂණවලින් අනූන වූ තවත් ශාන්ති කර්මයක් ලෙස සූනියම් යාගය වැදගත් වේ. වින කැපුම් යාගය, මැණික්පාල ශාන්තිය ඔඩ්ඩිස ශාන්තිය යන නම්වලින් ද මෙම ශාන්ති කර්මය හැඳින්වේ.

- මෙය බොහෝ විට පෞද්ගලික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කරනු ලබන ශාන්ති කර්මයකි. යම්කිසි පුද්ගලයකුට හෝ පවුලකට හෝ කොඩිවිනයක් / හූනියමක් සිදු කර ඇතැයි හැඟේ නම් එම විණ කැපීම සඳහාත්, ඔඩ්ඩිස හෙවත් සූනියම් යක්ෂයා ගෙන් පැමිණෙන උවදුරු දුරු කිරීම සඳහාත් මෙම ශාන්ති කර්මය සිදු කරනු ලැබේ.

  ආතුරයාට මානසික විරේකයක් හා විනෝදාස්වාදය ලබා දීම ද මෙම ශාන්ති කර්මයෙහි අරමුණු අතර වේ.

- මෙහි උපත් කතාව ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස්කම් සහිත වුව ද පොදුවේ ගත් කල කතා සාරය එකක් ම වන්නේ ය. මහා සම්මත රජතුමා ගේ බිසව වූත්, විෂ්ණු දෙවියන් ගේ සහෝදරිය වූත් මැණික්පාල බිසව මෙහි කථා නායිකාව වන්නී ය. මැණික්පාල කුමරිය කෙරෙහි ඇල්මෙන් සිටි වසවර්ති මාරයා මහා සම්මත රජු යුද පිණිස මාලිගයෙන් බැහැර ගිය අවස්ථාවක ඇයගේ කුටියට ඇතුළු වීමට ගත් උත්සාහය ව්‍යර්ථ වීම නිසා කෝපයට පත් ව අවිචි මහා නිරයෙන් ගිනි කඳක් ද, විෂ පොළඟකු ද මවා බිසව ගේ යහන් ගැබට දැම්මේ ය. මන්ත්‍ර බලයෙන්, දද කුෂ්ටවලින් වැසී ගිය සිරුරැති බිසව විරූපී තැනැත්තියක් වෙයි. දේව සභාවෙහි මේ ගැන සිදු කෙරෙන සාකච්ඡාවක ප්‍රතිඵලයක් ලෙස අජාකූට පර්වතයෙහි වෙසෙන ඔඩ්ඩිස ඍෂිවරයා ඇතුළු ඍෂිවරුන් හත් දෙනකු විසින් මෙම සූනියම් යාගය සිදු කොට බිසව සුවපත් කරනු ලැබුවා ය.

- තෙරුවන් නැමඳීමේ පූජාව, දෙවිවරුන් මල් යහනට කැඳවීම, තුන් යම යකුන්ට සූනියම් වීදිය කැප කිරීම, නානු මුරය, හත් අඩිය, දොරටු පැනීම, වඩිග පටුන, වැල් වළලු තීන්දුව, අටමගල තීන්දුව, පුහුල් තීන්දුව මෙම ශාන්ති කර්මයෙහි ප්‍රධාන පෙළපාළි වේ.

- මෙහි වඩාත් ම විචිත්‍රවත් ජවනිකාව වන්නේ නාට්‍යාවස්ථා රසක් සහිත වඩිග පටුන යි. මැණික්පාල බිසවට වසවත් මරු විසින් කරන ලද හූනියම කැපීමට වඩිග දේශයෙන් පැමිණි යාගයෙහි හසළ බමුණෝ මෙයින් නිරූපණය කෙරෙති. වඩිග පටුන පිළිබඳ මත කීපයක් වේ. මල්සර නම් රජකුට නාග පට්ටනමෙන් හා වඩිග දේශයෙන් පැමිණි බමුණන් මෙම යාගය පැවැත්වූ බවත් මාලිස තෙරුන් මෙය සිංහලයට නැගූ බවත් රාජ ඔඩ්ඩිසයේ සඳහන් වේ. නාට්‍යමය ලක්ෂණ සේ සැලකෙන කථා ප්‍රවෘත්තියක් තිබීම, අනුකරණය හා අනුරූපණය, සංවාද භාවිතය, වාද්‍ය භාණ්ඩ යොදා ගැනීම, චරිත හා භූමිකා, සමාරෝපය, වේෂභූෂණ හා අංග රචනා, රංග භූමිය, රංග භූමි අලංකරණ නාට්‍යෝපක්‍රම භාවිතය, ප්‍රේක්ෂාව, ප්‍රේක්ෂක සහභාගිත්වය, නාට්‍යෝපකරණ, ආලෝක භාවිතය ආදි වශයෙන් සතර අභිනය මෙහි ලා භාවිත කොට ඇත.

  පාලි, සංස්කෘත, දෙමළ ආදි භාෂා 18කින් මෙහි දී බමුණෝ සංවාදයෙහි යෙදෙති. සංවාද හාස්‍ය රසයෙන් යුක්ත ය. වැරදි උච්චාරණ බහුල ය. වාචික අභිනය ඉතා රසවත් ව මෙහි දක්නට ලැබේ. යකැදුරන් මෙහි දී අඳින රංග වස්ත්‍ර ඉතා ම විචිත්‍ර ය. බමුණු විලාසය උද්දීපනය වන ආකාරයෙන් වේෂභූෂණ හා අංග රචනය යොදා ගෙන තිබේ. සූනියම් වීදිය ඇතුළු රංගභූමි අලංකරණ ද ආහාර්ය අභිනයට නිදසුන් වේ. පොදුවේ සතර අභිනය ම මෙහි දක්නට ලැබෙන අතර, අතීත කතාවක් සතර අභිනය යොදා ගනිමින් ඉදිරිපත් කරනු ලබන නාට්‍යමය අවස්ථාවක් ලෙස මෙය හැඳින්විය හැකි ය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සූනියම් යාගයේ උපන් කතාව විස්තර කරන්න.
- සූනියම් යාගයේ ප්‍රධාන පෙළපාළි හඳුන්වන්න.
- සූනියම් යාගයෙහි නාට්‍යමය ලක්ෂණ විමසන්න.
- සූනියම් යාගයෙහි අරමුණු ප්‍රකාශ කරන්න.
- සූනියම් යාගයෙහි දක්නට ලැබෙන සංස්කෘතික ලක්ෂණ විමසන්න.

පැවරුම :

1. වඩිග බමුණන් හා සම්බන්ධ ක්‍රියාදාමය වේදිකාව මත ප්‍රතිනිර්මාණය කරන්න.
2. ''වඩිග පටුන ශාන්ති කර්මය යනු පහත රට ශාන්ති කර්මවල දී සතර අභිනය ඉතා සාර්ථක ව භාවිත කළ අවස්ථාවකි'' විමසන්න.

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.4 : දේශීය නාට්‍ය කලාවේ ප්‍රභවය විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- මඩු ශාන්ති කර්මයෙහි අරමුණු ප්‍රකාශ කරයි.
- මඩු ශාන්ති කර්ම හා සම්බන්ධ උපත් කතා විමසයි.
- මඩු ශාන්ති කර්ම නම් කරයි.
- මඩු ශාන්ති කර්ම ආශ්‍රයයෙන් ගොඩ නැඟී ඇති නාට්‍යමය අවස්ථා හඳුන්වයි.
- මඩු ශාන්ති කර්මවල ඇති නාට්‍යමය අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

ක්‍රියාකාරකම : සබරගමුවේ මඩු ශාන්ති කර්ම

ගුණාත්මක යෙදවුම් : මඩු ශාන්ති කර්ම පිළිබඳ ව ලියැවුණු පොත්පත්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය හා සාකච්ඡා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- මෙතෙක් උගත් උඩරට හා පහතරට සම්ප්‍රදායවලට අමතර ව සබරගමු සම්ප්‍රදායය නමින් නර්තන සම්ප්‍රදායයක් වේ. "මඩු ශාන්ති කර්ම" නම් වූ ශාන්ති කර්ම සබරගමු සම්ප්‍රදාය නියෝජනය කරයි. එහි ගම්මඩු හා දෙවොල් මඩු දිවයිනේ වෙනත් ප්‍රදේශවල දක්නට ලැබෙන නමුත් ගී මඩු, කිරි මඩු, පහන් මඩු, පූනා මඩු, හැල්ලුම් මඩු ආදිය සබරගමු සම්ප්‍රදායයට ආවේණික වේ.

- උඩරට හා පහතරට ශාන්ති කර්ම වැඩි වශයෙන් යකුන් හා සම්බන්ධ වන අතර මඩු ශාන්ති කර්මවල පිදුම් ලබන්නේ දෙවියන් වීම විශේෂත්වයකි. ඒ අනුව යකුන් හා සම්බන්ධ කටයුතු යකැදුරන් හෙවත් යක්දෙස්සා විසින් ද, දෙවියන් හා සම්බන්ධ කටයුතු කපුරාලලා විසින් ද සිදු කරනු ලැබේ.

- අරමුණු වශයෙන් ගත් කල මඩු ශාන්ති කර්ම, පොදු ශාන්ති කර්ම ගණයට වැටේ. පෞද්ගලික අරමුණු සහිත ශාන්ති කර්මවලට වඩා පොදුජන සහභාගිත්වයක් සහිත මෙම පොදු ශාන්ති කර්මවල දී වස්දොස් දුරු කොට මුළු රටට ම සෙත් ශාන්තිය ලබා දීම ද එමෙන් ම සශ්‍රීකත්වය පැතීම ද අපේක්ෂා කෙරේ.

- එකිනෙකට බොහෝ සෙයින් සමාන යම් යම් සුළු වෙනස්කම් සහිත මඩු ශාන්ති කර්ම කීපයක් අසන්නට ලැබේ. එනම් ගම්මඩුව, දෙවොල් මඩුව, පූනා මඩුව, කිරි මඩුව, ගී මඩුව, මල් මඩුව, හැල්ලුම් මඩුව, හත්දා ගී මඩු, තුන් දා ගී මඩු, කතරගම දෙවියන් ගේ දූත මඩුව ආදිය යි. මෙයින් ගම්මඩු හා දෙවොල් මඩු යාග වර්තමානයේ වඩාත් අසන්නට හා දකින්නට ලැබෙන මඩු ශාන්ති කර්මයි.

- ගම්මඩු ශාන්ති කර්මය පොදුවේ ගම්වැසියන් විසින් ගමට සෙත් පතා කරනු ලබන්නකි. දෙවොල් දෙවියන් ලංකාවට පැමිණි ආකාරය පිළිබඳ කතා පුවත මෙමඟින් නිරූපණය කෙරේ. මෙහි උපත් කතාව වන්නේ දඹදිව විසූ සේරිමානන් නමැති රජ කෙනෙකු හා සම්බන්ධ කතා පුවතකි. දඩ කෙළියෙහි යෙදී සිටිය දී උක්ත රජතුමා අතින් මරණයට පත් වන ගෝනකු රජතුමා කෙරෙහි බැඳි වෛරයෙන් රජතුමා ගේ මානෙල් විලේ මැඩියකු ව ඉපැදුණු ආකාරයත්, මානෙල් මලක සැඟවී සිටි මැඩියා දිනක් රජතුමා මානෙල් මලක් කඩා නාසයට ළං කරන අවස්ථාවේ රජුගේ නාසය දිගේ මොළය දක්වා ගමන් කිරීම නිසා රජතුමාට හිසරදයක් සැදුණු ආකාරයත්, ප්‍රතිකාරවලින් රෝගය සුව නොවුණු කල්හි සිහිනයෙන් දුටු පත්තිනි දෙවඟන ගේ මඟ පෙන්වීම යටතේ ලංකාවේ රුවන්වැල්ලේ නවගමු දේවාලයයට පැමිණ මෙම ශාන්ති කර්මය කොට සුව ලැබූ බවත් එයින් කියැවේ.

- ඉන්දියාවේ සිට ලක්දිවට පැමිණෙන දෙවොල් සත්කට්ටුව ස්වකීය නැව මුහුදු බත් වීමෙන් පසු නොයෙක් තොටමුණුවලට ගොඩ බැසීමට උත්සාහ කළ නමුදු මෙරට දෙවිවරුන් එයට ඉඩ නොදුන් බවත්, අවසානයේ ඔවුන් සීනිගමට ගොඩ බට අවස්ථාවේ පත්තිනි දේවිය ගිනිකඳු හතක් මවා දෙවියන් ගේ තේජස පරීක්ෂා කළ බවත්, එම ගිනිකඳු තරණය කර පූජා ලබා ගන්නට අවසර ලැබූ බවත් දෙවොල් දෙවියන් හා සම්බන්ධ කතා පුවතේ දී පැවසේ. ඉහත සඳහන් කළ පරමාර්ථවලට අමතර ව බෝවන වසංගත රෝගවලින් ආරක්ෂා වීම ද දෙවොල් මඩු ශාන්ති කර්මයේ දී සිදු කෙරේ.

- මුරුතැන් පිදීම, කාල පන්දම් ගහ, යහන් දැක්ම හළං වැඩීම, පත්නි සවුදම, පත්තිනි භාගය, තෙල්මෙ නැටුම, දොළහපාළිය, වාහල භාගය යන පිළිවෙළින් නටනු ලබන ගම්මඩුවෙහි එතැන් සිට දෙවොල් දෙවියන් උදෙසා සිදු කරනු ලබන දෙවොල් ගොඩ බැසීම, ගිනි පෑගීම, අඹ විදමන, මරා ඉපැද්දීම, රාමා මැරීම, ඇත් බන්ධනය, මී බන්ධනය, ගරා යක් නැටුම ආදි අවස්ථා නිරූපණය කරනු ලැබේ.

- උක්ත කරුණු අතරින් අඹ විදමන, මරා ඉපැද්දීම, ඇත් බන්ධනය, මී බන්ධනය, රාමා මැරීම, දෙවොල් ගොඩ බැසීම යන අවස්ථා බෙහෙවින් නාට්‍යෝචිත වන අතර එම අවස්ථා මඩු ශාන්ති කර්මවල දී නාට්‍යානුසාරයෙන් නිරූපණය කෙරේ. අඹ විදමන පත්තිනි දේවිය අඹයෙන් උපන් කථා ප්‍රවෘත්තිය නිරූපණය කරයි. මරා ඉපැද්දීමෙන් පත්තිනිය ගේ ස්වාමි පුරුෂයා වන පාලඟ කුමරු පඬි රජු විසින් මරවනු ලැබීම සහ පත්තිනි ඔහු ගේ මළකඳට යළි ප්‍රාණය ලබා දීමත් නිරූපණය කෙරේ. සොරකමට සැක කරනු ලබන රාමා හෙට්ටියකු විසින් මරා දමනු ලැබීමත්, රාමා මරා පැන යාමට තැත් කළ හෙට්ටියා අල්ලාගත් මිනිසුන් ඔහු ලවා ම යළි රාමාට ප්‍රාණය ලබා දීමත් රාමා මැරීමෙන් නිරූපණය කෙරේ. ඇත් බන්ධනයේ දී හා මී බන්ධනයේ දී බෙර කරු හා කපුරාල අතර ඇති වන සංවාද ආශ්‍රයයෙන් මංගර දෙවියන්ට පූජා කිරීම සඳහා ඇතකු හා මීමකු අල්ලා ගන්නා ආකාර හාස්‍යෝත්පාදක ව නිරූපණය කෙරේ. දෙවොල් ගොඩ බැසීමේ දී නිරූපණය කැරෙනුයේ දෙවොල් සත් කට්ටුව ලක්දිව ගොඩ බැසීම හා බැඳුණු කථා ප්‍රවෘත්තියයි.

- මීට අමතර ව, කිරි මඩුව ශාන්ති කර්මයට පාදක වන්නේ මී කැඩීමට වනයට යන මංගර කුමරු මීමකු අතින් මරණයට පත් වීමත්, ඔහුට යළි ප්‍රාණය දීමේ අරමුණින් දළ කුමරු මීමා මරා උගේ අවයවවලින් කිරි මැස්සක් තනා කිරි උතුරුවා මංගර දෙවියන්ට හා මීමාට යළි පණ ලබාදෙන ආකාරයත් ය. දිවි දොස් උදෙසා පවත්වනු ලබන පූනා මඩුවේ දී මැටියෙන් සෑදූ මුට්ටියක් බඳු 'පූනාව'ට සියලු වස් දොස් කිළි එකතු කොට එය ගවයකු ගේ හිසේ ගසා වස් දොස්වලින් මිදෙන අතර ගවයා පූනාවට අධිපති දිවි යකා වෙනුවෙන් කැප කරයි. සාමාන්‍ය උපද්‍රව හා විශේෂයෙන් ගව පට්ටිවලට පැමිණෙන රෝග දුරු කිරීම සඳහා කරනු ලබන දේවතෝත්‍රයක් ලෙස හැල්ලුම් මඩුව හැඳින්වේ. යමකුට පැමිණෙන අතුරු අන්තරා රෝග උපද්‍රවවලින් මිදීම සඳහා පත්තිනි හා කතරගම දෙවිවරුන් අරබයා සෙත් පැතීමේ ගීතිකා කියවමින් සිදු කරන ශාන්ති කර්මයක් ලෙස ගී මඩුව හැඳින්වේ. බෝවන රෝගවලින් ආරක්ෂා වීම හා එම රෝග පැතිරීම වැළැක්වීම අරමුණු කොට සත්පත්තිනි, වඳුරුමාල, කතරගම දෙවියන්, දෙවොල් සත්කට්ටුව, කුරුම්බර යකා හා දේව සමූහයා වෙනුවෙන් පහන් වැට දල්වා කරනු ලබන පූජා කර්මය ''පහන් මඩුව'' නම් වේ.

- මඩු ශාන්ති කර්මවල ප්‍රධාන වශයෙන් පත්තිනි දේව මෑණියෝ පුද ලබති. මෙම ශාන්ති කර්මවල පහත සඳහන් නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත ය. රංග භූමිය (මඩු ශාන්තිය සිදු කරන ස්ථානය) රංග භූමි අලංකරණ, සමාරෝපය (පත්තිනි දෙවොල් සත්කට්ටුව ඇතුළු බොහෝ චරිතවලට කපුරාලලා ආරෝපණය වීම) අනුකරණය, අනුරූපණය, වේෂභූෂණ, වාද්‍ය භාණ්ඩ යොදා ගැනීම, ආලෝකය ආදි වශයෙන් සතර අභිනය සාර්ථක ව යොදා ගත් අවස්ථා පිළිබඳ ව සිසුන්

සමග සාකච්ඡා කරන්න. උක්ත කරුණු පිළිබඳ ව වැඩිදුරටත් අධ්‍යයනය කොට නාට්‍ය ලක්ෂණ පෙන්නුම් කරන අවස්ථා සනිදර්ශන ව සාකච්ඡා කරන්න. ප්‍රදේශීය වශයෙන් මෙම මඩු ශාන්ති කර්මවල දක්නට ලැබෙන වෙනස්කම් කෙරෙහි ද අවධානය යොමු කරන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- මඩු ශාන්ති කර්මයෙහි උපත් කතාව විස්තර කරන්න.
- එහි අරමුණු ප්‍රකාශ කරන්න.
- මඩු ශාන්තිකර්මවල නාට්‍යමය අවස්ථා පැහැදිලි කරන්න.
- එම නාට්‍යමය අවස්ථා ප්‍රතිනිර්මාණය කරන්න.

පැවරුම : මඩු ශාන්ති කර්ම පිළිබඳ ව පුළුල් අධ්‍යයනයක් කොට එහි නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත වී ඇති ආකාරය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.5 : දේශීය ගැමි නාටකවල නාට්‍යමය ලක්ෂණ විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- ජන නාටකයක් ලෙස සොකරි වැදගත් වන අයුරු සාකච්ඡා කරයි.
- සොකරි නාටකයෙන් කියැවෙන කතා පුවත විස්තර කරයි.
- සොකරි නාටකයේ නාට්‍යමය ලක්ෂණ සනිදර්ශිත ව විග්‍රහ කරයි.
- සොකරි නාටකයේ අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.
- ගැමි සංස්කෘතියේ හර පද්ධති අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 4.5.1 : සොකරි හඳුනාගනිමු.

ගුණාත්මක යෙදවුම් : සොකරි නාට්‍ය පෙළ
සොකරි නාට්‍යයේ දර්ශන ඇතුළත් සංයුක්ත තැටි හෝ ඡායාරූප / රූප සටහන්

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය හා සාකච්ඡා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සොකරි නාට්‍යයේ එන අවස්ථාවක් සිසුන් ලවා ප්‍රතිනිර්මාණය කරවීමෙන් හෝ සංයුක්ත තැටිය ක්‍රියාත්මක කරවීමෙන් හෝ සොකරි පිළිබඳ අවධානය ඇති කරවමින් පාඩමට පිවිසෙන්න. පහත සඳහන් කරුණු ද ඇතුළත් වන සේ සොකරි පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- සොකරි නාටකයෙහි පරමාර්ථ වශයෙන් විනෝදාස්වාදය ලබා දීමත්, ඵලදාව හා සශ්‍රීකත්වය ඇති කිරීමත්, සෞභාග්‍යය උදා කර ගැනීමත් දැක්විය හැකි ය. මෙය උඩරට ප්‍රදේශවලට ආවේණික වූවකි. පත්තිනි පූජාව මුල් කරගත් ශාන්තිකර්මයක් ලෙස ද සැලකේ.

- සොකරි නාට්‍යයේ ප්‍රභවය ගැන සඳහන් කරන විට එය ''චොක්රි'' (රූමත් කාන්තාව) නම් හින්දි වචනයෙන් බිඳී ආ බවට මතයක් තිබේ. පත්තිනි සංකල්පය සොකරි හා බැඳී ඇති බව විශ්වාස කැරේ. ඉන්දියාවේ විවිධ භාෂාවලින් උපුටාගත් වචන සොකරි නාට්‍යයෙහි භාවිත වේ. කෘෂිකාර්මික ප්‍රදේශවල සොකරි නාට්‍යය රඟ දැක්වීමෙන් සෞභාග්‍යය හා සශ්‍රීකත්වය ළඟා කර ගැනීම අපේක්ෂා කළ බව පෙනේ. (ලග්ගල, හඟුරන්කෙත, හේවාහැට, මීරුප්පේ, තලාතුඔය ආදි) උඩරට ප්‍රදේශවල සොකරි ව්‍යාප්ත ව තිබූ බවට සාධක ඇත.

- සොකරි අනිකුත් ගැමි නාටකවලින් වෙනස් වූවකි. කෝලම්, නාඩගම් වැනි ගැමි නාටක සඳහා විවිධ කතා පුවත් යොදා ගැනුණ ද සොකරි නාට්‍යයේ ඇත්තේ එක ම කතා පුවතකි. එම කතාවේ සඳහන් ප්‍රධාන චරිතය වන සොකරි නමින් ම නාටකය ද නම් කර ඇත.

- සොකරි උපත් කතාව සැකෙවින් මෙසේ ය. සොකරිය, ගුරුහාමි හා පරයා සමඟ නැවක් තනා ගෙන ඉන්දියාවේ සිට ලංකාවට පැමිණේ. පදිංචියට තැනක් සොයා ඇවිදින අතර තඹරාවිට නම් ගමේ දී හමු වන වෙදරාල කෙනෙක් ඔවුන්ට පැලක් තනා ගැනීම සඳහා ඉඩම් කැබැල්ලක් දෙති. ඔවුහු එහි පැලක් තනා ගෙන වාසය කරති. මේ අතර පැන් සොයා යන ආඩිගුරු වෙදරාළ ගේ බල්ලා විසින් සපා කනු ලබයි. අනතුරු ව වෙදකම් කිරීමට එන්නේ වෙදරාල ය. ඔහු සොකරි සමඟ පලා යයි. ආඩිගුරු බොහෝ වෙහෙස වී ඇය සොයා ගනී. ඒ වන විටත් ඇය ගැබිනියකි. පසු ව සියල්ලෝ ම සමඟියෙන් ජීවත් වෙති.

- කථා වස්තුවේ සුළු සුළු වෙනස් වීම් ප්‍රදේශීය වශයෙන් දක්නට ලැබෙන අතර ඒ සැම විටෙක ම සොකරි, ආඩිගුරු සහ පරයා ප්‍රධාන චරිත වෙති. ඊට අමතර ව වෙදරාල, පච්චමීරා, කාලි ආදි චරිත මෙහි දක්නට ලැබේ.
- සොකරි නාටකයේ දක්නට ලැබෙන නාට්‍ය ලක්ෂණ සැකෙවින් මෙසේ දැක්විය හැකි ය.

අනුකරණය හා අනුරූපණය	(නැව් තැනීම, නැවක් දියත් කිරීම, නැවෙන් ගොඩ බැසීම, ගෙය තැනීම)

නාට්‍ය ධර්මී ලක්ෂණ සහිත වීම - (ගුරුන්නාන්සේ ගේ කවි ගායනා හා නර්තන)

රංග භූමිය	(කමත)
රංග භූමි අලංකරණ	(වං ගෙඩිය)
චරිත නිරූපණය	(සියලු චරිත පිරිමින් විසිනි)
වේෂභූෂණ	(සරල වෙස් මුහුණු භාවිතය)
අනුරූපණ	(පැදුර විවීම, බල්ලා සපා කෑම හා බෙහෙත් කිරීම, දෙහි කැපීම, ගොම ගෑම, පන් නෙළීම ආදිය)

- සොකරි නාටකයේ ශාන්ති කර්ම ලක්ෂණ ද දක්නට ලැබේ. පහන් පැල, පූජ්‍යාර්ථයේ කවි ගායනා රංගයට පෙර පේවීමේ චාරිත්‍රය, යක්කම්වල හා පාළිවල ලක්ෂණ සහිත අවස්ථා ආදිය ඉන් කීපයකි.
- සොකරි නාට්‍යයේ ආභ්‍යන්තරික පරමාර්ථ ගැන විවිධ අදහස් දක්නට ලැබේ. සශ්‍රීකත්වය පිළිබඳ අභිචාර ක්‍රමවල ආභාසය මෙහි දක්නට ලැබෙන අතර සම්භෝගය සංකේතවත් කර ඇති බවට මතයක් ඇත. පොළොවේ සශ්‍රීකත්වයේ වර්ධනය සංකේතවත් කිරීම වඳ ස්ත්‍රියකැයි සැලකූ සොකරියට දරුවන් ලැබීමෙන් පෙන්නුම් කෙරේ. එම දරුවා ප්‍රේක්ෂකයන් වෙත පිරිනැමීමෙන් කෘෂිකාර්මික සමෘද්ධිය මුළු මහත් ජන සමාජයට ම වැදගත් බව හෙළිවේ.
- වර්තමානයේ ඉතා ජනප්‍රිය නාට්‍යයක් වශයෙන් සොකරි නව නිර්මාණයක් ලෙස වේදිකා ගත වේ. එය පැරණි හෙවත් සාම්ප්‍රදායික සොකරි නාටකයෙන් වෙනස් වන ආකාරය පිළිබඳ ව ද සිසුන් හා සාකච්ඡා කරන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සොකරි කතා පුවත ප්‍රකාශ කරන්න.
- ජන නාටකයක් ලෙස සොකරි නාට්‍යය වැදගත් වන අයුරු විමසන්න.
- සොකරි නාට්‍යයේ නාට්‍යමය සංසිද්ධි නිදර්ශන සහිත ව පැහැදිලි කරන්න.
- සොකරියෙහි අවස්ථා ප්‍රතිනිර්මාණය කරන්න.

පැවරුම :

- සොකරි නාට්‍යයේ කතා වස්තුව සැකෙවින් ලියා සොකරි මඟින් හෙළිදරවු වන සමාජීය පරමාර්ථ නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීමේ දී යොදා ගෙන ඇති උපායමාර්ග විමසන්න.

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.5 : දේශීය ගැමි නාටකවල නාට්‍යමය ලක්ෂණ විමසයි.

ක්‍රියාකාරකම 4.5.2 : කෝලම් විමසමු.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- කෝලම් යනු කුමක් දැයි හඳුන්වයි.
- කෝලම් නාට්‍යයෙහි විශේෂ ලක්ෂණ විග්‍රහ කරයි.
- කෝලම් නාට්‍යයෙන් සමාජ දූෂණ උපහාසයට හා හාස්‍යයට ලක් කරන අයුරු විමසයි.
- කෝලම් නාට්‍යයෙහි ප්‍රභවය හා උපත් කතාව විස්තර කරයි.
- කෝලම් නැටුම ප්‍රතිනිර්මාණය කරයි.

ගුණාත්මක යෙදවුම් : කෝලම් මුහුණුවල රූප සටහන්
කෝලම් නාට්‍ය පිළිබඳ ව ලියැවුණු පොත් පත්
කෝලම් දර්ශන ඇතුළත් සංයුක්ත තැටි
කෝලම් රංග භූමියේ රූප සටහනක්
කෝලම් පිටපත්, චරිත අනුපිළිවෙළ දැක්වෙන පත්‍රිකා

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : සාකච්ඡා හා නිරීක්ෂණ

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ''වෙස් මුහුණු පැලඳ නැටීම'' යන අර්ථය සහිත කෝලම් නාටක වූ කලී දේශීය ජන නාට්‍ය විශේෂයකි. ''වෙස්මුහුණු නාටක'' යන නමින් ද කෝලම් හැඳින්වේ. පහතරට, විශේෂයෙන් වෙරළබඩ ප්‍රදේශවල මෙම කෝලම් ප්‍රචලිත ව පවතී.

- **කෝලම් නාටකයේ උපත් කතාව පහත දැක්වේ.**

  මහා සම්මත රජුගේ බිසවට නැටුම් සිනා කෙළි දැකීමට උපන් ආශාවක් හේතු කොට ගෙන කෝලම් පහළ විය. විවිධාකාර නැටුම් දක්නට සැලැස්වුව ද ඒ කිසි ම නැටුමකින් බිසව තෘප්තිමත් කළ නොහැකි විය. බිසව ගේ දොළ නොසංසිඳීම රජතුමා ගේ දැඩි කනස්සල්ලට හේතු විය. රජු ගේ ශෝකය නිසා ශක්‍ර දිව්‍ය රාජයා ගේ පාණ්ඩු කම්බල ශෛලාසනය උණු වූ අතර එක් රාත්‍රියක රජු ගේ මඟුල් උයනේ කෝලම් මුහුණු තබන්නට ඔහු කටයුතු කළේ ය. පසු දා නළුවන් එම මුහුණු පැලඳ ගෙන නැටූ බවත් එම නැටුම් දැකීමෙන් බිසව ගේ දොළ සංසිඳුණු බවත්, කෝලම් බිහි වූයේ ඒ අනුව බවත් එම උපත් කතාවේ සඳහන් වේ.

- **කෝලම් ඉදිරිපත් කිරීමේ අනුපිළිවෙළ මෙසේ ය.**

  පළමුවෙන් ම තොරතුරු කතා කාරයා, කාරියකරවන රාල හෙවත් සබේ විදානේ සබයට පැමිණේ. ඔහු කෝලම් රංගය ආරම්භ කිරීම සඳහා පළමුවෙන් ම තානායම් පොළට පැමිණ ත්‍රිවිධ රත්නය නමස්කාර කොට කෝලම් උපත් කවි ගායනා මඟින් විස්තර කරයි. අනතුරු ව සබයට පැමිණෙන්නේ අණබෙර කෝලම යි. රජු සහ බිසව කෝලම් බැලීම සඳහා පැමිණෙන බව ප්‍රකාශයට පත් කිරීම ඔහුගේ කාර්යය යි. ඉන් පසු හේවාකෝලම සබයට පැමිණේ. ඒ රජතුමාගේ හමුදා හටයෝ ය. ඔවුහු ප්‍රේක්ෂකයා බිය ගන්වමින් ද විකට ස්වරූප දක්වමින් ද රංගනයෙහි යෙදෙති.ඉන් පසු පොලිස් කෝලම සබයට පැමිණේ. බැටන් පොලු අතින් ගෙන සබයට පැමිණෙන ඔවුහු ජනතාව හසුරුවමින් හාස්‍යෝත්පාදක රංගනයක නිරත වෙති. ඉන් පසු සබයට පැමිණෙන්නේ තානායම් පොළ පිළියෙළ කිරීම භාර ව සිටින ආරච්චි කෝලම යි. අනතුරු ව උඩු වියන් බැඳීම හා පාවාඩ එළීම සඳහා ජස කෝලම හෙවත් පේඩිරාල සබයට පැමිණේ. ජසයාගේ බිරිය වූ රූමත් ලෙන්චිනා සබයට පැමිණීමත් සමඟ නව පණක් ලැබූවන්

සේ ජසයා, ලෙන්චිනා හා ආරච්චිරාල විකට නිරූපණයක යෙදෙති. ඒ අතර තානායම් පොළ පරීක්ෂා කිරීම සඳහා මුදලි කෝලම සබයට පැමිණේ. අවසාන වශයෙන් රජ සහ බිසව තානායම් පොළට පැමිණෙන අතර, එයින් කෝලම් දර්ශනයේ පළමු කොටස අවසන් වී දෙවන කොටස ආරම්භ වේ. දෙවන කොටසේ දී අදාළ කතා පුවත රඟ දැක්වේ.

- කෝලම් කථා වස්තු වශයෙන් මනමේ කතාව, සඳ කිඳුරු කතාව, ගෝඨයිම්බර කතාව ආදිය මෙම අපර රංගයේ දී රඟ දැක්වේ.

- කෝලම් රඟ දක්වෙන ස්ථානය ''තානායම් පොළ'' නමින් හැඳින්වේ. එය එළිමහන් වෘත්තාකාර රංග භූමියකි.



- නළුවන් වේෂ නිරූපණ කාර්යයෙහි යෙදෙන ස්ථානය ''මඩුව'' නම් වේ. රංගනය සඳහා තමන්ගේ වාරය පැමිණෙන තුරු නළුවන් රැඳී සිටින ස්ථානය ''වෙස් අත්ත'' නමින් හැඳින්වේ. ''කෝලම් සබය'' යනු රංග භූමියකි. එහි එක් පසෙක ''මල් පැල'' සකස් කොට තිබේ.

- **කෝලම් රංග ශෛලිය**

  කෝලම්වල දී යොදා ගනු ලබන්නේ නාට්‍ය ධර්මී ශෛලිය යි. දේශීය ගැමි ගායනා යොදා ගැනීමත්, නර්තනය බහුල ව යොදාගැනීමත් සියලු චරිතවලට අනන්‍ය වූ නර්තන ශෛලියක් අනුගමනය කිරීමත් හේතුවෙන් එය නාට්‍යධර්මී ශෛලියට අයත් වේ.

  කෝලම් රංග ශෛලියෙහි තවත් විශේෂත්වයක් වන්නේ වෙස් මුහුණු බැඳ නැටීම යි. සියලු චරිතවලට නිශ්චිත වෙස් මුහුණු තිබේ. ඒවා බෙහෙවින් විචිත්‍ර ය.

  කෝලම්වල හාස්‍යෝත්පාදක පූර්ව රංගයක් ද, නාට්‍යමය ගුණයෙන් යුක්ත අපර රංගයක් ද ඇත. කාරියකරවන රාල හෙවත් සබේ විදානේ පාත්‍රවාර්ගයා ගේ සම්ප්‍රාප්තිය, කථා වස්තුව ආදි ඉදිරිපත් කිරීම් සිදු කරයි.

  සතර අභිනයෙන් තුනක් මෙහි දී විශේෂ වේ. ඒ ආංගික වාචික හා ආහාර්ය අභිනය යි. කෝලම්වල නිශ්චිත රංග ආකෘතියක් තිබීම විශේෂත්වයකි. පූර්ව රංගයෙහි දී ස්ථාවර පාත්‍රයෝ සබයට පැමිණෙති. කෝලම් රංගයේ දී ද රංගනයෙහි යෙදෙනුයේ පිරිමින් පමණකි. හාස්‍යය හා උපහාසය මුඛ්‍ය කොටගත් විනෝදාස්වාදය පරමාර්ථ කොට ගත් ගැමි නාටක විශේෂයක් ලෙස කෝලම් වැදගත් වේ.

- සබේවිදානේ, අණබෙර කෝලම, හේවා කෝලම, පොලිස් කෝලම, ආරච්චි කෝලම, ජස ලෙන්චිනා, මුදලි කෝලම ප්‍රධාන ස්ථාවර කෝලම් චරිත වන අතර, ඊට අමතර ව මරක්කල, දෙමළ, හෙට්ටි, ලන්දේසි, ගොන් කොටි, වගවලස්, බඩදරු ආදි කෝලම් ද ඇතැම් විට දැකිය හැකි ය.

- කෝලම් නාටකයේ විවිධ ශාන්ති කර්මවල අංග ඇතුළත් ව ඇති නමුත් එය වඩාත් සමාන වන්නේ සන්නි යකුම් යාගයට බවත්, දහ අට සන්නිය හා කෝලම් අතර බෙහෙවින් සමානකම් දක්නට ලැබෙන බවත් මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයෝ පවසති.

- කෝලම් නාටකය සමකාලීන සමාජයේ කැටපතක් සේ දැක්විය හැකි ය. තත්කාලීන සමාජ යථාර්ථය හාස්‍යය හා උපහාසය කුළු ගැන්වෙන අයුරින් නාට්‍යානුසාරයෙන් නිරූපණයට දරන ලද ප්‍රයත්නයක් ලෙස මෙය හැඳින්විය හැකි ය. සමාජයේ දක්නට ලැබෙන බොහෝ චරිතවල දුර්වල තැන් හාස්‍යයට හා උපහාසයට ලක් කරමින් නළුවෝ එම චරිත අනුකරණය කරති. පියෙවි ඇසට හසු නොවන සහ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ නොහැකි බොහෝ චරිත ලක්ෂණ ප්‍රසිද්ධියේ ඉදිරිපත් කිරීමට කෝලම් ශිල්පියා මෙම කෝලම් නාට්‍ය කලාව යොදා ගත් බව පෙනේ. මෙහි දී ගැමි කලා කරුවා ප්‍රභූ පැළැන්තිය සරදමට ලක් කරයි. සමාජගත තුල භේදය විග්‍රහ කරයි. විවිධ සාංක්‍රමණික විවිධ ජනවර්ග පිළිබඳ ව සොයා බලයි. විවිධ වෘත්තීන් හා එහි ක්‍රියාකාරකයන් විසින් කරනු ලබන අක්‍රමිකතා ඉදිරිපත් කරයි. අනියම් සබඳතා අල්ලස් ගැනීම් ආදි සමාජ විෂමාචාර චරිත මඟින් හුවා දක්වයි.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

සමාජ විෂමාචාර හාස්‍යය හා උපහාසය කුළු ගන්වමින් ඉදිරිපත් කිරීම සඳහා යොදා ගනු ලැබූ ප්‍රයත්නයක් ලෙස කෝලම් නාටකයේ වැදගත්කම නිදසුන් සහිත ව විස්තර කරන්න.

අතිරේක කියවීම් සඳහා :

සිංහල ගැමි නාටකය	-	එදිරිවීර සරච්චන්ද්‍ර
ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව	-	රෝලන්ඩ් අබේපාල
කෝලම් නාටක සාහිත්‍යය	-	එම්. එච්. ගුණතිලක
ජසයා සහ ලෙන්චිනා	-	දයානන්ද ගුණවර්ධන

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.5 : දේශීය ගැමි නාටකවල නාට්‍යමය ලක්ෂණ විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :

- නාඩගම් ප්‍රභවය පිළිබඳ විවිධ මත විමසයි.
- නාඩගමේ සුවිශේෂ නාට්‍යමය ලක්ෂණ විස්තර කරයි.
- නාඩගම් රංග ශෛලිය හඳුනාගනී.
- නාඩගම් ගී ගයමින් රඟයි.
- නාඩගම් රංග ශෛලිය උපයෝගී කොට ගෙන නව නාට්‍ය නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම 4.5.3 : නාඩගම් හඳුනා ගනිමු.

ගුණාත්මක යෙදවුම් : නාඩගම් නාට්‍ය ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය පට, නාඩගම් පින්තූර, විස්තර පත්‍රිකා, නාඩගම් පිළිබඳ පොත්පත්

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ''නාටක'' යන සංස්කෘත පදය දෙමළ භාෂාවෙන් කියවෙන විට නාඩගම් වෙයි. එය ඒ අයුරින් ම සිංහලයට වැද්ද ගෙන ඇති බව පෙනේ. (දෙමළ භාෂාවේ ට, ඩ හා ක, ග සඳහා ඇත්තේ එක් අකුරක් බැගින් පමණක් බව සලකන්න.)

- දකුණු ඉන්දීය තෙරුක්කූත්තු නම් වීදි නාටක ආභාසයෙන් නාඩගම් ප්‍රභවය ලැබූ බවට ද විද්වත් මත පවතී. යුරෝපීය ජන වන්දනා නාට්‍යවල ආභාසය, දේශීය කවි නාටකවල ආභාසය, දකුණු ඉන්දීය ගැමි නාටකවල ආභාසය ආදි වශයෙන් විවිධ ආභාසයන් ලැබූ බවට විවිධ මතවාද පැවතුණ අතර යාපනය, මඩකලපුව ආදි දෙමළ ජනයා වැඩිපුර වසන ප්‍රදේශවල ජීවත් වන කතෝලික ප්‍රජාව අතර ප්‍රචලිත වී පසු ව දකුණට සංක්‍රමණය වී සිංහල සංස්කෘතියට අනුව හැඩ ගැසී දේශීය ස්වරූපයක් ගත් බව ඉන් එක් මතයකි. යාපනය, හලාවත, කොළඹ, වැලිගම, මාතර, තංගල්ල ආදි මුහුදුබඩ ප්‍රදේශවල ව්‍යාප්ත ව තිබූ මෙම නාට්‍යය දේශීය ගැමි නාටක අතර ප්‍රමුඛස්ථානයක් හිමි කර ගනී. අවශේෂ ගැමි නාටකවලට වඩා අංග සම්පූර්ණ දෘශ්‍ය කාව්‍යයක් වන නාඩගම් බටහිර ඔපෙරා නාට්‍යවලටත්, පීකිං ගීත නාට්‍යවලටත් සමාන කළ හැකි බව පැවසේ.

  ශ්‍රී ලංකාවේ රඟ දැක්වුණු පැරණිතම නාඩගම ලෙස හරිශ්චන්ද්‍ර නාඩගම සඳහන් වේ. තෙලුගු බසින් රචනා වූ එය නිෂ්පාදනය කරන ලද්දේ අලගනායිදු නම් ආන්ධ්‍ර දේශීය නාට්‍යකරු විසිනි. ප්‍රථම සිංහල නාඩගම ලෙස පිලිප්පු සිඤ්ඤෝ ගේ ඇහැළේපොළ නාඩගම හෙවත් ''සිංහලේ නාඩගම'' හැඳින්වේ.

  නාඩගම් රංග ශෛලිය

  - නිශ්චිත පෙළක් තිබීම
  - පොතේ ගුරු හා ගායක පිරිසක් සිටීම
  - පූර්ව රංගයක් හා ස්ථාවර පාත්‍රයන් සිටීම.
  - නිශ්චිත ආකෘතියක් තිබීම.
  - පිරිමින් පමණක් රඟපෑම
  - නාට්‍ය ධර්මී ශෛලිය භාවිත කිරීම
  - රෑ තුනක් හා හතක් අතර කාලයක් තුළ රඟ දක්වනු ලැබීම.
  - ඇතැම් විට පසුබිම් තිරයක් භාවිත කිරීම.

- කිට්සන් පහන් හෝ පන්දම් හෝ භාවිතය
- දකුණු ඉන්දීය කර්ණාටක සංගීතය යොදා ගැනීම
- ''කරළිය'' නම් විශේෂයෙන් සකස් කරන අර්ධ වෘත්තාකාර රංග පීඨයක රඟ දක්වනු ලැබීම.

රාත්‍රි කාලයේ ආරම්භ වන නාඩගම, පූර්ව රංගය නම් මුල් භාගයේ දී බහුබූතයා, සෙල්ලන් ළමා, බෙර කරුවන් දේශනවාදීන් යන ස්ථාවර පාත්‍රයන් ගේ නැටුම් ගැයුම් වැයුම් ඉදිරිපත් කරයි. පූර්ව රංගයේ දී පොතේ ගුරුගේ ප්‍රාරම්භක ගීතයෙන් ඉෂ්ට දේවතාවන් නමස්කාර කොට පොතේ විරිදුවෙන් කතා වස්තුවේ සාරය දක්වයි. පළමු ව සබයට එන බහුබූතයා විකට වේශයෙන් ප්‍රේක්ෂකයා පිනවයි. මෙම ස්ථාවර පාත්‍රයන් හා ප්‍රධාන කතාව අතර ඍජු සම්බන්ධයක් නොතිබුණ ද, සැම නාඩගමක ම දෙවන භාගයේ කථා වස්තුව ඉදිරිපත් කරනු ලබන්නේ මෙම ස්ථාවර පාත්‍රයන් ගේ රංගනවලින් අනතුරු ව ය. නාඩගම අවසන් වන්නේ මංගලම් ගීතයෙනි. මුළුමනින් ම කවිවලට සමාන අනාඝාතාත්මක (තාල රහිත) පද්‍ය හා ආඝාතාත්මක (තාල සහිත) සින්දු සහිත නර්තන විලාසයෙන් නාඩගම ඉදිරිපත් කරනු ලබයි. මුල, මැද, අග ගැළපුණු කථාවක් ගායන වාදන, ගමන් තාල ආදිය හා ගද්‍ය පද්‍ය සංවාද මාර්ගයෙන් අලංකෘත වූ රංග ආකෘතියක් ප්‍රථම වරට දේශීය නාට්‍ය කලාවෙහි ලා දැකිය හැකි වන්නේ නාඩගම් සම්ප්‍රදායෙනි.

පේදුරුසිංඤෝ : කම්මල් කරුවකු වූ මොහු තෙලුගු බසින් රචනා වූ හරිස්චන්ද්‍ර නාඩගම සිංහල නාඩගමක් බවට පත් කළ බව විද්වතුන් ගේ මතය වේ. එහෙත් සමහර ලේඛනවල මෙම නාට්‍යකරු ජාන්චිසිංඤෝ ලෙස ද සඳහන් වේ.

පිලිප්පුසිංඤෝ : ඇහැළේපොළ නාඩගම නම් වූ මුල් ම සිංහල නාඩගම නිර්මාණය කළ මොහු විසින් එම නාඩගමට අමතර ව මාතලන්, සිංහවල්ලි, හෙලේනා, රජ තුන්කට්ටුව, සෙනගප්පු, ජුසේ පුත්, සුසෙව්, විශ්ව කර්ම, වර්තගම්, සන්නිකුලා, සුලඹාවතී, හුනුකොටුවේ කථාව යන නාඩගම් ද රචනා කරන ලදි.

වෙනත් නාඩගම් කරුවන් අතර ජෝන් මර්තිනුස් පවුලස් පීරිස් සමරනායක, වී. ක්‍රිස්තියන් පෙරේරා මිහිඳු කුලසූරිය, ගාබ්‍රියෙල් ප්‍රනාන්දු, හෙන්ද්‍රික් රාජපක්ෂ, ස්ටීවන් සිල්වා, සයිමන් සිල්වා, එල්. මරියානු ප්‍රනාන්දු, ජුවානිස් පෙරේරා, පී. එම්. ඩී. සිල්වා, එම්. ජෝන්සිංඤෝ, ආර්.ජේ.එෆ්. වර්ණකුලසූරිය ආදීහු කැපී පෙනෙති.

නාඩගම පිරිහීමට හේතු :

- නාඩගම් පොළ වටා විවිධ දුශ්චරිත වර්ධනය වීම
- ඒකාකාරී රාගතාල මිශ්‍රිත ගායනවලින් මෙන් ම සංගීතයෙන් ද යුතු වීම
- රංග කාලය දීර්ඝ වීම
- ක්‍රමයෙන් දුර්වල භාවයට පත් රංගනය
- ආකෘතියේ හා අන්තර්ගතයේ පිරිහීම
- නාඩගමට විරුද්ධ ව මතු වී ආ සමාජ මතවාද
- ආර්ථික, සමාජ, දේශපාලන විපර්යාස
- නූර්ති නාට්‍ය සම්ප්‍රදායේ ආගමනය

දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතයට අනුව නාඩගම් සඳහා මද්දල, හොරණෑ, කයිතාලම් යන වාද්‍ය භාණ්ඩ මෙන් ම පසුව වයලීනය හා සෙරපිනාව ද යොදාගන්නා ලදි.

විදේශීය රටවල ජනප්‍රිය කථා වස්තු ඇසුරු කොට ගෙන නිර්මාණය කරන ලද නාට්‍යය ද සිංහල නාට්‍ය කලාව තුළ ජනප්‍රිය විය.

උදා : වී ක්‍රිස්තියන් පෙරේරා ගේ ඔරිසොන් සහ පාලෙන්තන් හෙවත් බැලසන්ත නාඩගම
ඉයුජින් නාඩගම
බ්‍රම්පෝඩ් නාඩගම

නාඩගම් සඳහා යොදා ගන්නා ලද භාෂාව තෙලුගු දෙමළ, සංස්කෘත ආදි වචන මිශ්‍ර වූ සංකර සිංහලයක් විය. නාඩගම් අබිබවා නූර්ති නාට්‍ය ජනප්‍රිය වීමට ද මෙම භාෂාවේ වෙනස බලපෑව ද, නාඩගම්වල දක්නට ලැබුණු නාට්‍යෝචිත ගී තනු සහ සංවාද භාවිතය නාට්‍ය වංශ කථාවේ කඩඉමක් සටහන් කළ මනමේ, සිංහබාහු නාට්‍ය සඳහා ද යොදා ගෙන ඇත. මේ අනුව නාඩගමේ සාධනීය ලක්ෂණ නූතන නාට්‍ය යුගය තෙක් ම විවිධාකාරයෙන් උපයෝගී කොට ගෙන ඇති බව පෙන්වා දිය හැකි ය.

උදා:
- ඉයුජින් නාඩගමෙහි එන ''දුල් නිමල් සිසි සේ දිසි සරදඹරේ'' යන ගීතයේ තනුව අනුව මනමේ නාට්‍යයේ ''සව්සිරින් වොරැඳි බරණැස් පුරයේ'' යන ගීතය නිර්මාණය කොට ඇත.
- එමෙන් ම ඉයුජින් නාඩගමේ එන ''මෙමගින් ගිය රූසිරු එ තරුණා'' යන ගීතයට අනුව මනමේහි ''රූසිරු ළඳුනි - ඔබෙ ප්‍රේමයෙනා'' ගීතය නිර්මාණය කොට ඇත.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

නාඩගමේ ප්‍රභවය පිළිබඳ ඇති විවිධ මතිමතාන්තර විමර්ශනය කරමින් නාඩගමේ සුවිශේෂ ලක්ෂණ නිදසුන් සහිත ව විස්තර කරන්න.

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.5 : දේශීය ගැමි නාටකවල නාට්‍යමය ලක්ෂණ විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- ශ්‍රී ලංකාවේ ජන නාට්‍ය සම්ප්‍රදායයක් ලෙස පාස්කු නාට්‍ය හඳුනාගනිමින් එහි අරමුණ හා තේමාව පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය ආරම්භය හා පසුබිම විස්තර කරයි.
- පාස්කු නාට්‍ය කතා පුවතට අයත් ප්‍රධාන අවස්ථා සැකෙවින් ඉදිරිපත් කරයි.
- පාස්කු නාට්‍ය රංග ශෛලිය ඇසුරෙන් එහි අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ විමසයි.

ක්‍රියාකාරකම 4.5.4 : පාස්කු නාට්‍යයේ නාට්‍යමය ලක්ෂණ දකිමු.

ගුණාත්මක යෙදැවුම් :
- පාස්කු නාට්‍යවල එන කතා පුවතට අදාළ විවිධ අවස්ථා ඇතුළත් ඡායාරූප සහ රූ සටහන්
- දූව පාස්කු නාට්‍යයේ වේදිකාව සහ මුහුදු බඩ ප්‍රදේශවල දෙව්මැඳුරු ආශ්‍රිත පාස්කු වේදිකාවල රූ සටහන්
- පාස්කු නාට්‍යවල ගායනා සහ දෙබස් ඇතුළත් සංයුක්ත තැටි
- පාස්කු නාට්‍ය ජවනිකා ඇතුළත් අන්තර්ජාලයේ ඇති දර්ශන සහ වෙනත් වීඩියෝ දර්ශන

ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය හා සාකච්ඡා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 01

- දේශීය නාට්‍ය කලාවෙහි බෞද්ධ පූජා කර්ම, ශාන්ති කර්ම හා ජන නාට්‍ය ගමන් මඟේ ලැබෙන කිතුනු ආගමික ජන නාට්‍ය විශේෂයක් ලෙස පාස්කු නාට්‍ය සම්ප්‍රදාය සැලකිය හැකි ය. එහෙත් සොකරි, කෝලම් වැනි සෙසු ජන නාටකවලට වඩා එය නාට්‍ය ලක්ෂණ හා මූලධර්ම අතින් තරමක් සංවර්ධිත ලක්ෂණ පිළිබිඹු කරයි.

  උදා : බටහිර නාට්‍යවල දැකිය හැකි ''නැටුම'' තරමක් දුරට මෙම කතා පුවතේ දිස්වන අතර සමාරෝපය, රංගනය, සංවාද, වේෂභූෂණ, නාට්‍යෝපකරණ, රංග භූමි අලංකරණ, සංගීතය, රංග භූමිය යන නාට්‍ය ලක්ෂණ ද, පුළුල් ව දැකිය හැකි ය. ඊට හේතු වන්නේ දේශීය පාස්කු නාට්‍ය සම්ප්‍රදාය සඳහා බටහිර ජන වන්දනා සම්ප්‍රදායයේ සහ දක්ෂිණ භාරතීය තෙරුක්කූත්තුවල ආභාසය ලැබීම යි.

- පාස්කු නාට්‍යයේ තේමාව වනුයේ ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ඇණ ගසා අනේක විධ දුක් දී ඝාතනය කළ ආකාරය සහ දින තුනකින් එතුමා මළවුන්ගෙන් උත්ථාන වීම යි.

ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය සම්ප්‍රදායය ආරම්භ වී විකාශය වන අයුරු

(1) 1728න් පසු ව මන්නාරමට නුදුරු පේසාලේ, යාපනය සහ මීගමුව දූව වැනි ස්ථානවල පාස්කු නාට්‍ය පෙන්වීම ආරම්භ කිරීම. 1728 දී ගෝවේ සිට පැමිණි සාහිත්‍යය හා සංගීතය පිළිබඳ වියත් පූජකයකු වූ ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා විසින් රචිත දුක්ප්‍රාප්ති ප්‍රසංගය නම් ගද්‍ය කාව්‍ය කථකයකු විසින් භක්ති ස්වරයෙන් උච්චාරණය කරන විට සුරුවම් හෙවත් ප්‍රතිමා කර්මණ්‍ය කරමින් ඉපැරණි පාස්කු නාට්‍ය පෙන්වීම.

(2) 1839 දී දූවේ පාස්කු රඟ දක්වීම සඳහා ඉන්දියාවේ කොචින් නුවර සිට ගෙන ආ ඓතිහාසික ක්‍රිස්තු ප්‍රතිමාව යොදා ගැනීම. ක්‍රිස්තු තුමා මරණයට මුහුණ දෙන අවසන් අවස්ථාව ''නූල් සූත්තර'' මඟින් සජීව අයුරින් නිරූපණය කිරීම.

(3) 1939 දී මර්සලින් ජයකොඩි පියතුමා ගේ පිටපතට අනුව දූවේ පාස්කු රඟ දැක්වීම, පිලාත් රජු ගේ නඩු තීන්දුව දක්වා පමණක් ජීවමාන පිරිමි නළුවන් යොදා ගැනීම. ඉතිරි කොටස සඳහා ප්‍රතිමා යොදාගැනීම.

(4) 1939න් පසු ව ක්‍රමික ව නාට්‍ය අවසානය තෙක් ජීවමාන නළු-නිළියන් ගේ රංගන දායකත්වය ලබා ගැනීම. අදත් ක්‍රිස්තුතුමා අවසන් හුස්ම හෙළන අවස්ථාව ඓතිහාසික ප්‍රතිමාව මඟින් නිරූපණය කිරීම.

(5) 1923 දී බොරලැස්සේ ලෝරන්ස් පෙරේරා විසින් බොරලැස්ස පාස්කු වේදිකාව නාට්‍ය සම්ප්‍රදායය ආරම්භ කිරීම. එය ලෝ ප්‍රකට ජර්මනියේ ඔබේරඅමගවු ග්‍රාමයේ දී වසර 10කට වරක් පෙන්වන පාස්කු නාට්‍ය ආදර්ශ කොට නිෂ්පාදනය කිරීම.

(6) දූවේ, මීගමුවේ සහ වෙනත් ගම් නගරවල දෙව්මැදුරු ආශ්‍රිත ව මහ සිකුරාදා ජන වන්දනා වත් පිළිවෙත් සමඟ භක්ති අභ්‍යාසයක් ලෙස වර්තමානයේ දීත් පාස්කු නාට්‍ය පෙන්වීම.

(7) බොරලැස්ස පාස්කු වේදිකා නාට්‍ය ආදර්ශ කොට ගනිමින් ඇරඹුණ පාස්කු වේදිකා නාට්‍ය ප්‍රවණතාව ද ඉදිරියට යාම.

උදා: ලෙස්ලි බොතේජු ගේ ''එසේ ය අපි ඔහු මැරුවෙමු'', නයිනමඩම මෙරිල් ප්‍රනාන්දු ගේ ''ගොල්ගොතා'', දූවේ ක්ලෙමන්ට් ප්‍රනාන්දු ගේ ''කටු ඔටුන්න''.

පියවර 02 පාස්කු නාට්‍ය සම්ප්‍රදායයේ ප්‍රධාන ධාරාව ලෙස ගිණිය හැකි දූවේ පාස්කු දුක්ප්‍රාප්ති නාට්‍යයේ රඟ දක්වනු ලබන ප්‍රධාන අවස්ථා පෙළ ගැස්වීම.

- ලෝක ආරම්භය - සුගති උද්‍යානය තුළ ආදම් ඒව කතාව
- පිලාත් රජු ගේ මාළිගාව අසලින් ජෙරුසලෙම් නුවරට ජේසුතුමා ජනතාව ගේ ''හෝසන්නා'' ජය ඝෝෂාවෙන් යුතු ව වැඩම කිරීම.
- අන්තිම රාත්‍රි භෝජනය
- ද්‍රෝහි වූ ජුදාස් ජේසුතුමා සතුරන්ට පාවා දීම සඳහා පිටත් වීම.
- ගෙත්සමෙනි උයනේ දී ජේසුතුමා සතුරන් අතට පත් වීම
- අන්නාස් සහ කයාෆාස් නායක පූජකවරුන් අබියස අනඩු ගුරු සභාව වෙත ජේසුතුමා ඉදිරිපත් කිරීම.
- ජේසුතුමා ගල් කණුවේ බැඳ කස පහර දීම.
- පිලාත් ආණ්ඩුකාරයා ජේසුතුමා මරණයට තීන්දු කිරීම.
- ජේසුතුමා ගේ කර මත කුරුසිය පැටවීම.
- වෙරෝනිකා නම් බැතිමත් ළඳ ජේසුතුමා ගේ මුහුණ රෙදි කඩකින් පිස දැමීම.
- ජේසුතුමා කුරුසියේ ඇණ ගැසීම.
- ජේසුතුමා ගේ ශ්‍රී දේහය ගල්ලෙනෙහි තැන්පත් කිරීම.
- ජේසුතුමා මළවුන්ගෙන් උත්ථාන වීම.

පියවර 03 පාස්කු නාට්‍ය රඟ දක්වන අයුරු හෙවත් එහි රංග ශෛලිය විමසීමෙන් එහි අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ හඳුනාගත හැකි ය.

- දූව පාස්කු නාට්‍යයේ නාඩගම් ලක්ෂණ ඇත.
- ආරම්භ කිරීමේ දී පූර්ණ විරිඳුව ගායනා කරනු ලැබේ.
- පොතේ ගුරා හෙවත් දේශනාවාදියා සහ අත්වැල එය ගායනා කිරීම.

"බිහි ව ලෝ තුළ දිළිඳු ගවලෙන, මුදා ගන්නට දෙරණ වැසි සැම, ඇවිද තැන තැන පිබිදූ මන සොඳ පසිඳු දෙවිඳුගෙ වදනිනා, එදින දූරු බල සතුරු යුද කැල ක්‍රෝධ ගිනි මැද පිසසු සේ ගොර කුරුසේ වද විඳ දූමුව එම සඳ සමිඳු පණ නළ සැඟවුණා."

- අනතුරු ව දේශනාවාදියා මැවීම පිළිබඳ පුවත නාඩගම් ස්වරයෙන් උච්චාරණය කරයි. එය දේශනාව නම් වේ. ''අපගේ ස්නේහවන්ත ස්වාමීන් වන දෙවි පියාණන් වහන්සේ ....."

- එලෙස කතා පුවතේ මූලික සිදුවීම් දේශනාවාදියා විසින් නාඩගම් සම්ප්‍රදායයට අනුව ගායනයෙන් ඉදිරිපත් කිරීම.

රංගනය

දූව පාස්කු නාට්‍යයේ නාට්‍ය ධර්මී ලක්ෂණ අතර රංගන ශිල්පීන් විසින් තම භූමිකා ලෝක ධර්මී ආකාරයට භාවාතිශය අයුරින් (Melodramatic form) නිරූපණය කරනු ලැබීම,

- සංවාද නිර්මාණයේ තාත්ත්වික මෙන් ම භාවාතිශය විලාසයක් දක්නට තිබීම. නූර්ති භාෂා ලක්ෂණ ද දිස්වීම.

  උදා : ''ජුදාස් (හති ලමින්)

  අහෝ නායක පූජක තුමෙනි! මේ මොන අපරාධයක් ද? නිර්දෝෂ රුධිරයෙන් මේ ජුදා පොළොව තෙත් කරන්න ද යන්නෙ?

  කයාපාස්

  ජුදාස් නුඹට පිස්සු ද?''

රංග භූමිය

- ස්ථාවර රංග මණ්ඩපයක් හෙවත් වේදිකාවක් නොවීම.
- කොටස් තුනකින් යුත් රංග භූමියකි. මධ්‍ය වේදිකාව සහ දෙපස අතුරු වේදිකා දෙකකි. අන්තිම රාත්‍රි භෝජනය මැද භාගයේ දර්ශනය වන විට එක පැත්තක කයාපාස් පූජක තැන ජුදාස් සමඟ කුමන්ත්‍රණය කිරීම දක්වේ. මධ්‍ය වේදිකාව කුරුසිය ස්ථානගත කළ හැකි අයුරින් උස් ව පිහිටා තිබීම.

  (බොරලැස්ස රංග භූමිය කොටස් 5කි. දෙපස අතුරු වේදිකා දෙක බැගින් තිබීම)
- සුරුවම් කර්මණ්‍ය කරනු ලැබූ මුල් කාලයේ පැවති රංග භූමිය හෙවත් පාස්කු මණ්ඩප ජේසාලේ හා පිටිපන වැනි දෙව්මැඳුරු අසල දක්නට තිබීම. ඒවා ස්ථාවර රංග මණ්ඩප වේ. පොළොව මට්ටමේ සිට අඩි 6ක් පමණ උසින් වේ.

රංග භූමි අලංකරණ

- රංග භූමි අලංකරණ ලෙස දූව හා බොරලැස්ස යන පාස්කු සම්ප්‍රදායවල දී චිත්‍ර වස්ත්‍ර භාවිත කිරීම.

  උදාඃ දූව පාස්කු නාට්‍යයේ ජේසලම්පුරය චිත්‍රණය කරන ලද පසුබිම් තිරය

- බොරලැස්ස පාස්කුව රඟ දැක්වීමේ දී ජේසුතුමා ස්වර්ගයට නැඟීම, පාවෙන වලාකුළු සමග ඉතා විචිත්‍ර ආකාරයට විදුලි ආලෝකය මගින් ඉදිරිපත් කළ බව.

  (ඩේලිනිව්ස් - 1936 අප්රේල් 19)

ඇඳුම් පැලඳුම්

- පාස්කු කතා පුවතට ගැළැපෙන රෝම, ජුදා, ඇඳුම් පැලඳුම් මෙන් ම වර්තමානයේ දී දේශීය ඇඳුම් පැලඳුම් ද එක් වී තිබීම.
- අංග රචනයේ දී විදේශීය ලක්ෂණ ද මිශ්‍ර වී තිබීම.

  උදාඃ රජ, සෙන්පති, නායක පූජක සඳහා උචිත රැවුළු වර්ග
- රෝම යුද්ධ භටයන් ගේ ඇඳුම්, තොප්පි, අත් පලඳනා යනාදිය ජුදා ලෝගුව, යක්ෂයා නිරූපණය කරන කළු ලෝගු යනාදිය

නාට්‍යෝපකරණ

- කාඩ් භාජන, ලන්ස, කඩු, කුසලාන (දුවේ දි මාළු කපන දිග මන්න පිහි යොදා ගෙන ඇත)

  දූව පාස්කු නාට්‍යයේ දී කොටළුවා ලෙස රෝද සවි කරනු ලැබූ කළු ලී අනුරුව යොදා ගැනීමේ දී එය ඇදගෙන යාම. ගැමියන් කොටළුවා ආදරයෙන් හඳුන්වනුයේ 'කලු දයා' නමින් ය.

සංගීතය

- දූව පාස්කු සම්ප්‍රදාය නාඩගම් ලක්ෂණ මෙන් ම පසම් ළතෝනි ගායනා ද දෙව් මැදුරු ගීතිකා (කන්තාරු සම්ප්‍රදායෙහි) ද යොදා ගෙන තිබීම.

- දූව පාස්කුවේ ජන ගී ආභාසය ද දක්නට ලැබීම.

  උදා ඃ ''සඳ පහනේ පිපි වැටකෙය මල සේ
  සුවඳ දිදී තිබිලා
  සඳ පහනේ පිපි මානෙල් මල සේ
  රුවට රුවේ තිබිලා
  සඳ පහනේ කිරි මුහුද වගේ
  අහෝ සුදට සුදේ තිබිලා
  ජේසු අනේ මේ කිමද වුණේ ඔබ
  මුහුණ ලෙයින් තෙමිලා''

  වෙරෝනිකා නම් යහපත් ස්ත්‍රිය ගයන පසම් ගායන මෙන් ම ප්‍රාණය නිරුද්ධ ජේසුතුමා දෙව් මවු උකුළෙහි තබන අවස්ථාවේ ගායනා කරනු ලබන විලාප ගීතය හෙවත් ළතෝනි ද ප්‍රේක්ෂක බැතිය වඩවයි. දෙව් මවු විලාපය දනවන පසම් ගායනයට උදාහරණ

  ''සුර ලොවිනේ බැස මෙදිනේ
  මවු කුසිනේ බිහි වෙමිනේ
  කුඹු දෙතනේ කිරි බොමිනේ
  මිණි ලෙසිනේ වැඩුණ තැනේ
  දිලෙන රනේ රුව ලෙසිනේ
  මල් උයනේ සිටිය දිනේ
  මෙම මරණේ ඔබට වුණේ
  කිම ද අනේ සුර රජුනේ
  අයි .... අයියෝ ....''

- බොරලැස්ස පාස්කු සම්ප්‍රදායේ දී උත්තර භාරතීය රාගධාරි සංගීතය හා බටහිර සංගීතය යොදා ගෙන තිබීම.

නිෂ්පාදනය තුළ විශේෂතා

- පොදුවේ පාස්කු නාට්‍ය සඳහා ගම්වල ජීවත් වන පිරිස නළුනිළියන් ලෙස යොදා ගැනීම.
- පාස්කු නාට්‍යවල නිසල පිළි රූ මෙන් නළුවන් ජීව රූප අයුරින් වේදිකාව මතට ගෙන ඒම. (Tableaux Vivants) උදා: ආදම් සහ ඒව
- පාස්කු නාට්‍ය නිෂ්පාදනය දේශීය නාට්‍යයේ කලාවේ පෝෂණයට ඉවහල් වී ඇති බව

  උදා : ධම්ම ජාගොඩ ගේ මළවුන් නැඟිටියි

  ජයන්ත චන්ද්‍රසිරි ගේ මෝරා

  මෙම නාට්‍යවල රංග කාර්යයෙහි ලා පාස්කු නාට්‍යයේ යම් ලක්ෂණ ඇතුළත් වීම.
- නළුනිළියන් 300 දෙනකු පමණ සහභාගි වීම.
- වර්තමානයේ දීත් කුරුසියේ ඇණ ගැසීමේ ජවනිකාව සඳහා ජේසුතුමා ගේ භූමිකාව රඟපාන ජීවමාන රංගන ශිල්පියා වෙනුවට දූවේ ආශ්චර්යමත් ක්‍රිස්තු ප්‍රතිමාව යොදා ගැනීම.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ශ්‍රී ලංකාවේ කිතුනු ආගමික ජන නාට්‍යයක් ලෙස පාස්කු නාට්‍යයේ සුවිශේෂත්වය විමසන්න.
- ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍යයේ ආරම්භය හා එහි පසුබිම විස්තර කරන්න.
- පාස්කු නාට්‍ය කථා වස්තුව හා එහි ඇතුළත් සිදුවීම් පෙළ ගස්වන්න.
- පාස්කු නාට්‍ය රංග ශෛලිය නිදසුන් මඟින් පැහැදිලි කරන්න.

පැවරුම : වීඩියෝ පටයක ආධාරයෙන් පාස්කු නාට්‍ය ජවනිකා කීපයක් නරඹන්න.

වැඩිපුර අධ්‍යයනය සඳහා :

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර	-	සිංහල ගැමි නාටකය
දූවේ පාස්කු සංවිධානය	-	දූව ආශ්චර්යමත් ක්‍රිස්තු ප්‍රතිමාව (වසර 150 මංගල ජයන්ති ප්‍රකාශය 1839-1989)
නාට්‍ය හා රංග කලා, ප්‍රතිබිම්බ කලා අධ්‍යයන ඒකකය, කැලණිය විශ්ව විද්‍යාලය	-	මීගමු දූවේ පාරම්පරික පාස්කු දර්ශනය 2009

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය, විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.6 : නූර්ති, මිනර්වා ආදි නාට්‍ය ප්‍රභේදයන්ගෙන් දේශීය නාට්‍ය කලාවේ පෝෂණයට ලැබුණු පිටිවහල වටහා ගනී.

ක්‍රියාකාරකම 4.6.1 : නූර්ති හා ටවර්හෝල් නාට්‍යය

කාලච්ඡේද සංඛ්‍යාව : 04

ඉගැනුම් පල :
- නූර්ති නාට්‍ය කලාවේ ආරම්භය පිළිබඳ ව ගවේෂණය කරයි.
- නූර්ති රංග ශෛලිය පැහැදිලි කරයි.
- ටවර් හෝල් නාට්‍ය පිළිබඳ ව කරුණු රැස් කරයි.
- නූර්ති/ටවර්හෝල් නාට්‍ය සඳහා පුරෝගාමී වූ නාට්‍යකරුවන් හා ඔවුන් ගේ නිර්මාණ ගවේෂණය කරයි.
- නූර්ති/ටවර්හෝල් නාට්‍ය රස විඳින්නෙක් වෙයි.

ගුණාත්මක යෙදවුම් : නූර්ති/ටවර්හෝල් නාට්‍ය පිළිබඳ ලිපි ඇතුළත් පොත්පත්
සිංහල ගැමි නාටකය - එදිරිවීර සරච්චන්ද්‍ර
සිංහල නාට්‍ය ඉතිහාසය - ඩී. වී. හපුආරච්චි
සිංහල නාට්‍යයේ විකාශය - තිස්ස කාරියවසම්
සිංහල නාට්‍ය වංශය - - විජේරත්න පතිරාජ
(නූර්ති / ටවර්හෝල් නාට්‍යවල පින්තූර පත්‍රිකා ඇති නම් මේවායේ ශ්‍රව්‍ය දෘශ්‍ය පට)

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- නූර්ති යන්න ''නෘත්‍ය'' (අදහස් ප්‍රකාශනය සඳහා යොදා ගන්නා නර්තනය) යන වචනයෙන් බිඳී ව්‍යවහාරයට පත් වූවකි. 1877 බොම්බායේ සිට ලංකාවට පැමිණි බාලිවාලා ගේ ''එල්පින්ස්ටන් ඩ්‍රැමටික් කම්පැනි'' නම් වූ පාර්සි නාට්‍ය කණ්ඩායම මෙරට නූර්ති ප්‍රචලිත කිරීමෙහි ලා මූලික වී ඇත.
- නාඩගම් කලාව පිරිහෙමින් තිබූ මෙම යුගයේ ඇති වූ ආර්ථික සාමාජික හා සංස්කෘතික වෙනස්කම්වලට ගැළපෙන උචිත නාට්‍ය ක්‍රමයක් සකස් කර ගැනීමෙහි ලා සී. දොන් බස්තියන් ජයවීර නමැති නාට්‍යකරුවා දැරූ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස රොලීනා නම් මුල් ම නූර්තිය ඔහු විසින් නිර්මාණය කරනු ලැබ ඇත. මේ වන විට බිහි වෙමින් තිබූ විවිධ රඟුම් විලාස ඇසුරෙන් කාලයට උචිත ලෙස මෙම නාට්‍ය වර්ගය ඇරඹීමෙහි ලා ඔහු පුරෝගාමී විය.
- පාර්සි නාට්‍ය කණ්ඩායම රෝමියෝ ජුලියට්, ඔතෙලෝ, ඇලඩින්, හරිස්චන්ද්‍ර, අරාබි නිසොල්ලාසයේ කතාවලින් ද යුත් නව මාදිලියේ නාට්‍ය රැසක් ඉදිරිපත් කරමින් එකල ප්‍රේක්ෂක ආකර්ෂණයට පාත්‍ර වූ අතර එය ජනප්‍රිය ම කණ්ඩායම විය. මේ කණ්ඩායම හැරුණු විට ''හින්දුස්තාන් ඩ්‍රැමටික් කොම්පැනිය'' විසින් ඉදිරිපත් කරන ලද ''ඉන්දර්සභා'' නම් නාට්‍යය හා කයිසර් ජපීර් නම් කොමඩි රංගනය ද මෙරට ජනයාට නැවුම් කලාවක රසය හා අත්දැකීමක් ලබා දී ඇත. ගීත නාට්‍ය ශෛලියේ ''ඉන්දර්සභා'' නාට්‍යය මෙරට නවීන සිංහල නාට්‍ය කලාවේ ප්‍රභවයට ආසන්න බලපෑමක් කළ බව පැවසේ. ඉන්දියාව සමග පාලන හා ගමනාගමන සම්බන්ධතා පුළුල් ව පැවතීමේ හේතුවෙන් මෙම කණ්ඩායම් පැමිණීමට පෙර සිට ම ඉන්දියාවේ ජනප්‍රිය ගීත හා හින්දුස්තානී සංගීතය ලංකාවේ ප්‍රචලිත ව තිබී ඇත. බලිවාලා නාට්‍ය කණ්ඩායම මාසයක් පමණ මෙරට රැඳී සිටිමින් ඉදිරිපත් කළ විවිධ රංගනවලින් යුත් නව නාට්‍ය කලාව, පැවති නාට්‍ය කලාව (නාඩගම්) කාලානුරූප ව සකස් කිරීමටත් සංවිධානාත්මක ලෙස දේශීය නාට්‍යකලාව පවත්වාගෙන යාමටත් පරිසරය සකස් කළේ ය. නාඩගම් අබිබවා නූර්ති ජනප්‍රිය වීමට හේතු වූ කරුණු කීපයක් පහත දැක්වේ.

- දින 3-7 අතර කාලයක් රාත්‍රිය පුරා ම රඟ දක්වන ලද නාට්‍ය වෙනුවට පැ 2-3කට සීමා වූ රංගයක් වීම.
- ගෘහස්ථ රංග ශාලාවක නැරඹීමට හැකියාව ලැබීම.
- ජවනිකා වෙනස් කිරීමට විචිත්‍ර වූ චිත්‍ර වස්ත්‍ර හෙවත් විචිත්‍රපට භාවිත කිරීම.
- අවස්ථා නිරූපණය සඳහා විවිධ රංග භාණ්ඩ මෙන් ම යාන්ත්‍රික උපකරණ ද යොදා ගනිමින් මනා ප්‍රේක්ෂාවක් ඇති කිරීම.
- උතුරු ඉන්දීය හින්දුස්තානි රාග තාලවලට අනුව නිර්මාණය කරන ලද ගීත වැඩි සංඛ්‍යාවක් යොදා ගැනීම.
- රංගනය සඳහා කාන්තාවන් ද සහභාගි කර ගැනීම.
- වේශ නිරූපණ රංගභූමි අලංකරණ, වේශ භූෂණ ඉතාම විචිත්‍ර අයුරින් යොදා ගැනීම.
- නාඩගමේ බහුභූතයා නූර්තියෙහි කවටයා ලෙස පෙනී සිටීම

සී. දොන් බස්තියන්

නූර්ති කලාවේ පුරෝගාමියා වූ මොහු විසින් ඒ වන විට බිහි වෙමින් තිබූ විවිධ රැඟුම් විලාස ඇසුරෙන් කාලයට උචිත වෙනත් නාට්‍ය ප්‍රභේදයක් සම්පාදනය කිරීමෙහි ලා නූර්ති නාට්‍ය රාශියක් නිර්මාණය කරන ලදි. උදාහරණ වශයෙන්,

රොම්ලින්, රෝමියෝ හා ජුලියට්

ප්‍රාන්ක්ලෝ සහ ඉංගර්ලි, ප්‍රෝටියස් හා වැලන්ටයින්

ලියෝනයින් සහ එම්ලින්

සිංහබා, සුදාස සහ ශාලිනී

දිනතර, දූලා හෙවත් කපටි බෑණා, ස්වර්ණතිලකා, ඇලඩින්, අලිබබා, හරිශ්චන්ද්‍ර, වැනීසියේ වෙළෙන්දා, ඇස් යූ ලයික් ඉට් ආදිය සඳහන් කළ හැකි ය.

ජෝන් ද සිල්වා

සී දොන් බස්තියන්ගෙන් පසු ව නූර්ති කලාව හා බැඳුණු සිංහල නාට්‍ය කලාවේ ප්‍රවර්ධනය සඳහා කැප වූ ප්‍රධාන නාට්‍යකරුවා මොහු වේ. ජෝන් ද සිල්වා ගේ නාට්‍ය කොටස් පහකට වර්ග කොට දක්වා ඇත.

1. ලංකා ඉතිහාසය පදනම් කොටගත් නාට්‍ය

   දස්කොන්, පරංගි හටන, සිරිසඟබෝ චරිතය, දුටුගැමුණු චරිතය, අලකේශ්වර චරිතය
2. සාම්ප්‍රදායික බෞද්ධ කථා වස්තු ඇසුරු කොටගත් නාට්‍ය වෙස්සන්තර ජාතක දෘශ්‍ය කාව්‍යය, විධුර දෘශ්‍ය කාව්‍යය, කුස ජාතක දෘශ්‍ය කාව්‍යය
3. සංස්කෘත සාහිත්‍ය ඇසුරු කොටගත් නාට්‍ය

   ශකුන්තලා නාට්‍යය, රත්නාවලී නාට්‍යය, නාගානන්ද නාට්‍යය, නල රාජ චරිතය, උත්තර රාම චරිතය
4. ඉංග්‍රීසි නාට්‍යවල අනුවාද (ශේක්ස්පියර් නාට්‍යය)

   ඔතැලෝ, හැම්ලට්, වැනීසියේ වෙළෙන්දා, මිම්මට මිම්ම
5. කාලීන සමාජ අත්දැකීම් පදනම් කොටගත් නාට්‍ය

   පරාභව නාටකය, මරණානුස්මෘති ප්‍රකරණය, සුරාසොඬප්‍රකරණය, සිංහල භාෂා ප්‍රකරණය

චාල්ස් ඩයස්

චාල්ස් ඩයස් නාට්‍යකරුවා ද දේශීය ඓතිහාසික කථා, ජාතක කථා, සංස්කෘත සාහිත්‍ය කථා, ප්‍රකට කතා පුවත්, යුරෝපීය නාට්‍යවල අනුවාද, විවිධ ප්‍රබල චරිත පදනම් කරගත් නිර්මාණ විවිධ කාව්‍ය සංග්‍රහ, නූතන වීර චරිත ආදිය පදනම් කොට ගෙන නාට්‍ය රාශියක් නිර්මාණය කළේ ය. පණ්ඩුකාභය, ඇලඩීන් සහ පුදුම පහන, පද්මාවතී සහ ධාතුසේන, දුටුගැමුණු, වළගම්බා, කුසරජ චරිතය, උම්මග්ග ජාතකය, ශ්‍රී වික්‍රම රාජ චරිතය, විජය, ධර්මාශෝක, කාවන්තිස්ස සිවම්මා හා ධනපාල, ඔතැලෝ, විධුර, කාව්‍යශේඛරය, නාගානන්ද, උදයරාජ චරිතය, ගුත්තිල නාටකය, සරදියෙල්, මානාබරණ, මහාසේන, ඉසබෙල් නොහොත් සංකාවේ විපාක යනාදි නාට්‍ය රාශියක් නිර්මාණය කොට ඇතත් බොහෝ නිර්මාණ අප්‍රකට ය.

නූර්ති සංගීතඥයෝ කීප දෙනෙක්.

ගුජරාටයේ පණ්ඩිත් අම්මාලාල්, සදාලාල්, මදන්ලාල්, මෝහන් ලාල්, සුල්තාන් බක්ස්, අබ්දුල් සතාර්, සදා සිවන්, විශ්වනාත් ලව්ජි, නවාබ් ඛාන්, ඩබ්ලිව්. සතාසිවම්, එච්. එච්. රූපසිංහ

ටවර් හෝල් නාට්‍යය

1911න් ආරම්භ වී 1932 සිනමා ශාලාවක් බවට පත් වන තාක් කාලය තුළ ටවර් රඟහලේ නිර්මාණය වූ නාට්‍ය ටවර් හෝල් නාට්‍ය නම් වේ. එවකට සරස්වතී ශාලාව, හුනු පිටියේ පබ්ලික් හෝල්, ජින්තුපිටියේ නාට්‍ය මණ්ඩපය, මල් වත්තේ පාර්සි නෘත්‍ය ශාලාව, ආදුරුප්පු වීදියේ නෘත්‍ය මණ්ඩපය වැනි තාවකාලික රංගශාලා පැවතුණ ද පරිපූර්ණ නෘත්‍ය ශාලාවක් ලෙස ඉදි වූ ප්‍රථම රංග ශාලාව ''ටවර් හෝල්'' විය. චාල්ස් ඩයස් ගේ ''පණ්ඩුකාභය'' නාට්‍ය පෙන්වීමෙන් විවෘත කරන ලද මෙහි ඔහුගේ සියලු ම නාට්‍ය පෙන්වා ඇත. නූර්තියේ අවසාන කාලයේ ටවර් හෝල් යුගයේ කීර්තිමත් ම නාට්‍යකරුවා වූ චාල්ස් ඩයස් ගේ ජනප්‍රිය නිර්මාණ අතර ශ්‍රී වික්‍රම රාජසිංහ, ඔතැලෝ, නාගානන්ද සහ කුස, භූරිදත්ත, විධුර, ධර්මාශෝක, පද්මාවතී, චන්ද්‍රා යන නාට්‍ය කැපී පෙනිණි.

මුල් ටවර් හෝල් නාට්‍යකරුවන් අතර මැන්දිස් පෙරේරා, ඩබ්ලිව්. සී. පෙරේරා, ස්ටීවන් ලක් පතිරණ වරාගොඩ, අයි. සී. ද. ජෑන්ස්, ඩී. ජේ. ඩබ්ලිව් ගුණතිලක, පී.ටී.ජී. ප්‍රේමචන්ද්‍ර, ජේ. රත්නායක, එල්.ඩී. ස්ටීවන් සිල්වා, එම්. ජී. පෙරේරා, ජේ.පී. දාබරේ කැපී පෙනුණ අතර ටවර් හෝල් අවසාන කාලයේ ජෝන් ද සිල්වා ගේ පුත් පීටර් ද සිල්වා, ප්‍රකට සංගීතඥයකු වූ එම්. ජී. පෙරේරා, ඇස්. ඩී. ස්ටීවන් ද සිල්වා, බී. ඇල්. බෝධිපාල යන නාට්‍යකරුවන් ගේ නිර්මාණ ජනප්‍රිය විය.

පීටර් ද සිල්වා ගේ - සෝෂක, කුවේණි, මනෝහාරා
එච්.සී. පෙරේරා ගේ - වැනීසියේ වෙළෙන්දා, ජුලියස් සීසර්, නෙමිසියස්
ඇස්. ඩී. ස්ටීවන් ද සිල්වා ගේ - ද සයින් ඔෆ් ද ක්‍රෝස්, ඇන්ටනි සහ ක්ලියෝපැට්රා ඒ අතර වේ.

නූර්ති නාට්‍ය කලාව පිරිහීමට බලපෑ සාධක

- විවිධ සංස්කෘතීන්ගෙන් මිශ්‍ර කොටගත් අංග නූර්තියේ ඇතුළත් වීම.
- නාට්‍ය සන්දර්භය පිළිබඳ හසළ බුද්ධියක් ඇති රචකයන් දුර්ලභ වීම.
- කථා වස්තුව ඉදිරිපත් කිරීම විනා මනා වූ නාට්‍යමය අවස්ථා මතුවන ආකාරයට පෙළ රචනා නොවීම.
- නාට්‍යයේ රසය විසිරී යන අයුරින් අනවශ්‍ය ලෙස ජවනිකා යොදා ගැනීම.

- අනුචිත ලෙස ගී සින්දු බහුල ව යොදා ගැනීම හා නාට්‍ය රසයට වඩා ගීත රසය ඉස්මතු වීම. ගී රසය අතින් කෙතරම් කන්කලු වුව ද නූර්ති සංගීතය නාඩගම් සංගීතය තරම් නාට්‍යෝචිත නොවීම.
- සමකාලීන ව විචාරවත් රසික පිරිසක් නොසිටීම.
- ද්විභාෂික මධ්‍යම පාන්තිකයන් විසින් පවත්වා ගෙන යනු ලැබුවත් මෙම නාට්‍ය කලාව ඔවුන් විසින් ම ප්‍රතික්ෂේප කරනු ලැබීම.
- ඉංග්‍රීසි පාලකයන් ගෙන් මෙම නාට්‍ය කලාවට කිසි දු අනුග්‍රහයක් නොලැබීම.

එමෙන් ම නූර්ති නිර්මාණය කිරීම එක් එක් සමාගම් යටතේ තරගකාරී ව හා වාණිජ පරමාර්ථයෙන් සිදුවීම නිසා ප්‍රධාන නාට්‍යකරුවන් අතර භේදකාරී තත්ත්වයක් ඇති වීම ද මෙම නාට්‍ය ඉදිරියට පවත්වා ගෙන යාමට බාධාවක් වී ඇත. කෙසේ නමුදු දේශීය නාට්‍ය කලාවේ පෝෂණයට නූර්ති නාට්‍යවලින් ලද දායකත්වය අගය කළ යුතු වේ.

- විශාල නාට්‍ය සංඛ්‍යාවක් බිහි වීම.
- ප්‍රථම නූතන සිංහල නාට්‍ය කලාව ලෙස ජාතික ප්‍රබෝධයක් ඇති කිරීම.
- නූර්ති නාට්‍ය කලාව සමඟ රංග ශිල්ප රාශියක් දේශීය නාට්‍ය කලාවට එක් වීම.
- දේශීය නාට්‍ය කලාව වෘත්තීය කලාවක් බවට පත් කිරීමට පදනමක් සකස් වීම.
- නව රංග ශෛලියක් බිහි වීම.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නූර්ති හා ටවර් හෝල් නාට්‍ය කලාව පිළිබඳ ව විස්තර කරන්න.
- නාඩගම් අබිබවා නූර්ති ජනප්‍රිය වීම හා නූර්තියේ පිරිහීමට හේතු වූ කරුණු පැහැදිලි කරන්න.
- නූර්ති නාට්‍යකරුවන් හා ඔවුන් ගේ නිර්මාණ පිළිබඳ ව ගවේෂණය කරන්න.

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.6 : නූර්ති, මිනර්වා ආදී නාට්‍ය ප්‍රභේදයන්ගෙන් දේශීය නාට්‍ය කලාවේ පෝෂණයට ලැබුණු පිටිවහල වටහා ගනී.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගැනුම් පල :
- ටීටර් හා මිනර්වා නාට්‍ය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.
- එම නාට්‍යයන් නිර්මාණය කළ නිර්මාණකරුවන් නම් කරයි.
- සිංහල නාට්‍ය කලාවට ටීටර් හා මිනර්වා නාට්‍යවලින් ලද දායකත්වය විමසයි.

ක්‍රියාකාරකම 4.6.2 : ටීටර් හා මිනර්වා නාට්‍යය

ගුණාත්මක යෙදැවුම් :
- ටීටර් හා මිනර්වා නාට්‍ය පිළිබඳ ලියැවුණු පොත්පත්
- එම නාට්‍යවලට අදාළ පින්තූර
- ටීටර් හා මිනර්වා නාට්‍ය පිළිබඳ ශ්‍රව්‍ය-දෘශ්‍ය පට
- මෙම නාට්‍ය සඳහා දායක වූවන් ගේ පින්තූර

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

ටීටර් යන්න "Theatre" යන ඉංග්‍රීසි වචනයෙන් බිඳී ආවක් ලෙස හැඳින්වෙයි. එහෙත් නූර්ති යුගයේ ම දිගුවක් ලෙස වෙනස්කම් කීපයක් යටතේ විකාශය වී ඇත.

ටීටර් නාට්‍යවල සුවිශේෂ ලක්ෂණ

- තාවකාලික වින්දනයට බර වූ අද්භූතවාදී කථා වස්තු විෂය කොට ගැනීම.
- ප්‍රධාන කතා පුවතට අමතර ව බාල වර්ගයේ විහිළු-තහළුවලින් යුත් අතුරු කතා ඇතුළත් කොට තිබීම.
- යථාර්ථවාදී හැසිරීම්වලින් ඔබ්බට ගිය සුදු කළු චරිත සමූහයක් මෙම කථා සඳහා යොදා ගැනීම.
- ජාත්‍යනුරාගය හා දේශීයත්වය අරමුණු කරගත් සාමාන්‍ය සමාජ කථා පුවත් ඇතුළත් වීම.

මිනර්වා නාට්‍යවල සුවිශේෂ ලක්ෂණ

- මධ්‍යම පාන්තික සමාජය හා ජීවන රටාව විවරණය කරන කතා වස්තු යොදාගැනීම.
- සාමාන්‍ය ජනතාව ගේ රස වින්දනයට සරිලන ප්‍රස්තුත තෝරා ගැනීම.
- හාස්‍යය දනවීම සඳහා ප්‍රධාන කතාවට අමතර ව අතුරු කතා යොදාගැනීම.
- මධ්‍යම පාන්තික ජීවන රටාව විවරණය කරන ආකාරයේ කතා පුවත් අන්තර්ගත වීම.

ටීටර් නාට්‍ය හා මිනර්වා නාට්‍යකරුවන් සහ ඔවුන් ගේ නිර්මාණ

ටීටර් - සිරිසේන විමලවීර

මායාදුන්නේ, සිංහලේ හෙවත් සිංහල වීරයා, විධුර, රොඩී කෙල්ල. අම්මා, සීදේවී, දියසේන පිටිසර කෙල්ල, ප්‍රතාප්සිං, ලංකා යක්ෂණී.

මිනර්වා - බී. ඒ. ඩබ්. ජයමාන්න

කඩවුණු පොරොන්දුව, පෙරළෙන ඉරණම, වැරදුණු කුරුමානම, සැඟවුණු පිළිතුර, කපටි ආරක්ෂකයා, උමතු විශ්වාසය, කවට අන්දරේ, අයිරාංගනී, ජීවිත පූජාව, සසර දුක, වනලිය, මතභේදය

ටීටර් නාට්‍ය හා මිනර්වා නාට්‍යය පිරිහීමට බල පෑ හේතු

- තෝරා ගත් කථා වස්තු, චරිත, නාට්‍ය තේමා, රංග ශෛලිය, සංගීතය ඇතුළු ආනුෂංගික කලාවන් ගේ සංකලනය දිනෙන් දින අවපාතයට ගමන් කිරීම.
- නාට්‍ය රචනාවන් ගේ දුර්වල බව
- ප්‍රේක්ෂකයාට තාවකාලික විනෝදාස්වාදයක් සැපයීම හා බාල වර්ගයේ නාට්‍ය රචනා කිරීම.
- අභව්‍ය සිද්ධිවලින් යුක්ත වීම.
- චිත්‍රපට කලාවේ ආගමනය

මිනර්වා නාට්‍යවල මුල් යුගයේ කාන්තා චරිත සඳහා යොදාගන්නා ලද්දෝ ද පිරිමි ය. ඔවුන් අතරින් එම්. ඩබ්ලිව් ෆොන්සේකා, එඩී. ජයමාන්න, එම්. ජෝන් පෙරේරා ප්‍රමුඛ වූහ. කාන්තාවක ලෙස මූලික ව සම්බන්ධ වූයේ ග්‍රේටා ජෙනට් සිල්වා ය. පසු කාලයේ රුක්මණී දේවී, සූරියරාණි, ඩී. එස්. එලිසබෙත්, රූපාදේවි, ජොසපින් ජයලත්, ඇසිලින් බාලසූරිය, ජෙමිනි කාන්තා වැනි නිළියෝ ද, බී. ඒ. ඩබ්ලිව් ජයමාන්න, ස්ටැන්ලි මල්ලවආරච්චි, එඩී. ජයමාන්න, හර්බි සෙනෙවිරත්න, ක්‍රිස්ටි ද මෙල්, බී. එස්. පෙරේරා, පීටර් පීරිස්, ලැඩී රණසිංහ මෙන් ම හියුගෝ ප්‍රනාන්දු වැනි නළුවන් ද රංගනයෙන් දායක වී ඇත්තාහ. ටීටර් නාට්‍යවල සුසිලා ජයසිංහ, රංජනී දේවී, සිරිසේන විමලවීර ජනප්‍රිය තරු වූහ.

ටීටර් හා මිනර්වා නාට්‍යවල සංගීතය

උතුරු ඉන්දිය සංගීතය සමඟ හින්දුස්ථානී රාග තාලවලින් යුත් ගායන මෙන් ම වාදන ද ටීටර් සඳහා බලපෑව ද භාවිතයේ දී ටීටර් සංගීතයේ වෙනස්කම් ඇත. හින්දි තනු සමඟ ම ද්‍රවිඩ තනු ද යොදාගත් අතර සමකාලීන ව ජනප්‍රිය වූ මොහොමඩ් ගවුස් වැනි සංගීතඥයන් ගේ නිර්මාණශීලීත්වය ද උපකාරී කොට ගෙන ඇත. නූර්තිවල තරම් විශාල ගීත සංඛ්‍යාවක් නොයොදා ගන්නා අතර පුළුල් වාදක මණ්ඩලයක්, විවිධ සංගීත සංකලන ක්‍රම යටතේ යොදාගත් බව දක්වේ. හින්දි හා දෙමළ සංගීතය ශාස්ත්‍රීය පදනමකට වඩා සරල හා සංකර ස්වරූපයෙන් යොදා ගෙන ඇත. හාර්මෝනියම්, වයලීන්, ක්ලැරිනට්, තබ්ලා ආදී සංගීත භාණ්ඩ ප්‍රධාන කොටගත් 10ක පමණ වාදක මණ්ඩලයක් යොදාගෙන ඇත.

ටීටර් හා මිනර්වා නාට්‍ය ඉදිරියේ නූර්ති නාට්‍ය පසුබෑමට හේතු :

ටීටර් හා මිනර්වා නාට්‍ය

- පොදු ජනයාට සමීප නිර්මාණ කිරීම.
- ලංකාව පුරා ම පැතිරීම.
- ස්වාභාවික රංග රීතියට සමීප වීම හා සරල රංග රීතියක් අනුගමනය කිරීම.
- අප්‍රධාන විහිළු චරිතවලට පවා ප්‍රධාන තැනක් හිමි වීම.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ටීටර් හා මිනර්වා නාට්‍යයෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ විස්තර කරන්න.

නිපුණතාව 4.0 : නාට්‍ය හා රංග කලාව විෂය හා බැඳි දේශීය, විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 4.7 : ආදි විශ්වවිද්‍යාලයීය නාට්‍ය අතර වඩාත් කැපී පෙනෙන නාට්‍ය විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- විශ්වවිද්‍යාලය නාට්‍ය බිහි වීමට බලපෑ හේතු විමසයි.
- විශ්වවිද්‍යාලය ඉංග්‍රීසි නාට්‍ය හා මහාචාර්ය ලුඩොවයික් ප්‍රමුඛ පිරිස විසින් නාට්‍ය ක්ෂේත්‍රයට සිදු කරන ලද සේවය විස්තර කරයි.
- විශ්වවිද්‍යාලයීය සිංහල නාට්‍යයේ ප්‍රභවය විමසයි.
- විශ්වවිද්‍යාලය ආශ්‍රය කර ගනිමින් බිහි වු පරිවර්තන, අනුවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය හඳුන්වයි.
- 1877 - 1956 අතර කාලයේ දී නාට්‍ය ක්ෂේත්‍රයේ වැදගත් සන්ධිස්ථාන පිළිබඳ ව සාකච්ඡා කරයි.

ක්‍රියාකාරකම : සිංහල නාට්‍ය කලාවේ ප්‍රගමනය උදෙසා විශ්වවිද්‍යාලයීය දායකත්වය (මනමේ නාටකය තෙක්)

ගුණාත්මක යෙදවුම් :
- විශ්වවිද්‍යාලය නාට්‍ය පිළිබඳ ව ලියැවුණු ග්‍රන්ථ.
- මහාචාර්ය ලුඩොවයික්, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර, නියුමාන් ජුබාල් යන අය ගේ ඡායාරූප.
- තත්කාලීන නාට්‍ය දර්ශනවල ඡායාරූප හෝ සංයුක්ත තැටි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- විශ්වවිද්‍යාලය නාට්‍යයේ ගමන් මඟ සකස් වී ඇති ආකාරය. 1921 දී කොළඹ විශ්වවිද්‍යාලය කොලීජිය ආරම්භ විය. මේ වන විට බාහිර සමාජයෙහි ඉංග්‍රීසි නාට්‍ය නිෂ්පාදනය පිළිබඳ ප්‍රවණතාවක් ඇති වීමට සමගාමී ව විශ්වවිද්‍යාලයයේ The University College Dramatic Society නමින් ඉංග්‍රීසි නාට්‍ය සංගමයක් බිහි විය. පසු ව එය The Ceylon University Dramatic Society නමින් නාට්‍ය නිෂ්පාදන සඳහා දායක විය.

- 1933 සිට මෙම ඉංග්‍රීසි නාට්‍ය සංගමය වෙනුවෙන් මහාචාර්ය ඊ. එෆ්. සී. ලුඩොවයික් විසින් වාර්ෂික ව ඉංග්‍රීසි නාට්‍ය නිෂ්පාදනය කොට වේදිකා ගත කරන ලදි. Where Women Rule, The Rivals, Imaginary Invalid ආදි වශයෙන් නාට්‍ය දහනවයක් පමණ ඔහු නිෂ්පාදනය කොට ඇත. (නාට්‍ය ලේඛනය අතිරේක උදවු යටතේ සඳහන් කොට ඇත.)

- 1950 දශකය ආරම්භයේ ශේක්ස්පියර් සමාජය, ද ප්ලේයර්ස්, සිලෝන් ඩ්‍රාමා ලීග් වැනි නාට්‍ය සංගම් සහ රොබට් පී නිවුටන්, නියුමාන් ජුබාල් යන අය ද නාට්‍ය නිෂ්පාදනයේ නිරත වූහ.

- මහාචාර්ය ලුඩොවයික් ගෙන් පසුව ඉංග්‍රීසි නාට්‍ය නිෂ්පාදනය කළවුන් අතර ශිෂ්‍ය නිෂ්පාදන කළවුන් ලෙස මහාචාර්ය සී. ඩබ්. අමරසිංහ, මහාචාර්ය ඇෂ්ලි හල්පේ, ආචාර්ය රංජනී ඔබේසේකර, ලක්ෂමී ද සිල්වා, ක්ලොඩට් ජයවර්ධන ආදීහු වැදගත් වෙති.

- 1923 දී යුනිවර්සිටි කොලීජියේ "ලංකා විශ්ව විද්‍යාලයයේ සිංහල ශාස්ත්‍රීය සමිතිය" ආරම්භ විය. එමගින් 1929 දී ජෝන් ද සිල්වා ගේ "දුටුගැමුණු" නාට්‍යයේ ජවනිකා කිහිපයක් රග දැක්විණි. 1931 චාල්ස් ඩයස් ගේ "මායාවතී", ඕ. එම්. ද අල්විස් විජේසේකර ගේ "කමලා නොහොත් රාලහාමි ගේ බලාපොරොත්තුව", ජී. පී. අමරසීල ද සිල්වා ගේ "මාලනී", එච්. පියසේන ගේ "නගරෙන් කෙතට" ආදි නාට්‍ය ගණනාවක් සිය සාංවත්සරික උත්සවවල දී ප්‍රදර්ශනය කරනු ලැබී ය.

- 1934 -1951 තෙක් ඉබේ වෙදා, යන්තම් ගැලවුණා, බඩ පිස්සා, වැරදුණ දීගය, මුදලාලි ගේ පෙරළිය, සුනේත්‍රා, හැංගි හොරා, මඟුල් ප්‍රස්තාව, වලහා, මැනේජර් ඇතුළු නාට්‍ය නිර්මාණ රාශියක් බිහි විය.

- මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ "සිංහල නාට්‍ය මණ්ඩලය" බිහි කරනු ලැබීම නාට්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රබෝධයකට හේතු වූ අතර, බහින කලාව, පබාවතී, වෙද හටන යන නාට්‍ය බිහිවිය. සිංහල නාට්‍ය කලාවට අත් පොතක් වැනි 'සිංහල ගැමි නාටකය' නමින් පසු ව පළ වූ The Sinhalese Folk Play මෙම යුගයේ දී එළි දැක්වීම විශේෂ සංසිද්ධියකි. රහස් කොමසාරිස් අනුවර්තනය සහ වඳින්න ගිය දේවාලේ ස්වතන්ත්‍ර කෘතිය ද මේ යුගයේ තවත් වැදගත් නිර්මාණ දෙකකි.

- 1956 සිංහල නාට්‍ය ඉතිහාසයේ ඉතා වැදගත් සන්ධිස්ථානයක් සටහන් කරන වර්ෂයකි. ඒ "මනමේ නාටකය" බිහි වීමයි.

  උක්ත කාල පරාසයේ දී නාට්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ ව සිදු වූ වැදගත් සිදු වීම් පහත සඳහන් ආකාරයට සම්පිණ්ඩනය කළ හැකි ය. දේශීය නාට්‍ය ඉතිහාසයේ 1877 - 1956 දක්වා කාලය තුළ හමු වන ඉතා වැදගත් සන්ධිස්ථාන මෙසේ පෙළ ගැස්වේ.

- 1877 වර්ෂයේ ආරම්භ වූ නූර්ති, ජාතික වශයෙන් හැදී වැඩී පෝෂණය වී ටීටර්, මිනර්වා ප්‍රභේදවලට බෙදී, චිත්‍රපටයේ ආගමනය සමඟ පරිහානියට පත් වීම.

- ලංකා විශ්ව විද්‍යාලයයේ නාට්‍ය සංගම් ආරම්භ වීම.

- බටහිර රටවල ව්‍යාප්ත ව තිබූ ස්වාභාවික නාට්‍ය සම්ප්‍රදායය මෙරට කලා ක්ෂෙත්‍රයට ඇතුළු වීම.

- 1933 ඊ. එෆ්. සී. ලුඩොවයික් ගේ නාට්‍ය නිෂ්පාදන ඔස්සේ ජනප්‍රිය යුරෝපීය නාට්‍ය මෙරටට හඳුන්වා දීම නිසා විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් තුළ රස වින්දනය හා විචාරය පිළිබඳ නව මතවාද ගොඩනැඟීමත්, උද්යෝගයක් ඇති වීමත් නාට්‍ය කලාවේ සංවර්ධනයට හේතු වීම.

- විශ්ව විද්‍යාලයයේ සිංහල සමිතිය සිංහල නාට්‍ය කලාව පෝෂණය කිරීම සඳහා ස්වකීය සංවත්සර උලෙළවල දී දුටුගැමුණු, මායාවතී වැනි ජනප්‍රිය නාට්‍ය ප්‍රදර්ශනය කිරීම නිසා දේශීය ස්වතන්ත්‍ර නාට්‍ය නිර්මාණ කිහිපයක් බිහි වීම.

- ජයමාන්න නාට්‍ය පරිහානියට පත් වෙද්දී විශ්ව විද්‍යාල නාට්‍ය නව ප්‍රබෝධයකින් නව ප්‍රවේශයක් ලබා ගැනීම.

- විශ්වවිද්‍යාලයීය සිංහල සමිතිය විසින් නිපදවන ලද අනුවර්තන (1936 ඉබේ වෙදා) නාට්‍යවලට අනුරූපී නාට්‍ය සම්ප්‍රදායයක් බිහි වූ අතර එය සිංහල නාට්‍ය කලාවේ පෝෂණයට හේතු වීම.

- මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර සූරින් හා ඒ අනුව ගිය නාට්‍යවේදීන් විසින් ගැමි නාට්‍ය සම්ප්‍රදායය මුල් කොට ගත් නව නාට්‍ය සම්ප්‍රදායයක් හඳුන්වා දෙනු ලැබූ අතර එමගින් රංග ශෛලිය නව ආකෘතියක් යටතේ වර්ධනය වීම. (විශ්වවිද්‍යාලයීය නාට්‍ය වංශය 1921-1981 තිස්ස කාරියවසම් - 20 පිටුව බලන්න)

- උක්ත නාට්‍යවේදීන්ගේ හා විද්වතුන් ගේ ගවේෂණ දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට හේතු වූ ආකාරය.

- නාට්‍යයේ සංවාද බස ක්‍රමානුකූල ව වඩාත් ව්‍යක්ත ස්වභාවයක් ගනිමින් නාට්‍ය කලාවේ පෝෂණයට බල පෑ ආකාරය. (මුදලාලි ගේ පෙරළියේ (1943) සිට හැංගි හොරා (1979) තෙක් නාට්‍යවල සංවාද භාවිත කොට ඇති ආකාරය ගැන සැලකිලිමත් වන්න.)

- සරල තේමා සහිත නාට්‍ය වස්තු වෙනුවට මිනිස් ජීවිතය ගැඹුරින් විමර්ශනය කෙරෙන සන්දර්භයක් සහිත නාට්‍ය වස්තු නිෂ්පාදන සඳහා යොදා ගැනීම සහ ඒ අනුව නාට්‍ය දෘෂ්ටිය පිළිබඳ ව ධනාත්මක විපර්යාසයක් දක්නට ලැබීම.
- අන්තනි චෙකොව් ගේ The Bear, Proposal, The Aniversary යන නාට්‍ය වලහා, මඟුල් ප්‍රස්තාව, මැනේජර් යනුවෙන් සිංහල බසින් අනුවර්තනය වීම ප්‍රේක්ෂක අවධානය නාට්‍යය කෙරෙහි යොමු වීමට හේතුවක් වීම.
- 1951 සිංහල නාට්‍ය මණ්ඩලය බිහි වීමත්, දේශීය නාට්‍ය සම්ප්‍රදායයකට අනුගත වීමේ අවශ්‍යතාව වටහා ගැනීමත් ආදි කරුණු මගින් සමාජ වටපිටාවේ අපූර්ව අවස්ථා හුවා දැක්වීමේ පසුබිමත් නිර්මාණය වීම (1951 බහින කලාව හෙවත් සංස්කෘතික කොමසාරිස් නාට්‍යය.)
- සිංහල ගැමි නාට්‍ය කලාව පිළිබඳ ව ගම් මට්ටමින් කරනු ලැබූ පර්යේෂණවල ප්‍රතිඵලයක් වශයෙන් 1952 දී එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් The Sinhalese Folk play නම් ඉංග්‍රීසි ග්‍රන්ථය එළි දැක්වීම. (මෙය පසු ව "සිංහල ගැමි නාටකය"නමින් සිංහල භාෂාවට පරිවර්තනය කරනු ලැබ නාට්‍ය කලාව පිළිබඳ අත්පොතක් වශයෙන් භාවිත වේ.)
- ජාතක කථා පාදක කර ගනිමින් ස්වාභාවික රංග ශෛලිය අනුව යමින් නාට්‍ය නිෂ්පාදනය කිරීම සිංහල නාට්‍ය කලාවේ තවත් වැදගත් සන්ධිස්ථානයක් වීම (පබාවතී නාට්‍යය)
- 1953 දී නිෂ්පාදනය වූ නියුමාන් ජුබාල් ගේ "වෙද හටන" අනුවර්තන නාට්‍යය සිංහල නාට්‍ය කලාවේ විකාශයට පුළුල් බලපෑමක් සිදු කිරීම.
- දේශීය ගැමි නාට්‍ය හා රංගකලාව පිළිබඳ ව දීර්ඝ කාලයක් තිස්සේ සිදු කරන ලද පර්යේෂණවල ප්‍රතිඵලයක් වශයෙන් 1954 වර්ෂයේ "රත්තරං" නාට්‍යය නිෂ්පාදනය වීම.
- උක්ත පර්යේෂණවල කූට ප්‍රාප්තිය වශයෙන් 1956 දී "මනමේ නාටකය" බිහි වීම සිංහල නාට්‍යයේ ගමන් මඟෙහි ඓතිහාසික සන්ධිස්ථානයක් ලෙස හැඳින්විය හැකි විය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

1. දේශීය නාට්‍ය කලාවේ ඓතිහාසික සන්ධිස්ථානයක් ලෙස "මනමේ" නාටකයෙහි වැදගත්කම පැහැදිලි කරන්න.
2. ආදි විශ්වවිද්‍යාලය නාට්‍ය (1877-1956) හා නාට්‍යකරුවන් විසින් සිංහල නාට්‍යයේ ගමන් මඟෙහි වැදගත් සන්ධිස්ථාන සටහන් කර ඇති ආකාරය වගුවක් (Chart) මඟින් දක්වන්න.

අතිරේක උදවු :

සිංහල නාට්‍ය වංශය - විජේරත්න පතිරාජ (2007)

විශ්වවිද්‍යාලයීය නාට්‍යවංශය - 1921-1981 - තිස්ස කාරියවසම් - (1982)

විසිපස් වසරක සිංහල නාට්‍ය හා රංගකලාව 1932-1956 - තිස්ස කාරියවසම් - (1988)

එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය යුගය - 1947-1997 දෙවන භාගය - රත්නපාල ද සිල්වා (1997)

නිපුණතාව 5.0 : නාට්‍ය හා රංග කලාව සම්බන්ධ විවිධ නිර්මාණ රසාස්වාදයට හා විචාරයට ලක් කරමින් ජීවිත අත්දැකීම් පෝෂණය කරයි.

නිපුණතා මට්ටම 5.1 : නාට්‍ය පෙළ රස විඳියි.

කාලච්ඡේද සංඛ්‍යාව : 04

ඉගැනුම් පල :
- ඊඩිපස් රජ නාට්‍යය අධ්‍යයනය කරයි.
- "කොලෝනස්හි ඊඩිපස්" හා "ඇන්ටිගනී" නාට්‍ය පෙළ අධ්‍යයනය කරයි.
- "ඊඩිපස් රජ" පෙළ කියවමින් රස විඳියි.
- කථා වින්‍යාසය පිළිබඳ ව සාකච්ඡා කරයි.
- ඊඩිපස් රජ පෙළ රූපණය කරමින් රස විඳියි.

ක්‍රියාකාරකම 5.1.1 : ඊඩිපස් රජ පෙළ රස විඳීම

ගුණාත්මක යෙදැවුම් :
- ආරියවංශ රණවීර - ඊඩිපස් රජ නාට්‍ය පිටපත
- සිරි එදිරිවීර - ඊඩිපස් රජ නාට්‍ය පිටපත

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : පෙළ පරිශීලනය හා සාකච්ඡා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- නිර්දිෂ්ට ග්‍රන්ථයට අනුව ශිෂ්‍යයන් අතුරෙන් පාත්‍ර වර්ගයා නම් කර, සංවාද කියමින් නාට්‍ය පෙළ රස විඳීම සුදුසු ය.
- නාට්‍යය රස විඳීමේ දී ඉස්මතු වූ විශේෂිත කරුණු පිළිබඳ ව සඳහන් කරමින්, පහත දැක්වෙන කරුණු කෙරෙහි ද සැලැකිලිමත් වෙමින් සිසු අවධානය ඒ වෙත යොමු කරවන්න.
- පෙළ, කථා වින්‍යාසය මැනවින් ගළපා තිබීම ද රස වින්දනයට හේතු වේ.
- තීබ නුවරට උදා වී ඇති විපත දැක්වීම පිණිස තීබ වාසීහු රජ මැඳුර අබියසට රොක් වෙති.
- විපතට හේතු හා පිළියම් සොයා ගෙන ඒම සඳහා පිටත් කළ ක්‍රියෝන් පැමිණේ. හේතුව පෙර රජ කළ ලායුස් රජු මැරූ ඝාතකයා එරට විසීම ය. ඝාතකයා සෙවීමට ගන්නා උත්සාහයේ දී ඇපොලෝ දෙවියන් ගේ සිතැඟි දිවැසින් දැකිය හැකි අන්ධ ඍෂිවරයා කැඳවයි. ඔහු නිහඬ ව සිටීමෙන් කෝපයට පත් රජ, ලායුස් රජු මැරූ ඝාතකයන් ලෙස ඔහුට ද, ක්‍රියෝන්ට ද චෝදනා කරයි. එයින් කෝපයට පත්වන ඍෂිවරයා පවසන්නේ,

  "ඉඳුරා කියමි මම නුඹට
  පව්කාරයෙකි නුඹ. මෙලොව තම නෑසියන්
  හැමට ම තොප අතින් වරද වී ඇත."
  "කීවෙමි ම කීමට ඇති දේ නොබිය ව
  පිටතින්ආ අයෙකු ලෙස හැසුරුන ද
  හෙළි වේවි සැණකින්, ඔහු ද තීබයකු ම බව
  මහ යස ඉසුරින් සිටිය ද දැන්,
  දෙනෙතට ද අහිමි ව, සැරයටිය ගෙන යාචකයකු සේ
  ඔහු යනු ඇත නුවරින්,
  තමන් ගේ පුතුහට ඔහු පියෙකු ය.
  සොහොයුරෙකු ය එක විට..."

- චෝදනාවෙන් ක්‍රියෝන් ද ශෝකයට පත් වේ. රජ හා ක්‍රියෝන් අතර පැන නැගි ගැටලුව විසඳීම සඳහා ජොකෙස්ටා බිසව පැමිණේ. බිසව පවසනුයේ අනාවැකි සඵල නොවන බවකි.

"ලායියුස් ඔහුගේ ම පුතකු අතින් මැරෙන බවට, කළ අනාවැකිය කොහෙත් ම වෙන්න බැහැ. ඔහුට දා ව මා ලත් පුත්‍රයා දුප්පත් දරුවා මිය ගිය නිසා, කඳුකරයේ ගෙන ගොස් දැමූ විට දෙපා විලංගු ගස්වා.."

- බිසව හමුවට කොරින්ති දූතයා පැමිණීමෙන් සියලු ගැටලු විසඳෙන බවක් හැඟේ. පොලීබස් රජු ගේ මිය යාම ඊඩිපස් කුමරුට සහනයක් වුව ද, මෙරෝපා වූ නම් වූ තම මව පිළිබඳ ව කියූ අනාවැකිය ඉටු වේ ය යන බියෙන්, කොරින්ති දේශයේ රජ කිරුළ ප්‍රතික්ෂේප කරයි. එහෙත් පණිවුඩකරු පවසන්නේ,

"ම ඔබේ පියා ද? නැත. එසේ නම් ඔහු ද ඔබ පියා නො වේ...."
"මා ඔබ ගේ පියා නොවන්නා සේම පොලීබස් ද ඔබගේ පියා නො වේ"

- ඊඩිපස් කුමරු ගේ උපත පිළිබඳ තොරතුරු හෙළි වෙද්දී, ජොකෙස්ටා එය වළකාලීමට උත්සාහ දරයි.

"ජොකෙස්ටා - දැන් ඒ ගැන සොයා ඇති ඵලය කුමක් ද?
ඒ ගැන සොයන්නේ කුමකට ද?" කුමක් වුණත්

"දෙවියන් ගේ නාමෙට නවත්වන්න ඔය දේ.

ඔබට තව දුරටත් ජීවත් වීමට ඕනෑ නම් නවත්වන්න ඔය දේ...."

- බිසව ගේ ඉල්ලීම නොසලකා කැඳවනු ලබන තීබවාසී ගොපල්ලා ගෙන් සියලු තොරතුරු අනාවරණය වෙයි. බිසව සියදිවි හානි කර ගැනීමත්, ඊඩිපස් තම දෙනෙත් අන්ධ කරගැනීමත් යන සිදුවීම් පෙළ අවසානයේ, ග්‍රීක නාට්‍යවල Exodos යනුවෙන් හඳුන්වන අවසන් ජවනිකාව වඩාත් ප්‍රේක්ෂක හදවත් කම්පනයකට ලක් කරන්නේ ඊඩිපස් රජු තම දියණියන් ගෙන් සමු ගන්නා අවස්ථාවේදී ය.

"ක්‍රියෝන් - යනු එසේ නම් (ඊඩිපස් මාළිගය දෙසට පිය නගයි. ඔහුගේ දෑත් තව ම දරුවන් ගේ ගෙල මත ය.) අත හරිනු දරුවන් දෙදෙන."
"ඊඩිපස් - අනේ ! ඉවත් නොකරන්න උන් මා කෙරෙන්...."

- අවසානයේ දී ඊඩිපස් ගේ ඉරණම පිළිබඳ භීතිය (fear) හා ඔහු කෙරෙහි කාරුණ්‍යය (pity) ක් ප්‍රේක්ෂකයා තුළ උපදවයි. මනුෂ්‍යාත්ම භාවය පිළිබඳ උදාර අවබෝධයක් එනම් ප්‍රත්‍යභිඥානයක් (Anagnoris) ඇති කරයි.

- සොෆොක්ලීස් හුදු කතාන්දරකරුවකු මෙන් මුල සිට අග තෙක් කාලානුක්‍රම පිළිවෙළින් කතන්දරය ගොඩ නැංවූයේ නැත. පුරාවෘත්තයේ සිද්ධි ඔහු නාට්‍ය ශරීරියට බද්ධ කර ඇත්තේ නිසි තැනකට නිසි කල් බලා ය. නාට්‍යයේ අංක හතරකි. නාට්‍යයේ බාහිර ස්වරූපය ගතහොත් මිනීමරුවකු සොයා, දඬුවම් කිරීමට දරන උත්සාහයක් පෙනේ. එකින් එක සිද්ධි තර්කානුකුල රාමුවක් තුළ ගොඩ නගමින්, නාට්‍යය අවසානය වන තෙක් ම ප්‍රේක්ෂක අවධානය දැඩි ලෙස ලබා ගැනීමට රචකයා දක්ෂ වී ඇත.

- පළමු වන අංකයේ එන ටෙරේසියාස් හා ඊඩිපස් අතර වන සංවාදයෙන් ඊඩිපස් සැබවින් ම මේ ඝාතනයට සම්බන්ධ ද, ක්‍රියෝන් හා ටෙරේසියාස් කළ කුමන්ත්‍රණයක් ද යන සැකය හා අවිශ්වාසය ප්‍රේක්ෂකයා තුළ ඇති වේ. එම අවස්ථාවේ දී ගායන වෘන්දය විසින් ගයනු ලබන ගායනයෙන් මෙම දෙගිඩියාව තවත් තහවුරු වෙයි.

- දෙවන අංකය, ක්‍රියොන් හා ඊඩිපස් අතර ඇතිවන සංවාදයෙන් ක්‍රියෝන් ගේ නිර්දෝශී භාවය හෙළිදරවු වෙයි. ලායියුස් රජු ගේ මරණය සිදු වූ ආකාරය ජොකස්ටා පවසද්දී, ඝාතකයා තමා ද යන සැකයේ මුල් බීජය ඊඩිපස් ගේ සිතෙහි හට ගනී.

- ජොකෙස්ටා එම සිද්ධිය ඊඩිපස්ට පවසනුයේ ඔහුගේ සැනසීම සඳහා වන හෙයින් උත්ප්‍රාසය මතු වෙයි.
- තුන් වන දර්ශනයේ දී කොරින්තියානු පණිවුඩකරුවා ගේ පැමිණීමෙන් සියලු ගැටලු විසඳීමට අවස්ථාව එළැඹෙතත් ඊඩිපස් ගේ උපත හා අනෙකුත් අභාග්‍ය සම්පන්න තොරතුරු හෙළි වීමෙන් කථා නායකයා ගේ ඇද වැටීම සිදු වේ. මෙවන් උත්ප්‍රාසාත්මක සිද්ධි නාට්‍ය රසය තීව්‍ර කිරීමට සමත් වෙයි. මතුපිටින් යහපතත්, ඇතුළතින් අයහපතත් ගෙනෙන මෙවන් උත්ප්‍රාසාත්මක ලක්ෂණ, නූතන විචාරකයන් විසින් හඳුන්වනු ලබන්නේ සොෆොක්ලියානු උත්ප්‍රාසය (Sophoclean Irony) වශයෙනි.
- ඊඩිපස් නාට්‍යයෙහි පසළොසකින් සමන්විත ගායක කණ්ඩායම, ඉතා ප්‍රබල ලෙස නාට්‍යයට දායක වෙති. හතරවන අංකය අවසානයේ දී ඔවුන්ගේ මුවට නංවන හමාර කිරීම ප්‍රේක්ෂක බුද්ධියට ආමන්ත්‍රණය කරයි.

  "තීබයේ පුතුනි, දූවරුනි, බල මැන මේ යන්නේ ඊඩිපස් ය. මිනිසුන් අතර අතිශ්‍රේෂ්ඨ ඊඩිපස් ය. විශ්වයේ ගැඹුරු ගැටලු අතැඹුලක් සේ දැන සිටියේ ය.... පුහුදුන් මිනිසා සැමවිට ම මෙනෙහි කළ යුතු වේ. සිය අවසානය ගැන කිව නොහැක. කිසිවකු සතුටු සිත් ඇත්තේ යැ යි, හැකි නොවුණහොත් ඔහුට සිය සතුට ගෙන යන්නට මිනී වළ වෙත යන විට..."

- නාට්‍යය සඳහා යොදාගත් වස්තුව, කාව්‍යෝචිත භාෂාව, වේශභූෂණ, ගාන වෘන්දය, රංග භූමිය භාවිත කළ ආකාරය ද, ග්‍රීක රංගය හා බැඳුණු සිද්ධාන්ත ප්‍රකට කිරීම නිසා සොෆොක්ලීස් ගේ "ඊඩිපස් රජ" නාට්‍යය සර්වකාලීන ව රස විඳිය හැකි කෘතියකි.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

"ඊඩිපස් රජ" නාට්‍යය පරිශීලනයෙන් ඔබ විඳි රසය පහදන්න.

ආශ්‍රිත ග්‍රන්ථ : ආරියවංශ රණවීර - ඊඩිපස් රජ

නිපුණතාව 5.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ විවිධ නිර්මාණ රසාස්වාදයට හා විචාරයට ලක් කරමින් ජීවිත අත්දැකීම් පෝෂණය කරයි.

නිපුණතා මට්ටම 5.1 : නාට්‍ය පෙළ රස විඳියි.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගැනුම් පල :
- කුවේණි පෙළ අවබෝධාත්මක ව කියවයි.
- කුවේණිය හා සම්බන්ධ ඓතිහාසික කතා පුවත විග්‍රහ කරයි.
- කුවේණි දෘශ්‍ය කාව්‍යයේ ආකෘතිමය විශේෂත්වය විමසයි.
- කුවේණිහි සංවාද හා භාෂා භාවිතය අධ්‍යයනය කරයි.
- පෙළින් මතුවන චිත්තරූප විඳියි.
- නාට්‍යයේ එන චරිත හඳුන්වයි.

ක්‍රියාකාරකම 5.1.2 : කුවේණි පෙළ රස විඳීම.

ගුණාත්මක යෙදැවුම් :
- කුවේණි නාට්‍ය පෙළ
- කුවේණි සම්බන්ධ ඓතිහාසික සිදුවීම සඳහන් වන මහාවංසය, කුවේණි අස්න ආදි ඓතිහාසික මූලාශ්‍ර
- කුවේණිය හා සම්බන්ධ ජනශ්‍රැති

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : පෙළ අධ්‍යයනය හා සාකච්ඡා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගනිමින් කුවේණි පෙළ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- සිංහල ජාතියේ ආරම්භය වශයෙන් විජයාගමනය පිළිගන්නා බොහෝ අය ඒ පිළිබඳ ව විවිධ කතාන්දර නිර්මාණය කොට ඇත.
- එම කතාවල පොදු හරය වශයෙන් සිය රටින් පිටුවහල් කරනු ලැබූ විජය කුමරු හා සත් සියයක් පිරිස ලංකාවට ගොඩ බට අතර එහි දී තම්මැන්නා වෙරළේ දී කපු කටිමින් සිටි කුවේණිය නම් යක්ෂ කුමාරිකාව මුණ ගැසුණු බවත්, සිය මායා බලයෙන් විජය කුමරු අවනත කරගන්නා ඇය ස්වකීය ඥාතීන් වනසා ලක් රජය අත්පත් කර ගැනීමට විජය කුමරුට සහාය වූ බවත්, කුවේණිය සිය අග බිසව කර ගත් විජය රජු පසුව පඬි රජු ගේ දියණියන් අග බිසෝ කර ගනිමින් කුවේණි හා දෙදරුවන් මාලිගයෙන් පිටමං කළ බවත්, විජයට ශාප කළ ඇය මාලිගයෙන් පිට ව යද්දී ඥාතීන් ඇය මරා දැමූ අතර දරු දෙදෙන වනගත වී වැද්දන් බවට පත් වූ බවත් යනුවෙන් ප්‍රචලිත ව ඇති කතා පුවත දැක්විය හැකි ය.

  (අතිරේක උදවු යටතේ දී ඇති විස්තර බලන්න.)
- හෙන්රි ජයසේන විසින් රචිත, 1963 සැප්තැම්බර් 07 වැනි දින පළමු වරට වේදිකාගත කරන ලද කුවේණි නාට්‍යයට පාදක වූයේ උක්ත කථා වස්තුවයි.
- මෙහි තේමාව වශයෙන් විජයාගමනය හා සම්බන්ධ ප්‍රවෘත්තිය යොදා ගෙන ඇති අතර, යටි පෙළින් ''කුවේණිය'' යනු සදාතන ව දුක් පීඩා, නින්දා අපහාස ආදි අසාධාරණයට ලක්වන කාන්තාව නිරූපණය කෙරෙන ''සංකේතාත්මක'' නාමය බව අවධාරණය කරයි.
- උක්ත කථා වස්තුවේ නාට්‍යෝචිත අවස්ථා ලෙස කුවේණිය කපු කැටීමේ නිරත වන අවස්ථාව, විජය-කුවේණි මුණ ගැසීම, කුවේණි හා විජය අතර මතු වන ගැටුම හා කුවේණිය දරුවන් සමඟ මාලිගයෙන් නික්මීම, නෑදැයින් ගෙන් අවමන් ලැබීම, දරුවන් වනගත වීම ආදි දැක්විය හැකි ය.

- කථා වින්‍යාසය ගොඩ නැගීමේ දී ඒ සඳහා සුවිශේෂ ආකෘතියක් යොදා ගෙන තිබේ. අතීතය හා වර්තමානය දඩයක්කරු - පූරක - ගායක පිරිස හා චරිත මඟින් මැනවින් විකාශනය කරයි. අන්ධකාරය සංකේතයක් ලෙස භාවිත කරමින්, අතීතය, වර්තමානය හා අනාගතය අවිද්‍යාව විසින් වසා දමනු ලැබ ඇති ආකාරය පූරක ගේ චරිතය ලවා ඉදිරිපත් කරවයි. කථා වස්තුවට පාදක වූ දෙදහස් පන්සිය වසරක් තරම් වූ කාලය අඳුර, මෝහය හෙවත් මුළාව හා මානය විසින් වසා තැබුණු ආකාරය පවසන රචකයා කුවේණි නාට්‍යය මඟින් එම අඳුරින් වැසුණු සත්‍යය, සැබෑව මතු කිරීමට උත්සාහ කරයි.
- මිනිසා ගේ විශිෂ්ට වූත්, විස්ම ජනක වූත් සොයා ගැනීම වූ ගින්න සංකේතය කර ගනිමින් භෞතික පරිසරයේ අනන්තය කරා යන නව නිපැයුම් සඳහා බුද්ධිය හා කුශලතාව භාවිත කළ මිනිසා යළි ස්ව මූලය සොයමින් ආරම්භයට ම පැමිණ අතීතය ගවේෂණය කර සත්‍යය සොයා ගැනීමට දරන උත්සාහය ද මෙයින් ප්‍රකාශ වේ.
- තුවක්කුව, දුනු, ඊතල වැනි සංකේත භාවිත කරමින් අතීතය හා වර්තමානය මුසු කරයි. එමඟින් එළඹෙන පරිසරයේ දී කුවේණිය පිළිබඳ අතීතයෙන් වර්තමානයට ආ කතා පුවතේ අවිද්‍යාත්මක බව මෙන් ම කුවේණිය පිළිබඳ සැබෑ සත්‍යය වන ඇය යක්ෂණියක නොව මිනිස් දුවක සේ සැලකීමට හේතු ද දක්වයි.
- වර්තමාන කුවේණිය උසාවියේ දී කරන ප්‍රකාශ මඟින් ''කුවේණිය යනු සදාකාලික ගැහැනිය'' බවත් භවයෙන් භවයට ඇය සැරිසරන්නේ ස්වාමියා ගේ ආදරය හා පිළිගැනීම, දරුවන් ගේ ආරක්ෂාවරණය පතා බවත් කියැවේ.
- කාන්තාවන්ට අවමන් කිරීම දැඩි සේ ම බැහැර කරන නාට්‍ය රචකයා කුවේණිය පිළිබඳ ව ඉතිහාසය විසින් කරුණු ලබන අවමානනීය ප්‍රකාශ හෙවත් ඇය මිනිසුන් මරා කන යක්ෂණියක බව හා දරුවන් වැද්දන් වීම යන කරුණු දරුවන් ගේ සිත් වේදනාවට හේතු වන ආකාරය දක්වීම මඟින් මෙන් ම උසාවියේ දී නඩුකාරයා විසින් කරනු ලබන ප්‍රකාශ ද මඟින් ''සැබෑ ගැහැනියට'' සාධාරණය ඉටු කරයි.
- ඉතිහාසය විසින් සඳහන් කරනු ලැබ ඇති බොහෝ කරුණුවල සාවද්‍ය බව ඉස්මතු කොට එම දුර්මත දුරු කරලීම සඳහා ඒ ඒ චරිත ලවා ඉදිරිපත් කරනු ලබන අදහස් ප්‍රබල ය. (උදාහරණ ලෙස කුවේණිය දඩයක්කරු විසින් යක්ෂණියක ලෙස හැඳින්වුණු අවස්ථාවේ දරුවන් ඇය ගේ මාතෘත්වය පිළිබඳ ව කරනු ලබන සංවේදී ප්‍රකාශ)
- කුවේණි නාට්‍යයේ ගැටුම් අවස්ථා ලෙස දඩයක්කරු හා කුවේණිය ගේ දරුවන් අතර ඉතිහාසය පිළිබඳ ව ඇති වන අදහස් මඟින් ඇති මානසික ගැටුම, ඉතිහාසය හා වර්තමානය අතර ඇති පරස්පරය, විජය, කුවේණිය මාලිගයෙන් පිටමං කරන අවස්ථාව, උසාවියේ නීතිය හා හෘදය සාක්ෂ්‍යය අතර ඇති වන ගැටුම ආදී අවස්ථා දක්විය හැකි ය.
- කුවේණි නාට්‍යයේ නාට්‍ය දෘෂ්ටිය වන්නේ ''කුවේණිය යනු මෙලොව සදාතන ගැහැනිය'' බවයි.

> ''සදා කාලෙ ම ලොව පහළ වූ
> සදා කාලෙ ම ලොව පහළ වන
> කුවේණිය ම යි එක ම ගැහැනිය
> එදා උපනත් අද උපන්නත්
> ඇයයි දුක් පීඩා විඳින්නේ
> ඇයයි වද හිංසා විඳින්නේ
> ඇයයි අවමානය ලබන්නේ
> ඇයයි යකිනිය නම් ලබන්නේ ''

- කුවේණි නාට්‍යයේ ශෛලිය මිශ්‍ර ලක්ෂණ ඇත. පූරක, ගායක පිරිස, ගායනා හා නර්තන ආදිය නාට්‍ය ධර්මී ශෛලියටත්, උසාවිය හා අනෙකුත් සංවාද ලෝක ධර්මී ශෛලියටත් රචනා කොට තිබේ.
- සංවාද හා භාෂා ප්‍රයෝග අතිශයින් ම ප්‍රබල ය. සංවාද ලෝක ධර්මී ශෛලියෙන් ලියා ඇත. සරල, කෙටි සංවාද බෙහෙවින් ළගන්නා සුලු ය. භාවිත කොට ඇති භාෂාව ගීතවත් මෙන් ම සම්භාව්‍ය ස්වරූපයක් ගනියි. සංකේත පද බහුල ය. භාෂාව මඟින් අවස්ථා පිළිබඳ විචිත්‍රවත් චිත්තරූප මවන ආකාරය කුවේණි නාට්‍යය පුරා ම දැකිය හැකි වීම විශේෂත්වයකි.
- පෙළෙහි රංග විධානවලින් අවස්ථා නිරූපණය කළ යුතු ආකාරය පිළිබඳ ව අධ්‍යක්ෂවරයාට හා නළුනිළියන්ට උපදෙස් සපයා ඇත.
- පටු සීමා මායිම් අබිබවනය කරමින් සිදු කරනු ලබන පුළුල් භාවාතිශය හා විප්ලවීය ප්‍රකාශ පාඨකයා ගේ / ප්‍රේක්ෂකයා ගේ බුද්ධියට ආමන්ත්‍රණය කරන අවස්ථා අතිශයින් ප්‍රබල ය. (ලෝක ඉතිහාසයේ මිනිසුන් ගෙන් ගල් මුගුරු පාර කාලා මැරුණු මුල් ම පව්කාරිය තමා කුවේණි,

  යකිණියක ඇඟ රුහිරු - කිරි වේ ද කිසි දිනක
  අපි මිනිස්සු වෙන්නෙ නෑ ....

  ස්නේහය, යුක්ති ධර්මය, ලෝකය පීරා සෙව්වත් නොලද බව)
- චරිත නිර්මාණයේ දී

පූරක	-	කථා වින්‍යාසය ගොඩ නැගීමේ මැදිහත්කරු වශයෙන් ද
දඩයක්කරු	-	අතීතය හා වර්තමානය සම්බන්ධීකාරකයා වශයෙන් පළමු ව ඉතිහාසය විශ්වාස කළ, අවසානය වන විට ඉතිහාසය අවිශ්වාස කරන අයකු වශයෙන් ද,
ජීවහත්ථ හා දිසාලා	-	මාතෘ ස්නේහය හා දැඩි ව බැඳී ගත් එහි ආස්වාදය උපරිම ව විඳින, සත්‍යය ලොවට හඬ ගා කියමින් සිය මව ගේ නිදොස් බව හෙළි කරන අහිංසක හා අදූෂිත දරුවන් වශයෙන් ද,
කුවේණිය	-	සදාතන ව අසාධාරණයට ලක්වන කාන්තාව ගේ නියෝජිතවරිය වශයෙන් ද,
විජය	-	උපයෝගීලී හා අභිමතාර්ථ සාධනයේ දී කෘතවේදීත්වය වුව ද පරදුවට තැබීමට නොපැකිළෙන්නකු වශයෙන් ද,
විනිශ්චයකරු	-	නීතිය හා හෘදය සාක්ෂ්‍යය අතර අතරමං වී යුක්ති ධර්මය විසඳාලීමට නොහැකි ව කම්පා වන සාධාරණ මනුෂ්‍යත්වය වශයෙන් ද
1 හා 2 නීතීඥවරු	-	අභිමතාර්ථ සාධනය සඳහා යුක්ති ධර්මයට පටහැණි ව ස්ව මතය වෙනුවෙන් පෙනී සිටින්නන් වශයෙන් ද,
ගායක පිරිස	-	වේදිකාවේ නිර්මාණය කළ නොහැකි අවස්ථා (කාල කළමනාකරණය) ඉදිරිපත් කරන්නන් වශයෙන් ද නිර්මාණය කොට ඇත. (නාට්‍ය පෙළ ඇසුරින් උදාහරණ සපයන්න)

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- කුවේණි නාට්‍යයේ චරිත නිර්මාණය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.
- සමකාලීන නාට්‍ය අතර කුවේණි නාට්‍යය සුවිශේෂ වීමට හේතු පැහැදිලි කරන්න.

වැඩිපුර අධ්‍යයනය සඳහා :

- මහා වංශය, රාජාවලිය, කුවේණි අස්න, වයඹ ජන කථා හා වෙනත් ජන ශ්‍රැති

නිපුණතාව 5.0 : නාට්‍ය හා රංග කලාව සම්බන්ධ විවිධ නිර්මාණ රසාස්වාදයට හා විචාරයට ලක් කරමින් ජීවිත අත්දැකීම් පෝෂණය කරයි.

නිපුණතා මට්ටම 5.1 : රූකඩ ගෙදර නාට්‍ය රස විඳියි.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගැනුම් පල :
- යථාර්ථවාදී නාට්‍යයක් ලෙස හෙන්රික් ඉබ්සන් ගේ 'රූකඩ ගෙදර' බිහි වීමට බලපෑ සමාජ, විද්‍යාත්මක, ආර්ථික හා ආගමික පසුබිම සැකෙවින් විස්තර කරයි.
- එම නාට්‍යයෙහි ගැටුමට අදාළ මූලික සිදුවීම් මාලාව ලිඛිත ව පෙළ ගස්වයි.
- නාට්‍ය රචනයෙහි ගැබ් වූ විවිධ තේමා විමසයි.
- ප්‍රේක්ෂකයා තුළ කුතුහලය ඇතිවන පරිද්දෙන් රූකඩ ගෙදර නාට්‍යයේ සිදුවීම් ගොඩනගා ඇති ආකාරය පැහැදිලි කරයි.
- ප්‍රධාන චරිතය වන නුවුරා තමාට හිමි පොදු මනුෂ්‍යත්වය සොයා යන අයුරු රස විඳියි.
- ටෝවල්ඩ්, ක්‍රොග්ස්ටඩ්, දොස්තර රන්ක් හා ලින්ඩා වැනි සෙසු චරිත හැසිරෙන ආකාරය රස විඳියි.
- චරිත නිරූපණය සඳහා සංකේත භාවිතය යොදා ඇති අයුරු විමසයි.
- නාට්‍යයේ භාෂා භාවිතය විමසයි.

ක්‍රියාකාරකම 5.1.3 : රූකඩ ගෙදර නාට්‍ය පෙළ රස විඳීම

ගුණාත්මක යෙදවුම් : • රූකඩ ගෙදර - විජිත ගුණරත්න ගේ පරිවර්තනය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පොදුවේ යුරෝපය තුළ යථාර්ථවාදී නාට්‍ය කලාව බිහිවීමට බලපෑ හේතු රැසකි.
- 19 වන සියවස වන විට යුරෝපයේ නව සමාජ වෙනස්කම් ඇති වීම.
- වැඩවසම් සමාජ ක්‍රමය වෙනස් වී මධ්‍යම පන්තියක් බිහි වීම.
- මාක්ස් එංගල්ස් වැනි චින්තකයන් ගේ ලියවිලි හේතු කොට ගෙන සාමානාත්මතාව, යුක්තිය හා සාධාරණත්වය යන නව සංකල්ප සමාජගත වීම.
- විද්‍යා ප්‍රබෝධය හේතුවෙන් පරිණාමවාදය, හේතුඵලවාදය වැනි සිද්ධාන්ත න්‍යාය බිහි වීම හා ආරය, පරිසරය වැනි සාධක අවධානයට යොමු වීම.
- දූරකථනය, රූපවාහිනිය, දුම්රිය වැනි නව සොයා ගැනීම්.
- කාර්මික දියුණුව පදනම් ව යන්ත්‍ර සූත්‍ර, කර්මාන්තශාලා, මුදල කේන්ද්‍ර කොට ගත් ආර්ථිකයක් සහ බැංකු පද්ධතියක් බිහි වීම.
- පාප් ආධිපත්‍යය බිඳ වැටී කතෝලික දහම විවිධ නිකායවලට බෙදීම සහ දේව සංකල්පය මෙන් ම ආගමික ඉගැන්වීම් වෙනස්කම්වලට භාජනය වීම.
- 19 වන සියවස වන විට යුරෝපයේ චිත්‍ර කලාවේ තාත්ත්විකත්වය ඇති වීම සහ නාට්‍ය වේදිකාව ද ත්‍රිමාණ පසුතලවලින් යුක්ත වීම හේතු කොටගෙන නාට්‍ය කලාවට තාත්ත්විකත්වය ඇතුළු වීම.
- ඉහත සමාජ, විද්‍යාත්මක, ආර්ථික හා ආගමික වෙනස්වීම් රූකඩ ගෙදර නාට්‍ය නිර්මාණය වීම සඳහා බලපෑම් කළ බව එය අධ්‍යයනය කරන විට පැහැදිලි වේ. ග්‍රීක, එංගලන්ත නාට්‍යවල දක්නට ලැබුණු රාජකීය, ප්‍රභූ චරිත වෙනුවට සමකාලීන මධ්‍යම පන්තියේ චරිත නිර්මාණ කෙරේ. ක්‍රොග්ස්ටඩ්, හෙල්මර් වැන්නෝ මෙම යුගයේ අලුතින් බිහි වූ බැංකුවල සේවා දායකයෝය.

- නාට්‍ය පෙළ රස විඳීමට නම් එහි වස්තුව (Plot) මනා ව අධ්‍යයනය කළ යුතු ය. එනම් එහි තර්කානුකූල ව ගළපා ඇති සිදුවීම් මාලාව අවබෝධ කරගත යුතු ය. නුවුරා හෙල්මර් සමඟ ගත කරන ජීවිතයේ දී ඇය මුහුණ දෙන අනපේක්ෂිත සිදුවීම් මගින් ප්‍රේක්ෂකයා තුළ නාට්‍ය රසය ඇති වන අයුරු විමසිය යුතු ය.

පළමු අංකයෙහි ප්‍රධාන සිදුවීම් :

- නෝරා සහ ටෝවල්ඩ් ගේ ප්‍රීතිමත් ජීවිතය
- ලින්ඩෙ මිය ගේ පැමිණීම මගින් සිදුවීම් කීපයක් හෙළිදරවු වීම.
- හෙල්මර් ගේ අසනීපය, ඉතාලියට යෑම, ඒ සඳහා නෝරා රිදී කාසි 1200ක් ණයට ගැනීම (සැමියාට රහසින්)
- නෝරා තමා ණය ලබා ගත් පුද්ගලයා කවරෙක් දැයි ලින්ඩෙ මියට හෙළි නොකිරීම.
- ලින්ඩෙ මහත්මිය පවසන ආකාරය හරහා ප්‍රේක්ෂකයා ද, පළමු වරට, නෝරා ණය ගෙන ඇත්තේ ක්‍රොග්ස්ටඩ්ගෙන් බව, ක්‍රොග්ස්ට්ඩ් බැංකුවෙන් නෙරපා ඇති බව සහ ණය පොරොන්දු පත්‍රයට නෝරා විසින් වාංචනික ව පියා ගේ අස්සන යොදා ඇති බව දැන ගැනීම.
- ක්‍රොග්ස්ටඩ් කර ඇත්තේ ද බැංකුවේ දී හොර අස්සනක් යෙදීම බවත්, නෝරා ගේ ඉල්ලීමට අනුව ක්‍රොග්ස්ටඩ්ට සමාව දීම කළ නොහැකි බවත්, හෙල්මර් පැවසීම මෙහි දී නෝරාට තමා කළ වරදේ බරපතළකම හැඟී යාම.

දෙවන අංකයෙහි ප්‍රධාන සිදුවීම් :

- නිවසේ ප්‍රීතිමත් පරිසරය වියැකී යාම.
- විලාසිතා ඇඳුම් සාදය සඳහා නර්තන ඇඳුමේ ලිහුණු තැන් මැසීම.
- නෝරා ණය ලබා ගත්තේ දොස්තර රන්ක්ගෙන් යැයි ලින්ඩෙ මිය සැක කිරීම.
- පුවත්පත් මගින් හෙල්මර් ගේ නමට අගෞරව කරාවි යැයි කියමින් නෝරා ක්‍රොග්ස්ටඩ්ට රැකියාව ලබාදෙන ලෙස ඉල්ලීම.
- ක්‍රොග්ස්ටඩ් රැකියාවෙන් නෙරපීම දක්වන ලිපිය ඔහු වෙත යැවීම.
- පියා ගේ ජාන හේතු කොටගෙන කොඳුනාරටියේ හටගත් පාරම්පරික රෝගයකින් දොස්තර රන්ක් පීඩා විඳීම.
- ණය පියවීම සඳහා නෝරා දොස්තර රන්ක්ගෙන් මුදල් ඉල්ලීමට සිතුව ද ඔහු නෝරාට ආදරය කරන බව පැවසීම නිසා එම අදහස වෙනස් කිරීම.
- ණය ගනුදෙනුව ඇතුළත් ලිපිය ක්‍රොග්ස්ටඩ් විසින් හෙල්මර්ගේ ලියුම් පෙට්ටියට දැමීම.
- හෙල්මර් ලිපිය ගැනීමට සැරසෙන විට එය වැළැක්වීම හෝ ප්‍රමාද කිරීම හෝ සඳහා නෝරා තරන්තලා නැටුම පුහුණු වීම සඳහා හෙල්මර්ට ආයාචනා කිරීම.

තුන්වන අංකයෙහි ප්‍රධාන සිදුවීම් :

- ලින්ඩෙ මිය හා ක්‍රොග්ස්ටඩ් ප්‍රේමයෙන් වෙළී පසු වූ බවත්, ලින්ඩෙ මිය ගේ ගෙදර ප්‍රශ්න නිසා ඇයට වෙනත් විවාහයක් කර ගැනීමට සිදු වූ බවත් හෙළි වීම සහ දෙදෙනා යළි එක් වීම.
- ක්‍රොග්ස්ටඩ් ලියුම් පෙට්ටියට දැමූ ලිපිය නැවත ගැනීමට ඔහු ම සූදානම් වෙයි. එහෙත් ලින්ඩේ මිය එය වළක්වයි. ලින්ඩේ මිය මෙසේ පවසයි.

  "එක අතකින් මේ සිද්ධිය ගැන හැම දෙයක් ම හෙල්මර් දැන ගන්න ම ඕනැ. ඒ දෙගොල්ලන්ට එකිනෙකා පිළිබඳ වැටහීමක් ඇති කරන්න නම්, මේ රහස සහ සැකය තව දුරටත් ආරක්ෂා කරන්න අනුබල දෙන එක තේරුමක් නැහැ."
- හෙල්මර් ලියුම් පෙට්ටිය විවර කර මෙම ලිපිය ගැනීමට පෙර නෝරා සියදිවි නසා ගැනීමට පවා සිතයි.
- ලිපිය කියවීමෙන් අනතුරු ව හෙල්මර් නුවුරාට දැඩි ලෙස දෝෂාරෝපණය කරයි.

- ඉන් අනතුරු ව ක්‍රොග්ස්ටඩ් ණය පොරොන්දු පත්‍රය එවීමත් සමඟ යළිත් හෙල්මර් සතුටින් කෑගසයි.

  " මේ ඔයයි මායි දෙන්න ම ගැලවිලා මේ බලන්න ඔයා ගේ අත්සන තිබුණ ණය ගිවිසුම් කඩදාසිය ආපසු එවලා."

  එහෙත් මේ වන විට නුවුරා සැබෑ ලෙස ම හෙල්මර් ගේ ස්වභාවය අවබෝධ කරගෙන හමාර ය.

  "අපි කසාද බැඳලා දැනට අට අවුරුද්දක් පිරිලා ඉවරයි. නමුත් අපි දෙන්න එකට ඉඳගෙන මේ ඔයයි මමයි ස්වාමියා හා බිරිඳ හැටියට වගකීමක් ඇති ව කතා කරන මුල් ම වතාව මේක බව ඔයාට හැඟෙන්නේ නැද්ද?"

- නුවුරා හෙල්මර් අතහැර නිවසින් පිට වී යයි.

  " අපි දෙන්න ගේ සාමූහික ජීවිතය අතර සැබෑ වැටහීමක් ඇති විවාහයක් වෙන තෙක් මම යන්නම් ටෝවල්ඩ්. (ඈ සාලයේ දොරින් පිටවෙයි.)

සෙල්ලම් ගෙදර නාට්‍යයේ ගැබ් වූ තේමාවන් පිළිබඳ ව ද විවිධ අදහස් පළවී ඇත. ඒ අතර

- ස්ත්‍රී විමුක්තිය
- පොදු මානව විමුක්තිය
- විවාහ ජීවිතය පිළිබඳ වෙනත් දෘෂ්ටිකෝණයෙන් බැලීමට පදනමක්.
- මිනිස් සබඳතාවන් හි පදනම හා ඊට බැඳෙන සමාජ පසුබිම.
- ස්ත්‍රී පුරුෂ සබඳතාවන්හි යථාර්ථය වැනි විවිධ තේමා දක්වා ඇත.
- පශ්චාද් දෘෂ්ටි කථන රීතියට අනුව සිදුවීම් විකාශනය වීම නිසා ප්‍රේක්ෂකයා තුළ කුතුහලයක් ඇති වේ. නාට්‍යය ආරම්භ වන විට ගැටුමට මුල පුරන සිදුවීම සිදුවී හමාර ය. ඒවා හෙළි වනුයේ මෙසේ ය.

  නුවුරා සැමියාට නොකියා ණයක් ගත් බව පළමු වරට ඇය ලින්ඩෙ මියට හෙළි කිරීම. එහෙත් ණය ලබා ගත්තේ කවරෙකු ගෙන් දැයි හෙළි නොකිරීම.

- ක්‍රොග්ස්ටඩ් ගේ පැමිණීම හේතුවෙන් කතා පුවත නොදන්නා ප්‍රේක්ෂකයාට පළමු වරට, නුවුරා ණය ගෙන ඇත්තේ ක්‍රොග්ස්ටඩ් ගෙන් බවත් ක්‍රොග්ටස්ඩ් මේ වන විට බැංකුවෙන් නෙරපා ඇති බවත්, ණය පොරොන්දු පත්‍රයට නුවුරා විසින් වාංචනික ව පියා ගේ අස්සන යොදා ඇති බවත්, හෙළිදරවු වීම. මෙය පශ්චාද් දෘෂ්ටි කථන රීතියට අනුව සිදුවීම.
- හෙල්මර් මඟින් ක්‍රොග්ස්ටඩ් කර ඇත්තේ ද බැංකුවේ දී හොර අත්සනක් බව හෙළිදරවු වේ.
- ලින්ඩේ මිය මඟින් ඇය සහ ක්‍රොග්ස්ටඩ් අතර පැවති ප්‍රේම සම්බන්ධය ද හෙළිදරවු වීම.
- සෙල්ලම් ගෙය නාට්‍යය රස විඳීමේ දී නුවුරා තමාට සමාජයේ තමාට හිමි තැන සොයා යන අයුරු ප්‍රේක්ෂකයා ද විඳියි.
- හෙල්මර් නුවුරා තම පියා මෙන් ම බෝනික්කකු ලෙස සැලකීම.
- නුවුරා මුහුණ දෙන ණය පිළිබඳ ගැටලුව සමඟ නුවුරා තමා සහ ටෝවල්ඩ් අතර ඇති බැඳීම පළමු වරට අභියෝගයට ලක් වීම.
- අවුරුදු අටක විවාහයේ දී තුළ ටෝවල්ඩ් තමාට අමුත්තකු ලෙස දිස් වීම.
- මේ අයුරින් නුවුරා තමා ගේ මානුෂික පැවැත්ම පිළිබඳ ව දිනෙන් දින ගැඹුරින් සිතන්නට පටන් ගන්නා අයුරු අවබෝධ කර ගැනීම. නුවුරා මෙහි දී එය පෞද්ගලික බේදයකට වඩා සමාජීය බේදයක් ලෙස දැකීම.

  "මම උත්සාහ කරනවා මම ද නැත්නම් සමාජ රටාව ද හරි කියන එක නිවැරදි ව තෝරා බේරා ගන්න"

- හෙල්මර් අවසාන භාගයේ දී ආදරය වෙනුවෙන් ඕනෑ ම දෙයක් කිරීමට සූදානම් බව පවසන විට ඇය ගේ පිළිතුර වනුයේ,

  ''කෝටියක් ගෑනු එහෙම කරලා තියෙනවා"

මේ අයුරින් නෝරා තම පුද්ගල විමුක්තිය සොයා යන්නේ පොදු මනුෂ්‍යත්වයට උරුම 'නිදහස' සමාජය තුළ තිබිය යුතු බව අදහන බැවිනි.

- සෙල්ලම් ගෙය නාට්‍යය රස විඳීමේ දී විශේෂයෙන් ටෝවල්ඩ් ගේ චරිතය හැසිරෙන ආකාරය ද සැලකිල්ලට ගත යුතු වේ.
- පුරුෂාධිපත්‍ය, මධ්‍යම පාන්තික ආර්ථික වටිනාකම්, සාම්ප්‍රදායික චින්තනය වැනි ලක්ෂණ ඔහු ගේ චරිතයෙන් නිරූපණය වන අයුරු අවබෝධ කරගැනීම.
- ක්‍රොග්ස්ටඩ් ගේ චරිතය මධ්‍යම පාන්තිකයන් ගේ ආත්මාර්ථකාමී අරමුණු, රැකියාව, මිල මුදල් වැනි දේ හඹා යෑම, තර්ජන ගර්ජන හරහා අරමුණ සාක්ෂාත් කරගැනීම වැනි කරුණු ද ඔහුගේ පෞද්ගලික ජීවිතයේ පසුබැසීමේ සහ නැඟීටීම් ද මෙහි දී අවධානයට යොමු විය යුතු ය.
- චරිත අතර ප්‍රතිවිරෝධතාව මෙන් ම විවිධත්වය ද මෙහි දී දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. දොස්තර රන්ක් ගේ රෝගය මඟින් මතු වන සමාජීය තතු මෙන් ම ඔහු ජීවිතය දෙස හෙළන දෘෂ්ටිය මෙහි දී අවධානයට යොමු වීම වැදගත් වේ.
- ලින්ඩේ මිය චරිතය හා නුවුරා අතර යම් සැසඳීමක් කළ හැකි ය. ඇය ගේ චරිතය කොතෙක් දුරට නුවුරා ගේ ජීවිත කඩා වැටීම ප්‍රේක්ෂකයාට පිළිබිඹු කිරීම සඳහා යොදා ගෙන තිබේ ද? ඒ අතර ම ඇගේ චරිතය දෙස ස්වාධීන ව බැලීමට අවධානය යොමු විය යුතු ය.
- සෙල්ලම් ගෙය නාට්‍යයේ දී චරිත නිරූපණය ප්‍රබල ව මතු කිරීම සඳහා නත්තල් සමය, නත්තල් ගස, මැකරුන්, සෙල්ලම් ඇඳුම, තරන්තලා නැටුම වැනි සංකේත යොදා ඇති ආකාරය හා ඒ මඟින් සියුම් නාට්‍ය රසයක් ඇති වන බව.
- පෙළ රසවිඳීමේ දී භාෂාව යොදා ඇති ආකාරය වැදගත් වේ. ඉබ්සන් ග්‍රීක, එංගලන්ත වැනි නාට්‍ය සම්ප්‍රදායවල පද්‍ය රටා ආකෘතිය වෙනස් කර ඇත. ඒ වෙනුවට තාත්ත්වික රීතිය අනුව ව්‍යවහාර භාෂාව යොදා ගත්ත ද එය කාව්‍යමය හා ව්‍යංග්‍යාර්ථවත් භාෂාවක් වූ නිසා ප්‍රේක්ෂකයා තුළ අවස්ථෝචිත රසය ජනනය විය.

  උදා :

  > ''නුවුරා .... කුණාටුව මැකිලා ගිය ගමන්, එහෙම කිසිම දෙයක් නොවුණ ගානට ඔයා හිටියා. ආ එතකොට මම ඔයා ගේ පුංචි සින්දු කිරිල්ලි, ඔයාගේ රූකඩ පැටික්කි.......... ටෝවල්ඩ් ඔය අතර තමයි මට වැටහුණේ අට අවුරුද්දක් ම මම මේ වගෙ මනුස්සයෙක් එක්ක මේ වගෙ ජීවිතයක් ගත කරලා.................... මට මාව ම කීතු කීතුවලට ඉරා ගන්න පුළුවන් නම්.''

- රේමන්ඩ් විලියම්ස් නම් විචාරකයා මෙම නූතන ට්‍රැජඩිය හඳුන්වා දෙන්නේ ලිබරල් ට්‍රැජඩිය නමින් ය. එනම් නුවුරා ගේ වීරත්වය ඇත්තේ අරමුණෙහි හා එය දිනා ගැනීමේ අභිලාෂයෙහි ය. නුවුරා ගේ විමුක්තිය සොයා ගත යුතු වනුයේ ඇය ගේ ම අධ්‍යාත්මය තුළින් බව පැහැදිලි වේ.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

1. රූකඩ ගෙදර නාට්‍යයේ එන ගැටුම ප්‍රබල ව ඉදිරිපත් කිරීම සඳහා නාට්‍යකරුවා තෝරාගෙන ඇති ප්‍රධාන සිදුවීම පෙළ ගස්වන්න.
2. නුවුරාගේ සහ ටෝවල්ඩ්ගේ චරිතවල ඔබ දකින ජීවන අරමුණු හා චරිත ලක්ෂණ පැහැදිලි කරන්න.
3. 'රූකඩ ගෙදර' ප්‍රේක්ෂකයා වෙත නාට්‍ය රසයෙන් යුතු අත්දැකීමක් බවට පත් කිරීම සඳහා ඉබ්සන් විසින් යොදා ගනු ලැබූ විවිධ උපක්‍රම පැහැදිලි කරන්න.

නිපුණතාව 5.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ විවිධ නිර්මාණ රසාස්වාදයට හා විචාරයට ලක් කරමින් ජීවිත අත්දැකීම් පෝෂණය කරයි.

නිපුණතා මට්ටම 5.2 : නාට්‍ය පෙළ රංගයක් බවට පත් කර ඇති ආකාරය විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගැනුම් පල :
- ග්‍රීක නාට්‍යයක් රංගගත කළ ආකාරය විමසයි.
- රංග ශෛලිය භාවිත කිරීම සඳහා රංග භූමිය යොදා ගත් ආකාරය විමර්ශනය කරයි.
- ''ඊඩිපස් රජ'' නාට්‍ය පෙළ අධ්‍යයනය කරයි.
- සර්වකාලීන මානව ධර්ම පෙළ මඟින් හුවා දක්වයි.
- කාරුණ්‍යය හා භය යන භාවයන් විශෝධනය වන ආකාරය විමසයි.

ක්‍රියාකාරකම 5.2.1 :''ඊඩිපස් රජ'' පෙළ වේදිකාවට

ගුණාත්මක යෙදවුම් :
- ''ඊඩිපස් රජ'' පෙළ - ආරියවංශ රණවීර
- ග්‍රීක රංග භූමියේ පින්තූර
- වෙස් මුහුණු හා වේශභූෂණ සහිත ව නළුවන් ගේ පින්තූර
- ''ඊඩිපස්''- සිරි එදිරිවීර

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : පෙළ අධ්‍යයනය හා ප්‍රායෝගික අත්දැකීම්

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ගුණාත්මක යෙදවුම් සඳහා රැස්කරගත් පින්තූර ප්‍රදර්ශනය කරමින්, නාට්‍ය පෙළ වෙත සිසු අවධානය යොමු කර ගන්න.
- අනතුරු ව පහත සඳහන් කරුණු ද සහිත ව ''ඊඩිපස් පෙළ'' වේදිකාගත කළ ආකාරය සාකච්ඡා කරන්න.
- ග්‍රීක ට්‍රැජඩි නාට්‍ය රංග ශෛලිය නාට්‍ය පෙළ ඇසුරෙන් විමසා බලන කල දැකිය හැකි වනුයේ නාට්‍ය ධර්මී ශෛලියකි. කාව්‍යමය බස් වහරක්, සරල ක්‍රියා නිරූපණයක් මෙන් ම නර්තන විලාසයක්, සංගීත සංයෝජනයක් සහ වෙස් මුහුණු පැලැඳ රංගනයේ යෙදීමක් විය.
- සියලු චරිත රඟපාන ලද්දේ පුරුෂයන් විසිනි. සේවිකාව වැනි ස්ත්‍රී චරිත රඟපාන ලද්දේ ද පුරුෂන් විසිනි. ඔවුහු වෙස් මුහුණු පැලඳ, ස්ත්‍රී වේශභූෂණ සහිත ව රංගනයේ යෙදුණහ. ජොකොස්ටා බිසව පැලඳ සිටි අලංකාර රන් කුරෙන්, ඊඩිපස් රජු සිය දෙනෙත් අඳ කරගත් බව සේවකයා හෙළිදරවු කරන තොරතුරෙන් ගම්‍යමාන වෙයි.

  ''ඔහු ඇගේ ඇඳුමේ ගසා දවටා තිබුණු අලංකාර රන් කුර ගලවා ඇඳුමින් එක් වර ම ඇන ගත්තා අත දිග හැර රන් කුරෙහි උලින් නැවත නැවතත් ඇස් දෙකට''

  ඊඩිපස්, ජොකොස්ටා, ක්‍රියොන් වැනි චරිතවල දවැන්ත ස්වරූපය පෙන්නුම් කිරීම සඳහා අඩියක් පමණ උස් වූ, ඔන්කොස් නමින් හැඳින්වූ මුහුළත්, කොතුර්නොස් නම් වූ අඩි උස පාවහන් ද පැලඳියහ. ඊඩිපස් සහ ක්‍රියෝන් අත්‍යලංකාර ලෙස සැකසූ දීප්තිමත් වර්ණයන්ගෙන් යුත්, දෙපා වැසෙන ආකාරයේ ලෝගු වැනි කඩා හැලෙන සුලු වස්ත්‍රවලින් සැරසුණ හ. ඌර්ධ්ව කාය සැරසූ සාටකය සිය උරමත රැඳවූහ. ජොකොස්ටා බිසව ද විචිත්‍ර වර්ණ ලෝගු ඇඳුමක් සහිත ව සාටකයෙන් හිස වසා සිටින්නට ඇත.

  ඔවුන් වෙස් මුහුණු පැලඳ රූපණයෙහි යෙදුණු බැවින් සාත්ත්වික අභිනය පැමක් සිදු නොවී ය. ඔවුන් පැලඳි වෙස් මුහුණ ප්‍රකෘති මුහුණට වඩා විශාල වත්, කටහඬ ඇතට ඇසෙන පරිදි මුඛය විශාල වත්, විශේෂිත ආකාරයකට සකස් ව පැවතියේ ය.

- ග්‍රීක නාට්‍යයේ සම්මත රීති අනුව කිසිදු භීෂණ ක්‍රියාවක් වේදිකාවේ ඉදිරිපත් නොකැරිණි. ''ඊඩිපස් රජ'' නාට්‍යයේ එවන් භීෂණ ක්‍රියා ගණනාවකි. ළදරු ''ඊඩිපස්'' කුමරු ගේ දෙපා සිදුරුකොට විලංගු දැමීම, කොරින්ත වැසියා ගේ ඝාතනය, ලායියුස් රජු හා පිරිස ඝාතනය, යකිනිය ගේ සියදිවි නසා ගැනීම, ජොකොස්ටා බිසව ගෙළ වැලලා ගෙන මිය යාම, ඊඩිපස් රජු විසින් සිය දෙනෙත් අඳ කර ගැනීම පිළිබඳ සියලු සිද්ධීන් වේදිකාවේ නොපෙන්වා, දූතයන් හෝ අත්වැල් ගායක කණ්ඩායම් මඟින් ප්‍රේක්ෂකයන් වෙත හෙළිදරවු කෙරේ.
- සොෆොක්ලීස් අනුගමනය කළ පශ්චාද් දෘෂ්ටි කථන රීතිය ''ඊඩිපස් රජ'' නාට්‍යයේ ද දැකිය හැකි ය. ඊඩිපස් කුමරු තීබ රාජ්‍යයට හිමිකම් කියනුයේ මන්ත්‍රකාරියක විසින් අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරු සැපයිය හැකි නිසා ය. ඉන් අදහස් වන්නේ තීබ නුවර රජකම් ලැබීමට හේතු වූයේ ඊඩිපස් කුමරු ගේ ප්‍රඥා මහිමය බව යි. ගායන වෘන්දය ඒ පිළිබඳ ව පවසන්නේ මෙලෙසිනි.

  "පිටත්තරයකු විලස අපගෙ පුරයට පැමිණ
  ගැලෙව්වේ අප නුවර ග්‍රහණයෙන්
  නුවර පෙළමින් සිටින රුදු මන්ත්‍ර කාරි ගෙන්
  නොලැබුණත් සහායක් නුවර වැසී අපෙන්
  දෙවියන්ට ඔබට පිළිසරණ වී යයි සිතමු.
  මන්ත්‍ර කාරිය දමා ඒ විලස
  ලබා දුනි යළි අපට ජීවිතය''. - 48 පිටුව -

- කරුණු හෙළිදරවු කිරීම පිණිස නව චරිත යොදා ගැනීම ද රචකයා ගේ පිළිවෙතකි. කොරින්තවාසී බැටළුපල්ලා ගේ පැමිණීම නිසා ඊඩිපස් ගේ උපත පිළිබඳ ව ද, හැදී වැඩුණු දේශය හා හදාගත් මවුපියන් මෙන් ම සැබෑ මවුපියන් පිළිබඳ ව තොරතුරු ද හෙළිදරවු වෙයි.

  ''පණිවිඩකරු - නැත, පොලිබස් හා ඔබ අතර කිසි ම ඥාති සම්බන්ධතාවක් නැත.
  ඊඩිපස් - ඥාතියෙක් නොවේ? ඔහු මගේ පියා නොවේ?
  පණිවිඩකරු - මම ඔබේ පියා ද? නැත. එසේ නම් ඔහු ද ඔබ පියා නොවේ''

- ඇරිස්ටෝටල් දක්වන පරිදි ශෝකාත්ම වීරයා උසස් පෙළපතකින් පැවත එන, සාධු ගුණයෙන් යුත්, එහෙත් මානව දුර්වලතාවන් ගෙන් හෙබි අයකු විය යුතු ය. ඊඩිපස් කුමරු උපත ලැබුවේ ද, හැදී වැඩුණේ ද රාජ මාලිගයේ ය. ඔහු ගේ සමාජ තත්ත්වය ද උසස් ය. එනම් හේ රාජ්‍ය පාලකයෙකි.

  "ඊඩිපස් - දුක්වෙමි මම ද දරුවෙනි, නුඹලා නිසා
  මා වෙතින් පතන පිහිට ගැන දනිමි මම තැවෙන
  විට නුඹලා තැවෙමි මෙම නුඹලාට වැඩි කරමින්
  දුක් තැවුල් නුඹලා එකිනෙකා විඳින
  එකතුව මහ දුකක් සෙයින් පෙළයි මා හද"

  ඔහු වැසියන් කෙරෙහි දැක්වූ කරුණාභරිත භාවය එමඟින් පිළිබිඹු වේ.

- ඔහු තුළ පැවති අධිමානය නිසා ඔහු අයසට යොමු වනු පෙනේ. ඔහු ගේ උපත පිළිබඳ කරුණු නොසොයන්නැයි, ටෙරේසියාස් නම් පූජකයා මෙන් ම ජොකොස්ටා බිසව කෙතෙක් කීවත් වෑයම අත් හරින්නේ ඊඩිපස් නොවේ.

  ඊඩිපස් රජු, ටෙරේසියාස් පූජකයාට මෙන් ම ක්‍රියෝන්ට ද චෝදනා කරයි.

  ආදරණීය පියතුමකු ලෙස දියණියන් ගේ අනාගත වගකීම ක්‍රියෝන්ට පවසන අන්ධ ඊඩිපස් තමා වෙතින්, දරුවන් දුරස් නොකරන්නැයි ඉල්ලා සිටී.

''ක්‍රියෝන් - යනු එසේ නම් (ඊඩිපස් මාලිගය දෙසට පිය නඟයි. ඔහුගේ දෑත් තවම දරුවන්
ගෙල මත ය.) අත හරිනු දරුවන් දෙදෙන.

ඊඩිපස් - අනේ! ඉවත් නොකරන්න උන් මා කෙරෙන්... යි" - 104 පිටුව -

කෑ ගසා පවසන්නේ සැබෑ මිනිස් ගුණ ඉස්මතු කරමිනි.

මව මෙන් ම තම දේවිය ද වූ ජොකොස්ටා ගේ දේහය ගෞරවාන්විත ලෙස මිහිදන් කරන්නැයි ක්‍රියෝන් ගෙන් ඉල්ලා සිටියි.

''ඊඩිපස් - මම ඉල්ලමි ඔබෙන්
මියගොස් සිටින ඇය ගේ
අවමඟුල් කටයුතු කරවන ලෙස ගෞරවයෙන්''

- පෙළ රංගයක් බවට පත් කිරීමේ දී චරිතවල මුවගට නංවා ඇති ප්‍රබල කාව්‍යමය බස් වහර නාට්‍යයේ අර්ථය හා චරිතවල භාවයන් ප්‍රේක්ෂකයා වෙත මනා ව සන්නිවේදනය කරයි.

''ඊඩිපස් -

එහෙත් ක්‍රියොන් ... මගේ දියණිවරු
අසරණ සිඟිති පැටවු ?
අහර වේලක් වත් එක ම එක
වළඳා නොමැත පියා නොමැති ව
බෙදා ගත්තෙමු හැම දේ ම අපි එකා මෙන්
ක්‍රියෝන් ... මට හැකි නම් තව එක ම එක වරක්
පිරිමදින්නට සිඟිති අත් උන්ගේ,
මට දැනේවි උන් දෙදෙන
මා නෙත් අබියස සිටින බව'' - 102 පිටුව -

- ''ඊඩිපස් රජ'' නාට්‍යය සඳහා පසුබිම් කර ගත්තේ එක ම ස්ථානයකි. එනම් තීබ රජ මාලිගය යි.
- පාදක කථා වස්තුව ද එක් දිනෙක කාල පරාසයක් තුළ සිදුවිය හැකි සිදුවීම් සහිත කථා ප්‍රවෘත්තියකි.
- ''ඊඩිපස් රජ'' වනාහි ඊඩිපස් පුරාණෝක්තිය රැගත් සොෆොක්ලිස්ගේ නාට්‍ය ත්‍රිකයේ පළමු වැන්න ය. ඊඩිපස් පෙළ අවසන් වනුයේ ද මහත් වූ ඛේදයකිනි. ලායියුස් රජ ඝාතනය කෙරේ. ජොකොස්ටා බිසව සියදිවි හානි කර ගනී. ඊඩිපස් තම අතින් ම දෙනෙත් අඳ කරගනිමින්, සිය ජීවිතයේ ඉතිරි කාලය ගත කිරීමට සිතරොන් කඳුකරයට පිටුවහල් වේ.

  වරදකරුවන්ට දඬුවම් නියම කළ ඊඩිපස් රජ, වරදකරු තමා බව හෙළි වීමෙන් පසු ව තමාට ම දඬුවම් ලබාදෙයි.

  මෙවන් සිදුවීම් ඔස්සේ කාරුණ්‍යය සහ බිය යන භාවයන් ජනිත වීමෙන් අපේක්ෂිත භාව විශෝධනය සිදු වේ.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ග්‍රීක රංග ශෛලියේ භාවිතය ''ඊඩිපස් රජ'' නාට්‍ය පෙළ ඇසුරින් විමසන්න.

වැඩිදුර අධ්‍යයනය සඳහා : සිරි එදිරිවීර - ඊඩිපස්
ආරියවංශ රණවීර - ඊඩිපස් රජ

නිපුණතාව 5.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ විවිධ නිර්මාණ රසාස්වාදයට හා විචාරයට ලක් කරමින් ජීවිත අත්දකීම් පෝෂණය කරයි.

නිපුණතා මට්ටම 5.2 : නාට්‍ය පෙළ රංගයක් බවට පත් කර ඇති ආකාරය විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගැනුම් පල :
- කුවේණි නාට්‍යය නරඹයි.
- රංග වින්‍යාසය අධ්‍යයනය කරයි.
- ආකෘතිකමය විශේෂත්වය නිරීක්ෂණය කරයි.
- සතර අභිනය භාවිත කොට ඇති ආකාරය ප්‍රකාශ කරයි.
- පෙළ කියැවීමෙන් මතු වූ චිත්ත රූප නාට්‍යයේ දර්ශන හා සසඳයි.
- චරිත නිරූපණයේ ස්වභාවය අත්විඳියි.

ක්‍රියාකාරකම 5.2.2 : කුවේණි පෙළ රංගයක් බවට පත් කිරීම

ගුණාත්මක යෙදවුම් :
- කුවේණි නාට්‍යයේ සංයුක්ත තැටියක්
- නාට්‍යයේ දර්ශනවල ඡායාරූප

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : පෙළ අධ්‍යයනය හා ප්‍රායෝගික අත්දැකීම්

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- කුවේණි නාට්‍යය වේදිකාවේ දී හෝ සංයුක්ත තැටියක් මාර්ගයෙන් හෝ නැරඹීමට සිසුන්ට අවස්ථාව සලසා දෙන්න. නාට්‍යය නැරඹීමේ දී වාචික, ආංගික, සාත්ත්වික හා ආහාර්ය අභිනයන් භාවිත කොට ඇති ආකාරය පිළිබඳ ව වෙසෙසින් සැලකිලිමත් වන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න. පහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගනිමින් කුවේණි නාට්‍යය නිෂ්පාදනයක් ලෙස රස විඳීමට මෙහෙයවන්න.
- ඉතිහාසය නිවැරදි කිරීමට දැරූ අපූර්ව උත්සාහයක් ලෙස කුවේණි නාට්‍යය හැඳින්විය හැකි ය.
- නාට්‍ය ධර්මී ශෛලිය නිරූපණය කෙරෙන ආකාරයෙන් පූරක විසින් එහි මුඛ්‍යාර්ථය සුගේය පද මාලාවක් භාවිත කරමින් වේදිකාවේ ඉදිරිපත් කරයි. එහි දී නාට්‍ය දෘෂ්ටිය හා යටි පෙළ පැහැදිලි ව ම ප්‍රේක්ෂකයාට අවබෝධ කර ගැනීමට අවස්ථාව සැලසේ.
- පෙළෙහි රංග විධානවලින් දක්වා ඇති කොටස් සාර්ථක ව වේදිකාවේ ප්‍රතිනිර්මාණය කොට ඇත.
- වේදිකාවේ නිරූපණය නොකළ හැකි අවස්ථා හා සිද්ධින් මෙන් ම ප්‍රේක්ෂකයා ගේ විමසුමට ගෝචර විය යුතු දාර්ශනික සංසිද්ධි ද ගායක පිරිස ලවා ඉදිරිපත් කොට ඇති ආකාරය නාට්‍යයේ ජීව ගුණයට බෙහෙවින් බලපා ඇත. උදාහරණ ලෙස මිනිස් ඉතිහාසයේ වැදගත් ම සංසිද්ධියක් වූ ගලින් ගල ගටා ගින්න සොයා ගැනීමේ සිට මිනිස් මොළය/බුද්ධිය විකසනය වී ඇති ආකාරය හා යළි ස්වකීය මූලය සොයා අතීතය වෙත යන ආකාරයත් පිළිබඳ දාර්ශනික චින්තනය ළඟන්නා පද මාලාවක් මඟින් ඉදිරිපත් කිරීම, කුවේණිය ගැන ඉතිහාසය සඳහන් කරන ආකාරය දරුවන්ට ඉදිරිපත් කිරීම. කුවේණිය ගේ ශාපය, කුවේණිය ගේ යළි සම්ප්‍රාප්තිය ආදි අවස්ථා දැක්විය හැකි ය. කථා වින්‍යාසය මැනවින් හැඩ ගැස්වීම සඳහාත්, විශේෂයෙන් අතීත කථාව ඉදිරිපත් කිරීම සඳහාත් නාට්‍යයේ දී ගායක පිරිස යොදා ගන්නේ ප්‍රකාශනාත්මක හා භාවාත්මක නිරූපණ හා සංකලනය වූ නර්තනාංග ද සහිත ව ය.
- එසේ ම ජීවහත්ථ සහ දිසාලා ලවා වරින් වර ඉදිරිපත් කරන සංවාද හා ගායනා මඟින් කුවේණිය මාතෘත්වය කැටි කොටගත්, අහිංසක, සාධු චරිතයක් ලෙස රංගයෙහි යෙදෙන්නී ය. එහි දී දක්වන භාවමය නිරූපණ ප්‍රේක්ෂක සන්තානයට කරන බලපෑම සුළුපටු නො වේ.
- නාට්‍යයෙහි ගැයෙන සෑම ගීතයක් ම භාව ප්‍රකම්පනය සඳහා කෙළින් ම බලපාන අතර ජනප්‍රිය

ගීතයක් වන ''සත් සියක් කපු මල් රැගෙන මම ....' ගිතයේ ගායනය හා නර්තනය බෙහෙවින් ම චමත්කාරය දනවයි. අප කොතෙකුත් අසා පුරුදු කුවේණි චරිතයට අපූර්වත්වයක් එක් කොට ප්‍රේක්ෂකයා භාවමය ප්‍රකම්පනයකට පත් කිරීමට සමත් වන මෙම ගීතය සුප්‍රකට ''ප්‍රේමයෙන් මන රංජිත වේ ...'' ගීතය මෙන් ම වාචික අභිනය ඉහළින් ම ප්‍රකාශිත ගීතයකි.

- එසේ ම ''සත්සියක්'' යන පදයෙන් අවධාරණය කෙරෙන සමූහාර්ථය විජය කුමරු ගේ පිරිවර සත්සියය සමඟ ද බද්ධ කරමින් විග්‍රහ කළ හැකි ය.
- කුවේණිය හා විජය මුණ ගැසෙන අවස්ථාව සිත් ගන්නා සුලු ය. කුවේණිය ඈත විමසුම් සහගත ව බලමින් පැමිණියේ කවරෙක් දැයි විමසයි. (ශෛලිගත) එහි දී කුවේණි ගේ අපේක්ෂා සහගත බව, විස්මය, විජය ගේ කෝපාවිෂ්ට බව ආදි සියලු භාව මැනවින් නිරූපණය කෙරේ. (සාත්ත්වික අභිනය)
- වරින් වර දිව්හත් හා දිසාලාවන් ලවා කරවන ගායනා මඟින් කුවේණිය ගේ මනුෂ්‍යත්වය හා මාතෘත්වය කුළු ගන්වයි.
- දඩයක්කරු මුල දී ඉතිහාසය විශ්වාස කරයි. දෙවනු ව සැක පහළ කරයි. තෙවනු ව කලකිරීම ප්‍රකාශ කරයි. (මිනිස්සු නොවී මොකා වුණත් කමක් නැහැ) අවසානයේ දී අතීතයේ මතක තබා ගත යුතු අහිංසක දෙයක් කියා දෙන ලෙස ඉල්ලීමක් කරයි. පෙළ ගැස්වෙන සිදුවීම් මාලාව අනුව පුද්ගල චින්තාභ්‍යන්තරය විපර්යාසයකට බඳුන් වන අයුරු පැහැදිලි ය.
- ගායක පිරිස අතීතයේ මවත් දරුවනුත් ජීවත් වූ ආකාරය ගයයි. දරුවෝ නින්දට පිවිසෙති. දඩයක්කරු ඔවුන් විමසයි. අතීතයේ සැරිසරා, සසරෙහි සැරිසරා කුවේණි යළි පැමිණෙයි. ඒ වත්මන් ස්වරූපයෙනි. මව හා දරුවන් අතර ඇති වෙන් කළ නොහැකි සෙනෙහස එම අවස්ථාවෙන් ප්‍රකාශ වේ.
- උසාවිය ප්‍රබල ඉදිරිපත් කිරීමකි. නීතිඥයන් ලවා කුවේණි ගේ සැබෑ ස්වරූපය හා ඉතිහාසය උගන්වා ඇති ආකාරය ද කියවයි. විනිශ්චය කරු සාධාරණත්වය ඉටු කිරීමේ දී ඇති වන නීතිමය තත්ත්වය හා හෘදය සාක්ෂ්‍යය අතර අතරමං වේ. ඔහු සර්වකාලීන හා සර්ව සමාජීය දර්ශනයක් ඉදිරිපත් කරයි. කෙනකු පිළිබඳ අයිතිය ලබා දීමට නීතියට හැකි වුවත්, සෙනෙහස, දයාව ආදි මානුෂීය අවශ්‍යතා ලබා දීමට නීතිය අපොහොසත් ය යනු එම දර්ශනය යි.
- කුවේණියට හෙළ හැතිරිය යැයි කී විට දිව්හත් - දිසාලා ඇගේ ස්වාභාවික ගතිය ගායනයකින් විස්තර කරයි. ඇය දරුවන්ට කතාන්දර කීවා ය. කුවේණිය දයාබර මවක බව දන්නේ දරුවන් පමණක් බව ඉන් කියැවේ. එසේ ම කුවේණිය ගේ විලාසය හා ශාපය මුළාවක් බව ද රජ කුමරිය ගෙන් වූ දා ඇය නොවැලපුණු බව ද එහි දී නිරූපණය කෙරේ. කුවේණි සැමිය ට දොස් නොකියයි. සමාජ ක්‍රමය ගැන දොම්නස් වෙයි. මතු සසරේ හමු වීමට පතයි. ඒ සැනසුම ලැබීමට යි.
- වර්තමාන දර්ශනය (උසාවිය) කුවේණිය සදාතන බවට සාධක ඉදිරිපත් කරයි. නීතිඥයන් ගේ කරුණු ඉදිරිපත් කිරීම සමාජ දුර්වලතා හෙළි කරයි. කුවේණි ගේ විචලා ගුණය නිරූපණය ඉතා ප්‍රබලයි.
- ''නෙත් කඳුළු ඉසින්නී'' යන පැරණි කියමන ''නෙත් කඳුළු නොසලා කියන්නේ'' යයි මෙහි දී වෙනස් කෙරේ. ආත්මගත ආදරය සොයා සාධාරණ විනිශ්චයක් පතන මෙම දර්ශන පෙළ නීතියත්, හෘදය සාක්ෂ්‍යයත් අතර ගැටුම මැනවින් ප්‍රකට කරයි. භාව තීව්‍ර කිරීමට සංගීතය මනා පිටුබලයක් සපයයි.
- නාට්‍යයේ අවසානය භාවාත්මක ය. දරුවන් නිදි ගැට හැර නැගිටින විට මෑණියෝ යළි පැමිණ සිටිති. ඒ උසාවියේ සිටි වර්තමාන කුවේණිය බව ඇගේ ඇඳුමින් පැහැදිලි වේ. සංවාදය අවසානයේ ''අපි මිනිස්සු වෙන්නෙ නෑ...'' ප්‍රබල ප්‍රකාශනයකි.
- නාට්‍යයේ සංගීතය අවස්ථා නිරූපණයේ දී මනා කාර්යභාරයක් ඉටු කරයි. නාට්‍යය පුරා ජීව ගුණය රඳවා ගැනීමට සංගීතයෙන් ලැබෙන පිටු බලය ඉමහත් ය.

- ආලෝකය සැපයීමේ දී විශේෂයෙන් කාලත්‍රයය දැක්වීම සඳහා අන්ධකාරය සංකේතයක් කර ගනී.
- වේදිකා පසුතල නිර්මාණය කිරීමේ දී ස්වාභාවිකත්වයට වඩාත් සමීප වීමට උත්සාහ කර තිබේ. ගස්, ගල් කුළු ආදිය මෙන් ම උසාවිය ද එයට නිදසුන් ය.
- කුවේණි නාට්‍යයේ රඟ පෑ නළු-නිළියන් (චරිත හසුරුවා ඇති ආකාරය හැකි නම් ශ්‍රව්‍ය දෘශ්‍ය දර්ශන මඟින් පෙන්වමින් සාකච්ඡාව මෙහෙයවන්න)

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ලැබී ඇති පහසුකම් යටතේ, කුවේණි නාට්‍යයේ ඔබ වඩාත් කැමති කොටස් ප්‍රතිනිර්මාණය කරන්න.
- ''නව ආකෘතියක් සොයා ගිය නාට්‍යයක් වශයෙන් කුවේණි සාර්ථක වී තිබේ ද?'' ඔබේ පිළිතුර නිදසුන්වලින් තහවුරු කරන්න.

නිපුණතාව 5.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ විවිධ නිර්මාණ රසාස්වාදයට හා විචාරයට ලක් කරමින් ජීවිත අත්දැකීම් පෝෂණය කරයි.

නිපුණතා මට්ටම 5.2 : නාට්‍ය පෙළ රංගයක් බවට පත් කර ඇති ආකාරය විමසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :

- රූකඩ ගෙදර නාට්‍යයේ රංග ශෛලිය හඳුන්වමින් එය සැකෙවින් විස්තර කරයි.
- රූකඩ ගෙදර නාට්‍යයේ රඟපෑම (Acting) හෙවත් රූපණය විමසයි.
- රූකඩ ගෙදර නාට්‍යයේ වේදිකා පසුතල නිර්මාණය පැහැදිලි කරමින් එය රූ සටහන් මඟින් පෙන්වයි.
- රූකඩ ගෙදර නාට්‍යයේ වේශභූෂණ හා අංග රචනය විස්තර කරයි.
- රූකඩ ගෙදර නාට්‍යයේ යොදා ගනු ලැබූ සංගීතය, නර්තනය, හඬ උපක්‍රම පැහැදිලි කරයි.
- විවිධ රටවල එය නිෂ්පාදනය වූ අයුරු ප්‍රකාශ කරයි.

ක්‍රියාකාරකම 5.2.3 : රූකඩ ගෙදර නාට්‍ය පෙළ රංගයක් බවට පත් කර ඇති ආකාරය විමසීම.

ගුණාත්මක යෙදැවුම් : රූකඩ ගෙදර නිෂ්පාදනයන්හි ඡායාරූප, වීඩියෝ දර්ශන

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- රූකඩ ගෙදර නාට්‍යය අන්තර්ගතය වශයෙන් යථාර්ථවාදී නාට්‍ය (Realistic) වර්ගයට අයත් වෙයි. මෙහි වස්තු විෂය හා තේමාව සමකාලීන සමාජය මත පදනම් වීම නිසා ඊට උචිත රංග ශෛලිය ලෙස තාත්ත්වික හෙවත් ලෝක ධර්මී ශෛලිය යොදා ගෙන ඇත. මෙහි අන්තර්ගතයේ හා ආකෘතියේ දක්නට ලැබෙන තාත්ත්විකත්වය යනු ජීවිතය තිබෙන සැටියෙන් ම පිළිබිඹු කිරීමක් නො වේ. එසේත් නැත්නම් යථාර්ථය යනු ජීවිතයේ යථා අර්ථය එනම්, අදාළ කෘතියෙන් ඉදිරිපත් වන පුද්ගලයන් ගේ හෝ සමාජයේ හෝ යථාර්ථය ප්‍රේක්ෂකයාට අනාවරණය විවරණය වන ආකාරයට නාට්‍ය ගොඩනැගීමයි.

- පෙළෙහි ගැබ් වූ ප්‍රබල හා සංකීර්ණ ගැටුම තාත්ත්වික ශෛලියෙන් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රබල රූපණයක අවශ්‍යතාව ඉබ්සන් අවබෝධ කර ගෙන ඒ සඳහා ස්ටැනිස්ලව්ස්කි ගේ රූපණ විධි ක්‍රමයට අනුකූල වූ අභ්‍යන්තර රංගනය (Inner acting) යොදා ගත්තේ ය. නූවුරා, ටෝවල්ඩ් ක්‍රොග්ස්ටඩ් වැනි සංකීර්ණ චරිතයන්හි මනෝභාවයන් මතුවන ආකාරයට නළු-නිළියන් සඳහා අභ්‍යන්තර රංගන ක්‍රමය උපයෝගි කර ගනී. ඉබ්සන් නාට්‍ය රචනය හා නිෂ්පාදනය පිළිබඳ ව ඉදිරිපත් කළ අදහස් මඟින් මෙම අභ්‍යන්තර රංගනය යනු කුමක් ද යි කෙනෙකුට එක්තරා දුරකට හෝ වටහා ගත හැකි වනු ඇත. ඉබ්සන් මෙසේ දක්වයි.

  ''එක වචනයක් හෝ ඒ ගැන ලිවීමට පෙර මා මවන චරිතයේ ඇතුළත හා පිටත මා ඉදිරියේ විදාරණය විය යුතු ය. ඔහු ගේ ආත්මය හමක් නම් එකී හමේ අවසාන රැල්ල තෙක් මා අවබෝධ කරගත යුතු ය. මා නිතර ම පටන් ගන්නේ පුද්ගල චරිත දෙස අවධානය යොමු කිරීමෙනි. ඉන් පසු රංග වේදිකාව, සැරසිලි, සාමූහික රංගන රටාව (Dramastic ensemble) ආයාසයකින් තොර ව ගලා ගෙන එයි. මා මවන පාත්‍රයා ගේ අභ්‍යන්තරය පමණක් නොව ඔහුගේ බාහිර ස්වරූපය ද මගේ මනසේ ඇඳි යා යුතු ය. ඔහු ගේ ඇඳුමේ අවසාන බොත්තම පවා මා දැන සිටිය යුතු ය. ඔහු නැඟිට සිටින්නේ, ඇවිදින්නේ, හැසිරෙන්නේ කෙසේ ද? ඔහු ගේ කටහඬ කවර ආකාරයේ විය යුතු ද?...'

- නාට්‍යය ගලා යැමේ දී එහි නිරූපිත පන්ති පදනමට උචිත රිද්මය නළු-නිළියන් විසින් රඳවා ගත යුතු බව.

- නාට්‍යයේ එන සියලු සිදුවීම් ටෝවල්ඩ් හා නුවුරා ගේ නිවස තුළ සිදුවේ. ඒ නිසා ස්ථාන ඒකත්වය එහි දක්නට ඇත. මෙහි දී එම නිවස නිර්මාණය කර ඇත්තේ ත්‍රිමාණ පසුතල සහිත ව හා ස්වාභාවික රංග භාණ්ඩ සමඟ ය.

    - දොරවල් සතර, ජනේලය, බිත්ති
    - මේසය, හාන්සි පුටු, කුඩා සෝපාව, උදුන, සැප පුටු, පියානෝව, පැද්දෙන පුටුව, කුඩා මේසය, කැටයම් චිත්‍රය, සේප්පුව, පොත් රාක්කය, බිම් පලස්
    - පිඟන් කෝප්ප
    - මුල් අංකයේ දි නත්තල් ගහ

- රූකඩ ගෙදර නාට්‍යයේ ඇඳුම් පැලැඳුම් ස්වාභාවික ආකාරයට යොදා ගෙන ඇත. එමඟින් යම් අරුත් සංකේතාත්මක ව දැක්වීම ද සිදු කර ඇත.

    උදා : සෙල්ලම් ඇඳුම, ගමන් ඇඳුම, හිස් වැස්ම, කළු සළුව, අංග රචනය තාත්ත්වික අයුරින් සාත්ත්වික අභිනය මතු කර ගැනීමට ඉවහල් වන අයුරින් නිර්මාණය කර ඇත.

- මෙහි සංගීතය හා නර්තනය ඉතා අරපරිස්සමින් හා සියුම් ව යොදා ගනු ලැබ ඇත. නුවුරා ගේ චරිතයෙහි අභ්‍යන්තර මනෝභාවයන් මතු කර ගැනීම සඳහා තරන්තලා නැටුම පුහුණු වීම සිදු වන ස්ථානයේ දී පියානෝ වාදනය යොදා ගෙන ඇත.

    උදා: (රන්ක් පියානෝව වාදනය කරන අතරතුර නුවුරා ආවේශයකින් මෙන් නටයි)

- හඬ උපක්‍රම ද නාට්‍යයේ අර්ථය සඳහා වේදිකාව මත දී භාවිත කර ඇත.

    උදා: (පහතින් ඇති දොර වසන හඬ ඇසේ)

    අලුත් චරිත පිවිසීමේ දී (දොරේ සීනුව නාද වෙයි)

- රූකඩ ගෙදර නාට්‍ය එදා සිට අද තෙක් ම ලොව සෑම රටක ම පාහේ වේදිකා ගත වී ඇත. මෙම නාට්‍ය පෙළ සමහර රටවල දී වෙනස්කම්වලට භාජනය විය. විශේෂයෙන් එහි අවසානය ජර්මනියේ දී වෙනස් කළ ද පසු ව ඉබ්සන් ම ඊට එරෙහි විය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- රූකඩ ගෙදර සමස්ත නාට්‍ය නිෂ්පාදනය පිළිබඳ ව නිදසුන් දෙමින් විමසීමක් කරන්න.
- රූකඩ ගෙදර වේදිකා පසුතල නාට්‍යෝපකරණ ඇඳුම් පැලැඳුම් රූ සටහන් සහාය කර ගනිමින් ඒවාහි වැදගත්කම පැහැදිලි කරන්න.
- රූකඩ ගෙදර නාට්‍යයෙහි අවසාන භාගය (කෙටි කර) රඟ දක්වන්න.

නිපුණතාව 5.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ විවිධ නිර්මාණ රසාස්වාදයට හා විචාරයට ලක් කරමින් ජීවිත අත්දැකීම් පෝෂණය කරයි.

නිපුණතා මට්ටම 5.3 : නාට්‍ය කෘති පරිශීලනයෙන් නව ජීවන දෘෂ්ටියක් ඇති කර ගනියි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- ග්‍රීක නාට්‍ය පෙළ කියවමින් රස විඳියි.
- ඛේදනීය වීරයන් මුහුණ දෙන අභාග්‍ය සම්පන්න අවස්ථාවක් විශ්ලේෂණය කරයි.
- එම කථා වස්තු තුළ ඇති ජීවන දෘෂ්ටි විමසා බලයි.
- ඊඩිපස් රජ පෙළ මඟින් මතු වන මානව ගුණ ධර්ම අගය කරයි.

ක්‍රියාකාරකම 5.3.1 : ඊඩිපස් නාට්‍යයෙන් මතුවන ජීවන දෘෂ්ටිය විමසීම.

ගුණාත්මක යෙදැවුම් : ආරියවංශ රණවීර - ඊඩිපස් රජ - නාට්‍ය පෙළ
සිරි එදිරිවීර - ඊඩිපස් - නාට්‍ය පෙළ

ඉගැනුම්--ඉගැන්වීම් ක්‍රමවේදය : පෙළ අධ්‍යයනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- මෙතෙක් අධ්‍යයනය කරනු ලැබූ ග්‍රීක නාට්‍ය කලාව පිළිබඳ තොරතුරු ඇසුරෙන් ''ඊඩිපස් රජ'' නාට්‍ය පිටපතෙන් ඉස්මතු කෙරෙන ජීවන දෘෂ්ටිය විමැසීම කෙරෙහි සිසුන් යොමු කිරීම සඳහා පහත දැක්වෙන කරුණු ද සහාය කරගන්න.

- සොෆොක්ලීස් ගේ මූලික අධ්‍යාසය වනුයේ ''ඊඩිපස්'' නම් පුරුෂයා තමා ගේ ජීවිතය පිළිබඳ ව කරන ගවේෂණයක ප්‍රතිවිපාක වශයෙන්, තමා නොදත් දෛවෝපගත ප්‍රහාරයකට ලක් වී ඇද වැටීම ගෙන හැර දැක්වීම ය.

- මෙලොව මිනිසකු අතින් සිදුවිය හැකි බරපතළ ම පාප කර්ම දෙකක් ඊඩිපස් පුරාවෘත්තයට පාදක වෙයි. එනම් පිතෘ ඝාතනයත්, මව සමඟ අඹු සැමියන් සේ හැසිරීමත් ය. එවන් බරපතළ පාපකර්ම ඊඩිපස් අතින් සිදු වුව ද, එහි වරද කිසි ම විටෙක දී ඔහු වෙත පැවරීමට අපි නොපෙලැඹෙමු. හේතුව ඔහු ගේ චරිතයෙන් ප්‍රකට වන මානුෂීය ගුණාංග ය.

  නාට්‍යයේ ප්‍රථම දර්ශනයේ දී ඊඩිපස් ගේ මුවට නංවන වචනවලින් නාට්‍යයට වැදගත් වන පුරාවෘත්තයේ සිද්ධි ප්‍රේක්ෂකයාට දැන ගැනීමට ලැබේ. ඊඩිපස් තීබයට ඒමට හේතුව, අතරමඟදී ලායියුස් රජු හා පිරිස ඝාතනය, මන්ත්‍රකාරිය ගෙන් තීබය බේරා ගැනීම, තීබයේ රජ වීම, ජොකොස්ටා විවාහ කර ගැනීම, දරුවන් ලැබීම ආදි සිද්ධි විශ්වසනීය ලෙස ඊඩිපස් චරිතය වටා ගොඩ නැඟී ඇත්තේ සැබෑ මිනිසකු ගේ ක්‍රියා පරිද්දෙනි.

  පුරාවෘත්තයේ පසුබිමෙහි ඇත්තේ දේව නියමය මඟින් වන විපාක දාමයක් වුව ද, නාට්‍යය පුරා දක්නට ඇත්තේ ලෙයින් මසින් සැදී මිනිසුන් ගේ අන්‍යෝන්‍ය බැඳීම්, ප්‍රතික්‍රියා හේතුවෙන් මතු වන හේතුඵල නියාමයනට අනුව ගොඩ නැඟී ඇති ආකාරය යි. අනපේක්ෂිත ව සිදු වන අද්භූත බලවේග කිසි දු විටෙක නාට්‍යයේ දක්නට නැත.

  නාට්‍යාරම්භයේ දී ම ඉදිරියට පැමිණෙන ඊඩිපස් තම රටවැසියන් අමතන විලාසයෙන් ඔහු කොතරම් දයාහරිත පාලකයෙක් දැ යි වැටහේ.

  ''දරුවෙනි, කිමෙක් ද මේ ආයාචනය ...?
  ගෞරවණීය පූජකතුමනි, ඔබ කියන්න
  මේ සැවොම වෙනුවෙන්
  පහදා දෙන්න මට, කුමක් ද මේ ආයාචනය ?
  කිසියම් භීතියක් ද?

නැතහොත් ඔබ සැමට
කිසියම් වරයක් අවශ්‍ය වී ඇත් ද? ලබා දෙමි
පතන යම් දෙයක් ඇත්නම්,
හදවතක් නැත්තෙක් නොවෙමි
මෙවැනි පොදු ආයාචනයකට
දෙකන් වසා නොගන්නෙමි''
''පැමිණි විට ඔහු පණිවිඩය රැගෙන
දෙවියන් පතන්නේ කුමක් වුව
ඉටු කරමි, මම එය, දිවි දෙවැනි කොට''

තම රට වැසියන් පිළිබඳ දැඩි භක්ත්‍යාදරයක් දැක් වූ රජු පවසන්නේ,

''............................
එක්කෝ අපි නැඟී සිටිමු එකට,
නැතහොත් වැටී නසිමු එකට''

ලෙසට ය.

තෙවන අංකයේ දී පැමිණෙන කොරින්තයේ පණිවිඩකරුවා විසින් ගෙන එන ලද ශුභාරංචිය, අභාග්‍යසම්පන්න සිද්ධි මාලාවක ආරම්භය වෙයි. ලායියුස් රජු ගේ ඝාතනය පිළිබඳ කළ ගවේෂණය, ඊඩිපස් ගේ උපත පිළිබඳ ගවේෂණයකට පෙරළෙයි.

මිනිසත් භාවය පිළිබඳ ගැඹුරු අර්ථයක් නිරූපණය කරන ඊඩිපස් ගේ චරිතය සර්වකාලීන ව, සාර්වභෞමික ව, ප්‍රේක්ෂක හදවත්හි ලැගුම් ගනු ඇත.

කල් තබා තීරණය කරන ලද ඉරණමක් තුළ ඊඩිපස් නාට්‍යයේ එන පාත්‍ර වර්ගයා කටයුතු කරති. ඊඩිපස් සිය පියා මරා, මව සමඟ විවාහ වීම, මවගෙන් දරුවන් ලැබීම නියම කරනු ලැබ ඇත්තේ දෛවය විසිනි. එවන් අභාග්‍ය සම්පන්න අනාවැකිවලින් මිදෙනු පිණිස නාට්‍යයෙහි එන ප්‍රධාන පාත්‍රයෝ ක්‍රියා කරති. ජොකොස්ටා බිසව ද, ලායියුස් රජු ද සිය එක ම පුත්‍රයා ඉරණම් අනවැකියෙන් මුදවනු පිණිස කටයුතු කරයි. සිය පුතු සිතීරියන් කඳු වැටියේ දමා මරණය අපේක්ෂා කරන්නේ ඉරණමෙන් ගැලවෙනු පිණිස ය.

ඊඩිපස්, කොරින්ත දේශයෙන් පලා එන්නේ ද නියමිත දෛවෝපගත ඉරණමෙන් මිදෙනු පිණිස ය. එහෙත් ඉරණම වැළැක්වීමට ගන්නා සැම ප්‍රයත්නයක් ම හමුවේ ඔවුහු එකී ඉරණමට ම ගොදුරු වෙති.

ඊඩිපස් රජු ගේ චරිතය නාට්‍යය පුරා විකාශනය කර ඇත්තේ නිදහස් මිනිසකු වශයෙනි. ඔහු නිසි තැන නිසි තීරණ ගෙන වහා ක්‍රියාත්මක වන ක්‍රියාකාරී පුද්ගලයෙකි.

ජොකොස්ටා, ටෙරේසියාස්, ගොපල්ලා යන සැම දෙනා ම ඊඩිපස් වළක්වද්දීත් ඔහු සත්‍යය සොයා යාම නො නවත්වයි. එමඟින් ස්වකීය ආත්ම විනාශය සිදුවන බව දැනදැනත් සෙවීමේ උත්සාහය අත් නොහරියි.

මෙලෙස අන්තවාදී ව නොගොස් ජීවිතයේ සැම කර්තව්‍යයක දී ම සම පැවැත්මක්, සම ජීවි කතාවක් සහිත ව ජීවත් විය යුතු වීම යෝග්‍ය ජීවන රටාවකැයි අපට ඒත්තු ගන්වන්නේ.

ජොකොස්ටා බිසවගේ චරිතය කෙරෙහි ද කිසි දු විටෙක ප්‍රේක්ෂක සිතෙහි පිළිකුලක් හට නොගැනේ. උරුම දෛවයෙන් ගැලවීමට කටයුතු කරන ඇය සැබෑ මාතාවකි. රජු සහ බිසව නිතර එකිනෙකා කෙරෙහි ගෞරවයෙන් කටයුතු කෙරෙති. භීතියට පත් තම ස්වාමියා ඉන් මුදවා ගැනීම පිණිස ඇය පවසන්නේ දෛවය, ඉරණම, අනාවැකි ඉටු පල නොදෙන බව ය.

''ඊඩිපස් - කියන්නම් මා දේවිය
මොවුනට වඩා මට ඔබ අගෙයි''

''ජොකොස්ටා - එසේ නම් හිමියනි,
සියලු සැක දුරු කර ගන්න සිතෙහි
ඔබ නිදොස් ය. මුළුමනින් නිදොස් ය ...
එහෙත් සිදු වුණේ එය නොවේ
ඔහු මළේ සොරමුළක් අතින් බව
දනිති සියලු දන
තුන්මං හන්දියක දී හොරු කඩා පැන,
මරා දමූහ, ඔහු ....
දරුවාට මක් වී ද? දුකක් මුත්
කියන්නම් එය ...
මෙසේ ලායියුස් මළේ, තම දරු අතින් නොවන බව
නිසැක යි, මා හිමියනි,''
''ඒ අතර ඔබේ හද පෙළන ඔය බර
මා සමග බෙදා ගනු මැනවි ස්වාමීනි...''

ජොකොස්ටා දේවිය, දෙවියන්ගේ පුදසුන වෙත ගොස් පුද පඬුරු තබා යාච්ඤා කරයි. අනතුරු ව එළැඹෙන නිමේෂයේ දී කොරින්ති පණිවුඩකරුවා ගේ ශුභාරංචිය හමුවේ ඇය සතුටු වන්නේ තම ස්වාමියාට සහනයක් වන හෙයිනි.

''ජොකොස්ටා - ස්වාමීනී නොකීවෙම් ද මම්
ඔය දේ හැම විට ම? ...
දැන් අමතක කරන්න එය ...
බිය! කුමකට ද බියෙන් තජ්ජිත වන්නේ ?
ආකස්මික බලවේගයකි ජීවිතය ...
ජීවිතය දරා උසුලන්නට නම්
අමතක කළ යුතු ය ඔවැනි දෑ ...''

කොරින්ති දේශයෙන් පණිවිඩකරු පැමිණෙන්නේ ඊඩිපස් රජුගෙන් ප්‍රසාද ලැබීමේ අදහස ඇති ව ය. ඔහු එන්නේ කොරින්ති දේශයේ රජකම භාර දීම පිණිස ආරාධනා කරනු පිණිස ය. එම දේශයේ රජු මියගිය බව දැන්වීමට ය. ඊඩිපස් කුමරු ගේ අභාග්‍යය ඇරඹෙන්නේ ද මෙතැන් සිට ය. කුමරු ගේ උපත පිළිබඳ සියලු තොරතුරු අනාවරණය වීමෙන් ඛේදාන්ත වීරයා, ඛේදයට ම ගොදුරු වෙයි.

පාපී පුද්ගලයා තමා බව අනාවරණය වීමෙන් ඔහු නියම කළ දඬුවම තමා ම විඳ ගනී.

''ගොපල්ලා - (තිගැස්සුණු නෙත් ඇති ව)

මේ මොන දෙයක් ගැන ද
ඔබ මට කියන්න පොලඹවන්නේ ...?
වහ ගනින් කට, මොනව ද මේ නුඹ කියන්නේ ...?
ඔහු දන්නෙ නැහැ ඔහු කියන්නේ මොනවා ද කියා
ඔහුට වැරදිලා ...''

පණිවිඩකරු, ගොපල්ලා වැනි අවශේෂ චරිත ක්‍රියා කරන ආකාරය අප ගේ ජීවිත අත්දැකීම් හා සම කරනු ලබයි.

ඊඩිපස් රජ නාට්‍යයේ විවිධ අවස්ථාවන්හි දී එහි ගායන වෘන්දය එහි පාත්‍රයන්ට හොඳ නරක උපදෙස් කියා දෙයි. ඒවා අපට ද ලබා දෙන මනා ඔවදන් ය.

''අත්වැල, ඔබ දෙදෙනා ඇයි මේ අඩ දබර කර ගන්නේ ?''

''මානයෙන් දූපෙමින්, ගුණවතුන් තළමින් පෙළමින්
බොරුවෙන් ජය ලබන එකෙකුට
ගලවන්නට හැකි වෙයි ද ඔහුට නිසි උරුමයෙන්
නරක වැලඳගෙන හොඳ පලවා හරින එකෙකුව
දෙවියනගෙ සැඩ හී සරින් රැකගත හැකි ද? නොහැකි ය''

ක්‍රියොන්ගේ චරිතය ගත් කල නිදොස් ඔහු වෙත ඊඩිපස් රජු විසින් එල්ල කරන ලද චෝදනා හමුවේ ඔහු බෙහෙවින් කම්පා වෙයි.

''ක්‍රියොන් - රට වැසියෙනි, ඊඩිපස් රජ මා කෙරෙහි අභූත
චෝදනා නැගූ මම ඇසුවෙමි.
දරිය නොහැකි ය එය මට
ඔහු සිතත් නම් මා ඔහුට
ද්‍රෝහී වූයේ යයි කියා වදනකින් පමණ වත්
ජීවත් වීමෙන් පලක් නැත මට ...''

''මරණ දඬුවම දෙවන ඔබ හඬට
මගෙ හඬ ද එක් කරමි එක හිතින්
පදනමක් නොමැති වූ චෝදනා කිරීමෙන්
නිදොස් කෙනෙකුට නිගරු ගෙන දීම යුතු නොවේ.
ප්‍රාණසම මිතුරකු ව පිටු දැක්ම
තම දිවිය පිටු දැක්ම හා සම ය''

ක්‍රියෝන් ගේ චරිත ලක්ෂණ අප ගේ ජීවන ගමනට මහත් සේ අත්දැකීම් ලබා දෙන බව නොරහසකි. ඉතා අවංක ව කටයුතු කරන්නකුට අභූත චෝදනා එල්ල වූ කල ක්‍රියා කරන්නේ ද මෙලෙස ම ය. අභාග්‍ය සම්පන්න වූ, නෙත් අඳ ඊඩිපස්ට සහනයක් ලබා දීමට ද ක්‍රියෝන් නොපසුබට වේ. දරුවන් පියා ගේ අබියසට යොමු කරමින්,

''මම කැටුව ආවෙමි උන් දෙදෙන
දනිමි මම නුඹ උනට කෙතරම් සෙනෙහෙවත් දැයි ...''

මෙමගින් ක්‍රියොන් සතුව පැවති කරුණා මහිමය පිළිබඳ දැක්මක් අප සතු කරයි.

මෙලෙස නාට්‍යයෙහි හැසිරෙන චරිත අප සමාජයේ අප ඇසුරු කරන්නන් සේ අපට සමීප වෙයි. එම චරිත හා සිදුවීම් සැමෙකක් ම අභව්‍ය ලෙස නොපෙනේ. කිසියම් හේතුවක් නිසා ඊළඟ ඵලය හටගත් බව අපට ඒත්තු යයි. කිසියම් සිදුවීමකට මුහුණ දෙන මිනිසුන් ක්‍රියා කරන ආකාරය මෙලෙස යයි දකින්නට ''ඊඩිපස් රජ'' පෙළ ගොඩනංවා ඇති ආකාරය ප්‍රශංසනීය ය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

''ඊඩිපස් රජ'' නාට්‍ය පෙළෙන් මතු කරගත හැකි ජීවන දෘෂ්ටිය විශ්ලේෂණය කරන්න.

නිපුණතාව 5.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ විවිධ නිර්මාණ රසාස්වාදයට හා විචාරයට ලක් කරමින් ජීවිත අත්දැකීම් පෝෂණය කරයි.

නිපුණතා මට්ටම 5.3 : නාට්‍යකෘති පරිශීලනයෙන් නව ජීවන දෘෂ්ටියක් ඇති කර ගනියි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- කුවේණි නාට්‍යයේ මූලික දෘෂ්ටිය ප්‍රකාශ කරයි.
- ස්ත්‍රීත්වය දෙස සානුකම්පිත ව බලයි.
- කාන්තාව සදාතනව ම අසාධාරණයට ලක් වන්නී දැයි ප්‍රශ්න කරයි.
- මෙම නාට්‍යයෙන් විමර්ශනය කිරීමට අදහස් කරන ස්ත්‍රී චරිතය හා මාතෘත්වය පිළිබඳ ව සාකච්ඡා කරයි.

ක්‍රියාකාරකම 5.3.2 : කුවේණි නාට්‍යයෙන් මතු වන ජීවන දෘෂ්ටිය විමසීම.

ගුණාත්මක යෙදැවුම් : කුවේණි නාට්‍ය පෙළ

ඉගනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය: පෙළ අධ්‍යයනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පහත සඳහන් කරුණු ද ආශ්‍රය කර ගනිමින් කුවේණි නාට්‍යයෙන් ඉස්මතු වන ජීවන දෘෂ්ටිය පිළිබඳ ව සිසුන් හා සාකච්ඡාවක් මෙහෙයවන්න.
- නාට්‍යයේ පෙළ රචකයා වන හෙන්රි ජයසේන විසින් සිය පෙරවදනේ සඳහන් කරනු ලැබ ඇති ''කුවේණිය මා දකින්නේ මෙලොව සදාතන ගැහැනිය ලෙස ය.'' යන පාඨයේ ගැබ් ව ඇති අර්ථය විග්‍රහ කිරීම.
- 5.1.2 පාඩම යටතේ දී ඇති කථා වස්තු පිළිබඳ ව යළිත් අවධානය යොමු කරමින් එම කථා වස්තුවල කුවේණිය හා සම්බන්ධ සිද්ධිය විස්තර කොට ඇති ආකාරය හා මූලාශ්‍රය සපයන්නන් එහි දී බලා ඇති දෘෂ්ටි කෝණය සාකච්ඡා කිරීම. (කුවේණිය යකිනියක ලෙසත්, ඇය මිනිසුන් මරා කන, සැමියාට හා පසු ව ආ අග බිසවට වෛර කරන, නිතර ඔවුන් බියපත් කරන, හඬන, වැලපෙන, හැවිලි හවන ගැහැණියක ලෙසත් දැක්වීමට බොහෝ මූලාශ්‍රය උත්සාහ කර ඇති ආකාරය සාකච්ඡා කරන්න.)
- එම සංසිද්ධීන් නාට්‍ය රචකයා ගේ ඇසින් බැලීමේ දී සිදු වී ඇති වෙනස්කම් කථා වස්තුව හා නාට්‍ය පෙළ ඇසුරින් සංසන්දනාත්මක ව සාකච්ඡා කිරීම.

  (උදා - කුවේණිය යනු ශිෂ්ට සම්මත හෙළ රැජිනක බව, ඇය මිනී මරන, මස් බුදින යකිනියක නොවන දයාර්ද්‍ර හදවතක් ඇති මවක බව, විජය කුවේණිය ගෙන් වෙන් වීමේ දී එසේ වූයේ රාජ්‍යත්වය පිළිබඳ ප්‍රශ්නයක් නිසා බව, කුවේණි විජයට ශාප නොකළ බව, ඇය සසර සැරිසරමින් අහිමි වූ ආදරය පතන බව ආදි වශයෙන් පූර්ව කථා වස්තුව දෙස සාධාරණ දෘෂ්ටි කෝණයකින් බැලීමට පෙළ රචකයා උත්සාහ කර ඇති ආකාරය විමසුමට ලක් කරන්න.)
- විජය රජු ගේ චරිත ලක්ෂණ, දේව නීතිය අබිබවා යන රාජ නීතිය, එමඟින් උල්ලංඝනය වන කාන්තා අයිතිවාසිකම්, සමාජය හමුවේ ගැහැනිය සදාතනව ම අසාධාරණයට ලක්වන බව මාතෘත්ව සංකල්පය හා එය කුවේණිගෙන් ඉස්මතු වන ආකාරය, තථ්‍ය ප්‍රේමය භවාන්තය තෙක් අඛණ්ඩ ව සැරිසරන ආකාරය ආදි කරුණු පැහැදිලි කිරීම.

  (උදාහරණ : ''සෝර නද කර, බියට පත් කර මහද සියුමැලි කවුද ආවේ...'' ප්‍රකාශවලින් සහ විජය ගේ කෝපාවිෂ්ට බස්වලින් මැවෙන විජය ගේ චරිතය, රාජ්‍යත්වයට පත් වීමට නම් රජ කුමරියක සරණ පාවා ගත යුතු බවට වන බමුණු ප්‍රකාශය.

  "ඇය යි දුක්පීඩා විඳින්නේ - ඇයයි වද හිංසා විඳින්නේ

  ඇය යි අවමානය ලබන්නේ - ඇයයි යකිනිය නම් ලබන්නේ"වැනි ප්‍රකාශවලින්

ගැහැනිය සමාජ අසාධාරණයට ලක් වන ආකාරය, දරුවන් ගේ ප්‍රකාශ හා ගායනා මඟින් මතුවන කුවේණි හා මාතෘත්වය, කුවේණි අවුරුදු දෙදහස් පන්සියයක් කල් සංසාරයේ සැරිසරමින් ආදරය සෙවීම ආදි කරුණු සාකච්ඡා කරන්න.

- ඒ ඒ චරිතවලින් ලබා ගත හැකි ආදර්ශ විස්තර කිරීම.

  (උදා: කුවේණි පතිදහම ගරු කරන, සැමියා ගේ අභිවෘද්ධිය ප්‍රාර්ථනා කරන (වෙන් වන අවස්ථාව) සුවච පතිනියක සහ දරුවන් වෙනුවෙන් කැප වූ (පෝෂණය කිරීම, රැකවරණ සැලසීම, උණුසුම ලබා දීම, කතාන්දර කීම) මවක ආදි වශයෙන් සියලු චරිත අධ්‍යයනය කරමින් ලබා ගත හැකි ආදර්ශ විමසුමට ලක් කරන්න.

- සදාතනික ව ම ගැහැනිය මුහුණ දෙන අසාධාරණය දෙස අනුකම්පා සහගත ව බැලිය යුතු බවත්, පවුලක අඹුසැමියන් අතර ඇතිවන අර්බුද නිසා දරුවන් මානසික පීඩාවලට හා විවිධ කම්කටොලුවලට මුහුණ දෙන බවත්, එම මානසික කඩා වැටීම සමාජ ව්‍යසනයක් බවට පත්වන ආකාරයත් එනිසා පවුල් ජීවිතයේ දී අන්‍යෝන්‍ය විශ්වාසය හා ආදරය අත්‍යවශ්‍ය ම වන බවත් සාකච්ඡා කිරීම.

- පොළොවෙහි වැසී තිබූ බීජ පසු කලක පැළ වෙන අයුරින් අතීතය කවරදා හෝ යළිත් අප ඉදිරිපිට මැවෙන බව පූරක විසින් විටින් විට ඉදිරිපත් කිරීම.

  - • අන්ධකාරය සංකේතයක් ලෙස භාවිත කිරීම.
  - • දඩයක්කාරයා මඟින් හා ගායක පිරිස මඟින් විවිධ අවස්ථාවල සිදු කරනු ලබන අතීතාවලෝකනය.
  - • දඩයක්කරු ගේ ක්‍රමික පරිවර්තනය.
  - • ජීවහත්ථ සහ දිසාලා විසින් වරින් වර මවනු ලබන මාතෘත්වයේ උත්තරීතර බව.
  - • උසාවියේ දී නීතිඥයන් ගේ හැසිරීම් රටාව හා විනිශ්චයකරු ගේ සාධාරණ බව, නීතිය හා හෘදය සාක්ෂ්‍යය අතර දෝලනය වන කුවේණි ගේ අපේක්ෂාව.
  - • විනිශ්චයකරු හා කුවේණි අතර සිදුවන සරල සංවාදවල ගැඹුර ආදි කරුණු පිළිබඳ ව පෙළින් නිදසුන් ගනිමින් විමසීම.

- දාර්ශනික හා උපහාසාත්මක ප්‍රකාශ.

  (''ලෝක ඉතිහාසයේ මිනිසුන් ගෙන් ගල් මුගුරු පාර කාලා මැරුණු මුල් ම පච්කාරිය තමා කුවේණි''

  ''ගල් මුගුරු ගහල මරා දාන එක වැදගත් සිද්ධියක් ද?''

  ''තාත්තව එහෙමත් කවුරු වත් මැරුව ද?

  ''විජය කුමාරයා අවුරුදු හැත්තෑවක් ආයුෂ වළඳලා මළා...''

  ''කුවේණිගෙ සාපයෙන් මේ රට ගිනි අරගෙන දැවෙන්න ඇති'' අපි මිනිස්සු වෙන්නෙ නෑ'' ආදි වශයෙන් ඇති ප්‍රකාශ අධ්‍යයනය කරමින් එහි යටි පෙළ අවබෝධ කර ගන්න.)

- කුවේණි ලොව පුරා සැරිසරන බවට ඇති සාධක පෙළ තුළින් ඉස්මතු කර ගනිමින් ''ලොව පුරා සැරිසරන්නේ විජයලා සහ කුවේණිලා ය. ඔවුන් සොයා යන්නේ ප්‍රේමය යි'' යන මතය සනාථ කළ හැකි දැයි බලන්න.)

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

කුවේණි අස්නෙහි දක්නට ලැබෙන කුවේණිය, ඉතිහාසය විසින් පවසන ලද ආකාරයට නාට්‍ය පෙළ දකින කුවේණිය හා නාට්‍ය රචකයා ගේ දෘෂ්ටිය යටතේ නිර්මාණය වන කුවේණිය සංසන්දනාත්මක ව විමසන්න.

නිපුණතාව 5.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ විවිධ නිර්මාණ රසාස්වාදයට හා විචාරයට ලක් කරමින් ජීවිත අත්දැකීම් පෝෂණය කරයි.

නිපුණතා මට්ටම 5.3 : නාට්‍ය කෘති පරිශීලනයෙන් නව ජීවන දෘෂ්ටියක් ඇති කරගනියි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- රූකඩ ගෙදර නාට්‍යයෙන් හෙළි වන ජීවන දෘෂ්ටිය ප්‍රකාශ කරයි.
- මෙහි ගැටුම මඟින් පොදු මනුෂ්‍යත්වයට උරුම වූ ගැටලුවක් සාකච්ඡා කරන බව පැහැදිලි කරයි.
- නුවුරා විවාහ බන්ධනය අමතක කොට ආත්ම විමුක්තිය සොයා යන බව පැහැදිලි කරයි.
- ටෝවල්ඩ් පුරුෂාධිපත්‍යය, ආර්ථික ප්‍රතිලාභ හා සමාජ සම්ප්‍රදාය හිස මුදුනෙන් පිළිගන්නා බව විස්තර කරයි.
- ක්‍රොග්ස්ටඩ්, ලින්ඩේ මිය, දොස්තර රන්ක් වැනි සෙසු චරිතවල ආකල්ප හා දැකීම පැහැදිලි කරයි.
- රූකඩ ගෙදර ජීවන දෘෂ්ටිය විශ්ව සාධාරණ බව ප්‍රකාශ කරයි.
- එහි සියලු මිනිස් සබඳතා සමාජ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් බවත් ඉන් හුදකලා කොට ගත නොහැකි බවත් පැහැදිලි කරයි.

ක්‍රියාකාරකම 5.3.3 : රූකඩ ගෙදර නාට්‍යයෙන් මතු වන ජීවන දෘෂ්ටිය විමසීම.

ගුණාත්මක යෙදවුම් : රූකඩ ගෙදර පරිවර්තන කීපයක් සහ විචාර ග්‍රන්ථ

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : පෙළ අධ්‍යයනය කිරීම

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සෑම කලා නිර්මාණයක් මඟින් ම ජීවිතය පිළිබඳ යම් අවබෝධයක් අපට ලැබේ. මෙම නාට්‍යය නිර්මාණය කළ ඉබ්සන් සමාජයට පණිවිඩයක් ලබා දෙයි. එය ඔහු ගේ ජීවන දෘෂ්ටිය යි. ඉබ්සන් අප හමුවේ ගැටලුවක් ඉදිරිපත් කරයි. රූකඩ ගෙදර ජීවන දෘෂ්ටිය ඔහු අප හමුවේ නිර්මාණය කරනුයේ නූතන මිනිසා මුහුණ දෙන මනෝවිද්‍යාත්මක ගැටලු හා සංකීර්ණතා ද සියුම් ලෙස සැලකිල්ලට ගනිමින් ය. නුවුරා, ටෝවල්ඩ් වැන්නෝ මානසික ව මෙම ගැටලුවේ ගොදුරු බවට පත් වෙති. ණය ගැනීම හා හොර අස්සන් ගැසීම වැනි ක්‍රියා මඟින් ක්ෂණිකව මතු වුව ද මෙම ගැටලුවේ පසුබිමට අතීතයක් ඇත. විවාහයෙන් අට වසරකට පසු මෙය උපරිමයට පත් වනුයේ එදා යුරෝපයේ සමාජ ක්‍රියාවලියේ විෂම සම්ප්‍රදාය හා බලවේගවල ප්‍රතිඵලයක් ලෙස ය. මේ අනුව රූකඩ ගෙදර නාට්‍යයෙන් හෙළි වන ජීවන දෘෂ්ටිය පුළුල් ය.
- රූකඩ ගෙදර නාට්‍යයේ එන ගැටුම හුදු ස්ත්‍රී විමුක්ති ප්‍රචාරක දෘෂ්ටියකින් දැකිය නොහැකි ය. ස්ත්‍රී විමුක්තිය ද පොදු මනුෂ්‍යත්වයට ම බද්ධ වූ එකකි. ඒ නිසා නුවුරා ටෝවල්ඩ් මඟින් දුටුවේ ''නුවුරා නොමැති ව නුවුරා සමඟ'' යන ගමනක් ය. ඒ නිසා මෙමඟින් වර්තමාන සමාජයේ ජීවත්වන ඕනෑ ම අයකු ගේ මානව අනන්‍යතාව පිළිබඳ ජීවන දෘෂ්ටියක් පිළිබිඹු කෙරේ.
- නුවුරා කුටුම්බය තුළ තමා ගේ භූමිකාව කුමක් දැයි ගැඹුරින් ප්‍රශ්න කරයි. වර්තමාන සමාජයේ ජීවත් වන අපට ද මෙයින් පැහැදිලි පණිවිඩයක් ඇත. එනම්, සාම්ප්‍රදායික හා යල් පිනූ අදහස් නිසා අප අප ගේ භූමිකා දෙස ගැඹුරින් සිතා නොබලන තත්ත්වය යි. උසස් අධ්‍යාපනයට පිවිසෙන සිසු - සිසුවියන් ලෙස අප ගේ භූමිකාව තුළ ස්වාධීන ව හා ස්ව වගකීමෙන් කටයුතු කිරීමට අපට අවකාශය තිබේ ද යන පණිවිඩය යි.

- ටෝවල්ඩ් අද සමාජය තුළත් දැකිය හැකි පුරුෂාධිපත්‍යයට කදිම නිදසුනකි. එසේ ම ඔහු ආර්ථික ලාභ ප්‍රයෝජන හා සමාජ සම්ප්‍රදායයේ හමුවේ වහලකු ලෙස ක්‍රියා කරයි. වර්තමාන සමාජය තුළ මෙම තත්ත්ව නිසා සිදු වන විවිධ ව්‍යසන (මිනීමැරීම්, සොරකම්, ප්‍රචණ්ඩ ක්‍රියා, දූෂණ, වංචා) රූකඩ ගෙදර නාට්‍යයෙන් පිළිබිඹු වන බව ද අවධානයට යොමු කළ හැකි ය.
- ක්‍රොග්ස්ටඩ්, ලින්ඩේ මිය වැනි චරිත ඔස්සේ වර්තමාන සමාජය තුළ දැකිය හැකි ආර්ථික ගැටලු, කඩා හැළෙන ප්‍රේම සම්බන්ධතා, කලකිරීම් අවධානයට යොමු කරනු වටී. එසේ ම ඔවුන් අභියෝගවලට සාර්ථක ව මුහුණ දෙන ආකාරය ද විමසනු වටී.
- දොස්තර රන්ක් ගේ චරිත ස්වභාව නිරීක්ෂණය කරන විට ඔහුට නොවැළැක්විය හැකි තත්ත්ව් නිසා ඔහු පත්වන ඛේදය ද එක්තරා ජීවිත පාඩමක් සේ ඉදිරිපත් කළ හැකි ය.
- රූකඩ ගෙදර වැනි යුරෝපීය නාට්‍යවල ජීවන දෘෂ්ටිය ආසියානු කලාපයේ ජීවත් වන අප වැනි රටවල ප්‍රේක්ෂක ජනතාවට ද ආගන්තුක නොවන බව අපට අවබෝධ වේ.
- රූකඩ ගෙදර නාට්‍යය එදා නෝර්විජියානු සමාජයේ ම ජීවත් වූ ලවුරා කියලෙෂ් නම් කාන්තාවක ගේ සත්‍ය කතාවක් ඇසුරෙන් නිර්මාණය වූ බව පැවසේ. එහෙයින් එය ජීවිතවලට ලබා දෙන ආලෝකය ප්‍රබල ය. එහෙත් ඉබ්සන් මෙය හුදෙක් පෞද්ගලික කතාවක් නොව විෂම වූ සමාජයක විෂම ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය කිරීම එහි විශේෂ ලක්ෂණය යි. ඉබ්සන්ගේ දෘෂ්ටිය හුදු පෞද්ගලික දෘෂ්ටියක් නොවන සමාජ දෘෂ්ටියකි.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

මෙහි එන ප්‍රධාන චරිත ඇතුළු සෙසු චරිත ජීවිතය දෙස බලන ආකාරය විග්‍රහ කරමින් සඟරාවකට ලිපියක් සකස් කරන්න.

අතිරේක කියවීම :

මෙහි පරිවර්තන කීපයක් ඇත.

- රූකඩ ගෙදර - විජිත ගුණරත්න
- සෙල්ලම් ගෙදර- අමරදාස වීරසිංහ සහ ගණනාථ ඔබේසේකර
- බෝනික්කි ගෙදර - සුනිල් විජේසිරිවර්ධන
- බෝනික්කිගෙ සෙල්ලම් ගෙදර - ඊ. එම්. ඩී. උපාලි

විචාර

- ආරියවංශ රණවීර - යුග තුනක ඉබ්සන්
- ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන - කතිකාවතක සටහන්

නිපුණතාව 5.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ විවිධ නිර්මාණ රසාස්වාදයට හා විචාරයට ලක් කරමින් ජීවිත අත්දැකීම් පෝෂණය කරයි.

නිපුණතා මට්ටම 5.4 : නාට්‍ය විචාරයේ දී සැලකිය යුතු කරුණු අධ්‍යයනය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 05

ඉගැනුම් පල :
- නාට්‍ය විචාරය යනු කුමක් දැයි විමසීමට ලක් කරයි.
- විචාරයක දී සලකා බැලිය යුතු ධනාත්මක හා ඍණාත්මක ලක්ෂණ ගවේෂණය කරයි.
- නාට්‍යයක් නැරඹීමේ දී එම ලක්ෂණ කොතෙක් දුරට භාවිත කළ හැකි දැයි අධ්‍යයනය කරයි.
- නරඹන ලද නාට්‍යයක් ඇසුරින් විචාර හැකියාව ප්‍රගුණ කරයි.
- විචාර පූර්වක රස විඳින්නකු බවට පත් වෙයි.
- නාට්‍ය හා රංගකලාව විෂය ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා දායක වෙයි.

ක්‍රියාකාරකම 5.4.1 : නරඹන ලද නාට්‍යයක් ඇසුරින් නාට්‍ය විචාරය ප්‍රගුණ කරමු.

ගුණාත්මක යෙදැවුම් :
- නාට්‍ය විචාරය සම්බන්ධ පොත්පත් හා ලිපි ලේඛන
- සාර්ථක නාට්‍ය පෙළ කීපයක්
- සාර්ථක නාට්‍ය දර්ශන ඇතුළත් සංයුක්ත තැටි කීපයක්
- නාට්‍යයක් විචාරය කරන අවස්ථාවක් දැක්වෙන විචාරකයකු දැක්වෙන ශ්‍රව්‍ය දෘශ්‍ය පටයක් (ලබා ගත හැකි නම් පමණක්)
- රූකඩ ගෙදර පරිවර්තන කීපයක් සහ විචාර ග්‍රන්ථ

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- විචාරය යනු කුමක් ද යන්න පැහැදිලි කිරීම.

යමක් විශ්ලේෂණය කිරීමේ හැකියාව පුද්ගලයකුට තිබිය යුතු කුසලතාවකි. පුද්ගලයෙක් කුඩා කාලයේ සිට ලබන අත්දැකීම්වලින්, අනුකරණයෙන් මෙන් ම තමන් ලබන අධ්‍යාපනයෙන් ද මෙම කුසලතාව වර්ධනය කර ගනී. මේ සඳහා පුද්ගලයකුට පංචේන්ද්‍රියන් උපකාර වේ. අසන දකින දේ ඇසුරෙන් යම් දෙයක සමස්තය කොටස් කර දැක්වීමේ හැකියාව විශ්ලේෂණයයි. මෙම විශ්ලේෂණය මඟින් අදහස් දැක්වීමේ හැකියාව මිනිසා සතු ය. සෞන්දර්ය අධ්‍යාපනයේ දී මෙම විශ්ලේෂණ හැකියාව වඩාත් වැදගත් වන්නේ යම් නිර්මාණයක් රස විඳීමට හා ඉන් අනතුරු ව ඒ පිළිබඳ විචාරයක් කිරීම සඳහා ය.

නාට්‍යයක් රස විඳින ප්‍රේක්ෂකයා නාට්‍යයේ, ආංගික, වාචික, සාත්ත්වික හා ආහාර්ය වශයෙන් අභිනය හඳුනා ගනියි. නාට්‍යයේ වස්තුව, එහි රංග ශෛලිය, තේමාව, ගැටුම, නාට්‍යෝචිත අවස්ථා ආදි අංග කෙතෙක් දුරට ගැළපේ ද යන්න විශ්ලේෂණාත්මක ව විග්‍රහ කරයි. එම විග්‍රහය විචාරය ලෙස හැඳින්විය හැකි ය. එනම් උක්ත කරුණු පදනම් කරගෙන නාට්‍යයේ සාධනීය ලක්ෂණ හා අඩුපාඩු පිළිබඳ අදහස් දැක්වීම විචාරය ලෙස හැඳින්විය හැකි ය.

නාට්‍යයක් විචාරයේ දී සලකා බැලිය යුතු කරුණු

නාට්‍යයක් නැරඹීමේ දී නාට්‍ය නරඹන ප්‍රේක්ෂකයා බොහෝ විට විචාරකයකු බවට පත් වේ. ඔහු/ඇය නාට්‍ය නරඹද්දීත්, නාට්‍ය නරඹා අවසානයේ දීත් නාට්‍යයේ බොහෝ අංග පිළිබඳ ගුණදොස් විවේචනයක යෙදෙයි. නාට්‍යයේ සන්දර්භය, රූපණය, ආනුෂංගික අංග ආදිය නාට්‍යකරුවා කෙතෙක් දුරට සාර්ථක ව ප්‍රේක්ෂකයා හමුවට ගෙන එන්නේ ද යන්න විචාරයේ දී සැලකිය යුතු ය. නාට්‍ය සන්දර්භය පිළිබඳ විචාරාත්මක ව විමසීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.

1. නාට්‍යයට පදනම් කරගත් නාට්‍ය වස්තුව කුමක් ද?
2. නාට්‍ය පෙළට අදාළ ව යොදාගත් රංග ශෛලිය කෙතරම් දුරට සාර්ථක ද?
3. නාට්‍යයේ තේමාව හෝ තේමා හෝ කවරේ ද, එම තේමා සමාජයේ පැවැත්ම උදෙසා කෙබඳු හරයක් ලබා දෙයි ද යන්න.
4. නාට්‍යයේ යටිපෙළ උද්දීපනය කිරීම සඳහා පෙළ රචකයා භාෂාව කෙසේ භාවිත කොට ඇත් ද යන්න විමසීම.
5. නාට්‍යයේ ගැටුම/ගැටුම් අවස්ථා කෙසේ නිර්මාණය වී ඇද්ද යන්න. එය නාට්‍යයේ පැවැත්ම හා නිර්මාණාත්මක බව කෙරේ කෙබඳු දායකත්වයක් දක්වා ඇද්ද යන්න විමසීම.
6. නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කිරීමේ දී නාට්‍ය නිෂ්පාදකයා නාට්‍ය පෙළෙන් කියවෙන කතා වස්තුවට හා නාට්‍ය තේමාවට කෙතෙක් දුරට අනුගත ව නාට්‍යෝචිත අවස්ථා, නිර්මාණය කොට ඇද්දූ යි විමසීම.

නාට්‍යයක් වේදිකාගත වූ පසු බෙහෙවින් විචාරයට ලක්වන කරුණ වන්නේ රූපණය යි. නාට්‍යයේ සාර්ථකත්වය උදෙසා නළුනිළියන්ගේ කාර්යභාරය ප්‍රධාන වශයෙන් බලපෑම එයට හේතු වේ.

රූපණය පිළිබඳ විචාරයේ දී පහත සඳහන් කරුණු පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් වීම වැදගත් ය.

1. නාට්‍යයේ භූමිකා රංගනයේ යෙදෙන නළු-නිළියන් නාට්‍ය ඉදිරිපත් කරන නට්‍ය රීතියේ අවශ්‍යතාවට අනුව ඒ ඒ චරිතවල බාහිර හා අභ්‍යන්තර චරිත ලක්ෂණ නිරූපණය වන අයුරින් සමාරෝපය වූයේ ද යන්න විමසීම.

2. ඒ ඒ චරිතවල මනෝභාවයන් නළු-නිළියන් ගේ රංගනයෙන් කෙතෙක් දුරට ප්‍රකට වූවා ද යන්න විමසීම. එමගින් එම චරිතයට නළුවා හෝ නිළිය හෝ සාධාරණයක් ඉටු කොට ඇද්දැයි විමසීම හා නාට්‍යයේ කථා වස්තුව රංග ගත වීමේ දී ඔවුන් ගෙන් සිදු වූ මෙහෙවර නාට්‍යයේ සාර්ථකත්වයට කෙතෙක් දුරට ඉවහල් වූයේ ද යන්න සොයා බැලීම.

3. රූපණය මඟින් මතු කරන නාට්‍ය රසය කෙබඳු ද යන්න විමසීම. එනම් නාට්‍යයේ රසය උද්දීපනය කිරීම සඳහා රූපණය කෙතරම් ඉවහල් වී ද යන්න විමසීම.

4. නාට්‍ය විචාරයේ දී විචාරකයා ගේ සැලකිල්ලට බඳුන් වන තවත් එක් ප්‍රධාන කරුණක් ලෙස ''සතර අභිනය'' දක්විය හැකි ය. නාට්‍යයක් නරඹන විචාරකයා, නාට්‍යකරුවා විසින් සිය නිර්මාණයට අභිනය සතර කෙසේ යොදා ගෙන තිබුණේ ද යන්න විචාරයට ලක් කරනු ලබයි. ආංගික, වාචික, සාත්ත්වික හා ආහාර්ය අභිනය නාට්‍යයේ සාධනීය ලක්ෂණ කෙරේ කෙසේ බලපා ඇද්ද යන්න විමසිය යුතු ය.

   නළු-නිළියන් සිය සිරුරේ අඟපසඟ මෙහෙයවා තමන්ට ලැබී ඇති චරිතයට ගැළපෙන අයුරින් රඟපාන්නේ ද යන්න විචාරකයා ගේ නෙතට අසුවිය යුතු කරුණකි. එහි දී වාචික හා සාත්ත්වික අභිනය ඒ ඒ චරිතයේ භාවික ගුණය ප්‍රකට කිරීම සඳහා කෙතරම් දුරට සාධනීය ලෙස යොදා ගෙන ඇත් ද යන්න විචාරයට හසු වන ප්‍රබල කරුණක් වේ.

5. නාට්‍යයක් නැරඹීමේ දී විචාරයට ලක් විය යුතු තවත් විශේෂ අංගයක් ලෙස දක්විය හැක්කේ නාට්‍යයට යොදා ගන්නා ලද ආනුෂංගික අංග ය. අංග රචනය, වේශභූෂණ, රංගාලෝකය, රංග භූමි අලංකරණය, නාට්‍ය සංගීතය, අංග රචනය ආදි අංග කෙතෙක් දුරට නාට්‍යයේ රංග ශෛලියට උචිත ද නැද්ද යන්න විචාරයේ දී සොයා බැලීම කළ යුතු ය.

6. නාට්‍ය විචාරයේ දී අංග රචනය කෙතෙක් දුරට නාට්‍යයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා භාවිත වී ඇද්ද යන්න විචාරයට ලක් වන කරුණකි. නාට්‍යයේ නළු-නිළියන් සඳහා භාවිත කරන අංග රචනා නාට්‍ය පෙළෙහි දක්වෙන රංග ශෛලිය හා ගැළපීම සිදුවිය යුතු ය. යොදා ගන්නා ලද අංග රචනා නාට්‍යයේ රංග ශෛලියට නොගැළපුණ හොත් එය නාට්‍යයේ ගුණාත්මක බව පිරිහීමට හේතු වන කරුණක් වේ.

උදාහරණයක් ලෙස චරිතයේ වයසට, බාහිර පෙනුමට ගැළපෙන අයුරින් අංග රචනා වීම සිදු විය යුතු ය. එපමණක් නොව, චරිතවල භාවයන් ප්‍රකට කිරීමට පහසු වන පරිදි අංග රචනා සිදු කළ යුතු ය. නැතහොත් නාට්‍යයේ ගුණාත්මක බව පිරිහීමට එය බලපානු ඇත.

නාට්‍යයක් නැරඹීමේ දී ප්‍රේක්ෂකයා නාට්‍යයේ වේෂභූෂණ විචාරයට ලක් කරයි. වේශභූෂණ භාවිතයේ දී එනම්, ඇඳුම් හා පැලැඳුම් භාවිතයේ දී නාට්‍යකරුවා විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

ඒ ඒ චරිතවල පෞරුෂයට ගැළපෙන අයුරින් මෙන් ම චරිත ස්වභාවය ඉස්මතු වන අයුරින් ද, නාට්‍යයේ ශෛලියට, ආකෘතියට, නාට්‍යය වස්තුවෙන් දක්වෙන කාලයට, යුගයට හා දේශයට ගැළපෙන අයුරින් වේශභූෂණ නිර්මාණය විය යුතු ය. එසේ ම වේශභූෂණ හිතුමතයේ නිර්මාණය නොවිය යුතු ය. ඒවා නළුවා ගේ ශරීර ස්වභාවයට ගැළපෙන අයුරින් නිර්මාණය වී තිබිය යුතු අතර එම නිර්මාණ නාට්‍යයේ රංගාලෝකය හා කෙතෙක් දුරට උචිත වේ ද යන්න විමසා බැලිය යුතු ය. ඇතැම් අවස්ථාවල දී නළුවන් හා නිළියන් භාවිත කරන වේශභූෂණ වේදිකාවේ භාවිත වන ආලෝකය හමුවේ ප්‍රේක්ෂකයා ගේ දෙනෙතට අපහසුතා ගෙන දෙන පරිදි අනවශ්‍ය දීප්තියක් නිකුත් කරන අවස්ථා දක්නට ඇත. එසේ ම ඒ ඒ චරිතවලට නොගැළපෙන අවස්ථා දක්නට ඇත. එවිට නාට්‍ය නරඹන ප්‍රේක්ෂකයා ගේ දැඩි විවේචනයට ලක්වේ. නාට්‍ය විචාරයේ දී මේ පිළිබඳ ව දැඩි ලෙස සැලකිලිමත් විය යුතු ය.

නාට්‍ය විචාරයේ දී ආනුෂංගික අංග අතර රංගාලෝකය ද ප්‍රබල ලෙස විවේචනයට ලක්වන කරුණකි. රංගාලෝකය භාවිත කරන්නේ නාට්‍යයේ සිද්ධි හා අවස්ථා තීව්‍ර කිරීම පිණිස වුව ද ඇතැම් අවස්ථාවල දී අඳුර හා ආලෝකය පිළිබඳ අවධානයෙන් තොර ව රංගාලෝකය භාවිත කරන අවස්ථා දක්නට ඇත. එවිට එය නාට්‍යයේ ගුණාත්මක භාවය පිරිහීම කෙරේ ප්‍රබල ලෙස බලපායි. රංගාලෝකය මඟින් රඟපෑමේ සීමා දැක්වීම, කාලය නිර්ණය කිරීම, විවිධ අවස්ථාවන් මවා පෑම ආදිය නාට්‍යකරුවන් විසින් කරනු ලැබේ. එය නාට්‍යයේ සමස්ත සාර්ථකත්වය කෙරේ ප්‍රබල ලෙස බලපායි. මෙහි දී ආලෝකකරණ ශිල්පියා මනා පරිචයකින් හා එළඹ සිටි සිහියෙන් යුතු ව ආලෝකය පාලනය කිරීම්, තීව්‍ර කිරීම්, අඳුරු කිරීම් ආදි කටයුතු කළ යුතු ය. එසේ නොවුණහොත් ප්‍රබල ලෙස නාට්‍යයේ රංග වින්‍යාසයට හානි සිදුවිය හැකි ය. විචාරකයා එය දකිනුයේ නාට්‍යයේ සාර්ථකත්වයට කරන ලද හානියක් ලෙස ය.

නාට්‍යයක රංග භූමි අලංකරණය ද විචාරක නෙතකට හසුවන ප්‍රබල අංගයකි.

රංග භූමි අලංකරණය සඳහා වර්තමානයේ බොහෝ දෑ භාවිතයට ගැනේ. එනම් පසුතල නිර්මාණ, විවිධ තිර භාවිතය, චිත්‍ර වස්ත්‍ර, රංග උපකරණ ආදි දෑ ඒ සඳහා යොදා ගනී. මේවා භාවිතයට ගැනීමේ දී පහත දක්වෙන කරුණු පිළිබඳ ව අවධානය යොමු කළ යුතු ය.

- නාට්‍යයේ ශෛලිය
- රංග භූමියේ ප්‍රමාණය (ඉඩකඩ)
- රංග භූමියේ ඇති පහසුකම්
- උපකරණවල ප්‍රමාණයන්
- ඒවායේ වර්ණ හා ගැළපීම්
- නාට්‍යයට ගැළපෙන හා පහසු ලෙස භාවිත කළ හැකි බව

උක්ත කරුණු පිළිබඳ නොසැලකීමෙන් නාට්‍ය මෙන් ම නිෂ්පාදකවරයා ද ප්‍රේක්ෂකයා ගේ විචාරයට ලක් වේ.

රංග රචනය හෙවත් රංග වින්‍යාසය ද විචාරයට ලක්වන අවස්ථාවකි.

- ප්‍රේක්ෂකයා හා ප්‍රේක්ෂාව අතර මනා සබැඳියාවක් ඇති කරන්නේ නාට්‍යයේ ආහාර්ය අභිනය යි. එබැවින් ප්‍රේක්ෂකයා ගේ ඇසට මනා ප්‍රේක්ෂාවක් ලබා දීම සඳහා රංග භූමියේ දෘශ්‍යමාන වන රූප රටා හා මෝස්තර නාට්‍යයේ ශෛලියට හා ආකෘතියට ගැළපෙන පරිදි සැකසිය යුතු

ය. එසේ නැතහොත් ප්‍රේක්ෂකයා විසින් නාට්‍යය ගුණාත්මක බවින් තොර එකක් යැයි ඍණාත්මක විචාරයකට ලක් කරනු ඇත.

නාට්‍ය නිර්මාණයේ සාධනීය ලක්ෂණ නරඹන ලද නාට්‍යයක් ඇසුරින් ඉදිරිපත් කිරීම.

- නාට්‍ය විචාරයේ දී සැලකිය යුතු උක්ත කරුණු ඇසුරින් සිසුන් විසින් නරඹන ලද නාට්‍යයක ඇති සාධනීය ලක්ෂණ හා ගුණාත්මක බවින් තොර ලක්ෂණ පිළිබඳ විමසීම.
- නරඹන ලද නාට්‍යයේ ඇති අඩුපාඩු හා සාධනීය ලක්ෂණ පෙන්වාදීම.
- අඩුපාඩු නිසා නාට්‍යයේ ගුණාත්මක භාවයට සිදු වූ හානි පිළිබඳ විමසීම.
- සාධනීය ලක්ෂණ නාට්‍යයේ ගුණාත්මක බවට හේතු වූ අයුරු දැක්වීම.
- ප්‍රසිද්ධ වේදිකා නාට්‍ය නැරඹීමේ පුරුද්ද සිසුන් තුළ ඇති කිරීමට ගුරුවරයා සිසුන් උනන්දු කරවීම කළ යුතු ය.
- එසේ නරඹන ලද නාට්‍ය පිළිබඳ අත්දැකීම් පන්තියේ සිසුන් කණ්ඩායම් කර විචාරයට ලක් කිරීමට ඉඩකඩ ලබා දිය යුතු ය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- විචාරය සම්බන්ධ ලියැවී ඇති පොතපත ඇසුරින් හා නරඹන ලද නාට්‍ය ඇසුරින් විචාර කලාවක් ගොඩනැඟීමට අවශ්‍ය කරුණු හා ධනාත්මක විචාර කලාවකට අවශ්‍ය නිදසුන් රැස් කරන්න.
- නාට්‍ය හා රංග කලාවේ උන්නතිය උදෙසා වන විචාර කලාවක් ඇති කිරීමට අවශ්‍ය සිද්ධාන්ත ගොඩනගන්න.

නිපුණතාව 5.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ විවිධ නිර්මාණ රසාස්වාදයට හා විචාරයට ලක් කරමින් ජීවිත අත්දැකීම් පෝෂණය කරයි.

නිපුණතා මට්ටම 5.5 : ධනාත්මක විචාර කලාවක් ගොඩ නගයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- ධනාත්මක විචාර කලාවක් ගොඩ නැඟීමට අවශ්‍ය කරුණු ගවේෂණය කිරීම සඳහා විවෘත ග්‍රන්ථ පරිශීලනය කරයි.
- යම් නිර්මාණයක වටිනාකම් හඳුනාගෙන ඒ පිළිබඳ විචාරයක් කිරීමට පෙලඹෙයි.
- කිසියම් නාට්‍ය නිර්මාණයක් විචාරය කිරීමට අවශ්‍ය සිද්ධාන්ත ගොඩනගයි.
- නාට්‍ය නිර්මාණ විචාරයට පෙලඹීම හේතුවෙන් තම ජීවිත අත්දැකීම් පුළුල් කරගනී.
- නාට්‍ය විචාරය සම්බන්ධ කුශලතා පිරිපුන් අයකු බවට පත් වෙයි.

ක්‍රියාකාරකම 5.5.1 : ධනාත්මක ව නාට්‍ය විචාරයට ලක් කිරීම.

ගුණාත්මක යෙදවුම් : නාට්‍ය විචාරය සඳහා අවශ්‍ය කරුණු ගවේෂණය කර ගැනීමට අවශ්‍ය පොත්, සඟරා හා ලිපි

උදා: - නාට්‍ය ප්‍රවේශය (සුචරිත ගම්ලත්)
- නාට්‍ය ප්‍රවේශය (රන්ජිත් ධර්මකීර්ති)
- යථාර්ථය හා නිර්මාණය (චන්ද්‍රසිරි පල්ලියගුරු)
- සොඳුරු ආඥාදායකයා හෙවත් නාට්‍ය නිෂ්පාදක (සුගතපාල ද සිල්වා)
- කල්පනා ලෝකය (එදිරිවීර සරච්චන්ද්‍ර)
- වෙස් මුහුණ ද සැබෑ මුහුණ ද (එදිරිවීර සරච්චන්ද්‍ර)

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : විවෘත ග්‍රන්ථ පරිශීලනය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- රසඥතාවක් සහිත පුද්ගලයකු බිහි වන්නේ නිර්මාණාත්මක සාහිත්‍යය පරිශීලනය කිරීමෙනි. කිසියම් නවකතාවක් හෝ නාට්‍යයක් හෝ හොඳ ද නරක ද යන්න විවේචනය කළ හැකි වන්නේ එම කෘති පරිශීලනයෙන් ලද අත්දැකීම් ඇසුරින් හා එවැනි වෙනත් නිර්මාණ සමඟ සංසන්දනය කිරීමෙනි. තමා ලත් රසඥතාව අන්‍යයන් හා බෙදා හදා ගැනීමේ හැකියාව ලැබෙන්නේ රස විඳින්නා ඇසූ පිරූ තැන් ඇති බහුශ්‍රැතයකු වූ විට ය.

  නාට්‍ය නිර්මාණ හෝ වේ වා වෙනත් ඕනෑ ම කලා නිර්මාණයක් හෝ වේ වා නිර්මාණ බහුතරයක් හඳුනාගත් අයකුට හෝ ඒවා පරිශීලනය කළ අයකුට එම නිර්මාණයන්හි හොඳ නරක පිළිබඳ අදහස් දැක්වීම වඩාත් පහසු වේ. එම අදහස් දක්වන ආකාරය අනුව ධනාත්මක ව හෝ සෘණාත්මක ව හෝ එම නිර්මාණයට බලපෑම් කළ හැකි ය.
- නාට්‍යයක හොඳ නරක ප්‍රකාශ කිරීමේ කලාව විචාර කලාව වන අතර එය නාට්‍ය නිර්මාණ පෝෂණයට හා නාට්‍ය රස වින්දනයට හේතු වන පරිදි සිදු කළ යුතු ය. නොඑසේ නම් එය නාට්‍ය කලාවේ ප්‍රගමනයට විශාල බාධාවක් වේ.
- නාට්‍යයක් විචාරය කරන විචාරකයා ගේ පර්යාවලෝකය හා දෘෂ්ටි පථය පුළුල් වීමෙන් ධනාත්මක විචාර කලාවක් ගොඩ නැගිය හැකි වේ.

ඒ සඳහා විචාරකයකු නිරන්තරයෙන් ම,

- නිර්මාණ රස වින්දනයේ යාවත්කාලීනයකු විය යුතු ය.
- විවිධ ශෛලියේ නාට්‍ය රස විඳින්නකු විය යුතු ය.
- විවිධ විචාර සිද්ධාන්ත අධ්‍යයනය කරන අයකු විය යුතු ය.
- බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තකු විය යුතු ය.
- නානාවිධ කෘති හඳුනා ගත යුතු ය.
- විවිධ නිර්මාණ සංසන්දනය කිරීමේ හැකියාව තිබිය යුතු ය.
- විචාරකයා තුළ තුලනාත්මක දෘෂ්ටියක් තිබිය යුතු ය.
- රස නීරස යන භේදය හඳුනා ගැනීමේ හැකියාව ඔහු සතු විය යුතු ය.

නිර්මාණාත්මක විචාර කලාවක් ගොඩනැඟීමේ දී එය ප්‍රධාන කරුණු කීපයක් ඔස්සේ ගොඩනැඟිය හැකි ය.

1. පූර්ව -නිශ්චිත දෘෂ්ටි කෝණයකින් තොර ව විවෘත මනසකින් යුක්ත ව කරන විචාරය.

   නාට්‍ය රංග ශිල්ප විධි ක්‍රම මඟින් නාට්‍ය නිර්මාණ රටාව, ඒවායේ ආකෘති, ප්‍රේක්ෂක සබඳතා ආදිය වර්තමානයේ ශීඝ්‍ර ලෙස වෙනස් වෙමින් පවතී. ඒවා කාලය, දේශය, පවත්නා සමාජ සංස්කෘතිය හා සමාජ පරිසරය අනුව නිරතුරු ව වෙනස් වීමකට ලක් ව ඇත. උදාහරණ ලෙස සිංහල ගැමි නාට්‍ය වන කෝලම්, සොකරි, නාඩගම්, නූර්ති ආදි ලෙස විවිධාකාරයෙන් වෙනස් වෙමින් නූතන නාට්‍ය කලාව තෙක් නාට්‍ය ප්‍රවේශ වී ඇත්තේ නාට්‍ය කලාවේ පරිණාමය හේතුවෙනි. ඒ නිසා නාට්‍යයක් විචාරයකට ලක් කිරීමේ දී පූර්වයෙන් නිශ්චය කරගත් කරුණු ඔස්සේ විචාරය කරනවා වෙනුවට විවෘත මනසකින් යුක්ත ව කරන විචාරය නාට්‍ය කලාවේ ප්‍රගමනයට හේතු වේ. එසේ නො වී නාට්‍යයේ රංග ශිල්ප ක්‍රම, නළු නිළියන් ගේ රංගනයන්, ඔවුන් ගේ වේෂභූෂණ ඇතුළු ආනුෂංගික අංග පිළිබඳ අන්ධානුකරණයෙන් පූර්ව නිශ්චිත දෘෂ්ටිකෝණයකින් විචාරය කළහොත් සිදු වන්නේ නිර්මාණකරුවකුට හෝ නිර්මාණයකට හෝ නළුවකුට හෝ නිළියකට හෝ නැඟී සිටීමට ඉඩක් නොමැති වීම යි. යම් නළුවකු ගේ හෝ නිළියක ගේ හෝ රංගනය මෙබඳු විය යුතු ම යැයි විචාරකයෙක් පවසන්නේ නම් ඔහු හෝ ඇය හෝ සාම්ප්‍රදායික රටාවකට කොටු කර තැබීමට විචාරකයාට හැකි වුව ද එය නළු-නිළියන් ගේ කුශලතා වර්ධනයට ඇතැම් විට විශාල බාධාවක් විය හැකි ය. එවිට විචාරකයා දක්වන ශිල්ප ක්‍රමවල පමණක් හිර වන ඔහු හෝ ඇය සමාජ භාවිතයෙන් ඉවතට වීසි වීමට විචාරය හේතුකාරකයක් විය හැකි ය. එවිට විචාරය සෘණාත්මක වේ.

   බොහෝ විට රංග විධි ක්‍රම සඳහා සම්මත නිර්ණායක හා වට්ටෝරු ද දක්නට නැත. විචාරකයා යම් විචාරයක් කිරීමේ දි නිර්මාණයේ අවශ්‍යතාව හා ඉල්ලුම අනුව නළුවා හෝ නිළිය හෝ නිර්මාණය මෙහෙයවීම සඳහා අනුබලයක් ලබා දෙන උපකාරකයක් ලෙස සිතා විචාරයට ලක් කළ යුතු ය. නො එසේ නම් සෘණාත්මක විචාරය හමුවේ නිර්මාණයේ මූලික ගුණය හා සේවය මැඬ ගනිමින් ශිල්ප විධික්‍රම පමණක් නැඟී සිටිනු ඇත.

2. නිශ්චිත රාමුවකින් තොර වූ ධනාත්මක විචාරය

   ඇතැම් නාට්‍යකරුවෝ නාට්‍ය පිළිබඳ ආශාවෙන් නාට්‍ය නිෂ්පාදනය කරති. ඇතැම් නාට්‍යකරුවෝ සමාජ අවශ්‍යතාවක් වෙනුවෙන් නාට්‍ය නිෂ්පාදනය කරති. ඇතැම්හු මෙම හේතු දෙක ම පටලවා ගනිමින් නාට්‍ය කරන්නට පෙලඹීම නිසා අගමුල පටලවා ගනිමින් නාට්‍ය නිෂ්පාදනය කරති.

   එබැවින් නාට්‍යයක් විචාරයට ලක් කිරීමේ දී විචාරකයා මෙම කරුණු පිළිබඳ ව ද අවබෝධයකින් යුතු ව විචාරක ඇස යොමු කළ යුතු ය.

ඇතැම් අය නාට්‍යයක් නිර්මාණය කරන්නේ කලාව සඳහා ය යන අදහස කරපින්නාගෙන ය. මේ නිසා ඇතැම් යල්පැනගිය බොහෝ දෑ නැවුම් ගතියක් ඇති වන පරිදි විවිධ උපක්‍රම මඟින් අලංකාර කොට ඉදිරිපත් කිරීමට උත්සාහ දරති. මේ අවස්ථාව විචාරක ඇස යොමු විය යුතු තැනකි. පැරණි දෑ ම නවීකරණය කරමින් ඉදිරිපත් කරන්නට යාමෙන් නව නාට්‍ය රටාවක් ගොඩනැඟීම හෝ ඉන් නව නාට්‍ය නැඹුරුවක් බිහිවීම හෝ නොවන හෙයිනි. මෙවන් අවස්ථාවක කරන විචාරයේ දී විචාරකයා නිශ්චිත රාමුවකින් තොර වූ ධනාත්මක විචාරයකට මඟ පාදා ගත යුතු ය. මෙහි දී පැරණි දේ පැරණි ලෙස ම ඉදිරියට ගෙන යා යුතු ද? පැරණි දේ නැවුම් ව ඉදිරිපත් කරන්නට යාමේ දී සිදු ව ඇති දේ කුමක් ද? එසේ නොමැති ව නැවුම් නිර්මාණයක් සමාජයට ඉදිරිපත් නොවීම නිසා නාට්‍ය කලාවේ ප්‍රගතියට කෙතරම් හානියක් සිදුවන්නේ ද යන්න විචාරකයකු සිය විචාරක ඇසින් දැක ප්‍රකාශ කළ යුතු ය. ඒ සඳහා නිශ්චිත රාමුවක් ගොඩනගා ගන්නේ නැති ව නාට්‍ය කලාවේ සංවර්ධනය ඇති වන ලෙස ධනාත්මක විචාරයක් කළ යුතු ය.

3. නිර්මාණයේ නිර්මාණාත්මක වටිනාකම් හැඳින ගෙන කරන විචාරය

නාට්‍යයක් විචාරයට ලක් කිරීමේ දී විචාරකයා එම නිර්මාණයේ ඇති නිර්මාණාත්මක වටිනාකම් පිළිබඳ ව පළමු ව අවබෝධ කරගත යුතු ය. මෙහි දී පහත සඳහන් කරුණු පිළිබඳ පූර්ණ අවබෝධය ඔහු තුළ තිබිය යුතු ය.

1. නාට්‍යයේ පිටපත
2. නාට්‍යයේ තේමාව/තේමා
3. නාට්‍යයේ ශෛලිය
4. නළු-නිළියන් ගේ රංග කාර්යය
5. ආනුෂංගික අංග භාවිතය
6. නාට්‍යයේ නිර්මාණාත්මක බව

ආදි කරුණු පිළිබඳ ව මනා අවබෝධයකින් යුක්ත ව නාට්‍යයක් විචාරයට ලක් කළ යුතු ය. පෙර කී අංග නාට්‍ය කලාවේ පැවැත්ම උදෙසා කෙතෙක් දුරට සාධනීය ලෙස යොදා ගෙන ඇද්ද යන්න විචාරයට ලක් කළ යුතු අතර එසේ කරන විචාරය නාට්‍ය නිෂ්පාදක/අධ්‍යක්ෂවරයා නැවතත් නිර්මාණයක් බිහි කිරීමට පෙලඹෙන ආකාරයේ විචාරයක් විය යුතු ය. මෙහි දී නාට්‍ය අධ්‍යක්ෂවරයා තමා ගේ දැනුම හා හැකියාව නිවැරදි ලෙස සමාජයේ ප්‍රගතිය උදෙසා කෙතෙක් දුරට යොමු කොට ඇද්ද යන්න විචාරයට ලක් කළ යුතු ය.

4. නාට්‍ය කෘතියක කාලීන බව හා විශ්ව සාධාරණීය බව පිළිබඳ ව අවබෝධයෙන් යුක්තව කරන විචාරය

විචාරකයකු සතු බහුශ්‍රැත බව ප්‍රයෝජනයට ගත හැකි අවස්ථාවක් ලෙස මෙම අවස්ථාව දැක්විය හැකි ය. විචාරකයකු විවිධ කාල පරාසයන්ට අයත් නිර්මාණ පිළිබඳ අවබෝධයෙන් යුතු ව යම් නිර්මාණයක් විචාරය කිරීමට පෙලඹිය යුතු ය. නාට්‍යයක් විචාරයට ලක් කිරීමේ දී එහි කාලීන වටිනාකම පිළිබඳ අවබෝධය විචාරකයකු සතු විය යුතු ය. තමන් නැරඹූ නාට්‍යය කෙතෙක් දුරට සර්වකාලීන වටිනාකමකින් යුක්ත ද ? එසේ නම් එම නාට්‍ය නිර්මාණය කරන ලද කාලය තුළ පවත්නා සමාජයට ඉන් ගත හැකි ආදර්ශ, නළු-නිළියන් ගේ රංග කාර්යයේ දැකිය හැකි සර්වකාලීන වටිනාකම, එහි ආනුෂංගික අංග ආදියේ පවත්නා සර්වකාලීන වටිනාකම දෙබස්, සංවාද, සංගීතය, අභිනය භාවිතය ආදියේ ඇති සර්වකාලීන වටිනාකම ආදි කරුණු පිළිබඳ අවබෝධයෙන් විචාරකයකු නාට්‍යයක් විචාරය කළ යුතු ය.

උදාහරණ ලෙස 1956 වර්ෂයේ නිර්මාණය කරන ලද මනමේ නාට්‍යය වර්ෂ අර්ධ ශතකයක් ඉක්මවා ගිය කාලයක් ප්‍රතිනිර්මාණය වෙමින් පැවතුණ ද එහි පවත්නා සර්වකාලීන ගුණයේ අඩුවක් නොවන බව පෙනේ.

එසේ ම යම් නාට්‍යයක විශ්ව සාධාරණීය ගුණය විචාරකයකු ගේ අවධානය යොමු විය යුතු කරුණකි. නාට්‍යකරුවා සිය නිර්මාණය මඟින් සමාජයට ඉදිරිපත් කරන තේමාව/තේමා නාට්‍ය ඔස්සේ නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමේ දී රූපණයේ දී නළු-නිළියන් එම තේමාව උද්දීපනය කිරීම උදෙසා කෙතෙක් දුරට සිය රංගන කුශලතා පෙන්වූවා ද කෙතෙක් දුරට සතර අභිනය උපයෝගී කොට ගෙන එය විශ්ව සාධාරණීය ගුණයෙන් යුක්ත ව ඉදිරිපත් කළ ද යන්න සොයා බැලිය යුතු ය. නාට්‍යයේ සමස්ත නිර්මාණය පුරා ම දක්නට ලැබෙන විශ්ව සාධාරණීය ගුණය පිළිබඳ අදහස් ධනාත්මක ලෙස ඉදිරිපත් කිරීමෙන් නාට්‍ය නිර්මාතෘවන්ට මෙන් ම රූපණ කාර්යය ඇතුළු අනෙකුත් ආනුෂංගික කාර්යවල නිරත වන ශිල්පීන්ට ද එය මහඟු උත්තේජනයක් වනු ඇත.

5. ඒ ඒ කෘතියට ආදේශ කළ හැකි පරිදි විචාර සිද්ධාන්ත ගොඩනඟා ගැනීම

නාට්‍ය නිර්මාණයේ දී නියත වශයෙන් ම මේ දේ නිවැරදි ය. මේ දේ වැරදි ය. කියන සිද්ධාන්තයක් වේදිකාවේ නැත. වේදිකාවේ එපා යයි නිශ්චිත ව කියන දෙයක් ද ඕනෑ යයි නිශ්චිත ව කියන දෙයක් ද නැත. වේදිකාව මත ඇත්තේ ඖචිත්‍යය හෙවත් උචිත බව යි. එනම් නියම දේ, හරි දේ හා උචිත දේ පමණක් කිරීම නාට්‍ය කලාවේ පැවැත්ම උදෙසා යහපත් ය.

එබැවින් නාට්‍ය නිෂ්පාදකවරයා/අධ්‍යක්ෂ සිය නුවණ මෙහෙයවා උචිත දේ පමණක් තෝරා ගත යුතු ය. නිර්මාණයේ ස්වභාවය අනුව ඊට ආවේණික අයුරින් විචාර සිද්ධාන්ත ගොඩනඟා ගැනීමට විචාරකයාට ප්‍රතිභාවක් තිබිය යුතු ය.

ශෛලිගත නාට්‍යයක දී නම් නළු-නිළියන් ගේ රූපණ කාර්යය කෙසේ විය යුතු ද? පසුතල නිර්මාණ ආදිය යොදා ගත යුතු ද? එසේ යොදා ගෙන ඇත්නම් ඒවා එම නිර්මාණය හා ගැළපේ ද නැද්ද යන්න විචාරයට ලක් විය යුතු දෙයකි.

ස්වාභාවික නාට්‍යයක නම් එම කරුණු කෙසේ බලපායි ද යන්න විචාරයට ලක් කළ යුතු අතර, එම විචාරය නාට්‍ය නිර්මාණයේ වැරදි ඇත්නම් නිවැරදි කර ගැනීම කළ හැකි පරිදි සංවර්ධනාත්මක විචාරයක් විය යුතු ය.

නාට්‍යකරුවා තේමාව වශයෙන් තෝරා ගෙන ඇත්තේ කුමක් ද? නාට්‍යයක තේමාව වන්නේ නාට්‍ය කතුවරයා විසින් කරනු ලබන විශ්වසනීය වැදගත්කමක් ඇති ප්‍රකාශයක් නැතහොත් විවරණයකි.

විචාරකයකු විසින් මෙය සොයා බැලිය යුතු වැදගත් කරුණක් වේ.

ගැහැනිය චපල බව දක්වෙන චුල්ලධනුග්ගහ ජාතකයෙන් මතු වන තේමාව සරච්චන්ද්‍රයන් සිය මනමේ නාට්‍යය මඟින් වෙනස් තේමාවක් කරා මෙහෙයවී ය.

නාට්‍යයක උසස් බව මෙන් ම පැවැත්ම ද ඇති වන්නේ ජීවිතය පිළිබඳ විශ්වසනීය යමක් එයින් කියැවෙන්නේ නම් පමණි. එබැවින් නාට්‍යයේ තේමාව සදාතන සිත් ගත් දෙයක් වීම වැදගත් බව විචාරක මනසට ඇතුළු විය යුත්තකි. තේමාව නිශ්චිත වූ විට විචාරකයකුට එම නාට්‍යය පිළිබඳ අර්ථ සැපයීම වඩාත් පහසු වේ.

- නාට්‍ය විචාරකයකු ගේ විචාරයට හසු වන තවත් ප්‍රධාන සිද්ධාන්තයක් ලෙස නාට්‍ය වස්තුව දැක්විය හැකි ය. නාට්‍යයක තේමාවෙන් සිදු වන දේ, සිදු වන ආකාරය දක්වීම නාට්‍ය වස්තුව අගය කිරීමේ දී සොයා බැලිය යුත්තේ නාට්‍ය කතුවරයා උත්සාහ කොට ඇත්තේ කෙබඳු

නාට්‍යයක් රචනා කිරීම සඳහා ද යන්න යි. එහි දී නාට්‍ය වඩාත් සාර්ථක යැ යි විචාරයට හසුවන්නේ කතුවරයා විසින් නිර්මිත නාට්‍ය වස්තුව මෙන් ම අවස්ථා නිර්මාණ සාර්ථක වුව හොත් පමණි. සාර්ථක නාට්‍ය වස්තුවක් විකාශනය විය යුත්තේ එක් අවස්ථාවකින් තවත් අලුත් අවස්ථාවකට ගමන් කරමිනි. එමඟින් ප්‍රේක්ෂක මනෝභාවයන් ප්‍රකට කරවමින්, ප්‍රේක්ෂක උනන්දුව වැඩි කරවමින් හා විශ්වාසය ග්‍රහණය කරවමිනි.

නාට්‍යයක තේමාව වස්තුව මෙන් ම විචාරයට ලක් වන තවත් කරුණක් වන්නේ චරිත හා සංවාදය යි. මෙය නාට්‍ය කතුවරයා විසින් තෝරා ගැනුණු සම්මතයට, එනම් ශෛලියට සරිලන පරිදි තෝරා ගත් චරිත හා සංවාද විය යුතු ය. උදාහරණ ලෙස වේදිකාව මත කතා කරන සතකු අප පිළිගන්නේ නාට්‍යමය සංකල්ප අනුව එය උචිත දෙයක් ලෙස ය. නාට්‍යයක චරිත පිළිබඳ ව ප්‍රේක්ෂකයා විශ්වාස කරන තරමට ඔවුන්ට සිදු වන දේ ගැන මුහුණ දෙන සිදුවීම් ගැන කම්පා වන ප්‍රමාණයට ප්‍රේක්ෂකයෝ නාට්‍ය හා බැඳෙති. මෙහි දී විචාරකයෙක් කෙතෙක් දුරට මෙම චරිත ප්‍රේක්ෂකයා හා බැඳී ඇද්ද යන්න සොයා බලයි. දක්ෂ නාට්‍ය කතුවරයාට අර්ථ සම්භාරයක් වචන කීපයක් තුළ සජීව ව හකුළුවා චරිතයක් මඟින් ප්‍රේක්ෂකයා හමුවට ගෙන ඒමට ශක්තියක් ඇත. එය නාට්‍ය විචාරයේ දී පැසසුමට ලක් වන අවස්ථාවකි.

නාට්‍යයක චරිතවල සිතුම් පැතුම් හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා තෝරාගත් වදන් සංවාද ලෙස නම් කළ හැකි ය. මෙම නාට්‍යමය සංවාද ඇතැම් විට ගීතය දක්වා පැතිර යයි. එනම් ගද්‍ය හෝ පද්‍ය විය හැකි ය. නාට්‍ය විචාරයේ දී, නිෂ්පාදන කාර්ය අර්ථවත් වීමට යොදාගන්නා මෙම භාෂාව එනම් ගද්‍ය හෝ පද්‍ය හෝ සංවාද කෙතෙක් දුරට නාට්‍යයේ රිද්මය සලකුණු කිරීම සඳහා යොදා ගෙන ඇද්ද යන්න සොයා බැලීම කෙරේ. නාට්‍යකරුවා ගේ වාක් සම්ප්‍රදායය අර්ථවත් වදන් කෙතෙක් දුරට නාට්‍යයේ ගුණාත්මක බව කෙරේ සාධනීය ලෙස බලපා ඇද්ද යන්න විචාරක ඇසට ලක් වේ. එබැවින් නාට්‍ය නිර්මාණයක දී යොදා ගන්නා භාෂාව පිළිබඳ ව අධ්‍යක්ෂවරයා මැනැවින් සැලකිලිමත් විය යුතු ය. එයට හේතුව වන්නේ නාට්‍යයක චරිත හෙළිදරවු කිරීම සඳහා උසස් ලෙස භාවිත කරන සංවාද වැදගත්වන හෙයිනි. එසේ ම එමගින් නාට්‍යයේ තේමාව විකාශනය කරන අතර නාට්‍යයේ කාර්යභාරය මැනැවින් ඉදිරියට ගෙනයයි.

6. නාට්‍ය කලාවේ ප්‍රගමනයට හේතුවන විචාරය

නාට්‍යයක් විචාරය කරන විචාරකයකුට එම නාට්‍යයේ පැවැත්ම කෙරේ විශාල බලපෑමක් කළ හැකි ය. එහෙත් අත්තනෝමතික ව හේතු සාධක රහිත ව යමෙක් නාට්‍යයක් විචාරය කළහොත් නාට්‍යයේ පැවැත්ම බිඳ දැමීම කෙසේ වුව ද විචාරකයා ක්ෂේත්‍රයෙන් පසකට වීසි වීමත් ගර්හාවට ලක්වීමත් සිදු වේ. එබැවින් නාට්‍යයක් විචාරයට ලක් කිරීමේ දී විචාරකයා එය පරිස්සමින් කළ යුතු ය. එයට හේතුව විවිධ සමාජ තරාතිරම්වල පිරිස්, විවිධ වයස් මට්ටම් මෙන් ම විවිධ බුද්ධි මට්ටම්වල පිරිස් ද එම නාට්‍ය නරඹා ඔවුන් ද එම නාට්‍යය පිළිබඳ ස්වයං විචාරයක් ඉදිරිපත් කිරීම යි. යහපත් විචාරකයා හැම විට ම උත්සාහ කරන්නේ අධ්‍යක්ෂවරයා ගේ ප්‍රයත්නය හඳුනා ගෙන එම උත්සාහයේ සාර්ථක අසාර්ථක බව මැනීමට ය. එසේ ම අධ්‍යක්ෂවරයා ගේ කාර්යභාරය දෙස ධනාත්මක ව බැලීමට ය. නාට්‍යයක් ආරම්භයේ සිට විකාශනය වන්නේ නිශ්චිත අවසානයක් කරා ය. එසේ අවසානය කරා යන ගමනේ දී විවිධ ප්‍රබලතා මෙන් ම දුබලතා ද ප්‍රේක්ෂක ඇසට ලක්වේ. විචාරකයකු කළ යුත්තේ ප්‍රබලතා හඳුනාගෙන ප්‍රශංසා කිරීමත් දුබලතා පෙන්වා දෙමින් ඒවා මඟහරවා ගැනීමට ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමත් ය. විචාරකයා සාර්ථක නිෂ්පාදනයකට හේතු වන පොලඹවන සුලු බව හා නැවතත් නිර්මාණයක් කිරීමට අධ්‍යක්ෂවරයා යොමු වන සුලු බව ඇති කරමින් නාට්‍ය කලාවේ ප්‍රගමනයට හේතුකාරක වන පරිදි විචාරය ඉදිරිපත් කළ යුතු ය.

- ගුණාත්මක යෙදැවුම් ලෙස දී ඇති කෘති කියවීමට සිසුන් පොලඹවා සංවර්ධනාත්මක විචාර කලාවක් ගොඩනඟා ගැනීමට සිසුන්ට මඟ පෙන්වන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නාට්‍යයක් විචාරයට ලක් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව විමසීමක් කරන්න.
- විවෘත ග්‍රන්ථ පරිශීලනයෙන් ධනාත්මක විචාර කලාවක් ගොඩනඟා ගැනීමට අවශ්‍ය කරුණු ගොනු කරන්න.
- නාට්‍ය කලාවේ ප්‍රගමනයට හේතු වන අයුරින් නාට්‍යයක් විචාරය කිරීමට අවශ්‍ය සිද්ධාන්ත ගොඩ නඟන්න.

නිපුණතාව 5.0 : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ විවිධ නිර්මාණ රසාස්වාදයට හා විචාරයට ලක් කරමින් ජීවිත අත්දැකීම් පෝෂණය කරයි.

නිපුණතා මට්ටම 5.6 : වේදිකා නාට්‍ය කලාවේ පැවැත්ම හා වර්ධනය සඳහා ප්‍රේක්ෂක ප්‍රතිචාරවල වැදගත්කම වටහා ගනියි.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගෙනුම් පල :
- නාට්‍ය නිෂ්පාදනයක අග්‍රඵලය භුක්ති විඳින්නා ප්‍රේක්ෂකයා බැවින් ඔවුන් ගේ ප්‍රතිචාර විඳ දරා ගැනීමට හුරු වෙයි.
- නාට්‍ය නිෂ්පාදනය කෙරෙහි ප්‍රේක්ෂකයන්ට දැඩි බලපෑමක් කළ හැකි බව අත්දැකීමෙන් පිළිගනියි.
- ගුණාත්මක නාට්‍ය බිහි වීමට ප්‍රේක්ෂක ප්‍රතිචාර අත්‍යවශ්‍ය සාධකයක් බව ප්‍රකාශ කරයි.
- නාට්‍යයක් නරඹන ප්‍රේක්ෂකයන් විවිධ මත හා විවිධ ආකල්ප දරන විවිධ තරාතිරම්වල හා විවිධ බුද්ධි මට්ටම්වල අය බව හඳුනාගනියි.
- සර්වකාලීන හා සර්වදේශීය වටිනාකමකින් යුත් නාට්‍ය බිහි කිරීමේ දී ප්‍රේක්ෂක ප්‍රතිචාර ඉමහත් රුකුලක් වන බව ප්‍රකාශ කරයි.

ක්‍රියාකාරකම 5.6.1 : ප්‍රේක්ෂක ප්‍රතිචාර පිළිබඳ ව සාකච්ඡා කිරීම.

ගුණාත්මක යෙදවුම් : කල්පනා ලෝකය - එදිරිවීර සරච්චන්ද්‍ර
නාට්‍ය ප්‍රවේශය - සුචරිත ගම්ලත්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : සාකච්ඡා ක්‍රමය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ප්‍රේක්ෂකයන් යනු කලාව නැමැති වෘක්ෂයේ හටගත් නාට්‍ය පෙළ නැමැති මහාර්ඝ ඵලය අධ්‍යක්ෂවරයා විසින් නිර්මාණාත්මක ලෙස කපා කොට ලුණු ඇඹුල් ලා සකසා වේදිකාව නමැති බන්දේසියේ ලා කවුරුන් උදෙසා පිළිගන්වන්නේ දෝ හෝ යි සිතන විට රසලෝලී ව නොඉවසිල්ලෙන් එය වළඳන්නට ප්‍රේක්ෂාගාරයේ අසුන් ගෙන සැදී පැහැදී බලා සිටින රසික පිරිසයි.

- එම රසවත් නිර්මාණය වනාහි දිගු කලක් තිස්සේ උපරිම සූදානමකින් යුක්ත ව පියවරෙන් පියවර ගොඩනැගූ හැසිරීම් සමුදායක තෝරාගත් සාරය ලෙස සැලකෙන නාට්‍යය වන්නේ ය.

- නාට්‍යයක් යනු කිසිසේත් ම ගබඩා කොට තබා රස විඳිය හැකි නිර්මාණයක් නො වේ. එය සජීව ව රසවිඳිය හැකි නිර්මාණයකි. නාට්‍යයක් වේදිකාව මත රංග ගත වන අවස්ථාව එය නැරඹීම සඳහා යන ප්‍රේක්ෂකයා නාට්‍යය ද සජීව ව එකිනෙකා වැලඳ ගන්නා ආදරණීය අවස්ථාවකි. මෙම ආදරණීය අවස්ථාව නාට්‍යයට හෝ ප්‍රේක්ෂකයාට හෝ වෙන් වෙන් ව හුදෙකලාව ළඟා කර ගත නොහැකි ය. එනම් ප්‍රේක්ෂකයන් ඇති තැන නාට්‍යය ද තිබිය යුතු ම ය. ඒ අනුව නාට්‍යයත් ප්‍රේක්ෂකයාත් ගසට පොත්ත සේ බැඳී සිටිති. ප්‍රේක්ෂකයන් නොමැති විට නාට්‍යයට පැවැත්මක හෝ ජීවයක් නැත්තා සේ ම නාට්‍ය නොමැති තැන ප්‍රේක්ෂකයාට ඉන් ලැබිය හැකි වින්දනයක් ද නැත.

  නාට්‍යයක් නැරඹීම සඳහා ප්‍රේක්ෂාගාරයක් වෙත එන ප්‍රේක්ෂකයා අරමුණු රැසක් පෙරදැරි කරගෙන පැමිණීමට ඉඩ ඇත. එනම්

  - හුදු විනෝදාස්වාදය ලැබීමේ පරමාර්ථයෙන්
  - විවේකය විනෝදයෙන් ගත කිරීමේ අපේක්ෂාවෙන්
  - නාට්‍යයක් නරඹා ඉන් ලැබිය හැකි වින්දනය අපේක්ෂාවෙන්
  - නාට්‍යය හා රංග කලාව යන විෂයය අධ්‍යයනය සඳහා කරුණු ගවේෂණය කිරීමේ පරමාර්ථයෙන්

- දැනුම ලබා ගැනීමේ පරමාර්ථයෙන්
- පෙර කියැවූ නාට්‍ය පෙළක්, නිෂ්පාදනය කිරීමේ දී අධ්‍යක්ෂවරයා ගේ කාර්යභාරය කෙබඳු ද යන්න විමසීමේ අටියෙන්
- නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වීමේ අරමුණින්
- තම නිර්මාණ කෞශල්‍යය වර්ධනය කර ගැනීමේ අරමුණින්
- අන්‍යෝන්‍ය සහයෝගිතාවට ඇති කැමැත්ත නිසා
- නාට්‍ය අධ්‍යක්ෂවරයකු ගේ ආරාධනය පිළිගැනීම නිසා
- නාට්‍ය වේදිකාගත වන උත්සවයක ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වීම සඳහා
- නාට්‍ය නරඹා ලැබූ රසවින්දනය පිළිබඳ මතකයන් නැවතත් අලුත් කර ගැනීම සඳහා
- රංගන ශිල්පියකු හෝ රංගන ශිල්පිනියක හෝ වීමට පූර්වාදර්ශ ලබා ගැනීම සඳහා
- නාට්‍ය හා රංග කලාව විෂය හැදෑරීමෙන් ලද දැනුම ප්‍රායෝගික අත්දැකීමක් බවට පත් කර ගැනීම සඳහා

  උදා: පාසලේ දී පෙළ අධ්‍යයනය කළ අයකු වේදිකාව මත දී කෙරෙන (නිෂ්පාදක) රංග ගත වීම දැක බලා ගැනීම සඳහා

- කිනම් අරමුණකින් නාට්‍යයක් නැරඹුව ද ඔහු ප්‍රේක්ෂකයෙක් වේ. නාට්‍ය නැරඹීමේ දී ත් නාට්‍ය නැරඹීමෙන් පසු වත් ඔවුහු එම නාට්‍ය පිළිබඳ විවිධ ප්‍රතිචාර ලබාදෙති. එම ප්‍රතිචාරවල ස්වභාවය ධනාත්මක ද නැතහොත් ඍණාත්මක ද කියා වෙන් කොට ගත හැකි වන්නේ ඔහු තුළ නාට්‍ය කලාව පිළිබඳ ඇති දැනුමේ ප්‍රමාණය අනුව ය. රසවින්දනය පමණක් අපේක්ෂා කරන ප්‍රේක්ෂකයකු ලබා දෙන ප්‍රතිචාර නාට්‍යයේ සාධනීය ලක්ෂණ කෙරේ එතරම් බල නොපාන්නට පුළුවන. එහෙත් යම් ප්‍රබුද්ධ ප්‍රේක්ෂකයකු නාට්‍යයේ පහත දැක්වෙන අංග පිළිබඳ වත් ඒවා නාට්‍යයේ ආරම්භයේ සිට අවසානය තෙක් නාට්‍යකරුවා භාවිතයට ගෙන ඇති අන්දමත් සාකච්ඡා කරන්නේ නම් එය නාට්‍යයේ සාධනීය ලක්ෂණ කෙරේ යම් බලපෑමක් කළ හැකි ය.

  එනම් නාට්‍යයේ,

  තේමාව
  කථා වස්තුව
  ශෛලිය
  ගැටුම
  නළු-නිළියන් ගේ රූපණ කාර්යය
  භාෂාව (සංවාද හා ගීත)
  ආනුෂංගික
  කාලීන වටිනාකම
  අධ්‍යක්ෂවරයා ගේ කාර්යභාරය
  සංගීතය
  අවසානය
  නාට්‍යෝචිත අවස්ථා
  රංග වින්‍යාසය ආදී අංග ය.

ඉහත කරුණු පිළිබඳ ව ඕනෑ ම ප්‍රේක්ෂකයකුට කතිකාවක් ගොඩනැගීමට පූර්ණ නිදහස ඇති අතර එම නිදහස නාට්‍ය කලාවේ ප්‍රගමනය උදෙසා යෙදෙන්නේ නම් නාට්‍ය විෂයය හදාරන්නවුන් මෙන් ම වෘත්තීය නාට්‍ය නිෂ්පාදකයන් ගේ ද එයට දායක වන නළු-නිළියන් ඇතුළු අනෙකුත් ශිල්පීන් ගේ ද ඉදිරි ගමනට මහත් පිටුබලයක් වනු ඇත. එහෙත් නාට්‍යයක් නරඹන සියලු ප්‍රේක්ෂකයන් ගෙන් එය අපේක්ෂා කළ නොහැක්කේ ප්‍රේක්ෂාගාරය තුළ සිටින ප්‍රේක්ෂකයන් විවිධ වන හෙයිනි.

ප්‍රේක්ෂාගාරයේ සිටින ප්‍රේක්ෂකයින් ඃ

- විවිධ තරාතිරම්වල පිරිස් විය හැකි ය.
- විවිධ ජාතීන් විය හැකි ය.
- විවිධ වෘත්තිකයන් විය හැකි ය.
- විවිධ වයස් මට්ටම්වල පිරිස් විය හැකි ය.
- විවිධ බුද්ධි මට්ටම්වල අය විය හැකි ය.
- විවිධ ආකල්ප දරන්නවුන් විය හැකි ය.
- විවිධ රැකියාවල නිරතවූවන් විය හැකි ය.
- විවිධ සමාජ මට්ටම්වල නියෝජනය කරන අය විය හැකි ය.
- විවිධ රසඥතාව ඇතියවුන් විය හැකි ය.
- ඇතැම් විට නරඹන ලද නාට්‍යය පිළිබඳ ව පූර්ව නිගමනයන්ට පැමිණියවුන් විය හැකි ය.

- නාට්‍යයක් නරඹන ප්‍රේක්ෂකයන් ගේ ප්‍රතිචාර මගින් නාට්‍යයේ ප්‍රගමනයට සාධනීය බලපෑමක් ඇති කළ හැක්කේ ඔවුන් තුළ නාට්‍ය කලාව පිළිබඳ යම් පමණකට හෝ ප්‍රමාණාත්මක දැනුමක් හා උසස් රසවින්දන ශක්තියක් තිබුණ හොත් පමණි. එසේ ම ඔවුන් තුළ විවිධ නාට්‍ය සම්ප්‍රදායන් පිළිබඳ ව හා නාට්‍ය ශෛලි පිළිබඳ ව දැනුමක් තිබීමෙන් ධනාත්මක ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් අපේක්ෂා කළ හැකි ය.

- ශිල්පීන් රාශියක ගේ එක්තැන් වූ ශ්‍රමය රංග කාර්යයක් ලෙස මනා සංවිධානයකින් යුතු ව වේදිකාවට ගෙන ඒමේ දී එම නාට්‍ය පෙළ ජීවමාන කිරීමට තත්පරයක් හෝ ප්‍රමාද නොවී උසස් ප්‍රේක්ෂාවකින් යුක්ත ව ප්‍රේක්ෂකයාට ලබාදීමට දරන ප්‍රයත්නය ප්‍රේක්ෂාගාරයේ සිටින ප්‍රේක්ෂකයාට පූර්ණ වශයෙන් නො පෙනේ. ඔහු විචාරයට ලක් කරන්නේ ඔහු ගේ නෙතට හා කනට ගැටෙන වේදිකාව මත කර පෙන්වන යම් ප්‍රමාණයක් පමණි.

- එම පෙනෙන ඇසෙන දකින ප්‍රමාණය කෙරේ ඔහු දක්වන විචාරය නාට්‍යයක පැවැත්ම කෙරේ බෙහෙවින් බලපායි.

- සාමාන්‍ය පොදු ප්‍රේක්ෂකයා නාට්‍යයක් සාර්ථක යැයි තෘප්තියෙන් ප්‍රකාශ කරන්නේ නාට්‍ය පෙළ, නළුවන්, අධ්‍යක්ෂණය, වේදිකා සැරසිලි, සංගීතය හා ආලෝකය යන කොටස්වල එකතුවෙන් ප්‍රේක්ෂකයා වෙත ගෙන එන සාමූහික රංග ක්‍රියාවලිය නිවැරදි ව වේදිකාව මත විකාශනය වීමෙන් නාට්‍ය නරඹන විට යම් තෘප්තියක් ලැබුණහොත් පමණි.

- කිසියම් වූ නාට්‍යයක් ගුණාත්මක වශයෙන් උසස් ද පහත් ද සාර්ථක ද අසාර්ථක ද යන්න නිර්ණය කරන්නේ පළමුවෙන් ම නාට්‍ය නරඹන ප්‍රෙක්ෂකයා විසිනි. එහෙත් ඒ පිළිබඳ දැනුමක් ඇති ප්‍රේක්ෂකයකු කිසි දු විටක වේදිකාවක් මත රංග ගත වන ඕනෑ ම අවස්ථාවක් නාට්‍යයක් ලෙස පිළිගැනිමට සූදානම් නැත.

නාට්‍ය නිෂ්පාදනයේ ප්‍රගමනයට හේතුකාරක වන්නා වු ධනාත්මක ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබෙන අවස්ථා

- නාට්‍ය නිෂ්පාදනයේ දී නාට්‍ය පෙළට සාධාරණයක් ඉටු වී ඇති විටක.
- නාට්‍යයේ චරිතවලට ගැළැපෙන නළු-නිළියන් තෝරා ගෙන ඇති විටක.
- නළු--නිළියන් ගේ රූපණ කාර්යය ප්‍රශස්ත මට්ටමකට ළඟා වූ විටක.
- රංගෝපක්‍රම හා වේදිකා තාක්‍ෂණය වඩාත් උචිත ලෙස යොදා ගෙන ඇති විටක.
- ආනුෂාංගික අංග මනා ලෙස සුසංයෝග කර ඇති විටෙක.
- ප්‍රේක්‍ෂක අවධානය ගිලිහී නොයන පරිදි රංග රිද්මය හා ප්‍රේක්‍ෂාව මනා ලෙස ගොඩනගා ඇති විටෙක.
- නාට්‍යයේ ආකෘතියට අදාළ පරිදි ගැටුම/ගැටුම් ඉස්මතු කර දැක්වීමට නිෂ්පාදකයා දරා ඇති උත්සාහය සාර්ථක වූ විට

- චරිතවලට ගැළපෙන පරිදි උචිත බස් වහරක් යොදා ගෙන තිබෙන විටක
- නාට්‍ය නැරඹීමෙන් රසාස්වාදයක්, වින්දනයක් මෙන් ම ජීවිතයට යම් අරුත්බර පණිවිඩයක් ලැබීම.

ප්‍රේක්ෂක ප්‍රතිචාර මගින් නාට්‍යකරුවෙකුට ලැබිය හැකි ප්‍රතිලාභ

- චමත්කාරයෙන් යුත් දෘශ්‍ය රූපවලින් ද, ශබ්ද මාධූර්යයෙන් ද, දාර්ශනික භාවයෙන් ද, දෘෂ්ටිවාදී ව ද අපූර්වත්වයෙන් අනූන නිර්මාණ බිහි කිරීමේ ශක්තිය වර්ධනය වීම.
- අවශේෂ කලා මාධ්‍යයන්ට වඩා නාට්‍ය කලාව ඉහළ තලයකට නැංවීමට ශක්තිය ඇති වීම.
- උසස් කලාත්මක ප්‍රාසංගික අත්දැකීම් ප්‍රේක්ෂකයා වෙත ප්‍රදානය කිරීමට හැකියාව ලැබීම.
- තම නිර්මාණයෙහි ඇති අඩු ලුහුඬු මහහරවා ගෙන එය ප්‍රති නිර්මාණය කිරීමේ අවස්ථාව උදා කර ගැනීම.
- කාලීන සමාජ අවශ්‍යතා සපුරා ලීමට අවශ්‍ය නම්‍යශීලී භාවය මෙන් ම නාට්‍ය ආකෘතිය රැක ගනිමින් පිළිගත් නාට්‍ය සිද්ධාන්ත ඔස්සේ නාට්‍යමය අවස්ථා ගොඩ නංවා ගැනීමට හැකියාව ඇති කර ගැනීම. එනම් යුගයේ අවශ්‍යතා හඳුනා ගෙන නිර්මාණකරණයේ යෙදීම.
- නළු වරණය මෙන් ම ඔවුන් ගේ රංගන කාර්යය ද සංවර්ධනය කර ගැනීමේ අවස්ථාව ලබා ගැනීම. ප්‍රේක්ෂක ප්‍රතිචාර මත නළු--නිළියන් ගේ ගැළපීම් නොගැළපීම් අවබෝධ කොට ගෙන ඉදිරි නිර්මාණවලදී එම ප්‍රේක්ෂක ප්‍රතිචාර පූර්වාදර්ශයක් කරගැනීම.
- ප්‍රේක්ෂක ප්‍රතිචාර මත සියලු ආනුෂංගික අංගයන්හි සාර්ථක අසාර්ථක තැන් සජීව ව දැක ධනාත්මක අදහස් පිළිබඳ තෘප්තියක් ඇති කරගත හැකිවාක් මෙන් ම ඍණාත්මක අදහස් අනුව වරද නිවරද කර ගැනීමට අවස්ථාව ලබා ගැනීම.
- ප්‍රේක්ෂකයා වේදිකාවේ කෙරෙන රංගයට දක්වන සැබෑ ප්‍රතිචාර සියැසින් දැක ඒ අනුව ඉදිරි නිෂ්පාදන කළ යුත්තේ කෙසේ ද යන්නත්, එම නාට්‍යයේ ම ඉදිරි දර්ශන තව දුරටත් සංවර්ධනය කරන්නේ කෙසේ ද යන්නත් පිළිබඳ ව සජීව ව අධ්‍යක්ෂවරයාට ම තහවුරු කර ගැනීමට ඉඩ ප්‍රස්තාව සැලසීම.
- ප්‍රේක්ෂකයා ගේ ඍජු ප්‍රතිචාර අනුව කාලීන අවශ්‍යතා හඳුනාගෙන වෙනස්වන සමාජයට ගැළපෙන පරිදි නාට්‍ය කලාවේ උන්නතිය රැකෙන පරිදි නිර්මාණ බිහි කිරීමට අවශ්‍ය ශක්තිය ඇති කර ගැනීම.
- නාට්‍ය අධ්‍යක්ෂවරයා (නිෂ්පාදකවරයා) සජීව ප්‍රේක්ෂක ප්‍රතිචාර නිසා නිරන්තරයෙන් ම නව නිර්මාණකරණයට යොමු වන්නකු බවට පත් වීම.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- වේදිකාව මත නිර්මාණය වන ප්‍රේක්ෂාව නරඹන ප්‍රේක්ෂකයා ඒ හා ඒකාත්මික කරවීම උදෙසා අධ්‍යක්ෂවරයා ගේ කාර්යභාරය පැහැදිලි කරන්න.
- ප්‍රේක්ෂකයා ගේ ප්‍රතිචාර ගුණාත්මක නාට්‍යයක් නිර්මාණය කිරීමේ දි කෙසේ බලපාන්නේ ද යන්න විග්‍රහ කරන්න.
- ප්‍රේක්ෂක ප්‍රතිචාර මඟින් නාට්‍ය නිෂ්පාදකවරයාට/අධ්‍යක්ෂවරයාට ලැබෙන ප්‍රතිලාභ විග්‍රහ කරන්න.
- ගුණාත්මක නාට්‍යයක් බිහි කිරීම සඳහා ප්‍රේක්ෂක ප්‍රතිචාර අත්‍යවශ්‍ය බව පැහැදිලි කරන්න.

නිපුණතාව 6. : නාට්‍ය හා රංග කලාව විෂයයට අදාළ සිද්ධාන්ත ප්‍රායෝගික ව අත්හදා බලමින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 6.1 : විවිධ අත්දැකීම් පාදක කොටගෙන නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- භූමිකාවක් යනු කුමක් දැයි අර්ථකථනය කරයි.
- එක් චරිතයක් තුළ විවිධ භූමිකා ඇති බව ප්‍රකාශ කරයි.
- භූමිකාවක ඇති බාහිර මෙන් ම අභ්‍යන්තර ලක්ෂණ විශ්ලේෂණය කරයි.
- සමාජ අත්දැකීම් භූමිකා නිරූපණයෙදී වැදගත් වන අයුරු විස්තර කරයි.
- විවිධ භූමිකා අතර ගොඩනැගෙන පරස්පරතා හා එකඟ වීම් නිසා නාට්‍යයේ ක්‍රියා විකාශය සිදුවන බව පවසයි.
- විවිධ ශෛලි අනුව භූමිකා නිරූපණය වන බව පෙන්වා දෙයි.

ක්‍රියාකාරකම 6.1.1.1 : භූමිකාවක් යනු කුමක් ද?

ගුණාත්මක යෙදැවුම් : නාට්‍ය පිටපත්

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : සාකච්ඡා

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පහත කරුණු ඔස්සේ සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- නවකතාකරුවකු තම කෘතියෙන් නිර්මාණය කරන්නේ චරිතයෝ ය. එහෙත් නාට්‍ය රචකයාට ළෙක් නිර්මාණය කිරීමේ දී එලෙස චරිතයක් පුළුල්ව නිර්මාණය කළ නොහැකි ය. එයට කාලය හා අවකාශය වැනි විවිධ සීමා පැනවේ. එබැවින් බොහෝ විට චරිතයක පැතිකඩ හෙවත් භූමිකා කිහිපයක් පමණක් නිර්මාණයට අදළ කර ගැනේ.

  උදා: මනමේ කුමරියගේ චරිතය තුළ මෙවැනි භූමිකා කිහිපයක් දක්නට ඇත.

  - තක්සලාවේ ඇදුරුතුමාගේ දුවණිය
  - කුමාරයාගේ ආදරයට පාත්‍ර වන පෙම්වතිය
  - කුමරුගේ විවාහක බිරිය
  - වැදි රජුගේ ආකර්ෂණයට ගොදුරු වූ කුමරිය

- භූමිකාවන් ප්‍රතිනිරූපණය කිරීමේ දී බාහිර හා අභ්‍යන්තර සමාරෝපණ සිදු වේ. එම ප්‍රවේශයෙහි සාර්ථකත්වය මත ප්‍රේක්ෂකයා භූමිකාව නිවැරදි ව හඳුනා ගනියි.

  උදා: බාහිර සමාරෝපය

  කැලණි පාලම නාට්‍යයේ චුට්ටේගේ චරිතයට අයත් අංග රචනය හා රංග වස්ත්‍රාභරණ ඔහු ජීවත් වන පරිසරයට අනුකූල ව නිර්මාණය කර ඇත.

  අභ්‍යන්තර සමාරෝපය

  චුට්ටේගේ චරිතයේ ඉරියවු, හැඟීම් ප්‍රකාශනය සහ කථන විලාසය නිර්මාණය කර ඇත්තේ ද ඔහු ජීවත් වන පරිසරයට අනුකූල ව ය.

- ඇතැම් භූමිකා නිරූපණයේ දී එක්වර ම සතෙකු හා මිනිසකු ආභ්‍යන්තරික වශයෙන් නිරූපණය කළ අවස්ථා ඇත. උදා : නරි බෑනා නාට්‍යයේ නරියාගේ චරිතය

- ස්ථානය මත ම සැම විටම භූමිකාවක් තීරණය වන්නේ නැත.

  උදා : සුබ සහ යස නාට්‍යයේ ද්වාර පාලක වන සුබ රජුගේ මිත්‍රයෙකු ලෙස රජ වාසලේ පෙනී සිටිය ද ඔහු ආභ්‍යන්තරික ව කැරලිකරුවකුගේ භූමිකාව ද රඟ දක්වයි.

- ස්ථානය මත ම සැම විට ම භූමිකාවක් තීරණය වන්නේ නැත.

  උදා: සුබ සහ යස නාට්‍යයේ ද්වාර පාලක වන සුබ රජුගේ මිත්‍රයකු ලෙස රජ වාසලේ පෙනී සිටිය ඔහු ආභ්‍යන්තරිකව කැරලිකරුවකුගේ භූමිකාව ද රඟ දක්වයි.

- සාර්ථක නාට්‍ය පෙළක් ගොඩනැගීම සඳහා එහි අන්තර්ගත චරිත තුළ විවිධ භූමිකා අතර ගැටීම ප්‍රබලව නිරූපණය විය යුතුය.

උදා:	නෝරාගේ භූමිකාව	ටෝවල්ඩ්ගේ බිරිය
		දරුවන්ගේ මව
		ලින්ඩාගේ යෙහෙළිය
		ආත්ම නිදහස සොයා යන කාන්තාව

- විවිධ භූමිකා පිළිබඳ ව ඇති සමාජ අත්දැකීම් රචකයාටත්, අධ්‍යක්ෂවරයාටත්, නළු නිළියන්ටත් සමස්ත ආනුෂංගික ශිල්පීන්ටත් නිර්මාණයේ සාර්ථකත්වය සඳහා අතිශයින් වැදගත් වේ.

- සාර්ථක භූමිකා නිරූපණයක් සඳහා ප්‍රබල නළු පෞරුෂය වැදගත් වේ. එය ඔහුගේ භූමිකාව උද්දීපනය කරයි. එසේ ම නළුවාගේ ප්‍රතිභාව සහ නිරීක්ෂණ හැකියාව ද මෙයට දායක වේ.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නිර්දිෂ්ට නාට්‍ය පෙළක චරිතයක් තෝරාගෙන එහි ඇති භූමිකාවන්හි ස්වරූපය වෙන් වෙන් වශයෙන් විස්තර කරන්න.
- ඔබට සමාජයේ හමු වන චරිත තුළ අන්තර්ගත විවිධ භූමිකා පිළිබඳ තොරතුරු රැස් කර පාඩමට අදාළ ව පන්තියේ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

නිපුණතාව 6. : නාට්‍ය හා රංග කලාව විෂයයට අදාළ සිද්ධාන්ත ප්‍රායෝගික ව අත්හදා බලමින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 6.1 : විවිධ අත්දැකීම් පාදක කොටගෙන නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- චරිතයක් නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු අවබෝධ කරගනියි.
- සාමූහික නිර්මාණකරණයට පෙලඹෙයි.
- අත්දැකීම් නිර්මාණ සඳහා භාවිත කරගන්නා අයුරු ප්‍රායෝගික ව අවබෝධ කරගනියි.
- පරිකල්පනය කරමින් චරිත, අවස්ථා ඉදිරිපත් කරයි.
- පරිකල්පන කුශලතා වර්ධනය කරගනියි.

ක්‍රියාකාරකම 6.1.1.1 : චරිත ඔස්සේ නිර්මාණකරණයට පිවිසෙමු.

ගුණාත්මක යෙදවුම් :
- ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්
  මෙම ක්‍රියාකාරකම සඳහා ප්‍රමාණවත් ඉඩක් තිබීම අවශ්‍ය වන අතර සිසුන් ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා සුදුසු ඇඳුමකින් සැරසී සිටීම වඩා ප්‍රයෝජනවත් වේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

පියවර 01 සියලු සිසුන්ට අවකාශයේ නිදහසේ ඇවිදින ලෙස පවසන්න. ඔබ ලබාදෙන සංඥාව සමඟ එකතැනක නවතින ලෙස පවසන්න.

පියවර 02 එසේ නතර වීමෙන් පසු ව යම් අපූරු චරිතයක් පිළිබඳ ව සිතන ලෙසත් එහි දී පහත දැක්වෙන කරුණු පිළිබඳ ව සැලකිලිමත් වන ලෙසත් දැනුම්වත් කරන්න.

චරිතයේ වයස
ඇවිදින ස්වභාවය
සමාන්‍යයෙන් අඳින පලඳින ආකාරය
රුචි අරුචිකම්
කතා කරන ආකාරය
එම චරිතයට අදාළ පවුලේ විස්තර

පියවර 03 ඉහත ලක්‍ෂණ සිසුන් ගේ නිර්මාණශීලී පරිකල්පනය ඔස්සේ තීරණය ගැනීමෙන් පසු දෑස් විවර කරන ලෙසත් මෙතැන් සිට ඔවුන් හැසිරිය යුත්තේ කතාබහ කළ යුත්තේ තමන් නිර්මාණය කරගත් චරිතයට අනුව බවත් මතක් කරන්න. එම චරිතයේ ජීවත් වෙමින් නිදහසේ ඇවිදින්න ඉඩ හරින්න.

පියවර 04 චරිත පහ බැගින් කණ්ඩායම් කරන්න. පුටු හතරක් අර්ධ කවාකාර ව තබා එක් පුටුවක්, ඉදිරියේ වෙන ම තබන්න.

පියවර 05 එක් එක් චරිතයට තමන් ගේ චරිතයේ ම රඟමින් ඉදිරියේ ඇති ආසනයට පැමිණ තමන් ගැන අනෙක් පිරිසට පවසන ලෙසට උපදෙස් දෙන්න. එම චරිතය පවසන දේ පිළිබඳ වත් නොපවසන දේ පිළිබඳ වත් ඉදිරියේ සිටින සිසුන්ට ප්‍රශ්න ඇසිය හැකි ය. තමන් ගේ චරිතයට අනුව ම ඒ සියල්ල එම සිසුවා කළ යුතු ය. ඉදිරියේ සිටින අය ගේ ප්‍රශ්න තාර්කික සහ ගැඹුරු වන තරමට නිරූපණය වන චරිතයට බොහෝ දේ සිතන්නට සිදු වේ.

පියවර 06 ක්‍රියාකාරකම අවසානයේ සිසුන් ගෙන් තම අත්දැකීම් පිළිබඳ අවබෝධයක් ඇති

වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 07 විශාල කැරැල්ලක් සිදුවන අවස්ථාවක තමන් නිරූපණය කළ චරිතවලින් යුත් කණ්ඩායම ගොඩනැගිල්ලක කාමරයක සිර වී සිටින්නේ යැයි සිතන ලෙස සිසුන්ට පවසන්න. එම අවස්ථාවට අදාළ චරිත මුහුණ දෙන අයුරු ක්ෂණික නිරූපණයක් ලෙස රංගනය කර දක්වන ලෙස සිසුන් යොමු කරන්න.

ක්‍රියාකාරකම් අවසානයේ සිසුන් ගේ අත්දැකීම් බෙදා හදා ගැනීම සඳහා සාකච්ඡාවක් මෙහෙයවන්න.

ඇගයීම : නිර්මාණාත්මක ක්‍රියාකාරකමේ දී තමන් ගේ කණ්ඩායමේ සිටි චරිත භාවිත කරමින් එම චරිතවල ලක්ෂණ ඉස්මතු වන සේ නාට්‍ය පිටපතක් රචනා කරන්න.

නිපුණතාව 6.0 : නාට්‍ය හා රංග කලාව විෂයට අදාළ සිද්ධාන්ත ප්‍රායෝගික ව අත්හදා බලමින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 6.1 : විවිධ අත්දැකීම් පාදක කොටගෙන නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :

- නිර්මාණශිලී ව විවිධ භූමිකාවලට අවතීර්ණ වෙයි.
- අත්දැකීම් මෙන් ම පරිකල්පන කුශලතා නිර්මාණ කාර්යය සඳහා යොදා ගනියි.
- අවධානයෙන් සහ අවබෝධයෙන් යුක්ත ව අවස්ථා නිර්මාණ සඳහා සක්‍රිය ව දායක වෙයි.
- චිත්ත ඒකාග්‍රතාව නිර්මාණ කරුවකු සතු විය යුතු බව අවබෝධ කර ගනියි.
- තාර්කික පදනමකින් යුතු ව භූමිකා නිරූපණය කරයි.
- සහයෝගයෙන් යුතු ව සාමූහික ව කටයුතු කරයි.

ක්‍රියාකාරකම 6.1.1.2 : අත්දැකීම් ඔස්සේ නිර්මාණකරණයට

ගුණාත්මක යෙදැවුම් : ප්‍රමාණවත් ඉඩක් සහිත හිස් අවකාශයක්.

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

සියලු ම සිසුන් දෙකොටසකට බෙදන්න. කණ්ඩායම් දෙකට ම නිදහසේ ඇවිද යා හැකි තරමේ වෘත්ත දෙකක් එකිනෙක ගැවෙන සේ අඳින්න

පියවර 01 සියලු ම දෙනාට නිදහසේ ඇවිද යාමට උපදෙස් දෙමින්, ගුරු භවතා ගේ අත්පොළසන් හඬත් සමඟ ක්ෂණික ව එක් වෘත්තයකට යාමට අවස්ථාව සලසන්න. වෘත්ත දෙකට සමාන ලෙස බෙදී යන තුරු නැවත නැවත එකී ක්‍රියාකාරකම කරවන්න.

පියවර 02 සිරිපාල සහ සිරියාවතී ලෙස කණ්ඩායම් නම් කර, අහඹු ලෙස "ආරච්චි" වශයෙන් කටයුතු කිරීමට සිසුවකු තෝරා ගන්න. සියලු ම දෙනා නිදහසේ ඇවිදින අතර "ආරච්චි" විසින් ලබාදෙන විධානවලට අනුරූප ව ක්‍රියාත්මක විය යුතු බව පැහැදිලි කරන්න.

සියලු ම දෙනා තනි තනි ව කිසියම් චරිතයක් අනුකරණය කළ යුතු වේ. (මහල්ලෙක්, කොරෙක්, අන්ධයෙක්....)

පියවර 03 විධානය " සිරිපාල"

එම කණ්ඩායම පමණක් මෙතෙක් නිරූපණය කළ චරිතය ක්ෂණික ව වෙනස් කළ යුතු වේ.

විධානය " සිරියාවතී"

එම කණ්ඩායම පමණක් එතෙක් රඟ දැක්වූ චරිතය වෙනස් කළ යුතු වේ.

* මෙසේ රූපණය කරන විට ආරච්චිට ඕනෑ ම යෙකු ගෙන් ප්‍රශ්න ඇසිය හැකි ය.

(නිදසුන් - නම මොකක් ද?
කොහෙ ද යන්නේ?
වයස කීය ද?

උස කීය ද?
බර කීය ද ?

ප්‍රශ්නවලට ප්‍රමාණවත් පිළිතුරක් ක්ෂණික ව සැපයිය නොහැකි වීම හා ක්ෂණික ව චරිතය වෙනස් කළ හැකි නොවීම ද නව " ආරච්චි" තනතුරට පත් වීමට හේතුවකි. එවිට එතෙක් ආරච්චි ලෙස කටයුතු කළ සිසුවා තමන් මුලින් වෙන් වූ කණ්ඩායමට එක් වේ.

පියවර 04 විධානය සිරිපාල , සිරියාවතී බස් රථය.

කණ්ඩායම් දෙක ම එක් වී බස් රථයක් නිර්මාණය කළ යුතු වේ.

විධානය සිරිපාල පීරිසිය
සිරියාවතී මල

තම කණ්ඩායමට ලැබුණු විධානයට අනුරූපී ව අදාළ වෘත්තය තුළ නිර්මාණය ඉදිරිපත් කළ යුතු වේ.

විධානය සිරිපාල, සිරියාවතී දේශපාලන රැස්වීම

මෙහි දී දෙපිරිස ම එක් වී අවස්ථාව නිර්මාණය කරන විට, ආරච්චිට පෙර සේ ම එකිනෙකා ගෙන් ප්‍රශ්න ඇසිය හැකි වේ. අනවබෝධයෙන් යුතු ව නිර්මාණය සඳහා දායක වීම හෝ ප්‍රමාණවත් පිළිතුරක් නොදීම හෝ නව 'ආරච්චි' තනතුරකට පත් වීමට හේතුවකි.

මෙම අවස්ථා නම් කිරීම ගුරු භවතාට රුචි ලෙස, නිර්මාණාත්මක ලෙස සිදු කළ හැකි ය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

යම් චරිතයක් අපූර්වත්වයෙන් යුතු ව නිර්මාණය කිරීමේ දී භාවිත කළ හැකි උපක්‍රම මොනවා දැයි සාකච්ඡා කරන්න.

නිපුණතාව 6.0 : නාට්‍ය හා රංග කලාවට අදාළ සිද්ධාන්ත ප්‍රායෝගික ව අත්හදා බලමින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 6.1 : විවිධ අත්දැකීම් පාදක කොටගෙන නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- පරිකල්පනය යනු කුමක් දැයි හඳුනාගනී.
- පරිකල්පන අභ්‍යාස යන්න විස්තර කරයි.
- පරිකල්පන අභ්‍යාස හා බැඳුණු විවිධ ප්‍රභේද වර්ග කරයි.
- පරිකල්පන කුශලතාව උපයෝගී කරගනිමින් පරිකල්පන අභ්‍යාසයවල යෙදෙයි.
- පරිකල්පන අභ්‍යාස ප්‍රභේදවලට අනුව නව නිර්මාණ ඉදිරිපත් කරයි.
- ශිෂ්‍යයන් ලත් රස වින්දනය ප්‍රකාශ කරයි.

ක්‍රියාකාරකම 6.1.1.3 : පරිකල්පන අභ්‍යාස (සාමූහික)

ගුණාත්මක යෙදවුම් : නිදහස් අවකාශය සහිත ස්ථානයක්, රංග අභ්‍යාසවලට සුදුසු සැහැල්ලු ඇඳුමක්, පරිකල්පනය කිරීමට උචිත වන තාල රහිත නිදහස හැඟීම් උත්තේජනය කළ හැකි සංගීත භාණ්ඩයක්. (සුදුසු සංගීත බණ්ඩයක් සහිත සංයුක්ත තැටියක් ද භාවිත කළ හැකි ය.)

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 01
- ශිෂ්‍යයන් අවකාශය කරා යොමු කරන්න.
- අවකාශය පුරා ඇවිදීමට සලස්වන්න.
- අංකනයට අනුව විවිධ ක්‍රියාකාරකම් සිදු කරන්න.

විධානය 1 ඇවිදින්න.
විධානය 2 ඇවිදින දිශාව ක්ෂණික ව වෙනස් කරන්න.
විධානය 3 උඩ පැන ඇඟිලි තුඩට බර වී නැවත ඇවිදින්න.
විධානය 4 වාඩි වී නැගිට නැවත ඇවිදින්න.
විධානය 5 ක්ෂණික ව හඬක් නංවා නැවත ඇවිදින්න.
විධානය 6 ඇවිදීම නතර කරන්න.
(මිනිත්තු 05ක් පමණ මෙසේ ශරීරය උණුසුම් කරවන අභ්‍යාසයකට යොමු කරන්න)

පියවර 02 ශිෂ්‍යයන් නවතින ස්ථානය අහඹු ස්ථානයක් වන අතර එම ස්ථානයේ ශිෂ්‍යයන්හට අත් පා මනා ව විහිදුවා වැතිරෙන්නට ඉඩ සලස්වා, ගැඹුරින් මනා ව හුස්ම ගැනීමට හා පහළ හෙළීමට අවධානය යොමු කරවන්න. (මිනිත්තු 05)

පියවර 03 සංගීත භාණ්ඩය සෙමෙන් වාදනය කරන්න.

පියවර 04 ගුරු භවතා විසින් ස්ථානය ප්‍රකට කරවන අභ්‍යාසයක් විස්තර කරන්න. එය සිසුන්ට ඇසෙන පරිදි මනා ව සිය කට හඬේ තානය, කට හඬේ ධ්වනි ගුණය ස්වරවල වේගය පාලනය කරමින් චිත්ත රූප මැවෙන පරිදි හඬ හසුරුවමින් විස්තර කරන්න.

ස්ථානය - මුහුදු වෙරළ

මුහුදු වෙරළට පිවිසි මිතුරෝ පිරිසකි. මුහුදු රළගෙඩි නගන හඬ ළමයින් ගේ ප්‍රීති ඝෝෂා හඬ සමඟ මුසු ව වාතලය පුරා ගිගුම් දෙයි. උණු උණු වඩේ මිල දී ගත් මිතුරෝ එකිනෙකා අතර තරගයක මෙන් බුදිති. ගල්පර මත වාඩි වී හාත්පස වෙරළ බිමේ නා නා ප්‍රකාර ඇස ගැටෙන සිදුවීම් පිළිබඳ ව දොඩති. ඇතැම්හු

සරුංගල් යවමින් තුටු වෙති. ඇතැම්හු උස් හඬ නංවා සිනාසෙමින් කතා කරමින් අත් පොළසන් දෙන්නෝ ය. වෙරළ බිම නැගෙන සුදුවන් පෙණ රැළි අතර දෙපා හොවමින් මුහුදු දියේ පා දෝවන්නෝ ය. ඇතැම්හු සැඬ රළට බිය වැදී කෑ ගසමින් දිව යන්නෝය. ඇතැම්හු ගල් පර අතර කුඩ සෙවණේ පෙම්බස් දොඩන්නෝ ය. ළමයි වෙරළේ වැලි මාලිගා තනන්නෝ ය. කොරල් කැබලි හා සිප්පි කටු සොයන්නෝ ය. ඒවායින් වැලි මාලිගා බිත්ති සරසන්නෝ ය. ඇතැම්හු රළ පෙළ අතර වැදී දිය කෙළින්නෝ ය. අයිස් ක්‍රීම් නළා, ප්‍රීති ඝෝෂා හා සාද සාමිචි කතා හඬ රළ පෙළ නගන හඬ මුසු වී ඇසේ. මිතුරෝ ගල්පර නැග නැග කෑ ගසමින් කපුටන් එළවති. එක් අයෙක් මුහුදට වැටේ. රළ පෙළ හා පොර බදිමින් ඔහු වෙරළට ඒමට යත්න දරයි. අවට සිටින සියල්ලෝ වික්ෂිප්ත දෑසින් උඩට ගත් හුස්ම බිම හෙළනු නොහී බලා සිටිති. මිතුරා ගොඩට ගැනීමට උපදෙස් දෙන සෙස්සෝ ඔහු දෙස දෑත් යොමා කෑ ගසති. මිතුරා මහ රළ ගෙඩියක් දිගේ ගොඩට ගසා ආ අතර සියල්ලෝ සැනසිලි හඬින් කතා කරති; ගොඩ ආ මිතුරා ගේ කරට අත් දමාගෙන ඔහු සනසමින් විමති දෑසින් පසු වන මිතුරා සංසිඳුවීමට යත්න දරති.

මේ ආකාරයට මෙම උදාහරණය සිසුන්ට විස්තර කරන්න. මෙය ස්ථානයක් ප්‍රමුඛ වන පරිකල්පන අභ්‍යාසයක් ලෙස හඳුන්වා දෙන්න.

පියවර 05

පහත සඳහන් ස්ථානයන් ප්‍රමුඛ වන අවස්ථා අහඹු ලෙස තෝරා ගැනීමට සලස්වා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. මෙම අවස්ථා ඉදිරිපත් කිරීමට පෙර ශිෂ්‍යයන්ට " අවස්ථාව" කතාබහ කොට සංස්කරණය කර ගැනීමට කාලය ලබා දෙන්න.

සතර අභිනය ම භාවිතයට ගත හැකි බව පැහැදිලි කරන්න.

* මූර්ති නිර්මාණය කරන ස්ථානයක්
* පොලිස් ස්ථානයක්
* පාරක් හදන ස්ථානයක්
* මල් උයනක්
* සත්ත්වෝද්‍යානයක්

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

ශිෂ්‍යන්ගෙන් වාචික හෝ ලිඛිත ව හෝ පහත සඳහන් පරිදි දැනුම් මැනීම සඳහා වන ප්‍රශ්න කිපයක් ඇසිය හැකි ය.

1. පරිකල්පන අභ්‍යාසය යන්න හඳුන්වන්න.
2. පරිකල්පන අභ්‍යාස නළු කාර්යය සඳහා වැදගත් වන ආකාරය විස්තර කරන්න.
3. පරිකල්පන අභ්‍යාස පුද්ගල පෞරුෂය නංවාලීමට ඉවහල් වන ආකාරය සාකච්ඡා කරන්න.
4. මෙබඳු පරිකල්පන අභ්‍යාස නිර්මාණය කරන්න.

නිපුණතාව 6.0 : නාට්‍ය හා රංග කලාව විෂයට අදාළ සිද්ධාන්ත ප්‍රායෝගික ව අත්හදා බලමින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 6.1 : විවිධ අත්දැකීම් පාදක කොටගෙන නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- ජීවිත අත්දැකීම් ඇසුරෙන් පරිකල්පන හැකියාව වර්ධනය කර ගනී.
- ගෘහ ආශ්‍රිත ව ඇසෙන හඬ නිර්මාණාත්මක ව නිපදවීමට උත්සාහ ගනියි.
- පවතින දෙයක් වෙනස් ආකාරයකට නිර්මාණය කිරීමට උත්සාහ දරයි.
- රූපණය මඟින් අත්දැකීම් පුළුල් කර ගැනීමට උත්සාහ දරයි.

ක්‍රියාකාරකම 6.1.1.4 : පරිකල්පන කුසලතා වර්ධනය කිරීම.

ගුණාත්මක යෙදවුම් :
- පත්තර කොළ කිහිපයක්.
- ඝන වැලි කඩදාසියක්.
- ඝන ගෝනි කැබැල්ලක්.
- මෝල් ගහක් වැනි ලීයක්.
- එළවළු කපන ලෑල්ලක්.
- අඩියක් පමණ දිග එක් පැත්තක කට්ට කපන ලද ලෑල්ලක්.
- අඩියක් පමණ දිග ඝන ලී කැබැල්ලක්

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

මිනිසා ඈත අතීතයේ සිට ම සන්නිවේදනය සඳහා ස්වකීය භාෂාව උපයෝගී කොට ගත් අතර ඒ සමඟ ම විවිධ හඬ හඳුනාගැනීමටත් හඬට ප්‍රතිචාර දැක්වීමටත් පුරුද්දක් ඇති කරගත්තේ ය. නාට්‍ය හා රංග කලාව හදාරන ශිෂ්‍යයන්ට ද ඇස, කන, නාසය , හා කට යන ශරීරාංග සන්නිවේදනය සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. නාට්‍ය පෙළක් කියැවීමේ දී අපට පෙනෙන්නේ මිනිස් චරිත, සංවාද මාර්ගයෙන් තමා ගේ ආකල්ප, අදහස්, හැඟීම් හා සිතුම් පැතුම් සන්නිවේදනය කරගන්නා ආකාරය යි.

- නළුවා හෝ නිළිය හෝ ආංගික ආභිනය මඟින් පෙළෙහි ඇති සංවාදවලට උපරිම ප්‍රකාශනයක් ලබා දෙයි. ඔහු සමාරෝපය මඟින් භූමිකාවේ ප්‍රකාශනය ප්‍රේක්ෂකයාට සන්නිවේදන කරයි. භූමිකාවක යථාර්ථය වේදිකාව මත අනුකරණය කර පෙන්වීම සඳහා තමා ඇසු දුටු දේ භාවිතයට ගත හැකි ය.

- අසන ලද ශබ්ද, දකින ලද රූප හා දර්ශන ආදිය ඇසුරෙන් අනුකරණය සඳහා නිදර්ශන සපයාගත හැකි ය.

- නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරගැනීම සඳහා යමකු විඳින, අසන, දකින අත්දැකීම් ප්‍රපංචයක් බවට පත් කරගත හැකි වේ.

- ප්‍රාථමික මිනිසා ස්වකීය අවකාශය සඳහා ගත්තේ අනුකරණ ක්‍රියාවලිය යි. ඔවුහු එමඟින් පුද්ගල අදහස් සිතුම්, පැතුම් හා හැඟීම් ප්‍රකාශ කළහ. එකල මිනිසා සිදු කළේ ශරීරය පාවිච්චි කරමින් තමන්ට ප්‍රකාශ කිරීමට අවශ්‍ය දේ අනුකරණයෙන් පෙන්වීම ය.

- පැරැණියන් ගිනිමැලයක් ගසා ඉන් නඟින දුම උපයෝගී කොටගෙන මිනිසුන් තමන් අබියසට කැඳවා ගත්හ.

- තවත් විටක "හූ වක්'' කියා තම සහයෝගයට තවෙකකු කැඳවූහ.

- කතා කිරීමට නොහැකි අයෙක් අතපය, හිස, දෑස් ආදියේ ආංගික අභිනයෙන් තව කෙනෙකුට

අදහස් ප්‍රකාශ කළහ.

- වනයේ දී ඇසෙන විවිධ හඬවල් මඟින් සතකු ගේ ශබ්දය හඳුනාගත්හ.

  උදා: ගෙරවිලි හඬින් කොටියා ද වෙන සතෙක් ද යන්න හඳුනාගත්හ.
- වැදි ජනයා ගිනිමැලයක් ගසා ඒ වටා නටමින් තමන් ගේ අත්දැකීම් අනුකරණය කොට පෙන්වූහ.
- නාට්‍යයක දී ස්වයං සන්නිවේදනය හා පුද්ගලාන්තර සන්නිවේදනය ඉතා වැදගත් වේ.
- හඬ නිපදවීමෙන් සන්නිවේදනය කරන බොහෝ අවස්ථා නාට්‍යානුසාරී රංගනයකට බෙහෙවින් ඉවහල් වේ.
- එදිනෙදා ජීවිතයේ දී අසන්නට ලැබෙන හඬ හඳුනා ගෙන එයට අදාළ පරිදි රංගයක් නිර්මාණය කර ගැනීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- මුළුතැන් ගෙයින් ඇසෙන විවිධ හඬ අනුකරණය සඳහා සිසුන් යොමු කරන්න.
  - පොල් ගෑම
  - මිරිස් ඇඹරීම
  - පිටි කෙටීම
  - පිටි හැලීම
- පොල් ගෑමේ දී නැඟෙන හඬ නිර්මාණය කිරීම සඳහා



දැති කපන ලද ලෑල්ල



ලී කැබැල්ල

දැති කපන ලද ලෑල්ලක දැති පැත්ත ලීයක ඇතිල්ලීමෙන් එම හඬ නිපදවා ගත හැකි ය.

- එළවළු කපන ලෑල්ලක් මතට සියුම් වැලි ස්වල්පයක් දමා රෝලරයකින් රෝල් කිරීමෙන් මිරිස් අඹරන හඬ නිපදවා ගත හැකි ය.
- බිමට එළන ලද ගෝනියක් මතට ලීයකින් (මෝල් ගසක් වැනි) තට්ටු කිරීමෙන් පිටි කොටන හඬ නිපදවා ගත හැකි ය.
- වැලි කඩදාසියක් බිමට (සිමෙන්ති බිමට) දමා පයින් එහා මෙහා කිරීමෙන් පිටි හලන නාදය නිපදවා ගත හැකි ය.

ක්‍රියාකාරකම 2 වන අදියර :

- මෙම උපකරණ සිසුන්ට නොපෙනෙන පරිදි ආවරණය කරන ලදස්ථානයක තබා (ඒ ආසන්නයේ) සිසුන් ට පන්තියේ හෝ ඉඩ ඇති ස්ථානයක හෝ රවුමට සිට ගැනීමට සලස්වන්න.
- ඉන් පසු නිවසේ වැඩි ම විවිධ හඬ නැඟෙන ස්ථානය කුමක් දැයි ළමයින්ගෙන් විමසන්න.
- මුළු තැන්ගෙය විවිධ හඬ නැඟෙන ප්‍රධාන ස්ථානය බව පෙන්වා දෙන්න.
- රවුමට සිටින දරුවන්ට දෑස් පියා ගන්නා ලෙස උපදෙස් දෙන්න.
- ඉන් පසු නායකයකු තෝරා උපකරණ සහිත ආවරණය වූ ස්ථානයේ ඇති විවිධ දෑ ඇසුරෙන් ඉහත කී හඬ නිපදවීමට ගුරුවරයා ඔහුට උදවු කරන්න.
- හඬ නිපදවීමට පෙර දෑස් පියාගෙන පළමු ව සියලු හඬවල් හඳුනාගන්නා ලෙස උපදෙස් දෙන්න. නිහඬ ව හඬ හඳුනා ගත් පසු දෑස් පියාගෙන ම එක් එක් හඬට අනුව අංග චලනයෙන් තමන් සිටගෙන සිටින තැන ම හිඳ ශබ්දයට අනුව ක්‍රියාව තමන්ට කැමති පරිදි අනුකරණය කර පෙන්වන ලෙස උපදෙස් දෙන්න.
- දෑස් වසා තම අනුකරණය දැක්වීමට උපදෙස් දීමෙන් නිවැරදි ව හඬට අනුව ක්‍රියාව හඳුනාගත් සිසුන්, එනම් නිවැරදි සංවේදනයන් ගෙන් යුත් සිසුන් හඳුනාගැනීමට ගුරුවරයාට හැකි වේ.

- මේ අවස්ථාවේ දී සිසුන් ගේ පරිකල්පන හැකියාව විහිදා දැක්වීමට අවස්ථාවක් ලබා දෙන්න.

  උදා: පොල් ගාන හඬ ඇසෙන විට ඔවුන් තම අත්දැකීම් අනුව වාඩි වී පොල් ගානු ඇත. මේසයට සවි කරන ලද පොල්ගාන යන්ත්‍රයෙන් පොල් ගෑම අනුකරණය කරනු ඇත.
- අයකු තම දණ හිස් උපයෝගී කොටගෙන එම ක්‍රියාව අනුකරණය කරනු ඇත.
- පොල් ගෑම, පිට කෙටීම, පිටි හැලීම, මිරිස් ඇඹරීම ආදි ක්‍රියාවන් නිරීක්ෂණය කිරීම සඳහා සිසුන් කීප දෙනකු ද යෙදවිය හැකි ය.
- සියලු අනුකරණයන් කර පෙන්වීමෙන් පසු සියලු ම සිසුන්ට දෑස් විවර කරගන්නට කියා තම තමන් පෙර දැක් වූ ආකාරයට ම ඒ ඒ ශබ්දවලට දැක්වූ අනුකරණයන් කර පෙන්වන ලෙස නැවතත් උපදෙස් දෙන්න.
- එවිට එකිනෙකා තම තමන් ගේ අනුකරණ මෙන් ම අන්‍යයන් ගේ අනුකරණ ද නිරීක්ෂණය කරනු ඇත.
- මේ ආකාරයට විවිධ හඬට අනුව කරන ක්‍රියා අනුකරණය කර පෙන්විය හැකි බවත් එම හඬ නිපදවීම සඳහා නිර්මාණාත්මක උපකරණ නිර්මාණය කළ හැකි බවත් පෙන්වා දෙන්න.
- මෙහි දී තම තමන් සතු නිර්මාණාත්මක පරිකල්පනය මේ සඳහා උපයෝගී කරගත හැකි බවත් පෙන්වා දෙන්න.
- ඉහත ශබ්ද මාරුවෙන් මාරුවට ඇසෙන්නට සලස්වා සිසුන් රංග අභ්‍යාසයකට වුව ද යොමු කළ හැකි ය.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

1. පරිසරයෙන් ඇසෙන විවිධ හඬ ප්‍රතිනිර්මාණය කරගත හැකි අයුරු ගවේෂණය කරන්න.
2. විවිධ හඬ ප්‍රතිනිර්මාණය කර ඒ ඇසුරෙන් නාට්‍යෝචිත අවස්ථා හා නාට්‍යෝචිත රංග අභ්‍යාස නිර්මාණය කරන්න.
3. ඇසෙන, පෙනෙන, දකින දේ ප්‍රතිනිර්මාණය කරමින් නව නාට්‍යෝත්පාදක අවස්ථා නිර්මාණය කරන්න.

නිපුණතාව 6.0 : නාට්‍ය හා රංගකලාව විෂයට අදාළ සිද්ධාන්ත ප්‍රායෝගික ව අත්හදා බලමින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය කරගනියි.

නිපුණතා මට්ටම 6.1 : විවිධ අත්දැකීම් පාදක කොටගෙන නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- චරිතය යන්න අර්ථ දක්වයි.
- දකින චරිත අධ්‍යයනය කිරීමට පෙලඹෙයි.
- චරිතවලට විවිධ භූමිකා පවතින බව හඳුනා ගනී.
- අත්දැකීම් විවිධ චරිත ඔස්සේ පරිකල්පනය කිරීමෙන් අපූර්ව චරිත නිර්මාණය කළ හැකි බව පිළිගනී.
- චරිතයේ පවත්නා බාහිර හා අභ්‍යන්තර ලක්ෂණ ඉස්මතු කෙරෙන පරිදි චරිතය ඉදිරිපත් කරයි.
- නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි චරිතයේ කටහඬ, අභිනය මෙහෙයවයි.
- ඉදිරිපත් කළ යුතු ශෛලිය හඳුනාගනී.
- ක්ෂණික සංවාද හා චලන නිර්මාණය කරයි.
- නිරූපණ ශිල්පියා ගේ ආත්මීය පරිකල්පනය ශාරීරික ප්‍රකාශනයක් ලෙස ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම 6.1.2.2 : විවිධ භූමිකා අපූර්වත්වයෙන් යුතු ව නිර්මාණය කරයි. (ඒකල)

ගුණාත්මක යෙදවුම් :
- විවිධ චරිත නිරූපණ කළ රූපණ ශිල්පියකු ගේ රූපණ දර්ශන සහිත දර්ශන පටයක්.

  උදා: මාලන් බ්‍රැන්ඩෝ
  රොබට් ඩී නීරෝ
  මාර්තා ග්‍රැහැම්
  අයිරාංගනී සේරසිංහ
  මාලිනී ෆොන්සේකා
  ජෝ අබේවික්‍රම
  නිදහස් අවකාශය සහිත ස්ථානයක්
  රංග අභ්‍යාස සඳහා සුදුසු වන වස්ත්‍රයක්
  රංග භාණ්ඩ ලෙස භාවිතයට ගත හැකි භාණ්ඩ කීපයක්.

ඉගැනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 01
- ශිෂ්‍යයන් අවකාශයට කැඳවන්න.
  ඔබ සපයාගත් දර්ශන පටය ශිෂ්‍යයන්ට දැකීමට සලස්වන්න. ශිෂ්‍යයන් දන්නා සමාජයේ නිරතුරු දකින විවිධ චරිතවල භූමිකා පිළිබඳ ව විමසන්න. චරිතයක් නිරූපණය කිරීමේ දී රූපණ ශිල්පියකුට වැදගත් විය හැකි ගුණාංග පිළිබඳ විස්තරයක් කරන්න.

- චරිතයක් කිසි විටක ආකස්මික නොවේ. චරිත නිරූපණය කිරීමට ප්‍රථම චරිතය අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ. චරිතයක බාහිර ස්වරූපය මෙන් ම අභ්‍යන්තර ස්වරූප පිළිබඳ නළුවා දන්නා හෝ නොදන්නා හෝ කරුණු තිබිය හැකි වුව ද නළුවකුට ස්වකීය චරිතය පිළිබඳ ව පවතින පසුබිම් තොරතුරු ඔස්සේ පරිකල්පනය කළ හැකි ය. නිරූපණ ශිල්පියා ගේ ආත්මය හා ශරීරය ඒකාත්මික වීම රූපණයේ මූලික හරය වේ.

ධවල කැන්වසයක් මත නෙක නෙක වර්ණ රටා මැවෙන්නා සේ චරිතාංගයන් පිළිබඳ නා නා ප්‍රකාර වූ පරිකල්පනයන් හට ගැනීමට නිරූපණ ශිල්පියා තුළ ආත්මීය කුශලතාවක් මෙන් ම ශිල්පිය ඥානය හා පරිකල්පන හැකියාවක් ද එක සේ පැවතිය යුතු ය.

චරිතයක් ගොඩනගා ගැනීමට ක්ෂණික ව සිදු කළ හැක්කේ සතතාභ්‍යාසයෙහි යෙදෙන නිරූපණ ශිල්පීන්ට පමණි.

නිරූපණ ශිල්පියා ගේ අධ්‍යයනය සීමා රහිත විය යුතු ය. අතිශය ග්‍රාම්‍ය කතාන්දර, ජන කවි, උපමා හෝ උපහාස කතා නැතහොත් චිත්‍ර කතා, කාටූන් කතා ද පන්සිය පනස් ජාතක පොත, ථේරී ගාථා මෙන් ම බයිබලය, හිතෝපදේශය මතු නොව සෙන් බුදු දහමේ උපමා කතා ද, නූතන චිත්‍රපට තිර කතා ද ඇතුළු ව ඡායාරූප, වාණිජකරණයේ කලබැගෑනියෙන් හෙම්බත් වූ නගර, සදාතන ග්ලැසියරයෙන් වැසුණු උත්තර ධ්‍රැවයේ සත්ත්ව සන්තතිය, සාගර පත්ලක සදාතන අන්ධකාරය, චක්‍රාවාටයෙන් ඔබ්බේ විස්මිත විශ්වය, තරු වළල්ලෙන් වැසුණු සුරගන සුන්දරත්වය, තුන් වැනි මානයෙන් එහා ලෝකය ද පිළිබඳ ව නිරූපණ ශිල්පියා ගේ පරිකල්පනයේ අසීමිත චින්තාවලියෙන් පෝෂණය වීමට අයාගත් ඇස් ඇති ව, යොමාගත් සවන් ඇති ව අතිශය ගැඹුරු උල්පතකින් උතුරන දියත්තක් මෙන් එකී පරිකල්පනය මතු කරලීමට අවැසි අධ්‍යයනවල අසීමිත ව යෙදිය යුතු වේ.

නිරූපණ ශිල්පියකු සතු මෙම අධ්‍යයනය කිරීමේ අපමණ ආශාවත් ඉන් ශිල්පියා ලබන අත්දැකීමත් නිරූපණ ශිල්පීය කුශලතාව ඔප මට්ටම් කරගැනීමට ඉවහල් වන බව පවසන්න.

නිරූපණ ශිල්පියා චරිතයක් ගොඩනැංවීමට ප්‍රථම

- කාල්පනික ව චිත්‍රය, ඡායා මාත්‍රය ගොනු කර ගත යුතු වේ.
- ස්වාධීන ව ගොඩනගා ගත් එකී ඡායාව ප්‍රශ්න කරමින්, විධාන දෙමින් සොයා යමින් ක්‍රමයෙන් ඡායාවේ අන්තයට කිඳා බැසීමට ඉඩ හැරිය යුතු වේ.
- නිරූපණ ශිල්පියා ඡායාවේ පතුලට කිඳා බසින විට ශාරීරික නම්‍යතාව, සැහැල්ලුව, නිදහස ලබාදෙන ශාරීරික බැඳීම තමා ගෙන් ම නිදහස් කොට ඡායාව තමා තුළ රෝපණය වීමට ඉඩ හැරිය යුතු වේ.
- තමා හා ඡායාව ඒකාබද්ධ වීම සිදු වූ විට තමා අත්හැර, සවිඥානක බව පමණක් තබා ගනිමින් ඡායාවට තමා පාලනය කිරීමට ඉඩ දිය යුතු වේ.
- සැම විට ම චරිතයක ස්වරූපය විසින් සිද්ධියට අදාළ පරිසරය ද මවනු ලැබේ.
- පරිසරය මැවීමට නිරූපණ ශිල්පියා ගේ වචනය, ක්‍රියාව හා චලනය ද අවශ්‍ය වේ.
- චරිතය හා පරිසරය ද ක්‍රියාව උද්දීපනය කිරීමට අවශ්‍ය ම වචනය, භාෂාව පමණක් නිරූපණ ශිල්පියකු ගේ මුවට ගලා ආ යුතු වේ. කුමක් නිසා ද වචනවලින් පරිසරයට හා ක්‍රියාවට උචිත නොවන අනවශ්‍ය පාණ්ඩිත්‍යයක් හෝ නොගැළපීමක් හෝ ඇති විය හැකි නිසා ය. ඒ සඳහා නිරූපණ ශිල්පියා අතිශයින් අවංක ව හා නිවැරදි ව සිද්ධියට අනුගත ව චරිතය හා පරිසරය තුළ තමා ගේ ආත්මය ප්‍රතිෂ්ඨාපනය කළ යුතු වේ.

  ශාරීරික චලනය, පරිසරය මැවීම, වචනයේ ඖචිත්‍යය, කටහඬේ තානය, වේගය, රිද්මය, හා භාවය චරිතයට උචිත ලෙස ගොනු වීමට නිරූපණ ශිල්පියා කය හා ආත්මය සමඟ බැඳුණු අප්‍රමාණ අසමතුලිත බැඳීම් හා කායික අනම්‍යතාවලින් මිදිය යුතු වේ.

- දැන් ඔබ සූදානම්, එසේ නම් මතු කියැවෙන චරිත හා චරිත තුළ විවිධ භූමිකාවලට ඔබ හැසිරවීමට ඉඩ දෙන්න.

  අවකාශයට කැඳවූ ශිෂ්‍යයන් පොළොව මත දිගා කරවන්න. සංගීත භාණ්ඩයක් වාදනය කරවන්න. එය නිදහස් තාල රහිත අඛණ්ඩ ව රිද්මය ගලා යන සංගීතයක් වන්නේ නම් මැනවි. වාදනය ශිෂ්‍යයා ගේ විසිරුණු මනස එක් තැන් කරනු ඇත. මිනිත්තු 10ක් පමණ ශිෂ්‍යයා එම කාර්යයේ නිරත කරවා රවුමකට වාඩි කරවන්න.

- පහතින් දැක්වෙන චරිත අහඹු ලෙස ශිෂ්‍යයන්ට තෝරා ගැනීමට අවස්ථාව සලසන්න.
- තෝරා ගනු ලබන චරිත ගොඩනැඟීම සඳහා ශිෂ්‍යයන්ට කාලය ලබා දෙන්න.
- ඉදිරිපත් කිරීම සඳහා කාලය අවකාශය සලසන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කරන ලද චරිත නිරූපණ අගයන්න. අගය කිරීම මිස අගය නොකිරීමට කිසිවක් තිබිය නොහැකි ය. කුමක් නිසා ද ඔවුන් නිරූපණ ශිල්පින් නො ව ශිෂ්‍යයන් වන බැවිනි. එනමුත් පහත නිර්ණායක චරිත නිරූපණයේ ගුණාත්මක බව මැනීමට ඉවහල් වනු ඇත.

නිර්ණායක :

1. ඉදිරිපත් කරනු ලබන චරිතයට බාහිර ව හා අභ්‍යන්තර ව සමාරෝපය වීම.
2. චරිතයේ ස්වරූපය ඉදිරිපත් කරන ශෛලිය
3. චරිතයට හා ශෛලියට අනුගත වී පරිසරය මැවීම.
4. චරිතයට හා ශෛලියට අනුගත වී පරිසරය මැවීම.
5. අනෙක් චරිත සමඟ පවත්වන අන්තඃ සම්බන්ධතාව

1. දස වසරකට පසු සිරගෙයින් නිදහස ලැබූ අයෙක්
2. පුනරුත්ථාපනය වූ මත්ද්‍රව්‍ය ලෝලියෙක්
3. පවුලේ වගකීම් නිසා උපැවිදි වූ අයෙක්
4. මරණයට නියම වූ කවියෙක්
5. ස්වාමියා මළ දෙදරු මවක්
6. උයන් පල්ලෙක්
7. ජනපති බිරිය
8. තරගය පැරදුණු භාවා
9. පල් වු වතුර බිව් රිලවා
10. වැඩ බැරි දාස
11. සොරකම වැරදුණු හොරා

ඉහත චරිත අහඹු ලෙස තෝරා ගැනීමට ඉඩ සලසා ඉහත නිර්ණායක මත පදනම් ව ලකුණු ලබා දෙන්න. ශිෂ්‍යයන්ට චරිත නිරූපණය කිරීම සඳහා වන ගුණාංග හා කුශලතා වර්ධනය කළ හැකි වන පරිදි උපදෙස් දී චරිත නිරූපණ, චරිතාංග නිරූපණ දැක්වෙන චිත්‍රපට, නාට්‍ය නැරඹීමට අවස්ථාව උදා කරන්න.

නිපුණතාව 6.0 : නාට්‍ය හා රංග කලාව විෂයයට අදාළ සිද්ධාන්ත ප්‍රායෝගික ව අත්හදා බලමින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 6.1 : විවිධ අත්දැකීම් පාදක කොටගෙන නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- විවිධ මිනිසුන් ගේ චරිත ස්වභාවයන් අවබෝධ කර ගැනීමට උත්සාහ දරයි.
- විවිධ භූමිකා හඳුනාගෙන නිරූපණය කරයි.
- භූමිකා නිරූපණය සඳහා පරිකල්පන ශක්තිය උපයෝගී කර ගනියි.
- යම් භූමිකාවක් අපූර්වත්වයෙන් යුක්ත ව නිර්මාණය කරයි.
- චරිත කිහිපයක් ඇසුරෙන් නාට්‍යෝචිත අවස්ථා නිරූපණය කරයි.

ක්‍රියාකාරකම 6.1.2.3 : විවිධ භූමිකා අපූර්වත්වයෙන් යුතු ව නිර්මාණය කරමු.

ගුණාත්මක යෙදවුම් :
- නාට්‍ය ජවනිකා (සමූහ) අතුරින් ඡායාරූප හෝ දෘශ්‍ය පට.
- විවිධ චරිත සමූහයක් සහිත චිත්‍ර
- අඹන්වෙල රාලගේ 'සාක්කියක්' පද්‍ය පන්තිය ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ඡායාස්ථ පිටපත්

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :

පියවර 1

- රැස් කර ගත් දෘශ්‍යාධාර නැරඹීමට සලස්වමින්, සිසුන් ට නියමිත පාඩම සඳහා යොමු කරගන්න.

  පහත සඳහන් කරුණු ද ඇතුළත් ව නාට්‍යමය අවස්ථාවක් නිරූපණය කිරීම සඳහා අවශ්‍ය මූලික දැනුම ලබා දෙන්න. මෙහි දී නළු කාර්යයේ වැදගත්කම අවධාරණය කෙරේ.

- නාට්‍යය නමැති සාමූහික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා අනුපමේය මෙහෙවරක යෙදෙන්නෝ නළුනිළියෝ ය.
- ඔවුහු නාට්‍ය පෙළ කියැවීමෙන් ලබාගන්නා අත්දැකීම අර්ථවත් ව හා රසවත් බවින් පරිපූර්ණ ව ප්‍රේක්ෂකයා අබිමුවට ගෙන ඒමට බැඳී සිටිති. එය ඔවුන් ගේ වගකීම ද වන්නේ ය.
- ඒ සඳහා ඔවුන්ට දැඩි කැපවීමක් කිරීමට මෙන් ම දැඩි ශ්‍රමයක් වැය කිරීමට ද සිදු වේ. රූපවාහිණී නාට්‍යයක, චිත්‍රපටයක මෙන් නොව නාට්‍යයක රඟපාන නළුවාට හෝ නිළියට හෝ සෘජු ව ම, ක්ෂණික ව මෙන් ම සජීව ව ප්‍රේක්ෂකයා හා සහසම්බන්ධතා පවත්වා ගනිමින් භූමිකා රංගනයේ යෙදීමට සිදු වේ.
- නාට්‍යයක රූපණ ශිල්පියා නාට්‍ය පෙළෙහි එන භූමිකා පෙළෙහි සඳහන් වචන, සංවාද, චරිත ස්වභාවයන්, නාට්‍යෝචිත අවස්ථා ආදී සියල්ල පිළිබඳ ව අවබෝධයෙන් යුක්ත ව ඉදිරිපත් කළ යුතු වේ.
- නාට්‍යයක රූපණ ශිල්පියා මඟින් නාට්‍යයේ සියලු ආනුෂංගික අංග අර්ථවත් වේ. රංග වස්ත්‍ර, රංගාලෝකය, සංවාද, ගීත, ආදී සියල්ලට ම ජීවය ලැබෙන්නේ නළු කාර්ය භාරය හේතුවෙනි.
- ප්‍රේක්ෂකයා වේදිකාව මත දකින භූමිකාව හා ඒකාත්මික වීමට නම් විශ්වසනීය ලෙස රූපණය ඉදිරිපත් කළ යුතු වේ.

පියවර 2

- නළු කාර්යය ප්‍රබල කර ගැනීමට ඔහු සතු විය යුතු ලක්ෂණ කෙරෙහි ද අවධානය යොමු කරන්න.
- භූමිකාවක් යනු චරිතයක විවිධ පැතිකඩ වේ. නාට්‍යයකට ගැඹුරු අරුතක් ලැබෙන්නේ භූමිකා හේතුකොට ගෙන ය. චරිත සංකීර්ණ වන්නේ ඔවුන්ට විවිධ භූමිකා ලෙස පෙනී සිටීමට සිදුවන බැවිනි. නිදසුන් වශයෙන් "රුකඩ ගෙදර" නාට්‍යයෙහි මිතුරියක ලෙස නෝරාට ලින්ඩා මහත්මියට උදවු කිරීමට සිදු වෙයි. ඇය බිරියක ලෙස අර්බුදයකට මුහුණ දීමට එය හේතුවක් වෙයි.
- ඒ අනුව චරිතයක ඇතුළත් භූමිකාවල සංකීර්ණත්වය අවබෝධ කර ගත යුතු වෙයි.
- තමන් රඟපාන භූමිකාවට ප්‍රවිෂ්ට ව, එහි ආත්මීය හැසිරීම් රටා අවබෝධ කර ගැනීම වැදගත් ය.
- නාට්‍ය ශෛලිය පිළිබඳ පූර්ණ අවබෝධය ද නළුවා සතු විය යුතු ය.
- භූමිකාව අපූර්වත්වයෙන් යුක්ත ව ඉදිරිපත් කිරීම සඳහා නිර්මාණාත්මක චින්තනය මෙන් ම පරිකල්පන කුශලතාව ද තිබිය යුතු වේ.

පියවර 3

- ඡායාස්ථ පද්‍ය පන්තිය සිසුන් අතර බෙදා දී ඒ පිළිබඳ හා කළ යුතු කාර්යය පිළිබඳ ව දැනුම්වත් කරන්න.
- විකට රසයෙන් පිරිපුන් මෙම පද්‍ය පන්තිය නුවර යුගයට අයත් අඹන්වෙල රාල නම් කවියා විසින් ලියන ලද 'සාක්කියක්' වෙයි. මෙය විවිධ චරිත නිරූපණය සඳහා දායක කරගත හැකිය.
- ඒ ඒ කවිවල අර්ථ වටහා ගැනීමට ද සහාය වන්න.
- පළමු වන කවියේ එන පරිදි කළු, සපු, සවුන්දරී, ලමි, කුමි, බවුන්තරි, කිරි, ගිරි, සුවන්තරි යන චරිත ගැමි කාන්තාවන් මෙන් සැරසී කෝලාහලයකට සූදානම් ව වේදිකාවට පැමිණ ආංගික අභිනයෙන් දබරයක ස්වරූපයට රූපණය කළ හැකි ය.
- දෙවන කවියෙන් දැක්වෙන අර්ථ නිරූපණයට අනුව එකිනෙකා දෑත් වනමින්, ඇඟිලි උරුක්කරමින්, ගල්වැලි දමා ගසමින් තදින් දබර කරන ස්වරූපය දැක්වේ.
- තෙවන කවියෙන් පැවසෙන්නේ ඇඹුල්දෙණියේ කිරා නමැත්තා ගේ බිරිය, පිරිසේ සිටි දිඹුල්මලීට ටොක්කක් ඇන්නෙන් එය දැඩි වේදනාවක් ගෙනදුන් බව ය.
- සිවුවන කවියෙන් දැක්වෙන්නේ (නැඹුල් යකුට...) යක්ෂයන්ට නිතර පුද පූජා කරන දියෝගු නමැත්තා දුවගෙන ගොස් කිඹුලකු සේ දියට පැන්න ආකාරය ය.
- පස් වන පද්‍යයෙන් කියැවෙන්නේ නල්ලගෙදර සෙල්ලයියා ගේ අඹුව ගුල්ලන් නොකෑ, හොඳ පොල්ලක් ගෙන "බල්ලකු පන්නන අයුරින්" පහරදෙන බවයි.
- හයවන කවියෙන්, දියෝගු බල්ලකු මෙන් වල්ල කැලයට පැන දිවූ බව කියැවෙයි.
- අට වන කවියෙන් දැක්වෙන්නේ කෙක්කකින් පමණක් නොව ටොක්කකින් ද පහර කා ලිබ්බොක්කට පැන්න ආකාරයයි.
- නව වන කවියෙන් දැක්වෙන්නේ, වත්තල කළුවා ගේ අඹුව නරක/අසභ්‍ය වචන කියමින්, වත්ත පහළ තුබූ කිතුල් පිත්තක් වනවනා පැමිණි බව ය.
- දහ වන පැදියෙන් කියැවෙන්නේ, කිතුල් පික්තෙන් පිටට දුන් පහරින් පිට පුපුරා ගිය බැවින් අධික වේදනාවෙන් යුතු ව අත්තන කැලයට දිවූ බව ය.

පියවර 4

- මෙම අවස්ථා සියල්ල පාදක කරගෙන ගම්මැද කෝලාහලයක ස්වරූපයක් හාස්‍යෝත්පාදක ව නිර්මාණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  මෙම පද්‍ය පන්තියේ එන අනුප්‍රාසයන් මතු කෙරෙන ගීතමය චමත්කාරය ද සැළකිල්ලට ගනිමින්, ගම්බද නූගත් පිරිසක් සුළු ප්‍රශ්නයක් අරබයා දබර කරගන්නා ආකාරය රූපණය කිරීමට උපදෙස් සපයන්න.
- ගායක කණ්ඩායමක් එක් එක් කවිය ගායනය කරද්දී ඊට අදාළ රූපණය ඉදිරිපත් කිරීමට ද හැකි ය.
- කවි පන්තියෙන් දැක්වෙන අවස්ථා ආංගික අභිනය පමණක් භාවිත කොට නිරූපණය කිරීමට ද හැකි ය.
- සියලු කවිවල දැක්වෙන අවස්ථා එක්කොට නිහඬ ව කෙරෙන දබරයක් ලෙස ද ඉදිරිපත් කළ හැකි ය.
- දබරය අවසානයේ සියලු දෙනා ම ගීතයේ එන "ඔහොයියා අවුල් නාද සපිරිවර්ධනේ දින දින" යන කොටස ගයමින්, සතුටින්, මිත්‍ර ලීලාවෙන් විසිර යාමෙන් රූපණය අවසන් කළ හැකි ය. ගැමියන්ගේ දබර පවත්නේ සුළු මොහොතකට පමණක් බව එමඟින් ගම්‍යමාන කරවයි.

ඇගයීම

: වෙනත් පද්‍ය පන්ති, අවස්ථා නිරූපණයට ගැළපෙන අයුරින් සකසා, අපූර්වත්වයෙන් යුතු නිර්මාණ ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.

- "සරා ගොයියා හරි මිනිහා....."
- "තේ කුඩය පිටේ බැඳන්......."
- "බඩගිනි වෙලා මා ගිය කල පුතුගේ ගෙට....."
- "අල්ලා ගෙන නෙරිය අතකින්....."
- "අකුරට යනවයි කියලා ටිකිරි අයිය බැදිවල ම යි....."
- "අයියලා සහ අක්කලා නංගි මල්ලී එක් වෙලා
  අහන්න මේ පොඩි කථාව එන්නකො මෙහි රොක් වෙලා....."

අඹන්වෙල රාළ
සාක්කියක්

නුවර කාලයට අයත් මේ කවියා සෑහෙන කීර්තියක් ලබා සිටින්නෙකි. විකට රසයෙන් පරිපෝෂිත පහත සඳහන් කවි පෙළ එයට අයත් වෘත්තයෙන් කියවා බලන්න.

කලුත් සපුත් සවුන්   දරිත්
ලමිත් කුමිත් බවුන්   තරිත්
කිරිත් ගිරිත් සුවන්   තරින්
ඇවිත් කළ රොසේ ඔහොයියා
අවුල් නාද සපිරිවර්දනේ
දින දින අවුල් නාද සපිරිවර්දනේ

පසුත් පෙරත් දෙයත් වරත්
රකිත් සිටිත් අනිත් බණිත්
ගසත් ඉසිත් ගලුත් වැලිත්
මමත් දුටු ලෙසේ - ඔහොයියා
අවුල් නාද සපිරිවර්දනේ
දින දින අවුල් නාද සපිරිවර්දනේ

ඇඹුල් දෙණියෙ කිරාගෙ අඹු
දිඹුල් මලිට ඇන්න ටොක්ක
බුබුල් නැගුණි හිස හැම තැන
ඇඹුල් දෙසි ලෙසේ - ඔහොයියා
අවුල් නාද සපිරිවර්දනේ
දින දින අවුල් නාද සපිරිවර්දනේ
නැඹුල් යකුට නිති පුද කොට
එකල් දියොගු දුවගෙන ගොස්
දිඹුල් දියට කඩා පැනපි
කිඹුල් මොටකු සේ - ඔහොයියා
අවුල් නාද සපිරිවර්දනේ
දින දින අවුල් නාද සපිරිවර්දනේ
නල්ල ගෙදර සෙල්ලගෙ අඹු
එතන ම ඉඳ ගුල්ලො නොවිදි
පොල්ලක් ගෙන "බල්ල" කියා
ගැසී නොව ලසේ - ඔහොයියා
අවුල් නාද සපිරිවර්දනේ
දින දින අවුල් නාද සපිරිවර්දනේ

ඉල්ල කකා ආඬින් වෙත
කොල්ල සේ ම ගොස් දියෝගු
බල්ල වගේ පැන්නයි ගොස්
වල්ල කැලයටා - ඔහොයියා
අවුල් නාද සපිරිවර්දනේ
දින දින අවුල් නාද සපිරිවර්දනේ

ටොක්ක නොහැර ඉන්නා බඩ
බක්ක කියන එකාගෙ දුව
අක්ක නුඹත් එනව ද අන්
නක්ක නෙළුමටා - ඔහොයියා
අවුල් නාද සපිරිවර්දනේ
දින දින අවුල් නාද සපිරිවර්දනේ

කෙක්ක අගින් ඇන්න කලට
හක්ක දෙපිට දත් පෙනුණිය
ටොක්ක කකා පැන්නයි ළිබ්-
බොක්ක ඇතුළටා - ඔහොයියා
අවුල් නාද සපිරිවර්දනේ
දින දින අවුල් නාද සපිරිවර්දනේ

වත්ත ල කළුවාගෙ අඹුව
තිත්ත කතාවෙන් බැණ බැණ
වත්ත පහළ තිබුණ කිතුල්
පිත්ත වන වනා - ඔහොයියා
අවුල් නාද සපිරිවර්දනේ
දින දින අවුල් නාද සපිරිවර්දනේ

පැත්ත පිටට දුන් කල හම්-
පොත්ත ඉගිළි හඬක්
අත්තන කැලයට දිව්වේ
චිත්ත බිය ගෙනා - ඔහොයියා
අවුල් නාද සපිරිවර්දනේ
දින දින අවුල් නාද සපිරිවර්දනේ

නිපුණතාව 6.0 : නාට්‍ය හා රංග කලාව විෂයයට අදාළ සිද්ධාන්ත ප්‍රායෝගික ව අත්හදා බලමින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 6.1 : විවිධ අත්දැකීම් පාදක කොට ගෙන නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- භූමිකා නිරූපණය සඳහා පරිකල්පන කුශලතා භාවිතයට ගනියි.
- චරිතයක් වේදිකාව මත ගොඩනැගීමේ දී තර්කය හා අවබෝධය අවශ්‍ය බව පෙන්වා දෙයි.
- චරිත, සිදුවීම්, අවස්ථා තාර්කික ව නිර්මාණය කරයි.
- විවිධ භූමිකා අපූර්වත්වයෙන් යුතු ව නිර්මාණය කරයි.
- අවස්ථාවට අනුගත වෙමින් විවිධ චරිත නිරූපණය කර රූපණ කුශලතා ප්‍රදර්ශනය කරයි.
- රංගනයේ අපූර්වත්වය විවිධ මාන ඔස්සේ දකියි.

ක්‍රියාකාරකම 6.1.1. : තාර්කික වාග් හරඹයකින් රඟුමක් පාමු.

ගුණාත්මක යෙදැවුම් :
- විවිධ භූමිකා රංගන ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය පට
- විවිධ නාට්‍ය කෘති / දෘශ්‍ය පට
- විවිධ භූමිකාවල පින්තූර සහිත පත්‍රිකා/පොත්/සඟරා

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

මෙය නිර්මාණාත්මක ක්‍රියාකාරකමක් බැවින් පළමුවෙන් ම ශරීරය උණුසුම් කිරීමේ අභ්‍යාසවල නිරත වී රංගනයට සූදානම් වීම වඩාත් යෝග්‍ය වේ.

පියවර 1
- සිසුන් දෙදෙනකු අහඹු ලෙස ඉදිරියට ගන්න. එක් සිසුවකු A ලෙසත් අනෙක් සිසුවා B ලෙසත් නම් කරන්න.

පියවර 2
- A සිසුවා සඳහන් කරන චරිතය B සිසුවාත්, B සිසුවා සඳහන් කරන චරිතය A සිසුවාත් නිරූපණය කළ යුතු ය.

උදා: A - මං දෙවි කෙනෙක්

මේ අවස්ථාවේ දී B සිසුවා දෙවි කෙනකු ලෙස රඟන්නට පටන් ගනියි. එයට අනුරූප ව A සිසුවා ද රංගනයට එක් වේ.

මෙම රංගනයේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කළ යුතු බව අවධාරණය කරන්න.

- පළමුවෙන් රංගනය ඉදිරිපත් කරන චරිතයට ගැළපෙන ලෙස දෙවැන්නා චරිතය නිර්මාණය කර ගැනීම හා සමාරෝපය වීම.
- චරිතද්වයේ ස්වභාවය සහ අවශ්‍යතාවන් අතර ප්‍රතිවිරෝධ මතුවන ලෙස සංවාද ගොඩ නැගීම.
- සමස්ත සිදුවීම විශ්වසනීයත්වයෙන් යුතු ව ගොඩ නැගීම.

පියවර 3
- ඉහත පරිදි අවස්ථාව රඟන අතර B ශිෂ්‍යයා වෙනත් චරිතයක් නම් කළ හැකි ය. එම අවස්ථාවේ දී ද පෙර සේ ම A සිසුවා ද වෙනත් චරිතයක් නම් කරයි.

එවිට එම චරිතද්වය සහිත අවස්ථාව එසැණින් නිර්මාණය විය යුතු ය. එසේ ම තාර්කික විය යුතු ය.

පියවර 4
- සිසුන් දෙදෙනෙකු ගේ රංගන ඉදිරිපත් කිරීමෙන් පසු අනෙක් සිසුන් සමඟ එම ගොඩනැගුණු අවස්ථාවේ. චරිත, හා සංවාද අතර තිබූ තාර්කික සම්බන්ධය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- මෙම ක්‍රියාකාරකම නැවතත් අහඹු ලෙස සිසුන් සම්බන්ධ කර ගනිමින් සිදු කළ හැකි ය.

පියවර 5
- A හෝ B හෝ සිසුවා අවස්ථාවට අනුව දෙබසක් කීමට අපොහොසත් වූ විටක දී අනෙක් සිසුවාට චරිතයකට සමාරෝප වන ලෙස පවසා මුල සිට වෙනත් අවස්ථාවක් ගොඩනැඟිය හැකි ය.

පියවර 6
- ක්‍රියාකාරකම අවසානයේ සිසුන්ගේ අත්දැකීම් සාකච්ඡා කරන්න

උදා : A මං දෙවියෙක්

B මං යාචකයෙක්

(මෙහි දි A යාචකයා බවටත් B දෙවියා බවටත් අභ්‍යන්තර ව සමාරෝප වේ.)

A - දවස තිස්සෙ ම ලෝකෙ වටේ රවුම් ගහලා පඬුපුල් ආසනේ වාඩි වුණා විතරයි. මේක රත් වෙන්න ගත්තා. මට පැ දෙකතුනක් වත් නිදාගන්න දෙන්නේ නැද්ද?

B - අනේ එහෙම කියන්න එපා දෙයියනේ. ඔබ වහන්සේ පත් කරලා තියෙන්නේ අපි ගැන බලන්න නේ

A - මේක යක්ෂ කතාවක් නේ. මෙච්චර අමාරුවෙන් දිව්‍ය ලෝකෙට ඇවිල්ලා විනාඩියක් වත් ඇස්දෙක පියාගන්න වාසනාවක් නැද්ද මට.

B - ඔන්න ඔන්න දෙයියනේ. අපිට තමයි ඔහොම කියන්නේ. ඇයි? මල් වට්ටි, පලතුරු වට්ටි අපි ළඟ නැති හින්ද ද? දෙයියන්ට දෙන්න තියා දවස් ගානකින් අපිට කන්ඩ වත් මොකුත් නෑ.

A - මේ නර පණුවා අහලා නැද්ද හම්බවෙන්නේ පුදන්නන්ට කියලා (සෙමෙන් සමීපයට පැමිණ) ඇත්තට ම ළඟ නැද්ද?

(මෙලෙස සිසුනට අවශ්‍ය පරිකල්පනය කරමින් සංවාද තාර්කික ව ගළපමින් අවස්ථා නිර්මාණය කළ හැකි ය.)

- මෙම ක්‍රියාකාරකම A සිසුන් දෙදෙනෙකු සහ B සිසුන් දෙදෙනෙකු වශයෙන් ද යොදාගෙන රංගනයේ යෙදවිය හැකි ය.

පැවරුම :

1. ක්‍රියාකාරකමේ සඳහන් පරිදි අක්ෂර පිළිවෙළ අනුව (A , B) දෙබස් යොදාගනිමින් කෙටි නාට්‍යමය අවස්ථා පිටපත් ලෙස රචනා කරන්න.
2. නිර්මාණය තුළ අවස්ථාවල සංවාද ඛණ්ඩ භාවිත කිරීමට අවස්ථාව ලබා දී එම චරිත එසේ හැසිරීමට හේතු තාර්කික ව දක්වමින් අදාළ චරිත පිළිබඳ විවරණයක් කරන්න.

නිපුණතාව 6.0 : නාට්‍ය හා රංග කලාව විෂයයට අදාළ සිද්ධාන්ත ප්‍රායෝගිකව අත්හදා බලමින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය කරගනියි.

නිපුණතා මට්ටම 6.1 : විවිධ අත්දැකීම් පාදක කොට ගෙන නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගැනුම් පල :
- චරිතයක් යන්න අර්ථකථනය කරයි.
- චරිතයක භූමිකා හඳුනාගෙන, එකී භූමිකා අපූර්වත්වයෙන් නිරූපණය කරයි.
- භෞතික ලෝකයේ පවත්නා චරිත මෙන් ම භෞතික ලෝකයෙන් ඔබ්බෙහි පවත්නා චරිතවල ස්වරූප පරිකල්පනය කරයි.
- බාහිර හා අභ්‍යන්තර ස්වරූප ඉස්මතු කෙරෙන පරිදි භූමිකා නිරූපණය කරයි.
- විවිධත්වයෙන් යුතු චරිතවල අන්තඃ සම්බන්ධතාව ඉස්මතු කෙරෙන පරිදි චරිත නිරූපණය කරයි.

ක්‍රියාකාරකම 6.1.2. : විවිධ භූමිකා අපූර්වත්වයෙන් යුතුව නිර්මාණය කරමු. (සමූහ)

ගුණාත්මක යෙදැවුම් :
- විවිධ භූමිකා ඉදිරිපත් කෙරෙන ආකාරයේ සමූහ දර්ශනයක් සහිත දෘශ්‍ය පට.
- විවිධ චරිත පිළිබිඹු කෙරෙන ආකාරයේ ඡායාරූප නැතහොත් දෘශ්‍ය පට
- රංග භාණ්ඩ ලෙස භාවිත කළ හැකි, පහසුවෙන් සපයාගත හැකි භාණ්ඩ කිහිපයක්
- නිදහස් අවකාශයක් සහිත ස්ථානයක්
- විවිධ සංගීත බණ්ඩ ඇතුළත් සංගීත හඬ පට

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 1
- නිදහස් අවකාශය වෙත ගොස්, ගුණාත්මක යෙදැවුම් වශයෙන් රැස් කරගත් රූප හා දෘශ්‍ය පට දර්ශන වෙත සිසුන් යොමු කරමින්, පාඩම කෙරෙහි අවධානය ලබා ගන්න.
- දෛනික ජීවිතයේ දී හමු වන මිනිස් චරිත, ඔවුන් ගේ භූමිකාවල ස්වරූප පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- නාට්‍යෝචිත අවස්ථාවක් නිරූපණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කෙරෙහි ද අවධානය යොමු කරවන්න.
  - චරිත නිර්මාණය වන්නේ භූමිකා එක් වීමෙන් බව.
  - චරිතයක පවත්නා විවිධ භූමිකා මතු වීමට අනෙක් චරිතවලින් ලැබෙන සහාය.
  - එම විවිධ චරිත, නාට්‍යමය අවස්ථාවක් තුළ අන්තඃ ක්‍රියා කිරීමෙන් (Act & React) චරිතවල පවත්නා බාහිර හා අභ්‍යන්තර ගුණාංග පිළිබිඹු වන බව.
- එලෙස සක්‍රිය වූ භූමිකා මගින් අර්ථාන්විත ප්‍රේක්ෂාවක් ඇති කෙරෙන බව.

පියවර 2
- සමූහ නිරූපණයක් සඳහා පහත දැක්වෙන අවස්ථාව ප්‍රතිනිර්මාණය කිරීමට උපදෙස් ලබාදෙමින් සහය වන්න.

- මහල් නිවාස සංකීර්ණයක ඇති කාමරයකි. මිතුරෝ කිහිපදෙනෙක් උපන් දින සාදයක් සඳහා සූදානම් වෙති. උපන් දිනය හිමි තම සගයා පුදුමයට පත් කිරීම ඔවුන් ගේ අදහස වන අතර, මිතුරා පුදුම වන හැටි සිතමින් ඔවුහු සතුටු වෙති. අවශ්‍ය කළමනා යුහු ව සකස් කරති. මිතුරා ගේ ප්‍රමාදය කාගේත් පසුතැවීමටත්, කුසගිනි වැඩි කිරීමටත් හේතු වී තිබේ.

  එකෙණෙහි ම උපන් දිනය හිමි මිතුරා තුවක්කුවක් අතැති ව ලේ වැකි දැතින් කලබලයෙන් කාමරයට ඇතුළු වෙයි.

  සෙස්සෝ අතිශයින් කලබලයට, වික්ෂිප්ත භාවයට පත් වෙති.

පියවර 3

- අවස්ථාව ගොඩ නඟා, නිර්මාණය ඉදිරිපත් කිරීමට අවශ්‍ය කාලය ලබා දෙමින් ගුණාත්මක යෙදැවුම් වන භාණ්ඩ හා සංගීත ඛණ්ඩ සපයමින් ඉඩ සලසන්න. අගය කරන්න. සංශෝධනය විය යුතු ස්ථාන පහදා දෙන්න.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නාට්‍යෝචිත අවස්ථා ප්‍රතිනිර්මාණය කිරීමට සුදුසු මාතෘකා පසු ඇගැයීම් ලෙස ලබා දෙන්න.

  ගමනාගමන පහසුකම් නොමැති නගරයෙන් පිටත ස්ථානයක සිට නගරයට යාම සඳහා බලා සිටින, විවිධ අවශ්‍යතා සහිත ගම්වැසියෝ.

  ප්‍රාථමික පාසලක, ප්‍රාථමික පන්තිවල දරුවන් පාසල නිමා වී එන තෙක් බලා සිටින දෙමාපියෝ.

  දීර්ඝ කාලීන ව නොවිසඳුණ මිනිමැරුම් නඩුවක අවසාන විනිශ්චය දෙන දිනයේ දී විනිසුරුවන් පැමිණෙන තෙක් බලා සිටින මාධ්‍යවේදීහු.

නිපුණතාව 7.0 : නාට්‍ය හා රංග කලාව විෂයයට අනුබද්ධ ආනුෂංගික කලාවන් අධ්‍යයනය කර වෘත්තීය කුශලතා සංවර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 7.1 : ආනුෂංගික කලා පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 08

ඉගැනුම් පල :
- ආනුෂංගික අංග පිළිබඳ අවබෝධයක් සහිත ව තෝරාගත් නාට්‍ය පිටපතක් අධ්‍යයනය කරයි.
- තෝරාගත් නාට්‍ය පිටපතට අදාළ රංග භූමි අලංකරණ නිර්මාණය සඳහා අවශ්‍ය දැනුම ගවේෂණය කරයි. නාට්‍ය නිර්මාණය සඳහා දායක වන සෙසු පිරිස් සමඟ සාකච්ඡා කරමින් දළ රූපසටහන් මගින් වේදිකා පසුතල සැලැසුම් කරයි.
- නිර්මිත සැලැසුම් ඇසුරින් කුඩා පරිමාණයට වේදිකා පසුතලවල දළ ආකෘති සකසයි.
- නිර්මාණකරණයට දායක වෙමින්, නිර්මාණයක නිර්මාණාත්මක අගය හා ප්‍රායෝගික භාවිතයන් පිළිබඳ අවබෝධයක් සහිත ව වෘත්තීය ශිල්පියකු වීමට අවශ්‍ය පසුබිම සකසා ගනී.

ක්‍රියාකාරකම 71.2.1 : වේදිකා පසුතල නිර්මාණය පිළිබඳ ප්‍රායෝගික ව අධ්‍යයනය කරමු.

ගුණාත්මක යෙදැවුම් :
- තෝරාගත් නාට්‍ය පිටපත
- දැනුම ගවේෂණයට අදාළ කරගත හැකි විවිධ මූලාශ්‍රය හා ඡායාරූප, සංයුක්ත තැටි ආදිය.
- A4 කඩදාසි, මිනුම් උපකරණ, පැන්සල්, පෑන් ආදිය.
- කාඩ්බෝර්ඩ්, රිජිෆෝම්, ගම්, කතුරු, වර්ණ හා අවශ්‍ය විවිධ උපකරණ

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික ක්‍රියාකාරකම්

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- වේදිකා නාට්‍ය කිහිපයක ඡායාරූප ප්‍රදර්ශනය කරමින් නාට්‍යයක සාර්ථකත්වය සඳහා සහාය වන ආනුෂංගික අංග අතර වේදිකා පසුතල නිර්මාණයට විශේෂ තැනක් හිමි වන බව අවබෝධ කරවමින් පහත දැක්වෙන කරුණු ආශ්‍රිත ව සාකච්ඡාවක් ගොඩ නඟන්න. **(අංක 7 රූප සටහන් බලන්න)**

- වේදිකා පසුතල නිර්මාණය, රංග භූමි අලංකරණය, වේදිකා සැරසිලි (Designing stage decor) / (Designing stage Scenery) ආදි විවිධ නම්වලින් මෙම ආනුෂංගික අංගය හැඳින්වේ.

- සෑම නාට්‍ය නිර්මාණයක් සඳහා ම වේදිකා පසුතල අත්‍යවශ්‍ය නොවන අතර එය නාට්‍ය පෙළ හා රංග ශෛලිය අනුව තීරණය වන්නකි.

- නිර්මාණකරුවා ගේ අවශ්‍යතාව හා නාට්‍ය පිටපත මඟින් අපේක්ෂිත කරුණු අනුව විවිධ නිර්මාණාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් වේදිකා පසුතල නිර්මාණය කළ හැකි ය.

    1. ද්‍රව්‍යමය වශයෙන් ත්‍රිමාණ ආකාරයට සකසන ලද පසුතල මඟින්
    2. චිත්‍රිත වස්ත්‍ර හෙවත් සිතුවම් කරන ලද තිර හෝ පුවරු මඟින්
    3. චිත්තරූප හෙවත් සංකල්ප රූපමය මැවීම් ඇසුරින්
    4. සංකේතාත්මක උපකරණ ඇසුරින්
    5. ආලෝක උපක්‍රම හා ප්‍රක්ෂේපණ මඟින්

6. මිනිස් සිරුර උපයෝගී කර ගනිමින්
7. ඉඟි හා අනුරූපණ ආශ්‍රයෙන්

ආදි වශයෙන් වේදිකාව මත පරිසරය මැවීමට විවිධ නිර්මාණාත්මක ක්‍රමවේදයන් අනුගමනය කිරීමට වේදිකා නාට්‍ය කලාව තුළ හැකියාව ඇත.

- ඉහත ක්‍රමවේද අතුරින් ද්‍රව්‍යමය වේදිකා පසුතල නිර්මාණයන් බහුල ව භාවිත කරනුයේ ස්වාභාවිකත්වයට සමීප ව නිර්මාණය කෙරෙන ලෝකධර්මී නාට්‍යවල වන අතර නාට්‍යධර්මී නාට්‍යවල ද ඇතැම් අවස්ථාවල ද්‍රව්‍යමය පසුතල භාවිත කෙරේ.

- වේදිකා පසුතල ද්‍රව්‍යමය වශයෙන් සකස් කිරීමේ දී විශේෂයෙන් සැලකිලිමත් විය යුතු කරුණු රැසක් පවතී.

  1. වේදිකාවේ ඉඩකඩ
  2. පහසුවෙන් හැසිරවිය හැකි වීම.
  3. සැහැල්ලු බව
  4. ශක්තිමත් බව
  5. උචිත බව හා විශ්වසනීය බව
  6. වර්ණමය ගැළපීම හා මනා රූප රචනය (Composition)
  7. ප්‍රවාහණයේ පහසුව ආදිය එබඳු සුවිශේෂ කරුණු කිහිපයකි.

- අවම යෙදුම් ප්‍රමාණයකින් උපරිම ඵල ලබා ගැනීමට හැකි වන පරිදි වේදිකා පසුතල සකස් කළ යුතු වෙයි. එමඟින් නාට්‍ය තුළ පසුතල භාවිතයේ දී ද, ආර්ථික වශයෙන් ද, ප්‍රවාහණයේ දී ද වාසි රැසක් අත්කර ගත හැකි ය.

- වේදිකා පසුතල නිර්මාණකරණයේ දී ඉහත කරුණු පිළිබඳ මනා අවබෝධයක් තිබීම වැදගත් වන අතර නාට්‍ය පිටපත හොඳින් අධ්‍යයනය කිරීම, නාට්‍ය අධ්‍යක්ෂවරයා සමඟ සාකච්ඡා කර යම් අවබෝධයක් හා එකඟතාවක් ඇති කර ගැනීම පසුතල නිර්මාණ ශිල්පියා විසින් සිදු කළ යුතු වෙයි.

- නාට්‍ය පිටපත මඟින් ඉදිරිපත් කෙරෙන යුගය, ප්‍රදේශය ආදිය පිළිබඳ ව පසුතල නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු බැවින් පින්තූර, සංයුක්ත තැටි හා අන්තර් ජාලය ආදි මූලාශ්‍ර පරිශීලනය කරමින් පසුතල නිර්මාණ ශිල්පියා අවබෝධය පුළුල් කර ගත යුතු වෙයි.

- ඉහත අධ්‍යයන මඟින් ලබා ගත් අදහස් හා දැනුම උපයෝගී කර ගනිමින් නිර්මාණකරුවා ගේ සිතෙහි ඇති කරගත් නිර්මාණාත්මක අදහස්, කටු සටහන් හා දළ රූප සටහන් මඟින් නිර්මාණය කිරීම වැදගත් වෙයි.

- එබඳු දළ රූප සටහන් ආශ්‍රයෙන් එක් වර ම අවසන් නිර්මාණය සිදු කරනවාට වඩා, යෝජිත පසුතල සැලසුම් ආශ්‍රිත ව කුඩා පරිමාණයේ ආකෘති (Dummy) සකස් කිරීම වඩාත් ප්‍රායෝගික පියවරක් වෙයි. **(අංක 8 රූප සටහන් බලන්න)**

1. විශාල මුදල් හා ශ්‍රම නාස්තියක් වීම වැළැක්වීම.
2. වේදිකාවේ ඉඩකඩ හැසිරවීම පිළිබඳ ව හා දර්ශනයෙන් දර්ශනයට පසුතල වෙනස් කිරීමේ ක්‍රමවේදයන් අත්හදා බැලීමට හැකි වීම.
3. පසුතල නිර්මාණ ශිල්පියා අතින් බිහි වන අවසාන නිමැවුම පිළිබඳ ව කල් තියා ම නාට්‍යයේ සෙසු පිරිස් වෙත අවබෝධයක් ලබා දීමට හැකි වීම.

4. වේෂභූෂණ, ආලෝකකරණය ආදි සෙසු ආනුෂංගික ශිල්ප සමඟ වර්ණ පිළිබඳ සම්මුතීන් ඇති කර ගැනීමට පහසු වීම
5. රංග වින්‍යාසයේ දී හා වේදිකාව භාවිතයේ දී විවිධ නිර්මාණාත්මක අදහස් ඇති කර ගැනීමට පහසු වීම
6. බහුකාර්ය භාවිතය, කොටස්වලට වෙන් කිරීම හා එකලස් කිරීම, ප්‍රවාහණය ආදි තාක්ෂණික භාවිතය පිළිබඳ ව වඩාත් නිර්මාණාත්මක එකඟතා ඇති කර ගැනීමට පහසු වීම

ආදි විවිධ වාසි රැසක්, කුඩා ආකෘති (Dummy) නිර්මාණය මඟින් අත්කර ගත හැකි ය.

- ඉහත සඳහන් කරුණු සාකච්ඡා කිරීමෙන් පසු ව පන්තියේ සිටින සිසුන් ප්‍රමාණය සැලකිල්ලට ගෙන අවශ්‍ය නම් කණ්ඩායම් කිරීම මඟින්, නැතහොත් පොදුවේ පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- මින් පෙර සිසුන් විසින් රචනා කරන ලද නාට්‍යයක එක් අවස්ථාවක් තෝරා ගැනීමට අවස්ථාව සලසන්න.
- එම අවස්ථාවට උචිත පසුතල නිර්මාණය කවරාකාර විය යුතු දැයි තොරතුරු ගවේෂණයටත් සාකච්ඡාවටත් සිසුන් යොමු කරන්න.
- එක්රැස් කරගත් දැනුම හා සාකච්ඡාවට අනුව යෝජිත පසුතල නිර්මාණ දළ රූප සටහන් ලෙස නිර්මාණය කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- නිර්මිත දළ රූප සටහන් නිශ්චිත අනුපාත ක්‍රමයක් අනුව A4 කඩදාසි මත නිර්මාණය කිරීමට සිසුන් වෙත උපදෙස් ලබාදෙන්න.
- පරිමාණ රූප සටහන් නිර්මාණයේ දී භාවිත කරන කඩදාසියේ දිග පළල අනුව

  අඩි 01ක් සෙන්ටිමීටර් 01ක් මඟින් හෝ

  අඩි 01ක් අඟල් 01ක් මඟින් හෝ අවශ්‍යතාව මත අනුපාත භාවිත කරමින් මෙම රූප සටහන් නිර්මාණය කළ හැකි බව පෙන්වා දෙන්න.
- මෙසේ නිර්මාණය කරන රූප සටහන් ආශ්‍රිත ව කණ්ඩායම එක් ව සාකච්ඡා කරමින් වර්ණ යෙදීම හා වෙනත් සිදු කළ යුතු වෙනස්කම් සිදු කරලීමට සිසුන් යොමු කරවන්න.
- ඉහත ආකාරයට සකසා ගත් රූප සටහන් ආශ්‍රය කර ගනිමින් යෝජිත වේදිකා පසුතල නිර්මාණයන් කුඩා ආකෘති ලෙස (Dummy) සකස් කිරීමට උපදෙස් ලබා දෙන්න.

  මේ සඳහා අමුද්‍රව්‍ය ලෙස කඩදාසි, කාඩ්බෝඩ්, ලී කැබලි, රිජිෆෝම් විවිධ ප්‍රමාණයේ බට කැබලි, කම්බි, රෙදි ආදියත්, ගම්, කතුරු ආදියත් සපයාදීමට කටයුතු කරන්න.
- සිසුන් විසින් සිදු කරනු ලබන ආකෘති සැකසීමේ දී සැම විට ම කිසියම් අනුපාත ක්‍රමයක් අනුගමනය කිරීමට උපදෙස් ලබාදෙන්න.
- මෙසේ සකසනු ලබන අනු රූ හෙවත් කුඩා ආකෘති (Dummy) හැකි තරම් සැබෑ වස්තූන්ට සමාන වන ලෙස නිර්මාණය කිරීම මඟින් සැකසීමේ අරමුණ වඩාත් සාර්ථක ව ඉටු වන බව පෙන්වාදෙන්න.
- සාමාන්‍යයෙන් වේදිකාවක දිග පළල අඩි 30 x 20 ලෙස උපකල්පනය කරමින් එම අනුපාතයට ගැළපෙන ලෑල්ලක් හෝ ඝන කාඩ්බෝඩයක් මත ඉහත සකසන ලද කුඩා ආකෘති ඇටවීමට උපදෙස් ලබා දෙන්න.
- නිර්මාණ කටයුතු අවසන් වූ පසු කණ්ඩායම් වශයෙන් කළ නිර්මාණ සෙසු අය වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.

එහි දී නිර්මිත ඒ ඒ කොටස් පිළිබඳ ව හා සමස්තය පිළිබඳ ව පැහැදිලි කිරීමට අවස්ථාව ලබාදෙන්න.

1. ඒ ඒ පසුතල සැකසීමට හේතුව
2. ඒ ඒ වර්ණ භාවිතයට හේතුව
3. සකසන ලද දේවල් රූපණයේ දී භාවිත කළ හැකි ආකාරය
4. යොදාගන්නා තාක්ෂණික ක්‍රමවේද ආදිය පිළිබඳ ව මෙම පැහැදිලි කිරීමේ දී විශේෂ අවධානය යොමු කරවන්න.

- සෙසු කණ්ඩායම්වල සිසුන්ට ද ඉදිරිපත් කරන ලද පසුතල නිර්මාණ පිළිබඳ ව ප්‍රශ්න ඇසීමටත් නව යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමටත් අවස්ථාව සලසන්න.

- සිසුන් කළ නිර්මාණයන්හි සාර්ථක අසාර්ථක තැන් පෙන්වා දෙමින් ඒවා තව දුරටත් වැඩි දියුණු කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

- සිසුන් ගේ කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස නිර්මාණය කිරීමට අපේක්ෂිත නාට්‍ය නිෂ්පාදනය සඳහා ඉහත අත්දැකීම් හා ක්‍රමවේද භාවිත කරමින් පසුතල නිර්මාණය කළ යුතු බව වටහා දෙමින් ප්‍රායෝගික ව වේදිකා පසුතල නිර්මාණයේ දී භාවිත කළ හැකි උපකරණ හා අමුද්‍රව්‍ය පිළිබඳ ව උපදෙස් ලබා දෙන්න.

- සාමාන්‍යයෙන් වේදිකා පසුතල නිර්මාණයක දී
    - සැහැල්ලු ලෑලි වර්ග - හාඩ් බෝඩ්
    - වැනිස්ට්‍රා / ප්ලයිවුඩ් (Plywood) - රීප්ප (1 x 2 අඟල්)
    - ලී (අඟල් 2 x 2 හෝ අවශ්‍යතාව පරිදි) - රෙදි වර්ග / ගෝනි
    - ඇණ, ගම්, කඩදාසි (ලෝහමය හා දැවමය)
    - විවිධ වර්ණ ලැකර් නැතහොත් ඉමල්ෂන් වර්ග ආදි අමුද්‍රව්‍ය ද
    - කියත
    - මිටිය
    - විදුම් යන්ත්‍රය / බුරුමය (Drill)
    - නියන් වර්ග
    - කැටයම් කපන කියත (Jigsaw)
    - විවිධ ප්‍රමාණයන් සහිත පින්සල්

    යතුරු ලියනය ආදි උපකරණ ද භාවිත කළ හැකි අතර මෙම අමුද්‍රව්‍ය හෝ උපකරණ හෝ හැරුණු විට විවිධ නිර්මාණාත්මක උපක්‍රම හා අමුද්‍රව්‍ය භාවිතයට අවස්ථාව ඇති බව පැහැදිලි කරන්න.

නිපුණතාව 7.0 : නාට්‍ය හා රංග කලාව විෂයයට අනුබද්ධ ආනුෂංගික කලාවන් අධ්‍යයනය කර වෘත්තීය කුශලතා සංවර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 7.1.2 : ආනුෂංගික කලා පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 08

ඉගෙනුම් පල :
- ආනුෂංගික අංග පිළිබඳ අවබෝධයක් සහිත ව තෝරාගත් නාට්‍ය පිටපතක් අධ්‍යයනය කරයි.
- තෝරාගත් නාට්‍ය පිටපතට අදාළ ව නාට්‍යෝපකරණ නිර්මාණය සඳහා අවශ්‍ය දැනුම ගවේෂණය කරයි.
- නාට්‍ය ඉදිරිපත් කරන රංග ශෛලිය හා ලබා දෙන අර්ථකථන සැලකිල්ලට ගනිමින් නාට්‍යෝපකරණ සැලැසුම් කරයි.
- රූපණ කාර්යයට පහසු වන පරිදි, දරා සිටීමට හෝ භාවිතයට පහසු සැහැල්ලු ද්‍රව්‍ය යොදා ගනිමින් නාට්‍යෝපකරණ නිර්මාණය කෙරෙහි අත්හදා බැලීම් සිදු කරයි.
- අවම වියදමකින් උපරිම ප්‍රයෝජන අත්කර ගත හැකි නාට්‍යෝපකරණ නිර්මාණ ක්‍රමවේද විමසා බලයි.
- නිර්මාණකරණයට දායක වෙමින්, නිර්මාණයක නිර්මාණාත්මක අගය හා ප්‍රායෝගික භාවිතාව පිළිබඳ අවබෝධයක් සහිත ව වෘත්තීය ශිල්පියකු වීමට අවශ්‍ය පසුබිම සකසා ගනී.

ක්‍රියාකාරකම 71.2.2 : නාට්‍යෝපකරණ නිර්මාණය පිළිබඳ ව ප්‍රායෝගික ව අධ්‍යයනය කරමු.

ගුණාත්මක යෙදවුම් :
- තෝරාගත් නාට්‍ය පිටපත
- සංයුක්ත තැටි, විවිධ ඡායාරූප හා සිතුවම් ආදිය සහ දැනුම ගවේෂණයට අදාළ විවිධ මූලාශ්‍ර
- A4 කඩදාසි, මිනුම් උපකරණ, පැන්සල්, පෑන් ආදිය
- ඉවත දමන ප්ලාස්ටික් බඳුන්, කාඩ්බෝර්ඩ්, කඩදාසි, රිජිෆෝම්, සැහැල්ලු බට වර්ග, ලී කූඩු, වැලි, ගම්, කතුරු, වර්ණ හා අවශ්‍ය විවිධ අමුද්‍රව්‍ය හා උපකරණ

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- වේදිකා නාට්‍ය කිහිපයක ශ්‍රව්‍ය දෘශ්‍ය පට ප්‍රදර්ශනය කරමින් විවිධ නාට්‍යවල වේදිකා උපකරණ භාවිත වී ඇති ආකාරය අධ්‍යයනයට ඉඩ සලසන්න. ප්‍රේක්ෂාව නිර්මාණයයේ දී මෙන් ම රූපණ කාර්යයේ දී ද වේදිකා උපකරණ මඟින් විශාල මෙහෙයක් වන බව අවබෝධ කර දෙමින් පහත දැක්වෙන කරුණු ද ආශ්‍රය කර ගනිමින් සාකච්ඡාවක් ගොඩ නඟන්න.

- වේදිකා උපකරණ, නාට්‍යෝපකරණ (Stage Properties) ආදි විවිධ නම්වලින් මෙම ආනුෂංගික අංගය හැඳින්වේ.

- වේදිකා පසුතල නිර්මාණ කාර්යය හා නාට්‍යෝපකරණ නිර්මාණය බොහෝ විට එකට බැඳී ඇති ක්‍රියාකාරකම් දෙකකි.

- පසුතල නිර්මාණ මඟින් නාට්‍යයට අයත් යුගය, ප්‍රදේශය, මනෝභාවය ආදිය කියාපාන්නක් මෙන් ම වේදිකා උපකරණ මඟින් එම කාර්යය සම්පූර්ණ කර ගැනීමට සහය වේ.

- යොදාගන්නා ආකාරය සලකා නාට්‍යෝපකරණ ප්‍රධාන වර්ග තුනකට බෙදා දැක්විය හැකි ය.

1. වේදිකා පසුතලය හා බද්ධ උපකරණ (Set Props)
2. නළු නිළියන් අත දරා සිටින උපකරණ (Hand Props)
3. අලංකරණාත්මක මෙවලම් (Decorative Props) ආදී වශයෙනි.

- ඉහත සඳහන් කරන ලද රංගෝපකරණ වර්ග අතුරින්

වේදිකා පසුතලයට සවි නොකෙරෙන, එහා මෙහා කළ හැකි ගෘහ භාණ්ඩ, ලාම්පු, මල් බඳුන්, ආදිය වේදිකා පසුතලය හා බද්ධ උපකරණ ලෙස ද (Stage Props)

උදාහරණ - හෙන්රික් ඉබ්සන් ගේ Dolls House රූකඩ ගෙදර නාට්‍යයේ නත්තල් ගස **(අංක 9 රූපය බලන්න)**

රඟපාන අතරතුර නළුනිළියන් අත දරා සිටින කුඩා උපකරණ (Hand Props) ලෙස පිඟන් කෝප්ප, ආභරණ, අවාන, පෑන, ජංගම දූරකථනය, බස්තම, වෙද නළාව, කඩුව, හෙල්ලය ආදිය ද හැඳින්විය හැකි ය.

වේදිකා මත ප්‍රේක්ෂකයාට පෙනෙන ලෙස රඳවා තබා ඇති එහෙත් රඟපෑම සඳහා නිශ්චිත ව පරිහරණය නොකරන උපකරණ අලංකාරණාත්මක මෙවලම් ලෙස (Decorative Props) හැඳින්විය හැකි ය.

බොහෝ විට මෙවැනි උපකරණ මඟින් පෙළට අදාළ කිසියම් සංකේතාත්මක නිරූපණයක් හෝ පුද්ගල භාව නිරූපණයක් හෝ සිදු කළ හැකි ය. මීට උදාහරණ ලෙස බිත්ති ඔරලෝසු, ඡායාරූප, සිතුවම්, පොත් රාක්ක තුළ පෙනෙන පොත්, මේස ලාම්පු ආදිය දැක්විය හැකිය.

- සෑම විට ම වේදිකා උපකරණ තථ්‍ය ස්වරූපයෙන් ම නිර්මාණය අත්‍යවශ්‍ය නො වේ. එය තීරණය කෙරෙන්නේ නාට්‍ය ඉදිරිපත් කරන රංග ශෛලිය හා අධ්‍යක්ෂවරයා ගේ අර්ථකථන් අනුව ය.

ඇතැම් විට රංග උපකරණ සැබෑ ප්‍රමාණයට වඩා විශාල ලෙස අතිශයෝක්ති සහගත ස්වරූපයකින් සකස් කෙරෙයි. ප්‍රේක්ෂකයාට හොඳින් පෙනෙන්නට සැලැස්වීම හැරුණු විට ඒ ඒ අවස්ථාවේ දී එම රංග භාණ්ඩයේ වැදගත්කම සලකා එබඳු විශාල හෝ කුඩා හෝ කිරීමක් සිදු කරනු ලැබේ.

උදාහරණ ලෙස,

- පොල් ගෙඩියට 'ජරමරේ' නාට්‍යයෙහි විශාල පොල් ගෙඩියක භාවිතය
- පාලිත ලොකුපෝතාගම නිර්මාණය කළ 'අමර ගියා දිව්‍යලෝකේ' නාට්‍යයෙහි විශාල සිරින්ජරයක් භාවිතය
- 'කාවෝ කැවෝ' නාට්‍යයෙහි විශාල පොතක ආකෘතියක් භාවිතය
- ජයලත් මනෝරත්න ගේ 'ගුරු තරුව' නාට්‍යයෙහි ජංගම දූරකථනය ප්‍රමාණයෙන් විශාල ලෙස සැකසීම ආදිය හැඳින්විය හැකි ය.
- විවිධ ආදේශාත්මක උපකරණ යොදාගනිමින් වේදිකා උපකරණ සංකේතාත්මක ව ඉදිරිපත් කළ හැකි ය. කුඩා ලී කැබැල්ලක් මඟින් ජංගම දූරකථනය නිරූපණය, ලී දණ්ඩක් මඟින් කඩුවක් හෝ හෙල්ලය හෝ නිරූපණය ඊට සරල උදාහරණ කිහිපයකි.

- රංග උපකරණ ද්‍රව්‍යමය වශයෙන් භාවිතයට නො ගනිමින් ඒවා අභිරූපණ ඇසුරින් ප්‍රේක්ෂක

මනසෙහි චිත්‍රණය කිරීමට ද හැකි ය.

- පිහියකින් යමක් කැපීම
- ගලක් ගැසීම
- තේ පානය කිරීම
- ආහාර ගැනීම
- යම් දෙයක් ලිවීම
- ඡායාරූපයක් දෙස බැලීම
- සිතුවමක් නිර්මාණය වැනි

රංග උපකරණ භාවිතයකින් තොර ව කර පෙන්වන අවස්ථා මීට උදාහරණ වේ.

- නාට්‍ය පිටපතක ඇතුළත් රංග විධාන හෝ සංවාද ඛණ්ඩ හෝ හොඳින් අධ්‍යයනය කිරීම මඟින් එම නාට්‍යය සඳහා අවශ්‍ය නාට්‍ය උපකරණ මොනවා දැ යි හඳුනාගත හැකි ය.

  එසේ සකසාගත් වේදිකා උපකරණ ලේඛනයක් ඇසුරින් නාට්‍ය අධ්‍යක්ෂවරයා සමග සාකච්ඡා කර නාට්‍යයට අත්‍යවශ්‍ය වේදිකා උපකරණ සකස් කිරීම සිදු කළ යුතු වෙයි.

- නාට්‍යයක වේදිකා ගත කිරීමේ දී නිවැරදි ව සකසා ගත් වේදිකා උපකරණ වට්ටෝරුවක් තබා ගනිමින් ඒ ඒ අවස්ථාවට අදාළ නිවැරදි උපකරණය නළුවන් වෙත ලබා දීමට වේදිකා පරිපාලක ගේ ද සහාය ලබා ගනිමින් කටයුතු කළ යුතු වෙයි.

- වේදිකා උපකරණ සැකසීමේ දී

  1. යුගයට, ප්‍රදේශයට, අනුකූල වීම.
  2. සැහැල්ලු බව හා ශක්තිමත් බව.
  3. භාවිතයට පහසුව හා විශ්වසනීය බව.
  4. උචිත බව හා වර්ණ ගැළපීම.
  5. සෙසු උපකරණවල ප්‍රමාණය සමග අනුපාත වශයෙන් ගැළපීම.
  6. අවම වියදම හා උපරිම ප්‍රයෝජන ලබා ගැනීම.

  ආදි කරුණු පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු වෙයි.

- ඇතැම් අවස්ථා සඳහා සැබෑ ජීවිතයේ දී භාවිතයට ගන්නා ගෘහ භාණ්ඩ ආදිය යොදාගන්නා අතර බොහෝ විට සිදු වන්නේ ප්‍රේක්ෂාගාරයට සැබෑ භාණ්ඩ ලෙස පෙනෙන පරිදි සැකසූ ව්‍යාජ උපකරණ භාවිතය යි.

- පොත් රාක්කයක් නිර්මාණයේ දී සැහැල්ලු දැවයෙන් සකසාගත් පොත් රාක්කයක පොත් ලෙස රිජිෆොම්, කාඩ්බෝඩ් පෙට්ටි හෝ වැනිස්ට්‍රා වැනි ලැලි කැබලි යොදා සකස් කරගත් ව්‍යාජ පොත් යෙදීම.

- විශාල බඳුන්, පලිහ, ප්‍රතිමා ආදිය නිර්මාණයේ දී කඩදාසි, පල්ප, දැල් ආදිය යොදා ගනිමින් වේදිකා උපකරණ සැකසීම.

- සිහින් ලී පතුරුවලින් කඩු, පිහි, කිනිසි, ආදිය නිර්මාණය

- PVC බට යොදා ගනිමින් හෙල්ල ආදිය සැකසීම ඊට උදාහරණ කිහිපයකි.

- බොහෝවිට වේදිකා උපකරණ නාට්‍ය ස්වරූපයට සමීප ව නිර්මාණය කෙරෙනුයේ තාත්ත්විකත්වයට සමීප ලෝකධර්මී රංග ශෛලියෙන් ඉදිරිපත් කරන නාට්‍ය සඳහා වෙයි.

- හෙන්රික් ඉබ්සන් ගේ 'සෙල්ලම් ගෙදර'

- ඇන්ටන් චෙකොෆ් ගේ 'චෙරිවත්ත' වැනි නාට්‍යවල වේදිකා පසුතල මෙන් ම නාට්‍යෝපකරණ ද බෙහෙවින් සැබෑ ස්වරූපයට සමීප ලෙස නිර්මාණය කිරීම මීට උදාහරණයකි.

- විශේෂයෙන් ඉබ්සන් ගේ 'සෙල්ලම් ගෙදර' නාට්‍යයෙහි 'පැද්දෙන පුටුව' හා ගුදිරි පුටුව (කුෂන්) එම අවස්ථාවට අත්‍යවශ්‍ය අර්ථ සම්පාදනය කරන වේදිකා උපකරණ දෙකක් වීම හේතුවෙන් එම උපකරණ සැබෑ ලෙස භාවිත කළ හැකි වන ලෙස නිර්මාණය කළ යුතු වීම මීට උදාහරණ ලෙස දැක්විය හැකි ය.

- එහෙත් එහි එන පියානෝව බාහිර ලක්ෂණවලින් සැබෑ පියානෝවක් ලෙස පෙනෙන ව්‍යාජ එකක් ලෙස සැකසීම ප්‍රමාණවත් වේ. මන්ද එය වාදනය කිරීම ඉරියව්වලින් දක්වන අතර ශබ්දය පසුබිමින් ලබාදිය හැකි බැවිනි.

  (අංක 10 රූප සටහන් බලන්න)

- එසේ ම 'ඇන්ටිගනී' වැනි ග්‍රීක නාට්‍යයක් නිර්මාණයේ දී නාට්‍ය උපකරණ නිර්මාණ කාර්යය සඳහා ග්‍රීක සංස්කෘතික වටපිටාව අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ. එහිදී සැබෑ උපකරණ සකසා ගත නොහැකි බැවින් ග්‍රීක සිතුවම්වල හෝ කෞතුක භාණ්ඩවල හෝ එන වර්ණ හැඩතල හා ප්‍රමාණ අධ්‍යයනය කර වේදිකාවට ගැළපෙන ලෙස ව්‍යාජ උපකරණ සකසා ගත යුතු වෙයි.

  (11 රූපය බලන්න)

- ඓතිහාසික සිදුවීමක් පදනම් කරගත් දේශීය නාට්‍ය නිර්මාණයක් සඳහා වේදිකා උපකරණ නිර්මාණය කරන්නේ නම් එම පිටපතට අදාළ යුගය පිළිබඳ සැලකිලිමත් වෙමින් එම යුගයේ භාවිත උපකරණ හා මෙවලම් පිළිබඳ ඇති කරගත් දැනුමක් සහිත ව නාට්‍යෝපකරණ නිර්මාණය කළ යුතු වෙයි.

- ඓතිහාසික හැඩතල, කැටයම් රටා හා අමුද්‍රව්‍ය පිළිබඳ ව ලබා ගත් අවබෝධය පදනම් කර ගනිමින් කල්පිත නිර්මාණයක් වුව ද සිදු කිරීමට හැකියාව නිර්මාණකරුවා සතු වේ.

  (අංක 13, 14 රූප සටහන් බලන්න)

- භාවිතයෙන් ඉවත ලන ප්ලාස්ටික් බඳුන්, බට කැබලි, කඩදාසි, පල්ප ආදිය යොදා ගනිමින් රංග භාණ්ඩ හා වේදිකා උපකරණ සකසා ගන්නා ආකාරය 7, 8, 9 වසරවල ගුරුමාර්ගෝපදේශවල ඇතුළත් ව ඇත.

ඉහත සඳහන් කරුණු සාකච්ඡා කිරීමෙන් පසු ව පන්තියේ සිටින සිසුන් ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් අවශ්‍ය නම් කණ්ඩායම් කර, නැතහොත් පොදුවේ පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- මෙම ක්‍රියාකාරකමට අදාළ ව සිසුන් විසින් රචනා කරන ලද නාට්‍ය පිටපත් අතුරින් සුදුසු නාට්‍ය පිටපතක් තෝරා ගන්න.

- පිටපතෙහි ඒ ඒ අවස්ථාව සඳහා අවශ්‍ය නාට්‍ය උපකරණ ලේඛනයක් (වට්ටෝරුවක්) පිළිවෙළ කර ගැනීමට අවස්ථාව සලසන්න.

- පෙර සාකච්ඡා කළ ක්‍රමවේදයන් අතුරින් සුදුසු නිර්මාණාත්මක ක්‍රමවේදයක් අනුගමනය කරමින් වේදිකා උපකරණ නිර්මාණ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- එසේ සිදු කළ නිර්මාණ ද ප්‍රායෝගික ව යොදා ගනිමින් නාට්‍ය රඟ දැක්වීමට සිසුන් යොමු කරන්න.

- සිදු කළ නිර්මාණයන් හා ඉදිරිපත් කරන ලද ක්‍රමවේදයන් සැලකිල්ලට ගනිමින් සිසු අදහස් විමසන්න.
- සමස්තයේ සාර්ථක අසාර්ථක තැන් පිළිබඳ ව විවරණයක යෙදෙමින් අඩුපාඩු සකසා ගැනීමට සිදු කළ යුතු වෙනස්කම් හා යොදා ගත යුතු නිර්මාණාත්මක ක්‍රමවේද පිළිබඳ ව උපදෙස් ලබා දෙන්න.

ඇගයීම : 1. කිසියම් නාට්‍ය නිර්මාණයක් සඳහා නාට්‍යෝපකරණ නිර්මාණ කාර්යය ඔබ වෙත පැවරුණහොත් ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ග අනුපිළිවෙළින් විස්තර කරන්න.

නිපුණතාව 7.0 : නාට්‍ය හා රංග කලාව විෂයයට අනුබද්ධ ආනුෂංගික කලාවන් අධ්‍යයනය කර වෘත්තීය කුශලතා සංවර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 7.1 : ආනුෂංගික කලා පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- නාට්‍ය සංගීතය යන්න හඳුන්වයි.
- නාට්‍ය සංගීතයේ සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරයි.
- නාට්‍ය සංගීතය සකස් කර ගැනීමේ දී අත්‍යවශ්‍ය වන කරුණු පැහැදිලි කරයි.
- සංගීතය උචිත ලෙස යොදා ගෙන ඇති නාට්‍ය නරඹයි.
- නාට්‍යෝචිත ව සහ රසෝත්පාදනය වන අයුරින් සංගීතය නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම 71.3 : නාට්‍යෝචිත සංගීතය භාවිත කරයි.

ගුණාත්මක යෙදැවුම් :
- සංගීතය සාර්ථක ව යොදා ගෙන ඇති නාට්‍ය කීපයක ශ්‍රව්‍ය දෘශ්‍යපට කීපයක්
- නාට්‍ය ගීත අඩංගු ශ්‍රව්‍ය දෘශ්‍යපට කීපයක්
- නාට්‍ය සංගීතය පිළිබඳ ව ලියැවුණු ලිපි, පොත්පත්

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ආනුෂංගික කලා අතර විශේෂ ස්ථානයක් හිමි වන නාට්‍ය සංගීතය ආහාර්ය අභිනයට අයත් වන අතර නළුනිළියන් ගේ ගායන වාචික අභිනයට අයත් වේ. සංගීත භාණ්ඩවලින් ගායන සඳහා වාදන සැපැයෙන අතර පසුබිම් සංගීතය ද සපයනු ලබයි. යම් අවස්ථාවල විවිධාකාරයෙන් යොදාගනු ලබන විවිධ ශබ්ද හා හඬවල් ද ශබ්ද සංකලනය ද නාට්‍ය සංගීතයේ දී අවස්ථා තීව්‍ර කිරීමේ උපක්‍රමයකි.

- නාට්‍යයේ තේමාවට උචිත ලෙසින් සංගීතය නිර්මාණය කළ යුතු වේ.

- එමෙන් ම නාට්‍යයේ ශෛලිය බෙහෙවින් ම වැදගත් වේ. විශේෂයෙන් ම ලෝකධර්මී ශෛලියට වඩා නාට්‍යධර්මී ශෛලියේ දී සංගීතය වඩාත් ප්‍රබල වන අතර එම නාට්‍යවල ජීවය රඳා පවත්නේ සංගීතය මත ය.

- නාට්‍ය සංගීතය "රංග පරම" සංගීතය, "ප්‍රාසංගික සංගීතය හා පසුබිම් සංගීතය" වශයෙන් ප්‍රභේද කොට දක්වන අවස්ථා ඇත. රංග පරම සංගීතය යනු නාට්‍යයේ යටිපෙළ අරුත් ගන්වන ලෙස නිර්මාණය කරණ සංගීතය වේ. එය නාට්‍යයේ ඇති මතුපිට අරුතට වඩා ගැඹුරු අරුතක් මතු කරයි. රංග පරම සංගීතය එල්ලන ලද ආටෝපයක් නොවන අතර නාට්‍යයේ ම අවශ්‍ය අංගයකි. ප්‍රාසංගික හෙවත් පසුබිම් සංගීතයේ දී ජවනිකා මාරු කිරීම්, අංකවල සබඳතාව, හිස් බව මකා ගැනීම, නාට්‍යයේ ඒකාබද්ධතාව රැකගැනීම අරමුණු කොට ගනී.

- සංගීතය නාට්‍යයක් වෙනුවෙන් සැකසීමේ දී අදාළ පරිසරයට, සමාජ තත්ත්වයට, රටට උචිත අයුරින් සිදු කළ යුතු ය.

- සංගීතඥයා නාට්‍යයේ රසය මවන්නකු මෙන් ම අවස්ථා තීව්‍ර කරන්නකු විය යුතු ය. නාට්‍යයේ එන සියුම් අවස්ථා කුළු ගන්වමින් රංගනය හා පෙළෙහි අර්ථකථන උද්දීපනය වන අයුරින් නාට්‍යයේ අන්තර්ගතය මැනවින් හඳුනාගෙන සංගීතය නිර්මාණය කළ යුතු යි. නළුනිළි රංගනය අබිබවා නොයන පරිදි නාට්‍ය අධ්‍යක්ෂ ගේ උපදෙස් හා අවශ්‍යතාව මනාව හඳුනාගෙන නාට්‍ය සංගීතය සැකසිය යුතු යි. ඒ පිළිබඳ ව නූතන ප්‍රවණතා අධ්‍යයනය කරමින් ශබ්ද සංකලනය කිරීම, ශබ්ද පරිපාලනය, ශබ්ද උත්පාදනය හා නිශ්ශබ්දතාව ද නාට්‍යෝචිත පරිදි යොදාගැනීම

කළ යුතු යි. විවිධ සංගීත භාණ්ඩ මෙන් ම ආදේශක භාණ්ඩ හා විවිධ උපකරණ (බෝතල්, ටින්, ලී පතුරු, යකඩ වැනි ලෝහ කැබලි, පොල්කටු, උණ බට, මැටි කළ, ප්ලාස්ටික් උපකරණ) ආදිය උපයෝගී කර ගෙන මෙන් ම මිනිස් හඬ හා මිනිසාගේ අත්, පා උපයෝගී කොටගෙන විවිධ අවස්ථා සඳහා ශබ්ද හා නාද සකස් කරගනු ලැබේ. සංවාදයක් වෙනුවට යොදාගත හැකි ආදේශනයක් ලෙස ද සංගීතය යොදා ගන්නා අවස්ථා ඇත. සංවාදයකට වඩා ප්‍රබල ලෙසින් උචිත සංගීත බණ්ඩ වාදනයකින් හෝ මිනිස් හඬ උපයෝගී කර ගනිමින් සංගීතමය භාව ප්‍රකාශනයක් කළ හැකි ය.

- සංගීතය අවම ලෙස යොදා ගෙන මෙන් ම සංගීතය යොදා නොගෙන ම රංගනය ඉදිරිපත් කරන නාට්‍යය ඇත. කැලණි පාලම එවැනි නිෂ්පාදනයකි.
- නාට්‍යයේ පෙළ නාට්‍ය සංගීතය ඉල්ලා සිටින්නේ නම් පමණක් එක් කර ගත යුතු ය. නාට්‍යයේ කථා වින්‍යාසයට, තේමාවට, ක්‍රියා විකාශනයට උචිත වූ නළු කාර්ය තීව්‍ර කරන්නාවූත්, රසොත්පාදනයට ඉවහල් වන්නාවූත් ආනුෂංගික අංගයකි නාට්‍ය සංගීතය.
- සජීව ව වාදනය කෙරෙන සංගීතය මෙන් ම පටිගත කරන ලද සංගීතය ද නාට්‍ය සඳහා යොදා ගැනේ.
- ඉලක්ක ගත ප්‍රේක්ෂක පිරිස අනුව ද නාට්‍ය සංගීතයේ භාවිතය වෙනස් විය යුතු වෙයි.

උදා : ළමා නාට්‍යක දී විශේෂයෙන් සරල බව, ගැයීමට පහසු අඩු ස්වර පරාසයකින් යුතු වීම. ළමා නාද හා රිද්ම භාවිත කිරීම, රසවත් බව, ආදි කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.
යොවුන් නාට්‍යයක දී යොවුන් මනසට ගැළපෙන පරිදි, නිර්මාණාත්මක සංගීතය භාවිත කළ යුතු වෙයි.

ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

1. නාට්‍යයක සාර්ථකත්වය සඳහා සංගීතය මඟින් ඉටු වන මෙහෙය පැහැදිලි කරන්න.
2. ඔබ නරඹා ඇති නාට්‍යයක සංගීත නිර්මාණයෙහි සාර්ථක අසාර්ථක බව විචාරයට ලක් කරන්න.

නිපුණතාව 7.0 : නාට්‍ය හා රංග කලාව විෂයයට අනුබද්ධ ආනුෂංගික කලා අධ්‍යයනය කර වෘත්තීය කුශලතා සංවර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 7.1.1 : ආනුෂංගික කලා පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 04

ඉගැනුම් පල :
- නාට්‍ය පිටපතක් අධ්‍යයනය කර වේශභූෂණ පිළිබඳ ව මූලික අවබෝධයක් ලබා ගනී.
- රංග ශෛලිය අනුව වේෂභූෂණ වෙනස් වන බව අවබෝධ කර ගනී. වේෂ භූෂණ නිර්මාණය සඳහා අවශ්‍ය මූලික කරුණු පිළිබඳ ව අධ්‍යයනය කරයි.
- යෝජිත නිර්මාණ දළ රූප සටහන් ආශ්‍රිත ව සැලැසුම් කරයි.
- වර්ණ, ප්‍රමාණ, අමුද්‍රව්‍ය හා ක්‍රමවේද පිළිබඳ අවබෝධයක් ලබා ගනී.
- නාට්‍යය සඳහා අවශ්‍ය වේශභූෂණ නිර්මාණය කර ප්‍රායෝගික භාවිතයෙහි යොදයි
- නිර්මාණකරණයට දායක වෙමින් ලද අත්දැකීම් අනුසාරයෙන් වෘත්තීය ශිල්පියකු වීමට අවශ්‍ය පසුබිම සකසා ගනී.

ක්‍රියාකාරකම 71.4.1 : වේශභූෂණ නිර්මාණය පිළිබඳ ව ප්‍රායෝගික ව අධ්‍යයනය කරමු.

ගුණාත්මක යෙදවුම් :
- තෝරාගත් නාට්‍ය පිටපත
- ශ්‍රව්‍ය දෘශ්‍ය පට
- A4 කඩදාසි වර්ණ, පැන්සල්, පෑන් ආදිය.
- සිතුවම් හා ඡායාරූප
- රෙදි කැබලි, කාඩ්බෝඩ්, නූල්, විවිධ ඇට වර්ග, පබළු, ගම්, කතුරු

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික ක්‍රියාකාරකම්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- නාට්‍යය කලාවේ එන සතර අභිනය අතුරින් ආහාර්ය අභිනයේ ප්‍රධාන අංගයක් ලෙස වේෂ භූෂණ වැදගත් වේ.
- අභ්‍යන්තර සමාරෝපයටත්, බාහිර සමාරෝපයටත් වේෂ භූෂණ බලපායි.
- නළුවකුට තම පෞද්ගලික චරිතයෙන් මිදී වෙනත් චරිතයකට පිවිසීමේ දී වේශභූෂණ අගනා සහායක් සපයයි.
- නාට්‍යයක් ඉදිරිපත් කරන රංග ශෛලිය අනුව වේශභූෂණ නිර්මාණය වෙනස් විය යුතු ය.
- ප්‍රේක්ෂකයින්ට නාට්‍යයක චරිත හඳුනා ගැනීම සඳහා වේශභූෂණ මඟින් ප්‍රබල සහායයක් සැපැයේ.
- ඒ ඒ චරිත සඳහා වේශභූෂණ නිර්මාණ කිරීමේදී නළුවාගේ ශරීර ප්‍රමාණය, ඡවි වර්ණය හා නාට්‍යය තුළ ඔහු විසින් ඔහු කළ යුතු චලන හා ක්‍රියාකාරකම් පිළිබඳ ව සැලකිලිමත් විය යුතු වෙයි.
- පොදුවේ වේශභූෂණ නිර්මාණයේ දී නාට්‍යයේ රංග ශෛලිය, කාලය, දේශය ආදී කරුණු පිළිබඳ ව විශේෂ අවධානය යොමු කළ යුතු ය.
- සෙසු ආනුෂංගික ශිල්පීන් සමඟ සාකච්ඡා කර ඇති කර ගන්නා සම්මුති වේශභූෂණ නිර්මාණයේ දී ඉතා වැදගත් වේ.

විශේෂයෙන් වර්ණ යෙදීමේ දී ආලෝකකරණය, අංග රචනය හා වේදිකා පසුතල සහසම්බන්ධතාව අත්‍යවශ්‍ය වේ.

- රූපණ ශිල්පීන් හට පහසුවෙන් දරා සිටිය හැකි වීම.
- රූපණ කාර්යයේ දී බාධාවකින් තොර ව මෙන් ම විශ්වාසයකින් යුතු ව පරිහරණය කළ හැකි වීම.
- නර්තනය හෝ ශාරීරික චලන හෝ මතු කර දැක්වීම අවශ්‍ය නම් ඊට සුදුසු ලෙස නිර්මාණය කිරීම ආදි පොදු ගුණාංග වේශභූෂණ නිර්මාණ සතු විය යුතු ය.

  වේශභූෂණ නිර්මාණයේ දී ප්‍රායෝගික ව අවධානය යොමු කළ යුතු පහත සඳහන් කරුණු පිළිබඳ ව ද සිසුන්ට දන්වන්න.
- විවිධ වර්ණ මගින් විවිධ අර්ථ චර්යා ලක්ෂණ හෝ මනෝභාව හෝ සංකේතවත් කෙරේ.

උදා: රතු - විනාශය/සරාග බව
කහ - තාරුණ්‍යය/සතුට
දම් - රාජකීය බව/උදාර බව
දුඹුරු - ශෝකය/දිළිඳු බව
නිල් - පිවිතුරු බව/හුදෙකලා බව
කොළ- ගුප්ත බව
සුදු - පවිත්‍රත්වය

- ආලෝකකරණයේ දී රංගාලෝකයේ වර්ණ හේතුවෙන් ඇතැම් වර්ණ වෙනස් ව දර්ශනය වේ.
- වර්ණ යෙදීම මඟින් චරිත මතු කර දැක්වීමට මෙන් ම චරිත යටපත් කිරීමට ද හැකි වේ. ඇතැම් විට රංග වස්ත්‍රවල වර්ණ හෝ ඉරි, කොටු වැනි හැඩතල හේතුවෙන් චරිත යටපත් වී රංග වස්ත්‍ර ඉස්මතු වේ.

විවිධ ආභරණ සකස් කිරීමේ දී අධික වියදම් සහිත සැබෑ ආභරණ වෙනුවට රංගෝචිත ව නිර්මාණය කරගත් සරල ආභරණ භාවිත කළ හැකි වේ.

- විවිධ ඇට වර්ග, පල්ප්, බොත්තම්, මැටි හෝ කඩදාසි හෝ භාවිත කරමින් ආභරණ සැකසිය හැකි ය.
- කාඩ්බෝඩ්, රෙදි, කපු කෝඩ් නූල්, ලී කුඩු, ගම් ආදිය යොදා විවිධ හැඩතල සහිත ව රංගාභරණ සැකසිය හැකි ය.
- අධික දීප්තිමත් වර්ණ හා දිලිසෙන බව වේදිකාවට උචිත නොවන අතර රංගාලෝකයට ඔරොත්තු දෙන පරිදි ආභරණ වර්ණ ගැන්විය යුතු ය.
- රංගාභරණ සෑදීම පිළිබඳ 6, 7, 8, 9 ශ්‍රේණිවල ගුරු මාර්ගෝපදේශවල එන ප්‍රායෝගික ක්‍රියාකරකම් පිළිබඳ පෙර දැනුම භාවිතයට උපදෙස් දෙන්න.

ඉහත සඳහන් කරුණු සාකච්ඡා කිරීමෙන් පසු ව පන්තියේ සිටින සිසුන් කණ්ඩායම් කරන්න. එසේ ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති නම් පොදුවේ පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

1. පහත ආකාරයට විවිධ ආකාර චරිත කිහිපයක් සටහන් කරන ලද තුණ්ඩු පිළියෙළ කරගන්න.

   1. ඊඩිපස් රජ චරිතය - ඊඩිපස් රජ
   2. ශකුන්තලා චරිතය - අභිඥානශාකුන්තල
   3. කුවේණි චරිතය - කුවේණි
   4. ඔතෙලෝ චරිතය - ඔතෙලෝ

5. නෝරා - සෙල්ලම් ගෙදර
6. චණ්ඩපජ්ජෝත - හස්තිකාන්ත මන්තරය
7. ෂයිලොක් - වැනීසියේ වෙළෙන්දා

2. සිසුන්ට අහඹු ලෙස එක් මාතෘකාවක් තෝරා ගැනීමට අවස්ථා සලසන්න.

3. තමන්ට ලැබුණු චරිතය පිළිබඳ ව පිටපත අධ්‍යයනය කරමින් කරුණු සෙවීමට යොමු කරවන්න.

4. වේෂභූෂණ නිර්මාණය සඳහා තම තමන් ලද චරිතය අදාළ යුගය, පරිසරය ආදියට අදාළ තොරතුරු සොයා ගත හැකි මූලාශ්‍රය පරිශීලනයට පොලඹවන්න.

5. මූලික ව ඒ ඒ චරිතයට අදාළ වේශභූෂණ, දළ රූප සටහන් මඟින් චිත්‍රණය කරන්න.

6. රූප සටහන් ආශ්‍රිත ව පෙර දැනුම ද යොදා ගනිමින් රෙදි, නූල්, කඩදාසි ආදිය යොදා ගනිමින් කුඩා ආකෘති ලෙස හෝ භාවිතයට ගත හැකි ලෙස රංගවස්ත්‍ර සැකසීමට අවස්ථාව සලසන්න.

7. සිසු නිර්මාණ එළිදැක්වීමට අවස්ථාව සලසන්න.

8. ඒ ඒ නිර්මාණ හා ඒවායේ වර්ණ, හැඩතල, යෙදීමට හේතු පිළිබඳ විස්තර කිරීමට සිසුන් යොමු කරන්න.

9. ඒ ඒ නිර්මාණයන්හි ගුණාගුණ විචාරයට ලක් කරමින් ප්‍රායෝගික ව වේශභූෂණ නිර්මාණකරණයේ දී සැලැකිලිමත් විය යුතු කරුණු තව දුරටත් පහදා දෙන්න.

ඇගයීම : සකුන්තලා නාට්‍යයෙහි සකුන්තලා චරිතය හා දුශ්‍යන්ත චරිතය සඳහා වේශභූෂණ සැලසුම් කර රූප සටහනක් මඟින් ඇඳ දක්වන්න.

නිපුණතාව 7.0 : නාට්‍ය හා රංග කලාව විෂයයට අනුබද්ධ ආනුෂංගික කලා අධ්‍යයනය කර වෘත්තීය කුශලතා සංවර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 7.1. : ආනුෂංගික කලා පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

ක්‍රියාකාරකම 71.2. : අංග රචනය පිළිබඳ ව ප්‍රායෝගික ව අධ්‍යයනය කරමු.

කාලච්ඡේද සංඛ්‍යාව : 04

ඉගැනුම් පල :

- අංග රචනය පිළිබඳ මූලික අවබෝධයක් සහිත ව නාට්‍ය පිටපතක් අධ්‍යයනය කරයි.
- අංග රචනය සඳහා අවශ්‍ය මූලික දැනුම ගවේෂණය කරයි.
- අධ්‍යක්‍ෂවරයා රූපණ ශිල්පීන් සෙසු ආනුෂංගික ශිල්පීන් සමඟ සාකච්ඡා කර අංග රචන සැලසුම් කළයුතු බව අවබෝධ කර ගනියි.
- රූප සටහන් අඳිමින් යෝජිත අංග රචනා ඉදිරිපත් කරයි.
- ඒ ඒ චරිත සඳහා අංග රචනා කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.
- ප්‍රායෝගික භාවිතාව මඟින් ඇති කර ගත් අවබෝධය සහිත ව වෘත්තීය ශිල්පියකු වීමට අවශ්‍ය මූලික පසුබිම සකසා ගනී.

ගුණාත්මක යෙදවුම් :

- විවිධ අංග රචනා සහිත ඡායාරූප
- නාට්‍ය පිටපත් කිහිපයක්
- A4 කඩදාසි වර්ණ, පැන්සල්
- අංග රචන උපකරණ කට්ටලය

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- විවිධ ආකාරයේ අංග රචනා සහිත චරිත ඇතුළත් නාට්‍ය ඡායාරූප කිහිපයක් ප්‍රදර්ශනය කර නාට්‍ය නිර්මාණයේ දී අංග රචනයේ වැදගත් කම අවබෝධ කරවමින් පහත දැක්වෙන කරුණු ආශ්‍රිත ව සාකච්ඡාවක් ගොඩ නඟන්න.
- ආහාර්ය අභිනයට අයත් ප්‍රධාන ආනුෂංගික අංගයක් වන 'අංග රචනය' බාහිර සමාරෝපය මෙන් ම අභ්‍යන්තර සමාරෝපයට ද බෙහෙවින් උපකාර වන්නකි.
- නළුවා ගේ සාත්ත්වික අභිනය වඩාත් පැහැදිලි ව ඉදිරිපත් කිරීමටත්, රඟපාන චරිතයේ බාහිර පෙනුම ඉස්මතු වන පරිදි නළුවා ගේ මුහුණේ ස්වරූපය වෙනස් කිරීමටත් අංග රචනය මඟින් හැකියාව ලැබේ.
- නළුවා චරිතානුකුල ව වෙනස් කිරීමේ දී හෙවත් වෙස් ගැන්වීමේ දී වේශභූෂණ මඟින් විශාල කාර්යභාරයක් ඉටු වන අතර එය පරිපූර්ණත්වයට පත්වන්නේ අංගරචනය ද ඊට එක් වූ පසු ව ය.
- නාට්‍ය ඉදිරිපත් කරන රංග ශෛලිය, වයස, තරාතිරම, මනෝභාව, චරිත අයත් යුගය හා ප්‍රදේශය ආදිය අංග රචනයේ දී සැලකිල්ලට ගත යුතු වෙයි.
- ආලෝකකරණයට ඔරොත්තු දෙන පරිද්දෙන් සහ ආලෝකකරණයේ දී නළුවා ගේ මුහුණේ ඉරියව් පැහැදිලි ව පෙනෙන පරිද්දෙන් නූතන වේදිකා නාට්‍ය කලාවේ දී අංග රචනය සිදු කළ යුතු වෙයි.
- විවිධ නාට්‍ය ශෛලි හා නිර්මාණාත්මක අවශ්‍යතාවන් පදනම් කර ගනිමින්, වර්තමානයේ අංග රචනය ප්‍රධාන වර්ග දෙකකට අනුව සිදු කෙරේ.

1. ඍජු අංග රචනය (Straight Make up)
2. චරිතාංග අංග රචනය (Charactor Make up)

- ඍජු හෙවත් සරල අංග රචනය යනු කෙනෙකු ගේ පවත්නා බාහිර ස්වරූපය ඒ ආකාරයෙන් ම එහෙත් වේදිකා ආලෝකකරණයට උචිත ලෙස අංග රචනය කිරීම යි. ආලෝකය පතිත වීමේ දී මුහුණේ වටකුරු ස්වරූපය මතු කිරීම, ඇස්, නාසය, තොල් ආදිය පැහැදිලි ව පෙනෙන පරිදි සටහන් කිරීම ආදි සරල ක්‍රියාකාරකම් කිහිපයක් මෙහි දී සිදු කෙරෙන අතර නළුවා ගේ බාහිර ස්වරූපය වෙනස් කිරීමක් කිසිවිට අපේක්ෂා නො කැරේ.

  පුද්ගලයකු ගේ පවත්නා බාහිර ස්වරූපය, රඟපාන චරිතයට අනුව වෙනස් කිරීම චරිතාංග අංග රචනයේ දී සිදු කෙරේ.

  මෙසේ චරිතයකට අනුව සිදු කරන අංග රචනාවක් ස්වාභාවිකත්වයෙන් ඈත් ව අතිශයෝක්තියට බර ව මෙන් ම, මුහුණ මත අංග රචනාවක් කළ බවට පෙනෙන පරිද්දෙන් සිදු කරන විට ශෛලිගත අංග රචනාවක් ලෙස හැඳින්විය හැකි ය.

  එසේ ම චරිතාංග අංග රචනයේ දී සැබෑ ලෝකයේ දක්නට නොලැබෙන සුවිශේෂී, කල්පිත චරිත අංග රචනය මඟින් මතු කරන අවස්ථා මෙන් ම විවිධ චරිත ලක්ෂණ හෝ භාව වර්ණ රේඛා හෝ හැඩතල සටහන් කිරීම මඟින් ඉදිරිපත් කිරීම විකාර රූපී හෙවත් මායාකාරී අංග රචනය ලෙස හැඳින්වේ.

- කවරාකාර ස්වරූපයක අංග රචනාවක් වුව ද සටහන් කෙරෙන්නේ සජීවී මුහුණක් මත හෙයින් අංග රචනා ශිල්පියා ඉතා පරිස්සමින් සිය කාර්යය ඉටු කළ යුතු වෙයි.

  අංග රචනය සඳහා ම නිර්මාණය වූ විවිධ වර්ණක හා උපකරණ වෙළෙඳ පොළෙහි පවතින අතර, අනුමත ද්‍රව්‍ය පමණක් භාවිතය මඟින් අංග රචනය සිදු කිරීම ඉතා ආරක්ෂිත පියවරක් වෙයි.

- අංග රචනයේ දී භාවිත වන උපකරණ හා ද්‍රව්‍ය කිහිපයක් පහත දැක්වේ.

  1. බේස් මේක් අප් (Base Make up)

     මේවා ඇඟිල්ලෙන් හෝ පින්සලෙන් ආලේප කළ හැකි (Grease paint) ලෙසත්, ජලය යොදා ස්පොන්ජයකින් ආලේප කළ හැකි (Pan Cake) ලෙසත් මිල දී ගත හැකි ය.

  2. ලයිනින් කලර්ස් (Lining Colours)

     විවිධ වර්ණයන් ගෙන් රේඛා, හැඩතල මුහුණෙහි සටහන් කළ හැකි ග්‍රීස් පේන්ට් වර්ගයකි.

  3. මේක් අප් පෙන්සිල් (Make up Pencils)

     විවිධ වර්ණයන් ගෙන් ලබා ගත හැකි පැන්සල් විශේෂයකි. හැඩතල මතු කිරීමටත් රේඛා ඇඳීමටත් භාවිත කරයි.

  4. බ්‍රෂස් ඇන්ඩ් ස්පොන්ජ්ස් Brushes & Sponges

     වර්ණ ආලේපනය සඳහා යොදා ගන්නා මේවා අංග රචනය සඳහා ම විශේෂයෙන් සකසන ලද උපකරණ වෙයි.

  5. ක්‍රේප් හෙයාර් (Crepe Hair)

     රැවුල ඇමීමට භාවිත කරයි. කළු, දුඹුරු, සුදු ආදිය විවිධ වර්ණයන් ගෙන් ලබා ගත හැකි ය. මේවා මුහුණ මත ඇලවීමට ස්පිරිට් ගම් (Sprirt Gum) භාවිත කරයි.

     අංග රචනා ක්‍රම හා විවිධ උපකරණ පිළිබඳ ව වැඩි දුරටත් දැන ගැනීමට 10 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය බලන්න.

- අංග රචනයේ දී මුහුණ මූලික වශයෙන් කොටස් 6 කට බෙදේ. (15 රූපය)



- වේදිකා නාට්‍ය අංග රචනයේ දී අඳුර සහ එළිය පිළිබඳ ව මූලධර්මය (Light & Shading) විශේෂයෙන් යොදා ගනී. නාසය දෙපස අඳුරු කිරීමෙන් නාසය මතු කිරීම. මුහුණෙහි අඳුරු කළ යුතු ප්‍රදේශ අඳුරු කිරීම හා මතු විය යුතු තැන් ළා පැහැයෙන් වර්ණ ගැන්වීම මඟින් ත්‍රිමාණ බව මතු කිරීම එබඳු උපක්‍රම වෙයි.
- අංග රචනය කිරීමේ දී සුදුසු ආලෝක තත්ත්වයක් ඇති ස්ථානයක් තෝරා ගැනීම, උපකරණ හා ද්‍රව්‍ය ක්‍රමවත් ව හා පිරිසිදු ව තබා ගැනීම මෙන් ම අංග රචනා ශිල්පියා ඒ වෙනුවෙන් සිදු කරන පෙර සූදානම ද ඉතා වැදගත් පියවර වෙයි.

- ඉහත ආකාරයට අංග රචනය පිළිබඳ මූලික කරුණු සාකච්ඡා කිරීමෙන් පසු ව පන්තියේ සිටින සිසුන් අතුරින් කිහිප දෙනකු අභිමතය පරිදි තෝරා ගෙන සෙසු සිසුන් ගේ සහයෝගය ඇති ව පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- අංග රචනය කරන සිසුන් හට සහාය සඳහා අංග රචනයට භාජනය වීමට කැමති සිසුවකු තෝරා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත මාතෘකා අතුරින් එකක් අහඹු ලෙස තෝරා ගැනීමට සලසන්න.
  1. ඊඩිපස් රජ චරිතය (ඊඩිපස් රජ)
  2. ශකුන්තලා චරිතය (අභිඥානශාකුන්තලය)
  3. ඔතෙලෝ චරිතය (ඔතෙලෝ)
  4. යසලාලකතිස්ස චරිතය (සුබ සහ යස)
  5. වැදි රජ චරිතය (මනමේ නාට්‍යය)
  6. කුවේණි චරිතය (කුවේණි)
- පෙර සාකච්ඡා කළ කරුණු ද ආශ්‍රය කර ගනිමින් තමන් වෙත ලද චරිතය සඳහා අංග රචනා සැලසුම් කිරීමට උපදෙස් ලබා දෙන්න.
- අංග රචනා උපකරණ කට්ටලය ලබා දෙමින් අදාළ අංග රචනා සිදු කිරීමට සුදුසු කාලය ලබා දෙන්න.
- අංග රචනා කරන අතරතුර අධීක්ෂණයක යෙදෙමින් තව දුරටත් අඩුපාඩු සකසා ගැනීමට උපදෙස් ලබා දෙන්න.
- සිදු කරන ලද අංග රචනා සෙසු පිරිස් වෙත ප්‍රදර්ශනයට හා ඒ පිළිබඳ ව විස්තර කිරීමට යොමු කරන්න.
- සිසු අදහස් විමසමින් ඒ ඒ අංග රචනා තවදුරටත් විධිමත් හා සාර්ථක වීම සඳහා අවශ්‍ය දැනුම හා උපදෙස් ලබා දෙන්න.

ඇගයීම : කුවේණි නාට්‍යයෙහි කුවේණි චරිතය හෝ සෙල්ලම් ගෙදර නාට්‍යයේ නෝරා ගේ චරිතය අංග රචනය සඳහා ඔබ විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාකාරකම් අනුපිළිවෙළින් විස්තර කරන්න.

නිපුණතාව 7.0 : නාට්‍ය හා රංග කලාව විෂයයට අනුබද්ධ ආනුෂංගික කලා අධ්‍යයනය කර වෘත්තීය කුශලතා සංවර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 7.1 : ආනුෂංගික කලා පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 08

ඉගැනුම් පල :
- නාට්‍යයක සාර්ථකත්වය සඳහා භාවිත වන ආනුෂංගික කලාවක් වන රංගාලෝකය යනු කුමක් දැයි හඳුනාගනියි.
- ප්‍රොසීනියම් වේදිකාවේ භාවිත වන ආලෝක පහන් සහ උපකරණ පිළිබඳ ව ගවේෂණය කරයි.
- වේදිකා නාට්‍යයකට රංගාලෝකයෙන් ඇති ප්‍රයෝජන අවබෝධ කරගනිමින් රංගාලෝකයෙහි අරමුණු සහ පරමාර්ථ ඇති බව වටහාගනියි.
- තෝරාගත් නාට්‍ය පිටපතක කොටසකට යෙදිය යුතු ආලෝක තත්ත්ව පිළිබඳ ව අදහස් යෝජනා කරයි.
- රංගාලෝක අධ්‍යක්ෂවරයා
  රංගාලෝක පිටපත
  රංගාලෝක පුහුණුව
  අනෙකුත් ආනුෂංගික කලාවන් හා ඇති සම්බන්ධය වැනි විවිධ මාතෘකා පිළිබඳ ව අධ්‍යයනය කරයි.
- වේදිකා නාට්‍යයෙහි රංගාලෝකයේ භාවිතය පිළිබඳ ව ප්‍රායෝගික ව කරුණු හදාරයි.

ක්‍රියාකාරකම 7.1.5 : රංගාලෝක භාවිතය

ගුණාත්මක යෙදවුම් :
- ආලෝක පහන්වල සහ උපකරණවල ඡායාරූප රැගත් විශාල චිත්‍ර සහිත රූප සටහන්
- තෝරා ගත් නාට්‍ය පිටපතකට කොටසක්/රංගාලෝක පිටපතක කොටසක්
- විවිධ නාට්‍යවල ඡායාරූප කිහිපයක්
- රංගාලෝක පහන් සහ උපකරණවල සාදාගත් කුඩා ආකෘති (ආදර්ශ)
- විදුලි පන්දමක්, කාඩ්බෝඩ්

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය : ප්‍රායෝගික

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් : (16 අංකය යටතේ දැක්වෙන රූප හඳුනාගන්න)

පියවර 01
- ආහාර්ය අභිනයට අයත් වන ප්‍රධාන ආනුෂංගික කලාවක් වන රංගාලෝකය යනු රංගය සඳහා යොදා ගනු ලබන ආලෝකය බව පහදා දිය යුතු ය. මෙහි දී හිරු එළියෙන් ලැබෙන ස්වාභාවික ආලෝකය හා ජල විදුලියෙන් ලැබෙන කෘත්‍රිම ආලෝකය පිළිබඳ ව ද සාකච්ඡා කළ හැකි ය. බෞද්ධ පූජා කර්මවල, ශාන්ති කර්මවල සහ නූර්තිවල අතීතයේ භාවිත වූවාට වඩා දියුණු ආලෝක තත්ත්ව වත්මන් ප්‍රොසීනියම් වේදිකාවේ තිබෙන බව ද සඳහන් කළ හැකි ය.
- ප්‍රොසීනියම් වේදිකාවක පින්තූර හෝ එහි ආකෘතියක් හෝ සාදා ගෙනවිත් එහි භූගෝලීය පිහිටීම පිළිබඳ ව හැඳින්වීම වැදගත් වේ. වේදිකාවක් සහිත ශාලාවක් තිබේ නම් එය වඩාත් පහසු වේ. සිසුන් හය දෙනකු හෝ නව දෙනකු හෝ වේදිකාවට ගෙන ස්ථානගත කොට හඳුන්වාදීමට පුළුවන. (DR. DC. DL ... යනාදි ලෙස)

පියවර 02
- වේදිකාවේ භාවිත වන ප්‍රධාන පහන් වර්ගවල කලින් සාදාගත් ආකෘති ළමයිනට දී ඒවා පිළිබඳ ව ඔවුන් සමඟ සාකච්ඡා කළ හැකි ය. එහි දී

හැඩය, බල්බය, කාචය වැනි දේ පිළිබඳ ව ද කියා දිය හැකි ය. විදුලිය පන්දම ගෙන එහි ක්‍රියාකාරීත්වය හා එහි මුහුණතට කවාකාර ව නැවූ කාඩ්බෝඩ් කැබැල්ල තබා විවිධ හැඩයේ ආලෝක ධාරාවන් ලැබෙන අයුරු අත්හදා බැලිය හැකි ය.

- ප්‍රොසිනියම් වේදිකාවේ භාවිත කරන ආලෝක පහන් පිළිබඳ ව රූප සටහන් හා තොරතුරු ලබාදීම අනතුරු ව කළ යුතු ය. එහි දී Spot Lights, Flood light, Strip light strobe, Ultraviolet සහ උපකරණ වන Gobo, colour wheel, Dimmers, Colour filters පිළිබඳ ව සාකච්ඡා කළ හැකි වේ. (මෙම සෑම පහනක ම පින්තූර පෙන්වා පැහැදිලි කිරීම අවශ්‍ය වේ.)

පියවර 03

- රංගාලෝකයේ අරමුණ හා පරමාර්ථ විවිධ වේදිකා නාට්‍යවල පින්තූර පෙන්වා ඒවායෙහි ඇති ආනුෂංගික කලා පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවීම. ඒ ඇසුරින් ආලෝක තත්ත්ව පිළිබඳ ව ද විශේෂ අවධානය යොමු කිරීම කළ යුතු ය. දික්තල කාලගෝල නැතහොත් තලමල පිපිලා වැනි නාට්‍යයක දෘශ්‍ය පටයක් පෙන්වමින් මෙය කළ හැකි ය. එසේ ත් නැතිනම් සිසුන් සමඟ වේදිකා නාට්‍යයක් නැරඹීමට ගොස් පැමිණ ඒ පිළිබඳ ව කතිකාවක් මෙහෙයවීම මඟින් බුද්ධි කලම්බනයක් කළ හැකි වේ. එහි දී අවධාරණය කළ යුතු කරුණු පහත සඳහන් වේ.

1. රංගය හොඳින් දෘශ්‍යමාන වීම සඳහා
2. සන්නිවේදන මාධ්‍යයක් ලෙස (නළුවන් ගේ මනෝභාව, පරිසරයේ ස්වභාවය, පසුබිම, කාලගුණික තත්ත්වය ආදිය)
3. වේදිකාවේ ත්‍රිමාණ ලක්ෂණ පෙන්වීම සඳහා (පර්යාවලෝක ලක්ෂණය) පසුතල, භාණ්ඩ හා පුද්ගලයන් ගේ අඳුර සහ ආලෝකය මඟින් ත්‍රිමාණ බව ඉස්මතු කළ හැකි ය.
4. වේදිකාවේ හිස් බව නැති කරලීමට, අවශ්‍ය දේ පමණක් පෙන්වීමට.
5. නාට්‍යයේ ජවනිකා වෙන් කිරීමට.
6. වේදිකාව මත තත්ත්වානුරූපී මායාවක් ඇති කරලීම සඳහා
7. ගුණාත්මක ප්‍රේක්ෂාවක් ඇති කර එමඟින් ප්‍රේක්ෂක රසවින්දනය ඇති කරලීමට.

ඉහත එක් එක් කරුණ වෙන ම ගෙන නාට්‍යවලින් උදාහරණ සපයමින් පැහැදිලි කළ විට ඉතා පහසුවෙන් අවබෝධ කර ගනු ඇත.

පියවර 04

රංගාලෝක පිටපත ආශ්‍රිත දැනුම. මෙහි දී සැබෑ ආලෝක පිටපතක කොටසක් සිසුන් ට පෙන්වා ඒ පිළිබඳ ව සාකච්ඡා කළ යුතු වේ. රංජිත් ධර්මකීර්ති ගේ ''වෙරි උයන'' හෝ ධර්මසිරි බණ්ඩාරනායක ගේ ''මකරාක්ෂයා'' හෝ සෝමලතා සුබසිංහ ගේ ''විකෘති'' හෝ වැනි නාට්‍යයක රංගාලෝක පිටපතක් සොයා ගත හැකි ය.

R/S	7 වන ජවනිකාව සුබ සහ යස නාට්‍යයෙන් - සුබ ගේ නිවස (රජු ගේ කථනයේ දී පසුපස වේදිකාවේ රාජ සභාව වෙනස් කොට සුබ ගේ නිවස සකස් වේ) (සුබ සහ සගයන් වේදිකාවේ ඉදිරිපස ආලෝක ධාරා වේ) - පිටුව 68 -

දිවැස් හෙළනු මැන නාට්‍යයෙන් (පළමු වැනි ජවනිකාව)

O/H Ember G/L full	තුන්වෙනි සීනුව හඬවනවාත් සමඟ ම ශාලාවේ විදුලි පහන් ආලෝකය ක්‍රමයෙන් අඩු වේ. නාගසලන් සංගීතය තේමා කරගත් තේමා වාදනය ආරම්භ වේ. ප්‍රධාන තිරය දෙපසට ඇදී යයි. වේදිකාවේ පසු මැද පූජාසනයකි. හඳුන්කූරු සහ තෙල් පහන් දල්වේ. පූජාසනය පසු පස සිට එල්ල වන තැඹිලි වර්ණක ආලෝක ධාරාවක් වේදිකාවට ඉදිරි දකුණට පැතිර ඇත. ඒ ආලෝක ධාරාව තුළ කපු මහතෙක් යාතිකා කරමින් සිටී. කපුරාල : (ගයයි) තනිකඩ මගෙ සිතේ පාළුව රජයන්නේ ළඳුනට පමණි. පාළුව දුරු කළ හැක්කේ දෙවියා : දේව දරුවා... තොප ගේ දුක මම දුටුවෙමි. තොප ගේ කන්නලව්ව මම ඇසුවෙමි. (වේදිකාව සම්පූර්ණයෙන් ම ආලෝක වේ).
Cyc.Blue $\frac{1}{2}$ M/S ENTER - හාමිනේ G/L $\frac{1}{2}$ ENTER - ලියන මහත්තයා G/L full	**මෝදර මෝල නාට්‍යයෙන්** පළමු වැනි අංකය (පිටත ආලින්දය තිරය විවර වෙන විට හාන්සි පුටුවක දිගා වී ශ්ලෝකයක් කියවමින් සිටින මයිකල් මුදලාලි හෙවත් රාලහාමි ක්‍රමයෙන් පෙනෙන්නට වෙයි) (හාමිනේ ඔහුට බාධා නොකොට තේ කෝප්පයක් ද අතැති ව බලා සිටී) හාමිනේ - (අහක බලමින්) දුව තාම නෑ ... රාලහාමි - (තේ එක බොමින්) හවස පත්තියක් එහෙම තියෙනව ද දන්නෙ නැහැ නොවැ... ලියන මහතා - ආයුබෝවන්ඩ රාලහාමි රාලහාමි - ආ... ලියන මහත්තයා ආව ද ? (හාමිනේ පිටවෙයි)

ඉහත දක්වා ඇත්තේ වේදිකා නාට්‍යවල රංගාලෝක පිටපත්වල උපුටාගත් කොටස් කිහිපයකි. ඒවා ඡායා පිටපත් කර ළමයින් අතට දී ඒ පිළිබඳ ව බොහෝ කරුණු සාකච්ඡා කළ හැකි ය. රංගාලෝක පිටපත යනු නාට්‍ය පිටපතක වම් පස 2ක" පමණ තීරුවක ඒ ඒ අවස්ථාවල නාට්‍යයට යොදන ආලෝක තත්ත්ව පිළිබඳ ව සටහන් කර ගැනීම යි. සාමාන්‍යයෙන් මෙහි දී පිළිගත් සංඥා, අක්ෂර මඟින් හෝ ඒ ඒ අධ්‍යක්ෂකවරයාට පහසු වන පරිදි ඔහුට ආවේණික රටාවකට හෝ ලියා තබාගනී.

RS යනු Right Spot යන්න කෙටියෙන් ලිවීම යි. Ember යනු ඉහළින් පතිත (Overhead) තැඹිලි වර්ණ ආලෝකය වේ.

Cyc Blue $\frac{1}{2}$ යනු ගගනිකාව (සුදු තිරය) මඳක් නිල් පැහැය ගත යුතු බව යි. (සම්පූර්ණයෙන්ම දීප්තිමත් නොවී)

G/L යනු General Light (සාමාන්‍ය ආලෝකය) යන්නෙහි කෙටි නාමය යි.

G/L $\frac{1}{2}$ යනු එතරම් දීප්තිමත් නොවූ සාමාන්‍ය ආලෝකය යි.

G/L Full යනු සියලු ම දෙනා හොඳින් පෙනෙන සේ යොදන සම්පූර්ණ සාමාන්‍ය ආලෝකය යි. මෙහි දී Fresnel (Flood) පහන භාවිත කරයි.

- ඇතැම් නාට්‍යවල රංගාලෝක තත්ත්ව තිබිය යුතු ආකාරය නාට්‍ය අධ්‍යක්ෂවරයා ම පිටපතෙහි සටහන් කරයි. උදාහරණ ඉහත " මෝදර මෝල " නාට්‍යය. එහි අධ්‍යක්ෂවරයා වන රංජිත් ධර්මකීර්ති විසින් යොදන ලද සටහන් එහි ඇත.

- ''දිවැස් හෙළනු මැන'' නාට්‍යයේ පිටපතේ සංවාද අතර එහි අධ්‍යක්ෂ රෝලන්ඩ් ඒ ප්‍රනාන්දු විසින් ම වචනයෙන් ලියන ලද රංගලෝක උපදෙස් එම පිටපතෙහි ඇත. මෙය ආලෝකය හා සම්බන්ධ ශිල්පියාට පහසුවකි. පිටපත කියවන ප්‍රේක්ෂකයාට ද චිත්තරූප මවා ගැනීමට උපකාරී වේ.

- එහෙත් බොහෝ නාට්‍යවල, නාට්‍යයට අවශ්‍ය කරන රංගාලෝකය සැලසුම් කිරීම විශේෂ පුද්ගලයකුට පැවරේ. ඔහු රංගාලෝක අධ්‍යක්ෂවරයා නම් වේ. ඔහු ගේ පරිකල්පන ශක්තියෙන් මවන ආලෝක තත්ත්ව නාට්‍ය පිටපතෙන් සලකුණු කර ගනී. එම සලකුණු බලා ආලෝකය මෙහෙයවන්නා (Lighting Operator) ආලෝක පාලන පුවරුව (Dimmer) හසුරුවයි.

ඇගයීම :

සිසුන්ට පහත සඳහන් පරිදි සරල නාට්‍ය පිටපත් සකස් කර ලබා දී ඒවාට උචිත ආලෝක තත්ත්ව (යෙදිය යුතු ආලෝකය) පිටපතෙහි වම් පස නිශ්චිත සංකේතවලින් හෝ වචනයෙන් ලියා හෝ දක්වන්නට පැවරීම.

ආලෝක තත්ත්වය	අවස්ථාව (ප්‍රධාන තිරය සෙමෙන් විවර වේ. සඳ රේඛා ගේ පියා වේදිකාවේ මැද පුටුවක වාඩි වී පත්තරයක් කියවමින් සිටී. ටික වේලාවකින් ඔහු ගේ බිරිය තේ තෝප්පියක් ද අතැති ව වේදිකාවේ ඉහළ වම් පසින් ඇතුළු වී සෙමෙන් ඔහු අසල පැමිණ...)
ආලෝක තත්ත්වය	අවස්ථාව වේදිකාවේ පහළ වමේ සිටින ගුරුවරයාට මැරයෙක් තදින් පහර දෙයි.
ආලෝක තත්ත්වය	අවස්ථාව ප්‍රධාන තිරය වසා ඇත. ඉදිරි දකුණු කෙළවරේ සිටින පොතේ ගුරු ගායනය අරඹයි. ඔහු වේදිකාවේ ඉදිරි මැදට විත් ගායනය අවසන් කරනවාත් සමඟ තිරය විවර වේ. වේදිකාව තුළ සිටින ගායක කණ්ඩායම අත්වැල් ගීය ආරම්භ කරයි.
ආලෝක තත්ත්වය	අවස්ථාව වේදිකාවේ ඉහළ දකුණු පස සිට වම් පසට cyclorama ගගනිකාව ඉදිරියෙන් තිදෙනකු යමක් කරනු ප්‍රේක්ෂකයාට දැක ගත හැකි ය. ඔවුහු අඳුරු සෙවණැලි මෙන් දිස් වෙති. පැහැදිලි ව හඳුනාගත නොහැකි ය.

විවිධ සහාය

වරුණ අලහකෝන්
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
සෞන්දර්ය අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය - බත්තරමුල්ල

වයි. එම්. එම් කේ. යාපා
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් අධ්‍යාපන කාර්යාලය - මහනුවර

ජගත් පද්මසිරි
කථිකාචාර්ය
සෞන්දර්ය විශ්ව විද්‍යාලය

චාමික හත්ලහවත්ත
ගුරු උපදේශක
පිළියන්දල කලාපය

ජනකා හද්‍රාංගනී
ගුරු සේවය
නිවන්තකචේතිය විද්‍යාලය,
අනුරාධපුර

කුමාරි එදිරිසිංහ
ගුරු සේවය
ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, කුරුණෑගල

රත්නා ලාලනී ජයකොඩි
ගුරු සේවය
රාජකීය විද්‍යාලය,
කොළඹ

පරිගණක මෙහෙයුම් : **ඩබ්ලිව්. එම්. ධම්මිකා**
මුද්‍රණාලය, ජාතික අධ්‍යාපන ආයතනය

සහාය : **ඊ. එම්. වික්‍රමනායක**
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

කේ. පී. පෙරේරා
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

නාට්‍ය හා රංග කලාව

12 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ඡායාරූප එකතුව

1 රූපය - සංගීත සන්දර්ශනයක අවස්ථාවක්

2.1 රූපය - බැලේ නාට්‍යාවස්ථාවක්

2.2 රූපය - බැලේ නාට්‍යාවස්ථාවක්

3.1 රූපය - ජීව මූර්ති

3.2 රූපය - ජීව මූර්ති

3.3 රූපය - ජීව මූර්ති

4.1 රූපය - ග්‍රීක රඟමඩල

4.2 රූපය - ග්‍රීක රඟමඩල



5.1 රූපය - ග්‍රීක රඟමඩල ආකෘතිය



5.2 රූපය - ග්‍රීක රඟමඩල ආකෘතිය



5.3 රූපය - දොඹකරය



5.4 රූපය - ග්‍රීක රඟමඩල ආකෘතිය



6.1 රූපය - මධ්‍ය කාලීන රඟමඩල

6.2 රූපය - මධ්‍ය කාලීන රඟමඩල

7.1 රූපය - වේදිකා පසුතල

7.2 රූපය - වේදිකා පසුතල

8.1 රූපය - පසුතල සැලසුම් කිරීමේ අවස්ථා

8.1 රූපය - පසුතල සැලසුම් කිරීමේ අවස්ථා

9.1 රූපය - සෙල්ලම් ගෙය නාට්‍යයේ නත්තල් ගස

10.1 රූපය - සෙල්ලම් ගෙය නාට්‍යයේ අවස්ථාවක්

10.2 රූපය - සෙල්ලම් ගෙය නාට්‍යයේ අවස්ථාවක්

11.1 රූපය - ග්‍රීක නාට්‍යයක රංග භණ්ඩ භාවිත වන අවස්ථාවක්

11.2 රූපය - ග්‍රීක නාට්‍යයක රංග භණ්ඩ භාවිත වන අවස්ථාවක්

11.3 රූපය භාණ්ඩ භාවිතය

13.1 රූපය - රංග භාණ්ඩ

13.2 රූපය - රංග භණ්ඩ භාවිතය

14.1 ග්‍රීක නාට්‍යයකට උචිත වේදිකා පසුතලයක්

14.2 ඇන්ටිගනි නාට්‍යයේ අවස්ථාවක්

16 ක්‍රියාකාරකම - වේදිකා ආලෝකකරණය සඳහා භාවිත වන පහත දක්වෙන රූප සටහන් හඳුනාගෙන නම් කරන්න.

ROGUE
001
CHAUVET

CHAUVET